INTERNATIONAL BRIDGES TO JUSTICE LANKA

# ශ්‍රී ලංකාවේ අපරාධ විත්තිවාචකය
# අත් පොත



**<u>ශ්‍රී ලංකාවේ අපරාධ විත්තිවාචකය - ප්‍රායෝගික අත්පොත පිළිබඳ නීතිඥ සංගම් වල සහතික කිරීම්.</u>**

**නීතිඥ සංගමය - යාපනය**

ඉන්ටර් නැෂනල් බ්‍රිජස් ටූ ජස්ටිස් හි (IBJ) මෙම අපරාධ විත්ති වාචකය පිළිබඳ අත්පොත සඳහා පූර්ණ අනුමැතිය පලකර තිබේ. ඔවුන් මෙය ශ්‍රී ලංකාවේ වෘත්තීය කටයුතු වල නිරත සියලු අපරාධ විත්තිය පිළිබඳ නීතිඥවරුන්ට ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් වනු ඇති බවට විශ්වාසය පල කරති.

- ශාන්තා අබිමානසිංහම් , සභාපතිනිය -
  නීතිඥ සංගමය - යාපනය

**නීතිඥ සංගමය - ත්‍රිකුණාමලය**

"මෙම අත්පොත අපරාධ නඩු පිළිබඳව සහ චූදිතගේ අයිතිවාසිකම් ගැඹුරින් විශ්ලේෂණය කර ඇත. ඒ අනුව මෙම අත්පොත නීතිඥවරුන්ට, උගතුන්ට, විනිසුරුවරුන්ට සහ සිවිල් සමාජ සාමාජිකයින්ට සහයවනු ඇත."

- සුභාෂිනී චිත්‍රවේල්, සභාපතිනිය -
  නීතිඥ සංගමය - ත්‍රිකුණාමලය

**නීතිඥ සංගමය - මන්නාරම**

"මෙම පොත ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සම්බන්ධ විශාල කොටසක් සුදුසු බවට පිළිගැනීමට සහ අගය කරනු ඇති බවට මට කිසිදු සැකයක් නැත. "මූලික අයිතිවාසිකම්, නිර්දෝෂී බාවයේ පූර්ව නිගමනය, සහ පාපොච්චාරණයට, අදාළ රීතීන් ගරු කරන සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මෙම නෛතික මූලධර්මයන් පරදුවට තබා ඇති සහ මහත් අනතුරට පාත්‍රව ඇති කාලයක එවැනි බේදවාචකයන්ට විරුද්ධව කටයුතු කරන දිගු ගමනක් සඳහා ගමන් ගනු ඇත. මට විශ්වාසයක් ඇත. ඒ මෙම පොත නීති ක්ෂේත්‍රයේ බහුතර තරුණ පිරිසට වඩාත් වැදගත් උපකාරයක් වනු ඇති හෙයින් එය මිණුම් දණ්ඩක් ලෙස උපකාරී වන බවටය."

- ඊ. කායිස් ෆෙල්මාගේ -
  සභාපති,
  නීතිඥ සංගමය - මන්නාරම

**නීතිඥ සංගමය - මහනුවර**

"මෙම අපරාධ විත්තිවාචකය පිළිබඳ ප්‍රායෝගික අත්පොත අපේ නෛතික දේ ඇස් විවර කරනු ඇත. ඒ අපරාධ යුක්ති ක්‍රියාදාමය පුළුල් කිරීමේ ප්‍රායෝගික කාර්යපටිපාටිය පිළිබඳ නව ප්‍රවණතාවයන් ඔස්සේය."

- - - ඊ.එම්.පී.කුමාරි අබේරත්න, සභාපතිනිය -
  මහනුවර නීතිඥ සංගමය,

  බණ්ඩාර කරුණානායක,
  ලේකම් - මහනුවර නීතිඥ සංගමය

**නීතිඥ සංගමය - වව්නියාව**

වව්නියාව නීතිඥ සංගමයේ සාමාජිකාවක් හැටියට මෙම ඉන්ටර් නැෂනල් බ්‍රිජට් ටූ ජස්ටිස් හි අත්පොත අපි .සතුටින් පිළිගනිමු. ස්ථිරව විශ්වාසකරන දෙයක් තිබේ. එනම් එය නීතිඥවරුන්ට ප්‍රයෝජනවත් වන බවය.

- ඇන්ටන් ප්‍රනිත්තානායමගම් -
  ලේකම්,
  නීතිඥ සංගමය - වව්නියාව

# <u>යුක්තිය උදෙසා ජාත්‍යන්තරයට පාලමක් (IBJ) පිළිබඳ පැහැදිළි කිරීමක්.</u>
# <u>(About International Bridges To Justice)</u>

මෙම ජාත්‍යන්තර ආයතනය වර්ෂයේ 2000 දී බිහි වූවකි. යුක්තිය උදෙසා ජාත්‍යන්තරයට පාලමක් ආයතනය 21 වන සිය වසේදී වධහිංසාව අවසන් කිරීම සහ ලොව පුරා නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදී. සෑම පුද්ලයෙකුගේම අයිතිවාසිකම් වලට ගරු කරන අපරාධ යුක්තිය පසිදලීමේ ක්‍රමවේදයක් සකස් කිරීම උදෙසා මෙම අයි.බී.ජේ. සංවිධානය රජය, සිවිල් සමාජය සහ ප්‍රජාව මත පදනම් වූ සංවිධාන සමග සහයෝගීතාවයෙන් කටයුතු කරයි.
අපරාධ යුක්තිය පසිදලීමේ ක්‍රියාදමයේ ප්‍රාථමික අවස්ථාවේදී චූදිතයෙකුට නීතිඥ සහාය ලබාදී චූදතයන් එම අවස්ථාවේදී වධහිංසාවකට මානව හිමිකම් උල්ලංඝණයන්ට හෝ වෙනත් අපයොජනයකට ලක්වීමේ අවදානම අඩුකරමින් චූදිතයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අයි.බී.ජේ. ආයතනය කටයුතු කරයි. අයි.බී.ජේ. ආයතනය මූලික වශයෙන් අවදානය යොමු කරන තවත් කරුණක් වන්නේ අපරාධ යුක්ති ක්‍රියාදමයේ නියමුවන් සහ මහජන ආරක්ෂකයින් සවිබල ගැන්වීම සහ සහායදීමයි.
අයි.බී.ජේ. එක්සත් ජනපදයේ ලියාපදිංචි වී ඇති ස්වේච්ඡා සංවිධානයක් වන අතර දැනට බුරුන්ඩි, කාම්බෝජය, චීනය, කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය, මෙක්සිකෝව, මියන්මාරය, රුවන්ඩාව, ශ්‍රී ලංකාව, සිරියාව, වියට්නාමය සහ සිම්බාබ්වේ යන රටවල වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

<u>අයි.බී.ජේ. හි දැක්ම:</u>

අපගේ අපේක්ෂාව වන්නේ ලොව සෑම මිනිසෙකුගේම, කාන්තාවකගේම සහ ළමයෙකුගේම මූලික නෛතික අයිතිවාසිකම් වලට ගරු කරන ලෝකයක් බිහිකිරීම වන අතර, එහිදී විශේෂයෙන්ම නිසි නෛතික නියෝජනයට ඇති අයිතිය, වධහිංසා වලින් නිදහස් වීමට ඇති අයිතිය සහ අනෙකුත් කෲර අමානුෂික සහ පහත්කොට සැලකීම් වලින් නිදහස්ව සිටීමේ අයිතිය මෙන්ම නිදහස් සහ සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය ද සුවිශේෂ වේ. අපගේ තවත් අරමුණක් වන්නේ පුරවැසියන් තනි තිනිව ගත් කළ සෑම පුරවැසියෙකුටම ඔහුගේ/ ඇයගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැණුවත් භාවයක් ලබාදීම සහ එම අයිතිවාසිකම් ප්‍රායොගිකව බලාත්මක කර ගැනීමට හැකියාව ඇති ලෝකයක් නිර්මාණය කිරීමයි. තවද එදිනෙද යුක්තිය පසිඳලීමේදී ක්‍රියාවලියේදී ලෝකයේ සම්මත ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහ නීතියේ ආධිපත්‍ය පවතින ලෝකයක් නිර්මාණය කිරීම අපගේ තවත් අරමුණක් වේ.

<u>අයි.බී.ජේ. මෙහෙවර</u> :-

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ මූලික මූල ධර්ම හඳුනා ගනිමින් සංවර්ධනය වෙමින් පවතින රටවල සාමාන්‍ය පුරවැසියන්ගේ මූලික නෛතික අයිතීන් අරාක්ෂා කිරීම උදෙසා අයි.බී.ජේ. කැපවී සිටියි. නිශ්චිතවම සියලු පුරවැසියන්ට නිසි නෛතික නියෝජනයකට ඇති අයිතිය, වධහිංසාව, කෲර අමානුෂික සැලකිලි හෝ දඬුවම් වලින් ආරක්ෂා වීමේ අයිතිය සහ සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය සහතික කිරීමෙහිලා අයි.බී.ජේ. කටයුතු කරනු ලැබේ.

<u>අයි.බී.ජේ. හි ප්‍රවේශය</u> :-

අයි.බී.ජේ. සිය මෙහෙවර සාක්ෂාත් කිරීමෙහිලා නීති ආධාර ලබාදෙන නිතිඥවරුන්, රාජ්‍ය ආයතන, නීති ආධාර සංවිධාන, ප්‍රජා සංවිධාන සහ අනෙකුත් උනන්දුවක් ඇති පාර්ශව සමග කටයුතු කරයි. එනම් ඵලදායි සහ පුළුල් සම්පූර්ණ අපරාධ යුක්ති ප්‍රතිසංස්කරණයක් උදෙසා අයි.බී.ජේ. ත්‍රිවිධ ආකාරයක වැඩසටහන් ක්‍රියාත්මක කරමින් කටයුතු කරනු ලබයි.

විත්තියේ නීතිඥවරුන්ගේ හැකියාව වර්ධනය :-

අපරාධ යුක්ති ක්‍රියාදාමය තුළ නියමුවන් වන්නේ විත්තිය වෙනුවෙන් පෙනී සිටින නිතිඥවරු/නීති ආධාර සපයන නීතිඥයන් වේ. ඔවුන්ව බලගැන්වීමට, එනම් හැකියාවන් සංවර්ධනය සඳහා වූ වැඩසටහන් සහ අවශ්‍ය ද්‍රව්‍ය, සම්පත් මධ්‍යස්ථාන, ජාත්‍යන්තර සහයෝගීතාව සංවර්ධනය සහ තාක්ෂණික ආධාර ලබා දීම ඔස්සේ සහයෝගය ලබා දීමට වැඩි වශයෙන් කටයුතු කරනු ලැබේ.

ආයතනික වශයෙන් හැකියා වර්ධනය :-

නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක කිරීමට යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියට සම්බන්ධ සියලු දෙනාගේම සහයෝගය අවශ්‍ය වන අතර, ඒ සදහා අයි.බී.ජේ. ආයතනය විත්තිය වෙනුවෙන් පෙනී සිටින නිතිඥවරු , පැමිණිල්ල මෙහෙයවන නිතිඥවරු , විනිසුරුවරුන්, අධිකරණ පරිපාලකයන්, පොලීසිය, වෛද්‍ය පරීක්ෂකයන්, රැඳවුම් මධ්‍යස්ථාන නිලධාරීන්, ආණ්ඩුවේ නියෝජිතයන් සහ නීති අධ්‍යයන විශේෂඥවරුන් යන සියළු දෙනාම එක් රැස් කරමින් ඔවුනාවුන් අතර සහයෝගය වර්ධනය කර ගැනීමට අදහස් හා යෝජනා හුවමාරු කර ගැනීමට වටමේස සාකච්චා සංවිධානය කිරීම සිදුකරයි. මේ මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය උදෙසා දීර්ගකාලීන පදනමක් දැමීමක් ද සිදු වේ.

**අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය-**

සිය නෛතික අයිතීන් පිළිබඳ සාමාන්‍ය පුරවැසියන් ගේ තොරතුරු හිඟකම සහ දැනුම මදකම අයිතීන් උල්ලංඝණය අඛණ්ඩව සිදුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපායි. අයි.බී.ජේ. මෙම අයිතීන් පිළිබඳව විවිධ ආකාරයට කටයුතු කරනු ලැබේ.

උදාහරණ ලෙස පෝස්ටර්, පත්‍රිකා, වීදි නීති සැසි ක්‍රියාත්මක කිරීම මගිනි. පුරවැසියන්ට තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටීමට සහ තමන්ගේ පවුලේ සාමාජිකයෙතුගේ නෛතික අයිතිවාසිකම් ආරක්ෂාකර ගැනීමට උපදෙස් ලබා ගත හැකි වන පරිදි මහජනතාව නෛතික දැනුමෙන් බලගැන්වීමද අයි.බී.ජේ. මගින් සිදුකරණු ලබයි.

## අන්තර්ගතයන්

හැඳින්වීම - 12 -13

ප්‍රස්තාවනාව - 13

යුක්ති පසිදලීමේ කාර්ය පටිපාටියට අදාල මූලික පදනම සම්බන්ධ දළ විශලේශණයක් සහ සංක්‍රාන්තික යුක්තිය

මූලික කරුණු සම්බන්ධ දළ විශ්ලේශණයක්

ජාත්‍යන්තර ගිවිසුම් වලට අදාල බැදීම් වගකීම් සහ අනෙකුත් අදාල ගෝලීය නීති ප්‍රමිතීන් - 15
ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තිය - 15

හැඳින්වීම - 16

එක්සත් ජාතීන්ගේ යෝජනා සමග එකඟ වීම - 16

යුක්තියේ ප්‍රමාදය - 16

අපරාධමය වගවීම - 16- 17

යුක්ත පසිදලීමේ ක්‍රියාදාමයේ විවිධත්වය නොමැති වීම. - 17

අධිකරණ කාර්ය මණ්ඩලය තුළ පරිපාලන අදක්ෂභාවය - 17

අධිකරණය - 17 - 18

**පරිච්ඡේදය - 01**

1. **චූදිතගේ මූලික අයිතිවාසිකම්** - 19

1.1.ආරක්ෂාව සඳහා ඇති අයිතිවාසිකම - 19

1.2.නිර්දෝශීභාවයේ පූර්ව නිගමනය -20

1.3. වධ හිංසාවට හෝ පහත් සැළකිල්ලට ලක් නොවී සිටීමේ අයිතිවාසිකම - 20

1.4. නිහඬව සිටීමට ඇති අයිතිවාසිකම - 22

1.5.නීතිඥ නියෝජනය සඳහා ඇති අයිතිවාසිකම - 22

1.6. නීතියේ නිසි ක්‍රියාදාමයට ඇති අයිතිවාසිකම - 23

1.7.නීතියේ සමාන ආරක්ෂාවට ඇති අයිතිවාසිකම - 24

1.8. දෙවරක් වරදකරුවකු වීමේ අන්තරායට එරෙහි අයිතිවාසිකම -24

1.9. අතීතයට බලපාන ලෙස නීති පැනවීමට එරෙහිව ඇති අයිතිවාසිකම - 25

1.10. චෝදනා දැන ගැනීමට ඇති අයිතිවාසිකම - 25

1.11. ඇප ලබා ගැනීමට ඇති අයිතිය -25

1.12. භෂා පරිවර්තනය සඳහා ඇති අයිතිය - 26

1.13.නීති විරෝධී සෝදිසි කිරීම සහ තහනම් කිරීම්වලට එරෙහි අයිතිවාසිකම - 27

1.14. පොලීසිය සිදුකරන නීති විරෝධී රඳවා ගැනීමට එරෙහි අයිතිවාසිකම - 28

**පරිච්ඡේදය 02**

විත්තිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥයන්ගේ යුතුකම් සහ වගකීම් - 29

2.1. නැවත බැලීම සහ ශ්‍රී ලාංකීය ජාතික රාමුව - 29

2.2. ජාත්‍යන්තර රාමුව - 30

2.3. නිශ්චිත යුතුකම්, වගකීම් සහ විත්තිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥයන්ගේ අයිතිවාසිකම් - 30

2.3.1. සේවාදායකයාගේ තොරතුරු වල රහස්‍ය භාවය ආරක්ෂා කිරීමේ වගකීම- 30

2.3.2. අතිශය උද්යෝගිමත් අද්වකාත් වරයකු වීමේ වගකීම - 31

2.3.3. අත්‍යවශ්‍ය විමර්ශන කිරීමේ වගකීම - 32

2.3.4. ස්වාධීන වීමේ වගකීම - 33

2.3.5. ආචාර ධර්ම වලට අනුකූල වීමේ වගකීම -33

2.3.6. නියෝජනය සිදු කිරීමේදී ගැටළු ඇති කර ගැනීමෙන් වැළකී සිටීමේ වගකීම - 34

2.3.7. අධිකරණය තුළ නියෝජනය සැපයීමේ වගකීම - 34

2.3.8.රැඳවුම් බාරයේ සිටින සේවාදායකයන්ට ප්‍රවේශය ලබා ගැනීමට ඇති අයිතිවාසිකම- 35

**<u>3 වන පරිච්ඡේදය</u>**

<u>සේවාදායකයා</u>

3.1. ප්‍රාථමික අවස්ථාවේ සේවා යෝජකයා සමග සම්මුඛ සාකච්ඡාව - 34 -36

3.2. මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා ප්‍රායෝගික උපදෙස් - 36 -37

3.3. නීතිඥයා හා සේවාදායක සහයෝගීතාවය ගොඩ නැගීම -38

3.4. ප්‍රාථමික සේවා යෝජකයා සමග සම්මුඛ සාකච්ඡාවේ හරි වැරදි බැලීමේ ලේඛනය-39 -42

3.5. විශේෂ ජනගහන - 42- 46

3.5.1. ළමුන් - 46

3.5.2. කාන්තාවන් - 46

3.5.3. නාරි මෛතුන්‍ය, සමලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති ලිංගිකයන් (ලිංගික පරිවර්ථනයට ලක්වූවන් ) , අන්තර් ලිංගිකත්වය -50

3.5.4 මානසිකව රෝගී වූ වන් - 51

**<u>4 වන පරිච්ඡේදය</u>**

වධ හිංසාවට සහ/හෝ මානව හිමිකම් කඩවීමට ලක්වූ සේවාදායකයකු නියෝජනය කිරීම - -53

4.1. වධ හිංසාව සාමාන්‍ය අර්ථ කථනය - 53 -54

4.2. වධ හිංසාව පිළිබඳ ජාත්‍යන්තර නීත්‍යානුකූල අර්ථ කථනය - 54

4.3. ශ්‍රී ලංකාවේ නෛතික රාමුව සහ වධ හිංසාව -54

4.4. සම්මුඛ පරීක්ෂණයට සූදානම් වීම හා ඉදිරියට කරගෙන යාම - 55

4.5. වධ හිංසාවට පාත්‍ර වූ වින්දිතයන් සම්මුඛ පරීක්ෂණයට බඳුන් කිරීමේ
ප්‍රායෝගික මිණුම් දඬු
-57
4.6. වධ හිංසාව සහ/හෝ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ
මුහුණ දෙනු ලැබූ පුද්ගලයන්ට ආදර්ශ ප්‍රශ්න - 57
4.7. වධ හිංසාවට පාත්‍ර වූ වින්දිතයන් පිළිබඳව පොදුවේ නිරීක්ෂණය කරන ප්‍රතිචාර - 57
4.8. වධ හිංසාවට සහ/හෝ මානව හිමිකම් උල්ලංඝණයන්ට භාජනය වූ සේවාදායකයකු සමග
සම්මුඛ පරීක්ෂණය පවත්වා අවසානයේදී නීතිඥවරයා සතු විය යුතු තොරතුරු -59
4.9. චෝදනාව මෙහෙයවන නීතිඥවරයා හෝ විනිසුරුවරයා වෙත ප්‍රවේශ වීමේ ප්‍රායෝගික
පියවර - 59
4.10. ඉස්තාන්බුල් ප්‍රටකෝලය (2004) සහ වධහිංසාව - 60
4.11. ස්ත්‍රී පුරුෂ සමාජානුභාවය පිළිබඳ කරුණු සහ වධහිංසාව - 61 -62
4.12. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කඩවීම් පිළිබඳව අධිකරණයෙන් බාහිර විසඳුම් - 63

**5 වන පරිච්ඡේදය**

විත්ති පාර්ශවයේ නඩුවේ න්‍යාය හා තේමාව

5.1. හැඳින්වීම සහ නඩුවේ සීමාවන් නිර්මාණය කිරීම - 63
5.2. නඩුවේ න්‍යාය තීරණය කිරීම - 63 -65
5.3. නඩුවේ තේමාව තීරණය කිරීම - 66-67
5.4. කතාව කියවීම සහ න්‍යාය සහ තේමාව ඉදිරිපත් කිරීම කිරීම - 67
5.5. විත්ති වාචක - 68
5.5.1. තොරතුර පිළිබඳ වැරදීම - 68
5.5.2. යහපත් චේතනාව - 68
5.5.3. ආත්මාරක්ෂාව - 69
5.5.4. අවාසනාව - 69
5.5.5. මත්වීම - 69
5.5.6. කැමැත්ත - 70
5.5.7.තර්ජනය - 70
5.5.8. අන්‍යස්ථානිකභාවය -70
5.5.9. පොදු අරමුණින් හෝ සාමූහික අපරාධ ක්‍රියාවෙන් ඉවත් වීම - 71
5.5.10. මුලා වීම - 72 -74
5.5.11. අධිකරණ සමාව - 75
5.5.12. නීතිය පිළිබඳ වරද - 75
5.5.13. ධාරිතාවය නැතිකම - 75

5.5.14. උන්මත්තක භාවය - 75

<u>6 වන පරිච්ඡේදය - අධිකරණ බලය</u>

6.1. මහේස්ත්‍රාත් අධිකරණය -75

6.2. මහාධිකරණය - 76-77

6.3. අභියාචන අධිකරණය - 77 -78

6.4. ශ්‍රේෂ්ඨාධිකරණය - 78

6.5. අනෙකුත් නීති යටතේ සිදුකළ වැරදි පිළිබඳ අධිකරණ බලය - 79

<u>7 වන පරිච්ඡේදය</u>

විමර්ශන අවස්ථාව -

7.1. චෝදනාව - 79 -82

7.2. අත්අඩංගුවට ගැනීම - 82

7.2.1. නීති විරෝධී අත්අඩංගුවට ගැනීම -82

7.2.2. වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම -83-84

7.2.3. වරෙන්තුවක් සහිත අත්අඩංගුවට ගැනීම - 85

7.2.4. සංඥෙය නොවන වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම - 86

7.2.5. පුද්ගලයන් සිදුකරන අත්අඩංගුවට ගැනීම - 86

7.2.6. මහේස්ත්‍රාත්වරයා විසින් අත්අඩංගුවට ගැනීම - 87

7.2.7. ළමා අපයෝජයක් සිදුකළ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම - 87

7.3. සෝදිසි කිරීම් - 88

7.3.1. අත්අඩංගුවට ගත් පුද්ගලයන් සෝදිසි කිරීම - 88

7.3.2. කාන්තාවන් සෝදිසි කිරීම - 88

7.3.3. ස්ථානය සෝදිසි කිරීම - 88

7.4. දේපළ සහ ලේඛන අත්අඩංගුවට ගැනීම - 89

7.5. සිතාසි -89

7.6. පශ්චාත් මරණ පරීක්ෂණ - 89

7.7. රැඳවුම් භාරය - 90-91

7.8. පොලීසිය සිදුකරන ප්‍රශ්න කිරීම - 92 -98

7.9. චූදිත සිදුකළ ප්‍රකාශය - 98 -100

7.10. නිශ්ශබ්දව සිටීමේ අයිතිවාසිකම - 100

7.11. පොලීසිය සේවාදයකයාට සිදුකළ අයහපත් සැළකිලි - 100

7.12. නඩුවට අවශ්‍ය සාක්ෂි ලබා ගැනීම -101

## 8 වන පරිච්ඡේදය - නඩු විභාගයට පෙර කරුණු


8.1. ඇප - 101-102

8.2. ඇප පිළිබඳ ප්‍රශ්නාවලිය - 102 - 106

8.3. අයැද සිටීම - 106

8.3.1. වරදකරු ද නිවැරදිකරු ද - 106 -108

8.3.2. ආයාචනයන් පිළිබඳ ගනුදෙනුවක් මෙහෙයවීම - 108

8.4. ප්‍රාථමික පරීක්ෂණය - 108 -110

8.5. නඩු විභාගයට සූදානම් වීම - 112


## 9 වන පරිච්ඡේදය

නඩු විභාගය


9.1. මහේස්ත්‍රාත් අධිකරණ ක්‍රියා පටිපාටීන් - 113

9.1.1. ප්‍රාථමික පරීක්ෂණය - 113 - 115

9.1.2.මහේස්ත්‍රාත් අධිකරණයේ ලඝු නඩු විභාගය - 116

9.2. මහේස්ත්‍රාත් උසාවි නඩු ඇසීමේ ගැලීම් සටහන - 120

9.3. මහාධිකරණය කාර්ය පටිපාටිය - 121

9.3.1. මහාධිකරණය ජූරිය නොමැතිව විනිසුරු නඩු විභාගය පැවැත්වීම - 122

9.3.2. මහාධිකරණය ජූරිය සමග නඩු විභාගය පැවැත්වීම - 124

9.3.3. ජූරිය තෝරා ගැනීම සහ ඒ සමග අදල වන සාමාන්‍ය ක්‍රියාදමයන් - 125

9.3.4. චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සහ විත්තිය වෙනුවෙන් නඩුව අවසන් කිරීම - 125 - 127

9.3.5. නඩු විභාගය අවසන්කිරීම - 128 - 131

9.4. මහාධිකරණයේ ගැලීම් සටහන - 132

9.5. අධිකරණ ශාලාව තුළ ආචාර ධර්ම සහ සිරිත් විරිත් - 132 -133

9.6. විවෘත ප්‍රකාශ - 133 -134

9.6.1. සාමාන්‍ය - 134

9.6.2. අදාළ ව්‍යවස්ථාව - 134

9.6.3. එලදායී ලෙස විවෘත ප්‍රකාශයක් කිරීම. - 134

9.6.4. එලදායී විවෘත ප්‍රකාශයක් ලබාදීම සම්බන්ධ වැඩිදුරටත් ප්‍රායෝගික කරුණු - 135

9.7. ඍජු පරීක්ෂණ (මූලික පරීක්ෂණය) - 136

9.7.1. අදල ව්‍යවස්ථාව - 136

9.7.1.1. මහේස්ත්‍රාත් අධිකරණය; මහේස්ත්‍රාත්වරයා විසින් නඩු ඇසීම - 136

9.7.1.2. මහාධිකරණ විනිසුරුවරුන් හා නඩු විභාග කිරීම - 135

9.7.1.3. මහාධිකරණය නඩු විභාගය ජූරිය සමග - 136 -137

9.7.1.2. මූලික පරීක්ෂණයක් කිරීමේදී මතක තබාගත යුතු කරුණු -137

9.8. සාක්ෂි දීමට චූදිත කැඳවීම - 138

9.9. හරස් ප්‍රශ්න ඇසීම - 139

9.9.1. සාමාන්‍ය - 139

9.9.2. අදාල ව්‍යවස්ථා - 140

9.9.3. හරස් ප්‍රශ්න ඇසීම පිළිබඳ ප්‍රායෝගික කරුණු - 140

9.9.4. හරස් ප්‍රශ්න ඇසීම සඳහා වැඩිදුර සූදනම් වීම - 140

9.10. නැවත විභාගය - 141

9.11. තර්ක කිරීම අවසන් කිරීම - 141

9.11.1. සාමාන්‍ය - 141

9.11.2. ප්‍රයෝජනවත් ප්‍රායෝගික කරුණු - 141

9.12. පරීක්ෂණය :- සාධාරණ සැකයෙන් ඔබ්බට වරදකරු වීම - 142

9.13. චෝදනාව මෙහෙයවන නීතිඥවරයා නඩුව අවසන් කිරීමේදී නිදහස් කිරීමට අධිකරණයට ඉල්ලුම් කිරීම - 142

## 10 වන පරිච්ඡේදය

## සාක්ෂ්‍ය රීතිය

10.1. සාමාන්‍ය - 144

10.2. තහවුරු කිරීම - 144

10.3. ප්‍රවාදක සාක්ෂි - 144

10.4. ලේඛනගත සාක්ෂ්‍ය - 145

10.5. පරිවේෂණීය සාක්ෂ්‍ය - 147

10.6. වාචික සාක්ෂ්‍ය - 148

10.6.1. ළමුන් - 148

10.6.2. අපරාධ සහයකයන් - 150

10.6.3. විශේෂඥයන් - 151

10.6.4. සාක්ෂි විශ්වසනීයතාව - 152

10.7. ඩී.එන්.ඒ. ඇඟිලි, අත්ල, පා සටහන් සහ අත්අකුරු -153-154

10.8. හඳුනා ගැනීමේ පෙරෙට්ටුව - 154

10.9. පරීක්ෂණක සාක්ෂි - 155

10.10. දිව්රුම් ප්‍රකාශ - 155

10.11. ඇතුළත්කිරීම් - 156

10.12. පාපොච්චාරණ/වරද කියාපෑම් -157

10.13. ගිනි අවි - 158-160

<u>**11 වන පරිච්ඡේදය - පශ්චාත් නඩු විභාග කිරීම**</u>

11.1. දඬුවම් පැමිණවීම් - 160

11.1.1. සාමාන්‍යය - 160

11.1.2. ශ්‍රී ලංකාවේ දඬුවම් පැමිණවීමේ රාමුව - 160

11.1.3. දඬුවම් පැමිණවීම අඩු කරන සහ බරපතල කරන තොරතුරු -161

11.1.4. සිර දඬුවම් නියම කිරීමෙන් පසු ප්‍රතිඵල

11.1.4.1. මූල්‍යමය වන්දි -163

11.1.4.2. ප්‍රජා සේවා ආඥා - 164

11.1.4.3. බන්ධනාගාරගත කිරීම - 164

11.1.4.4. අත්හිටවූ සිර දඬුවම් -164

11.1.4.5. කොන්දේසිගත නිදහස් කිරීම් - 165

11.1.4.6. මරණ දණ්ඩනය - 165

11.1.4.7. කාන්තාවන් -166

11.1.4.8. අදාල ව්‍යවස්ථාව - 167

11.2. අභියාචනා - 167

11.2.1. සාමාන්‍ය - 168

11.2.2. මහේස්ත්‍රාත් අධිකරණයේ සිට අභියාචන අධිකරණය දක්වා -170

11.2.3. මහාධිකරණයේ සිට අභියාචන අධිකරණය දක්වා - 171

11.2.4. අභියාචනයේ ප්‍රතිඵලය - 172

11.2.5. අභියාචනයට අවසර දීම අවශ්‍යය වන අවස්ථා - 172

11.2.6. ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කිරීම - 173

11.3. අධිකරණමය සමාලෝචනය - 174

<u>**12 වන පරිච්ඡේදය**</u>

<u>අනෙකුත් අදාලත්වයක් ඇති දේශීය ව්‍යවස්ථා.</u>

12.1. මරණ දඬුවම - 175

12.1.1. ශ්‍රී ලංකාවේ මරණ දඬුවමින් දඬුවම් කරනු ලබන අපරාධ සහ වැරදි -176

12.1.1. මරණ දඬුවමින් බැහැර කළ වැරදි පිළිබඳ වර්ගීකරණය - 176

12.1.2. 1. වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන් - 177

12.1.2.2. ගර්භනී කාන්තාවන් - 177

12.1.2.3. බුද්ධිමය වශයෙන් අබල වූ - 177

12.1.2.4. මානසික රෝගී වූ - 178

12.2. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත - 179

12.2.1. සාමාන්‍ය - 179

12.2.2. මෙම පනතට සහ එය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන මානව හිමිකම් පිළිබඳ කරුණු - 179

12.3. අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ පනතට අයත් කාර්යාලය (2016 අංක 14) - 179

12.3.1. අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්‍යාලයේ වරණය - 180

12.3.2. අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්‍යාලයේ බලතල -180

12.3.3. අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්‍යාලයේ ක්‍රියාකාරීත්වයන් සහ වගකීම් - 181

12.3.4. එහි සොයා ගැනීමේ ඒකකය සහ වින්දිත සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම - 181

12.4. මරණ ලියාපදිංචිය (තාවකාලික ප්‍රතිපාදන පළිබඳ සංශෝධනය) 2016 අංක 16 දරන පනත - 181

12.5. තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය පිළිබඳ පනත (2016 අංක 12) - 182

12.6. බලය යොදා සිදුකරන අතුරුදහන් කිරීම් වලින් සියලු පුරවැසියන් ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (2018 අංක 5) - 182

**13 වන පරිච්ඡේදය - අපරාධයට සම්බන්ධ පුද්ගලයන්**

13.1. සාමාන්‍ය - 182

13.2. විනිසුරුවරු - 183

13.3. මහේස්ත්‍රාත්වරු -184

13.4. සාමදාන විනිශ්චයකාරවරු සහ නිල නොවන මහේස්ත්‍රාත්වරු - 184

13.5. නඩු පවරන්නන් - 185

13.6. පොලීසිය - 185

13.7. අධිකරණ වෛද්‍ය නිලධාරීන් - 186

13.8. හදිසි මරණ පරීක්ෂකවරුන් - 187

13.9. විශෝධන සේවා සහ බන්ධනාගාර නිලධාරීන් - 188

13.10. අධිකරණ භාෂා පරිවර්තකයන් - 188

13.11. ජූරි සභා සාමාජිකයන් - 189

13.12. නීති ආධාර කොමිෂම - 189

13.13. ශ්‍රී ලංකා අධිකරණ සේවා කොමිෂම - 189

13.14. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂම - 189

**14 වන පරිච්ඡේදය**

වාර්තා කිරීමේ අකෘතිය/රටාව සහ උප ග්‍රන්ථය/පරිශිෂ්ටය

(1) නීති සේවා සඳහා මූලික ගිවිසුම

(2) එළිදරව් කිරීම සඳහා මෝෂම/ඉල්ලුම් පත්‍රය

(3) එළිදරව් කිරීමට බල කරන මෝෂම/ඉල්ලුම් පත්‍රය

(4) නිශ්ප්‍රභා කිරීමට මෝෂම/ඉල්ලුම් පත්‍රය; චෝදනා ප්‍රමාණවත් නොවීම හෝ සදෙස් වීම

(5) යටපත් කිරීමට මෝෂම/ඉල්ලුම් පත්‍රය; වරෙන්තුවක් නොමැතිව සාක්ෂි ලබා ගැනීම

(6) තර්ක කිරීමේ ප්‍රධානීන්; සැල කර සිටීම් අවසන් කිරීම

(7) තර්ක කිරීමේ ප්‍රධානීන්; දඬුවමට එරෙහිව අභියාචනා කිරීම

(8) මෝෂම/ඉල්ලුම් පත්‍රය; අභියාචන ප්‍රතිඵලය බහා තැබීම, නිදහස් කිරීම

(9) මහේස්ත්‍රාත් අධිකරණයේ ගැලීම් සටහන

(10) මහාධිකරණයේ ගැලීම් සටහන

## 15 වන පරිච්ඡේදය

දේශීය නීති/ආඥා පනත්

1. දණ්ඩ නීති සංග්‍රහය (1883 අංක 02 දරන ආඥා පනත)
2. අපරාධ නඩු විධාන සංග්‍රහ පනත (1979 අංක 15)
3. සාක්ෂි (විශේෂ විධි විධාන) පනත (1995 අංක 14)
4. ඇප පනත (1997 අංක 30)
5. අධිකරණ සංවිධාන පනත (1978 අංක 02)
6. පීඩාකාරී ආයුධ පනත (1996 අංක 08)
7.ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (1979 අංක 48)
8. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කාර්යාලය පිළිබඳ පනත (2016 අංක 14)

9. සාක්ෂි ආඥා පනත
10. ළමුන් සහ තරුණ පුද්ගලයන් පිළිබඳ ආඥා පනත

ජාත්‍යන්තර සම්මුතීන්.

1. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
2. වධහිංසාව සහ අනෙකුත් කෲර අමානුෂික හෝ පහත් කොට සැළකීම් හෝ දඬුවම් වලට එරෙහි සම්මුතිය
3. වධහිංසාව සහ අනෙකුත් කෲර අමානුෂික හෝ පහත් කොට සැළකීම් හෝ දඬුවම් වලට එරෙහි සම්මුතියට අදල වෛකල්පිත ප්‍රොටකෝලය
4. බලය යොදා සිදුකරන අතුරුදහන් කිරීම් වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය
5. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය
6. කාන්තාවන් ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය

ජාත්‍යන්තර ප්‍රකාශයන්/මූලධර්මයන්/ප්‍රතිපත්ති

1. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
2. කාන්තා සිරකාරියන්ට සැලකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ රීතීන් සහ කාන්තා වැරදිකාරියන් පිළිබඳ රැකවරණය ලබා නොදීම පිළිබඳ මිණුම් දඬු
3. අපරාධ යුක්ති ක්‍රියාදාමය තුළ නීති ආධාර ලබා ගැනීමේ ප්‍රවේශය පිළිබඳ එක්සත් ජාතීන්ගේ

මූලධර්ම සහ ප්‍රතිපත්තීන්

4. නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්

5. ආසියානු මානව හිමිකම ප්‍රකාශය

සංවිධාන

1. ජාත්‍යන්තර නීතීඥ සංගමය

2. ශ්‍රී ලංකා නීතිඥ සංගමය

3. නීති ආධාර කොමිෂම

මෙම අත්පොත භාවිතා කරන්නේ කෙසේද

මෙම අත් පොතේ පළමු කොටස මගින් ශ්‍රී ලංකාවේ අපරාධ නීතියට අදාල මූලික ගැටළු සහ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ කරුණු සලකා බලයි.

එහි පළමු හා දෙවන පරිච්ඡේද චූදිතගේ අයිතිවාසිකම් මෙන්ම වින්තිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම සලකා බලයි.

3 වන පරිච්ඡේදය සේවාදයකයාගේ විශ්වාසය ගොඩනගා ගන්නා ආකාරය ගැන මගපෙන්වීමක් සපයන අතර අවදානමකට ලක්විය‍හැකි විශේෂිත කණ්ඩායම් (විශේෂිත ජන කොට්ඨාශ) වලට අදල තත්ත්වයන් ද සලකා බලයි.ඒ අය අතරට ළමුන්, කාන්තාවන්, නාරි මෛථූන (කාන්තා සමලිංගිකයන්) , සමලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්තික ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ inter sex (අන්තර් ලිංගිකත්වය) සහ මානසික වශයෙන් ආබාධිත අය ඇතුළත්වේ.

එහි 4 වන පරිච්ඡේදය වධ හිංසාවට හෝ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝණයන්ට ගොදුරු වූ සේවාදයකයකු වෙත ලගාවී ඔහු නියෝජනය කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් මගපෙන්වීම සපයයි.

5 වන පරිච්ඡේදය නඩුවක් සදහා සූදානම් වීම සහ නඩුවට අදාල තේමාව සහ ඊට අදාල න්‍යායන් ගොඩනගා ගැනීම මෙන්ම ශ්‍රී ලංකාවේ විශේෂිත ආයාචනා සම්බන්ධව පැහැදිළි කරයි.

6 වන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණවල අධිකරණ බලය ගැන සලකා බැලීමක් ලබා දේ.
7 වන පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ නඩුවක විමර්ශන අවස්ථා පැහැදිළි කරයි.
8 වන පරිච්ඡේදය නිශ්චිත නඩු විභාග ගැන සහ ඊට අදල තත්ත්වයන් ගැන සවිස්තරාත්මකව සලකා බලයි. මීට අමතරව පූර්ව නඩු විභාග කරුණු ද සලකා බැලේ.
9 වන පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ නඩු විභාග කිරීම සහ ඒ සම්බන්ධ කරුණු සලකා බලයි.
10 වන පරිච්ඡේදය සාක්ෂි වලදී අදල රීති පිළිබඳව සාකච්චාවක් ලබා දෙයි.

11 වන පරිච්ඡේදය දඬුවම, අභියාචනය සහ සමාලෝචනය යන පශ්චාත් නඩුව පිළිබඳව කරුණු සලකා බලන අතර,

12 වන පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ අනෙකුත් ව්‍යවස්ථා, එනම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ ඊට සම්බන්ධ කරුණු පිළිබඳ විස්තර සපයයි.

13 වන පරිච්ඡේදයට ද ඉහත කරුණු සම්බන්ධ වන අතර ඒ සමගම අපරාධ යුක්තියට සම්බන්ධ අය ගැන, ශ්‍රී ලංකා අපරාධ යුක්ති යාන්ත්‍රණය ගැන සාකච්ඡා කර ඇත.

14 සහ 15 වන පරිච්ඡේද නිශ්චිත ඇමුණුම් ලබා දෙන අතරම මෙම අත් පොත සැකසීමේදී ඒ සදහා උපයෝගී කරගන්නාලද සම්පත් දායකයින් සහ ඒ සදහා සහාය ලබාදෙන ලද නීතිඥයින් සම්බන්ධයෙන්ද දක්වා ඇත.

අලුත්න් නීතිඥ වෘත්තියට පිවිසෙන ලද අයට මෙන්ම පළපුරුදු වෘත්තිකයන්ටත් මෙම අත්පොතෙහි ඇති අන්තර්ගත කරුණු මෙන්ම මෙහි දක්වා ඇති පරිශීලණය කරණු ලැබූ ග්‍රන්ත

නාමාවලිය ආදියෙන්ද ස්වකීය වෘත්තීය ජීවිතයේදී ප්‍රයෝජනවත් වෙනු ඇතැයි අපගේ අවංක බලාපොරොත්තුවයි .

හැඳින්වීම

මෙම වෘත්තීය අත්පොත මගින් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පසිඳලීමේ ක්‍රියාදාමයට අදාල සියළු කරුණු සම්බන්ධයෙන් හරයාත්මක සහ ක්‍රියාකාරී නෛතික උපදෙස් ලබාදීමට අරමුණු කරනු ලබයි. එහිදී ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රියාදාමයේ සියලුම අංශයන් සහ සේවාදයක අයිතිවාසිකම් සහ නීතිඥවරුන්ගේ වගකීම්, කාර්යපටිපාටිය සහ සාක්ෂි පිළිබඳ රීති සහ නඩු විභාග පිළිබඳ කරුණු ද ඊට අමතරව, දඬුවම් පැමිණවීම සහ අභියාචන ද ඇතුළත් කර තිබේ.

අප විසින් මෙම අත්පොත සැකසීමේදී ශ්‍රී ලංකාව තුළ හා පිටත යුක්තිය පිළිබඳ විවිධ උනන්දුවක් ඇති අයගේ උපදෙස් ලබා ගන්නා ලදි.

මෙම අත්පොත යොමුව ඇත්තේ ශ්‍රී ලංකාවේ අපරාධ සහ අපරාධ නඩු විධාන සංග්‍රහය වන අතරම එයින් වඩාත් අරමුණු කරගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ අපරාධ වැරදි සඳහා චෝදනා එල්ල වී ඇති සේවාදයකයන් නියෝජනය කරන අපරාධ පිළිබඳ පෙනී සිටින විත්තියේ නීතිඥවරුන් වෙතයි.

එමෙන්ම ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රියාදාමයට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන්ට (සීමාවක් නොවී) එනම් නඩු පවරන්නන්ට, අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ට, පොලිස් නිලධාරීන්ට සහ බන්ධනාගාර නිලධාරීන්ට වටිනා මාර්ග උපදේශයක් සපයන ග්‍රන්තයක් බවට මෙම අත්පොත පත්කිරීම අපගේ තවත් බලාපොරොත්තුවකි.

අයිස්ලින් බ්‍රවුන්<br>
වැඩසටහන් කළමනාකරු<br>
යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතාව (IBJ)

ජාකස් ඩී. ප්‍රිස්<br>
නීති පුහුණු අධ්‍යක්ෂක<br>
යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතාව (IBJ)

පූර්විකාව

වර්ථමානයේ ශ්‍රී ලංකාවේ පශ්චාත් යුදමය තත්ත්වයක් පවතී.ඒ අනුව ශ්‍රී ලංකාව තුල නීතියේ ආධිපත්‍ය යලි තහවුරු කිරීමට කැපවීසිටීම මෙන්ම නෛතික ආයතන සහ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය නැවත ඇති කිරීම අවශ්‍යයවේ.එහිදී සත්‍යය සොයා ගැනීමෙහිලා අතීතය විමසීමටය අපිට ධෛර්යයක් තිබිය යුතු අතර එයට මුහුණ දීමේ ශක්තියක් ද තිබිය යුතුය.තවද වරදකරුවන් රදවා තබාගැනීම සම්බන්ධයෙන් වගවීම සහ වින්දිතයන්ට සහන සැලසීම (වන්දි ගෙවීම) සහතික කිරීම අවශ්‍යය වේ.

අනාගතයයෙදී සමානත්වය ඇතිකර ගැනීම සදහා පුරවැසියන් සවිබල ගැන්වීම අවශ්‍යය වන අතර ඒ සදහා ඔවුන්ට ඇති සුවිශාල අයිතීන් පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීමෙන් මෙන්ම ඒ සදහා අවශ්‍යය සම්පත් සැපයීම මගින් එය සිදුකළ හැකිය.

එමෙන්ම අපේ නෛතික ආයතන සදහා වර්ථමානයේ භාවිතාවන ජාත්‍යන්තර ප්‍රමිතීන් අදාල කර ගැනීම මගින් අපගේ නෛතික ආයතන තුළ වඩාත් යහපත් ප්‍රායෝගික භාවිතාවන් ක්‍රියාත්මක කිරීම සහ එකී ආයතන ශක්තිමත් කිරීම සිදුකළ හැකිය.
මේ සංක්‍රාන්ති කාල පරිච්ඡේදයයි තුල නීති වෘත්තිකයන්ට දෙන මෙම අත්පොත අත්‍යාවශ්‍යය නෛතික සම්පතක් ලෙස සලකා දැඩි උනන්දුවකින් යුතුව එය පිළිගනු ලැබේ

මෙම අත්පොත දැඩි ඕනෑකමකින් සහ අත්‍යාවශ්‍යය නෛතික සම්පතක් තෑග්ගක් ලෙසත් ඉතා තියුණු ආශාවකින් පිළිගනු ලැබේ. එය පවත්නා නීති සාහිත්‍යය තුළ තීරණාත්මක හිඩසක් පුරවන අතරම, නීති වෘත්තිකයන්ට මෙන්ම උගත් ප්‍රජාවේ සාමාජිකයන්ට සහ නීතිය සම්බන්ධ පුද්ගලිකව උනන්දුවක් ඇති පුරවැසියන්ට අත්‍යාවශ්‍යය ප්‍රවේශ ග්‍රන්ථයක් ලබාදීමකි.
මෙම අත්පොත විෂය පථය අනුව පමණක් සම්පූර්ණ නොවන අතර එය නෛතික බලධාරීන්ට සහ අපරාධ යුක්ති ක්‍රියාදාමය සම්බන්ධ පුද්ගලයන්ට පමණක් නොව සාමාන්‍ය ජනතාවට , අපක්ෂපාතී, ප්‍රායෝගික සහ අනාගතය දැනගැනීමට කැමති සියල්ලන්ටම සුදුසුය පරිශීලනයට හිතකාමී ප්‍රායෝගික ග්‍රන්ථයකි .
ශ්‍රී ලංකාවේ නීතිඥවරුන්ට මෙම අත්පොත ප්‍රයෝජනවත් ග්‍රන්තයක් වනු නොඅනුමානය මෙම ග්‍රන්තය මගින් අපරාධ යුත්තිය පසිදලීමේ ක්‍රියාවලියට අදාල ප්‍රධාන තොරතුරු ලබාදෙයි. එනම් සේවාදයකයාට අවශ්‍යය සම්මුඛ පරීක්ෂණ ලබාදීමේදී අවශ්‍යය ප්‍රශ්නාවලි, නඩු විභාගයට සූදානම් වීම සහ කේවල් කිරීම තොරතුරු සහ වෘත්තීය නිපුණතාවය වැඩිදියුණුකර ගැනීමට ශ්‍රී ලංකාවේ නීතිඥවරුන්ට මෙම අත්පොත ප්‍රයෝජනවත්වනු ඇත. එය ඔවුන්ට ඉතා හොඳ වෘත්තීය හැකියාවක් වර්ධනයකර ගැනීමට මෙන්ම ඵලදායී ලෙස සහ සාර්ථකව තම සේවාදයකයන් නියෝජනය කිරීමට ද, අවස්ථාව ලබාදෙනු ඇත.
මෙම අත්පොත ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම පවතින මෙවන් සමයක්තුල මතුවන නෛතික ගැටළු විසඳීම සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇති බව අපගේ විශ්වාසයයි. මානව හිමිකම් පිළිබඳ කරුණු, සංක්‍රාන්තික යුක්තිය, හෝ සාමාන්‍යය අපරාධ නෛතික කරුණු සම්බන්ධයෙන් උනන්දු වන සහ ඒවා සමග ගනුදෙනු කරන හෝ ඒ සම්බන්ධයෙන් කැමැත්ත ඇති ඕනෑම පුද්ගලයකුට පරිශීලනය කළ හැකි නෛතික කරුණු අඩංගු ඉතා ප්‍රයෝජනවත් ග්‍රන්තයක් ලෙස මෙය නිර්දේශ කළ හැකිය.

නොයල් ඩයස් පියතුමා
නීතිඥ
සභාපති කතෝලික නීතිඥ සංගමය
ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති පිළිබඳ මහාචාර්ය

ප්‍රියන්ත ගමගේ
නීතිඥ
සාම විනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත්
ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂමේ නීති කොමසාරිස්
ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක කමිටු සාමාජික
සංහිඳියාව පිළිබඳ කලාපීය කාර්ය බලකායේ කමිටු සාමාජික
කෑගල්ල නීතිඥ සංගමයේ සභාපති

පදනම ගැන බැලීමක්

ශ්‍රී ලංකාව, පොදු නීතිය ක්‍රියාත්මක වන රටකි. මෙය සිවිල් නීති සම්ප්‍රදය සමග සැසඳීමේදී සංග්‍රහගත කරන ලද නීතියක් වන අතර, ව්‍යවස්ථාවන් ප්‍රබලවම ක්‍රියාත්මක වේ. පොදු නීති සම්ප්‍රදය නඩු තීන්දු මත ඉතා දැඩිව රැඳී පවතින අතර (පූර්ව නිදර්ශන න්‍යාය සමග සිටීම සහ තීරණය කරන ලද කරුණු වෙනස් නොකළ යුතුය සහ තීරණයකට හේතුව සහ පදනම) අධිකරණ මතවාද අනුව විජාතික නීතිය අර්ථකථනය කිරීමට උදව් දීම සහ ජාතික නීතිය අදාල කිරීම වේ. උඩරට නීතිය, රෝම ලන්දේසි නීතිය, ඉංග්‍රීසි නීතිය, තේසවලාමේ සහ මුස්ලිම් නීතිය නෛතික ක්‍රියාදාම වල මිශ්‍රණයක් ලෙස නෛතික රාමුව සෑදී ඇත.

වඩාත් අධිකාරීමය තීරණ ලබා දෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය වන අතර එය පිළිවෙලින් අභියාචන අධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය සහ ප්‍රාථමික අධිකරණ යන දුරාවලියෙන් සැකසී තිබේ. මෙහිදී ප්‍රාථමික අධිකරණමය බලය හිමි එකම අධිකරණයන් වන්නේ මහේස්ත්‍රාත් අධිකරණය සහ මහාධිකරණය ය. ඒවාට ලැබෙන්නේ අපරාධ නීතිය සම්බන්ධ නඩු සහ අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් පිළිවෙලින් නීති පරිපාලන ඒකක ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය ක්‍රියාත්මක වන ප්‍රධාන මූලික මූලාශ්‍ර පහත පරිදිය.

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- ශ්‍රී ලංකා අපරාධ නඩු විධාන සංග්‍රහය
- ශ්‍රී ලංකා සාක්ෂි නීතිය
- ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය
- ශ්‍රී ලංකා අධිකරණ සංවිධාන පනත (විනිශ්චය පනත)

මහ අධිකරණයේදී, ශ්‍රී ලංකා රජය නීතිපති දෙපාර්තමේන්තුව හරහා අපරාධ නඩු මෙහෙයවනු ලැබේ. සාමාන්‍යයෙන් මිනීමැරුම් නඩු සහ රජයට එරෙහි නඩු මහා අධිකරණයේ විභාග වන අතර අනෙකුත් අපරාධමය වැරදි මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ. මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු ඇසීම තීරණය කිරීම කරන්නේ එක් මහේස්ත්‍රාත්වරයෙක් වන අතර මහ අධිකරණයේ නඩු විනිශ්චය කිරීම විනිසුරුවරයකු හෝ ජූරියක් විසින් සිදු කරණු ලබයි.

පහළ අධිකරණ වල නඩු විභාගවලට විරුද්ධව අභියාචන විභාග කිරීම සිදුකිරීමේ හැකියාව ඇත්තේ අභියාචනාධිකරණයටයි. සෑම විටම අභියාචනයක් විභාග කරන්නේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලකි. ශ්‍රේෂ්ඨාධිකරණය කොළඹ පිහිටා ඇත. එය සෑම නඩුවකම අවසාන අභියාචකයා වේ. එහිදී සාමාන්‍යයෙන් නඩු අසන්නේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් විසිනි. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය අධිකරණයක් නැත. සමහරක් අනෙකුත් රටවල එවැන්නක් ඇත. ඒ ව්‍යවස්ථා ප්‍රතිපාදන අර්ථකනය කිරීමට සහ අදාල කර ගැනීමට ය.

(ii) <u>ජාත්‍යන්තර ගිවිසුම් බැඳීම් සහ අනෙකුත් අදාල ලෝක නෛතික ප්‍රමිතීන්.</u>

මානව හිමිකම් සහ අපරාධ යුක්තිය පිළිබඳව ජාත්‍යන්තර ගිවිසුම් ගණනාවක් ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම හෝ අදාල කර ගැනීම සිදු කරයි. මෙම ජාත්‍යන්තරගිවිසුම් වලට ඇති ජාත්‍යන්තර වගකීම් අනුව ශ්‍රී ලංකාවේ අධිකරන තුල තර්ක කිරීමට නීති වෘත්තිකයන් උනන්දු කරණු ලැබේ.

මෙම ගිවිසුම් සහ ශ්‍රී ලංකාව ඒවාට අත්සන් කළ දිනයන් අනුමත කිරීම සහ සම්මත කිරීම පහතින් දක්වා ඇත.

1. මානව හිමිකම පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1995.12.14 අනුමත කර ඇත)
2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1980 ජුනි 11 සම්මත කෙරිණි)
3. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය (1981 ඔක්තෝබර් 05 අනුමත කළා) ඒ සමගම පුද්ගලික පැමිණිලි කිරීමේ ක්‍රියාදමය පිළිගත්තා.
4. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (1991 ජූලි 12 අවසර දුන්නා)
5. වධ හිංසාව සහ අනෙකුත් කෲර අමානුෂික හෝ පහත් කොට සැලකීම් හෝ දඬුවමට එරෙහි සම්මුතිය. (1994 ජනවාරි 03 අවසර දුන්නා)
6. බලය යොදා සිදුකරන අතුරුදහන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය (2016 මැයි 25 අනුමත කළා)

7. වධ හිංසාව සහ අනෙකුත් කෲර අමානුෂික හෝ පහත් කොට සැළකීම හෝ දඬුවමට එරෙහි සම්මුතියට අදාල වෛකල්පිත ප්‍රටකෝලය (2017 දෙසැම්බර් 05 අවසර දුන්නා)

8. ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (2016 පෙබරවාරි 08 අවසර දුන්නා)

ගිවිසුම් නීතිය පිළිබඳ 1969 වියනා සම්මුතිය පහත ප්‍රකාශය කරයි. එනම් රටවල් අනුමත කළ ගිවිසුම් පිළිබඳ යහපත් විශ්වාසයන් ඇතිකර ගත යුතු අතරම ජාත්‍යන්තර ගිවසුම්වලට අනුව කටයුතු කිරීමට අපොහොසත් වන විට ඒ වෙනුවෙන් සාධාරණීකරණය කිරීමට අභ්‍යන්තර නීතියේ ප්‍රතිපාදන වල පිහිට පැතිය යුතු නැත. වැඩිදුරටත් ජාත්‍යන්තර නීතිය හොඳින් ස්ථාපිත කළ මූලධර්මයක් ඇත. එනම් රටවල් වලට වගකීමක් ලෙස ජාත්‍යන්තර නීතියේ වගකීම් සමග අනුකූල වීමට අභ්‍යන්තර නීතිය හා එකඟ වීමයි.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් ගණනාවක පාර්ශවයක් වන නමුත් විවේචනයට ලක්වන අවස්ථාවක් ලෙස මෙම සම්මුතීන් වල ඇති නෛතික වගකීම් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට සම්පූර්ණයෙන් කටයුතු නොකිරීම දැක්විය හැක.

(iii) <u>ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තිය</u>

(අ) හැඳින්වීම

ගැටුම්කාරී කාල පරිච්ඡේද වලදී විශාල මර්ධන ව්‍යාපාර වලදී විවිධ හා අසාමාන්‍ය මානව හිමිකම් උල්ලංඝණයන් සහ බරපතල වූ ප්‍රමාණවත් ප්‍රතිචාරයක් දැක්වීමට සාමාන්‍ය යුක්ති ක්‍රියාදාමය අපොහොසත් වන විට එම රටවල ඉස්මතු වූ දෙයක් ලෙස සංක්‍රාන්තික යුක්තිය අදාල කරගත හැක.[1]

පුළුල්ව ගත් කල සංක්‍රාන්තික යුක්තිය අරමුණු කරන්නේ සත්‍යය, වගවීම, වන්දි ලබාදීමයි .

2009 මැයි මස ශ්‍රී ලංකාවේ අවුරුදු 26 ක් පැවති යුද්ධය නිමා විය. යුද්ධය නිමා වී දිගු කලක් ගතව ඇති මුත් මානව හිමිකම් උල්ලංඝණයන්, බලය යොදා සිදුකරන අතුරුදහන් කිරීම්, වගවීම අඩු වීම, ආණ්ඩුවේ විනිවිද භාවය නොමැතිවීම අඛණ්ඩව සිදු වේ. 2015 ජනාධිපතිවරණයට පසුව ආණ්ඩුව සංක්‍රාන්තික යුක්තිය උදෙසා කැපවීම් සිදු කර ඇත.

(ආ) <u>එක්සත් ජාතීන්ගේ යෝජනා සමග එකඟතාවයන්</u>

2015 ඔක්තෝබර් මස ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ යෝජිත 30/1 හි සම අනුග්‍රාහකයන් විය. ශ්‍රී ලංකාව පහත කරුණද පොරොන්දු විය. ඒ යුක්තිය, සංහිඳියාව සහ මානව හිමිකම් ප්‍රවර්ධනය උදෙසා සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රන සතරක් පිහිටුවීම පිළිබඳවය.

මෙයට වගවීම (accountability) පිළිබඳ යාන්ත්‍රනය ද අදාල වේ. එය ජාත්‍යන්තර විනිසුරුවරුන්, නඩු පවරන්නන් සහ විමර්ශකවරුන් ගෙන් සමන්විත වන අතර සත්‍ය සහ සංහිඳියා යාන්ත්‍රනය, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කාර්යාලය. සහ වන්දි පිරිනැමීමේ කාර්යාලයන් ගෙන් සමන්විත වේ. නමුත් මේ දක්වා පිහිටුවා ඇත්තේ අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පමණි.

2016 ජුනි මස ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් මානව හිමිකම් කොමිෂම නිර්දේශ කළ නියෝග අනුව කටයුතු කරන ලදි. ඒ රැඳවියන් අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී සහ රඳවා ගැනීමේදී අතවර වලින් ආරක්ෂා කිරීමට කොමිසමක් පත්කිරීමෙනි. මෙයට වෛද්‍ය සහ නීති ක්ෂේත්‍රයේ උදව් සහ උපදෙස් ඇතිව අත්ඩංගුවට ගැනීම, ලියාපදිංචි කිරීමේදී රැඳවියන් ආරක්ෂා කිරීම ආදිය

[1] What is Transitional Justice ?" International Centre for Transitional Justice: Justice Trade Digital 2018, http://www.ibj.org/about/ transitional – Justice.

ඇතුලත් වේ. ශ්‍රී ලංකාව වධ හිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට සහ එකසත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කරණු ලැබේ.

ඒ පුළුල්ව පවතින වධ හිංසා පැමිණවීම සහ බලය යොදා සිදුකරන අතුරුදහන් වීම් ගැන චෝදනා පිළිබඳව එම කමිටු දෙකම බරපතල අවධානයක් යොමුකරන බව ප්‍රකාශ කර ඇත. [2]

2017 මාර්තු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (2015) නවතම යෝජනාවට අනුව ශ්‍රී ලංකාවේ තත්ත්වය සලකා බලා ඇති අතර ශ්‍රී ලංකාව සිදුකරන සම්පූර්ණ කැපවීම උදෙසා සියලු සීමා දීර්ඝ කර ඇත.

යුක්තියේ ප්‍රමාදය

අපරාධ නඩු ප්‍රමාදය නැති කිරීමට අපරාධ නඩු වලට කාලසීමාවන් පැමිණවිය යුතුය. බලය අයුතු භාවිතාව වලක්වමින් වින්දිතයන්ට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා කාලෝචිත ආකාරයකට සිදුවිය යුතුය. සමහර නඩු වසරකට එක පාරක් පමණ කැඳවයි එයට හේතුව වන්නේ පවතින අධික නඩු තදබදය නිසා දෙපාරක් කැඳවීමට අධිකරණයට පහසුකම් නොමැති වීමයි. [3]

තවද විනිසුරුවරුන් සහ නඩු පවරන්නන් නොපැමිණීම නිසාද නඩු ප්‍රමාදය සිදු වේ. නඩු කල් දැමීමට හේතු වන තවත් කරුණකි ඒ සාමාන්‍යය නඩු අසන විනිසුරු නොපැමිණි විට වෙනත් අයකුට එම නඩුව ඇසිය නොහැක. මේ පිළිබඳව යාන්ත්‍රනයක් නැත. (එනම් අධිකරණ සේවා කොමිෂමේ ප්‍රතිපාදනයන් නොමැත)[4] අධිකරණ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විවිධ නඩු කොළඹට මාරු කරන අතර නිතරම නඩු වැඩි ගණනාවක් ලැබෙන හෙයින් එය කාල සීමාවකට අනුව ඇසීම නොහැකි වී තිබේ.

අපරාධමය වගවීම (Criminal Accountability)

සිවිල් යුද්ධය වසර 26 ක් පුරා පැවතිනි. එම කාල සීමාව සිදුවූ මනුෂ්‍ය ඝාතන පිලිබඳව අපරාධමය වගවීම සංක්‍රාන්තික යුක්තියේ වැදගත් කරුණකි. 2010 දී ජනාධිපති රාජපක්ෂ උගත් පාඩම් හා සංහිඳියා කොමිෂම පිහිටුවනු ලැබූ අතර, එයට 2002 සිට 2009 දක්වා කාල සීමාව තුළ සිදුවූ සිද්ධීන් විමර්ශනයට අවස්ථාවක් හිමි විය. මෙම කොමිෂම ජාත්‍යන්තරයේ දැඩි විවේචනයට බඳුන් වූ අතර ඒ එහි වරම (බලතල) ප්‍රමාණවත් නොවීම සහ එහි පැහැදිළිව දක්නට ලැබුණු පක්ෂපාතීත්වය හේතුවෙනි.[5]

ශ්‍රී ලංකා ආණ්ඩුව චෝදනා ලැබූ අපරාධකරුවන් පිළිබඳ විමර්ශන පැවැත්වීමට සහ නඩු පැවරීමට විශේෂ අධිකරණයක් පිහිටුවීමෙන් ද අසමත් විය. 2017 දී ආණ්ඩුව ප්‍රකාශ කර සිටියේ

[2] Pinto – Jayawardane , Kishali. Will International Treaies Protect Human Rights in Sri Lanka." Colombo Telegraph, 10 December 2019, http://www.colombotelegraph .com/index.php/ Will – internantional-treadies protect-human-rights-in-sri-lanka/.

[3] Trath Behind Law's Delay" the Daily Mirror. 24 October 2016.web.16 July 2018

[4] Trath Behind Law's Delay" the Daily Mirror. 24 October 2016.web.16 July 2018

[5] De Jonge , F. (2015) , An Ad HOC Hybrid Special Court for Sri Lank : What Does it Take ? 25 September 2015. Available at http://www.peaceplacelibray.nl/2015/09/an-ad-hoic-hybrid-special-court-for-sri-lanka-what-does-ittake/

නඩු පැවැරීමේදී ජාත්‍යන්තර සහභාගීත්වයක් සිදු නොවන අතරම යුධ විරුවන්ට ( LTTE ය සමග සටන් කළ හමුදා නිලධාරීන්ට) අත නොතබන බවයි.[6]

<u>යුක්ති ක්‍රියාදාමයේ විවිධත්වය නොමැති වීම.</u>

ශ්‍රී ලාංකේය සමාජයේ සිංහලයන් බලය පවත්වනු ලබන අතර, කැපී පෙනෙන දෙමළ සහ මුස්ලිම් සුළුතරයක් සිටී. සිංහල හා දෙමළ යන භාෂා දෙකම රාජ්‍යය භාෂාවන් වේ. කෙසේ නමුත් ආයතනයේ ඇති විවිධත්වය වර්තමාන යුක්ති ක්‍රියාදාමය තුළ නිරූපනය නොවන අතර, අධිකරණ කාර්ය මණ්ඩලයේ සිටින බහුතරය සිංහල වේ. දෙමළ භාෂාව කතා කරන නඩු කියන්නන්ට නිරතුරුවම මුහුණ දෙන්න වන දුෂ්කරතාවයක් වන්නේ අධිකරණය කටුයතු කරන ආකාරය පිළිබඳවයි. මක් නිසාද පරිවර්තනයේ සහ දෙමළ භාෂාව කතා කරන අධිකරණ කාර්ය මණ්ඩල අඩුවීම නිසාය. මීට අමතරව නීති වෘත්තියේ සිටින කාන්තාවන් ඉහළ අධිකරණමය පත්වීම් සඳහා පත්කිරීම අඩුය.

<u>අධිකරණ කාර්ය මණ්ඩලයේ පවතින පරිපාලන අදක්ෂභාවය.</u>

අපරාධ නඩු අනවශ්‍ය ලෙස ප්‍රමාද වීමෙහිලා බලපාන කරුණක් ලෙස කාර්ය මණ්ඩල හිඟතාවය දැක්විය හැකිය. මීට අමතරව අධිකරණ කාර්ය මණ්ඩලවලට නිසි ලෙස අධ්‍යාපනය ලබා දීම මෙන්ම ඔවුන්ගේ වගකීම් නිසි ලෙස ඉටු කිරීම සඳහා නිසි පුහුණුව ලබාදිය යුතුය. ප්‍රමාණවත් සුදුසුකම් ඇති කාර්ය මණ්ඩල අවශ්‍යය වේ. ඒ අප්‍රමාදව සහ ඵලදායි ලෙස යුක්ති ක්‍රියාදාමය තුළ නඩු ඇසීම සාර්ථකව සිදුවීම, සහතික කිරීමෙහිලාය.

<u>අධිකරණය.</u>

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අධිකරණ භූමිකාව වන්නේ ආණ්ඩුවේ දේශපාලන අංශයන් සමග සංවරණ හා තුලනයක් පවත්වා ගෙන යාම වේ.

වර්තමාන ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධිකරණ ස්වාධීනත්වයට මෙන්ම බලතල බෙදීමට නිශ්චිත නියමයන් ලබාදීමට අපොහොසත් වී තිබේ. 2017 මාර්තු මස එක්සත් ජාතීන්ගේ වාර්තාවක් සම්පූර්ණ කර ඇත. ඒ ශ්‍රී ලංකාවේ විනිසුරුවරුන් ගේ සහ නීතිඥයන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂිත වාර්තාකරු විසිනි. එහි සඳහන් වන්නේ අධිකරණයේ ස්වාධීනත්වය, අපක්ෂපාතීත්වය සහ දක්ෂභාවය සම්බන්ධයෙන් විශ්වසනීය තැකීමක් පවතින බවය.[7] ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් නිලයෙන් පහ කිරීමට පාර්ලිමේන්තුවේ දෝෂාභියෝග ක්‍රියාවලියකින් පසුව ජනාධිපතිගේ තීරණය මත සිදුකළ හැක.[8] තවද විධායකයට විනිසුරුවරයෙකු අත්තනෝමතික ලෙස බලය යොදා ඉවත් කිරීමේ හැකියාවක් ද ඇත. මේ තත්ත්වය විධායකයට අධිකරණය සම්බන්ධයෙන් යම් මට්ටමකට පාලනයක් කිරීමේ හැකියාවක් ඇති කරයි.

ඉහළ අධිකරණ විනිසුරුවන් පත්කිරීම සහ තෝරා ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් මගින් සිදුකරනු ලැබේ. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත

---

6 Jayakody, Nadesha .To Prosecute or Not to Prosecute. The Need for Justice in Post – Conflict Sri Lanka" United Nations University , Centre for Policy Research , 13 December 2017 , http:/cpr.unu.edu/category/articles.

7 Pinto, Monica. "Report of the special Reporter on the independence of judges and lawyers on her mission to Sri Lanka." United Nations Human Rights Council (23 March 2017) Pg.7, Para.32

8 Pinto, Monica. "Report of the special Reporter on the independence of judges and lawyers on her mission to Sri Lanka." United Nations Human Rights Council (23 March 2017) Pg.9, Para.48

ව්‍යවස්ථාපිත අධිකාරියකි. ඒ කටයුත්ත වන්නේ ස්වාධීන කොමිෂන් සභා පවත්වාගෙන යෑම සහ ඒවායේ කටයුතු අධීක්ෂණය කිරීම වේ. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ භූමිකාව වන්නේ ජනාධිපති අධිකරණයට කරන බලපෑම අවම කිරීමය. කෙසේ නමුත් මෙම සභාවේ බහුතරය දේශපාලඥයන් වේ.[9] මෙම සභාව හරහා අධිකරණයට සිදුකරන පත්කිරීමේ ක්‍රියාදමය ගැන අඛණ්ඩව දැනීමක් නැත. 2009 දී ජාත්‍යන්තර නීති සංගමය ප්‍රකාශ කරන්නේ ස්වාධීන පැහැදිළි කිරීමක් නොමැති වීම සහ අධිකරණ පත්වීම් ගැන විධායක ජනාධිපතිගේ අභිමතය මගින් විධායක මැදිහත්වීම හා එහි ස්වාධීනත්වය අනතුරට ලක්කිරීම නිසා අධිකරණය පහසුවෙන් අවදානමට පාත්‍ර වන බවය.[10]

පහළ අධිකරණවල විනිසුරුවන් පත්කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම සහ විනය තීරණය කිරීමට අධිකරණ සේවා කොමිෂන් ක්‍රියාදමයක් සකස් කර තිබේ. මෙම කොමිෂමේ සාමාජිකයන්ව ජනාධිපති විසින් පත් කිරීම නිසා දේශපාලන ස්වාධීනත්වය මද වී ඇත. ඒ නිසා විනිසුරුවන් බඳවා ගැනීම දේශපාලන බලපෑමට නතුව තිබේ. වැඩි වශයෙන්ම විනිසුරුවන් පත් කිරීම ඔවුන්ගේ දක්ෂතාවය මත පදනම් විය යුතු අතරම එය දේශපාලන අත පෙවීම මත සිදු නොවිය යුතුයි. [11]2017 දී විශේෂ වාර්තාකරුගේ වාර්තාවට අනුව අතීතයේදී විනිසුරුවරුන් පත් කිරීම පිළිබඳව ස්ථාපිත කළ ක්‍රියාදමය අනුගමනය නොකිරීම පිළිබඳ අවස්ථා තිබිණ.[12]

විනිසුරුවන්ට උසස් වීම් දීම පිළිබඳ ක්‍රියාදමයද සාපේක්ෂව පැහැදිළි නැත. මෙහිදී තැකීමක් ඇති කළ කරුණක් තිබේ. එනම් මෙම උසස් කිරීම් මානව හිමිකම් උල්ලංඝණයන් සහ වධ හිංසාව සම්බන්ධයෙන් දේශපාලන සමානකම සහතික කරන උපකරණයක් ලෙස යොදා ගැනීමයි. විනිසුරුවරුන් විශ්‍රාම යාමෙන් පසුව ඔවුන්ට නිරතුරුවම ආණ්ඩුවේ හෝ දේශපාලන තනතුරු හිමි වේ.[13]

(1) චූදිත සතු මූලික අයිතිවාසිකම්.

1.1. විත්තිය පිහිටුවීමට ඇති අයිතිවාසිකම

1. විත්තිකරුට සාක්ෂි පැහැදිළි ලෙස තහවුරු කිරීමේ අයිතිය ඇත. එමෙන්ම සාක්ෂි හෝ තමන්ගේම විත්තියවාචිකය සනාත කිරීම වෙනුවෙන් සාක්ෂිකරුවන් ඉදිරිපත් කිරීමට අයිතිය ඇත.

---

[9] Pinto, Monica. "Report of the special Reporter on the independence of judges and lawyers on her mission to Sri Lanka." United Nations Human Rights Council (23 March 2017) Pg.8, Para.35

[10] Justice in retreat: A report on the independence of the legal profession and the rule of law in Sri Lanka." International Bar Association (May 2009), Pg.7.

[11] Authority without Accountability: The Crisis of impugning in Sri Lanka. International Commission of Jurists , International Commission of Jurists , 26 October 2012 , Page 151, http://www.retworld.org/pdfid/509e36562.pdf.

[12] Pinto, Monica. "Report of the special Reporter on the independence of judges and lawyers on her mission to Sri Lanka." United Nations Human Rights Council (23 March 2017) Pg.8, Para.37

[13] Pinto, Monica. "Report of the special Reporter on the independence of judges and lawyers on her mission to Sri Lanka." United Nations Human Rights Council (23 March 2017) Pg.7, Para.33

අපරාධ නඩු විධාන සංග්‍රහය 152 පරිච්ඡේදය.

2. අදාල ජාත්‍යන්තර තත්ත්වයන් : ඔහුට විරුද්ධව අපරාධ චෝදනාවක් ගොනු කිරීමේදී පහත අවම තත්ත්වයන්ට අනුව එකී ක්‍රියාව සිදුවිය යුතු බවට අවම ආරක්ෂණයක් ඇත.

එනම් සම්පූර්ණ සමානතාවය, ඔහු පෙනී සිටියදී නඩුව ඇසීමට ඇති අයිතිය, ඔහුට ඔහු වෙනුවෙන්ම කරුණු කීමට හෝ ඔහුගේම තෝරාගැනීම පරිදි ඔහු වෙනුවෙන් නෛතික සහය ලබා ගැනීමට ඒ පිළිබඳව දැනුවත් වීමට ඔහුට හැක්යාව තිබීම, නෛතික සහය නොමැති නම් ඔහුට නියම වී ඇති නෛතික අයිතිය ලබා ගැනීමට ඕනෑම නඩුවකදී යුක්තියේ අභිලාෂයන් අවශ්‍ය වූ විට ඒ අවස්ථාවේ ඔහුට ගෙවීමක් සිදු කිරීමට අවශ්‍ය නැති අතර එවැනි නඩුවකදී ඔහුට ගෙවීමට හැකියාවක් නොමැතිවීම ද අදාල නොවේ. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය 14 (3) (d) වගන්තිය.

1.2 නිර්දෝෂී භාවයේ පූර්ව නිගමනය.

1. වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂී යයි පූර්වානුමාන කළ යුත්තේය.

එසේ වුවද විශේෂ වූ සිද්ධි ඔප්පු කිරීමේ භාරය, චූදිත තැනැත්තෙකු වෙත නීතියෙන් පවරනු ලැබිය හැක්කේය. (ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව 13 (5) වගන්තිය).

2. අදාල ජාත්‍යන්තර තත්ත්වයන් :

දණ්ඩන වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටි සැම පුද්ගලයකුටම, නීතියානකූල විවෘත අධිකරණ විභාගයකින් වරදකරු බව ඔප්පු වන තෙක් නිර්දෝෂියකු ලෙස සලකනු ලැබීමටත්, ඒ අධිකරණයේදී තම නිදහසට කරුණු පෙන්වා සිටීමට වුවමනා සියලු අවශ්‍යතා නොඅඩුව ලැබීමටත් හිමිකම් ඇත්තේය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය 11 (1) වගන්තිය.

දණ්ඩන නීතිය උල්ලංඝණය කළැයි චෝදනා ලැබ සිටින සෑම ළමයෙකුටම පහත අවම සහතිකයක් ඇත. ඒ නීතිය අනුව වරදකරු යැයි ඔප්පු වන තෙක් නිර්දෝෂී ලෙස සලකනු ලැබීමය.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය. 40(2) (6) වගන්තිය.

සාපරාධී වරදක් සම්බන්ධයෙන් චෝදනා ලබන සෑම කෙනෙකුටම නීතිය අනුව වරදක් බව ඔප්පු කරනු ලබන තෙක් තමා නිර්දෝෂය යන අනුමැති සඳහා හිමිකම් ඇත්තේය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය 14(2) වගන්තිය.

අපරාධ වරදක් පිළිබඳ චෝදනා එල්ලවූ සෑම පුද්ගලයෙකුටම සාධාරණ සහ විවෘත නඩු විභාගයකදී දක්ෂ ස්වාධීන සහ අපක්ෂපාතී විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ නීතියේ ප්‍රතිපාදනයන්ට අනුව වරදකරු යයි ඔප්පු වන තෙක් නිර්දෝෂී ලෙස සලකන අතර විත්තිවාචක ඉදිරිපත් කිරීමට ද නිදහස ඇත. මානව හිමිකම් පිළිබඳ ආසියානු ප්‍රකාශනය 20 (1) වගන්තිය.

1.3 වධ හිංසාවට හෝ පහත් කොට සැලකීමට බඳුන් නොවීමේ අයිතිවාසිකම.

1. කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 11 වන වගන්තිය.

2. යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති යම් තැන්තෙකුට විරුද්ධව ඇති ඒ චෝදනාව පිළිබඳව යම් ප්‍රකාශයක් කරන ලෙසට ඒ තැනැත්තා පෙළඹවීම පිණිස යම් විශේෂ සැලකීමක්

දැක්වීම , පොරොන්දුවක් ලබාදීම,තර්ජනය කිරීම හෝ පොරොන්දුවක් දීමට සැලැස්මක් හෝ යම් පරීක්ෂණ මෙහෙයවන නිළධාරියෙකු විසින් නොකළ යුතුය. අපරාධ නඩු විධාන සංග්‍රහය 111 වන වගන්තිය සහ 126 වන වගන්තිය.

යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති යම් තැන්තෙකුට විරුද්ධව ඇති ඒ චෝදනාව පිළිබඳව යම් ප්‍රකාශයක් කරන ලෙසට ඒ තැනැත්තා පෙළඹවීම පිණිස යම් පරීක්ෂකවරයකු විසින් හෝ පොලිස් නිලධාරියකු විසින් යම් පෙළඹවීමක් කිරීම, තර්ජනය කිරීම හෝ පොරොන්දුවක් දීමට සැලැස්මක් හෝ නොකළ යුතුය. එහෙත් මේ පරිච්ඡේදය යටතේ යම් විමර්ශනයක් කරනු ලබන අතරතුර සිය තැමැත්තෙන්ම යම් ප්‍රකාශයක් කිරීමට කැමති වන යම් තැනැත්තෙකු යම් අවවාදයක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉන් වැලැක්වීම හෝ අධෛර්යයට පත් කිරීම යම් පරීක්ෂකවරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ නොකළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය iii) xxi වන පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති යම් තැනැත්තෙකුට විරුද්ධව ඇති ඒ චෝදනාව පිළිබඳව යම් ප්‍රකාශයක් කරන ලෙසට ඒ තැනැත්තා පෙළඹවීමක් කිරීම පිණිස යම් සාම නිලධාරියෙකු බලය ලත් තැනැත්තෙකු විසින් යම් පෙළඹවීමක් කිරීම, තර්ජනයක් කිරීම හෝ පොරොන්දුවක් දීම නැතහොත් පෙළඹවීමක් හෝ තර්ජනයක් කිරීම හෝ පොරොන්දුවක් දීමට සැලැස්වීම හෝ නොකළ යුතුය. එහෙත් සිය කැමැත්තෙන්ම යම් ප්‍රකාශයක් කිරීමට කැමති වන යම් තැනැත්තෙකු යම් අවවාදයක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉන් වැළැක්වීම හෝ අධෛර්යයට පත් කිරීම යම් සාම නිලධාරියෙකු විසින් හෝ වෙනත් තැනැත්තෙකු විසින් හෝ නොකළ යුතුය. අපරාධ නඩු විධාන සංග්‍රහය 111 වන වගන්තිය සහ 126 වන වගන්තිය.

3. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- කිසිම පුද්ගලයකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික අවමන් සහගත සැළකිල්ලට හෝ දඬුවමකට හෝ භාජනය නොකළ යුතුය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය 5 වන වගන්තිය.
- කිසිම පුද්ගලයකු වධ හිංසාවකට හෝ කෲර අමානුෂික හෝ පහත් සැලකීමකට හෝ දඬුවමකට හෝ භාජනය නොකළ යුතුය. විශේෂයෙන්ම කිසිවකු ඔහුගේ ස්වාධීන අනුමැතියක් නොමැතිව වෛද්‍ය හෝ විද්‍යානුකූල අත්හදා බැලීම්වලට භාජනය නොකළ යුතුය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 7 වන වගන්තිය.
- වධ දීම යන්නෙන් වෙනත් යම් තැනැත්තෙකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූද ක්‍රියාවක් අදහස් කෙරේ.
- (අ) පහත දැක්වෙන කාර්යයන් ගැන එනම්

i. එකී වෙනත් තැනැත්තන්ගෙන් හෝ දෙවන තැනැත්තෙකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබා ගැනීම හෝ

ii. එකී වෙනත් තැනැත්තා හෝ තුන් වන තැනැත්තෙකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කරන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූද;

iii. එකී වෙනත් තැනැත්තා හෝ තුන් වන තැනැත්තෙකු බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා

(ආ) වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නා වූද සෑම අවස්ථාවකදීම රජයේ නිලධරයෙකුගේ නිල තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් තැනැත්තෙකු විසින් හෝ එම නිලධාරියාගේ හෝ තැනැත්තාගේ මුල් වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිලධාරියාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නා වූ ද යම් ක්‍රියාවක් අදහස් වේ. වධ හිංසාවට එරෙහි සම්මුතිය 1 වන වගන්තිය.

- සෑම රාජ්‍යයක්ම එහි බලසීමාව යටතේ ඇති ඕනෑම භූමියක වධ හිංසාව වැළැක්වීම සඳහා ඵලදයී ලෙස ව්‍යවස්ථාදයක, විධායක, අධිකරණ හෝ අනෙකුත් මිනුම් දඬු භාවිතා කළ යුතුය. වධ හිංසාවට එරෙහි සම්මුතිය 2 (1) වගන්තිය.

1.4 නිහඬව සිටීමේ අයිතිවාසිකම (වරද පිළිගැනීමට පෙළඹවීමෙන් වැලකී සිටීමේ අයිතිවාසිකම)

1. අපරාධ නඩුවකදී පාපොච්ඡාරණයක් වූ යම් ප්‍රකාශයක් කරන තැනැත්තා ගෙන් ප්‍රශ්න කරන විට එය ස්වේච්ඡාවෙන් කරන ලද බවට විශ්වාස කිරීමට තමාට හේතු දැනගතහොත් මිස කිසිම විනිසුරුවරයකු එම පාපොච්ඡාරණය සාක්ෂියක් ලෙස වාර්තාගත නොකළ යුතුය. අපරාධ නඩු විධාන සංග්‍රහය 127 වන වගන්තිය.

2. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

ඕනෑම පුද්ගලයෙකුට තමාට විරුද්ධව ඇති අපරාධ චෝදනාවක් තීරණය කරනු ලැබීමේදී සමානාත්මතාවයෙන් සලකන බවට අවම සහකතිකයක් තිබිය යුතු අතර එකී පුද්ගලයා විසින්ම කරන ලද පාපොච්චාරණයක් මතම පමණක් ඔහු වරදකරු නොකළ යුතුය. සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය 14 (3) (9) වගන්තිය.

1.5 නීතිඥ නියෝජනයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම.

1. යම් අපරාධ අධිකරණයක් ඉදිරියෙහි චෝදනා ලැබ සිටින සෑම තැනැත්තෙකුම එක් අයිතිවාසිකමක් වශයෙන් මේ සංග්‍රහයෙහි යම් ලිඛිත නීතියක විධි විධානවලට යටත්ව, නීතිඥවරයකු මාර්ගයෙන් විත්ති වාචක ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර අගතියට පත් සෑම පාර්ශවකරුවෙකුටම නීතිඥයකු මගින් අධිකරණයේදී තමා නියෝජනය කරනු ලැබීමේ අයිතිවාසිකම තිබිය යුතුය. අපරාධ නඩු විධාන සංග්‍රය 260 වන වගන්තිය.

2. අධිචෝදනා පත්‍රය මහාධිකරණය වෙත ලැබුණ විට යම් මහාධිකරණ සැසි වාරයකදී චූදිත තැනැත්තා වෙනුවෙන් නීතිඥ නියෝජනයක් නොමැත්තේ නම් තමාගේ විත්තිවාචකය සඳහා නීතිඥයෙකුගේ සේවය අවශ්‍යය දැයි අධිකරණය විසින් චූදතගෙන් විමසා එසේ අවශ්‍ය බව පවසන්නේනම් අධිකරණය මගින් නීති ආධාර වශයෙන් නීතිඥ වරයෙකු පත්කළ යුතුය.අපරාධ නඩු විධාන සංග්‍රහය 195 වන වගන්තිය.

3. යම් අපරාධ නඩුවක් සම්බන්ධව අභියාචනා අධිකරණයේ නඩුව විභාගවන අවස්ථාවේ අභියාචකට නීතිඥ සහාය ලබාගැනීමට තරම් වත්කමක් නොමැතිබවට අධිකරණය සෑහීමකට පත්වන්නේ නම් කවර හෝ අපරාධ නඩුවකදී, හෝ නඩු කටයුත්තක දී අභියාචකගේ ඉල්ලීම පිට අභියාචක වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥවරයෙකු නීති ආධාර සේවය යටතේ පත් කළ හැකිවේ.අපරාධ නඩු විධාන සංග්‍රහ පනත 353 වන වගන්තිය.

4. වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවරනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකව හෝ නීතිඥයකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 13 (3) වගන්තිය.

5. නීති ආධාර කොමිෂමේ අරමුණ වන්නේ ඵලදයී නීති ආධාර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම වේ. එකී නීති උපදෙස් ලබාදීම ලැබීමට සුදුසු පුද්ගලයන්ට ඔවුන් වෙනුවෙන් නීති සහ නෛතික නියෝජනය ලබා දීම සහ තවද නීති ආධාර ලැබීමට සුදුසු පුද්ගලයන්ට නීති ආධාර ලබා දීමද වේ. නීති ආධාර කොමිෂම 3 වන වගන්තිය.

6. සුදුසු නඩු වලදී යුක්තිය සඳහා අවශ්‍යය විට ගෙවීමකින් තොරව එනම් ඒ සඳහා වත්කම් නොමැති විට නීති ආධාර ලබා දීම වේ. නීති ආධාර කොමිෂම 4 වන වගන්තිය.

සෑම ළමයෙකුටම රජය විසින් රජයේ වියදමින් ළමයාට බලපාන අපරාධ නඩු ක්‍රියාදාමයේදී නීති ආධාර ලබාදිය යුතු අතර එසේ නොවුව හොත් හරයාත්මක ලෙස අයුක්තිය සිදුවනු ඇත. නීති ආධාර කොමිෂම 5 වන වගන්තිය.

8. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

සෑම කෙනෙකුටම තමාට විරුද්ධව ඇති සාපරාධී චෝදනාව තීරණය කරනු ලැබීමේ දී සමානාත්මතාවයෙන් සලකනු ලබන බවට අවම සහතික වීම් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(ඈ) තමා ඉදිරිපිට නඩු විභාග කරනු ලැබීමට තමා විසින්ම හෝ තමා විසින් තෝරා ගනු ලබන නීතිඥයන්ගේ සහාය ඇතිව නිදහසට කරුණු දැක්වීමට ඔහුට නීතිඥ සහාය නොමැති නම් මෙම අයිතිවාසිකම් ගැන දන්වනු ලැබීමට යුක්ති ධර්මයේ යහපත සඳහා අවශ්‍ය වන්නේ නම් ඔහුට සහාය වීම සඳහා නීතිඥවරයෙකු පත්කරනු ලැබීම සහ ඒ සඳහා ගෙවීමට ඔහුට ප්‍රමාණවත් මාර්ගයක් නොමැති නම් ඔහු විසින් කිසිම ගෙවීමකින් තොරව එසේ කරනු ලැබීම වේ.

සිවිල් දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය 14 (3)(ඈ) වගන්තිය.

ආණ්ඩුව දුප්පත් අය වෙනුවෙන් සහ අනෙකුත් වරප්‍රසාද අහිමි පුද්ගලයන් වෙනුවෙන් නීති සේවා සැපයීම ප්‍රමාණවත් ආධාර සහ අනෙකුත් සම්පත් ලබාදීමට සහතික විය යුතුය. නීතිඥවරුන්ගේ වෘත්තීය සංගම් මෙම සංවිධානය කිරීමේදී සේවා පහසු කරන්නන් හා අනෙකුත් සම්පත් වලදී සහයෝගයෙන් කටයුතු කිරීම අවශ්‍යය වේ.

නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූල ධර්ම 3.3.

6. නිසි ක්‍රියාදාමය සඳහා ඇති අයිතිවාසිකම.

1. නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිර බාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තෙකු සිර භාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 13 (1) වගන්තිය.

(2) අත්අඩංගුවට ගනු ලැබූවන් රඳවා තබාගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයක විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ආකාර මිස, ඒ තැනැත්තා තව දුරටත් අත්අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 13(2) වගන්තිය.

(3) අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- තමන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව හෝ තමන්ට විරුද්ධව යම් අපරාධ චෝදනාවක් පිළිබඳව නිශ්චය කිරීම සඳහා සාධාරණ වුත්, විවෘත වුත් ස්වාධීන, අපක්ෂපාතී නඩු විභාගයකට සෑම තැන්තෙකුට ම පූර්ණ සමානාත්මතාවයෙන් යුක්තව හිමිකම් ලබයි.
  මානව හිමිකම් විශ්ව ප්‍රකාශය 10 වන වගන්තිය.

- සියලු දෙනාම අධිකරණ සහ විනිශ්චයාධිකරණ ඉදිරියෙහි එක සමාන වන්නාහ. සෑම කෙනෙකුටම තමාට විරුද්ධව නගා ඇති ඕනෑම සාපරාධී චෝදනාවක් සම්බන්ධව නීතිය විසින් ප්‍රතිෂ්ඨාපිත හා අපක්ෂපාතී විභාගයකට හිමිකම් ඇත්තේය.
  සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය 14(1) වගන්තිය.
- සෑම කෙනෙකුටම පුද්ගල නිදහසට හා සුරක්ෂිත භාවයට අයිතිවාසිකම් ඇත්තේය. කිසිම කෙනෙකු අත්තනෝමතික ලෙස සිර භාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ නොකළ යුතුය. නීතියෙහිලා ප්‍රතිෂ්ඨාපිත හේතු මත සහ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම කෙනෙකුට ඔහුගේ නිදහස අහිමි නොකළ යුතුය.
  සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 9(1) වගන්තිය.

1.7 නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව සඳහා ඇති අයිතිවාසිකම.

1. නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමේදී නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 12(1) වගන්තිය.

2. කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විනිශ්චයකට හෝ භාජනය නොවිය යුත්තේය.

3. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- ජාති, වංශ, වර්ග, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලන ආදී කවර භේදයක් හෝ සමාජ, ජාතික, දේපළ, උපත ආදී කවර තත්ත්වයක විශේෂයක් හෝ නොමැතිව යම් ප්‍රකාශනයේ සඳහන් සියලු හිමිකම් සහ ස්වාධීනත්වයන් සෑම පුද්ගලයකුටම උරුම වන්නේ ය.

  තවද යම් පුද්ගලයකු අයත්වන රටේ දේශපාලන, නීතිමය හෝ ජාත්‍යන්තර තත්ත්වයන් පිළිබඳ කිසිදු විශේෂයක් ද ඒ රට ස්වාධීන භාරකාර යන ආදී කවර තත්ත්වයක් පිළිබඳ විශේෂයක් ද නොමැතිව මේ හිමිකම් ඔහු සතු වන්නේ ය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය 2 වන වග්නතිය.

- සියල්ලන්ම නීතිය ඉදිරියේ එකිනෙකාට සමාන වන අතර නීතියේ ආරක්ෂාව ලැබීමට කිසිදු විශේෂයක් නොමැතිව සියල්ලෝම හිමිකම් ලබති. මේ ප්‍රකාශයට පටහැනි ලෙස කෙරෙන ඕනෑම අසාධාරණයකින් ආරක්ෂා වීමේ අයිතියත් කිසිදු අසාධාරණයන්ට පෙළඹීමෙන් ආරක්ෂා වීමේ අයිතියත් සියල්ලන්ටම හිමි වේ. මානව අයිතිවාසිකම පිළිබඳ විශ්ව ප්‍රකාශය 7 වන වගන්තිය.
  සියලු දෙනාම අධිකරණ හා විනිශ්චයාධිකරණ ඉදිරියේ එක සමාන වන්නාහ. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 14(1) වගන්තිය.

1.8. දෙවරක් අපරාධ වරදකරු වීමේ අන්තරායෙන් වැළකී සිටීමේ අයිතිවාසිකම.

1. යම් වරදකට නඩු පවරා අවසන් පුද්ගලයකු හට එම වරදටම නැවත වරක් නඩු පැවරිය නොහැක. අපරාධ නඩු විධාන සංග්‍රහ පනත 314 වන වගන්තිය.

අදල ජාත්‍යන්තර තත්ත්වයන්

- යම් වරදක් සඳහා එවකටත් ඒ රටේ නීතිය හා දණ්ඩන කාර්යය පටිපාටිය අනුව වරදකරු කරනු ලැබූ හෝ නිදහස් කරනු ලැබ ඇති පුද්ගලයකු නැවත නඩු විභාග කිරීමකට හෝ දඬුවමකට හෝ යටත් නොවිය යුතුය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය 14 (7) වන වගන්තිය.

1.9 <u>සිද්ධියෙන් පසුව නඩු පැවරිය නොහැකි බවට ඇති අයිතිවාසිකම.</u>

1. අදාල ජාත්‍යන්තර නීති.

- යම් වරදක් හෝ ප්‍රමාද දෝෂයක් කිසිවෙකුගෙන් සිදු වූ අවස්ථාවකදී, එම කාලයේ පවතින ජාතික හෝ ජාත්‍යන්තර නීතියෙහි එම වරද හෝ ප්‍රමාද දෝෂය දණ්ඩන වරදක් සේ නොසඳහන්ව පැවතියේ නම් එම වරදට හෝ ප්‍රමාද දෝෂයට ඔහු වරදකරුවෙකු ලෙස නොසැළකිය යුතුය. දණ්ඩන වරද කළ කාලයේදී වලංගුව පැවති දඬුවමකට වඩා වැඩි දඬුවමක් එවැනි වරදකරුවකු උදෙසා නොපැනවිය යුතුය. <u>මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය 11 (2) වන වගන්තිය.</u>

යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවල ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙකු වරදකට වරදකරුවකු නොවිය යුත්තේය. තවද යම් වරදක් වරදක් නොවී නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් බලපැවැත්වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නොකළ යුත්තේය. <u>ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 13 (6) වගන්තිය.</u>

- කිසිම ළමයෙකු වරදක් සිදුකරන අවස්ථාවේ එම වරද ජාතික හෝ අන්තර් ජාතික නීතිය මගින් තහනම් නොකළ වරදක් නම් එය දණ්ඩ නීතිය උල්ලංඝණය කළ එම ක්‍රියාව හෝ නොකර හැරීමට ඔහු යටත් නොවේ. ළ<u>මා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 40(2) (අ) වගන්තිය.</u>

(1.10) <u>චෝදනා දැන ගැනීමට ඇති අයිතිවාසිකම.</u>

1. සිර භාරයට ගනු ලබන තැනැත්තා සිර භාරයට ගනු ලබන්නේ යම් චෝදනාවක් හෝ දෝෂාරෝපනයක් මතද ඒ චෝදනාවේ හෝ දෝෂාරෝපනයේ ස්වභාවය ඔහුට දැනුම් දිය යුතුය.

<u>අපරාධ නඩු විධාන සංග්‍රහ පනත 23(1) වගන්තිය.</u>

2. මූලික පරීක්ෂණයක් පවත්වන මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ පරීක්ෂණය ආරම්භයේදී පරීක්ෂණය පවත්වනු ලබන්නේ යම් චෝදනාවක් හෝ චෝදනා සම්බන්ධයෙන් ඒ චෝදනාව හෝ චෝදනා චූදිතයාට කියවා දිය යුතු නමුත්, එසේ කියවා දීමේදී එයට යම් උත්තරයක් දෙන ලෙස චූදිතට නියම කරනු නොලැබිය යුතුය. එවැනි යම් උත්තරයක් දෙනු ලැබුවහොත් මහේස්ත්‍රාත්වරයා විසින් එය වාර්තාගත කරනු නොලැබිය යුතුය. එමෙන්ම එවැනි යම් උත්තරයක් චූදිතයාට විරුද්ධව සාක්ෂියක් ලෙස ආවේශ්‍ය නොවිය යුතුය.

<u>අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 146 වන වගන්තිය.</u>

3. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

සිර භාරයට ගනු ලබන ඕනෑම තැනැත්තකුට ඔහු එසේ සිර භාරට ගැනීමට හේතු සිර භාරයට ගනු ලබන අවස්ථාවේ දැන්විය යුතු අතර ඔහුට විරුද්ධව ඇති චෝදනාවද නොපමාව දැන්විය යුතුය.

<u>සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 9(2) වගන්තිය.</u>

<u>1.11 ඇප සඳහා ඇති අයිතිවාසිකම.</u>

ඇප දිය හැකි වරදකට චෝදනා ලැබූ තැනැත්තකු අධිකරණය ඉදිරියේ පැමිණ පෙනී සිටින්නා වූ අවස්ථාවක ඒ තැනැත්තා ඇප පිට මුදා හැරිය යුතුයි.

<u>අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 402 වන වගන්තිය.</u>

2. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- බලහත්කාරයෙන් අත්අඩංගුවට ගැනීමට හෝ අත්අඩංගුවේ රඳවා තැබීමට හෝ පිටුවහල් කිරීමට හෝ කිසිම පුද්ගලයකු භාජනය නොකළ යුතුය.
- මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය 9 වන වගන්තිය.

කිසිදු ළමයකුගේ නිදහස නීති විරෝධී ලෙස හෝ අත්තනෝමතික ලෙස අහිමි කළ නොහැක. ළමයකු අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනීම හෝ සිරගත කිරීම නීතියට අනුකූලව සිදුවිය යුතුය. මෙය අත්‍යාවශ්‍යම අවස්ථාවකදී අවසාන පියවරක් ලෙස පමණක් භාවිතා කළයුතු අතර එය අඩුම කාලයක් විය යුතුය.

ළමා අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය 37(6) (අ) වගන්තිය.

සාපරාධී චෝදනාවක් මත සිර භාරයට ගනු ලබන ඕනෑම කෙනෙකු සාධාරන කාලයක් තුළ විනිශ්චයකරුවකු හෝ විනිශ්චය බලතල ක්‍රියාත්මක කිරීමට බලය දෙනු ලැබූ වෙනත් ඕනෑම නිලධාරියකු වෙත නොපමාව ඉදිරි පත්කළ යුතු අතර සාධාරණ කාලයක් ඇතුළත නඩු විභාග කරනු ලැබීමට හෝ නිදහස් කරනු ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේය. නඩු විභාගයක් බලාපොරොත්තුව සිටින තැනැත්තන් සිර භාරයෙහි තබා ගැනීම සාමාන්‍ය රීතිය නොවිය යුතුය. එහෙත් නිදහස් කර හැරීම නඩු විභාගයට විනිශ්චය කෘත්‍යයේදී වෙනත් ඕනෑම අවස්ථාවක සහ අවශ්‍ය වුවහොත් නඩු තීන්දුව ක්‍රියාත්මක කරන අවස්ථාවේදී පෙනී සිටින බවට කෙරෙන සහතික වීම්වලට යටත්ව සිදුකළ හැකිය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 9(3) වගන්තිය.

සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම හේතු කොට සිය නිදහස අහිමි වූ ඕනෑම කෙනෙකුට ඔහු එසේ සිර භාරයෙහි රඳවා ගැනීමේ නීත්‍යානුකූල භාවය නොපමාව තීරණය කිරීම සඳහා අධිකරනයට කරුණු ගොනුකළ හැකි අතර එම රඳවා තබා ගැනීම නීත්‍යානුකූල නොවන්නේ නම් ඔහු මුදා හැරීමට නියෝග කිරීම සඳහා අධිකරණයක් ඉදිරියෙහි නීති කෘත්‍යයක් ආරම්භ කිරීමට හිමිකම් ඇත්තේය. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 9(4) වගන්තිය.

1.12 භාෂා පරිවර්තනය සඳහා ඇති අයිතිවාසිකම.

ශ්‍රී ලංකාව මුළුල්ලේ ම අධිකරණයන්හි කටයුතු රාජ්‍ය භාෂාවෙන් කළ යුත්තේ ය. ඒ අනුව ඒ අධිකරණයන් හි වාර්තා සහ නඩු කටයුතු රාජ්‍ය භාෂාවෙන් විය යුත්තේ ය. එසේ වුවද උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ මුල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණවල කටයුතු දෙමළ භාෂාවෙන් ද කළ යුත්තේ ය. ඒ අධිකරණ වල වාර්තා සහ නඩු කටයුතු දෙමළ භාෂාවෙන් විය යුත්තේ ය. එවැනි යම් අධිකරණයක නඩුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන විට ඒ අභියාචනය විභාග කරන අධිකරණයේ පහසුව සඳහා ජාතික භාෂා දෙකෙන්ම වාර්තා පිළියෙල කළ යුත්තේ ය. අධිකරණයක භාවිතා වන භාෂාව නොදන්නා යම් කිසි විනිශ්චයකාරවරයකුට, ජූරි සභිකයකුට, යම් කිසි පාර්ශවයකට හෝ අයදුම්කරුවකුට ඇතහොත් ඒ පාර්ශවය හෝ අයදුම්කරු නියෝජනය කිරීමට නීතියේ බලය ලබා ඇති යම්කිසි තැනැත්තකුට එම අධිකරණයේ සිදුවන කටයුතු වටහා ගැනීමටත් ඒ කටයුතු වලට සහභාගී වීමටත් හැකි වන සේ රජය විසින් උචිත ජාතික භාෂාවෙන් සපයනු ලබන භාෂා පරිවර්තක සහ පරිවර්තන ලබා ගැනීමටත් නඩු වාර්තාවකින් නීතිය අනුව ලබා ගැනීමට හිමිකම් ඇති කවර වූ හෝ කොටසක් නැතහොත් එහි පරිවර්තනයක් ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුවද ලබා ගැනීමටත් හිමිකම ඇත්තේ ය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 24 වන වගන්තිය.

2. චූදිතයාට නොවැටහෙන භාෂාවකින් යම් සාක්ෂියක් දෙනු ලැබූ හා ඔහු පුද්ගලිකවම පැමිණ සිටින නමුත් නීතිඥවරයකු විසින් නියෝජනය නොකරනු ලබන කවර විටකදී වුවද, ඒ සාක්ෂිය විවෘත අධිකරණයේදී ඔහුට වැටහෙන භාෂාවකින් ඔහුට භාෂාණ පරිවර්තනය කර දිය යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 275(1) වන වගන්තිය.

3. විධිමත් ලෙස ඔප්පු කිරීමේ කාර්යය සඳහා ලේඛණ ඉදිරිපත් කරනු ලබන විට එයින් අවශ්‍ය විය හැකි යැයි අධිකරණයට පෙනී යන කොටස් පමණක් අධිකරණය විසින් සහ අභිමතය පරිදි භාෂණ පරිවර්තනය කිරීමට සැලැස්විය යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 275(2) වන වගන්තිය.

4. චූදිතයකු විසින් මහේස්ත්‍රාත්වරයකු වෙත ප්‍රකාශයක් කරනු ලැබුවහොත් ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වාර්තාගත කොට ඒ වාර්තාව ඔහුට පෙන්වීම හෝ ඇසෙන සේ කියවීම හෝ කළ යුතුය. එය ලියා ඇති භාෂාව චූදිතයාට නොවැටහේ නම්, ඔහුට වැටහෙන භාෂාවකින් එය ඔහුට භාෂණ පරිවර්තනය කරනු ලැබිය යුතු අතර තම ප්‍රකාශය පැහැදිළි කිරීමට හෝ ඊට යමක් එකතු කිරීමට හෝ ඔහුට නිදහස තිබිය යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 277(1) වන වගන්තිය.

5. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්

පුද්ගල නිදහස සහ ආරක්ෂාව සදහා සෑම කෙනෙකුටම අයිතියක් ඇත . නීතියෙන් නියම කර ඇති ක්‍රියාපටිපාටියට අනුකූලව හැර අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම හෝ රදවා තබා ගැනීම නොකළ යුතුය. අත්තනෝමතික ලෙස කිසිවෙකුට ඔහුගේ නිදහස අහිමි නොකළ යුතුය. සෑම කෙනෙකුටම සමානාත්මතාවයෙන් යුතුව ඔහුට විරුද්ධව නගා ඇති චෝදනාවේ ස්වභාවය සහ නිමිත්ත ඔහුට වැටහෙන භාෂාවකින් නොපමාව සවිස්තර ලෙස දන්වනු ලැබීය යුතුය.

ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 14 (3) (අ) වගන්තිය.

(1.1.3) නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් සහ සෝදිසි කිරීම්වලට එරෙහි අයිතිවාසිකම.

1. නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිර භාරයට ගැනීම නොකළ යුත්තේය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 13 (1) වගන්තිය.

2. යම් තැනැත්තකු සිර භාරයට ගැනීමේදී ඒ සිර භාරයට ගනු ලබන තැනැත්තා තමා අත්අඩංගුවට ගනු ලැබීමට වචනයෙන් හෝ ක්‍රියාවෙන් අවනත වුවහොත් මිස, ඔහු සිරභාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිර භාරයට ගනු ලබන තැනැත්තාගේ ශරීරය සැබැවින්ම ස්පර්ශ කොට හෝ රඳවා තබා පසුව සිර භාරයට ගත යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 23 (1) වගන්තිය.

3. සිර භාරයට ගැනීම කරන සාම නිලධරයා විසින් හෝ පෞද්ගලික තැනැත්තකු විසින් සිර භාරයට ගැනීම කරන ලද අවස්ථාවක, ඔහු විසින් සිර භාරයට ගනු ලැබූ තැනැත්තා හා රැඳෙනු ලැබූ සාම නිලධරයා විසින් හෝ 30 වන වගන්තියට යටත්ව ඒ තැනැත්තා සෝදිසි කරනු ලැබ, ඔහු වෙත ඇති අවශ්‍ය ඇඳුම් නොවන සියලු ද්‍රව්‍ය ආරක්ෂා රැකවරණයේ තැබිය හැකිය. තවද ඒ ද්‍රව්‍ය අතුරින් අපරාධයේ උපකරණ හෝ ප්‍රතිඵල හෝ වෙනත් සාක්ෂි හෝ වන්නේ යයි විශ්වාස කිරීමට හේතු ඇති කිසිවක් ඔහු නිදහස් හෝ නිදෙස් වනතුරු රඳවා තබා ගත හැකිය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 29 වන වගන්තිය.

4. ස්ත්‍රියක සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍ය වන කවර අවස්ථාවකදී වුවද ඒ සෝදිසියෙහි විනීතභාවය කෙරෙහි ඉතාමත් සැලකිලිමත්ව වෙනත් ස්ත්‍රියක විසින් කළ යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 30 වන වගන්තිය.

5. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- සෑම කෙනෙකුටම පුද්ගල නිදහසට හා සුරක්ෂිතභාවයට අයිතිවාසිකම් ඇත්තේය. කිසිම කෙනෙකු අත්තනෝමතික ලෙස සිර භාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ නොකළ යුතුය. නීතියෙහිලා ප්‍රතිෂ්ඨාපිත හේතු මත සහ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම කෙනෙකුට ඔහුගේ නිදහස අහිමි නොකළ යුතුය.
  සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 9(1) වගන්තිය.

1.14 නීති විරෝධී පොලිස් රඳවා ගැනීමට එරෙහි අයිතිවාසිකම.

1. අත්අඩංගුවේ තබා ගනු ලැබූ හෝ රඳවා තබාගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 13 (2) වන වගන්තිය.

2. වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු අවස්ථාගත සියලු කරුනු අනුව යුක්ති සහගත වන කාලයකට වඩා දීර්ඝ කාලයක් අත්අඩංගුවෙහි රඳවා තබා ගැනීම හෝ අන් ලෙසකින් රැඳවීම කිසිම නිලධරයකු විසින් නොකළ යුතු අතර ඒ කාලය සිර භාරයට ගැනීම සිදුකළ ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත යාමට අවශ්‍ය කාලය ගණන් බැලිය යුතු පැය විසි හතරක කාලය නොඉක්ම විය යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 37 වන වගන්තිය.

3. සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ක්‍රියාවේ යොදවන තැනැත්තා විසින් (ඇප පිළිබඳ 51 වන වගන්තියේ විධි විධාන වලට යටත්ව) සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබීමට තමාට නීතියෙන් නියමිත අධිකරණය වෙත අනවශ්‍ය ප්‍රමාදයෙන් තොරව ඔහු ඉදිරිපත් කළ යුතු අතර සිර භාරයට ගැනීම කරන ලද වේලාව සහ ස්ථානය ඔහු විසින් වරෙන්තුවෙහි පිටසන් කළ යුතුය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 54 වන වගන්තිය.

4. පැය 24 ක් ඇතුළත විමර්ශන සම්පූර්ණ කළ නොහැකි අවස්ථා වල චූදිතව රඳවා ගැනීමේ කාල සීමාව දින 15 කට සහ එයින් වැඩි නොවන කාලයකට දීර්ඝ කළ හැක.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 115 වන වගන්තිය.

5. විමර්ශනය නිම කරනු ලැබූ වහාම පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් නියමිත ආකෘතියෙහි වූ වාර්තාවක් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. සැකකරු යම් වරදක් සිදුකර ඇති බවට හෝ යම් වරදක් සිදු කිරීමෙහිලා සැකකරු සම්බන්ධ වී ඇති බවට හෝ වාර්තාවෙහි කිසිම චෝදනාවක් නොවුව හොත් මහේස්ත්‍රාත්වරයා විසින් ඔහු නිදහස් කරනු ලැබිය යුතුය. සැකකරු යම් වරදක් සිදු කිරීමෙහිලා සම්බන්ධ වී ඇති බවට වාර්තාවෙහි චෝදනාවක් වුව හොත් මේ සංග්‍රහයේ විධි විධානවලට අනුකූලව ඔහුට විරුද්ධව නඩු පවරනු ලැබිය යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 120 (3) වන වගන්තිය.

6. අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

බලහත්කාරයෙන් අත්අඩංගුවට ගැනීමට හෝ අත්අඩංගුවේ රඳවා තැබීමට හෝ පිටුවහල් කිරීමට හෝ කිසිම පුද්ගලයකු භාජනය නොකළ යුතුය.

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය 9 වන වගන්තිය.

- නීති විරෝධී හෝ අත්තනෝමතික ලෙස කිසිම ළමයෙකුගේ නිදහස අහිමි කළ නොහැක. ළමයාව අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනම, සිරගත කිරීම නීතියට අනුව සිදුවිය යුතුය. එය සිදුවිය යුතු අත්‍යාවශ්‍යම අවස්ථාවකදී අවසාන පිවරක් වශයෙන් සිදු විය යුතු අතර අදල කාල සීමාව සුදුසු කෙටිම එක විය යතුය.
  ළමා අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය 37 (අ) වගන්තිය.
- සාපරාධී චෝදනාවක් මත සිර භාරයට ගනු ලබන ඕනෑම කෙනෙකු විනිශ්චයකරුවකු හෝ විනිශ්චය බලතල ක්‍රියාත්මක කිරීමට බලය හෝ බලය ලැබූ වෙනත් ඕනෑම නිලධාරියකු හමුවට නොපමාව පත්කළ යුතු අතර සාධාරණ කාලයක් ඇතුළත නඩු විභාග කරනු ලැබීමට හෝ නිදහස් කරනු ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේ ය. නඩු විභාගයක් බලාපොරොත්තුව සිටින තැනැත්තන් සිර භාරයෙහි තබා ගැනීම සාමාන්‍යය රීතිය නොවිය යුතුය. එමෙන්ම නිදහස් කර හැරීම නඩු විභාගයට විනිශ්චයක කෘත්‍යයෙහි දී වෙනත් ඕනෑම අවස්ථාවක සහ අවශ්‍යය වුවහොත් නඩු තීන්දුව ක්‍රියාත්මක කරන අවස්ථාවේදී පෙනී සිටින බවට කෙරෙන සහතික වීම්වලට යටත්ව සිදු කළ හැකිය.
  සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 9(3) වගන්තිය.
- සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම හේතු කොට සිය නිදහස අහිමි වූ ඕනෑම කෙනෙකුට ඔහු එසේ සිර භාරයෙහි රඳවා ගැනීමේ නීත්‍යානුකූල භාවය නොපමාව තීරණය කිරීම සඳහා අධිකරනයට කරුණු ගොනුකළ හැකි අතර එම රඳවා තබා ගැනීම නීත්‍යානුකූල නොවන්නේ නම් ඔහු මුදා හැරීමට නියෝග කිරීම සඳහා අධිකරණයක් ඉදිරියෙහි නීති කෘත්‍යයක් ආරම්භ කිරීමට හිමිකම් ඇත්තේය.

  සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 9 (4) වන වගන්තිය.

## පරිච්චේදය - 2

## වින්තියේ නීතිඥවරුන්ගේ යුතුකම් සහ වගකීම්.

### (2.1) ශ්‍රී ලංකා ජාතික රාමුව පිළිබධ දළ විශ්ලේශනයක්

1974 දී ශ්‍රී ලංකා නීතිඥ සංගමය පිහිටවනු ලැබීය. එය එහිම ව්‍යවස්ථාවකට අනුකූලව පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත නොවන ආයතනයකි. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාව තුළ නීති කෘත්‍යයේ යෙදීමට ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීතිඥයකු ඇතුලත් කර ගැනීම සහ බඳවා ගැනීම සිදුවිය යුතුය. (ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ව්‍යවස්ථාව, 3.1 වන වගන්තිය) මේ තත්ත්වය උදා කර ගැනීමට පහත අවශ්‍යතා සපුරාගත යුතුව තිබේ. එනම් නීති විද්‍යාලයේ අවසන් වසර විභාග සම්පූර්ණ කිරීම සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් හැදෑරීම වේ. තවද අවම වශයෙන් වසර 8 ක නීති ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති නීතිඥවරයකු යටතේ මාස 06 ක් ආධුනිකව පුහුණුව ලැබිය යුතුය. ඉහත සුදුසුකම් මත නීති වෘත්තියේ නියෝජිත ආයතනය වූ ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමයේ සාමාජිකත්වය ලැබීමට නීතිඥවරුන්ට හිමිකම ලැබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම නීති උපදේශකයා වන්නේ නීතිපතිවරයාය. තවද ඔහු ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රාථමික නීතිඥවරයකු ද වේ.

අධිකරණ පනතේ 40 වන වගන්තියේ මෙසේ සඳහන්ව ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ රෙගුලාසි වල 07 වන වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට හොඳ චරිතයක් ඇති දැනුම පිළිබඳ දක්ෂතාවය සහ හැකියාව මත නීතිඥවරුන් නීති වෘත්තියට ඇතුළත් කර ගැනීම හා බඳවා ගැනීම සිදුකළ හැක. නීති වෘත්තියේ නිරත සෑම අයකුටම වගකීමක් ඇත. ඒ අදල දැනුම, හැකියාවන් සහ දක්ෂතාවයට අනුව සාධාරණ ප්‍රමිතිය මත ඔහුගේ හෝ ඇයගේ නීති සේවාව සැපයීම වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ යම් නීතියක විධි විධාන වලට යටත්ව අග්‍ර විනිශ්චයකාරවරයා සහ

ඔහු විසින් නම් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයන් තිදෙනෙකු විසින් (උ) නීතිඥවරයන් පිළිගැනීම, බඳවා ගැනීම, වෘත්තියෙහි යෙදී සිටීම, අත්හිටුවීම හා ඉවත් කිරීම, ජ්‍යේෂ්ඨ නීතිඥවරුන් පත් කිරීම හා ඒ නීතිඥයන් සඳහා විනය නීති හැසිරීම, ඇඳුම් අදාළ රීති ඇතුළු අධිකරණයේ පරිචය සහ කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා කලින් කල රීති සෑදිය හැක්කේය. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 136 (1) වගන්තිය.

නීතිය මත පාලනය පවත්වාගෙන යාමට සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහතික කිරීමෙහිලා ශක්තිමත් සහ ස්වාධීන නීති වෘත්තිකයන් අවශ්‍ය වේ. ඔවුන්ගේ වගකීම් ඵලදායී ලෙස සිදු කිරීමෙහිලා නීතිඥවරු දේශීය සහ ජාත්‍යන්තර නීතියට අනුකූලව කටයුතු කළ යුතුව ඇත. එම දේශීය හා ජාත්‍යන්තර නීතිය මතින් පහත දේ සහතික කර තිබේ. එනම් අපරාධ නඩු විධාන ක්‍රියාදාමයේදී තමන්ගේ සේවාදයකයන්ගේ අභිලාෂයන් ස්වාධීන සහ ඵලදායී ලෙස නියෝජනය කිරීම සහ අනෙකුත් මූලික අයිතිවාසිකම් සහ නිදහස ස්ථාපිත කිරීම වේ.

2.2 ජාත්‍යන්තර රාමුව.

නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ මූලධර්ම (එක්සත් ජාතීන්ගේ මූලධර්ම) 1990 දී ස්ථාපිත කෙරුණි. ඒ නීතිඥවරුන්ගේ භූමිකාව ප්‍රවර්ධනය හා සහ නිසි ආකාරයෙන් පවත්වා ගැනීම සහතික කිරීමෙහිලාය. එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම වල පූර්විකාවේ මෙසේ සඳහන්ව ඇත. මානව අයිතිවාසිකම් සහ මූලික නිදහසට ප්‍රමාණවත් ආරක්ෂාවක් සෑම පුද්ගලයකුටම සහතික කර තිබෙන අතර සියලු ස්වාධීන නීති වෘත්තිකයන් විසින් සපයනු ලබන නීති සේවා සඳහා ඵලදායී ප්‍රවේශයක් තිබේ යනුවෙනි. නීතිඥවරුන්ගේ නීති භූමිකාව සහතික කිරීමට සහ ප්‍රවර්ධනයට ස්ථිර ප්‍රමිතියක් ජාත්‍යන්තර නීතිඥ සංගමය විසින් සපයා ඇත.

පුද්ගලිකව අයිතිවාසිකම් දරන අය මෙන් නීතිඥවරුන්ට ද ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් ගිවිසුම් යටතේ අයිතිවාසිකම් සහ ආරක්ෂාවන්ට ද හිමිකම් ලබයි. මෙයට ඇතුලත් වන දේ පහත ආකාරයට උදාහරණ දැක්විය හැක. එනම් ජීවත් වීමේ අයිතිය, නිදහස සහ පුද්ගලික ආරක්ෂාව, වධ හිංසාව හෝ අනෙකුත් කෲර අමානුෂික හෝ පහත් කොට සැලකීම් හෝ දඬුවමට (වෙනත් අයහපත් සැලකීම්) වැලකී සිටීම සහ නීතිය ඉදිරියේ සමානතාවයයි.

2.3 වෘත්තියේ නීතිඥවරුන්ගේ නිශ්චිත යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම්.

2.3.1 සේවාදායකයන්ගේ තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යෑමේ යුතුකම.

අධිනීතිඥයකු, නීතිඥයකුගේ නොතාරිස් කෙනෙකු වශයෙන් මෙම සේවය කරගෙන යද්දී හෝ එම සේවයේ කාර්යය සඳහා ස්වකීය සේවාදායකයා විසින් හෝ ඔහු වෙනුවෙන් තමා වෙත දන්වන ලද යම් ලියුම් කියුම් සේවාදායකගේ ප්‍රකාශිත කැමැත්ත ඇතිව මිස නොඑසේනම්, අනාවරණය කිරීමට හෝ ස්වකීය වෘත්තීය සේවයක් හෝ එම සේවයේ කාර්යය සඳහා තමා දැනගත් යම් ලේඛනයක අන්තර්ගත කරුණු හෝ කොන්දේසි සඳහන් කිරීමට හෝ එම සේවය කරගෙන යද්දී හෝ එම සේවයේ කාර්යය සඳහා තමා විසින් තම සේවාදායකයාට දෙන ලද යම් අවවාදයක් අනාවරණය කිරීමට කිසිම නීතිඥයකුට, අධිනීතිඥයකුට හෝ නොතාරිස් කෙනෙකුට කිසි විටෙක අවසර නොදිය යුතුය.

එසේ වුවද මේ වගන්තියෙහි සඳහන් කිසිවත් නිසා පහත දැක්වෙන දේ අනාවරණය වීම වලක්වාලිය යුතු නොවේ.

(අ) යම් නීති විරෝධී කාර්යයක් සාර්ථක කර ගැනීම සඳහා කරනු ලබන එබඳු යම් ලියුම් කියුම්,

(ආ) යම් අධිනීතිඥයකු, නීතිඥයකුගේ නොතාරිස් කෙනෙකු විසින් එබඳු සේවයක නියුක්තව සිටිද්දී නිරීක්ෂණය කරන ලද එසේ සේවය ආරම්භ වීමෙන් පසු යම් අපරාධයක් හෝ වංචාවක් සිදුකර ඇතැයි දක්වන්නා වූ කරුණක්.

(2) එබඳු අධිනීතිඥයකුගේ, නීතිඥයකුගේ නොතාරිස් කෙනෙකුගේ සැලකිල්ල ස්වකීය සේවාදයක විසින් හෝ ඔහු වෙනුවෙන් එබඳු කරුණක් කෙරෙහි යොමු කරන ලද ලද්දේ ද නැද්ද යන වග නොවැදගත් ය.

ශ්‍රී ලංකා සාක්ෂි ආඥා පනත - 126 වගන්තිය.

තමා සහ තම නීති උපදේශකයන් ද අතර ගනුදෙනු වූ රහසිගත ලියුම් කියුම් අධිකරණයට එළිදරව් කරන ලෙස සාක්ෂිකරුවකු ලෙස ඉදිරිපත් නොවුව හොත් කිසිවෙකුට බල නොකළ යුතුය. ඔහු එසේ ඉදිරිපත් වුවහොත් ඔහු විසින් දෙන ලද යම් සාක්ෂියක් විස්තර කිරීම සඳහා දැනගත යුතු යයි අධිකරණයට එළිදරව් කිරීම අවශ්‍ය ලෙස පෙනෙන යම් ලියුම් කියුම් පමණක් එළිදරව් කරන ලෙස ඔහුට බල කළ හැකිය. අන් කිසිවක් එළිදරවු නොකළ යුතුය.

ශ්‍රී ලංකා සාක්ෂි ආඥා පනත - 129 වගන්තිය.

අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- නීතිය සහ අදාල වෘත්තීය හැසිරීමට අදාල රෙගුලාසි මගින් ඉඩ සලසන හෝ අවශ්‍යතාව මත කරුණකදී හැර වර්තමාන හෝ හිටපු සේවාදයකයන් සමග ඇති ගනුදෙනුවල රහසිගත භාවය ආරක්ෂා කිරීම සැම විට නීතිඥයකු විසින් කළ යුතුය.

ජාත්‍යන්තර නීතිඥ සංගමය - 4.1 වන වගන්තිය.

නීතිඥවරුන් සහ ඔවුන්ගේ සේවාදයකයන් අතර සියලු සන්නිවේදන සහ උපදෙස් වලට අදාල වෘත්තීමය සබඳතා විශ්වසනීය බව ආණ්ඩුව විසින් පිළිගෙන ගෞරව කළ යුතුය.

නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 22 වන වගන්තිය.

2.3.2 අතිශය උද්යෝගීමත් නීතිඥයකු වීමේ යුතුකම.

චූදිතයන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම පමණක් නීතිඥවරුන්ගේ කටයුතුවලට ප්‍රමාණවත් නැත. ඔවුන් නඩුවට අදාල තොරතුරු සහ නීතිය පිළිබඳව සූදනම් විය යුතුය. තවද සේවා දයකයාගේ අභිලාෂයන් වෙනුවෙන් ශක්තිමත් ලෙස පෙනී සිටිය යුතුව ඇත.

අදල ජාත්‍යන්තර තත්ත්වයන්.

- යුක්තිය ඉටු කිරීමේ කාර්යභාරයේදී නීතිඥවරු නෛතික නියෝජිතයන් ලෙස කටයුතු කිරීමේදී ඔවුන් සැම විටම වෘත්තීය ගෞරවය සහ අභිමානය රැකගත යුතුව තිබේ.

  නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 12 වන වගන්තිය.

- නීතිඥවරුන්ට තම සේවාදයකයන්ට යුතුකම් ඉෂ්ට කිරීමේදී පහත කරුණු වැදගත් වේ.

(අ) සේවාදයකයන්ට ඔවුන්ගේ නෛතික අයිතිවාසිකම් සහ යුතුකම් සම්බන්ධයෙන් උපදෙස් ලබාදිය යුතු අතරම නෛතික ක්‍රියාදාමයේදී අදල වන ඔවුන්ගේ නෛතික අයිතිවාසිකම් සහ යුතුකම් සම්බන්ධයෙන් ද දැනුවත් කළ යුතුව ඇත.

(ආ) සේවාදයකයන්ට සැම සුදුසු ආකාරයටම ඔවුන්ගේ නෛතික කටයුතු සදහා සහාය විහයුතු අතර ඔවුන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමට නෛතික ක්‍රියාමාර්ග ලැනීමද සිදුකළ යුතුය.

(ඇ) තවද අධිකරණ, විනිශ්චය සභා විසින් පරිපාලන අධිකාරීවල සහ සුදුසු ස්ථානවලදී සේවාදයකයන්ට සේවාදැයකයන්ට අවශ්‍ය නෛතික සහාය ලබාදිය යුතුවේ.

නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 13 වන වගන්තිය.

- සේවාදායකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීමේදී ජාතික සහ ජාත්‍යන්තර නීතියේ පිළිගත් මානව හිමිකම් සහ මූලික නිදහස ඉහළට ඔසවා තැබිය යුතුව ඇත. තවද ඔවුන් සෑම විටම නීති වෘත්තියේ පිළිගත් ප්‍රමිතිය සහ ආචාර ධර්ම සහ නීතියට අනුකූලව නිදහස්ව සහ සුපරික්ෂාකාරීව කටයුතු කළ යුතුව තිබේ.

<u>නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 14 වන වගන්තිය.</u>

- නීතිඥවරුන් සෑම විටම ඔවුන්ගේ සේවාදායකයන්ගේ අභිලාෂයන්ට විශ්වසනීය ලෙස ගෞරව කළ යුතුව ඇත.

<u>නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 15 වන වගන්තිය.</u>

- නීතිඥවරුන්ට ද සෙසු පුරවැසියන් මෙන් භාෂණයේ නිදහසට, විශ්වාසයක් දැරීමට, සමාගමයේ සහ රැස්වීම් සඳහා අයිතිවාසිකම් ඇත. විශේෂයෙන් ඔවුන්ට පහත දේ සඳහා නිදහස සහ අයිතිවාසිකම තිබේ. නීතිය, යුක්තියේ පරිපාලනය සහ මානව හිමිකම් ප්‍රවර්ධනයට සහ ආරක්ෂාවට අයිතිය ඇත. දේශීය ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධ වීමෙන් ඒවාද ස්ථාපිත කිරීමටත් අයිතිය තිබේ. ඔවුන්ට ඒවායේ රැස්වීම්වලට සහභාගී වීමට ද අයිතිය ඇත. මෙහිදී නීත්‍යානුකූල සංවිධානයන් හි වෘත්තීය සීමාවන් ගෙන් පීඩාවට පත් නොවීමේ හැකියාව තිබේ. මෙම අයිතිවාසිකම් භාවිතා කිරීමේදී නීතිඥවරුන් සෑම විටම නීතියට සහ පිළිගත් ප්‍රමිතීන්ට සහ නීති වෘත්තියේ ආචාර ධර්මවලට අනුකූලව කටයුතු කළ යුතුය.

<u>නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 23 වන වගන්තිය.</u>

- නීති වෘත්තියේ ස්ථාපිත රෙගුලාසි, ප්‍රමිතීන් සහ අචාරධර්ම වලට විෂය වෙමින් නීතිඥවරු ඔහුගේ හෝ ඇයගේ යුතුකම් ඉටුකළ යුතුය. ඔවුන් ඒ අනුව නිදහස්ව අභිමානවත් සහ බිය නැතිව කටයුතු කළ අතරම සේවාදායකයාගේ ව්‍යවස්ථාපිත අභිලාෂයන් වෙනුවෙන් පෙනී සිටිය යුතු අතර ඒ සඳහා අධිකාරීන්ගේ රජයේ තහනමකට හෝ පීඩාවකට පත් නොවිය යුතුය.

<u>2.3.3 අත්‍යාවශ්‍ය විමර්ශන පැවැත්වීමේ යුතුකම.</u>

විත්තියේ විමර්ශනයක් පැවැත්වීමට අසමත් වීම සේවාදායකයාට ඇති අයිතිවාසිකම් උල්ලංගනය කිරීමකි, නීතිඥවරයකු ලබා ගැනීමට ඇති අයිතිය සහ සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිවාසිකම උල්ලංඝණය කිරීමකි. පහත කරුණු වලදී විත්තිය නියෝජනය කරන නීතිඥයා අනෙක් අය මත පහත කරුණු සම්බන්ධයෙන් රැඳී නොසිටිය යුතුය. එනම් වාචික සාක්ෂිකරුවන්ගේ පක්ෂපාතීත්වය හෝ සාවද්‍යබව තීරණය කිරීමට චෝදනාව මෙහෙයවන නීතිඥයා විමර්ෂණය කරණ ජායාරූප වැනි අවශ්‍ය සාක්ෂ මත විත්තිය නියෝජනය කරන නීතිඥයා රැඳී නොසිටිය යුතුව ඇත.

<u>අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.</u>

සිය විත්ති වාචකය සූදනම් කර ගැනීමට තමාම තෝරා ගනු ලබන නීතිඥයකු හා අදහස් හුවමාරු කර ගැනීමට ප්‍රමාණවත් කාලය සහ පහසුකම් ලැබීමටයි.

<u>සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 14(3) (ආ) වගන්තිය.</u>

නීතිඥවරුන්ට පහත දේ සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම බලධාරීන්ගේ යුතුකමකි. ඒ නිසි ආකාර තොරතුරු, ලිපි ගොනු සහ ලේඛන වලටය. ඒවා ඔවුන් භාරයේ ඇත. තවද නීතිඥවරුන්ට

ඔවුන්ගේ සේවාදායකයන්ට එලදායී නීති සහය ලබාදීමට ඇති අයිතිය සහතික කිරීමෙහිලා ප්‍රමාණවත් ලෙස කාලය පාලනය කිරීම ද කළ යුතුව ඇත. එවැනි ප්‍රවේශයකට වඩාත් සුදුසු ලෙෂ ඉක්මනින්ම කාලයක් සපයා දිය යුතුය.

නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 21 වන වගන්තිය.

- ආණ්ඩු පහත කරුණු සම්බන්ධයෙන් නීතිඥවරුන්ට සහතික විය යුතුව ඇත. (අ) බිය වැද්දීම, අවමන් කිරීම, හිරිහැර හෝ අනිසි මැදිහත්වීම නොමැතිව ඔවුන්ගේ සියලුම වෘත්තීමය කටයුතු වල නිරතවීම (ආ) ඔවුන්ගේ රට තුළත් විදේශ වලත් ගොස් ඔවුන්ගේ සේවාදායකයන් සමග නිදහස්ව උපදෙස් ලබාදීම (ඇ) පිළිගත් වෘත්තීය යුතුකම්, ප්‍රමිතීන් හා ආචාර ධර්ම වලට අනුකූලව කටයුතු කිරීමේදී පීඩාවට පත්කිරීම හෝ තර්ජනය කිරීම නොකළ යුතු අතරම නඩු පැවරීම හෝ පරිපාලනමය, ආර්ථිකමය හෝ වෙනත් සම්භාධක පැමිණවීම ද නොකළ යුතුව ඇත.

නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 16 වන වගන්තිය.

2.3.4. යුතුකම සහ ස්වාධීනත්වය පිළිබඳ අයිතිවාසිකම.

වෘත්තියේ යෙදීම තුළ එක් බාධකයක් වන්නේ නීතිඥවරයා සේවාදායකයා මතුපිටින් බලා හඳුනා ගැනීමකි. මේ අතරතුර නීතිඥවරුන් සේවාදායකයා සමග කේන්ද්‍රීය විය යුතු අතරම ඔවුන්ගේ අභිමතයන් ගැනද සිතිය යුතුව ඇත. නීතිය සහ ආචාර ධර්ම ප්‍රමිතීන් වලට අනුකූල ව කටයුතු කළ යුතු අතරම ස්වාධීන වෘත්තිකයන් ලෙස ද කටයුතු කළ යුතුය.

අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- නීතිඥවරුන් ඔවුන්ගේ සේවාදායකයන්ගේ හේතූන් ඔවුන් ගේ ක්‍රියාවන් සිදු කිරීමේදී ප්‍රතිඵලයක් ලෙස හඳුනා නොගත යුතුය. නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 18 වන වගන්තිය.
- නීතිඥවරු සිවිල් සහ දණ්ඩණ මුක්තියට හිමිකම් ලබති. ඒ යහපත් චේතනාවෙන් සිදුකරන ප්‍රවේශ වලදී මෙය ලිඛිතව හෝ වාචිකව විය හැක. තවද එයට අධිකරණයේදී, විනිශ්චය සභාවක හෝ වෙනත් නීතිමය හෝ පරිපාලන අධිකාරියකදී වෘත්තීමය පෙනී සිටීමේදී යන්න එකතු වේ. නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 20 වන වගන්තිය.

- නීතිඥවරයා ස්වාධීනත්වය පවත්වාගෙන යා යුතුය. සේවාදායකයන්ට අපක්ෂපාතී උපදෙස් හා නියෝජනය ලබාදීමේදී ස්වාධීන වීමෙන් ආරක්ෂාව සැපයිය යුතුව ඇත. තවද නීතිඥවරයා සේවාදායකයකුට උපදෙස් දීමේදී ස්වාධීනව සිටීම, අපක්ෂපාතී වෘත්තීය තීරණය භාවිතා කළ යුතු වන අතර එයට සේවාදායකයාගේ හමුවීමේදී සාර්ථකත්වයට කැමති විය යුතු වේ. ජාත්‍යන්තර නීතිඥ සංගමය - 1 වන වගන්තිය.
  - නිදහස අහිමි පුද්ගලයන් සමග ගනුදෙනු කිරීමේදී නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය සහතික විය යුතු අතරම ඒ පුද්ගලයන් නිදහස් සාධාරණ සහ විශ්වසනීය නීතිමය සහයෝගීතාවය ද සහතික විය යුතුය. මෙහිදී ඒ සඳහා එවැනි පුද්ගලයන්ට නීතිඥයාගේ ප්‍රවේශය ද සහතික විය යුතුව ඇත. මෙහිදී ඔවුන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥයා සහ බලධාරීන් අතර ගැටුම්, පිළියෙල කිරීම් හෝ යැපීම් වැලැක්වීමෙහිලා ආරක්ෂිත විධි විධාන ගොඩනගා තිබේ. ජාත්‍යන්තර නීතිඥ සංගමය, 12 වන වගන්තිය

2.3.5 ආචාරශීලි වීමේ යුතුකම.

අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- නීතිඥවරුන්ට ද සෙසු පුරවැසියන්ට මෙන් භාෂණයේ නිදහසට, විශ්වාසයක් දැරීමට, සමාගමයේ හා රැස්වීමේ නිදහසට අයිතිවාසිකම් ඇත. විශේෂයෙන් ඔවුන්ට පහත කරුණු සඳහා අයිතිවාසිකම් තිබේ. නීතිය අධිකරණමය යුක්තියේ පරිපාලනය, මානව හිමිකම්

ප්‍රවර්ධනයට සහ ආරක්ෂාවට අදාල පොදු සාකච්ඡාවන්ට සහභාගී වීමේ අයිතිය මෙන්ම දේශීය ජාතික හෝ ජාත්‍යන්තර සම්බන්ධතා සංවිධාන වලට එකතු වීම හෝ ස්ථාපිත කිරීමට ද ඒවායේ රැස්වීම්වලට සහභාගී වීමටද යන අයිතීන් වේ. මෙහිදී ඔවුන්ගේ නෛතික ක්‍රියාව හෝ ඔවුන්ගේ නීතිමය සීමාවන්ගෙන් පීඩාවට පත් නොවිය යුතුය. මෙම අයිතිවාසිකම් භාවිතයට ගැනීමේදී නීතිඥයන්ට නීතිය සහ පිළිගත් ප්‍රමිතීන් මෙන්ම නීති වෘත්තියේ ආචාර ධර්ම වලට අනුකූලව ද කටයුතු කළ හැක. නීතිඥවරුන්ගේ භූමිකාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම 23 වන වගන්තිය.

2.3.6 නියෝජනයේදී අභිමතයන් අතර ගැටුම මගහැරීමේ යුතුකම.

නියෝජනයේදී අභිමතයන් අතර ගැටුමකට ඉඩ නොදී සිටීමට අපරාධ නඩු කටයුතු මෙහෙයවන නීතිඥවරුන්ට යුතුකමක් ඇත. නීතිඥයා හා සේවාදායකයා අතර සබඳතාවයට බලපෑමක් වීමට ඉඩක් පවතින විට අභිමතයන් අතර ගැටුම ඇති වේ. ඒ නිසා මෙම තත්වය සේවාදායකයා වෙත නීතිඥයාට ඇති පක්ෂපාතීත්වය, සේවාදායකයාට ස්වාධීන නඩු තීන්දුවක් ලබාදීමට නීතිඥයාට ඇති වගකීම හෝ සේවාදායකයාගේ අභිමතයන් ආරක්ෂා කිරීමේ වගකීමට බලපායි.

මෙහිදී සටහන් කළයුතු වැදගත් කරුණක් ඇත. නඩුවෙන් නඩුවට ගැටුමේ සීමාව වෙනස් වේ. ඒ ගැන සැලකිල්ල යොමු කළ යුත්තේ නඩුවට අනුවය. නියෝජනය පිළිබඳ ගැටුමට පහත උදාහරණ අදාල වේ.

(1) චූදිතයකු සිය නීතිඥයා හමුවේ වරදකරු බව පිළිගත්ත ද කැමැත්තෙන් සිටින්නේ එසේ නොමැති බව ප්‍රකාශ කිරීමටය. මෙහිදී චූදිත වැරදිකරු බව සිතා නීතිඥයාට නිසි ලෙස අධිකරණය ආමන්ත්‍රණය කළ නොහැක. (එනම් දැනුවත්ව අසත්‍යයක් වෙනුවෙන් අධිකරණය නියෝජනය කරනු ලැබේ)

(2) නඩුවේ න්‍යාය සම්බන්ධයෙන් චූදිතයකු එකඟ නොවී සිටිය හැක. නීතිඥයා හා සේවාදායකයා අතර සම්බන්ධය පලුදු වීම නිසා නීතිඥයාට නිසි ලෙස නඩුව කළමනාකරණය කළ නොහැකි වන අතර ඉදිරියට කරගෙන යාමේ හැකියාව අඩුවේ.

2.3.7 අධිකරණයේදී නෛතික නියෝජනය ලබාගැනීමට ඇති අයිතිවාසිකම.

අදාල ජාත්‍යන්තර තත්ත්වයන්.

- කිසිදු අධිකරණයක් හෝ පරිපාලන අධිකාරියක් නීතිඥයකු ලබා ගැනීමට ඇති අයිතිය පිළිගත්ත ද නීතිඥවරයා දේශීය නීතිය සහ භාවිතය සහ මෙම මූලධර්මයන්ට අනුව සුදුසුකම් නොමැති විටදී නීතිඥයකු ලෙස තම සේවාදායකයා වෙනුවෙන් නැගී සිටීමය බළධාරී ආයතන මගින් ප්‍රතික්ෂෙප කරයි. 19 වන වගන්තිය එක්සත් ජාතීන්ගේ නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ මූලික මූලධර්මයන්.
- කිසිදු අධිකරණයක් හෝ පරිපාලන අධිකාරියක් එම අධිකරණ බලය තුළ සුදුසුකම් සහිතව සේවාදායකයා වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥවරයා සතු අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කරන්නේ නැත. 9 වන වගන්තිය ජාත්‍යන්තර නීතිඥ සංගමය.

- යම් නිශ්චිත නඩුවකදී නීතිඥවරයකුට විනිසුරුවරයකුගේ සහභාගීත්වයට හෝ අඛණ්ඩ සහභාගීත්වයට සාධාරණ හේතුවක්මත විරෝධතාවය පල කිරීමට අයිතිවාසිකමක් ඇති අතරම නඩු විභාගය හෝ නඩු ඇසීමට යන කාරණා සම්බන්ධයේදී මේ තත්ත්වය අදාල වේ. 10 වන වගන්තිය ජාත්‍යන්තර නීතිඥ සංගමය.

2.3.8 රැඳවුම් භාරයේ සිටින සේවාදායකයන්ට ප්‍රවේශය සඳහා ඇති අයිතිවාසිකම.

අදල ජාත්‍යන්තර තත්ත්වයන්.

- සියලුම පුද්ගලයන්ට තම කැමැත්ත පරිදි නීතිඥයකුගේ සහය ලබා ගැනීමට එනම් ඔවුන්ගේ අයිතවාසිකම් ආරක්ෂා කිරීමට සහ ස්ථාපිත කිරීමට සහ අපරාධ නඩු විධාන ක්‍රියාමාර්ගයන්හි සෑම පියවරකදීම ඔවුන්ගේ ආරක්ෂාව සඳහා පෙනී සිටීමේ අයිතිවාසිකම ඇත. පළවන වගන්තිය, නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්.
- සියලුම පුද්ගලයන්ට ඔවුන්ගේ භූමිය තුළ විෂය වන සහ කිසිදු වෙනස්කමකට එනම්, ජාතිය, වර්ණය, දේපළ, උපත, ආර්ථිකමය තත්ත්වයන් මත වෙනස්කමකට භාජනය නොවී නීතිඥවරුන් වෙළදයී සහ සම ප්‍රවේශය ලබාගැනීමෙහිලා වෙළදයී ක්‍රියාදමයන් සහ වගකිවයුතු යාන්ත්‍රණයක් නිර්මානය කිරීමට රජය වගබලාගත යුතුවේ. 2 වන වගන්තිය නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්.
- ආණ්ඩුව විසින් දුගී ජනතාවට සහ අනෙකුත් වරප්‍රසාද අහිමි පුද්ගලයන්ට ඒ අවශ්‍යතා අනුව නීති සේවා ලබාදීම සඳහා ප්‍රමාණවත් ආධාර සහ අනෙකුත් සම්පත් ලබාදීම පිළිබඳ ප්‍රතිපාදන සහතික කළ යුතුය. 3 වන වගන්තිය නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්.
- ආණ්ඩු සහ නීතිඥවරුන්ගේ වෘත්තීය සංගම් කළ යුත්තක් ඇත. ඒ ජනතාවට ඔවුන්ගේ නෛතික අයිතිවාසිකම් සහ යුතුකම් සහ ඔවුන්ගේ මූලික නිදහස අරක්ෂා කිරීමෙහිලා නීතිඥවරුන්ගේ වැදගත් භූමිකාව පිළිබඳ දැනුවත් වීමට ඉවහල් වන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමය. මෙහිදී දුප්පත් සහ අනෙකුත් වරප්‍රසාද අහිමි පුද්ගලයන්ට සහය වීමට සහ ඔවුන්ගේ අයිතීන් දිනා ගැනීමට නීතිඥවරුන්ගේ සහය ලබා ගැනීම යන කරුණු වලට විශේෂ අවධානය යොමු කළ යුතුය. 4 වන වගන්තිය නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්.
- යම් අධිකාරියක් විසින් සියලු පුද්ගලයන්ව අත්අඩංගුවට ගැනීමේදී හෝ රැඳවීමේදී හෝ අපරාධ වරදකට චෝදනා එල්ල වූ විට ඔවුන්ගේ කැමැත්ත මත නීතිඥවරයෙකුගේ සහයෝගය ලබාගැනීමට ඔවුන්ට අයිතිවාසිකමක් ඇති බව ආණ්ඩුව විසින් සහතික කළ යුතු තවත් කරුණක් වන්නේ . 5 වන වගන්තිය නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්.
- ආණ්ඩු විසින් තවදුරටත් සහතික කළ යුතු කරුණක් වන්නේ අත්අඩංගුවේ රඳවනු ලැබූ සියලු පුද්ගලයන් අපරාධ චෝදනාවක් ඇතිව හෝ නැතිව ඒ අයට ඉතා කඩිනමින් නීතිඥවරයෙකු වෙත ප්‍රවේශය ලබා ගැනීමට සහ ඕනෑම සිද්ධියකදී අත්අඩංගුවේ හෝ රඳවා ගෙන පැය 48 කට නොඅඩු කාලයක් තුල මෙය සිදුවිය යුතු බවය. 7 වන වගන්තිය නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්.
- අප්‍රමාදව, බාධාවක් හෝ වාරණයක් නොමැතිව සම්පූර්ණ විශ්වාසයක් ඇතිව නීතිඥවරයෙකුට පැමිණ සියලු අත්අඩංගුවට ගත්, රඳවාගනු ලැබූ හෝ සිරකර ඇති පුද්ගලයන්ට සන්නිවේදනය කිරීමට උපදෙස් දීමට ප්‍රමාණවත් අවස්ථාව, කාලය සහ පහසුකම ලබාදිය යුතුය. ඒ උපදෙස් දීම සිදුවන විට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හෝ දැකීමට හැකි විය යුතු අතර ඔවුන් විසින් ශ්‍රවනය නොකළ යුතුය. 8 වන වගන්තිය නීතිඥවරුන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මයන්.

(3) සේවාදායකයා

3.1 සේවාදායකයා සමග සිදුකරන ප්‍රාථමික සම්මුඛ සාකච්චාව.

විත්තියේ නීතිඥයා (ඔහු/ඇය) සේවාදායකයා සමග කරන ප්‍රථම සම්මුඛ සාකච්ඡාවේ වඩාත් වැදගත් පළමු මුණ ගැසීම වේ. එය නීතිඥ සේවාදායක සබඳතාවයට වඩාත් අත්‍යාවශ්‍ය පදනමක්

දරන අතර විත්තියේ නීතිඥයාට විත්තිකරු කවුද යන්න හඳුනා ගැනීමට නීතිඥවරයාට අවස්ථාවක් සහ නඩුවේ මූලික කරුණු අවබෝධ කර ගැනීමට ආරම්භයක් ද වේ.

ප්‍රාථමික සම්මුඛ සාකච්ඡාව අතරතුර විත්තියේ නීතිඥවරයා වඩාත් තීරණාත්මක තොරතුරු ඉගෙන ගනු ඇත. එනම් සාක්ෂිකරුවන් හඳුනා ගැනීම, සම විත්තිකරුවන් හඳුනා ගැනීම, සාක්ෂි ඇති ස්ථාන, විත්තිකරුගේ නෛතික අයිතිවාසිකම් වල යම් තීරණාත්මක උල්ලංඝණයන් සිදු වී ඇති ද යන්න බවට තැකීමක් ඇති කරුණුය. මෙම තොරතුරු සාර්ථක විත්තියේ සැලැස්මක් සංවර්ධනය උදෙසා වන අතර මෙය ප්‍රායෝගික හැකියාව මත ඉතා කඩිනමින් ලබා ගත යුතු දේවේ.

සේවාදයකයා සිද්ධීන් පිළිබඳව කරන ප්‍රකාශය තේරුම් ගැනීමෙන් ඔබ්බට ගිය හොත් පමණක් ඉතා හොඳ විත්තියක් ගොඩ නැගෙනු ඇත. මේ අතර තුර ඔබ ඔබේ සේවාදයකයාගේ කතන්දරය දැනගත යුතුය. තවද අනෙකුත් අය එයට විරුද්ධව පවසන කතාන්දරය සමග එය පරීක්ෂා කර බැලීමද වැදගත් වේ. පහත උදාහරණය සලකා බලමු. ඔබේ සේවාදයකයා වෙනත් අයෙකුට පහරදීම පිළිබඳව චෝදනා ලබා ඇත. ඔහු එය ප්‍රතික්ෂේප කරයි. එහිදී ඔබ අනෙකුත් අයගෙන් ඉගෙන ගත යුතු තවත් කරුණකි. ඒ ඔහු ප්‍රචණ්ඩ පුද්ගලයකු ලෙස සලකන්නේ ද යන්නය. මෙය උදාහරණයක් ලෙස දැක්විය හැක. එනම් වින්දිතයා ලෙස හඳුන්වන පුද්ගලයා විත්තිකරුට වඩා විශාල නම් සහ එම පුද්ගලයා පහරකෑමට ඉලක්කය විය නොහැකි බවය. විත්තියේ නීතිඥවරයා මෙම ප්‍රථම සම්මුඛ සාකච්ඡාව පහත කරුණු සඳහා ද ප්‍රයෝජනයට ගත යුතුය. එනම් විත්තිකරුට ඔහුගේ නෛතික අයිතිවාසිකම් පිළිබඳව උපදෙස් දීමට නීතිඥවරයා සහ සේවාදයක සම්බන්ධයෙන් ලක්ෂණ පැහැදිළි කිරීමට සහ නඩුවේ නෛතික කාර්ය පටිපාටීන් සාකච්ඡා කිරීමටය.

මේ සඳහා සරල සැලැස්මක් පහතින් දැක්වේ.

ගිවිසුම
↑
කරුණු අර්ථ නිරූපනය
↑
දෙබස විස්තර කිරීම
↑
සේවාදයක පවසන දේ (කතන්දරය)
↑
විස්තරය නීතියට අනුව
↑
හැඳින්වීම සහ ලක්ෂණ පිළිබඳ පසුබිම

ඒ අනුව විත්තියේ නීතිඥයා ඔහුගේ ඇයගේ සේවාදයකයා ඉතා ඉක්මණින් මුණගැසිය යුතුය.

1. ඉතා ඉක්මණින් අවශ්‍යය නීතිඥ සහාය ලබාදිය යුතුය.

2. නඩුව පිළිබඳ ආරම්භයේ තොරතුරු එකතු කිරීමට පටන්ගත යුතුය.

3. තොරතුරු සහ සිද්ධීන් ගැන සේවාදයකයා කරන විස්තරය අවබෝධ කරගත යුතුයි.

4. සේවාදයකයාගේ උපදෙස් ගත යුතුයි.

5. විත්තිය ගොඩනැගීම ආරම්භ කළ යුතුයි.

6. නඩුවට අදල විත්තිය සහ තේමාව සංවර්ධනය කිරීම ආරම්භ කළ යුතුය.

7. සේවාදයකයාගේ අභිලාෂයන් පිළිබඳ යහපත් තත්ත්වය ආරක්ෂා කිරීම උදෙසා ගතයුතු ප්‍රාථමික නෛතික පියවර සලකා බැලීම සහ ආරම්භ කිරීම කළ යුතුය.

සේවාදායකයා සමග කරන පළමු හමුවේදී සංවේදනාත්මකව සැලකීම හා කාරුණික බව අත්‍යවශ්‍ය වේ. සේවාදායකයාව ඵලදායී ලෙස නියෝජනය කිරීම සඳහා විත්තියේ නීතිඥයා ඔහුගේ හෝ ඇයගේ විශ්වසනීයත්වය ලබා ගත යුතුය. මෙහිදී සේවාදායකයා පැහැදිලි කළ යුතු දෙයක් වන්නේ හමුවීම වරප්‍රසාද සහගත සහ විශ්වසනීය එකක් බවය. තවද සේවාදායකයා දැනුවත් කළ යුත්තේ නඩුවේ චෝදනා හෝ තොරතුරු යහළුවන් සහ පවුලේ උදවිය මෙන්ම අන් සැම කෙනෙකු සමගම සාකච්ඡා නොකළ යුතු බවය. අවසාන වශයෙන් අවංක බව සහ සියලුම තත්ත්වයන් යටතේ සත්‍යය පැවසීමේ වැදගත්කම ඉස්මතු කිරීම වේ.

ප්‍රථම සේවාදායක සම්මුඛ සාකච්ඡාවේදී තවත් වැදගත් අරමුණක් ඇත. ඒ සේවාදායකයා අත්අඩංගුවේ තබා ගැනීමට සාධාරණ පසුබිමක් ඇත් ද යන්න නිශ්චිතව දැන ගැනීමය.

විත්තියේ නීතිඥවරයා නඩු විභාගයට පෙර සේවාදායකයා ව නිදහස් කර ගැනීමට අදාල නෛතික ක්‍රියාදාමය පිළිබඳව අවබෝධයෙන් සිටීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ඇප දිය හැකි වැරදි සහ ඇප දිය නොහැකි වැරදි අතර වෙනස වැදගත්ය.

සේවාදායකයා නීතියේ නියම කර ඇති උපරිම කාලයට වැඩි කාලයක් තබ ාගත නොහැකි අතර ඔහුව හෝ ඇයව අධිකරණයට ඉදිරිපත් නොකර තබා ගැනීම ද නොකළ යුතුය. මෙය සහතික කළ යුතුය.

තවද සේවාදායකයා වධහිංසාවලට හෝ අතවර වලට විෂය නොවන බව මෙන්ම සේවාදායකයා රඳවා සිටින විට ඒ රඳවා ගැනීමේ තත්ත්වයන් පිළිගත් මානව හිමිකම් සංකල්පයන් සහ ප්‍රමිතීන්ට අනුකූළ වන බව ද සහතික විය යුතුය.

### (3.2) ප්‍රථම සම්මුඛ සාකච්ඡාවේදී නීතිඥ - සේවාදායක සම්බන්ධය ගොඩ නගා ගැනීම පිළිබඳ ප්‍රායෝගික කරුණු.

සේවාදායක විශ්වාසය ලබාගැනීම සහ අදාල තොරතුරු අනාවරණය කර ගැනීම සහ නඩුව සමග ක්‍රියාපටිපාටිය ලෙස ඉදිරියට යාමට අවශ්‍ය විට පහත දේ පිළිබඳව සලකා බැලිය යුතුය.

(3.2.1) ඔබේ සේවාදායකයාගේ කතාවට ඇහුන්කන් දීම.

- ඔබේ ඇහුන්කන් දීම සහ සම්මුඛ පරීක්ෂණය සිදුකිරීමේ මූලික හැකියාවන් භාවිතයට ගන්න.
- ඔබේ සේවාදායකයාගේ තැකීමක් ඇති කරුණු සහ ස්ථාවරයන් අවබෝධ කර ගැනීමට උත්සහ කරන්න.
- ඔබේ සේවාදායකට ඇහුම්කන් දෙන්න. නිරීක්ෂණය කරන්න.
- ඔබ සේවාදායකට සවන් දෙන බව සහ අවධානය යොමු කරන බව පෙන්නුම් කිරීමට ඔබේ ශරීර භාෂාව භාවිතයට ගන්න.
- සේවාදායකයා ගැන කැමැත්තක් ඇති බව පෙන්නුම් කිරීමට ඇස් වලින් සම්බන්ධතාවය ගොඩ නගා ගන්න.
- සේවාදායකයා ට තම සම්පූර්ණ කතාව හෙලිදරව් කිරීමට උනන්දු කරවීම.
- හැකියාව පවතී නම් සේවාදායකයාට ඔහුගේ ඇයගේ අදාල සිද්ධීන් ලිවීමට ඉඩ සැලැස්වීම.
- තවද, තමා සේවාදායකයාව විනිශ්චය නොකරන බව දැන්වීම.

(3.2.2) ප්‍රබල ලෙස අවධාරණය කළ යුතුය. වෙනස් නොවිය යුතුය.

- සේවාදායකයා පිළිබඳව තැකීමක් ඇති බව පෙන්විය යුතුය.
- එම තැකීමක් ඇති බව පෙන්නුම් කිරීමේදී කෙසේ නමුත් නීතිඥයකු ලෙස වෘත්තීමය ලෙස හා බාහිර හැසිරීමෙන් දුරස්ථභාවයක් තබා ගත යුතුය.

(3.2.3) සම්මුඛ සාකච්ඡාවේ ආරම්භක කොටසේදී සේවාදායකයා වෙත යම් පාලනයක් ඇත්නම් එය අතහැර දැමිය යුතුය.

- සේවාදායකයාට හැඟීම් ආදිය නිදහසේ පිට කිරීමට ඉඩ දිය යුතුය.
- මතක තබා ගත යුතුය; ඔබ ගැටළුව විසඳන කෙනා බැවින් සේවාදායකයාට ඔහුගේ /ඇයගේ ගැටළු සහ ප්‍රශ්න ඔබ වෙත විස්තර කිරීමට අවශ්‍ය බවත්ය.

(3.2.4) උත්තරය දනවන ප්‍රශ්න අසන්න.

- සේවාදායකයාගේත් ඔහුගේ හෝ ඇයගේ පැහැදිළි කිරීම හෝ කතන්දරය ලබා ගැනීමට ප්‍රශ්න අසන්න.
- මතක තබා ගැනීම; උත්තරය අඟවන ප්‍රශ්න WWWHW ප්‍රශ්නය එනම් Who (කව්ද) When (කීයටද) Why (ඇයි) How (කොහොමද) සහ Where (කොහේද) ආදී වශයෙනි.
- උත්තරය අඟවන්නේ නැති ප්‍රශ්න මගහැරිය යුතුය. ඒවා උත්තරය අඟවන ප්‍රශ්න වලට වඩා අඩු තොරතුරු ප්‍රමානයක් සපයන අතර ඒවාට සේවාදායකයාව ඉදිරියට යොමු කිරීමේ හැකියාව ඇත.

(3.2.5) <u>සේවාදායකයා සමග ගැටුමක් ඇති කර ගැනීමෙන් වැළකී සිටීම.</u>

- ඔබේම සේවාදායකයාගෙන් ප්‍රශ්න නොකිරීම.
- දිගින් දිගටම ප්‍රශ්න කිරීමෙන් වැළකීමට උත්සාහ කිරීම.
- මෙම පියවරේදී උත්සාහ කළ යුතු තවත් දෙයක් වන්නේ සේවාදායකයාගේ විස්තරය අනෙක් සාක්ෂිකරුවන්ගේ විස්තරය සමග පරස්පර විරෝධී හෝ නොගැළපීම පෙන්වීමට ඉඩ නොදී සිටීමය.

  මෙම කරුණ නීති උපදේශනයේදී සහ නඩු විභාගයට සූදානම් වීමේදී ඉදිරි කටයුතුවලදී ද අවධානය යොමු කරනු ඇත.

(3.2.6) <u>ප්‍රශ්න අසන්නා තමාත් වැඩියෙන් කතා කිරීමෙන් වලකින්න.</u>

- අත්දැකීම් සහිත සම්මුඛ සාකච්ඡාව සිදුකරන තැනැත්තා ඔහු හෝ ඇය කතා කරනවාට වඩා ඇහුම්කන් දෙයි.
- යම් තොරතුරක් අපැහැදිලි විට ඉදිරියට යෑමට හෝ ප්‍රශ්න විභාග කිරීමට අදාල දේ ඇසිය යුතුව ඇත.

(3.2.7) <u>සෑම විටම සම්මුඛ සාකච්ඡාව අවසන් කළ යුත්තේ ධනාත්මක පියවරක් සඳහා බලාපොරොත්තුව තබමිනි.</u>

- ඔබ වෘත්තියේ නීතිඥවරයා ලෙස පහත කරුණු සිදුකළ යුතුව ඇත. එනම් ඔබේ සේවාදායකයා කොතරම් ලොකු වුවද හෝ කුඩා වුවද ඊළඟ ක්‍රියාව හෝ ප්‍රායෝගික පියවර පිළිබඳව පෙන්නුම් කිරීමක් සිදු කරන්න.
- ඉදිරියට සිදුකරන සම්මුඛ සාකච්ඡාව පිළිබඳ කාල වකවානු තීරණය කර ගන්න.
- කිසිම අවස්ථාවක ඔබට ඔබේ සේවාදායකයා වෙනුවෙන් කළ නොහැකි දෙයක් පිළිබඳව පොරොන්දුවක් නොදෙන්න.

3.3 <u>නීතිඥ සේවාදායක සම්බන්ධතාවය ගොඩ නැගීම.</u>

සේවාදායකයා, වෘත්තියේ නීතිඥවරයා පිලිබඩව මුල් ආකල්පයක් ඇති කරගත යුතු අතරම සේවාදායකයා ද ස්වකීය නීතිඥයා සම්බන්ධව මුල් ආකල්පයක් ඇතිකර ගැනීම මුල් අවස්ථාවේදී සිදුකරගත යුතුය. පළමු සේවාදායක සම්මුඛ සාකච්ඡාවේදී වෘත්තියේ නීතිඥවරයාගේ ප්‍රාථමික අරමුණ අන්‍යොන්‍ය විශ්වාසය, අවබෝධය සහ ගෞරවය මත පදනම් වූ ධනාත්මක නීතිඥ සේවාදායක සබඳතාවයක් ස්ථාපිත කිරීම වේ. වඩාත් ඵලදායී නෛතික නියෝජනය සැපයීම වෙනුවෙන් වෘත්තියේ නීතිඥවරයා හැකි ඉක්මණින් පළමු සම්මුඛ සාකච්ඡාව පැවැත්වීමෙහිලා වෘත්තිකරු හමුවිය යුතු වේ.

නීතිඥවරයාට පහත අයිතිවාසිකම ඇත. එනම් පොලිස් නිලධාරියෙකු හෝ බන්ධනාගාර නිලධාරියකු ගේ සහභාගීත්වය නොමැතිව පුද්ගලිකව සිය සේවාදයකයා සමග සම්මුඛ සාකච්ඡා කිරීමය. පොලීසියට ඔවුන් සිටියදී හෝ ඔහුට ඇසෙන දුරකින් සිටින විට එනම් කතා කරන දේ ඇහුන්කන් දීමට හැකිවන පරිදි සේවාදයකයා සමග සම්මුඛ සාකච්ඡාව පැවැත්විය යුතු යැයි තදින් කියා සිටිය නොහැක.

ගැඹුරු සම්මුඛ සාකච්ඡාවක් සඳහා ප්‍රමාණවත් කාලය වෙන් කිරීමට විත්තියේ නීතිඥවරයා වගබලා ගැනීම අනිවාර්ය වේ. පළමු සම්මුඛ සාකච්ඡාවට සූදානම් වීමේදී විත්තිකරුට එල්ලවී ඇති අපරාධ චෝදනාව සහ ඒ සඳහා නියමව ඇති දඬුවමට අදාල මූලද්‍රව්‍යය පිළිබඳව විත්තියේ නීතිඥවරයා හොඳින් දැන සිටිය යුතුය. තවද හැකියාව තිබේ නම් අදාල ලේඛන එනම් අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු, සෝදිසි වරෙන්තු, පොලිස් වාර්තා සහ අනෙකුත් අතිරේක ලිපි ලේඛන ආදී අපරාධ චෝදනාවට අදාල දේවල් පිළිබඳ පිටපත් විත්තියේ නීතිඥවරයා විසින් ලබාගත යුතුය. මෙම ලේඛණ සපයාගත නොහැකි වීම මත සම්මුඛ සාකච්ඡාව ප්‍රමාද නොකිරීමට වගබලා ගත යුතුය. (පළමු සම්මුඛ සාකචඡාව මීට පෙර මෙම දේවල් සපයා ගත නොහැකි නම් සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වෙමින් තිබිය දී හැකි ඉක්මණින් සපයාගත යුතුව ඇත.

(3.4) <u>පළමු සේවාදයක සම්මුඛ සාකච්ඡාවේ හරි වැරදි බැලීමේ ලේඛනය.</u>

සේවාදායකයා සමග කරන පළමු සම්මුඛ සාකච්ඡාවේදී එකතු කළ යුතු තොරතුරු මොනවාද යන්න සම්බන්ධයෙන් පහත කරුණු ප්‍රයෝජනවත් උපදෙස් මාලාවක් වනු ඇත.

<u>සේවාදයකයාගේ පසුබිම පිළිබඳව තොරතුරු.</u>

පළමු සම්මුඛ සාකච්ඡාවේදී විත්තියේ නීතිඥවරයා විසින් විත්තිකරුගෙන් පහත සඳහන් පසුබිම පිළිබඳ තොරතුරු ලබාගත යුතුව ඇත. මෙම තොරතුරු විත්තිකරු පිළිබඳව විත්තියේ නීතිඥවරයාට හඳුනා ගනීමටත් නීතිඥවරයාට විත්තිය පිළිබඳව උපක්‍රම ගැන දැනුවත් කිරීමට ඉඩ ප්‍රස්ථා ලබා දේ.

- නම
- ලිපිනය
- දුරකථන අංක
- උපන් දිනය
- ප්‍රජාව සමග ඇති බැඳියාවන් (දැනට ඇති ලිපිනයට අදල වෙලාව, පවුල් සබඳතා, ආගමන තත්ත්වය (අදල වුවහොත් පමණක්)
- උස, බර සහ හඳුනාගත් අනෙකුත් ලක්ෂණ
- හමුද සේවය පිළිබඳ ඉතිහාසය
- අධ්‍යාපනය පිළිබඳ ඉතිහාසය
- රැකියාව පිළිබඳ ඉතිහාසය
- අපරාධ ඉතිහාසය
- පවුලේ ඉතිහාසය
- ශාරීරික සහ මානසික සෞඛ්‍යය
- කඩිනම් වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යතා
- හදිසි අවස්ථාවක සම්බන්ධ වීම පිළිබඳ තොරතුරු

<u>අත්අඩංගුවට ගැනීම.</u>

- අත්අඩංගුවට ගත්තේ කවද ද?
- අත්අඩංගුවට ගත්තේ කොහේදී ද?
- අත්අඩංගුවට ගත්තේ කවුරුන් විසින් ද?

- අත්අඩංගුවට ගන්නා හේතුව ඔබට දැන්නුවා ද?
- අත්අඩංගුවට ගැනීමේ හේතුව පිළිබඳව ඔබට අවබෝධ වූවා ද?
- ඔබව අත්අඩංගුවට ගත්ත වේලාවේදී ඔබව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුව හෝ සිතාසිය පෙන්නුවා ද?
- ඔබව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුව කියවා තේරුම් ගැනීමේ හැකියාව තිබුණා ද?
- ඔබට වරෙන්තුවේ හෝ සිතාසියේ පිටපත ලබා දුන්නා ද?
- ඔබට ඔබේ නෛතික අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීමක් සිදුකළා ද?
- ඔබව රඳවාගෙන පැය 24 ක් ඇතුළත ඔබව අත්අඩංගුවට පත්වූ ස්ථානය සහ ඔබව රඳවා ගැනීමේ වරෙන්තුව ඔබේ පවුලට හෝ වැඩ ඒකකයට සඳහන් කළාද?
- ඔබව අත්අඩංගුවට ගැනීමේදී ඔබ සමග වෙන අයෙකුත් අත්අඩංගුවට ගත්තා ද? එසේ සිදුවූයේ නම් ඔවුන්ගේ නම්, ලිපින සහ දුරකථන අංක සහ ඔවුන්ගේ පවුල්වල උදව්ය සමග සම්බන්ධ වීමේ තොරතුරු පිළිබඳව ඔබ දන්නේ ද? ඔබ ඔවුන්ට චෝදනා ඇති වැරදි පිළිබඳව දන්නේ ද?

සෝදිසි කිරීම හා භාරයට ගැනීම.

- ඔබව නිරුවත් කර පරීක්ෂා කළා ද? ඔබෙන් ලබාගත් පුද්ගලික දෑ මොනවා ද?
- ඔබේ ඇඳුම් කිසිවක් භාරයට ගත්තා ද? ඇඳුම් වල තිබී යමක් ගත්තා ද?
- ඔබේ ශරීරයේ යම් දියරයක් හෝ හිසකෙස් පරීක්ෂා කිරීම සඳහා ගත්තා ද?
- ඔබව සෝදිසි කළේ ඔබව අත්අඩංගුවට ගත් ස්ථානයේදී ද?
- ඔබව සෝදිසි කළේ ඔබ පදිංචි ස්ථානයේදී ද?
- ඔබව සෝදිසි කළේ වැඩ කරන ස්ථානයේදී ද?
- ඔබ වෙනත් පුද්ගලයන් හෝ ස්ථාන පරීක්ෂා කළ ස්ථාන දන්නේ ද? එම පුද්ගලයන්ගේ නම්, ලිපින සහ දුරකථන අංක මොනවා ද? එසේ නම් එම සෝදිසි කළ ස්ථානවල ලක්ෂණ මොනවා ද? එම ස්ථාන කවර ආකාරයේ ඒවා ද? (උදා: පදිංචි ස්ථාන, වැඩබිම්)
- ඔබ පොලීසිය හෝ විමර්ශකයන් යම් සාක්ෂියක් තම භාරයට ගනු දුටුවා ද?
- කුමනාකාරයේ භාණ්ඩ භාරයට ගත්තා ද?
- සෝදිසි වරෙන්තුවක් තිබුණා ද? ඔබ එය දැක්කා ද? ඔබට එහි සඳහන් දේ තේරුම් ගැනීමට හැකි වුනා ද?
- සෝදිසි සිදුකරන අවස්ථාවේ සාක්ෂිකරුවන් ඉදිරිපත්ව සිටියා ද? එසේ නම් ඔවුන්ගේ, නම්, ලිපින සහ දුරකථන අංක මොනවා ද?
- සෝදිසිය වාර්තා කළාද? විමර්ශකයන් එය අත්සන් කළා ද? ඔබ එයට අත්සන් කළා ද? එයට වෙනත් අය අත්සන් කළා ද? යමෙක් එයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළා ද? එසේ නම් ඒ ඇයි?
- සිද්ධිය වූ ස්ථානයේදී හමු වූ ද්‍රව්‍යය සහ ලේඛන පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් සහ දෙවන පිටපතක් විමර්ශකයන් විසින් සකස් කරනු ලැබුවා ද? ඔවුන් එම ලැයිස්තුවේ පිටපතක් එම භාරයට ගත් ද්‍රව්‍යය අයිති පුද්ගලයාට ලබා දුන්නා ද?

ප්‍රශ්න කිරීම.

- ඔබව අත්අඩංගුවට ගත් වේලාවේ ඔබට කුමක් කීවේ ද?
- අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔබට කීවේ කුමක් ද?
- ඔබව අත්අඩංගුවට ගෙන පැය 24 ක් ඇතුළත ප්‍රශ්න කිරීම කළා ද?
- ඔබව ප්‍රශ්න කළේ කවුරුන් ද? පුද්ගලයන් කී දෙනෙක් ඔබව ප්‍රශ්න කළා ද?
- ඔබ සමග සාකච්ඡාව ආරම්භ කළේ කවුද?

- ඔබ ඔවුන්ට දැක්වූ ප්‍රතිචාරය කෙසේ ද?
- එම වේලාවේ ඔබේ මනසේ තත්ත්වය කුමක්ද?
- ඔබෙන් ලබාගත් ප්‍රකාශය වාර්තා කළාද?
- ඔබේ ප්‍රකාශය ලියන ලද්දේ ඔබ විසින්ම ද?
- ඔබේ ප්‍රකාශය ප්‍රමාණවත් ලෙස විශ්ලේෂණයට සහ සකස් කිරීමට ඔබට ප්‍රවේශය දුන්නා ද?
- ඔබේ අදහස් ලිවීමට අවකාශය ලබාදුන්නා ද?
- ඔබ සමග සිටි සම විත්තිකරුවන් ප්‍රශ්න කිරීමට ලක් කළාද? එසේ කළා නම් ඔවුන් ඔබ ගැන කිවූ දේ දැන සිටියාද?

<u>නීති ආධාර සහ පවුල සඳහා කරනු ලබන ඉල්ලීම්.</u>

- විත්තියේ නීතිඥයකු ගැන ඔබ ඇසුවාද?
- යමෙකු ඔබට විත්තියේ නීතිඥයකු තබා ගැනීමට හැකි බවට දැන්වූයේ කොයි වේලාවේද?
- අත්අඩංගුවට ගැනීමෙන් පසුව පවුලේ ඥාතියකු, මිත්‍රයෙකු හෝ වැඩ කරන ස්ථානයේ සමකාලීනයකු බැලීමට ඔබ ඉල්ලීමක් කළාද?
- අත්අඩංගුවට ගැනීමෙන් පසුව පවුලේ සාමාජිකයන්, යහළුවන් සහ වැඩ කරන ස්ථානයේ සමකාලීනයන් ඔබ දුටුවාද?
- ඔබව අත්අඩංගුවට ගැනීමෙන් සහ රඳවා තබා ගැනීමෙන් පැය 24 ක් ඇතුළත පවුලේ ඥාතීන්ට එම වාතාවරණය සහ ස්ථානය දැන්වූවා ද?

<u>රඳවා තබා ගැනීම.</u>

- අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔබව රඳවා තැබූ ස්ථානය විස්තර කරන්න.
- ඔබව අත්අඩංගුවට ගත් අවස්ථාවේ ආරක්ෂක නිලධාරීන් කී දෙනෙක් සිටියා ද?
- ඔබව ප්‍රශ්න කිරීමට පෙර ඔබට විරුද්ධව අනිවාර්ය මිණුම් දඬු ක්‍රියාත්මක කළාද?
- අත්අඩංගුවට ගත් අවස්ථාවේදී සහ පසුව ඔබව ශාරීරිකව අපයෝජනයට පාත්‍ර කළා ද?
- අත්අඩංගුවට ගත් අවස්ථාවේදී සහ පසුව ඔබට ප්‍රචණ්ඩකාරී අයුරින් සැලකුවා ද?
- අත්අඩංගුවට ගත් අවස්ථාවේදී සහ පසුව ඔබව වාචික අපයෝජනයට හෝ තර්ජනය කිරීමට පාත්‍ර කළා ද?

<u>වරදට පාත්‍ර වූ වින්දිතයා පිළිබඳ තොරතුරු.</u>

- වරදට පාත්‍ර වූ වින්දිතයාව ඔබ හඳුනනවා ද?
- එසේ නම් එම වරදට පාත්‍ර වූ වින්දිතයා සමග ඔබට ඇති සම්බන්ධය විස්තර කරන්න.
- වරදට පාත්‍ර වූ, වින්දිතයාගේ නම, වයස, ලිපිනය, දුරකථන අංකය සහ රැකියාව ඔබ දන්නවා ද? ඒ බවට අපරාධ වාර්තාවක් තියෙනවා ද?
- වරදට පාත්‍ර වූ වින්දිතයා ශාරීරික හෝ මානසිකව තුවාල ලැබුවාද?

එසේ නම් එම තුවාල කවරාකාරද? සහ ඒවායේ බරපතලකම කවරේද යන්න පිළිබඳව වරදට පාත්‍ර වූ වින්දිතයා යථා තත්ත්වයට පත්වූවාද? එම වින්දිතයාගේ දේපළ වලට හානි සිදු වූවාද එසේ නම් ඒවායේ ස්වභාවය සහ හානියේ තරම කොපමණ ද යන වග.

- වරදට පාත්‍ර වූ වින්දිතයාට යම් වන්දියක් ප්‍රදානය කෙරුනාද? එසේ නම් එය කොපමණද? එම වන්දිය පිරිනැමුවේ කවුද යන වග.
- වරදට පාත්‍ර වූ වින්දිතයා පිළිබඳව ඔබේ හැඟීම් කවරේද?

<u>සම විත්තිකරුවන් පිළිබඳ තොරතුරු.</u>

- ඔබ සම විත්තිකරුවන් ගැන දන්නවාද? එසේ නම් ඔබට ඔවුන් සමග ඇති සම්බන්ධතාවය විස්තර කරන්න.
- සම විත්තිකරුවන්ගේ නම්, වයස් සීමා, ලිපින, දුරකථන අංක, රැකියාව සහ අපරාධ ඉතිහාසය කවරේද?
- චෝදනා එල්ලවී ඇති සම විත්තිකරුවන් අත්අඩංගුවට ගෙන ඇත්ද යන්න පිළිබඳව ඔබ දන්නවා ද? එසේ නම් ඔවුන්ගෙන් භාරයට ගත් අයිතමයන් ගැන ඔබ දන්නවා ද?
- සම විත්තිකරුවන් ඔබ ගැන යම් ප්‍රකාශයක් කර ඇත්නම් ඒ ගැන ඔබ දන්නවා ද? එම සිද්ධීන් පිළිබඳව කර ඇති ප්‍රකාශ ගැන ඔබේ ප්‍රකාශය කවරේද?

<u>අපරාධ චෝදනා</u>

- ඔබ ඔබට විරුද්ධව ඇති අපරාධ චෝදනා තේරුම් ගෙන තිබේද?
- ඔබ එම චෝදනා වල නෛතික තේරුම් අවබෝධ කරගෙන තිබේද?
- අදාල චෝදනා වලට ඇති විත්තිවාචක ඔබ තේරුම් ගෙන තිබේද?
- අපරාධය සිදුවන වේලාවේ ඔබ සමග සිටි අය හෝ සාක්ෂියක් දීමට කෙනෙක් සිටීද? නමුත් ඔවුන් අපරාධය සිදුවූ ස්ථානයෙන් බැහැරව සිටය යුතුය. එසේ නම් ඔවුන්ගේ නම්, ලිපිනය සහ දුරකථන අංකය කවරේද?
- ඔබට විරුද්ධව ඇති චෝදනා වලින් වැරදි දේ කවරේද?
- චෝදනා ඇති හෝ චෝදනා කළ යුතු තවත් අයෙක් සිටීද? එසේ නම් ඔවුන්ගේ නම, ලිපිනය සහ දුරකථන අංක කවරේද? තවද අදාල සිද්ධියේදී ඔවුන් ගේ සහභාගීත්වය ඔබ විස්තර කරන්නේ කෙසේද?

<u>කඩිනම් විමර්ශනය.</u>

- මා කා සමග සම්බන්ධ විය යුතුද? ඔවුන්ගේ නම්, ලිපින සහ දුරකථන අංක මොනවාද?
- මා කතා කළ යුතු යම් සාක්ෂිකරුවකු සිටීද? එසේ නම් ඔවුන්ගේ නම, ලිපිනය සහ දුරකථන අංක මට ලබාදීමට පුළුවන්ද?
  ඔබ සිතන ආකාරයට ඔවුන් ලබාදෙන තොරතුරු කෙබඳුද? ඔවුන් විශ්වසනීයයි කියා ඔබ හිතනවාද ?
- ආරක්ෂා කළ යුතු යම් සාක්ෂියක් තිබේද? එසේ නම් ඔබට එය කවරේද යන්න සහ සොයා ගත හැකි ස්ථානය කුමක්ද යන්න මට කිව හැකිද? එය දැනටමත් භාරයට ගෙන ඇති බව ඔබ දන්නවාද?

<u>සම්මුඛ සාකච්ඡාව අතරතුර අනවශ්‍ය ප්‍රශ්න හෝ අනතුරු වලකා ගැනීමෙහිලා විත්තියේ නීතිඥවරයා පහත ක්‍රියාවන් සහ හැසිරීම් විලාශයන්ගෙන් මගහැරිය යුතුය.</u>

- නඩුවේ තොරතුරු සේවාදයකයාට දැන ගැනීමට සැලැස්වීම. මෙයට ලිඛිත චෝදනා සහ හෙළිදරව් වූ කරුණු අදාල වේ.
- නඩුවේදී සේවාදයකයාට ඔහුගේ භූමිකාව තුළ බොරු කීමට යොමු කිරීම.
- සේවාදයකයාට තමාගේ ජංගම දුරකථනය දීම.
- සේවාදයකයාට පුද්ගලිකව ද්‍රව්‍යමය අයිතම ලබාදීම.
- සේවාදයකයා මුණ ගැසීමේදී නීතිඥවරයකු නොවන අයකු හෝ සේවාදයකයාගේ පවුලේ සාමාජිකයන් සහභාගී කර ගැනීම.

**සැමවිටම මතක තබාගත යුතුය :** සේවාදයකයා සමග සම්මුඛ සාකච්ඡාව පවත්වන විට ඔහු අත්අඩංගුවේ සිටියත් නැතත් නීතිඥවරයා විසින් සේවාදයකයාට බොරු විත්ති වාචකයක් ලබා නොදීමට වගබලා ගත යුතුය. නීතිඥවරයා සේවාදයකයාගේ කතාව කුමක්දැයි සොයාගත යුතුය. එනම් කියන දේ නඩුවේ කරුණු ලෙස සේවාදයකයා චෝදනා කරන දේ ඊට ඇතුළත්ය. නීතිඥවරයා ලෙස සේවාදයකයාට අවශ්‍ය විත්තිවාචක යෝජනා කළ යුතු අතරම ඒවා අදාල

කරුණු සනාථ කරන ඒවා විය යුතුව ඇත. සේවාදයකයා හෙළිදරව් කරන තොරතුරු වලට ඔබ්බට ගොස් සේවාදයකයා සඳහා විත්තිවාචක නිර්මාණය කිරීම හෝ යෝජනා කිරීම නීතිඥවරයකු සිදු කරන්නේ නම් එය සම්පූර්ණයෙන්ම ආචාර ධර්ම වලට පටහැනිය.

**(3.5) විශේෂ ජන කොට්ඨාශයන්.**

"විශේෂ ජන කොට්ඨාශ" යන පාඨය යම් නිශ්චිත අක්‍රමිකතාවක් හෝ පහසුවෙන් පීඩාවට පත්වන ජන කොට්ඨාශයක් හැඳින්වීමට යොදා ගැනේ. අපරාධ යුක්ති ක්‍රියාදාමයේ නීති ආධාර සඳහා ප්‍රවේශ වීමේ එක්සත් ජාතීන්ගේ මූලධර්ම සහ මිනුම් දඬු හි 10 වන මූලධර්මය පහත ආකාරයට සඳහන් කොට ඇත.

කාන්තාවන්ට ළමයින්ට සහ විශේෂ අවශ්‍යතා ඇති කණ්ඩායම්වලට වැඩිහිටියන්, සුළුතරයන්, ආබාධ, මානසික රෝග තියෙන පුද්ගලයන්, එච්.අයි.වී. සමග ජීවත් වන සහ අනෙකුත් බරපතල බෝවන රෝග ඇති, මත්ද්‍රව්‍යය භාවිතා කරන, දේශීය ආදිවාසීන්, රාජ්‍යයක් නැති, දේශපාලන රැකවරණ සොයන්නන්, විදේශික පුරවැසියන්, සංක්‍රමණිකයන් සහ සංක්‍රමණික සේවකයන්, සරණාගතයන්, රට අභ්‍යන්තරයේ අවතැන් අය යන පුද්ගලයන් ඇතුළුව නමුත් සීමා නොවී නීති ආධාර ලබා ගැනීමට අර්ථාන්විත ප්‍රවේශයකට විශේෂ මිණුම් දඬු සහතික කළ යුතුව ඇත. මෙවැනි මිණුම් දඬු ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී සහ සුදුසු වයස් මට්ටම් ඇතුළුව එවැනි කණ්ඩායම් වල විශේෂ අවශ්‍යතා සලකා බැලීමට යොදගත යුතුව තිබේ.

මෙම අත්පොත සඳහා ශ්‍රී ලංකාවේ විශේෂ ජන කොට්ඨාශ වලින් කණ්ඩායම් 04 ක් පරීක්ෂා කිරීමට අපේක්ෂිතය.

ඒ බාල අපරාධකරුවන්, කාන්තාවන්, සමලිංගික (කාන්තා) සමලිංගික (පිරිමි) ද්වී ලිංගිකයන්, හුවමාරු ස්ත්‍රී පුරුෂභාවය සහ අන්තර් ලිංගිකත්වය සහ මානසික රෝගී වූ පුද්ගලයන් වේ.

(3.5.1) <u>බාල අපරාධකරුවන්.</u>

ශ්‍රී ලංකාව තුළ බාල අපරාධකරුවන් ට යුක්තිය ලබාදීම පිළිබඳ කරුණු ප්‍රාථමිකව සලකා බලන්නේ 1939 ළමුන් සහ තරුණ පුද්ගලයන් පිළිබඳ ආඥා පනතට අනුකූලවය. එහි ළමයා අර්ථනිරූපනය කර ඇත්තේ වයස අවුරුදු 14 ට අඩු තැනැත්තන් ලෙස හා තරුණ පුද්ගලයා යනු වයස අවුරුද 14 ත් 16 ත් අතර පුද්ගලයන් ලෙසටය.

දැන් නීතිය, වයස අවුරුදු 18 ට අඩු අයකු ළමයකු බවය.

දණ්ඩ නීති සංග්‍රහයේ 75 වන වගන්තියට අනුව වයස අවුරුදු අටකට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ යනුවෙන්ද එහි 76 වගන්තිය අනුව යම් අවස්ථාවකදී තමාගේ හැසිරීම් ස්වභාවය සහ එහි ප්‍රතිඵලය නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස සුදුසු බුද්ධිය නොලත් වයස අවුරුදු 8 කට වැඩි අවුරුදු 12 ට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ යනුවෙන් සඳහන් වේ.

<u>(3.5.1.1) අධිකරණ බලය.</u>

ළමුන් සහ තරුණ තැනැත්තන් පිලිබඳ ආඥා පනත බාල අපරාධ නැතිනම් ළමා අධිකරණ පිහිටනු ලැබීය. එහි දෙවන ඡේදයට අනුව ළමයකුට හෝ තරුණ තැනැත්තකුට එරෙහිව ඕනෑම චෝදනාවක් සම්බන්ධව හා ලඝු නඩු ඇසීමට අධිකරණ බලය ඉහත සඳහන් අධිකරණ වලට හිමිව ඇත. එහි 3 (1) සහ 3 (2) ඡේදවලට අනුව මහේස්ත්‍රාත්වරු එවැනි නඩු ඇසීමට ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත් අධිකරණවලට සහ නගර සභා අධිකරණවලට පත්කිරීමට හැකිය. මෙම අධිකරණවලට පහත සඳහන් ඡේද ඇතුළුව සියලුම ළමුන් සම්බන්ධ නඩු ඇසීමට පුළුල් අධිකරණ බලයක් ඇත. ඒ රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍යය වූ අවස්ථාවක සහ ළමුන් සම්බන්ධ ඕනෑම චෝදනාවක් එනම්, මිනී මැරීම, සාවද්‍ය නොවන මනුෂ්‍ය ඝාතන, මිනී මැරීමට තැත් කිරීම සහ මංකොල්ල කෑම ආදී උපලේඛන ගත වරදවල් හැරය.

එහි 4(2) ඡේදය මෙසේ සඳහන් කරනු ලැබේ. එනම් නගර සභා අධිකරණයක්, බාල අපරාධ අධිකරණයක් ලෙස කටයුතු කරන විට නගර සභා ආඥා පනත යටතට වැටෙන වැරදි සිදුකිරීම ගැන අධිකරණ බලය ද එය සතුය. තවද මෙහි 4 (1) ඡේදයට අනුව මහේස්ත්‍රාත් අධිකරණයක් බාල අපරාධ අධිකරණයක් ලෙස කටයුතු කරන විට උපලේඛනගත වැරදි හැර ළමයකු හෝ තරුණ තැනැත්තකු චෝදනා ලබන ඕනෑම නඩුවක් අසා තීන්දු දීමට අධිකරණ බලය තිබේ.

ළමා පනතේ 9 (1) ඡේදයට අනුව ළමයකු හෝ තරුණ තැනැත්තකු බාල අපරාධ අධිකරණයක් ඉදිරියට පැමිණවූ විට එම අධිකරණයට අධිකරණ බලය ඇති ඕනෑම වරදක් පිළිබඳව නඩු ඇසීමට සහ තීන්දු දීමට හැකියාව ඇති අතර එම අධිකරණය විසින් ඔහුට තේරෙන සරල භාෂාවකින් චෝදනා කරන වරද පිළිබඳව පැහැදිළි කර දීම හැකි ඉක්මණින් සිදුකළ යුතුව ඇත.

ළමා හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනතේ 4 (1) ඡේදයට අනුව බාල අපරාධ අධිකරණ වලට ඕනෑම වරදක් නමුත් අධිචෝදනීය වැරදි හැර අධිකරණ බලය හිමි වේ. එම අධිකරණය අධිචෝදනීය වැරදි සම්බන්ධයෙන් නඩුව ඉක්මණින් කළ යුතුව ඇතැයි අදහස් කරන විට එනම් ලඝු නඩුව පැවැත්වීම සම්බන්ධයෙන් එම තැනැත්තාට පහත හෝ සමාන ප්‍රශ්නයක් යොමු කළ යුතුය. "ඔබ මෙම අධිකරණයෙන් නැත්නම් ඉහළ අධිකරණයෙන් නඩුව විභාග කිරීමට කැමැතිද?"

මෙහිදී අධිකරණය විසින් සිදුකළ යුතු වැදගත් දෙයක් ඇත. ඒ ඉහත ප්‍රශ්නය සම්බන්ධයෙනි. එනම් චූදිත ළමයාට ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන් ගේ භාරකරුවන් හෝ මිතුරෙකුගේ උපදෙස් ලබාගෙන උත්තරය දීමට හැකි බව පැහැදිළි කිරීම වේ. මෙම පනතේ 9 (4) (i) ඡේදය බලමු. එනම් එම චූදිතයාට ස්ථාන භාර නිලධාරියා පහත තීරණ පැහැදිලි කර දීම වගකීමක් වේ. එනම් අදාල කරුණු ගැන එසේ නඩු විභාග කිරීමේ බලපෑම සහ එසේ වන්නේ බාල අපරාධ අධිකරණයේදී සහ ස්ථාන භාර නිලධාරියා අදාල කරන පහළ අධිකරණයක් මගින් විභාග කරන විට කාර්යපටිපාටිය කුමන ආකාරයට සිදුවන්නේ ද යන්න ඔහු හෝ ඇය එවැනි ඉහළ අධිකරණයකට නඩුව යොමු කර ඉදිරියට පවත්වාගෙන යාමේදී ය.

තරුණ තැනැත්තා හෝ ළමයා නඩුව ඉහළ අධිකරණයක් විසින් විභාග වීමට කැමති වන විට සුසුදු අධිකරණ බලයක් මහේස්ත්‍රාත් අධිකරණයකින් තෝරා ගැනේ.

(3.5.1.2) <u>බාල අපරාධ සේවාදයකයකු සමග සිදුකෙරෙන සම්මුඛ සාකච්ඡාව.</u>

මෙම සේවාදයක බාල අපරාධකරුවන් විශේෂයෙන්ම අවදානම් සහගතය. ඔවුන් නිසැකයෙන්ම විත්තියේ නීතිඥවරයාට අභියෝගයක් වේ. ඒ අතර වඩාත් වැදගත් කරුණ වන්නේ දෙමාපියන් සහ බාල අපරාධ විත්තිකරු අතර අභිලාෂයන් අතර ගැටුමකි.

මෙම තත්ත්වය එනම් ඝට්ඨනය මග හැරීමට අවශ්‍යය වේ. එනම් නීතිඥවරයා පළමු සම්මුඛ සාකච්ඡාවේදී තමන් විසින් සහතික කළ යුත්තක් තිබේ. ඔහු හෝ ඇය නියෝජනය කරන්නේ ළමයාව සහ ඔහුගේ/ඇයගේ අභිලාෂයන් බවයි. දෙමාපියන් සහ ළමයා අතර එකඟතාවයක් ඇති නොවන අවස්ථාවේ නීතිඥවරයා කටයුතු කළ යුත්තේ ළමයා වෙනුවෙනි. දෙමාපියන් වෙනුවෙන් නොවේ. විත්තියේ නීතිඥවරයා පහත කරුණු අනිවාර්යයෙන්ම සලකා බැලිය යුතුය. එනම් පළමු සම්මුඛ සාකච්ඡාවේදී දෙමාපියන් අදාල කාමරයේ සිටිය යුතුද නැද්ද යන්න පිළිබඳව වේ.

නීතිඥ සේවාදයක වරප්‍රසාදය ආරක්ෂා කිරීම සඳහා විත්තියේ නීතිඥවරයා බාල අපරාධ විත්තිකරු එම ප්‍රථම සම්මුඛ සාකච්ඡාව විත්තිකරුගේ දෙමාපියන්ගේ සහභාගීත්වයෙන් තොරව පැවැත්විය යුතුය. තවත් සලකා බැලිය යුතු කරුණක් ඇත. ඒ බාල අපරාධකරුගේ වයස, මානසික තත්ත්වය, පවතින මනාපය, සම්මුඛ සාකච්ඡාවේදී දෙමාපියන් පෙනී සිටීම තුළ එයට අනුග්‍රහය දැක්වීමක් වන අතර එහිදී වරප්‍රසාද සමථයට පත් කිරීම අතහැරේ. ළමා විත්තිකරුගේ සැබෑ අවශ්‍යතාවයන්ට විත්තියේ නීතිඥවරයා සංවේදී විය යුතුය. ඔහු හෝ ඇය ප්‍රථම සේවාදයක සම්මුඛ සාකච්ඡාවේදී වඩාත් මානසික ආතතියෙන් සහ කනස්සල්ලෙන් පසුවිය හැක. එම තත්ත්වය තම වැඩිහිටි සහයකයාට වඩා වැඩිය. බාල ආපරාධ විත්තිකරුවන්ට ඉදිරියට කටුයතු කරීමට ප්‍රශ්න සහ අදාල ක්‍රියාදාමය පිළිබඳව අතිරේක පැහැදිළි කිරීමක් අවශ්‍ය වේ.

විත්තියේ නීතිඥවරයා ස්ථිර කරගත යුතු දෙයක් ඇත. ඒ බාල අපරාධ විත්තිකරු ප්‍රාථමික සේවාදයක සම්මුඛ සාකච්ඡාවේදී සාකච්ඡා කළ සියල්ල අවබෝධ කරගත යුතු අතරම සම්මුඛ සාකච්ඡාවේදී පැමිණි නිගමනය වන්නේ බාල අපරාධකරුවන්ට ප්‍රශ්න ඇසීමේ අවස්ථාව ලබා දීම වේ.

(3.5.1.3) බාල අපරාධකරුවන් රඳවා තබා ගැනීම.

ළමුන් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනතට අනුව ළමා සහ තරුණ වරදකරුවන් පොලිස් ස්ථාන සහ අධිකරණවල රඳවා තැබිය යුත්තේ වැඩිහිටියන්ගෙන් වෙන් කොට වේ. එහි 13 වන ඡේදයට අනුව බාල අපරාධ ගැහැණු දරුවන් රඳවා ගැනීමේදී ඔවුන්ව රැගෙන යන හෝ රඳවා තබා ගැනීමේදී කාන්තාවකගේ රැකවරණය යටතේ සිටිය යුතුව තිබේ. මෙම ආඥා පනතේ 14 (1) 14 (2) සහ 14 (3) ඡේදවලට අනුව ඇප දීමට සහ/හෝ ළමුන් සහ තරුණ පුද්ගලයන් රඳවා ගැනීමට සහ අත්අඩංගුවට ගැනීමට පාත්‍ර වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ 122 අ ඡේදය යටතේ පහත ප්‍රතිපාදනය ලබාදී ඇත. ඒ ළමයෙකු හෝ අවුරුදු 12 ට වැඩි සහ අවුරුදු 14 ට අඩු අයෙක් සිදුකළ වරදක් පිළිබඳ චෝදනාවකදී වෛද්‍ය පරීක්ෂණයට බඳුන් කිරීම වේ.

පොලීසියේ ස්ථාන භාර නිලධාරියා ළමයෙකුගේ අවුරුදු 12 ට වැඩි සහ අවුරුදු 14 ට අඩු අයකු වරදක් කළ අයෙකු බව චෝදනා ලැබ ඇති විට එය විමර්ශනයේදී එම ළමයාගේ දෙමාපියන් හෝ භාරකරුවන් ගේ කැමැත්ත ඇතිව බහුවිධ විනය කණ්ඩායමක් මගින් පරීක්ෂා කිරීමට යොමු කළ හැකි අතර එහි උප ඡේදයේ සඳහන් වන්නේ ළමයා වයෝපූර්ණයට පත්ව ඇද්ද පිළිබඳව වාර්තාවක් ගැනීමට එනම් මෙම නඩුව විනිශ්චයට මහේස්ත්‍රාත්වරයාට බලය ඇත්දැයි තීරණය කිරීමට මෙන්ම

(අ) එම ළමයාගේ වගකීමේ තත්ත්වය චෝදනා ලැබ ඇති වරද පිළිබඳ ස්වභාවය සහ ප්‍රතිඵල සලකා බැලීම.

(ආ) ළමයාට ප්‍රතිකාර/චිකිත්සක මැදිහත්කමක් සඳහා ඇති අවශ්‍යතාවය.

(2) එම යොමුව සිදුකරන බහුවිධ විනය කණ්ඩායමට 1 වන උප ඡේදයට අනුව පහත අයගෙන් සමන්විත විය යුතුය.

(අ) අදාල දිස්ත්‍රික්කයේ අධිකරණ වෛද්‍ය නිලධාරී

(ආ) බාල චිකිත්සාව හෝ වැඩිහිටි මනෝ වෛද්‍යවරයකු සහ

(ඇ) මනෝ විශේෂඥවරයකු

(3) එවැනි ළමයාගේ දෙමාපියන් හෝ භාරකරු එසේ ළමයා පරීක්ෂා කිරීම අකමැති වන අවස්ථාවක පොලිස් ස්ථානය භාර නිලධාරියා එම නඩුව සඳහා අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් මගින් පළමුව එම ළමයා පරීක්ෂා කරන බහු විනිශ්චය මණ්ඩලයට අවසර දීම සඳහා ආඥාවක් ලබාගත යුතුව ඇත.

(4) ඕනෑම අවස්ථාවක අදාල දිස්ත්‍රික්කයේ අධිකරණ වෛද්‍ය නිලධාරී නොමැති විට අදාල වරද විමර්ශනය කරන පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයා ඕනෑම දිස්ත්‍රික්කයක අධිකරණ වෛද්‍යය නිලධාරියකුගේ සහය මගින්, 1 වන උප ඡේදයේ සඳහන් වාර්තාවක් ලබාගත යුතුව ඇත.

(5) එවැනි බහුවිධ විනය කණ්ඩායමක් තම වාර්තාව පොලිස් ස්ථානය භාර නිලධාරියා වෙතත්, ඔහු එය මහේස්ත්‍රාත්වරයා වෙතත් භාර දිය යුතුව ඇත. මෙසේ කරන්නේ ඔහුට තමන්ගේ මතය ඉදිරිපත් කිරීමට පහසු වීමටය. ඒ පළමුවන උප ඡේදයේ සඳහන්ව තිබේ. තවද ඔහුගේ තීරණය ලබාදීමට දණ්ඩ නීති සංග්‍රහයේ 76 වන පරිච්ඡේදය අනුව ඇති ප්‍රතිපාදන සලකා බැලිය යුතුය.

(6) පළමු උප ඡේදයේ විධි විධාන අනුව ළමයාව පුනරුත්ථාපනයට යොමු විය යුතු අතරම එය අධිකරණමය සහ උපදෙස් දීමට ළමුන් පිළිබඳ මනෝ වෛද්‍යවරයකු සහ මානසික රෝග පිළිබඳ විශේෂඥයකු යටතේ සිදුවිය යුතුය.

(3.5.1.4) බාල අපරාධකරුවන් පිළිබඳ අපරාධ ක්‍රියාදාමය.

බාල අපරාධ අධිකරණයක් විසින් විභාග වන සෑම නඩුවකදීම එම අධිකරණය ළමා පනතේ 9(5) උප ඡේදය අනුව පහත ක්‍රියාදාමය අනුගමනය කළ යුතුව ඇත.

(අ) අධිකරණයට ළමයාගෙන් හෝ තරුණ තැනැත්තාගෙන් තමන් වරදක් කළ බව පිළිගන්නේ දැයි ඇසිය හැක.

(ආ) එම ළමයා හෝ තරුණ තැනැත්තා වරද සිදුකළ බව පිළිගන්නා විට එම චෝදනාවට සහය පළ කරන සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට ඇහුම්කන් දිය යුතුව ඇත.

(ඇ) එවැනි සෑම සාක්ෂිකරුවෙක්ම මූලික සාක්ෂි විභාගය අවසානයේදී අධිකරණය ළමයා හෝ තරුණ තැනැත්තාගේ හෝ එය සුදුසු යයි සිතන විට, ළමයාගේ හෝ තරුණ තැනැත්තාගේ දෙමාපියන් හෝ භාරකරුවන් නඩු පවරන්නාගේ සාක්ෂිකරුවන්ට ප්‍රශ්නයක් යොමු කළ යුතු දැයි විමසා සිටිය හැක.

(ඈ) ළමයාට හෝ තරුණ තැනැත්තාට දෙමාපියන් හෝ භාරකරුට එය කැමති වන විට ඕනෑම ප්‍රශ්නයක් යොමු කළ හැක.

(ඉ) ඔහු කැමති වන විට ළමයාට හෝ තරුණ තැනැත්තාට ප්‍රශ්න ඇසීම වෙනුවට ප්‍රකාශයක් ද කළ හැක.

(ඊ) අධිකරණයට පහත වගකීම ඇත. ඒ චෝදනාවට පක්ෂව සාක්ෂි දෙන සෑම සාක්ෂිකරුවෙකුටම අවශ්‍යය විට අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට කටයුතු කිරීම වේ.

(උ) අධිකරණය විසින් ළමයා හෝ තරුණ තැනැත්තා සිදුකරන ඕනෑම ප්‍රකාශකයදී විස්තර කරන ඕනෑම කරුණක් පැහැදිළි කර ගැනීමට එවැනි ප්‍රශ්න ළමයාට හෝ තරුණ තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය.

(ඌ) නඩුව ඉදිරියට පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් සාක්ෂි ඇතැයි අධිකරණයට පෙනෙන විට විත්තියට ඇති ඕනෑම සාක්ෂිකරුවකුගේ සාක්ෂි අවධානයට ගැනීමට සහ ළමයා හෝ තරුණ තැනැත්තාට සාක්ෂි ලබාදීමට හෝ ඕනෑම ප්‍රකාශයක් කිරීමට කටයුතු සැලැස්විය යුතුය.

(එ) ළමයා හෝ තරුණ තැනැත්තා තමන් වරද සිදුකළ බව පිළිගන්නා විට හෝ අධිකරණය ඉදිරිපත් කර ඇති සාක්ෂි ගැන සෑහිමකට පත්වන විට ඔහුගෙන් මෙසේ අසනු ලැබේ. ඒ ඔහු වරද පිළිබඳ බරපතලකම ලිහිල් කිරීමට හෝ දඬුවම ලිහිල් කරන හෝ අනෙකක් සම්බන්ධයෙන් කුමක් පැවසීමට කැමතිද යන්නය.

(3.5.1.5) බාල අපරාධකරුවන් ට දඬුවම් පැමිණවීම.

ළමයා හෝ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනතට අනුව ළමයා හෝ තරුණ තැනැත්තා වැරැද්දට වරදකරු බව තීරණය වූ විට ඔහු හෝ ඇයට පහත ආකාරයට දඬුවම් පැමිණවිය යුතුය.

- මසකට නොවැඩි කාලයක් රැඳවුම් නිවාසයක භාරකාරත්වයට පත් කළ යුතුව ඇත. (25 (1) ඡේදය)
- වයස අවුරුදු 12 ක ලමයකු තරුණ තැනැත්තකු පිළිගත් හෝ සහතික කළ පාසලකට යැවිය යුතුව ඇත. (26 (1) ඡේදය)
- වසරක කාලයක් යහපත් හැසිරීමෙන් සිටින පොරොන්දුව මත දෙමාපියන්ට හෝ භාරකරුවන්ට භාරකාරත්වය ලබාදිය යුතුය. (27 (1) ඡේදය)

- කොන්දේසි මත ඔහුව නිදහස් කිරීම. (27 (1) ඡේදය)
- ඔහුට දඩයක් නියම කිරීම. ( 28 (1) ඡේදය)
- වෙනත් ශාරීරික දඬුවම් පැමිණවීම. (පිරිමි අයට පමණක් සැහැල්ලු වේවැලකින් පාරවල් 06 ක් ගැසීම.) (29 (1) ඡේදය)
- දැන් ශාරීරික දඬුවම් පැමිණවීම අවලංගු කර ඇත.
- නිසි ලෙස අධිකරණය විසින් සිදුකරන ලිහිල් අවවාද කිරීමකින් පසුව ඔහුව නිදහස් කිරීම.

වරදකරුවන් වූ ළමා සිරකරුවන් සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ පිහිටි පහත ආයතනවලට යොමු කරනු ලැබේ.

- තරුණ වරදකරුවන් අම්බේපුස්ස පුහුණු පාසලට.
- තරුණ වැරදිකරුවන් පල්ලන්සේන විශෝධන මධ්‍යස්ථානයට ද සහ/හෝ
- තරුණ තැනැත්තන් තල්දෙන විශෝධන මධ්‍යස්ථානයට ද

(3.5.2) කාන්තාවන්

ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් අපරාධ ක්ෂේත්‍රයේ සුළු ප්‍රතිශතයකි. 2017 ආරම්භයේදී ශ්‍රී ලංකාවේ කාන්තා රැඳවියන්ගේ ප්‍රතිශතය එහි මුළු සිරකරුවන් ගණනෙන් 4.9% තරම් අඩු ප්‍රමාණයකි.(මේ අදාල කාලය තුළ මුළු සිරකරු සංඛ්‍යාව එනම් 21,000 ට අනුවය)[14]

ශ්‍රී ලංකාවේ කාන්තාවන් නිරතුරුවම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ ස්ත්‍රී දූෂණයේ වින්දිතයන් බවට පත්වේ.[15] වාර්තා වන අන්දමට ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අසංවේදිත්වය අපරාධ යුක්ති ක්‍රියාදාමයේ සියළුම අංශයන් වලින් විද්‍යමාන වේ. එනම් එයට පහත ආයතන ඇතුළත් වේ.

(i) නීතිය ක්‍රියාත්මක කිරීම.
(ii) නඩු පැවරීම.
(iii) අධිකරණ විනිශ්චය
(iv) විශෝධනය
(v) පුනරුත්ථාපනය

මෙහිදී පහත කරුණු අනිවාර්යයෙන් සලකා බැලිය යුතුය. කාන්තාවක් අධිකරණ ක්‍රියාදාමය තුළ සෝදිසි කිරීමට අවශ්‍යය වූ විට එය තවත් කාන්තාවක් විසින් සිදුකළ යුතු අතරම එය චූදිතගේ විනීතභාවය සම්බන්ධයෙන් ඉතා තදින් ක්‍රියාත්මක විය යුතුව තිබේ. (අපරාධ නඩු විධාන සංග්‍රහය 30 ඡේදය)

ඒ පිළිබඳව වැඩිදුරටත් මෙසේ සඳහන් වේ. අපරාධ යුක්ති ක්‍රියාදාමය තුළ පොලිස් කොස්තාපල්වරු, නීතිඥවරු, විනිසුරුවරු, බන්ධනාගාර නිලධාරීන්, අධිකරණ වෛද්‍ය නිලධාරීන් සහ අනෙක් අය ඇතුළත්ව ඇති වෙනස් ක්‍රියාදාමයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී බව අඩුයි යන්නය. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ කාන්තා සිරකාරිය සහ රැඳවියන්

---

[14] World Prison Brief data: Sri Lanka “December 2017 .

http://www.prisonstudies.org/country/SriLanka.

[15] Some aspects of criminal law discriminatory of women Daily News , 14 December 2015,

http://www.dailynews.lk/2015/12/14/teatures /some aspects-criminal -law-discriminatory-women

පිළිබඳ ගැටළුකාරී කරුණු වාර්තා වන අතර ඒ බව පහත සඳහන් වේ. (ඔවුන් නඩු විභාග අපේක්ෂාවෙන් සිටින අය හෝ වරදකරුවන් වේ.)

- ඵලදායී ලෙස කටයුතු කරන පොලීසියක් නොමැතිකම කාන්තා හා ළමා කාර්යාංශය දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම පාහේ ළමා හා කාන්තා අංශ ප්‍රමාණය වැඩි කිරීමට පියවර ගෙන ඇතත් ඔවුන් ඵලදායී සේවාවක් සැපයීමට අපොහොසත්ව ඇත.
- බන්ධනාගාර තදබදය සහ අයහපත් තත්ත්වය.
- සංක්‍රාන්ති ස්ත්‍රී පුරුෂ සමාජභාවය කාන්තාවන් ඇතුලුව අපරාධ වලට පාත්‍ර වූ කාන්තා වින්දිතයන්ට සුදුසු සහ ප්‍රමාණවත් රැකවරණයක් නොමැතිකම.
- අපරාධවලට ගොදුරු වූ වින්දිතයන්ට සහය පල කිරීම සහ ආරක්ෂාව ලබා දීමේදී (2015 අංක 4 දරන අපරාධ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහය පළ කිරීමේ පනතට අනුව) ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ අංශයන් පිළිගැනීම අසමත්ව ඇතිවා මෙන්ම අපරාධවලට ගොදුරු වන කාන්තා වින්දිතයන්ට අවධානය ක්‍රියාවට නංවා නැත. තවද කාන්තාවන්ට ඔවුන්ගේ අවදානම් සහගතභාවය පිළිබඳ පසුබිම ගැන විශේෂ ආරක්ෂාවක් ලබාදීමට ද අපොහොසත්ව ඇත.[16]

<u>ගබ්සාව, ස්ත්‍රී දූෂණය සහ ගණිකා වෘත්තිය.</u>

ශ්‍රී ලංකාවේ ගබ්සාව තවමත් මතභේදාත්මක නීති කරුණකි. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 303 වන වගන්තියේ මෙසේ සඳහන් වේ. ස්ත්‍රීන්ගේ ජීවිතය බේරීමේ කාර්යය සදහා සද්භාවයෙන් කරනු ලබන ගබ්සා කිරීමක් නොවන ගබ්සා කිරීමක් ගැබ් ගත් ස්ත්‍රියකට කැමැත්තෙන්ම සිදු කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය. තවද එකී ස්ත්‍රිය දරු ප්‍රසූතියට ආසන්නව සිටියදී නම් ඔහුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

එහි 304 වගන්තියට අනුව ස්ත්‍රියක දරු ප්‍රසූතියට ආසන්නව සිටියදී හෝ නොසිටියදී කැමැත්ත නොමැතිව ඉහත වගන්තියේ විස්තර කරනු ලැබූ වරද කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

දණ්ඩ නීති සංග්‍රහයේ 305 වන වගන්තියට අනුව ගැබ් ගත් ස්ත්‍රියකට ගබ්සා කිරීමේ අදහසින් එකී ස්ත්‍රියගේ මරණය සිදුකරන යම් ක්‍රියාවක් කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. පැහැදිළි කිරීම, වරදකරු විසින් එම ක්‍රියාවෙන් මරණය සිදුවීමට ඉඩ ඇති බව දැනගනු ලැබීම මේ වරද සඳහා අත්‍යාවශ්‍ය නොවේ.

දණ්ඩ නීති සංග්‍රයේ 363 වගන්තියට අනුව මින්මතු ව්‍යතිරේඛයෙන් දැක්වෙන අවස්ථාවලදී හැර පහත සඳහන් වන පස් වැදෑරුම් අවස්ථාවලදී යමකට වැටෙන පරිදි මිනිසකු ස්ත්‍රියක සමග ලිංගික සංසර්ගය ඇති වූ විට ඔහු "ස්ත්‍රී දූෂණය" කළ ලෙස සලකනු ලැබේ. පැහැදිළි කිරීම, ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට අවශ්‍ය ලිංගික සංසර්ගය ඇති කිරීමට ප්‍රවේශය ප්‍රමාණවත් වේ. යම් පුරුෂයකුට සිය භාර්යාව දූෂණය කළ බවට චෝදනා නැගෙන විට එම දෙදෙනා අධිකරණ නියොගයකින් වෙන්ව සිටිය යුතුය. විවාහය බිඳ වැටීම නිසා දෙදෙනා වෙන්ව සිටීම යන්න නිසි

[16] Some aspects of criminal law discriminatory of women Daily News , 14 December 2015,

http://www.dailynews.lk/2015/12/14/teatures /some aspects-criminal -law-discriminatory-women

වෙන්වීමක් ලෙස නොසැලකේ. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය එකට ජීවත් වන ශ්‍රී ලංකාවේ පුරුෂයකුට එරෙහි ස්ත්‍රී දූෂණය කිරීමේ චෝදනාව නැගිය නොහැක.

ශ්‍රී ලංකාව තුළ සැලකිය යුතු කාන්තාවන් සංඛ්‍යාවක් ගණිකා වෘත්තියේ නිරත වීම පිළිබඳව චෝදනා ලබති.

විවිධ ලෙස සැලකිලිමත් විය යුතු කරුණු ඉස්මතුව ඇත. ඒ නෛතික පරිභවයක් හා අපැහැදිළි තැන් කාන්තාවට එරෙහි වෙනස්කමකට හේතු වී ඇති බැවිනි. එනම් දඬුවම් පමුණුවන්නේ කාන්තා ගණිකාවන් වෙනුවෙන් පමණි තවත් පිරිමි තැනැත්තන්ට කිසිදු දඬුවමක් නොපැනවීමය. අයාල ආඥා පනතේ 3 (1) (අ) ඡේදයේ මෙසේ සඳහන් වේ.

"සෑම පොදු ගණිකාවක්ම ප්‍රසිද්ධ මාර්ගයක හෝ අධිවේගී මාර්ගයක ඔහුට පොදු ස්ථානයක කලහකාරී ලෙස හෝ අවිනීත ස්වභාවයෙන් හැසිරෙන විට අරමුණක් නොමැතිව රැළී සිටින විට හා අවිනීත පුද්ගලයකු පළමුව සිරභාරයට ගැනීමෙන් හෝ දඩයකට ලක්වන වරදකරුවකු වේ"

අයාල ආඥා පනතේ 3 (2) ඡේදයේ වැඩිදුරටත් මෙසේ සඳහන් වේ.

"පොලිස් නිලධාරියකුට වරෙන්තුවක් නොමැතිව අරමුණක් නොමැතිව ඉබාගාතයේ යන හෝ අවිනීත පුද්ගලයකු අත්අඩංගුවට ගත හැක"

පොදු ගණිකාව යන වචනය ඉහත ඡේදයේ සඳහන් වන නමුත් එය අයාල ආඥා පනතේ අර්ථකතනය කොට නැත.

එයට බොහෝ තේරුම් ගෙන දෙන නෛතික වචනයක් වන අතර පොලීසියට වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමෙහිලා පුළුල් බලතල ලබාදේ.[17] එනම් "ඉබාගාතයේ යන හෝ අවිනීතව හැසිරෙන ඕනෑම පුද්ගලයෙක්" අයාල ආඥා පනතේ 7 වන ඡේදයේ පහත ආකාරයට සඳහන් කරනු ලැබේ.

"යම් පුද්ගලයකු ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක සිට ඕනෑම පුද්ගලයකු ලිංගික සම්බන්ධතා හෝ අවිනීත ක්‍රියාවකට යොමු කිරීමට කටයුතු කරන විට එම පොළඹවන පද්ගලයා සමග හෝ වෙනත් අයකු සමග නිශ්චිත හෝ නැතුව වරදකට වරදකරු වන අතරම සිර දඬුවමකට හෝ දඩයකට පාත්‍ර වේ."

<u>ධර්මදස එරෙහිව තියඩෝමන් (56 එන්.එල්.ආර්. 278)</u> හි පෙළඹවීම කැමැත්තෙන් හෝ බලය යොදා සිදුකිරීම අවශ්‍ය වන්නේ නැත. යමෙක් වක්‍රාකාරයෙන් පෙළඹවීම සිදුකරන විට මෙම වරද කිරීමට එනම් පෙළඹවීමට එය ප්‍රමානවත් වනු ඇත.

ඉහත වාතාවරණය නීතිමය දෘෂ්ඨිකෝනයකින් ගත් කළ අපැහැදිළි වන අතරම පොලීසියට පුළුල්ව අත්අඩංගුවට ගැනීමේ බලතල පවරා දී තිබේ.

<u>(3.5.2.2) බන්ධනාගාරවල සිටින කාන්තාවන්ට බලපාන ජාත්‍යන්තර ප්‍රමිතීන්.</u>

ජාත්‍යන්තර ප්‍රමිතීන් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ බැන්කොක් රෙගුලාසි පහත අවශ්‍යතාවන් සපයා දෙයි. එනම් දෙපාර්ශවයම රක්ෂිත බන්ධනාගාරගත කිරීමේදී සහ පහත දඬුවම් පැමිණවීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී විකල්පයන් ලබා දිය යුතුය. එක්සත් ජාතීන්ගේ බැංකොක් රෙගුලාසි උදාහරණයක් ලෙස ගනිමු. කාන්තාවක් බන්ධනාගාරයට යැවීම සලකා බලමු.

[17] Some aspects of criminal law discriminatory of women . "Daily News , 14 December 2015 , https://www.dailynews.lk/2015/12/14/features /some-aspects-criminal-law-discriminatory -women.

එහිදී ඔවුන්ට සුදුසු සෞඛ්‍යය, මානුෂිකව සැලකීම, සෝදිසි කිරීම් වලදී ගරුත්ත්වය ආරක්ෂා කිරීම, ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාව ආදිය සැපයීම කළ යුතු අතරම ඒවා ඒ ආකාරයෙන්ම බන්ධනාගාරගත වූ රැඳවියන්ගේ ළමයින්ට ද සැපයීම කළ යුතුව ඇත.

(3.5.3) කාන්තා සමලිංගික, පුරුෂ සමලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති ස්ත්‍රී පුරුෂ සමාජබාවය සහ අන්තර් ලිංගිකත්වය (LGBTI)

ශ්‍රී ලංකාවේ සිටින කාන්තා සමලිංගික, පුරුෂ සමලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අන්තර් ලිංගිකත්වය පිළිබඳ පුද්ගලයන් එසේ නොවන පුද්ගලයන්ගේ අත්දකින්නේ නැති නෛතික අභියෝගවලට මුහුණ දෙති.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය පහත මූලික අයිතිවාසිකම පිළිගනී. ඒ ජාතිය, ආගම, භාෂාව, කුලය, ලිංගිකත්වය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි සෑම පසුබිමකම පුද්ගලයකුම වෙනස්කමකට ලක් නොකිරීම වේ. මෙම මිණුම් දණ්ඩ මගින් ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ හඳුනා ගැනීම් මත නින්දවට සහ වෙනස්කමකට පාත්‍ර වීමෙන් ආරක්ෂා කරනු ලැබේ. එහි 12.1 වගන්තිය පහත පරිදිය. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සමාන තත්ත්වය සහතික කරන අතරම ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුකරන හඳුනා ගැනීම මත වෙනස්කමකට පාත්‍ර කරන ඕනෑම නීතියක් ව්‍යවස්ථා විරෝධී බව ප්‍රකාශ කෙරේ. නමුත් ඉහතින් කුමක් සඳහන් වුවද රාජ්‍යය පාර්ශවය හා රාජ්‍යය නොවන පාර්ශවය LGBTI (එල්.ජී.බී.ටී.අයි.) විරුද්ධව සිදකුරන වෙනස්කම් සහ අතවර නොනවත්වාම සිදුවන බව වාර්තා වේ.[18]

දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 A බවද ශ්‍රී ලංකාව තුළ සමලිංගිකත්වය අපරාධ වරදක් කර ඇත්තේ පහත පරිදිය.

එනම් ස්වභාව ධර්මයට විරුද්ධව, කැමැත්තෙන්ම කාමුක සංසර්ගයෙහි යෙදෙන සහ තදබල අපහරණ ක්‍රියා යනුවෙනි. මේ අනුව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පොදුවේ අවබෝධ වන කරුණක් ඇත. ඒ වැඩිහිටියන් ගේ කැමැත්ත අනුව වුවද සමලිංගික සබඳතා අපරාධයක් කර ඇති බවය.

365. යම් පුරුෂයකු, ස්ත්‍රියක හෝ සතෙකු සමග ස්වභාව ධර්මයට විරුද්ධව, කැමැත්තෙන්ම කාමුක සංසර්ගයෙහි යෙදෙන තැනැත්තෙකුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයේ එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

පැහැදිළි කිරීම : මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරදට අවශ්‍ය වූ කාමුක සංසර්ගය ඇති කිරීමට ප්‍රවේශ කිරීම ප්‍රමාණවත් වේ.

365. අ ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ වෙනත් පුරුෂයකු සමග තදබල අශෝභන ක්‍රියාවක් කරන හෝ එබඳු ක්‍රියාවකට පාර්ශවකාරයකු වන හෝ එබඳු ක්‍රියාවක් යම් පුරුෂයකු ලවා කරවන හෝ කරවීමට තැත් කරන පුරුෂයකු වරදට වරදකාරයකු විය යුතුය. ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකෙන්ම දඬුවම් කළ යුතුය.

සංක්‍රාන්ති ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ අන්තර් ලිංගිකත්වය හිමි පුද්ගලයන්ට ශ්‍රී ලංකා නීතිය විශේෂයෙන් සලකා අපරාධ බවට සඳහන් කර නැත. නමුත් ඔවුන්ගේ අයිතිවාසිකම් සහතික කරන කිසිදු නීතියක් ද නොමැත. නමුත් වාර්තා වන ආකාරයට පොලීසිය LGBTI (එල්.ජී.බී.ටී.අයි.) පුද්ගලයන් ඉලක්ක කර අපරාධ වැරදි ගණනාවක් සඳහා රෙගුලාසි යොදා ගනී. මෙහිදී LGBTI

[18] Sri Lanka: Event of 2016, "Human Rights Now, http://www.hrw.org/world-report/2017country - chapters/Sri-Lanka#d91ede.

පුද්ගලයන් අතරින් පිරිමි සමලිංගික සබඳතා පවත්වන සහ සංක්‍රාන්ති ස්ත්‍රී පුරුෂ සමාජභාවයක් ඇති පුද්ගලයන් විශේෂ වේ.

මෙයට අපැහැදිළි ලෙස වචන ඇති අයාල ආඥා පනත අදාල වේ. එමගින් තදබල අශෝභන ක්‍රියා සිදුකිරීම හෝ ආධාර දීම තහනම් කර ඇත. මෙයට ස්වභාව ධර්මයට විරුද්ධව කැමැත්තෙන්ම කාමුක සංසර්ගයේ යෙදීමද අදාල වේ.[19] සමහරක් සංක්‍රාන්ති ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාල ස්ත්‍රීන් පුරුෂයන් ලිංගික ශ්‍රමිකයන් ලෙස සලකන අතර ඔවුන් පෙන්නුම් කරන දෙයක් තිබේ. එනම් පොලීසිය දිගින් දිගටම සිදුකරන හිරිහැරයන් වේ. එයට අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම හා විෂම ලෙස සැලකීම ඇතුළත් වේ. ඒ අනුව ඔවුන්ට ශ්‍රී ලංකා බලධාරීන් කෙරෙහි ඇති විශ්වාසය සෝදාපාලුවට ලක්වෙමින් ඇත. මේ තත්ත්වය නිසා සිදුවන්නේ ඔවුන් විසින් අපරාධ හෙලිදරව් කිරීමට මැලිවීම වේ. මෙම ප්‍රජාව පැමිණිලි කරන තවත් දෙයක් වන්නේ වෛද්‍ය බලධාරීන් විසින් සිදුකරන අතවරයන් හා හිරිහැර කිරීම් ය. ඒ අනුව සංක්‍රාන්ති ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාල පුද්ගලයන් තමාම වෛද්‍ය ප්‍රතිකාර තීරණය කරන අතර වෘත්තීමය සහයෝගය පතන්නේ නැත. මේ තත්ත්වය තුළ ශ්‍රී ලංකා නීතිය තවමත් අපැහැදිළි සේම සැක සහිත වන්නේ එය අපචාරයන්ට විවෘතව ඇති බැවිනි.

<u>ස්ථානාධිපති, පොලිස් ස්ථානය, (මරදාන) එරෙහිව ගලබඩ විමලසිරි සහ තවත් අයෙක්</u> (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCSP L LA No 304/2009) මෙසේ සඳහන් වේ. 1990 අංක 19 දරන පළාත් මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ එහි 9 (අ) ඡේදය යටතේ කළ ඉල්ලීමකි. අභියාචකයන්ට මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා ගොනු විය. ඒ දණ්ඩනීති සංග්‍රහයේ සංශෝධිත 365 (ආ) ඡේදය යටතේ පුගලයන් දෙදෙනෙක් අතර සිදු වූ අශෝභන ක්‍රියාවක් සම්බන්ධයෙනි. දෙදෙනාම වරදකරුවන් විය.

දඬුවම වසරක සිර දඬුවමක් හා රුː 1500/- ක දඩයක් වන අතර, උසාවිය නියෝගය නොසලකා හැරියොත් දඬුවම මාස 06 ක් ලෙසිනි. අභියාචනයේදී ශ්‍රේෂ්ඨාධිකරණය පහත කරුණු සලකා බැලිණි. එනම් අදාල වාතාවරණය අනුව සෘජු සිර දඬුවමට සුදුසු ද යන්නය. එය දඬුවමට එරෙහි අභියාචනය පිළිගත්ත ද ඒ හා සමානව වරදකරු බව තීරණය කිරීම ප්‍රතික්ෂේප කෙරිණි. අධිකරණමය තීරණය වූයේ මෙම නඩුවේදී සිර දඬුවම සුදුසු හා නිසි ආකාර වන බවය. අභියාචකයන්ට බරපතල වැඩ සහිතව වසර 2 ක සිර දඬුවමක් වසර පහකට අත්හිටුවා ලබාදෙන ලදි. ඒ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 (1) ඡේදය අනුවය.

<u>(3.5.4) මානසිකව රෝගී වූ අය.</u>

විත්තියේ නීතිඥවරයා සේවාදයකයා සමග සිදුකරන සම්මුඛ සාකච්ඡා වලදී එහි ප්‍රතිඵලයක් ලෙස සේවාදයකයා නඩුවට මුහුණ දීමට මානසිකව අපොහොසත් බව සලකා බැලීම සිදුවීමක් උද්ගත වූයේ යැයි සිතමු. එවිට නීතිඥවරයා නඩු පවරන්නා සමග අදාල නඩුව සම්බන්ධයෙන් සම්බන්ධීකරණයක් සිදුකර චූදිතගේ මානසික තත්ත්වය පිළිඳව මහේස්ත්‍රාත්වරයාගේ අවධානයට ලක් කළ යුතුය. එහිදී නියෝගයක් ලබාගත හැක. ඒ චූදිතගේ මානසික සෞඛ්‍යය තීරණය කිරීමට මානසික වෛද්‍යවරයෙකුගේ නිර්දේශයක් ලබාගැනීමටය.

විත්තියේ නීතිඥවරයා අනිවාර්යෙන් සලකා බැලිය යුතු තවත් කරුණක් ඇත. එනම් චූදිත චෝදනාවට පදනම් වූ අදාල ක්‍රියාව සිදුකරන වේලාවේ මානසික අවුල්සහගත තත්ත්වකින් පසුවූවා ද යන්නයි. මානසික ව්‍යාකූල භාවය ස්ථිර ව්‍යාකූලතාවයක් නොවේ. මෙහිදී තීරණාත්මක ප්‍රශ්නයක් ඇත. එනම් අපරාධය සිදුකරන අවස්ථාවේදී මෙම මානසික අවුල්සහගත භාවය පැවතියේ ද යන්නය.

[19] Sri Lanka: Event of 2016, “Human Rights Now, http://www.hrw.org/world-report/2017country - chapters/Sri-Lanka#d91ede.

z

අපරාධය පෙනෙන ආකාරයට අරමුණු කළ දෙයක් නොවන බව පෙනී යන විට විත්තියේ නීතිඥවරයා සුපරික්ෂාකාරී විය යුතු දෙයක් ඇත. ඒ සේවාදයකයා අපරාධය සිදුකරන වේලාවේදී ඔහු/ඇය යම් ආකාරයක මානසික අස්ථාවරභාවයකින් පෙළුනාද යන්නය. මිනී මැරුම් නඩුවක් ගනිමු. එය අසාමාන්‍ය පැහැදිළි කළ නොහැකි සහ විකාර රූපී හැසිරීමක් මිනීමැරුම සිදුකිරීමට පෙර, ඒ අතර තුර හෝ පසුව සිදු වී ඇතැයි ද බැලීමය. ඒ චූදිත තම නීතිඥවරයාට උපදෙස් දෙන අන්දම අනුවය. ඇය හෝ ඔහු හැසිරෙන ආකාරය මෙහිදී නොසලකා හැරිය නොහැක. එය චූදිතට විෂම මානසිකත්වයක් තිබූ බව ස්ථාපිත කිරීමෙහිලා අදළ වේ.

අදල ක්‍රියාව සිදුවන වේලාවේදී සේවාදයක තාවකාලික මානසික විෂමතාවයකින් පීඩා විඳි බව සලකා බැලිය යුතුය. නමුත් දැන් ඔහු මානසිකව සාර්ථකත්වයට පත්ව තිබේ නම් චූදිත විත්තියේ නීතිඥවරයාට අවුල් සහගත මානසික තත්ත්වය පිළිබඳව ආයාචනය කිරීමට ඉඩ හැරීමෙහිලා මැලි බවක් දක්වයි. මෙහිදී සේවාදයකයා බියට පත්වන කරුණක් ඇත. එනම් මෙම තත්ත්වයට පත්වුවහොත් ඔහු හෝ ඇය මානසික රැකවරණයට පාත්‍ර වේ. ඒ උන්මත්තක භාවය නිසා අපරාධය සිදුකළ බැවිනි. නීතිඥවරයා පහත කරුණද සේවාදයකයා වෙත පැහැදිළි කර දිය යුතුව ඇත. ඒ විත්තිවාචකය සාර්ථක වුවහොත් අධිකරණය චූදිත තවදුරටත් මානසික අවුල් සහගත තත්ත්වයක නොසිටින බව තීරණය කරන අතර ඔහුව සිරගත කිරීමෙන් නිදහස් කරන්නැයි සරලව සඳහන් කරයි.

දණ්ඩනීති සංග්‍රහයේ 77 වන ඡේදයේ පහත පරිදි සඳහන් වේ. “ක්‍රියාව කරන වේලෙහි එම ක්‍රියාවෙහි ස්වභාවය හෝ තමා වැරදි දෙයක් හෝ නීතියට පටහැනි ක්‍රියාවක් කරන බව සිහිවිකලත්වය නිසා දැන ගැනීමට පුළුවන්කමක් නැති තැනැත්තකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ.” මෙම ඡේදය සම්පූර්ණයෙන්ම විත්තිකරුව අපරාධ වගකීමෙන් නිදහස් කරයි. ඒ වරද සිදුකළ අවස්ථාවේ විත්තිකරු මානසික අවුල් සහගත බවකින් සිටි බැවිනි. මෙම ඡේදය පහත අවශ්‍යයතාවද ලබා දෙයි. උන්මත්තකභාවයේ නෛතික අර්ථකතනය ශ්‍රී ලංකාවේ අධිකරණමය ක්‍රියාදාමය තුළදී පමණක් යොදාගත යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ මොනම ව්‍යවස්ථාවකවත් මානසික රෝග පිළිබඳ නෛතික අර්ථකතනයක් ලබාදී නැත. දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වන්නේ, මානසික රෝග යන්න “අවුල්සහගත මනසක්” ලෙසයි. අවුල්සහගත මනස යන වාක්‍ය කණ්ඩය 1873 මානසික සෞඛ්‍යය ආඥා පනත, 1979 ශ්‍රී ලංකාවේ අපරාධ නඩු විධාන සංග්‍රහය සහ 1895 සාක්ෂි පනතේ එලෙසින්ම භාවිතා කර ඇත. ඒ මානසික රෝග සම්බන්ධයෙනි. අවුල් සහගත මනසක් යන වාක්‍ය කාණ්ඩය පුළුල් අර්ථකථනයක් ගන්නා අතරම මනසේ රෝගයක් නිසා ඇතිවන මානසික රෝග ඌන වර්ධනය එනම් මානසික ඌන වර්ධනය පිළිබඳව යොදා ගැනේ.

අපරාධ වගකීම ආරම්භ වන්නේ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ද නැතිනම්/හෝ ඉහළ අධිකරණයකින් ද යන්න පිළිබඳව ඇගයීමක් කිරීමට ඉල්ලීමක් කළ යුතුව ඇත. නඩුව විභාගයට ගැනීමට පෙර හෝ අතරතුර මෙම ඉල්ලීම කළ යුතුව තිබේ. මානසික අවුල්සහගත භාවය පිළිබඳ කරුණු ඉස්මතු කළ යුත්තේ චෝදනාව මෙහෙයවන නීතිඥවරයා, විත්තිය හෝ විනිසුරු විසිනි.

මානසික අවුල්සහගත භාවය පිළිබඳ යම් පුද්ගලයෙකුගේ අපරාධ වගකීම නිශ්චය කිරීමට විශේෂඥ සහයක් අවශ්‍යය වේ. විත්තිකරුගේ මානසික අවුල්සහගත භාවය නිශ්චය කිරීමෙහිලා අපරාධ විධි විධාන සංග්‍රහ පනත විශේෂඥවරුන් ලෙස හඳුනාගෙන ඇත්තේ වෛද්‍ය නිලධාරීන්ය.

උන්මත්තක භාවය පිළිබඳ විත්තිවාචකය පහත මූලධර්මය මත පදනම් වේ. වරද සිදුකරන වේලාවේදී යම් පුද්ගලයකු මානසික අවුල්සහගත භාවයකින් හෝ උන්මත්තක භාවයකින් සිටින විට සාවද්‍ය චේතනාව එනම් අපරාධය සිදුකිරීමට අවශ්‍යතාවය ඉටු නොකරෙන අතරම දඬුවමකදී විෂය නොවේ.

<u>(3.5.4.1) මානසිකව රෝගී වූ සේවාදයකයෙකු සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීම.</u>

විත්තියේ නීතිඥවරයකු මානසිකව රෝගී වූ සේවාදයකයෙකු ආරක්ෂා කිරීමේදී අතිරේඛ සලකා බැලීම් කළ යුතුව ඇත. මෙම සම්මුඛ පරීක්ෂණවල ප්‍රාථමික විස්තර මානසිකව රෝගී වූ විත්තිකරුවන් සිටින රෝහල්වල හෝ ආයතනික තත්ත්වයන් තුළ පවතී. එවැනි වාතාවරණයන් වල විත්තියේ නීතිඥවරයා වඩාත් ප්‍රවේශම් විය යුතු කරුණක් තිබේ. ඒ ඔහු නීතිඥවරයෙකු බවත් රෝහල් කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු බවත්ය.

මානසිකව රෝගී වූ සේවාදයකයා සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමේදී අදාල වන කරුණු

- විත්තියේ නීතිඥවරයා ඔවුන්ගේ සාකච්ඡාවල විශ්වසනීයත්වය ආරක්ෂා වන බවත් ඒ පිළිබඳව රෝහල් කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා නොකරන බව මානසිකව රෝගී වූ විත්තිකරුට පැහැදිළි කර දීම අනිවාර්ය වේ.
- විත්තියේ නීතිඥවරයාගේ සැලැස්මට මානසික ආබාධිත භාවය පිළිබඳ සාක්ෂිය වැදගත් වන්නේ එමගින් චෝදනාව ලැබ ඇති අපරාධය සිදුකිරීමට අවශ්‍ය අපරාධ චේතනාව ඔප්පු කිරීමට විත්තිකරුට හැකියාවක් නොමැති බවය.
- විත්තියේ නීතිඥවරයා විත්තියේ පවුලේ සාමාජිකයන් සමග පවත්වන සම්මුඛ සාකච්ඡා මගින් මානසික රෝගී තත්ත්වය පිළිබඳ තොරතුරු ලබා ගත යුතුව ඇත.
- විත්තිකරුගේ මානසික තත්ත්වය ඇගයීමෙහිලා විත්තියේ නීතිඥවරයා විශේෂඥ අදහස් සලකා බැලිය යුතු අතරම වඩාත් ඵලදයී විත්තියේ සැලැස්ම වෙනුවෙන් එය ආධාර කර ගත යුතුව තිබේ.

(4) <u>වධ හිංසාවට සහ/හෝ මානව හිමිකම් උල්ලංඝණයකට විෂය වූ සේවාදයකයකු නියෝජනය කිරීම.</u>

(4.1) <u>වධ හිංසාව ගැන සාමාන්‍ය අර්ථකතනය</u>.

වධ හිංසාව දැරිය නොහැකි සහ සමහරවිට දීර්ඝ කාලීන වේදනාවන් ගෙන දෙන ක්‍රියාවන් වන අතර එය මානසික හෝ ශාරීරික විය හැකිය. එය මරණය වැළැක්වීම හෝ ප්‍රමාද කිරීම සිදුකරනු ලැබේ. එහි පසුකාලීන බපලෑම ශාරීරික (සැලැස්ම සහ/හෝ පශ්චාත් ක්ලමත ආතතිය) වේ. වධ හිංසාව සම්පූර්ණයෙන් තහනම් කිරීම සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ පහත් කොට සැලකීම් හෝ දඬුවම් සාම්ප්‍රදායික ජාත්‍යන්තරය පිළිගත් නීතිය තුළ පිළිගත් මූලධර්මයන් ය.

වධ හිංසා පැමිණවීමේ ඉහත ආකාරයේ සහ පහත කරුණුවලට සීමා නොවේ.

<u>ශාරීරික</u> පහරදීම්, වේදනාකාරී ස්ථාන අවහිර කිරීම, විදුලිසැර, රුධිරයේ ඔක්සිජන් නොමැතිකම, රසායන ද්‍රව්‍යය වලට අනාවරණය කිරීම, දැඩි ආලෝකය, ලිංගික පහරදීම, රඳවා තබා ගැනීමේ අඩු තත්ත්වයන් සැළකේ. සහ/හෝ කුසගින්නේ තැබීම වේ.

<u>මානසික</u> වාචික අතවර, මරණ තර්ජන, තවදුරටත් වධ හිංසා පැමණවීම, තම පවුල/මිතුරන්ට හානි පැමිණවීම, මරණ දණ්ඩනය පිළිබඳව අපහාස කිරීම, බලය යොදා සිදුකරන හැසිරීම්/(උදා ලිංගික සබඳතා සඳහා බල කිරීම, තම ආගමට විරුද්ධ ක්‍රියාවන් කිරීමට බල කිරීම, සහ/හෝ නින්ද නොයාම පිළිබඳ ගැටළුය.

වධහිංසාව පිළිබඳ බරපතල කරුණක් ඇත. එනම් වින්දිතයා සම්පූර්ණයෙන් පාලනය කිරීමට වධ හිංසාවට හැකිය. මෙම පාලනය මගින් එනම් ශාරීරික හෝ මානසික වේදනාවක් වින්දිතයාට ගෙන දීම වේ. ඒ වධ හිංසාව පිළිබඳ අරමුණු හෝ බලපෑම් කිරීමට පහත අංග ඇතුළත්ය.

- වින්දිතයාගේ තොරතුරු ලබාගැනීම.
- වින්දිතයාට හෝ/සහ පාපොච්ඡාරණයට බලපෑම් කිරීම.
- සැබෑ සහ/හෝ ව්‍යාජ අපරාධ සඳහා දඬුවම් කිරීම.

- ජනතාව හෝ දේශපාලන සංවිධාන බිය වැද්දීම. උදාහරණයකට යම් කණ්ඩායමක් යොදාගෙනය. එය අනෙකුත් ජනතාව බියට පත්කිරීම හෝ පසුබෑම සිදුකිරීම වේ. එනම් ඔවුනුත් තමන් වින්දිතයන් වේ යැයි බියට පත්වනු ඇත.
- කාළකණ්ණි සතුටක් ලැබීම.
- වින්දිතයාගෙන් ප්‍රකාශ ලබා ගැනීමට ඔහු හෝ ඇය දුර්වල බව එනම් මානසික සූදානම් වීම, ඒත්තු ගැන්වීම වේ.
- වධ හිංසාව සාධාරණීකරණය කිරීමට ඉහළ නිලධාරියකුගේ නියෝග ලැබුණු බව පැවසීම.

(4.2) වධ හිංසාව පිළිබඳ ජාත්‍යන්තර නෛතික අර්ථකථනය

වධ හිංසාව, සහ අනෙකුත් කෘෘර, අමානුෂික හෝ පහත්කොටසැළකීම් හෝ දඬුවමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ පළමු වගන්තියේ වධහිංසාව විස්තර කර ඇත්තේ පහත පරිදිය.

"වධ දීම යන්නෙන් වෙනත් යම් තැනැත්තෙකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූද, පහත දැක්වෙන කාර්යයන් හා එනම් එකී වෙනත් තැනැත්තාගේ හෝ තුන්වන තැනැත්තෙකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්ඡාරණයක් ලබා ගැනීම හෝ එකී වෙනත් තැනැත්තාගේ හෝ තුන්වන තැනැත්තෙකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූද එකී වෙනත් තැනැත්තාගේ හෝ තුන්වන තැනැත්තෙකු බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නාවූ ද සෑම අවස්ථාවකදීම රජයේ නිලධාරියෙකු හෝ නිල තත්ත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තෙකු විසින් හෝ එම නිලධාරියාගේ හෝ තැනැත්තාගේ මුල් වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිලධාරියාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නාවූ ද, යම් ක්‍රියාවක් අදහස් වේ."

වධ හිංසාවට එරෙහි සම්මුතියේ 16 වන වගන්තියේ මෙසේද සඳහන් වේ. එනම් එය වැළැක්වීමට පාර්ශවයන් කටුයතු කළ යුතුය. එනම් කෘෘර, වාචික හෝ පහත්කොට සැලකීම් හෝ දඬුවම්, වධ හිංසාව යටතට පත් නොවන එනම් පළමු වගන්තියේ අර්ථකතනය කළ ආකාරයට ඔවුන්ගේ භූමිවල අධිකරණ බල ප්‍රදේශ තුළදීය. මෙම වධ හිංසාවට එරෙහි සම්මුතිය අනෙකුත් ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන්වලට ව්‍යුහයට සමානකමක් දක්වනු ලැබේ. ඒ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වේ. මෙම මානව හිමිකම් යාන්ත්‍රන සියල්ලම, වධ හිංසාවට පාත්‍ර නොවී සිටීමේ අයිතිවාසිකම සහතික කර ඇත.

වධ හිංසාව රෝම සම්මුතියේ පහත ආකාරයට අර්ථකථනය කර තිබේ. රඳවා තබා ඇති හෝ චූදිතගේ පාලනය යටතේ සිටින පුද්ගලයකුට චේතනාත්මකව දැඩි වේදනාවක් හෝ පීඩාවක් පහත් කොට සැලකීම පිළිබඳ ක්‍රම, ස්වභාවයෙන්ම ශාරීරික සහ/හෝ මානසික වන අතර එම ක්‍රම දෙකේම ශාරීරික සහ මානසික බලපෑමක් ඇත.

(4.3) නෛතික රාමුව සහ ශ්‍රී ලංකාවේ සිදුවන වධ හිංසා පැමිණවීම්.

ශ්‍රී ලංකාව විසින් 1994 ජනවාරි 03 වධ හිංසාවට එරෙහි සම්මුතිය අනුමත කරන ලදි. ශ්‍රී ලංකාවේ වධ හිංසා පැමිණවීම නීති විරෝධී වේ. ඒ 1994 අංක 22 දරන වධ හිංසාව සහ අනෙකුත් කෘෘර, අමානුෂික හෝ පහත් කොට සැලකීම හෝ දඬුවමට එරෙහි පනත මගිනි.

මීට අමතරව ශ්‍රී ලංකාවේ අධිකරණ පහත ආකාරයට ද තීරණය කර ඇත. (ද සිල්වා එරෙහි පොහොර සංස්ථාව (1989) 2 SLR 393) එනම් මානසික ආවේගශීලි බවද වධ හිංසා පැමිණවීමක් වන බවය.

මෙය හැරුන විට තවමත් පුද්ගලයන් ශාරීරිකව හෝ මානසිකව හානි කිරීම්වලින් ආරක්ෂා කිරීමේ නීති සහ විධි විධාන තිබුණද යථාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ නීතිඥවරුන් පහත් කොට සැලකීම

හෝ වධ හිංසාව පිළිබඳව එයට මුහුණ දෙන වින්දිතයන් සමග ගැටුම් ඇති කර ගන්නා බවය. 2016 වසරේදී වධ හිංසාව සහ අනෙකුත් කෲර, අමානුෂික සහ පහත් කොට සැලකීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු මෙසේ ප්‍රකාශ කර ඇත. ඒ ඔහුගේ ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාව මගිනි. (2016 මැයි 7 ලෙස ඔහු දිනය සඳහන් කර ඇත) "වධ හිංසාව වූ කලී පොදු භාවිතාවකි. ඒ අපරාධ විමර්ශන කටයුතුවලදී නිරතුරුව සිදු වේ."[20]

මෑතකදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත කරුණු හඳුනාගෙන ඇත. ඒ ශ්‍රී ලංකා පොලීසිය, "ජනතාවගේ මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝණය කරන බවය." ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනියට අනුව එහි වැඩ කටයුතු වලදී, පළමු මාස නවය තුළ පමණක් කොමිෂමට වාර්තා වූ පැමිණිලි ගණන 5614 ක් බවය. එයින් 1174 ක් පොලීසියට එරෙහිව නීති විරෝධී රඳවා ගැනීම සහ වධ හිංසා පැමිණවීම් පිළිබඳවය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට අනුව, ඒ පොලීසිය සිය රැඳවීම් වලදී සහ විමර්ශන කටයුතු හැසිරවීමේදී උද්ගත වන වැදගත් දුෂ්කරතාවන් නිසාය. එය වැඩිදුරටත් ඉස්මතු කරන කරුණක් තිබේ. 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කොමිෂමට, වධ හිංසා පැමිණවීම් 249 ක්, අත්තනෝමතික ලෙස රඳවා ගැනීම් සහ තර්ජනාත්මක හැසිරීම් පිළිබඳ සිද්ධීන් 323 ක් වශයෙනි.[21]

2017 අතර කාලයේදී ආදේශකයකු ලෙස එක්සත් ජාතීන්ගේ විශේෂ රපෝර්තුකරුවකු වනම් ශ්‍රී ලංකාවේ වධ හිංසාව සහ අනෙකුත් කෲර, අමානුෂික සහ පහත් කොට සැලකීම හෝ දඬුවම පිළිබඳ මෙසේ වාර්තා කළේය. වධ හිංසා පැමිණවීම අදටත් පවතින අතර එය වසංගතයක් මෙන්ම පැතිරෙන ආකාරයක් බවට පත්ව ඇත. ජාතික ආරක්ෂාව පිළිබඳ පසුබිම තුළ අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සිදුකළ අතර සහ මෑතකදී 2016 වසර අග භාගයේ වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට පත් වූ 80% ක් පැමිණිලි කරන ලද කරුණකි. ඒ ඔවුන්ව අත්අඩංගුවට ගැනීමෙන් පසුව සිදුවූ වධ හිංසා පැමිණවීම සහ ශාරීරික පහත් කොට සැලකීමය.[22]

(4.4.) වධ හිංසාවට සහ/හෝ මානව හිමිකම් උල්ලංඝණයට පාත්‍ර වූ සේවාදයකයකු සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට සූදනම් වීම.

වධ හිංසාව පිළිබඳ විස්තර ලබා ගැනීම සහ ඔබේ සේවාදයකයා වෙත ප්‍රවේශය ලබා ගැනීම.

- සංවේදී සහ ගරුත්ත්වයක් ඇතිව සේවාදයකයා වෙත ප්‍රවේශ වීම;
- මතක තබා ගත යුත්තක් ඇත. ඒ ඔවුන් වධ හිංසාවට පාත්‍ර වී ජීවිතය නොනැසී පවත්වාගෙන යන සාමාන්‍යය පුද්ගලයන් බව;

[20] Un experts huge Sri Lanka to adopt urgent measures to fight for Lure and strengthen justice system's independence" United Nations Human Rights office of the High Commissioner , 10 May 2016 ,

[21] Perera , Melani , Manel "HRCSL Slams police for seriond human rights violations" Asia News. it 8 January 2018, http://www.asianews.it/news/en/HRCSL-slams-police-for-serious-human -right-violation-42767.....23. "UN experts' huge Sri Lanka to adopt urgent measures to fight torture and strengthen justice system's independence. United Nations Human Rights office of the High Commissioner, 10 May 2016,

http://www.occur.org/en/NewsEvents/Pages/DisplayNews.aspec ? News ID = 19946& LangID = E.

[22]

- වධ හිංසාවට පාත්‍ර වී ජීවිතය නොනැසී ජීවත්වන අය ඔබ සමග තොරතුරු බෙදා ගැනීමට මැලිවන විට හෝ වැරදි හැඟීම හෝ ඔවුන් මුහුණ දුන් ආතතිය ද නින්දව නිසා එහි ප්‍රතිඵලයක් ලෙස වූ ලැජ්ජාව සලකා බැලීම;
- කුඩා කතාවකින් සුදුසු ආරම්භයක් සලකා බැලීම සහ වඩා කෙටි ප්‍රශ්න ඇසීම මගින් වඩා දුෂ්කර මාතෘකාවන්ට යොමු වීම.

ප්‍රශ්න ඇසීම.

- මෙහිදී විවෘත (මොකද වුණේ) හා සංවෘත/නිශ්චිත ප්‍රශ්න (නිලධාරියා ඔබට පහර දෙන විට යමක් කිව්වා ද?) ඒ ඔබට ප්‍රවේශයට ප්‍රතිචාර පහසුවෙන් ලබා ගැනීමටය.
- වධ හිංසාවට අදාළ සෘජු ප්‍රශ්න වෙත යොමු වීමට පෙර ඒ සඳහා සේවාදායකයාගෙන් අවසර ඉල්ලා සිටින්න.
- ශාරීරික සහ/හෝ මානසික වධ හිංසා පැමිණවීම් ගැන දෙඅංශයේම විස්තර ලබාගැනීමට මතක තබාගන්න.

සේවාදායකයාගේ මිනුම් දඬු පිළිබඳව සම්බන්ධ වීම.

- සන්සුන්ව සිටින්න;
- ශබ්ද කිරීම හෝ මුහුණේ හැඟීම් පළ වීමෙන් වැළකී සිටින්න;
- ප්‍රවේශමෙන් ඇහුම්කන් දෙන්න සහ වෙනත් දේ වලට යෙමු වීමෙන් වළකින්න;
- සේවාදායකයාට ඔවුන්ගේ කතාව බෙදා ගැනීමෙහිලා ඉඩදෙන අතරතුර විවෘත හා සංවෘත ප්‍රශ්න පිළිබඳ හොඳ සැලැස්මක් සකසා ගන්න. ඔබ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේ අරමුණ ඔහුගේ නෛතික කරුණු පිළිබඳව බව ස්ථිර කර ගන්න;
- ශාරීරිකව අපහසුවෙන් සිටීමෙන් වළකින්න;
- සේවා දායකයාගේත් එමෙන්ම ඔබගේත් අවශ්‍යතා සහ සීමාවන් ගැන හොඳ අවබෝධයකින් පසුවන්න;
- ඔබේ සේවාදායකයා රඳවා සිටින්නේ නම් ඔබේ සේවාදායකයාගේ ආරක්ෂාව අනතුරේ හෙලන ක්‍රියාවන්ගෙන් වැළකී සිටින්න;
- සම්මුඛ සාකච්ඡාවේ ඉලක්ක සහ අරමුණු ගැන පිළිවෙලින් කටයුතු කරන අතරම ඒවා මනසේ ධාරණය කර ගන්න.

වැදගත් ප්‍රායෝගික හෙළිදරව් කිරීම්.

- වඩාත් පහසු විට වධ හිංසාව පිළිබඳව කතා කිරීමද වාර්තා කිරීමේ වැදගත්කම සේවාදායකයාට විස්තර කිරීම, එය විමර්ශනය කිරීමට හැකි වන බවත් වෙනස්කම් ඇති කිරීමට උදව් වන ලෙසත් පැවසිය යුතුය.
- අපරාධ යුක්ති ක්‍රියාදාමය තුළ හැකි ඉක්මණින්ම වේලාවේදී ඔබ සේවාදායකයා මුණගැසිය යුතුය; වධ හිංසාව හෝ අතවරයන් සිදුව ඇත්නම් ඒවා පහසුවෙන් හඳුනාගත හැක්කේ මුල්ම අවස්ථාවේ වන අතර පසු අවස්ථාවක නොවේ.
- වධ හිංසා පැමිණවීම ඔප්පු කිරීමට අවශ්‍යම දේ ශරීරය පිළිබඳ සාක්ෂිය, සේවාදායකයා, ඔහු හෝ ඇය වධ හිංසාවට පාත්‍ර වූ විට ඒ පිළිබඳවද චෝදනා නගන විට තදින් පැවසිය යුත්තේ වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්විය යුතු බවයි.
- මතක තබාගත යුත්තේ නීතිඥවරයාට සේවාදායකයාට ප්‍රවේශ වීම නිරතුරුව වළක්වන විට තුවාල සිදුවී තිබීම හෝ ඒ පිළිබඳ සාක්ෂි වියැකී යනු ඇත.
- නීති විරෝධී ලෙස ඔබව ප්‍රවේශ වීම වළක්වන විට, අදාල අධිකරණ නිලධාරීන් සමග සම්බන්ධ විය යුතු අතරම සේවාදායකයාට නීතිඥවරයා වඩාත්ම මුල්ම අවස්ථාවේදී මුණගැසීමට ඇති අයිතිය තදින්ම පැවසිය යුතුය.

- තවදුරටත් සේවාදයකයාට ඇති ප්‍රවේශය පිළිබඳ අයිතිය වැළැක්වෙන විට අධිකරණයට යා යුතු අතරම ප්‍රවේශ වීම වැළැක්වීම ගැන මෝෂමක් අධිකරණයේ ගොනු කළ යුතු අතර වධ හිංසාව පිළිබඳව ඇති සාක්ෂි ද ඉදිරිපත් කළ යුතුය.

(4.5) වධ හිංසාවට පාත්‍ර වූ වින්දිතයන් සම්මුඛ සාකච්ඡාවට පාත්‍ර කිරීම පිළිබඳව ප්‍රායෝගික මිනුම් දඬු.

- වින්දිතයාගෙන් සවිස්තරාත්මක ප්‍රකාශයක් ටේප් රෙකෝඩරයක් ආධාරයෙන් වාර්තා කිරීම සහ පටිගත කර තබා ගැනීමට උත්සාහ කළ යුතුය.
- උත්තරය නොසඟවා ප්‍රශ්න කිරීම් හෝ නිගමනයන් ලබා නොදෙයි. එය වින්දිතයාට වඩාත්ම සම්පූර්ණ සහ අපක්ෂපාතී ප්‍රකාශය ලබා දීමට ඉඩකඩ ලබාදෙයි.
- උත්තරය නොසඟවන ප්‍රශ්න වන්නේ ඔයාට මොකද වුනේ සහ කොහේද ආදී වශයෙන් වන අතර ඔබව බන්ධනාගාරයේදී වධ හිංසාවට පාත්‍ර කළේ ද යන්නෙන් වෙනස් වේ. (මෙම අවසාන ප්‍රශ්නය පීඩාවකි.)
- කලින් සෑදු ප්‍රශ්න නාමාවලියකට අදාලව ප්‍රශ්න ඇසීමෙන් වැළකිය යුතුය. එමගින් පුද්ගලයාට වැරදි උත්තර ලබාදීමට බල කරනු ලැබේ. එනම් සත්‍යය වශයෙන්ම සිදු වූ දෙය විකල්පයක් ලෙස සැලකෙන්නේ නැත.
- අදාල පුද්ගලයාට තමන්ගේ කතාව කීමට ඉඩ දිය යුතුය. නමුත් වඩාත් නිශ්චය ක් ගැනීමට අසන ප්‍රශ්න මගින් එයට සහය පල කරනු ලැබේ.
- අදාල පුද්ගලයාට තමාට සිදුවූ දෙය කීමේදී තම හැඟීම් පල කිරීමට ද උනන්දු කළ යුතුය.
- ඔහු හෝ ඇය දැකපු දෙය, ගඳ, සුවඳ, ඇසුන දෙය, දැනුන දෙය, ඇසිය යුතුය. මෙය වැදගත්ය. මක් නිසාද සමහර අවස්ථාවල, යම් වාතාවරණයන් තුළ පුද්ගලයාගේ ඇස් වසා තැබිය හැකි අතරම පහරදීම කළුවරේදී සිදුවිය හැක.

(4.6) වධ හිංසාව සහ/හෝ මානව හිමිකම් උල්ලංඝණයන්ට පාත්‍ර වූ බව චෝදනා කරන පුද්ගලයන්ගෙන් ඇසිය යුතු ආදර්ශ ප්‍රශ්න.

මෙය වෙහෙසකර ලැයිස්තුවක් නොවේ. නමුත් පහත ප්‍රශ්න ඔබට සහය පළ කරනු ඇත. ඒ ඔබගේ සේවාදයකයා වධ හිංසාවට පාත්‍ර වූයේ හෝ වෙනත් ආකාරයේ පහත්කොට සැලකීම් හෝ දඬුවමකට පාත්‍ර වූයේ ද යන්න විමර්ශනය කිරීමට සහ ස්ථිර කර දැන ගැනීමට ය. නමුත් කාරුණිකව සිත්හි තබාගත යුත්තක් ඇත. මෙම ප්‍රශ්න වලට පිළිතුරු දීම අසාමාන්‍ය ලෙස සේවාදයකයාට උත්තර දීම දුෂ්කර වේ. ගෞරවනීය වන්න, සංවේදනාත්මක සහ සැහැල්ලු වන්න.

- ඔබව අත්අඩංගුවට ගත්තේ කවදද? සහ කොහේද?
- ඔබව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී නිලධාරීන් කී දෙනෙක් සිටියේද?
- ඔවුන් අතර ප්‍රධානත්වය දැරුවේ කවිද?
- ඔවුන් නිල ඇඳුම් ඇඳ සිටියේද? ඔව් නම් කවර ආකාරයේද?
- විශේෂයෙන් යම් අයෙක් කැපී පෙනෙන ආකාරයෙන් සිටියේද?
- ඔබව අත්අඩංගුවට ගත් පුද්ගලයන් පැවසුවේ කුමක් ද?
- ඔවුන් ඔබට, ඔබව අත්අඩංගුවට ගත්තේ ඇයි දැයි කීවේද?
- ඔවුන් ඔබේ අයිතිවාසිකම් ගැන කුමක් කීවේද?
- ඔබව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී වෙනත් ප්‍රදේශයට ගෙන ගියේද?
- ඔබට හමු වූ පුද්ගලයන් සිටියේද?
- මෙම බන්ධනාගාරයේ රඳවා සිටි පුද්ගලයින්ට පහර දුන්නා ද? වධ හිංසා පැමිණ වූවාද? එවැනි දෙයක් ඔබට සිදුවූවාද?
- පොලිසිය පාරේදී, ගෙදරදී හෝ වෙනත් ස්ථානයකදී ඔබට පහරදීම හෝ වධ හිංසා පැමිණවීම සිදු කළාද?

- එය කී සැරයක් සිදු වුනාද? එය සිදුවූයේ කවර විටකදීද? එය අවසන් වීමට කොපමණ කාලයක් ගතවූවාද?
- ඔබේ ශරීරයේ කවර ස්ථාන පහර දීමට හෝ වධ හිංසාවට ලක්වූවාද? ඔබට එම ස්ථාන මට පෙන්වීමට පුළුවන්ද? ඒ පහරදීම හෝ වධ හිංසාවට පාත්‍ර වූ ඔබේ ශරීර අංගයන් වේද?
- ඔවුන් ඔබට කී සැරයක් පහර දුන්නාද? එක් පුද්ගලයකුට වැඩි දෙනෙක් එයට සහභාගී වූයේ නම් ඒ එක් එක් පුද්ගලයා ඔබට කී සැරයක් පහර දුන්නා ද?
- ඔබට පහරදෙන විට හෝ වධ හිංසා පමුණුවන විට ඔබට ඔහු කීවේ කුමක්ද? ඔබට තර්ජනය කළාද? ඔවුන් ඔබට පාපොච්ඡාරණය කරන්නැයි කියා සිටියාද?
- ඔබ ඔවුන්ට කී දේ ඔබට මතකද?
- ඔබ පුද්ගලයින් කී දෙනෙක් දුටුවාද?
- ඔවුන් මොනවාද කළේ?
- ඔබ විනිසුරුවරයකු හෝ වෙනත් නීතිඥයකු දුටුවාද?
- ඔබට පහරදීම හෝ වධහිංසා පැමිණවීමේදී ඔබව යමෙක් දැක්කා ද? ශබ්දය ඇසුනාද?
- එම නිලධාරීන් ඔබට යම් අසාමාන්‍ය හෝ අපහසුතාවය ඇති කරන දෙයක් සිදුකළාද?
- ඔබට මා හට කීමට වෙනත් යමක් තිබේද?

(4.7) වධ හිංසාවට පාත්‍ර වූ වින්දිතයන් තුළ පොදුවේ නිරීක්ෂණය කළ හැකි ප්‍රතික්‍රියා.

- වින්දිතයන් නිහඬව සිටී. මෙසේ වන්නේ ක්ලමතය සමග ගනුදෙනු කිරීමට වින්දිතයා යොදා ගන්නා ස්වාභාවික ප්‍රතික්‍රියාවකි.
- වින්දිතයින් සීමාව ඉක්මවා කතා කිරීම ඒ වින්දිතයා ඔවුන් සිදුකළ දේ පිළිබඳව කෝපයට පත්වී සිටින අතරම ඔවුන්ට එම කෝපය පිටකර ගැනීමට ඇති අවශ්‍යතාවයකි.
- මතක තබා ගත යුතු කරුණක් ඇත. වින්දිතයා මෙම ආකාර දෙකේම ප්‍රතික්‍රියා වල ලක්ෂණ පෙන්නුම් කරයි. නීතිඥවරයා ඔහුගේ හෝ ඇයගෙන් ප්‍රශ්න කිරීමට සහ ප්‍රවේශ වීමට උපාය මාර්ගයන් යොදා ගත යුතුය.

(4.7.1) වධහිංසා පැමිණවීම ගැන වින්දිතයකු චෝදනා කරන විට හෝ/සහ අසාමාන්‍ය සැලකීමක් පෙන්නුම් කරන විට සහ නිහඬව සිටීමට තෝරාගත් විට.

- මෙහිදී ඔහු/ඇය තම අත්දැකීම් ගැන පැවසීමට ඔබගේ සහය පතන විට එය මග නොහැරිය යුතුය.
- ඔබේ සේවාදායකයා වෙනුවෙන් කතා කරන විට පෙළඹවීම වැළැක්විය යුතුය.
- සේවාදායකයාව අත්අඩංගුවට ගැනීමේ කාරණාව කුමක්දැයි ඇසිය යුතු අතරම එය ආරම්භක අවස්ථාවේදීම සිදුකළ යුතුව ඇත. එනම් මේ අතර තුර වැඩිමනත් විශේෂ විස්තර ගැන ඇසිය යුතුය.
- ඔබේ සේවාදායකයාගේ පොඩි කතා පිළිබඳව අසන විට මතක තබා ගත යුතු කරුණක් තිබේ. ඔහු/ඇය පහත් සැලකීමට හෝ වධ හිංසා පැමිණවීමට පාත්‍ර වූයේ ද යන විශාල ප්‍රශ්නවලට උත්තරදීමය.
- සේවාදායකයාගේ වාක්‍යය අවසන් කිරීමට හෝ සම්පූර්ණ කිරීමට කිසි විටෙකත් කටයුතු නොකළ යුතුව ඇත.
- වින්දිතයාට තමාට සිදු වූ දේ කියන විට එහි විස්තරවලට අවධානය යොමු කළ යුතුය. සමහරක් ක්‍රියා වින්දිතයා පවසන ඔහුට/ඇයට අවබෝධ වන ආකාරය සහ නීතිය දැක්වෙන දෙයට වඩා වෙනස් විය හැකිය.
- සේවාදායකයා ඔහු/ඇය ගේ සිදුවීම් පිළිබඳව කතා කිරීමට පටන්ගත් විට එයට බාධා නොකිරීම එයට අදාල ඉදිරි ප්‍රශ්න ඇසීමට පෙර එය අවසන් වන තුරු සිටිය යුතුය.

- හැකි සෑම විටම සේවාදයකයාට ශාරීරිකව සිදුවූ අතවර පිළිබඳව කතා කිරීමට ඉඩ සැලසිය යුතු අතරම එය අතවර වලින් සිදු වූ මානසික බලපෑම කියා සිටීමට පෙර විය යුතුය.
- ඔබ ඔබගේ සේවාදයකයා සමග එක්ව අතවරය නිසා ඇතිවූ පෙනෙන්නට තිබෙන කැලැල්, අදාල සාක්ෂිකරුවන්, අපරාධකරුවන් ඔවුන්ගේ නම් (හෝ අන්වර්ථ නම්) සහ ඔවුන්ගේ විස්තරයක් දන්නේ නම් ලැයිස්තුවක් සෑදිය යුතුය.

(4.7.2) <u>වධ හිංසාව ගැන චෝදනා නගන හෝ/සහ පහත් ලෙස සැලකීම පිළිබඳව පෙනෙන ඔහු හෝ ඇය තම අත්දැකීම පිළිබඳව කෝපයෙන් පසු වුවද එවැනි සේවාදයකයෙකු ඔබට මුණ ගැසුනු විට;</u>

- සේවාදයකයාට බැන වැදීමට ඇති අවශ්‍යතාව තේරුම් ගැනීම. සම්මුඛ සාකච්ඡාවේදී සේවාදයකයාට නිදහස්ව ඔහුගේ/ඇයගේ හැඟීම් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදිය යුතුව ඇත.
- මෙම වේලාව වැදගත් කරුණු හඳුනා ගැනීමට හැකියාව ඇති සාකච්ඡාව යොමු කළ යුතු දිශානතියකට යොමු කිරීමට යොදගත යුතුව ඇත.
- අතිශෝක්තියට ඇති හැකියාව බලාපොරොත්තු විය යුතු අතරම ඒ සඳහා ප්‍රතිපාදන සෑදිය යුතුව ඇත.
- සේවාදයකයාට විත්තිවාචකය සෑදීමේදී සමහරක් කරුණු සැඟවීම සහ දැනුවත් කිරීමට ඇති අවශ්‍යතාව පැහැදිළි කළ යුතුව ඇත.
- වැඩි වශයෙන් කතා කරන සේවාදයකයෙකු නම් ඔහුට පළමුව මානසික වධ හිංසාව ගැන කතා කිරීමට හැකියාව ඇත්නම් ඊට ඉඩ සැලසිය යුතුව ඇත.
- සේවාදයකයාගේ කතාවට හෝ එය දිගට ගලා යෑමට බලපෑම් වන අවස්ථාවක යම් කාලයකට විෂය වෙනස් කොට එනම් ඔවුන්ගේ පවුල ගැන කතා කරන විටදීය. මෙය අවසාන වූ විට අතවරය හෝ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කතාව විස්තරාත්මක පැහැදිළි කිරීමට යොමු විය යුතුව තිබේ.
- සම්මුඛ සාකච්ඡාව අවසානයට ළඟා වූ විට ශාරීරික තුවාල පිළිබඳව විභාග කිරීම සහ විමර්ශනය කිරීම කළ යුතුව ඇත.
- සේවාදයකයා සමග එක්ව නාමාවලියක් සැකසිය යුතුව ඇත. එයට සාක්ෂිකරුවන්, අපරාධකරුවන්, ඔවුන්ගේ නම්, (අන්වර්ථ නම් ද ඇත්නම්) ඔවුන් හෙළිදරව් කරන්නා වූ කතාන්දරය සංවිධානගත කිරීමද කළ යුතුව ඇත.

<u>(4.8) වධ හිංසාවට සහ/හෝ මානව හිමිකම් උල්ලංඝණය ට පාත්‍ර වූ සේවාදයක සමග කරන සම්මුඛ සාකච්ඡාව අවසානයේදී නීතිඥවරයා ලබාගත යුතු තොරතුරු.</u>

- චෝදනා නගන සිදුවීම් සිදුවූ වේලාව සහ ස්ථානය.
- එම සිද්ධීන් වලදී සහභාගී වූ පුද්ගලයන් පිළිබඳ විස්තර. ඔවුන් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවකට සහභාගී වූවාද, නොවූවාද යන්න පිළිබඳ විස්තර.
- සෑම පුද්ගලයකුගේම නිසැක භූමිකාව සහ විශේෂයෙන් සිදුවූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ස්වභාවය.
- මානසිකව හානිදයක සහ/හෝ මානසික වධ හිංසාවට අදාල ව සිදුවූ පීඩාවන් හෝ තර්ජනයන් පිළිබඳ විස්තර.
- සේවාදයකයා ඔබට පෙන්වූ ශාරීරික කැලල් සියල්ල පිළිබඳ විස්තර.
- සිද්ධීන් පිළිබඳව සාක්ෂි දීමේ හැකියාව ඇති යම් සාක්ෂිකරුවෙකු වේ නම් ඔවුන්ගේ විස්තර.

(4.9) වධ හිංසාවට සහ/හෝ අතවරයන්ට ලක්වූ සේවාදායකයකු නොසලකා හරින විටදී චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට හෝ විනිසුරුවරයාට ප්‍රවේශ වීමේදී අනුගමනය කළ යුතු ප්‍රායෝගික පියවර.

(4.9.1) විනිසුරුවරයකුට ප්‍රවේශය ලබාගැනීමේදී

- යුක්තිය පසිඳලීමේ ප්‍රධානතම විනිශ්චය වූ විනිසුරුවරු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂ භූමිකාවක් ඉටු කරති.
- විනිසුරුවරුන් තුළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මගින් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කිරීමෙහිලා ආචාර ධර්ම මත පදනම් වූ වගකීමක් නිර්මාණය කරති.
- එක්සත් ජාතීන්ගේ අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රධාන මූලධර්මවල 6 වැන්න මෙසේ ප්‍රකාශ කරයි. අධිකරණ ස්වාධිනත්වය පිළිබඳ මූලධර්මය අධිකරණ ක්‍රියාදාමය සහ අදාල පාර්ශවයන්ගේ අයිතිවාසිකම් එයට ගරු කිරීම සහතික කිරීම සහ එයට අවකාශය සලසා දීම සිදුකරනු ලැබේ.
- සේවාදායකයාට ඇති ප්‍රවේශය දිගින් දිගටම පැහැර හරින විටදී උසාවියට "ප්‍රවේශය වැළැක්වීම" පිළිබඳ මෝෂමක් ඉදිරිපත් කළ හැක.

(4.9.2) චෝදනාව මෙහෙයවන නීතිඥවරයා වෙත ප්‍රවේශ වීම.

- රජයේ නිලධාරීන් සිදුකරන  වධ හිංසාව පිළිබඳ අපරාධයට විරුද්ධව විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට නඩු පවරන්නන්ට ආචාර ධර්මයට අනුකූලව වගකීමක් ඇත.
- නඩු පවරන්නන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මිණුම් දඬුවල එනම් 15 වගන්තියේ මෙසේ සඳහන් වේ. "රජයේ නිලධාරීන් සිදුකරන අපරාධ සම්බන්ධයෙන් නඩු පැරීමේදී නිසි අවධානය යොමු කළ යුතුය. ඒ විශේෂයෙන් දූෂණය, බලය අවභාවිතා කිරීම, බරපතල මානව හිමිකම් උල්ලංඝණය කිරීම්, අනෙකුත් අපරාධවල දීය. මේවා ජාත්‍යන්තර නීතිය හඳුනාගෙන ඇත. නීතියෙන් බලාත්මක කර ඇත. එවැනි වැරදි විමර්ශනය කරන විට දේශීය යාන්ත්‍රනයට අනුකූල වේ"
- සේවාදායකයාට ප්‍රවේශ වීම දිගින් දිගටම වළක්වන විට චෝදනාව මෙහෙයවන නීතිඥවරයා ප්‍රවේශය ලබාගෙන ඔහුට/ඇයට පෙන්නුම් කළ යුතු දෙයක් ඇත. එනම් මෙම තත්ත්වය දිගින් දිගටම පැවතුනහොත් අධිකරණයේ "ප්‍රවේශය වැළැක්වීම" යන හිසින් යුතුව මෝෂමක් මගින් නඩුවක් ගොනු කරන බවය.

හපුගමගේ ජගත් පෙරේරා එරෙහි ගෝතමී රනසිංහ, පොලිස් ස්ථානාධිපති සුළු අපරාධ අංශය, පොලිස් ස්ථානය (මීරිගම) සහ තවත් අය. (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR 1006/2009)

මේ කරුණ හේතුවෙන් විත්තිකරු අධිකරණයෙන් සිය නීත්‍යානුකූල අයිතිය පිළිබඳ ප්‍රකාශයක් ඉල්ලා සිටින්නේ ය. ඒ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1), 13(1) සහ 13(2) වගන්ති වලින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම්, පළමු, දෙවන හා තුන්වන වගඋතත්රකරුවන් උල්ලංඝණය කළ බවටය. මෙය සිදුවූයේ ශ්‍රීලංකාවේ පොලීසිය පෙත්සම්කරුව නීති විරෝධීව අත්අඩංගුවට ගෙන පහරදීම මගිනි. අධිකරණය, දෙවන වගඋත්තරකරු විසින් පෙත්සම්කරුගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 12(1) වගන්තීන් වලින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බව සොයා ගනු ලැබිණ. බරපතල පොලිස් පහරදීමේ ප්‍රතිඵලයක් ලෙස පෙත්සම්කරුට දතක් අහිමි විය. අධිකරණය කියා සිටියේ පෙත්සම්කරුට රජය විසින් රුඃ 500,000/- ක් වන්දි ලෙස ගෙවිය යුතු බවත් ඒ සඳහා අයිතියක් පෙත්සම්කරුට ඇති බවත්ය.

ජානක බටවලගේ එරෙහිව පොලිස් පරීක්ෂක ප්‍රසන්න රත්නායක, පොලිස් ස්ථානය සහ තවත් සතර දෙනෙක්.

(ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR 393/2008)

මෙම සිද්ධියේදී පොලීසිය පෙත්සම්කරුගේ කම්මුලට පහරදීම සහ ඇඟිලි සලකුණු ගැනීමට බල කර ඇත. පොලීසිය පෙත්සම්කරුට තම බිරිඳ සහ අනෙකුත් අය හමුවීමට ද ඉඩ දී නැත. අධිකරණ වෛද්‍ය නිලධාරී හමුවීමෙන් පසුව පෙත්සම්කරුව රෝහල්ගත කළ යුතු බවට නියෝග කර ඇත. ඉන්පසුව පෙත්සම්කරුට, ඔහු නොපැවසූ තොරතුරු අතුළත් පොලිස් ප්‍රකාශයකට අත්සන් කරන ලෙස පොලීසිය බල කර තිබේ. ඉන්පසුව අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂමට ප්‍රකාශයක් කර ඇත.

ඒ පෙත්සම්කරු වෛද්‍ය, නීතිමය පරීක්ෂණයකට විෂය නොවූ බවය. අධිකරණය පෙත්සම්කරු වධ හිංසාවට සහ පහත්කොට සැලකීමට භාජනය වී ඇති බව තීරණය කෙරිණි. ඒ අනුව 11 වන වගන්තියේ සඳහන් ඔහුගේ මූලික අයිතීන් කඩවී තිබේ. අධිකරණය පෙත්සම්කරුට රුः 150,000/- ක් ගෙවීමට සහ නෛතික ගාස්තු ලෙස රුः 25,000/- ක් රජය ගෙවිය යුතු බවට නියෝග කෙරිණි.

<u>ඉස්තාම්බුල් ප්‍රටකෝලය (2004)</u>

ඉස්තාම්බුල් ප්‍රටකෝලය වධ හිංසාව සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ පහත් කොට සැලකීම් හෝ දඬුවම් පිළිබඳ ඵලදායී විමර්ශනය කිරීම සහ වාර්තාගත කිරීම සම්බන්ධයෙන් ස්ථිර මිණුම් දඬු සපයා දී තිබේ. එය ජාත්‍යන්තර වශයෙන් ඉතාම හොඳින් භාවිතයට ගනු ලබන මූලධර්ම සහ මිණුම් දඬු ස්ථාපිත කර ඇත. ඒ වධ හිංසාව සහ පහත්කොට සැලකීම පිළිබඳ චෝදනා කරන පුද්ගලයන්ව තක්සේරු කිරීම, වධ හිංසාව සිදුවූ බව කියන සිද්ධියේ හෝ අනෙකුත් විමර්ශන කරන ආයතනවලට වාර්තා කිරීම වේ.

ප්‍රටකෝලය පහත කරුණු සම්බන්ධයෙන් පැහැදිළිය. වධ හිංසාව පිළිබඳව සිදුකරන චෝදනා නැගීම් ඵලදායී ලෙස විමර්ශනය කිරීමෙහිලා, විමර්ශනකරු චෝදනා නගන වින්දිතයාගේ ප්‍රකාශයක් ලෙස පහත තොරතුරු ගැනීමට උත්සාහ කළ යුතුය.

(i) වධ හිංසාව සහ අත්අඩංගුවට ගැනීම හෝ පැහැර ගැනීම සහ රඳවා ගැනීම ද ඇතුළත්ව ඒ සඳහා වාතාවරණය;

(ii) වධ හිංසාව පිළිබඳව අවසාන වතාවට වධ හිංසා පැමිණවීම ද ඇතුළත්ව ඒවා සිදුවූ බොහෝදුරට නිවැරදි දිනය සහ වේලාව; <u>සටහන</u> : මෙම තොරතුරු ලබාගැනීම පහසු කටයුත්තක් නොවේ. ඒ ස්ථාන කිහිපයක් සහ අපරාධකරුවන් (හෝ අපරාධය සිදුකළ කණ්ඩායමක්) එයට සහභාගී වී සිටින නිසාය. වෙනස් ස්ථාන පිළිබඳව වෙන වෙනම කතන්දර වාර්තාගත කිරීම සිදුකළ යුතුව ඇත. දින වකවානු අනුව සිදුවීම් පෙළ ගැස්වීමට බලාපොරොත්තු වන විට සුදුසු නොවීම සහ සමහර අවස්ථාවල ව්‍යාකූල විය හැක. වධ හිංසාවට පාත්‍ර වූ පුද්ගලයකුගෙන් වේලාවන් නිශ්චය කර ගැනීම ඉතාම දුෂ්කර විය හැක. වෙනස් ස්ථාන පිළිබඳ එකිනෙකට වෙන් වූ කතන්දර අදල කතාන්දරය පිළිබඳ පුළුල් ලෙස හඳුනා ගැනීමට ප්‍රයෝජනවත් වනු ඇත. වධ හිංසාවට පාත්‍ර වී නොනැසී ජීවත් වන්නන් බොහෝ විට ඔවුන්ව ගෙන ගිය ස්ථාන ඇස් වැසීම නිසා හෝ සිහි කල්පනාව මඳ බව නිසා දන්නේ නැත. ප්‍රකාශ සියල්ල එක් තැනකට ඒකරාශී කර ගැනීමෙන් ස්ථාන නිශ්චය කිරීම, ක්‍රමයන් පමණක් නොව අපරාධකරුවන් ද පැහැදිළි කර ගැනීමේ හැකියාව ලැබේ.

(iii) අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ වධ හිංසාව පිළිබඳව ඊට අදල වූ පුද්ගලයන් ගැන සවිස්තරාත්මක විස්තරයක් ලබාගැනීම කළ යුතුව ඇත. එයට පහත අංග ද ඇතුළත් වේ. එනම් ඔහු හෝ ඇය වධහිංසාට පෙර දී ඔවුන් පිළිබඳව දැන සිටියාද, ඇඳුම්, තරාතිරම, පැල්ලම්, උපන් ලප, පච්ච කෙටීම්, උස, බර, (පුද්ගලයකු තම ප්‍රමාණය අනුව වධ හිංසාව විස්තර කිරීමට අදලව) අපරාධකරුගේ ශරීර ආකෘතියේ දැකිය හැකි යම් අසාමාන්‍යතාවයක්, භාෂාව සහ වචන උච්චාරණ විධිය සහ යම් වේලාවක අපරාධකරුවන් (හිංසකයන්) බීමත්ව සිටියා ද යන වගය.

(iv) පුද්ගලයාට පැවසූ දෙය හෝ ඇසූ දෙය එහි අන්තර්ගතය, මේ මගින් පහත කරුණුවලට අදාලව තොරතුරු ලබා දෙනු ඇත. ඒ රඳවා තබා ගැනීම පිළිබඳ රහස්‍යය හෝ නොදන්නා ස්ථානය හඳුනා ගැනීමට උත්සාහ කරයි.

(v) රඳවා තැබූ ස්ථානය පිළිබඳ සාමාන්‍ය විස්තර සහ පහත් කොට සැලකීමේ ආකාරයන් පිළිබඳ විස්තර.

(vi) වධ හිංසා ක්‍රම ඇතුළත්ව වධ හිංසාව පිළිබඳ විස්තරයක්.

සටහන : මෙය නිරතුරුවම තේරුම් ගැනීමට දුෂ්කරය. එනම්, විමර්ශකයන් බලාපොරොත්තු නොවිය යුතු දෙයක් තිබේ. ඒ එක් සම්මුඛ පරීක්ෂණයේදී සම්පූර්ණ කතාන්දරය ලබා ගැනීමකි. නමුත් සම්පූර්ණ තොරතුරු ලබා ගැනීම වැදගත් වේ. තවද මෙහිදී අපහාසාත්මක සහ පහරදීම පිළිබඳ, ඊට සම්බන්ධ ප්‍රශ්න නිරන්තරයෙන්ම ක්ලමතය සහ විඩාවක් ඇති කරයි.

(vii) පුද්ගලයා ලිංගිකව හිංසනයට ලක්වීමේදී බහුතරයක් පුද්ගලයන් ලිංගික හිංසනය ගැන ප්‍රශ්න කරන විට එයට උත්තර දීමට නැඹුරුව ඇත්තේ ස්ත්‍රී දූෂණයක් හෝ පුරුෂ මෛථුනයක් ලෙස සලකාය.

සටහන: විමර්ශකයන් පහත කරුණු සම්බන්ධයෙන් සංවේදී විය යුතුය. වාචික හිංසනය, ඇඳුම් ගැලවීම, කාමුක හෝ අපහාසාත්මක ක්‍රියාවන් හෝ පහරදීම් හෝ ලිංගික අවයව වලට විදුලි කම්පනයන් ඇති කිරීම වන අතර මේවා වින්දිතයන් ලිංගික හිංසනයක් ලෙස සලකන්නේ නැත. මෙවැනි ක්‍රියාවන් සියල්ල පුද්ගලයකුගේ ලිංගික සබඳතාවයන් අහිමි කරයි. උල්ලංඝණය කරයි. ඒ අනුව මේවා ලිංගික හිංසනය බව එහි කොටසක් බව අනිවාර්‍යයෙන් සැලකිය යුතුය. වින්දිතයන් බොහෝ විට ලිංගික හිංසනය පිළිබඳ කිසිවක් නොකියන අතරම එය ප්‍රතික්ෂේප කරති. මෙම කතාව එලියට එන්නේ දෙවන හෝ නැත්නම් තෙවන හමුවීමේදී වන අතරම ඒ සම්බන්ධයෙන් අවංක සහ සංවේදී ව පුද්ගලයාගේ සංස්කෘතිය සහ පෞරුෂයට සමීප වූ විටදී ය.

(viii) වධ හිංසා පැමිණවීමේදී සිදුවන තුවාල කිරීම්.

(ix) ආයුධ හෝ යොදගත් අනෙකුත් ශාරීරික උපාංග පිළිබඳ විමර්ශනයක් සහ

(x) වධ හිංසා පැමිණවීමට අදාලව ඊට ඇතුළත් වූ සාක්ෂිකරුවන් හඳුනා ගැනීම.

සටහන : සාක්ෂිකරුවන්ට ආරක්ෂාව ලබාදීමට විමර්ශකයා, කටයුතු කළයුතු අතරම පහත කරුණු ගැන අනිවාර්යයෙන් සැලකිළිමත් විය යුතුය. සාක්ෂිකරුවන් හඳුනාගැනීම් රහසිගතව තබාගැනීම හෝ වැදගත් සම්මුඛ පරීක්ෂණය සිදුකළ ලේඛන වලින් ඔවුන්ගේ නම් වෙන්කොට තැබිය යුතුව ඇත.

(4.11) සාමාන්‍ය කරුණු සහ වධ හිංසාව සහ/හෝ මානව හිමිකම් උල්ලංඝණයන්.

ඉස්තාම්බුල් ප්‍රටකෝලය පහත ආකාරයට ස්ත්‍රී පුරුෂ සමාජ භාවයන් පිළිබඳ කරුණු සලකා බැලේ.

අනිවාර්යයෙන්ම විමර්ශන කණ්ඩායමක් තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව දෙයාකාරයෙන්ම කටයුතු කරන විශේෂඥයන් සිටිය යුතුව ඇත. වධ හිංසාවට පාත්‍ර වූ බව කියා සිටින පුද්ගලයන් විමර්ශකයාගේ පමණක් නොව අවශ්‍ය වන විට පරිවර්තකයාගේ ද ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව සොයාගත යුතුය. එය පහත අවස්ථාවක් සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත් වේ. ඒ ස්ත්‍රී දූෂණය සිදුවිය හැකි ස්ථානයක කාන්තාවක් රඳවා ඇත. නමුත් ඇය ඒ පිළිබඳව මෙතෙක් ප්‍රකාශ කර නැත. ලිංගික හිංසනය සිදුවී නැති අවස්ථාවලින් බොහොමයක් වධ හිංසා පැමිණවීම් වලට ලිංගික කටයුතු අදල වේ.

නැවතත් පීඩාවට පත් හෝ ක්ලමත තත්ත්වය වඩාත් නරක් විය හැක. මක් නිසාද ඇය තමාට සිදුවූ දේ විස්තර කරන්නේ තමන්ට වධ හිංසා පැමිණ වූ වධකයාටම සමාන ශරීර ස්වරූපයෙන් වූ පිරිමියෙකුට මෙන්ම ඔවුන් වඩාත්ම හෝ සමස්තයක් ලෙස පිරිමින් ද වන බැවිනි. සමහරක් සංස්කෘතීන්වල පිරිමි විමර්ශකයකුට කාන්තා වින්දිතයකුගෙන් ප්‍රශ්න කළ නොහැකි අතර මෙය

ගරු කළ යුතු තත්ත්වයකි. කෙසේ නමුත් බොහෝ සංස්කෘතීන්වල මෙම තත්ත්වය වෙනස්ය. එනම් පිරිමි විශේෂඥයකු පමණක් සිටින විට බොහොමයක් කාන්තාවන් වෙනත් වෘත්තියක කාන්තාවක සමග කතා කරනවාට වඩා ඔහු සමග කතා කිරීමට කැමැත්තක් දක්වන්නීය. ඒ අයට අවශ්‍යය වෛද්‍යය තොරතුරු හා උපදේශය ලබා ගැනීමටය. එවැනි සිද්ධියක දී පරිවර්තක ලෙස යමෙක් යොදා ගන්නා විට, ඒ අනිවාර්‍යයෙන්ම කාන්තාවක් විය යුතුය. සමහරක් සම්මුඛ පරීක්ෂණයට ලක්වන අය කැමති දෙයක් ඇත. ඒ අනුවර්තක ඔවුන්ගේ ප්‍රදේශයෙන් පරිබාහිර කෙනෙකු වීමත්ය. එසේ වන්නේ ඔවුන් පාත්‍ර වූ වධ හිංසාවට යළි සිහිකැඳවීම සහ ඔවුන් විශ්වසනීයත්වයට තර්ජනයක් වේය යන කාරණා දෙක නිසාය. අනුවර්තකයකු අවශ්‍ය නොවන විට විමර්ශක කණ්ඩායමේ කාන්තාවක ඒ වෙනුවෙන් පෙනී සිටිය හැකි අතර එය අවම වශයෙන් ශාරීරික පරීක්ෂණය සඳහා විය යුතු අතරම රෝගියා කැමති වන විට සමස්ත සම්මුඛ පරීක්ෂණයටම ඇයව යොදාගත හැකිය.

පිරිමි වින්දිතයකු ගත් විට ඔහු ලිංගික හිංසනයට ද ලක්වී ඇති අවස්ථාවක තත්ත්වය වඩාත් සංකීර්ණ වේ. මක් නිසාද ඔහුව පිරිමි විසින් වඩාත් සහ සම්මතයක් ලෙස ලිංගික අතවරයට ලක් කරන බැවිනි.

වින්දිතයා පිරිමියකු වන අවස්ථාවක් සලකා බලමු. ඔහුව ලිංගික අතවරයට ද ලක් කර ඇත. මෙහිදී උද්ගත වන සංකීර්ණ තත්ත්වයක් තිබේ. පසුව වැඩියෙන් හෝ සම්පූර්ණයෙන්ම පිරිමි අය විසින් ලිංගික අතවරයට ලක් කරන බැවිනි. මේ නිසා සමහර පිරිමි තම අත්දැකීම් කාන්තාවකට විස්තර කිරීමට වඩාත් කැමති වේ. ඒ වෙනත් පිරිමින්ට ඇති බිය නිසාය. නමුත් අනෙක් අය කාන්තාවක් ඉදිරියේ පුද්ගලික කරුණු සාකච්ඡා කිරීමට කැමති නැත.

(4.12) වධ හිංසාවට පාත්‍ර වූ වින්දිතයන්ට අධිකරණයෙන් බැහැරව ඇති විසඳුම්.

අපරාධ විත්තියේ නීතිඥවරුන්ට වගකීමක් ඇත. ඒ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් භාරයේ සිටින විට වධ හිංසාවට පාත්‍ර වූ වින්දිතයන්ට අපරාධ අධිකරණවලින් සහ සාම්ප්‍රදායික අපරාධ යුක්ති ක්‍රියාදාමයෙන් බැහැරව අතිරේක විසඳුම් ඇති බව පැහැදිළි කර දීම වේ.

මීට අමතරව අපරාධ විත්තියේ නීතිඥවරු අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු සමග එම අතරවරවලට විරුද්ධව වාර්තා කළ යුතු අතරම කඩිනමින් මානව හිමිකම් කොමිෂමට, නීතිපති දෙපාර්තමේන්තුවට, පොලිස්පතිට හා ශ්‍රී ලංකාවේ ජාතික පොලිස් කොමිෂන් සභාවට ලිපි සකස් කර දිය යුතු අතර එය පහත රාමුවට අනුව විය යුතුව ඇත.

1. චූදිතට චෝදනා ගොනු කළ දිනය/වේලාව;

2. අත්අඩංගුවට ගත් නිලධාරියාගේ නම/තනතුර සහ ඔහු සිටියේ නිල ඇඳුමින්ද නැතිනම් සිවිල් ඇඳුමින්ද යන වග;

3. වධ හිංසා පැමිණවීමේ ක්‍රියාදාමයට සම්බන්ධ අනෙකුත් නිලධාරීන්ගේ නම/තනතුර;

4. පොලිස් ස්ථානය හා හෝ රැඳවුම් මධ්‍යස්ථානයෙහි නම සහ ප්‍රදේශය;

5. චූදිත පුද්ගලයා සමග සම්බන්ධකම් ඇති පවුලේ සාමාජිකයකු හෝ මිතුරකු මගින්;

6. චූදිතයාව නිදහස් කිරීමට පෙර රඳවා තැබූ කාලය හා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ කාලය.

(5) විත්තියේ නඩුව පිළිබඳ න්‍යාය සහ තේමාව.

(5.1) හැඳින්වීම සහ නඩුවේ රාමුව සැකසීම.

නඩුවක් මධ්‍යගත න්‍යායක් මත හෝ කේන්ද්‍රීය කරුණක් මත සංවිධානය කිරීමට සහ සූදානම් කිරීමට නීතිඥයකුගේ තීරණාත්මක නෛතික හැකියාව සහ උපරකණ මත සිදුවිය යුතුව තිබේ. චූදිතගේ විත්තිවාචකය නඩුවේ න්‍යාය අනුව සකස් වන අතරම එය සවිස්තරාත්මක වීම, තාර්කික සහ සිද්ධ වූ දෙය පිළිබඳව නිවැරදි කතාවක් විය යුතුය. නඩුවේ න්‍යාය සම්පූර්ණයෙන්ම සලකා

බැලුව හොත් පහත පරිදි වේ. සෑම නඩුවකටම කතාවක් ඇත. මෙහිදී නීතිඥවරයාගේ වගකීම වන්නේ ඔවුන්ගේ සේවාදයකයන් වෙනුවෙන් මෙම කතාව කීමය. කෙනෙකුගේ නඩුවක් ප්‍රදර්ශනය කරන න්‍යායක් වන්නේ සේවාදයකයාට නිදහස් වීමට අයිතියක් ඇති බවය. අපරාධ නඩුවකදී නම් නිදෙස් කොට නිදහස් වීමටය. නඩුවක් මෙහෙයවීමේ උපායශීලි සැලැස්ම වන්නේ නඩුවේ න්‍යායයි. තවද සේවාදයකයෙකු වෙනුවෙන් විත්තිය ද එයම වන අතර ඉන්පසුව ඇත්තේ උපායශීලි ඉදිරිපත් කිරීමකි. සාමාන්‍යයෙන් නඩුවේ න්‍යායට නෛතික න්‍යාය, සිද්ධිය පිළිබඳ න්‍යාය සහ ඒත්තු ගැන්වීමේ න්‍යාය ඇතුළත් වේ.

- නීතිය පිළිබඳ න්‍යාය; චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ හෝ චූදිතට පැවැත්ම සඳහා නෛතික තර්කයන්;
- සිද්ධිය පිළිබඳ න්‍යාය; නිශ්චිත සිද්ධිය කෙසේ සිදුවූයේ හෝ සිදුවීමට ඉඩ තිබීම ගැන පැහැදිළි කිරීම සහ
- ඒත්තු ගැන්වීමේ න්‍යාය; සාධාරණත්වය සහ යුක්තිය පිළිබඳ කරුණක් මත චූදිත නිදෙස් කොට නිදහස් කළ යුත්තේ ඇයිද යන්න පිළිබඳ තර්කය;
- විත්තිකරුව අත්අඩංගුවට ගැනීම නීති විරෝධී ද?
- සේවාදයකයාව යම් ආකාරයකට වධ හිංසාවට හෝ/සහ පහත් කොට සැලකීමකට පාත්‍ර කර ඇත්ද?
- චූදිතව අත්අඩංගුවට ගැනීමෙහිලා ප්‍රමාණවත් ව්‍යවස්ථාපිත පසුබිමක් තිබුණාද?
- චූදිතව රඳවා තබා ගැනීම නීත්‍යානුකූලද?
- සෝදිසිය සම්පූර්ණ කළා නම් එය නීත්‍යානුකූලද?
- අවශ්‍ය වූ විට චූදිතට පරිවර්තකයකු ලබා දුන්නාද?
- අපරාධ සිදුකිරීමෙහිලා චූදිතට මානසික හැකියාවක් පැවතියාද?
- චූදිත යම් ලේඛනයකට එනම් පාපොච්චාරණ ඇතුලුව අත්සන් කළාද?
- චූදිතට වරද පිළිගැනීමට අවශ්‍යයද?
- එකතු කර තබාගත යුතු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ගත්තාද?
- චූදිතට නොහැකියාව පිළිබඳ උත්තරවාදයක් ඇති විට එය සත්‍යය ඔප්පු කිරීමට යොදගත හැකිද?
- අපරාධ නඩුවක් ගොනු කිරීමේ ව්‍යවස්ථාපිත කාලය ඉකුත්වී ඇතිද?
- ඔබට චූදිතගේ නිරදෝෂීභාවය ඔප්පු කිරීමට පුළුවන්ද?
- චූදිත සිදුකළ අපරාධය ඔබ සාධාරණීකරණය කිරීමට ඔබට පුළුවන්ද?
- චූදිත සැබවින්ම අපරාධ සිදුකර තිබේද?
- චෝදනා කරන වරද සම්බන්ධයෙන් සේවාදයකයාට වඩා වැඩි වගකීමක් හිමිවන වෙනත් පුද්ගලයෙක් සිටීද?
- සේවාදයක ලිහිල් හෝ සැහැල්ලු දඬුවමකට සුදුසුද?
- චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට ඔප්පු කිරීමේ භාරය දරා ගැනීමට හැකිද?

ඉහත ඇත්තේ සවිස්තරාත්මක නොවන නාමාවලියකි. මතකයේ තබාගත යුතු කරණක් ඇත. එම මිණුම් දඬු නම්‍යශීලි වේ. ඒ සෑම පුද්ගලික නඩුවක කරුණු සමග ගැලපීමක් ඇති කර ගත හැකි බැවිනි. ප්‍රාථමික තොරතතුරු රැස්කර ගත් පසු කළ යුතු දෙයක් ඇත. ඒ චෝදනාව සම්බන්ධයෙන් මෙන්ම අපරාධයේ කරුනු සම්බන්ධයෙන් ඇති ව්‍යවස්ථා හෝ සංග්‍රහයන් සමාලෝචනය කිරීම වේ. දිය හැකි දඬුවම් සම්බන්ධයෙන් අපරාධ සංග්‍රහය සමාලෝචනය කළ යුතුව ඇත. ඒ චූදිත මුහුණ දුන්න චෝදනා ලැබූ වරද සම්බන්ධ නඩු තීන්දුවක් ඇත්දැයි බැලිය යුතු වීමය.

(5.2) නඩුවේ න්‍යාය තීරණය කිරීම/නිශ්චය කිරීම.

(5.2.1) යම් කරුණක් පිළිබඳ තොරතුරු කෙසේ වුවද, යහපත් නඩුවක න්‍යායක් වන්නේ;

- නඩුවේ පෙන්නුම් කරන අංශයන් හෝ තොරතුරු සම්බන්ධයෙන් උපකල්පනයන් මත පදනම් නොවිය යුතුය;
- නඩුවට අදාල තොරතුරු හෝ අංශයන් සම්බන්ධයෙන් සතුටුදායක නොවන තර්ක කිරීම් පැහැදිළි කිරීම් ගණනය කළ යුතුව තිබේ;
- නඩුව මෙහෙයවන නිලධාරියා හෝ/සහ ජූරිය ඔවුන්ගේ පරිකල්පනයන් මත දිගින් දිගටම නොසිට කරුණු පිළිගත යුතුය;
- තොරතුරු මත ගොඩනැගිය යුතුය;
- විශ්වසනීය තොරතුරු මත (පවතී නම්) එකඟ විය යුතුය;

(5.2.2.) <u>නඩුවක න්‍යාය සංවර්ධනය කිරීම සහ පවත්වා ගැනීම වැදගත් වන්නේ ඇයි?</u>

නඩුව පිළිබඳ න්‍යායන් වැදගත් වේ. ඒ ඔබේ නඩුව පහත න්‍යායන් පාලනය කරන බැවිනි;

- ඔබේ නඩුව පිළිබඳ විමර්ශනය;
- සේවාදායකයා ගෙන් ඔබ විමසන ප්‍රශ්න;
- ඔබේ සොයා ගැනීම සහ නඩුවට සූදානම් වීම;
- ඔබේ ආරම්භක ප්‍රකාශයේදී කියන දේවල්;
- මූලික සහ හරස් ප්‍රශ්න විමසීමේදී ඇසිය යුතු දේවල් කුමක්ද?
- චෝදනාව මෙහෙයවන සහ විත්තියේ සාක්ෂිකරුවන්ට යොමු කරන ප්‍රශ්න;
- ඔබ තර්ක කිරීම් අවසානයේදී කියන දේ සහ
- ඔබේ නඩුවේ තේමාව කුමක්ද යන්න;

අඩුපාඩු නොමැති නඩුවක න්‍යාය උපායශීලී සැලැස්මක් ඉදිරිපත් කරන අතරම විනිශ්චයකරුට සහ/හෝ ජූරියට එය උපායශීලීව ඉදිරිපත් කිරීම පෙන්නුම් කිරීම.

(5.2.3) <u>මා විසින් නඩුවක න්‍යාය නිර්වචනය කිරීම සහ සංවර්ධනය කර පවත්වාගෙන යන්නේ කෙසේද?</u>

එහි පළමු පියවර වන්නේ චෝදනාව හෝ අධි චෝදනාව සමාලෝචනය වන ආකාරයට නඩුවේ න්‍යාය නිර්මාණය කිරීම වේ. එහිදී එය චූදිතට එරෙහි චෝදනාවේදී විශ්වසනීය විය යුතුව ඇත. මෙම පියවරේදී අපරාධය සහ චෝදනාවට අදාල අත්‍යාවශ්‍ය කරුණු සම්බන්ධයෙන් තීරණය කිරීම විවේචනාත්මක විය යුතුය.

දෙවන පියවරේදී නඩුවේ තොරතුරු සහ පසුබිම අඩුපාඩු නොමැතිව ගැඹුරු ලෙස විමර්ශනය කළ යුතුය. එය එවිට ක්‍රියාවන් ඔස්සේ සිදු කළ හැක.

- තොරතුරු කරුණු සහ උපදෙස් ලබා ගැනීමට චූදිත සමග සම්මුඛ සාකච්ඡා පැවැත්විය යුතුය;
- නඩු පවරන්නාගේ සියලු ලේඛන, ප්‍රදර්ශක සහ අනෙකුත් දේවල් පරීක්ෂා කිරීම සහ විභාග කිරීම කළ යුතුව ඇත.
- හැකියාව පවතී නම් චෝදනා ඇති අපරාධයට අදල ඇසින් දුටු සාක්ෂි තොරතුරු ලබා ගැනීමට සමමුඛ පරීක්ෂණයට භාජනය කළ යුතුය.
- හැකියාව ඇත්නම් නඩුවට අදළ වෙනත් ඕනෑම විභවයක් සහිත සාක්ෂිකරුවකු සමග සම්මුඛ සාකචඡා පැවැත්වීම;
- හැකියාව පවතී නම් හෝ අදාලත්වය ඇති විට අපරාධය සිදුවූ බවට චෝදනා කරන ස්ථානය පරීක්ෂා කළ යුතුය..
- චූදිතගේ ව්‍යවස්ථාපිත අයිතීන් උල්ලංඝණය වී ඇති විට එය පාලනය කළ යුතු අතර, එහිදී විශේෂයෙන්;

**ඔබ චූදිතව අත්අඩංගුවට ගැනීමෙන් පසුව නිහඬව සිටීමේ අයිතිය ඔහුට/ඇයට දැන්වූවාද?**

**චූදිතට නීතිඥ සහය ලබා ගැනීමේ අයිතිය ( නීතිඥ වරයෙකු වෙනුවෙන් මුදල් වියදම් කිරීමේ හැකියාව නැති වුවද) දැන්වූවාද? තවද චූදිතගෙන් ප්‍රශ්න කරන අවස්ථාවේ එම නීතිඥවරයාට පෙනී සිටීමට ඇති අයිතිය දැන්වූවාද?**

**අසාධාරණ සෝදිසියක් සහ/හෝ චූදිතගේ සහ/හෝ දේපළ සම්බන්ධයෙන් සිදුවූවාද? අත්අඩංගුවට ගැනීමේ හෝ සෝදිසි වරෙන්තුවක් ඇති විටක එයට සාධාරණ හේතුවක් තිබුනිද?**

තෙවන පියවර පහත පරිදි වේ. එනම් යමෙකුගේ නඩුවට අදල න්‍යාය තීරණය කරන විට තීරණය කළ යුත්තේ උසාවිය තුළ චූදිතගේ විත්තිවාචකය මෙහෙය වන්නේ කුමන ආකාරයෙන්ද යන්නය.

- සේවාදයකයා අයැද සිටීමට පෙර ආරම්භක විරෝධතා ඇතිදැයි විනිශ්චය කළ යුතුය. උදහරණයකට ගත් විට එය පහත ආකාර වේ. අධිකරණමය කරුණු, චෝදනාව පිළිබඳ සාවද්‍ය කරුණු සහ අධි චෝදනා වේ.
- ස්ථාපිත කිරීමට නියමිත තොරතුරු හඳුනාගත යුතු අතරම නඩුවේදී ඒවා ඔප්පු කළ යුතු වේ. තවද චින්දිතගේ විත්තිවාචකය ඉදිරිපත් කළ යුතුව ඇත.
- මෙම තොරතුරු ඔප්පු කරන ආකාරය හඳුනා ගන්න. එම කරුණු ගොඩ නැගීමේදී අවශ්‍ය වන සාක්ෂිකරුවන්ව කැඳවීමද ඔබ කළ යුතුව ඇත.
- විනිශ්චය කළ යුතු තවත් කරුණක් තිබේ. ඒ නඩු පවරන්නාගේ සාක්ෂිකරුවන්ට තිබෙන (හෝ වැදගත්) විශ්වසනීය කරුණු තිබේද යන්නය.
- ඔබේ නඩුවේ ඇති ශක්තිමත්ම කරුණු විනිශ්චය කළ යුතු අතරම එයට නඩු පැවරීම ද අදල වේ.
- චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ මෙන්ම ඔබේත් නඩුවට සම්බන්ධ දුර්වල කරුණු විනිශ්චය කළ යුතුව ඇත.


සේවාදයකයාගේ යහපත්ම අභිලාෂයන්, අදල කරගත යුතු නීති සහ අදල නීතිය තොරතුරු ද ඇතුළත්ව ඒවා කේන්ද්‍ර කරගනිමින් නීතිඥවරයා බාහිරව නඩුවේ සාමාන්‍ය න්‍යායක් ගොඩනැගිය යුතුය. එය පහත ආකාරයට ඔහුට/ඇයට උදව් වේ. විත්තියේ ක්‍රියාදමය තුළ ගත යුතු කරුණු පිළිබඳව ඇගයීම මෙන්ම පහත මෙහෙයවීම ද සිදු වේ. එනම් ඒ අදල කරණු විමර්ශනය කිරීම සහ නඩු විභාගයට සූදනම් වීම කේන්ද්‍රීය ලෙස සලසා ගෙනය.

මේ අනුව නීතිඥවරයාගේ වගකීම පහත ආකාරයට සිදුව ඇත. ඒ අඛණ්ඩව තොරතුරු සහ ඔහු/ඇයගේ සේවාදයකයාගේ විනිශ්චය සහ නඩුවේ න්‍යායට අදල සාක්ෂි වලට සහය පළ කිරීම සහ අවධාරණය පුළුල් කිරීම වේ.

<u>(5.3) නඩුවට අදල තේමාව තීරණය කිරීම.</u>

ඵලදයී කතන්දරයට (හෝ න්‍යායට) පහත දේ අවශ්‍යයි. ඒ වෙනස් දේවල් එකට එකතු කිරීම පැහැදිළි තේමාවකට අවශ්‍යය වේ. මතක තබාගත යුතු වැදගත් දෙයක් ඇත. ඔබේ නඩුවේ තේමාව පහත පරිදිය. ඒ නඩුව පිළිබඳ පුළුල් න්‍යායෙන් එක් අංගයක් වේ. නඩුවේ න්‍යායට තේමාවක් අවශ්‍ය විය යුතුය. නඩුවේ තේමාව එක්කෝ වචනයකි. වාග් ශෛලියක් හෝ සරු වාක්‍යයකි. එමගින් බලගතු හැඟීමක් ඇති කර සකස් කරනු ලැබේ. තේමාව කෙටි විය යුතුව ඇත. විනිසුරුවරයකු හෝ/සහ ජූරිය පහසුවෙන් මතක තබාගත යුතුය. නඩුවේ තේමාව විචක්ෂණශීලීය. එය අනෙකුත් අංග එකට එකතු කරනු ලැබේ.

ඔබේ නඩුවේ තේමාව වර්ධනය කර ගැනීම සඳහා පහත දේද ඇතුළුව අවශ්‍ය වන හෝඩුවාවන්.




<u>(5.4) සිදුවීම පෙළගැස්සවීම සහ නඩුවේ න්‍යාය සහ තේමාව ඉදිරිපත් කිරීම.</u>

උසාවියේදී නීතිඥවරයා සේවාදයකයාගේ කතාව කියයි. එහිදී ඔහු/ඇය ප්‍රබල තේමාවක් මගින් කාවදින ලෙස නඩුවේ න්‍යාය ප්‍රයෝජනයට ගතයුතුව ඇත. ඵලදායී ලෙස සේවාදයකයකුගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටීමේදී නීතිඥවරයා පහත කරුණු අවබෝධ කරගත යුතුව ඇත. එනම් කතාව අධිකරණයට පවසන්නේ කෙසේද, වඩාත්ම ඒත්තු ගත හැකි කතාවකදී එය වඩාත්ම තාර්කික භාවය විශ්වසනීයව ඒත්තු ගැන්වීම වන අතර එය නඩුවේ තොරතුරු විනිශ්චය කරන විනිසුරුට හෝ ජූරියට ඉදිරිපත් කළ යුතුය.

ඉහත කරුණු මනසේ තබාගෙන නීතිඥවරයා සිදුවීම පෙළගැස්සවීමේදී අදාල වේදිකාව තැනීම, සුදුසු වාතාවරණයක් නිර්මානය කර ගැනීම, චරිත හඳුන්වාදීම සහ සාක්ෂි සංවිධානගත කිරීම ප්‍රවේශමෙන් සකස් කළ රාමුවකට අනුව සිදුකළ යුතුව ඇත. එවැනි රාමුවක් නොමැති වූ විට සිදුවන දේ පහත ආකාර වේ. විනිසුරු සහ/හෝ ජූරි සභිකයන් චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ තර්ක කිරීම් මත එයට අනුව සාක්ෂි සහ ප්‍රකාශ අවබෝධ කර ගැනීම හා පිළිගැනීම සිදුවනු ඇත.

එවැනි රාමුවක් භාවිතයට ගැනීම විත්තියේ නීතිඥවරයා පහත් කරුණු සම්බන්ධයෙන් විනිසුරුවරු සහ/හෝ ජූරි සභිකයන් මෙහෙයවනු ලැබේ. සාක්ෂි ප්‍රකාශන අවබෝධ කර ගැනීම සහ පිළිගැනීම එය ඔවුන්ගේ සේවාදයකයාට වාසිසහගතව සිදුවිය යුතු අතරම එය සේවාදයකයාගේ අත්දැකීම් පිළිබඳ සන්දර්භය තුළ සිදුවිය යුතුය. ඔබේ සේවාදයකයාගේ කතාව උසාවියට කියන විට ධනාත්මක වාතාවරණයක් නිර්මාණය කිරීම වැදගත් වේ. මෙම වාතාවරණය /පරිසරය තුළ ඉදිරිපත් කරන්නා වූ සාක්ෂි ඇගයීමට ලක්වනු ඇත. උසාවිය තුළ කතාන්දරය කීම/සිදුවීම් පෙළගැස්වීම වඩාත් ඵලදායී ලෙස සිදුවීමෙහිලා පහත හැකියාවන් අවශ්‍යය වේ.

- විවිධ ස්වර සහ හඬෙහි තිව්ර භාවය
- සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමේදී රිද්මය සහ ස්වරය
- විනිසුරුවරයකු හෝ ජූරිය ආමන්ත්‍රණයේදී නිසි රිද්මය සහ රිද්මයේ වේගය
- ශාරීරික භාෂාව සහ විවෘත අංග චලනයන්
- ඵලදායීතාව සහ ඉස්මතු කිරීමෙහිලා අවශ්‍ය නතර කිරීම්
- ඇස් මගින් කරන සංනිවේදනය සහ ඇස් සමග සම්බන්ධතාව පවත්වා ගෙන යාම සහ

- වෙනස් සිත් ඇදගන්නා සුළු කතාව (අලංකාරත්වය) පිළිබඳ හැකියාවන්ය.

නඩුවක න්‍යාය ඵලදායී ලෙස සංවර්ධනය කර ගැනීමෙහිලා නීතිඥවරයා චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව අරමුණකට අනුව ඇගයීමට ලක් කළ යුතුව ඇත.

මෙය සේවාදයකයා දෙන උපදෙස් අනුව සහ තොරතුරුවල ප්‍රකාශයක් සමග තුලනය විය යුතුව ඇත. තවද මෙම තුලනය සුදුසු නීතිඥවරයකු එක දිගට ගලායන කතාවක් සඳහා සැකිල්ල සකස් කළ යුතු අතරම එය අදාල කරුනු වල තොරතුරු මත පදනම් වේ. යම් හැඟීම්බර තොරතුරු ඇතොත් අසත්‍යය ඔප්පු කිරීමෙහිලා සාමූහික ප්‍රයත්නයක් ලෙස සංග්‍රහ කෙරෙනු ඇත.

නඩුව පිළිබඳ සාධාරණ න්‍යාය අවබෝධ කරගැනීම හැකි ඉක්මණින් සිදු කළ යුතුය. ඒ නඩුවේ විමර්ශනය, සාක්ෂිකරුවන්, සාක්ෂි පරීක්ෂා කිරීම සහ ඉදිරිපත් කිරීම මෙන්ම තර්ක ඉදිරිපත් කිරීමෙහිලා පරීක්ෂාවට ලක් කරනු ලැබෙන බැවිනි. සාධාරණ සහ ඒත්තු ගැන්විය හැකි කතාවකට ඉහත සියල්ල එකතු කර ගනිමින් විත්තියේ නීතිඥවරයා, විනිසුරුවරයා හෝ ජූරිය මගින් ඔහුගේ/ඇයගේ සේවාදයකයා මුද ගැනීමට කටයුතු කළ යුතුව ඇත. මීට අමතරව දඬුවම ලිහිල් කර ගැනීමට හෝ තම සේවාදයකයා අපරාධ වගකීමෙන් මුද ගැනීමට කටයුතු කළ යුතුය.

<u>(5.5) විත්තිවාචක</u>

නඩුවේ න්‍යාය ගොඩනැගීමේදී එහි ක්‍රියාදාමය තුළ විත්තියේ නීතිඥවරයා තීරණය කළ යුතු දෙයක් ඇත. ඒ සේවාදයකයා නිදෙස් කළ හැකිද යන්නය. එසේ වන විට නීතිඥවරයා තවදුරටත් සලකා බැලිය යුතු කරුණක් ඇත. ඒ නඩු විභාගයේදී සේවාදයකයාගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීම වේ.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ iv පරිච්ඡේදයේ විවිධ විත්තිවාචක වල අවශ්‍යතාව දක්වා ඇත. ඒවා අපරාධ චෝදනාවලදී ගෙනහැර දැක්විය හැක. මෙහිදී පැහැර හැරිය නොහැකි කරුණක් තිබේ. ඒ පවතින විත්තිවාචක මෙන්ම අත්‍යවශ්‍ය කරුණු සම්බන්ධයෙන් සමීප වීම වේ. පහතින් දක්වා ඇත්තේ චූදිතයකු නිදෙස් කර ගැනීමෙහිලා ශ්‍රී ලංකා නෛතික රාමුව තුළ ඇති පවතින විත්තිවාචකයන්ය.

(5.5.1) <u>තොරතුර පිළිබඳ වැරදීම.</u>

යම් ක්‍රියාවක් කිරීම නීතියෙන් බැඳී සිටින්නාවූ හෝ නීතිය පිළිබඳ වැරදීමකින් නොව සිද්ධිය පිළිබඳ වැරදීමකින් එසේ නීතියෙන් තමා බැඳී සිටින බව සද්භාවයෙන් විශ්වාස කරන තැනැත්තකු විසින් කරනු ලැබූ කිසිම ක්‍රියාවක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය, 69 වන වගන්තිය)

නිදර්ශනය :

(අ) නීතියේ විධාන පරිදි තම ඉහළ නිලධාරියාගේ ආඥාව අනුව "ඒ" නම් වූ යුද්ධ භටයා කලහකාරී පිරිසකට වෙඩි තබයි. "ඒ" කිසි වරදක් කර නැත.

(ආ) අධිකරණයක නිලධාරියකු වූ "ඒ" එම අධිකරනය මගින් "වයි" සිරභාරයට ගැනීමට නියම කරනු ලැබ, නිසි විභාගයකින් පසුව "වයි" යයි විශ්වාස කරමින් "ඉසෙඩ්" සිරභාරයට ගනියි. "ඒ" කිසි වරදක් කර නැත.

<u>(5.5.2) යහපත් චේතනාව</u>

නීතියෙන් හේතු යුක්තියක් ඇත්තෙකු විසින් හෝ නීතිය නොදැනීම මගින් නොව, සිද්ධිය නොදැනීම මගින් යම් ක්‍රියාවක් කිරීමට නීතියෙන් බලය ඇතැයි යන සද්භාවයෙන් විශ්වාස කරන්නෙකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. (දණ්ඩනීති සංග්‍රහය, 72 වන වගන්තිය)

නිදර්ශනය :

මිනී මැරුමක් ලෙස "ඒ" ට හැඟෙන දෙයක් "ඉසෙඩ්" කරනු "ඒ" දකියි. මිනීමරුවන් මිනී මැරීමේදී ඔවුන් ඇල්ලීමට සියලු තැනැත්තන්ට නීතියෙන් දී තිබෙන බලය "ඒ" තමාගේ විනිශ්චය අනුව සද්භාවයෙන් පාවිච්චි කිරීමෙන් නිසි බලධාරීන් ඉදිරියට ගෙන ඒම සඳහා "ඉසෙඩ්" අල්ලා ගනියි.

“ඉසෙඩ්” ආත්මාරක්ෂාව පිණිස ක්‍රියාකරන ලද බැව් පසුව දැනගන්නට ලැබුනත් “ඒ” විසින් වරදක් කර නැත.

(5.5.3) ආත්මාරක්ෂාව

ආත්මාරක්ෂාව සහ තෙවන පාර්ශවයේ ආරක්ෂාව සම්පූර්ණ විත්තිවාචක වන අතර එසේ වන්නේ මෙම විත්තිවාචකයට අවශ්‍යය සියලු කරුණු වලින් සැහීමකට පත්වන විටදීය.

“පීඩාවක් කිරීමේ සාපරාධී අදහසක් නොමැති වූ පුද්ගලයන් හට හෝ දේපළවලට විය හැකි වෙනත් පීඩා වැළැක්වීමේ හෝ මගහැරවීමේ කාර්යය සඳහා සද්භාවයෙන් යම් ක්‍රියාවක් කරන ලද නම්, එය කරනු ලැබූයේ ඉන් පීඩාවක් විය හැකි බව දත් පමණින් වූ විට ඒ ක්‍රියාව වරදක් බවට පත් නොවේ.”

(දණ්ඩ නීති සංග්‍රහය - 74 වන ඡේදය)

දණ්ඩ නීති සංග්‍රහය 92 වන වගන්තියේ ඇතුළත් සීමා කිරීම්වලට යටත්ව පහත දැක්වෙන දේවල් ආරක්ෂා කර ගැනීමට සෑම තැනැත්තකුටම අයිතිය ඇත්තේය.

පළමුව මනුෂ්‍ය ශරීරියට විරුද්ධව කෙරෙන යම් වරදකදී තමාගේ ශරීරය ද, වෙනත් තැනැත්තෙකුගේ ශරීරය ද, දෙවනුව සොරකම, කොල්ලකෑම, අනර්ථ කිරීම හෝ සාපරාධී අයුතු ඇතුළුවීම හෝ සොරකමට, කොල්ලකෑමට, අනර්ථ කිරීමට හෝ සාපරාධී අයුතු ඇතුළුවීමට තැත් කිරීම පිළිබඳව විස්තරය යටතේ වැටෙන වරදක් වූ ක්‍රියාවකදී තමාගේ හෝ වෙනත් තැනැත්තකුගේ චංචල හෝ නිශ්චල දේපළ ද වේ. (දණ්ඩ නීති සංග්‍රහය 90 වන ඡේදය)

ආරක්ෂාවේ කාර්යය සඳහා අවශ්‍ය වන ප්‍රමානයකට හැර ඊට වඩා පීඩාවක් සිදුකිරීමට කවර අවස්ථාවකදී වුවද පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නොපැතිරේ. (දණ්ඩ නීති සංග්‍රහය 92 (4))

(5.5.4) අවාසනාව, ආපදාව

නිසි ආරක්ෂාව හා ප්‍රවේශම ඇති වූ සාපරාධී අදහසක් හෝ දැනුමක් නොමැතිව, නීත්‍යනුකූල මාර්ගවලින් නීත්‍යනුකූල ලෙස නීතියානුකූල ක්‍රියාවක් කිරීමේදී අහම්බෙන් හෝ අවාසනාවෙන් සිදු වූ කිසිවක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය - 73 වන පරිච්ඡේදය)

නිදර්ශනය : “ඒ” අත් පොරොවෙන් වැඩ කරයි. තලය විසිවී ගොස් අසල සිටි මිනිසෙකු ට වැදීමෙන් ඔහු මැරෙයි. “ඒ” ගේ නිසි ප්‍රවේශමෙහි අඩුවක් නොතිබිණි නම් ඔහුගේ ක්‍රියාවට සමාව දිය හැකිය. වරදක් ද නොවේ.

(5.5.5) මත්වීම.

ස්වේච්ඡාවෙන් නොවන මත්වීම සම්පූර්ණ විත්තිවාචකයකි. ස්වේච්ඡාවෙන් නොවන මත් වීමට පහත වාතාවරණය ඇතුළත් වේ. චූදිතයකුගේ බීමට යමෙක් යම් මත්ද්‍රව්‍යයක් එකතු කර ඔහු එය පරිභොජනය කළ විට එනම් ඔහුට ඒ පිළිබඳව අවබෝධයක් නැති විට මෙය සිදුවිය හැකිය. චූදිතට මෙවන් අවස්ථාවක අපරාධය පිළිබඳ සාවද්‍ය චේතනාව නැත. ඒ මත්ද්‍රව්‍ය වල බලපෑම හේතුවෙනි. ඔහුට සම්පූර්ණ විත්තිවාචකය හිමි වේ.

ක්‍රියාවෙහි ස්වභාවය හෝ තමා වැරදි දෙයක් හෝ නීතියට පටහැනි ක්‍රියාවක් කරන බව, ක්‍රියාව කරන වේලාවෙහි මත්වීම හේතුවෙන් දැන ගැනීමට නොහැකි තැනැත්තකු විසින් කරනු ලැබූ කිසිවක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය 78 වන වගන්තිය)

එය එසේ වරදක් නොවීමට ඔහු මත් කරනු ලැබූ දෙය ඔහු නොදැනුවත්වම හෝ ඔහුගේ කැමැත්තට විරුද්ධව ඔහුට දෙන ලද්දක් නොවී නම් ඔහු මත් නොවී සිටින විට ඇති දැනුමෙන් යුතු වූ ලෙස දඬුවම් ලැබීමට ඔහු යටත් විය යුතුය. (දණ්ඩ නීති සංග්‍රහය - 79 වන වගන්තිය)

(5.5.6) කැමැත්ත

ක්‍රියාව කරන්නා මරණය සිදු කිරීම හෝ බරපතල තුවාල කිරීම අදහස් කරනු නොලැබුව ද, සිදුවිය හැකි බව දැන නොසිටියාවූ ද, යම් ක්‍රියාවක්, ඒ සීමාව දරා ගැනීම සඳහා සිය කැමැත්ත පැහැදිළිව හෝ ඇඟවෙන ලෙස දුන් වයස අවුරුදු දහ අටෙන් ඉහළ තැනැත්තෙකුට ඒ ක්‍රියාවෙන් සිදුවන හෝ ක්‍රියාව කරන්නා විසින් කිරීමට අදහස් කරනු ලැබූ පීඩාව නිසාම පමණක් නැතහොත් පීඩාවේ විපාක දරා ගැනීමට කැමැත්ත දුන් තැනැත්තෙකුට සිදුවිය හැකි ලෙස ක්‍රියාව කරන්නා විසින් දැන ගත හැකි යම් පීඩාවක් නිසා පමණක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය - 80 වන වගන්තිය)

මරණය සිදු කිරීමට අදහස් කරනු නොලැබූ කිසි ක්‍රියාවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලබන්නේ යමෙකුගේ යහපතට නම්, ඒ තැනැත්තා විසින් පීඩාව දරා ගැනීමට හෝ පීඩාවේ විපාකය දරා ගැනීමට ප්‍රකාශිතව හෝ ඇඟවෙන ලෙස කැමැත්ත දෙනු ලැබී නම් ඒ ක්‍රියාවෙන් ඔහුට විය හැකි පීඩාවක් හෝ ක්‍රියාව කරන්නා විසින් විය හැකි ලෙස අදහස් කරනු ලැබූ හෝ දැන ගනු ලැබූ පීඩාවක් නිසා පමණක් වරදකරු නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය - 81 වන වගන්තිය)

(5.5.7) තර්ජනය

යම් ක්‍රියාවක් කරන වේලාවෙහි එසේ නොකළහොත් එහි විපාකය වශයෙන් එකෙනෙහිම එකී ක්‍රියාව කරන්නාට මරණය යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි ප්‍රමාණයක තර්ජන වලින් බල කරනු ලැබූ නිසා කරනු ලැබූ, මිනී මැරුම හා මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි ආණ්ඩුවට විරුද්ධ වූ ක්‍රියා හැර අන් කිසිම ක්‍රියාවක් වරදක් නොවේ. මෙය වරදක් නොවීමට එකී ක්‍රියාව කරන්නා සිය කැමැත්තෙන්ම නැතහොත් ක්ෂණික මරණයකට අඩු පීඩාවක යුක්ති සහගත අනුමානයකින් එසේ බල කිරීමකට යටත් වන තත්ත්වයකට තමාගේම ඕනෑකමින් පත් නොවී සිටය යුතුය.

(දණ්ඩ නීති සංග්‍රහය - 87 වන වගන්තිය)

නිදර්ශනය : ගෙවල් බිඳින්නන් රංචුවකට ඔවුන්ගේ හැසිරීම දකිමින්ම තමාගේ කැමැත්තෙන් හෝ පහර දෙනු ලැබීමේ තර්ජනයක් හේතුවෙන් එකතු වන තනැත්තෙකුට තම සහචරයන්ගේ බල කිරීමේ හේතුවෙන් නීති විරෝධී ක්‍රියාවක් කර මේ ව්‍යතිරේඛයේ වාසිය ලබා ගැනීමට බලය නැත්තේය.

(5.5.8) අන්‍ය ස්ථානික භාවය/නොහැකියාව

අන්‍ය අස්ථානිකභාවය නිශ්චිත විත්තිවාචකයකි. එහිදී අදල අපරාධය සිදුවන අවස්ථාවේ ඔහු/ඇය එම ස්ථානයේ නොසිටි බව චූදිත පිළිගනී. ඒ අවස්ථාවේ ඔහු/ඇය සිටියේ වෙනත් ස්ථානයක වේ.

චූදිත ශ්‍රී ලංකාවේ දී අන්‍ය අවස්ථාවක නොසිටීම පිළිබඳ විත්තිවාචකය අයැද සිටින අවස්ථාවක් බලමු. එහිදී අවශ්‍ය වන කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 126 A වගන්තියෙන් ස්ථිරව දක්වා ඇත. එම වගන්තිය පහත ආකාරයට නිශ්චිත කරනු ලැබේ. එමගින් පෙන්නුම් කරන්නේ චූදිත අන්‍ය ස්ථානිකභාවය පිළිබඳ විත්තිවාචකය ගැන චූදිත දැනුම් දීමක් කළ යුතු බවය.

(1) මහ අධිකරණයේ අධි චෝදනාව පිළිබඳ නඩු විභාගයෙන් කිසිදු පුද්ගලයකුට අන්‍ය අස්ථානික බාවය පිළිබඳ විත්තිවාචකයට සහාය පළ කිරිම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ හැකිවන නමුත් ඔහුට,

(a) පොලීසිය සිදුකරන විමර්ශනයේදී එම තොරතුරු පිළිබඳව ප්‍රකාශයක් කළ හැකිය. නැතිනම්

(b) ප්‍රාථමික පරීක්ෂණයේදී ඕනෑම වේලාවක එවැනි විත්තිවාචකයක් ඉස්මතු කර දැක්විය හැක.

(c) අධිචෝදනා ඉදිරිපත් කිරීමෙන් පසුව නඩු විභාගය ආරම්භයට දින 14 කට පෙර ඕනෑම වේලාවක නීතිඥවරයාට එම විත්තිවාචකය දැන්විය හැක.

කෙසේ නමුත් පහත අවශ්‍යතාවය ඇත. ඒ අධිකරණයට චූදිත ඉහත කාලය තුළ අන්‍ය අස්ථානික භාවය පිළිබඳ විත්තිවාචකය අදාල කරුණු ඉදිරිපත් කිරීමට නොහැකි වූයේ ප්‍රමාණවත් කරුනු මත බවට පෙනී යන විට චූදිත ට පහත අවසරය හිමි වේ. එනම් අන්‍ය අස්ථානිකබාවය පිළිබඳ විත්තිවාචකය අයැද සිටීම චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව අවසන් වීමට පෙර බවය.

(2) පුද්ගලයන් අතරින් කෙනෙකු ඔහුගේ අන්‍ය අස්ථානික භාවය පිළිබඳව සහය පළ කිරීමට පහත සාක්ෂි අයැද සිටිය යුතුව ඇත. එනම් පළමු සත්‍යය ප්‍රකාශනයේදී එම සියලු තොරතුරු ඇතුළත් කළ යුතුය. ඒ එම පුද්ගලයා කියා සිටින වේලාව සහ ස්ථානය වන අතරම ඊට අදාල විස්තර වේ.

(3) මෙම වගන්තියේ අරමුණු වලට අන්‍ය ස්ථානික භාවය පිළිබඳව එයට සහය පළ කරන සාක්ෂිවල තේරුම පහත පරිදිය. එහිදී සාක්ෂි විය යුත්තේ විත්තිකරු නිශ්චිත ස්ථානයක හෝ නිශ්චිත වේලාවකදී නිශ්චිත ස්ථානයක ඔහු නොසිටිය බව හෝ වරද සිදුවූ බවට චෝදනා කරන ස්ථානයේ අපරාධය සිදුවූ වේලාවේදී (චෝදනා කරන ආකාරයට) නොසිටිය බවය.

නීතිඥවරයාට පැහැරහැරිය නොහැකි කරුණක් තිබේ. ඒ මෙම තත්ත්වය චූදිතට පැහැදිළි කිරීම සහ අන්‍ය ස්ථානිකත්වය විත්තිවාචකය අයැද සිටීමේදී නිශ්චිත අවශ්‍යතා සැලකිල්ලට ගැනීම වේ.

(5.5.9) පොදු අදහස හෝ සාමූහික අපරාධ කටයුත්තෙන් ඉවත් වීම.

පොදු අදහස (මෙය පොදු සැලසුම, සාමූහික කටයුත්ත හෝ සාමූහික අපරාධ කටයුත්ත සම්බන්ධයෙන් ද යෙදේ) පිළිබඳ සිද්ධාන්තය, පොදු නීති නෛතික සිද්ධාන්තයක් වේ. එමගින් අපරාධයක් පිළිබඳ එක් පුද්ගලයකුට වරද පැවරීමේදී සාමූහික අපරාධ කටයුත්තේදී දායක වූ සියලු දෙනාම එම සාමූහික කටයුත්තක් ඇතිව, සියලු ප්‍රතිඵල වලට වරද පැටවේ.

මෙම පොදු කටයුත්ත පහත නිදර්ශන මගින් පැහැදිළි කළ හැක. ඒ කැරැල්ලක දී පුද්ගලයකුට තුවාල විය. එයට සහභාගී වූ අය විසින් එය දැන සිටින ලදි. නැතිනම් ඒ පිළිබඳව නොසැලකිලිමත් විය. ඒ ඔවුන් අතරින් යමෙකු සතුව පිහියක් තිබුන බවත් එය භාවිතා කළ බවට සහ ඒ හැරුන විටදී අනෙකුත් සහභාගී වූ පුද්ගලයන් සතුව පිහි නොතිබූ බවත්ය. මෙය පහත ආකාරයට තවත් උදාහරණයක් මගින් පැහැදිළි කළ හැක. කණ්ඩායමක් ආරවුලකට හෝ අපරාධයක් සිදුකිරීමෙහිලා පැමිණ ඇත. එම සහභාගී වූ අය තම කණ්ඩායමේ කෙනෙකු සතුව ආයුධයක් තිබීම දැන සිටියා හෝ දැන නොසිටියා විය හැක. ආයුධයක් ඇති බව දන්න පුද්ගලයා පැහැදිළිව දැකිය යුත්තේ එය පාවිච්චි කිරීම සහ අනෙකුත් සහභාගී වූ පුද්ගලයන් ඊට උපදෙස් නොදීම සහ එය දමා යාමට ඔවුන් උපදෙස් නොදීම යන කරුණුය. මෙයින් තේරුම් යන්නේ ඔවුන්ගේ කැමැත්ත මත එහි සීමාව මත එය භාවිතයට ගැනීම සිදු වූ බවය. කෙසේ නමුත් යම් පුද්ගලයකු ආයුධය ගැන නොදැන සිටි විට එය හොඳින් සලකා බලා පොදු චේතනාවෙන් (අරමුණින්) ඉවත් වීමක් සහ මෙය පොදු කටයුත්ත (සූදානම) බිඳ දැමීමක් වේ.

මෙම පොදු අරමුණ (චේතනාව) ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය පිළිගෙන, නීතිගත කර ඇත. එය ශ්‍රී ලංකාවේ අපරාධ නීතියේ ඇත. එය 32 වන සහ 33 වන වගන්තිය මගින් නිශ්චය කර තිබේ.

32 වන වගන්තිය සියල්ලන්ගේ පොදු අදහස ඉෂ්ට කර ගැනීම වශයෙන් කීප දෙනෙකු විසින් අපරාධයක් කළ කල්හි තමා විසින් එය තනිවම කරන ලද්දක් සේ එකී තැනැත්තාගේ එක් එක්කෙනා ම එම ක්‍රියාව සඳහා යටත් විය යුතුය.

33 වන වගන්තිය සාපරාධී දැනුමක් හෝ අදහසක් ඇතිව කළ නිසාම පමණක් සාපරාධී වූ යම් ක්‍රියාවක්, කීප දෙනෙකු විසින් කරනු ලැබූ අවස්ථාවකදී එබඳු දැනුමක් හෝ අදහසක් ඇතිව එකී ක්‍රියාවට සම්බන්ධ වන එක් එක් තැනැත්තෙකුට එබඳු දැනුමක් හෝ අදහසක් ඇතිව ඔහු විසින් තනියම ඒ ක්‍රියාව කරනු ලැබූ ලෙස ඒ ක්‍රියාව ගැන යටත් විය යුතුය.

චූදිතට චෝදනා ගොනු කර ඇති විට සහ  චෝදනාව මෙහෙයවන නීතිඥවරයා පොදු අදහසින් සිදුකළ බවට චෝදනා ගෙන එන විට කන්ඩායම අයැද සිටිය හැකි විත්තිවාචකය වන්නේ ඉවත්වීම යන්නය.

තවද චූදිත පෙන්නුම් කළ යුතු කරුණක් ඇත. ඒ ඔහු/ඇය තමන් ක්‍රියාකාරී ලෙස ප්‍රශ්නගතවූ පොදු අපරාධ කටයුත්තක් (පොදු අරමුණින්) සමාගමයෙන් ඉවත්වූ බවය.

තවද සටහන් කළ යුතු වැදගත් දෙයක් තිබේ. ඒ අපරාධය සිදුකිරීමෙන් පසුව ඇතිවන පසුතැවිල්ල කෙතරම් අවංකව වුවද චෝදනා නැගෙන පොදු අදහස සම්බන්ධයෙන් ඉවත් වීම පිළිබඳ විත්තිවාචකය ගෙන ඒමට ප්‍රමාණවත් නැත. කණ්ඩායමක් තුළ සිටින ක්‍රියාකාරී සාමාජිකයකු පොදු අදහසක් ඇතිව සිටින විට වගකීමෙන් බේරීමට නම් අනෙක් අය අපරාධය සිදුකිරීමට යාමට මත්තෙන් එයින් ඉවත් විය යුතුය. කෙසේ නමුත් යම් ක්‍රියාවක් සිදු නොකර ඇතිවන හුදු පසුතැවිල්ල එම අයගෙන් ඉවත්වුවද නඩු පැවරීමට සහ දඬුවමට වගකීමට සිදුවේ.

මෙම ඉවත්වන පාර්ශවය වඩා ඵලදයී ලෙස අනෙක් අයගෙන්ද සිදුවූ දේ සම්බන්ධයෙන් විශ්වසනීය ලෙස ඉවත් කර යැවීමට ද කටයුතු කළ යුතුව ඇත. දෙවන පාර්ශවයක් සිදුකරන ඉවත්වීම පිළිබඳ සන්නිවේදනයේදී අපරාධකරු ඉතා පැහැදිළි සටහනකට අනුව කටයුතු කළ යුතුව ඇත. ඒ පොදු අදහසට සම්බන්ධ අනෙක් පාර්ශවය එය දිගටම කරගෙන යන විට ඔහු එය සිදුකරන්නේ ඉවත්වූ පාර්ශවයේ වැඩි දුරටත් ආධාර සහ සහය ඇතිව ඉවත්වන බැවිනි.

- අපරාධ සහයකයකුට අපරාධය සිදුකිරීමේ මූලධර්මය පිළිබඳව, උපදෙස් දීම සහ උනන්දු කිරීම සිදුකරන විට ඔහු අනිවාර්යයෙන් අවම වශයෙන් අනෙක් පාර්ශව වලට තම ඉවත්වීම සන්නිවේදනය කළ යුතුය; සහ
- අපරාධ සහයකයා අපරාධය සිදුකිරීමේ තේරුමට අනුව මූලධර්මය සපයා දෙන විට අපරාධ සහයකයා මධ්‍යස්ථ වීම හෝ අවම වශයෙන් මධ්‍යස්ථභාවය පිළිබඳ සියලු සාධාරණ පියවර ගැනීම සහ ඔහු ලබාදුන් සහයෝගය ගැන හෝ;
- වඩා බරපතල නඩුවලදී ඵලදයී ඉවත්වීම වන්නේ ශාරීරිකව මැදිහත්වීම හෝ පොලීසිය කැඳවීම වේ.

මෙහිදී තවත් කරුණක් ඇත. ඒ සහභාගී වන්නන්ගෙන් එක් අයෙකු පොදු අදහසින් ඉවත්වීම වේ. එය බලය නොමැතිව හෝ ගිවිසගත් ආකාරයට විය හැක. එහිදී සම සහභාගී වන අය ප්‍රතිඵල වලට වගකිව යුතු වේ.

<u>(5.5.10) මුලාවීම (උගුලකට හසුවීම)</u>

<u>(5.5.10.1)</u> <u>සාමාන්‍යය</u>

අපරාධ නීතියේදී මුලාවීම යන්න භාවිතයකි. එහිදී නීතිය ක්‍රියාත්මක කරන නියෝජිතයා යම් පුද්ගලයකුට අපරාධය වරදක් කිරීමට පොළඹවයි. අනෙක් අතට එම පුද්ගලයා එය ඉටු කිරීමෙහිලා කැමැත්තක් හෝ ඕනෑකමක් නැත. මූලික වීම පහත ආකාරයට සිද්ධ වේ. ඒ වරදක් සිදු කිරීමෙහිලා අවශ්‍යතාවක් පවතින විට සාක්ෂි සනාථ කිරීමෙ නිශ්චිත අරමුණකින් යුතුව සහ දඬුවම සඳහා නිර්මාණය කිරීමේදී ය. එය අවශ්‍යයෙන්ම රැවටීම සමග සම්බන්ධ වේ. සමහර විට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට උගුල අටවනු ලැබේ. එය මතුපිටින් පෙනෙන ආකාරයට නීති විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වේ.

උගුලට හසු කිරීම අපරාධ චෝදනාවලට නිරතුරුවම විත්තිවාචකයක් වේ. එයට පදනම වන්නේ පොලිස් නිලධාරීන් සහ චෝදනා නැගෙන අපරාධයට පූර්වයෙන් හෝ (ඒ අතර තුරේ) විත්තිය අතර පවතින ගනුදෙනුවකි. උගුලට හසු කිරීමේ පහත ආකාරයට ඉස්මතු වේ. ඒ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් බලය යොදන්නේ ද යම් අයෙකු අපරාධයක් සිදු කිරීමෙහිලා පෙළඹවීම යොදගන්නා උපක්‍රම දරාගත නොහැකි බැවිනි. අපරාධ නීතියේ එන මුලා කිරීම පිළිබඳ අරමුණු වලදී පවතින භාවිතයක් ඇත. ඒ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියා පුද්ගලයකු අපරාධ වරදක්

කිරීමට පොළඹවන අතරම අනෙක් අතට එම පුද්ගලයා එය සිදුකිරීමට කැමැත්තක් හෝ උත්සාහයක් නොගනී.

මෙම කරුණු හේතුවෙන් අපරාධය සිදු නොකරන පුද්ගලයන්, අසාධාරණ ලෙස එය සිදු කිරීමට පොළඹවීමක් සිදුවිය හැකි අතර තාක්ෂණය අනිසි ලෙස භාවිතා කිරීමක්ද සිදුවිය හැක.

(5.5.10.2) අරමුණට එරෙහිව විෂයගත ඇගයීම.

විවිධ අධිකරණ ක්‍රියාදාමයන් අරමුණුගත හෝ විෂයගත පරීක්ෂණයක් යොදගනු ලැබේ. ඒ පහත කරුණු නිශ්චය කිරීම උදෙසාය. ඒ අනුව මුලා කිරීම සිදුවූවා ද සහ/හෝ එවැනි මුලා කිරීමකින් ලබාගත් සාක්ෂි, චූදිතට එරෙහිව සාක්ෂි විභාගයේදී යොදා ගත්තා ද යන්න පිළිබඳවය.

- අරමුණුගත තත්ත්වයන්: අරමුණුගත තත්ත්වයන් යටතේ විත්තිකරුද චූදිත මුලාකිරීම පිළිබඳ සාක්ෂි ජූරියට හෝ චෝදනාව මෙහෙයවන නිලධාරියකුට ලබාදෙන අවස්ථාවක් සලකා බැලීමේදී ඔවුන් පහත ආකාරයට විනිශ්චය කරනු ලැබේ. ඒ නීති නිලධාරියාගේ ක්‍රියාවන් මගින් සාමාන්‍ය නීතියට ගරු කරන පුද්ගලයෙක් අපරාධයක් සිදු කිරීමෙහිලා පොලඹවා ගත්තේ ද යන්නය.

ජෝට චෝදනා එල්ල විය. එනම් ඔහු ඖෂධ ශාලාවක වීදි කොල්ලකරුවන් පිරිසක් විසින් මංකොල්ල කන ආකාරය බලා සිටීම ගැනය.

→ ජෝ ගේ යාලුවා ස්නිම් වේ. ඔහු Undercover පොලිස් නිලධාරියෙකි. ජෝ කියන්නේ ඔහු මොවුන් මුලා කළ බවයි. ඒ තමාට මංකොල්ලයට සහභාගී වීමට හෝ මැර කණ්ඩායමට දායක වීමය.

↓

මුලා කිරීම පිළිබඳ අරමුණුගත පරීක්ෂණයක් සිදුවන තත්ත්වයකදී ජූරිය තීරණය කළ යුතු කිරීම වන්නේ ස්නිම්ගේ ක්‍රියාවන් නීතිගරුක පුරවැසියකු මංකොල්ලයකට සහභාගී වීමට පෙළඹුවා ද යන්නය.

→ මුලා කිරීම පිළිබඳ විෂයගත පරීක්ෂණයකදී නඩු පවරන්නාට මෙසේ අපරාධයක් සිදු කිරීම පිලිබඳ මීට පෙර දඬුවම් පමුණුවා තිබුණාද ඔහු වීදි මංකොල්ලයට සහභාගී වීමට කැමැත්ත තිබුණාද යන්න පිළිබඳවය.

↓

මෙම නඩුවේදී ජූරිය තීරණය කළ යුත්තේ සලකා බැලිය යුත්තේ ජෝ මංකොල්ලයට සහභාගී වීම ඔහුගේ කැමැත්තට අනුව මිස ස්නිම්ගේ ක්‍රියාදාමයක් අනුව නොවුන බවය.

↓

අරමුණුගත සහ විෂයානුබද්ධ තොරතුරු අනුව යන දෙයාකාරයටම අනුව වැදගත් වන්නේ මුලා කිරීම විත්තිවාචකයක් ලෙස ලබා දෙන්නේ ද යන්නය.

(5.5.10.3) මුලා කිරීම පිළිබඳ සෙසු උදාහරණ.

උදාහරණ 01; ජෝයි ට ඔත්තු බලන පොලිස් නිලධාරියකුට නීති විරෝධී මත්ද්‍රව්‍යය විකුණූ බවට චෝදනාව එල්ල විය. ඇය විසින් ඇය උත්සවයකදී අදාල නිලධාරියාට මත්ද්‍රව්‍ය සමහරක් විකිණීම සිදුකර තිබිණි. ඇය ප්‍රකාශ කළේ මත්ද්‍රව්‍ය ඇගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා තිබූ ඒවා බවත් නිලධාරියා ඔහුගේ පියා පිළිකාවකින් දැඩි ලෙස වේදනාවට පත්ව ඇති බැවින් ඔහුට දීම සඳහා ඉල්ලූ බැවින් ලබාදුන් බවත්ය. මෙම නිලධාරියා ඇයට සහතික කර ප්‍රකාශ කොට ඇත්තේ ඔහු පොලිස් නිලධාරියකු නොවන බවයි.

මෙම උදාහරණයේ අදාල පොලිස් නිලධාරීයාගේ ක්‍රියාකාරකම් මුලා කිරීමක් දක්වා නොයන බවය. මෙම නිලධාරියා නීතිය කඩ කිරීමේ අවස්ථාවකින් බේරීමට බේරීමට කටයුතු කර තිබේ. නමුත් නිලධාරියා අන්තයට යන හෝ දරාගත නොහැකි හැසිරීමක යෙදී නැත.

උදාහරණ 02; ඇයට අධිචෝදනා නැගිණි. ඒ ඇය රහස් පොලිස් නිලධාරියකුට මත්ද්‍රව්‍යය විකිනීම සම්බන්ධයෙනි. ඇය සාක්ෂි දුන්නේ ඒවා ඇගේ ප්‍රයෝජනය සඳහා බවයි. මෙම රහස් පොලිස් නිලධාරියා අඛණ්ඩව සති තුනකට වඩා කාලයක් ඇගේ නිවසේ ඇයව නතර කරමින් ඇගෙන් මත්ද්‍රව්‍යය ඉල්ලා ආයාචනා කළාය. ඒ මුදලටය. ඔහු කීවේ ඔහුගේ පියාට හොඳටම අසනීප බවය. තවද ඔහුගේ වේදනාව සමනයට මත්ද්‍රව්‍ය අවශ්‍ය වී තිබෙන බවත් ය. තවද ඇය පවසන්නේ ඇය දිගටම මේ තත්ත්වය ප්‍රතික්ෂේප කළා යන්නය.

නිලධාරියා ඇයට කීවේ මෙම මත්ද්‍රව්‍යය පියාගේ වේදනාව සමනය කර ඔහුට පහසුවක් ගෙන දෙන බැවින් මත්ද්‍රව්‍ය තමාට විකුණන ලෙසයි.

මෙයින් පසුව වහාම ඇයව අත්අඩංගුවට ගැනින. මෙම රහස් පොලිස් නිලධාරියාගේ අඛණ්ඩ වෑයම සහ අසත්‍ය කරුණු මුලා කිරීම අන්තයටම සිදු වූ බව ප්‍රමානවත් කරුණක් විය. මෙහි ප්‍රතිඵලය වූයේ නඩු තීන්දුවේදී වරදකරු නොවීමය.

(5.5.10.4) මුලා කිරීම පිළිබඳ ඉංග්‍රීසි නීතිය.

ඉංග්‍රීසි නීතියේ මෙසේ සඳහන්ව ඇත. ඒ දණ්ඩනය ඉතා පැහැදිලි ලෙස කිරීමේදී මුලා කිරීම පිළිබඳ විත්තිවාචකයක් නොමැති බවය. (බලන්න RV Sang (1980) AC 402) කෙසේ නමුත් සලකා බැලිය යුතු කරුණක් වන්නේ රජයේ ආයතන ක්‍රියාදාමයේ අපචාරයන් යොදා ගනිමින් පුරවැසියන් නීති විරෝධී ක්‍රියා සිදුකිරීමට පෙළඹවීම සහ එසේ කිරීමෙහිලා ඔවුන්ට නඩු පැවරීම වේ. රජය මෙවැනි ආකාරයේ මුලා කිරීම් නිර්මාණය කරයි. සැමවිටම එහි ප්‍රතිඵලය වන්නේ නීති කෘත්‍යය නතර කිරීම වේ.

මුලා කිරීම පිළිබඳ ප්‍රකට ඉංග්‍රීසි නඩුවක් වන්නේ ආර්. එරෙහිව ලූස්ලි (2001) UKHL 53 යන්නය. මෙම නඩුව පහත කරුණු සම්බන්ධයෙන් හොඳ ඒත්තු ගැනීමක් වේ. එනම් රහස් පොලිස් නිලධාරීන් පරීක්ෂණ මෙහෙයුම් වලදී ක්‍රියාත්මක කරන ආකාරයෙන්ය. මෙම නඩුව ප්‍රයෝජනවත් මිනුම් දණ්ඩක් ද සපයනු ලැබේ. ඒ පොලීසියේ හැසිරීම අපරාධය සිදු කිරීමට පෙළඹුවාද නැතිනම් උනන්දු කරාද යන්නය. මෙම ප්‍රශ්නයට සුදුසු පිළිතුරක් ද ඇත. ඒ පොලීසිය විත්තිය වෙනුවෙන් පෙනී සිටීමට වඩා වැඩිමනත් දෙයක් එනම් අපරාධයක් සිදුකිරීමෙහිලා අසමාන්‍යය අවස්ථාවකදී වැඩිමනත් දෙයක් කරාද යන්නය.

වරද සිදුකිරීමෙහිලා පොලීසියේ හැසිරීම අනෙක් අය බලාපොරොත්තු වන අවස්ථාවක් යටතේ සිදු වූ විට එය මුලා කිරීමක් නොවේ. කෙසේ නමුත් රජය අදාල ක්‍රියාදාමය අනිසි ලෙස සිදු කළහොත් එය මෙය ඉතා හොඳින් ස්ථාපිත කරනු ඇත.

(5.5.11) අධිකරණමය සමාව.

අධිකරණයක නඩු තීන්දුවක හෝ ආඥාවක ප්‍රකාර වූ, නැතහොත් එබඳු අධිකරණයක නඩු තීන්දුවකින් හෝ ආඥාවකින් බලය දෙනු ලැබූ, ක්‍රියාවක් ඒ නඩු තීන්දුව හෝ ආඥාව බලපවත්වන කාලය තුළ ඒ නඩු තීන්දුව හෝ ආඥාව දීමට එම අධිකරණයට එබඳු අධිකරණ බලයක් ඇතැයි යනු සද්භාවයෙන් විශ්වාස කරන්නේ නම් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය 71 වන වගන්තිය)

(5.5.12) නීතිය පිළිබඳ වරද.

නීතියේ හේතු යුක්තියක් ඇත්තකු විසින් හෝ නීතිය නොදැනීමකින් නොව, සිද්ධිය නොදැනීමකින් යම් ක්‍රියාවක් කිරීමට නීතියේ බලය ඇතැයි යනු සද්භාවයෙන් විශ්වාස කරන්නකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය 72 වන වගන්තිය)

(5.5.13) අපරාධ කිරීමේ හැකියාව නැති.

වයස අවුරුදු අටකට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය 75 වන වගන්තිය) යම් අවස්ථාවකදී තමාගේ හැසිරීමේ ස්වභාවය හා එහි ප්‍රතිඵලය නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොලත්, වයස අවුරුදු අටකට වැඩි අවුරුද 12 ට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය, 76 වන වගන්තිය)

(5.5.14) උන්මත්තකභාවය.

ක්‍රියාව කරන වේලාවෙහි එම ක්‍රියාවෙහි ස්වභාවය හෝ තමා වැරදි දෙයක් හෝ නීතියට පටහැනි ක්‍රියාවක් කරන බව සිහිවිකලත්වය නිසා දැන ගැනීමට පුළුවන් කමක් නැති තැනැත්තෙකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. (දණ්ඩ නීති සංග්‍රහය 77 වන වගන්තිය)

විත්තිවාචකයක් ලෙස උන්මත්තකභාවය පිළිබඳව ආයාචනය කරන විට සහ ඉස්මතු කරන විට පහතින් දක්වන කරුණු තීරණාත්මක වේ.

- අදාල ක්‍රියාව සිදුකළ වේලාව.
- චූදිතගේ මානසික රෝගී තත්ත්වය
- ඔහු තමා කළ ක්‍රියාව පිළිබඳ දැන නොසිටීම සහ අවබෝධයක් නොමැතිකම සහ
- එය නීතිය පිළිබඳ වරදක් හෝ ගැටීමක් වේ.

(6) අධිකරණ බලය.

(6.1) මහේස්ත්‍රාත් අධිකරණ.

ශ්‍රී ලංකාවේ මහෙස්ත්‍රාත් අධිකරණ වලට ලඝු අපරාධ අධිකරණ බලය ඇත. මෙය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 9 වන වගන්තියේ පහත ආකාරයට සඳහන්ව තිබේ.

9. මේ සංග්‍රහයේ විධි විධානවලට යටත්ව සහ අනුකූලව සෑම මහේස්ත්‍රාත් අධිකරණයකටම,

(අ) ස්වකීය ප්‍රාදේශීය අධිකරණ බලසීමාව තුළ සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් සිදුකර පැවතියා වූද මේ සංග්‍රහය මගින් හෝ බලපවත්නා වෙනත් යම් නීතියක් මගින් හෝ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් හෝ දිසා අදිකරණයක් විසින් හෝ විභාග කළ යුතු බවට පත්කර අත්තා වූද වැරදි පිළිබදව වූ සියලු කාරණා හෝ අපරාධ නඩු ලඝු ආකාරයෙන් විභාග කිරීමට, තීරණය කිරීම සහ එසේ කිරීමට මෙයින් නියම කරනු ලැබේ.

(අ)

(i) ස්වකීය ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් සිදුකර ඇත්තාවූ හෝ සිදුකර ඇතැයි කියනු ලබන්නාවූ හෝ සියලු වැරදි විභාග කිරීමට හෝ යම් වැරදි සම්බන්ධයෙන් මේ සංග්‍රහය යටතේ ඒ අධිකරණයට

අධිකරණ බලය ඇත්තේ ද ඒ වැරදි ආශ්‍රිත සියලු සාක්ෂිකරුවන් සහ වරදකරුවන් අල්ලා ගැනීමට වරෙන්තු සහ වෙනත් අධිකරණ විධාන නිකුත් කිරීමට ද නීතිය අනුව ඔවුන්ට විරුද්ධව කටයුතු කිරීමට ද; සහ

(ii) සොරකම් කරන ලද බඩු හෝ යම් වරදක් සිදුකිරීමෙහිලා උපයෝගී කරගන්නා ලද නැතහොත් යම් වරදකට සම්බන්ධ බඩු, ද්‍රව්‍ය හෝ දේවල් තබාගෙන ඇතැයි කියනු ලබන සියලු ස්ථාන සෝදිසි කිරීම සඳහා නැතහොත් සෝදසි කිරීමට සැලැස්වීම සඳහා වරෙන්තු නිකුත් කිරීමට සහ සාමය සඳහා හෝ යහපත් පැවැත්ම සඳහා නීති ප්‍රකාර ඇප තබන ලෙස තැනැත්තන් ට නියම කිරීමට; තවද

(iii) යම් තැනැත්තකු යම් බන්ධනාගාරයක හෝ මානසික රෝහලක හෝ ලාදුරු රෝහලක හෝ මිය ගිය නැතහොත් දමරික ක්‍රියාවකින් හෝ හදිසි අනතුරකින් මිය ගිය නැතහොත් මිය යාම හදිසියේම සිදු වූ හෝ යම් තැනැත්තකුගේ මරණය සිදු වූයේ කෙසේ ද යන්න හෙළිදරව් නොවී ඒ තැනැත්තාගේ මළ සිරුර සොයාගනු ලැබූ හෝ සියලු අවස්ථා පිළිබඳව පරීක්ෂණයක් කිරීමට අධිකරණ බලය තිබිය යුතුය.

මහේස්ත්‍රාත් අධිකරණවල ලඝු අපරාධ අධිකරණ බලය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 10 වන වගන්තියට විෂය වේ.

10. යම් නීතියක විශේෂිතවම අන්‍යාකාර විධි විධාන සලසා ඇත්නම් මිස, දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන්, ඒ වරද නියමිත දිනයට පෙර හෝ පසුව හෝ සිදුකරනු ලැබුවේ වූව ද මේ සංග්‍රහයේ වෙනත් විධි විධානවලට යටත්ව,

(අ) මහාධිකරණය විසින් හෝ

(ආ) පළමු වන උපලේඛනයේ අටවන ඡේදයෙහි ඒ වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබීය හැකි බව දන්වා ඇති අවස්ථාවක මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය හැකිය.,

(6.2) <u>මහාධිකරණ</u>.

සිවිල් සහ අපරාධ නඩු පිළිබඳ ඉහළ උසාවිය මහාධිකරණයයි. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 12 වන වගන්තියේ මෙසේ සඳහන් වේ.

12. මහාධිකරණය ඉදිරියේ නඩු විභාග කරනු ලැබීම සඳහා, චූදිත තැනැත්තාට විරුද්ධව නීතිපතිවරයා විසින් හෝ නීතිපතිවරයාගේ මෙහෙයවීමෙන් අධි චෝදනා කර ඇත්නම් මිස, මේ සංග්‍රහයේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධාන වලට යටත්ව, මහාධිකරණය විසින් යම් වරදක් සංගණනය නොකළ යුතුය.

ශ්‍රී ලංකාවේ මහාධිකරණ වලට පහත අධිකරණ බලය ඇති බව අධිකරණ සංවිධාන පනතේ 9 වන වගන්තියේ සඳහන්ව ඇත;

(1) මහාධිකරණයට යම් පුද්ගලයකුට විරද්ධව අධිචෝදනා ගොනු කර ඇති සියලුම නඩු විභාග වලට අදාළ ලිඛිත නීතියේ පහත දේ සඳන්ව ඇත. ඒ නඩු දැමීමට, විභාග කිරීමට සහ තීරණය කිරීමට මහාධිකරණයට බලය හා අධිකාරිය ඇති බව.

(අ) තවද ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණයෙන් හෝ කොටසක් සිදුකරන ඕනෑම වරදක්;

(ආ) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය මත හෝ ඊට ඉහළින් ඕනෑම පුද්ගලයකු සිදුකරන ඕනෑම වරදක්;

(ඇ) ජාතික නීතිය තිරීණය කර ඇති ඉහළ ගුවන් සීමාවේ ඕනෑම පුද්ගලයකු සිදුකරන ඕනෑම වරදක්;

(ඈ) ජාතික නීතිය තීරණය කර ඇති ඉහළ මුහුදු සීමාවේ ඕනෑම පුද්ගලයකු සිදුකරන ඕනෑම වරදක්;

(ඉ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඕනෑම ආකාරයක ඕනෑම නැවක හෝ ඕනෑම ගුවන් යානයක එයට සම්බන්ධ ඕනෑම පුද්ගලයකු සිදුකරන්නා වූ ඕනෑම වරදක්; හෝ

(2) මහාධිකරණයේ අධිකරණ බලය අනෙකුත් ඕනෑම නීතියක ප්‍රතිපාදන වලට විෂය වේ;

(අ) පළවන උප වගන්තියේ (අ) ඡේදය අනුව ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණ හෝ කොටසක් ලෙස සිදුකරන වරදක් සම්බන්ධයෙන් වූ විට, එම වරද සම්පූර්ණයෙන් හෝ කොටසක් සිදුවූ අධිකරණ කලාපය තුළ මහාධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් කටයුතු කරනු ලැබේ;

(ආ) අගවිනිසුරුවරයා විසින් කරන ලද ලිඛිත නියෝගයක් මගින් යුක්තිය පසිදලීමට සුදුසු යැයි ඔහු නම් කළ මහාධිකරණයකදී  ආ සිට ඊ දක්වා ඡේද වලට අදළ ඕනෑම ස්ථානයකට අදළ ඕනෑම වරදක් අසා ඒවා තීරණය කරනු ඇත.

(ඇ) ඡේදයේ සදහන්ව ඇති ඕනෑම වරදක් ඔහු විසින් ඇසීමට හෝ තීරණයක් දීමට නියම කළ හැක. එය මහාධිකරණය නඩු අසන සහ තීරණය කරන අධිකරණ කලාපයක් තුළ සාමාන්‍යයෙන් සිදුවේ.

මහාධිකරණයේ සියලු නඩු ජූරියක් නොමැති විනිසුරුවරයකු ඉදිරිපිට ඇසේ. (අධිකරණ සංවිධාන පනත, 11 වන වගන්තිය)

අධිකරණ සංවිධාන පනතේ 11 (2) වන වගන්තිය, පහත ලෙස තීරණය කර ඇත. ඒ ජූරිය සහිතව මහාධිකරණය විභාග කරන නඩු මහාධිකරණ විනිසුරුවරයකු ඉදිරියේ විභාග වන විට;

(අ) දෙවන උප වගන්තියේ ඇති ආකාරයට අවම වශයෙන් එක් චෝදනාවක් වත් එවැනි වරදක් විය යුතු අතරම;

(ආ) චූදිත විසින් නඩු විභාග කිරීමට ජූරිය තෝරා ගැනේ;

10. යම් නීතියක විශේෂිතවම අන්‍යාකාර විධි විධාන සලසා ඇත්නම් මිස දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන්, ඒ වරද නියමිත අදහසට පෙර හෝ පසුව හෝ සිදුකරනු ලැබුවා වූද යයි සංග්‍රහයේ වෙනත් විධි විධානවලට යටත්ව,

(අ) මහාධිකරණය විසින් හෝ

(ආ) පළමුවන උපලේඛනයේ අටවන තීරයෙහි ඒ වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබීය හැකි බව දක්වා ඇති අවස්ථාවක මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් හෝ නඩු විභාග කරනු ලැබිය හැකිය.

(6.3) අභියාචනාධිකරණය

මහාධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණ වල සියලු අභියාචන විභාග කරනු ලබන්නේ අභියාචනාධිකරණය විසිනි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ අනෙකුත් නීතියක ඇති ප්‍රතිපාදන වලට විෂය වෙමින් එයට පහත සඳහන් අධිකරණ බලතල ඇත.

- අභියාචනාධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී කවර හෝ ආඥාවක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ දණ්ඩන නියමයක් නීතිය අනුව ස්ථිර කිරීම, ආපසු කැඳවීම, නිවැරදි කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම 139 (1) වන වගන්තිය.

- මුල් අවස්ථා අධිකරණය විසින් හෝ ඇති සාක්ෂිවලට අමතරව හෝ පරිපූරකව යුක්ති ධර්මය අනුව අවශ්‍ය විය හැකි නමුත් සාක්ෂි භාර ගැනීම සහ පිළිගැනීම. (139 (2) වන වගන්තිය)
- හෙබයාස් කෝපුස් රිට් ආඥා හැර වෙනත් රිට් ආඥා නිකුත් කිරීමේ බලය (140 වන වගන්තිය)
- සිරකරුවන් ගෙන්වා ගැනීමේ සහ ඉවත් කිරීමේ බලය. (142 වන වගන්තිය)
- ඉන්ජන්ෂන් තහනම් නිකුත් කිරීමේ බලය. (143 වන වගන්තිය)
- ඕනෑම මුල් අවස්ථා අධිකරණයක වාර්තා ගෙන්වා ගැනීම, සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම. (145 වන වගන්තිය)

(6.4) ශ්‍රේෂ්ඨාධිකරණය.

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය 1972 දී පිහිටවනු ලැබිනි. ඒ අළුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමෙන් පසුවය. එය ඉහළම උසාවිය මෙන්ම වාර්තා කිරීමේ අවසාන උසාවිය ද වන අතරම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට විෂය වෙමින් බලතල ක්‍රියාත්මක කරනු ලැබේ. සියළුම පහළ අධිකරණ එහි තීරණයට යටත් වේ. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය පොදු නීතියේ සහ සිවිල් නීතියේ මිශ්‍රනයක් බැවින් සංකීර්ණව පවතී. උදහරණයකට මරණ දඬුවම නියම කරන තීන්දු ගනිමු.

ඒ පිළිබඳව එනම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව තීරණය ගන්නේ ජනරජයේ ජනාධිපතිවරයා විසිනි.

පහත නිශ්චිත කරුණු ආවරණය කිරීමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලතල මගින් සිදුවේ.

- ව්‍යවස්ථාපිත කරුණු
- මූලික අයිතිවාසිකම්
- අවසාන අභියාචන අධිකරණ බලය, අපරාධය සහ සිවිල් කරුණු වල
- උපදේශාත්මක අධිකරණ බලය
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ)
- පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම්;
- පාර්ලිමේන්තුවේ නීතිය මගින් පනවන අනෙකුත් කරුණු ;
- නීතිඥවරුන් පත් කිරීම, කටයුතු කිරීම, තහනම් කිරීම සහ ඉවත් කිරීම.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 වන වගන්තිය පහත සඳහන් ලෙස තීරණය කර ඇත.

අග්‍රවිනිශ්චයකාරවරයා අන්‍යාකාර විධාන කළහොත් මිස, ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙන් වෙන් අධිකරණ බලය සාමාන්‍යයෙන් කොළඹදී ක්‍රියාත්මක කළ යුත්තේ ය. ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය වෙන් වෙන් නඩු විභාග කරන ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාගෙන් කිහිප දෙනෙකු විසින් එකම අවස්ථාවේ දී විවිධ කාරනා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැක්කේ ය.

එසේ වුවද සියලු අවස්ථාවලදී එහි අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට යටත්ව, ශ්‍රේෂ්ඨාධිකරණය වශයෙන් එක් රැස්ව සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කළ යුත්තේය.

අග්‍ර විනිශ්චයකාරවරයා විසින් සිය මෙහෙයවීමෙන් හෝ යම් කාරණයක් විභාග කරන විනිශ්චයකරුවන්ගෙන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට හෝ යම් අභියාචනයක් නඩු කටයුත්තක් හෝ කාරණයක් හා සම්බන්ධ ප්‍රශ්නය අග්‍රවිනිශ්චයකාරවරයා ගේ මතය අනුව ජනතාව සම්බන්ධයෙන් වැදගත් වන හා පොදු වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් වේ නම් ඒ අභියාචනයේ නඩු කටයුත්තේ හෝ කාරණයේ පාර්ශවකරුවකුගේ ඉල්ලීම පිට හෝ;

ඒ අභියාචනය නඩු කටයුත්ත හෝ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගෙන් පස් දෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක හෝ සමන්විත විනිශ්චය පීඨයක් විසින් කළ යුතු යයි විධාන කළ හැක්කේය.

මහාධිකරණයේ පැවැත්වෙන ත්‍රිපුද්ගල නඩුවල අභියාචන විභාග කරනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු පස් දෙනෙකු හෝ ඊට වැඩි විනිසුරුවරුන් ගණනක් විසිනි.

(6.3) වෙනත් නීති යටතේ කරනු ලබන වැරදි පිළිබඳව ඇති අධිකරණ බලය.

මෙය සිදුකරනු ලබන්නේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 11 වන වගන්තිය මගිනි. එහි පහත ආකාරයට තීරණය කර ඇත.

11. යම් නීතියක විශේෂිතවම ආඥා කර විධි විධාන සලසා ඇත්නම් මිස දණ්ඩ නීති සංග්‍රහය නොවන වෙනත් යම් නීතියක් යටතේ වූ වරදක්, ඒ වරද නියමිත දිනයට පෙර හෝ පසුව හෝ සිදුකරනු ලැබුවේ වුවද.

(අ) ඒ වරද සම්බන්ධයෙන් ඒ නීතිපති යම් අධිකරණයක් සඳහන් කරනු ලැබ ඇති අවස්ථාවක

- (i) සඳහන් කරනු ලැබූ අධිකරණය මහාධිකරණය වන විට මහාධිකරණය විසින් ද නැතහොත් අවුරුදු දෙකක් ඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකින්හෝ රුපියල් එක් දහස් පන්සියයක් ඉක්මවන දඩයක් හෝ දඬුවම් කරනු ලැබ හැකි වරදක් සම්බන්ධයෙන් වන විට සදහන් කරනු ලැබූ අධිකරණය දිසා අධිකරණයක් වන අවස්ථාවක ඒ අධිකරණය විසින්ද,
- (ii) සදහන් කරනු ලැබූ අධිකරණය මහේස්ත්‍රාත් අධිකරණය වන විට මහේස්ත්‍රාත් අධිකරණයක් විසින්ද නැතහොත් අවුරුදු දෙකක් නොඉක්ම වන දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් වන විට සඳහන් කරනු ලැබූ අධිකරණය දිසා අධිකරණය වන අවස්ථාවක ඒ අධිකරණය විසින් ද නඩු විභාග කරනු ලැබිය හැකිය.

(ආ) ඒ වරද සම්බන්ධයෙන් යම් අධිකරණයක් සඳහන් කර නොමැති අවස්ථාවක

- (i) මහාධිකරණය විසින් හෝ;
- (ii) අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් වන විට මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය යුතුය;

(7) විමර්ශන අවස්ථාව.

(7.1) චෝදනාව.

තමා චූදිතව නියෝජනය කරන නඩුව පිළිබඳව නීති වෘත්තිකයා චෝදනාව මෙහෙයවන නීතිඥවරයාව දැනුවත් කළ යුතුය. එහිදී ඔහු සාමාන්‍යයෙන් පහත සඳහන් දේ වෘත්තිකයාට ලබාදෙයි. ඒ චෝදනාවේ පිටපතක් සහ චූදිත දන්වන තුරු නැවත සහ ප්‍රවේශම් කළ ප්‍රකාශ වේ. මෙය සිදුනොවුනහොත් නීති වෘත්තිකයා මෙම ලියකියවිලි තමාට ලැබීමට සලස්වන ලෙස ඉල්ලීමක් කළ යුතුය.

පළමු කටයුත්ත විය යුත්තේ චූදිතට එරෙහි නඩුව කුමක්දැයි අවබෝධ කර ගැනීම වේ. චෝදනාව ඉතා තියුනු ලෙස පරීක්ෂා කිරීම කළ යුතුය. එනම් එයට නීතිමය වශයෙන් කෙතරම් දක්ෂතාවයක් හිමිවේද සහ නිසි විත්තිවාචකයක් නොමැතිව ඒ සඳහා ප්‍රමාණවත් තොරතුරු ලැබ ඇති ද යන්නය. චෝදනාව ට රජය පවරන නඩුවේ විස්තර ඇතුළත් විය යුතුය. චූදිතට චෝදනාවේ ස්වභාවය දැනුම් දීමට එය සාධාරණ ලෙස වන අතර එය පහත ආකාරයට සිදුවිය යුතුව ඇත.

1. වරද සිදුවූ බවට චෝදනා කරන වේලාව සහ එය සිදුවූ ස්ථානය ද,

2. එයට යම් පුද්ගලයකු සම්බන්ධ නම් එය සිදුවූයේ කාට එරෙහිවද යන වග,

3. යම් දේපලක් ඇත්නම් එය සිදුවූයේ එයින් කුමකින්ද යන වග,

මේ සංග්‍රහය යටතේ වූ සෑම චෝදනාවක්ම, චූදිතයාට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබුවේද ඒ වරද ප්‍රකාශ විය යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 164 (1) වන වගන්තිය)

වරද නිර්ණය කෙරෙන නීතියේ ඒ වරදට යම් නිශ්චිත නාමයක් දී ඇතොත් චෝදනාවෙහි ඒ වරද, ඒ නාමයේ පමණක් විස්තර කළ හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 164 (2) වන වගන්තිය.)

වරද නිර්ණය කෙරෙන නීතියේ ඒ වරදට යම් නිශ්චිත නාමයක් දී නොමැති නම්, චූදිතයාට විරුද්ධව යම් කාරණයක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබුවේ ඒ කාරණය චූදිතයාට දැන්වීමට තරම් වූ වරද පිළිබඳ අර්ථකථනයක් ප්‍රකාශ විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 164 (3) වන වගන්තිය.)

කරන ලදැයි කියන වරදකට දඬුවම් කළ හැකි වන්නේ යම් නීතියක යම් වගන්තියක් යටතේ ද ඒ නීතිය සහ ඒ වගන්තිය චෝදනාවෙහි සඳහන් කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 165 (4) වන වගන්තිය.)

චෝදනාව නගනු ලැබීම, චෝදනා ඇති වරද සංයුක්ත වීමට නීතිය අනුව අවශ්‍ය වූ සෑම නෛතික කොන්දේසියක්ම ඒ අවස්ථාව සම්බන්ධයෙන් සම්පූර්ණ වී ඇති බවට කරන ලද ප්‍රකාශයක් හා සමාන වන්නේය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 165 (5) වන වගන්තිය.)

නඩුව විභාගය සඳහා තැබීමට පූර්වයෙන් පැවැත්වෙන පරීක්ෂණ වුවද නඩු විභාගයේදී වුවද චෝදනාව ඉදිරිපත් කරනු ලබන විට එය චූදිතයාට අවබෝධ වන භාෂාවකින් කියවා දිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 165 (6) වන වගන්තිය.)

නීතිපති එරෙහිව බිම්බිරගොඩගේ සුජිත් ලාල් (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු SC (SPL) LA 232/14)

මෙය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 128 වන වගන්තිය යටතේ සිදුකළ විශේෂ අභියාචන ඉල්ලුම් පත්‍රයකි. වගඋත්තරකරුවන් මිනී මැරීමට වරදකරුවන් විය. මරණ දඬුවම හිමි විය. අධිකරණය විසින් සලකා බැලිය යුත්තක් තිබේ. ඒ නඩු විභාගය සිදුකළ විනිසුරුවරයා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 195 (ee) වගන්තිය සලකා බැලීමට අපොහොසත් වූවාද යන්නය. නඩු විභාගය සිදුකරන විනිසුරුවරයාට වගකීමක් ඇත. ඒ අධිචෝදනා ඉදිරිපත් කළ ව්‍යවස්ථාවේ ජූරිය සමග නඩු විභාග කරනවාද, එසේ නැද්ද යන්න සවිස්තරාත්මකව අසා දැන ගැනීමටය. එය චූදිතගේ මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇත. අධිකරණය නඩු විභාග කරන විනිසුරුට ඒ පිළිබඳව චූදිතගෙන් විමසීම පමණක් නොව එසේ කිරීමට චූදිතට අයිතියක් ඇති බව දැන්වීමද වේ. මෙම ක්‍රියාදමය නිරීක්ෂණය නොකිරීම නීති විරෝධී වේ. එය හුදු අකාර්යක්ෂමතාවයක් නොවේ. අධිකරණය විසින් අභියාචනයට අවකාශය ලබාදෙන ලදි. ඒ චූදිතව වරදකරු කිරීම සහ දඬුවම් පැමිණවීම යන කාරනා දෙකටම විරුද්ධවය.

අදාළ චෝදනාව කරන ලදැයි කියනු ලබන වරද කරන ලද වේලාව සහ ස්ථානය ද ඒ වරද කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව නම් ඒ තැනැත්තා පිළිබඳව ද යම් දෙයක් සම්බන්ධයෙන් නම් ඒ දෙය පිළිබඳව ද, චූදිතයාට විරුද්ධව චෝදනා නගනු ලැබූ කාරණය සම්බන්ධයෙන් ඔහුට දැනුම් දෙනු ලැබීමට සහ ඒ වරද සඳහා නඩු පැවරිය හැකි කාලය ගතවී නොමැති බව පෙන්වීමට සාධාරණ ලෙස ප්‍රමාණවත් වන්නාවූ විස්තර ඒ චෝදනාවෙහි ඇතුළත් විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 165 (1) වන වගන්තිය.)

සාපරාධ විශ්වාසභාවය කඩ කිරීම මෙන්ම චංචල දේපළ වංක ලෙස පරිහරණය කිරීම පිළිබඳව හෝ චූදිතයාට විරුද්ධව චෝදනා නගනු ලැබූ කල්හි, ඒ වරද කරන ලදැයි කියනු ලබන්නේ යම් මුදලක් හෝ දෙයක් සම්බන්ධයෙන්ද අවස්ථාවෝචිත පරිදි, ඒ මුදලෙහි ද ප්‍රමාණය හෝ ඒ දෙයෙහි දළ ප්‍රමාණය සහ ඒ වරද කරන ලදැයි කියනු ලබන්නේ යම් දින අතරද, ඒ දින විශේෂ විෂයක් හා නියම දින නොදක්වමින් සඳහන් කිරීම ප්‍රමාණවත් විය යුතු අතර එසේ සකස් කරනු ලැබූ

චෝදනාව 174 වන වගන්තියේ අර්ථානුකූලව එක් වරදක් සඳහා වූ චෝදනාවක් ලෙස සලකනු ලැබිය යුතුය.

එසේ වුවද ඒ දින අතුරින් පළමුවන හා අවසන් දින අතර ඇතුළත කාලය එක් අවුරුද්දක් නොඉක්මවිය යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 165 (2) වන වගන්තිය.)

චූදිතයාට විරුද්ධව චෝදනා නගා ඇත්තේ යම් කාරණයක් පිළිබඳව ද ඒ කාරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම් දීමක් 164 වන වගන්තියේ සහ මේ වගන්තියේ මීට ඉහතින් වූ උදාහරණවල සඳහන් විස්තරවලින් චූදිතයාට නොලැබෙන්නාවූ ස්වභාවය නඩුවෙහි ඇති කල්හි, ඒ කාර්යය සඳහා ප්‍රමාණවත් වන සේ කරන ලදැයි කියන වරද කරන ලද ආකාරය පිළිබඳ විස්තර ද චෝදනාවෙහි ඇතුළත් විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 165 (3) වන වගන්තිය.)

සෑම චෝදනාවකම, වරදක් විස්තර කිරීමේදී පාවිච්චි කරන ලද වචන ඒ වරදට දඬුවම් කළ හැකි වන්නේ යම් නීතියක් යටතේ ද ඒ නීතිය ඒ වචනවලට පිළිවෙලින් ඇති සේ සලකනු ලබන අර්ථයෙන්ම පාවිච්චි කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 165 (4) වන වගන්තිය.)

චෝදනාවෙහි සඳහන් කරනු ලැබීමට නියමිත වරද හෝ විස්තර හෝ එහි සඳහන් කිරීමෙහිලා වූ යම් දෝෂයක් සහ ඒ වරද හෝ ඒ විස්තර සඳහන් කිරීමෙහිලා වූ නොකර හැරීමකින් චූදිතයා නොමග ගියේ නම් මිස එවැනි කිසිම දෝෂයක් හෝ නොකර හැරීමක් නඩුවේ යම් අවස්ථාවකදීම වැදගත් ලෙස සලකනු නොලබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය 166 වන වගන්තිය.)

නඩු තීන්දුව ප්‍රකාශ කිරීමට පෙර හෝ ජූරි සභාවක් මගින් මහාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාග සම්බන්ධයෙන් වූ විට ජූරි සභාවේ තීන්දුව දීමට පෙර හෝ ඕනෑම වේලාවකදී යම් අධි චෝදනාවක් හෝ චෝදනාවක් යම් අධිකරණයක් විසින් වෙනස් කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 167 (1) වන වගන්තිය.)

එවැනි සෑම වෙනස් කිරීමක්ම චූදිතයාට කියවා තේරුම් කර දෙනු ලැබිය යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය 167 (2) වන වගන්තිය.)

ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය තුළ මෙය ඉතා වැදගත් වේ. මෙම කරුන ගැන වෘත්තිකයන් ඉතාමත් ප්‍රවේශම් විය යුතුය. චෝදනාව සංශෝධනය කළ විට ඒ පිළිබඳව චූදිතයාට කියවා දීම සහ විස්තර කිරීම නොකළහොත් මෙම කරුන පිළිබඳව අභියාචනා කළ හැකිය.

<u>පොඩ්ඩනා තිස්සමහාරාම සහ තවත් අය 15 එරෙහිව තිස්සමහාරාම පොලිස් ස්ථානාධිපති සහ නීතිපතිවරයා (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක (එස්.පී.එල්.ඒ. අංක 289 (09)</u>

මෙය විශේෂ අභියාචන ඉල්ලුම් පත්‍රයකි. ඒ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 128 (2) වගන්තිය අනුවය. මෙම කරුණ පිළිබඳව තැකීමක් ඇති අතරම ශ්‍රී ලංකා නීතියේ චෝදනා පත්‍රය/ අධි චෝදනාව පරිදි සංශෝධනය කර ඇත. මෙම නඩුව පහත කාරණා ස්ථිර කර දක්වා තිබේ. එය චෝදනා පත්‍රය සංශෝධනය කර ඇති විට එය චූදිතට කියවා දිය යුතුව ඇත. එ යසලකා බැලීමද සිදු වේ. (ශ්‍රී ලංකා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 167 (1) සහ (2) වන වගන්තීන් වලට අනුකූලවය) එය ශ්‍රී ලංකා නීතිය යටතේ වූ අවශ්‍යතාවයකි. එනම් චෝදනා පත්‍රය හෝ අධිචෝදනාව සංශෝධනය කළ විට එම සංශෝධිත චෝදනා පත්‍රය හෝ අධි චෝදනාව චූදිතට කියවා තේරුම් කර දිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම නඩුව චූදිතට එරෙහිව දෝෂ සහිත නඩුවක් බවට පත් කරයි.

අධිචෝදනාවක එක් චෝදනාවක් වෙනුවට වෙනත් චෝදනාවක් ආදේශ කිරීම හෝ අධිචෝදනාවකට අලුත් චෝදනාවක් එකතු කිරීම ද මහේස්ත්‍රාත් අධිරකරණයකදී එක් චෝදනාවක් වෙනුවට වෙනත් චෝදනාවක් ආදේශ කිරීම හෝ අලුත් චෝදනාවක් එකතු කිරීම ද මේ වගන්තියේ

අර්ථානුකූලව පළමුව ඒ අධිචෝදනාව හෝ චෝදනාව යටතේ වෙනස් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය 167 (3) වන වගන්තිය.)

යම් තැනැත්තෙකුට විරුද්ධව චෝදනා නගනු ලබන සෑම වෙන් වෙන් වරදක් සඳහාම වෙන වෙනම චෝදනාවක් තිබිය යුතුය. 174 වන, 175 වන, 176 වන සහ 180 වන වගන්තීන්වල සඳහන් අවස්ථාවලදී හැර ඒ සෑම චෝදනාවක් පිළිබඳවම වෙන් වෙන්ව නඩු විභාග කළ යුතු අතර එහි වගන්තීන් වෙන් වෙන්ව හෝ ඒකාබද්ධව හෝ අදාළ කරගනු ලැබිය හැක. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 173 වන වගන්තිය.)

පළමුවන වරදෙහි සිට අවසන් වරද තෙක් මාස දොළහක කාලය ඇතුළත කරන ලද එකම වර්ගයේ වැරදි එකකට වඩා වැඩි ගණනක් සම්බන්ධයෙන් තැනැත්තකු චෝදනා ලැබ සිටින විට, එයින් තුණකට නොවැඩි යම් වැරදි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා නගා එක නඩු විභාගයේදීම ඔහු නඩු විභාගයට භාජනය කළ හැකි අතර මහාධිකරණය ඉදිරිපිට දී වූ නඩු විභාග වලදී ඒ චෝදනා එකම අධිචෝදනා පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 174 (1) වන වගන්තිය.)

දණ්ඩ නීති සංග්‍රහයේ හෝ යම් විශේෂ හෝ ප්‍රාදේශිය නීතියක එකම වගන්තිය යටතේ හෝ එකම ප්‍රමාණයේ දඬුවම් වලින් කළ හැකි වැරදි එකම වර්ගයේ වැරදි වේ.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 174 (2) වන වගන්තිය.)

<u>(7.2) අත්අඩංගුවට ගැනීම.</u>

<u>(7.2.1) නීති විරෝධී අත්අඩංගුවට ගැනීම.</u>

විත්තියේ නීතිඥවරුන් අනිවාර්යයෙන් දැන සිටිය යුතු දෙයක් ඇත. ඒ නීත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමක් සංස්ථාපනය වන්නේ කෙසේද යන්නය. එවිට ඔවුන්ට තම සේවාදායකයන්ව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම සිදුකරන විටදී සුදුසු පියවර ගත හැකිය.

යම් තැනැත්තකු සිර භාරයට ගැනීමේදී ඒ සිරභාරයට ගනු ලබන තැනැත්තා තමා අත්අඩංගුවට ගනු ලැබීමට වචනයෙන් හෝ ක්‍රියාවෙන් අවනත වුවහොත් මිස, ඔහු සිරභාරයට ගැනීම කරන තැනැත්තෙකු විසින් සිර භාරයට ගනු ලබන තැනැත්තාගේ ශරීරය සැබවින්ම ස්පර්ශ කොට හෝ රඳවා තබා ඔහුව ගනු ලබන්නේ යම් චෝදනාවක් හෝ දෝෂාරෝපණයක් මතද ඒ චෝදනාවේ හෝ දෝෂාරෝපණයේ ස්වභාවය ඔහුට දැනුම් දිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 23 (1) වන වගන්තිය.)

නීති විරෝධී ලෙස පුද්ගලයකු අත්අඩංගුවට ගැනීම, ඔහුට හෝ ඇයට අත්අඩංගුවට ගැනීමේ හේතුව නිසි ලෙස දැන්වීම සිදු නොකිරීම මගින් චූදිතයන් ව්‍යවස්ථා නීති අයිතීන් උල්ලංඝණය කරන අතරම උසාවිය චූදිත තැනැත්තෙක් ව්‍යවස්ථාපිත අයිතින් කඩවූ බව තීරණය කරන අතරම චූදිත තැනත්තාට වන්දි සහ හානිය ගෙවන්නට සිදුවිය හැක.

<u>පත්කුඹුරගේ රෝහිත අනුර කුමාර එරෙහිව එච්. හැරිසන් හෙට්ටිහේවා, පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය බොරලැස්ගමුව සහ තවත් එක් අයෙක් (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු අංක SC/FR/194/2013)</u> ව්‍යවස්ථාවේ 17 වන වගන්තිය සහ 126 වන වගන්තිය යටතේ පවරනු ලැබේ. මෙහිදී පොලීසිය අත්අඩංගුවට ගැනීමේ හේතුව නීසි ලෙස නොදන්වා ම රඳවාගනු ලැබිණි. මෙය සිදුවූයේ නීත්‍යානුකූල ලෙස අත්අඩංගුවට ගැනීමෙන් පසුවය. නමුත් රඳවා ගැනීම නීති විරෝධී විය. ඒ ඇප බැඳුම්කරයට පසුව සිදුවූ බැවිණි. අධිකරණය විසින් පහත ආකාරයට තීරණය කරන ලදි. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) සහ 13 (2) වන වගන්තියේ පෙත්සම්කරු සම්බන්ධයෙන් උල්ලංඝණය කර ඇති බවත්ය. එය සිදු කළේ 2 වන වගඋත්තරකරු සහ තවත් අය කිහිප දෙනෙක් විසිනි.

මෙම ක්‍රියාදාමය තුළ ඔවුන්ව හඳුන්වා ගෙන නොමැත. දෙවන වගඋත්තරකරු රුඃ 50,000/- ක් සහ රජය රුපියල් 100,000/- ක් වන්දි ලෙස පෙත්සම්කරුට ගෙවීමට නියෝග කෙරිණි. තවද නෛතික ගාස්තු ලෙස රජය විසින් රුඃ 50,000/- ක් ගෙවීමට ද නියෝග කෙරිණි.

සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු සිය පැන යාම වැළැක්වීමෙහිලා අවශ්‍යය ප්‍රමාණයට වැඩි මැඩ පැවැත්මක් ඔහු සම්බන්ධයෙන් නොකළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 28 වන වගන්තිය.)

ඒ තැනැත්තා තම සිරභාරයට ගැනීමේ උත්සාහයට බලහත්කාරයෙන් ප්‍රතිරෝධය පෑවොත් හෝ සිර භාරයට ගනු ලැබීම මග හැරීමට තැත් කළහොත් ඒ සිර භාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිර භාරයට ගැනීම ක්‍රියාත්මක කිරීම ට සාධාරණ ලෙස අවශ්‍ය උපක්‍රම යෙදිය හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 23 (2) වන වගන්තිය.)

මරණීය දඬුවම දිය හැකි වරදකින් චෝදනා නොකරනු ලැබූ තැනැත්තකු සිර භාරයට ගැනීමෙහිලා ඔහුගේ මරණය සිදුකිරීමේ අයිතිවාසිකමක් මේ උප වගන්ති කිසිවකින් නොලැබේ.

(අපරාධ නඩු විධාන සංග්‍රහය 23 (3) වන වගන්තිය.)

ඒ ස්ථානයට ඇතුළුවීමට 24 වන වගන්තිය යටතේ ඉඩ ලබාගත නොහැකි වුවහොත් යම් අවස්ථාවකදී වරෙන්තුවක් යටතේ ක්‍රියාකරන තැනැත්තකු විසින් ද වරෙන්තුවක් නිකුත් කළ හැකි වුවත් සිරභාරයට ගත යුතු තැනැත්තාට පැන යාමේ අවස්ථාවක් නොදෙමින් ඒ වරෙන්තුව ලබාගත නොහැකි යම් අවස්ථාවකදී සාම නිලධරයකු විසින්ද ස්වකීය අධිකරණය හා අරමුණ දැනුම්දීමෙන් හා ඇතුළු වීමේ අවසරය වේ. එහිදී ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු අන් ලෙසකින් ඔහුට එහි ඇතුළු විය නොහැකි නම්, ඔහු ඒ ස්ථානයට ඇතුළු වී එහි සෝදිසි කිරීම ද ඒ ස්ථානයට ඇතුළු විය හැකි වනසේ සිරභාරයට ගත යුතු තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ යම් ස්ථානයක යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ කවුළුවක් කඩා එය විවෘත කිරීම ද නීත්‍යානුකූල විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 25 වන වගන්තිය.)

සිරභාරයට ගැනීමක් ක්‍රියාත්මක කිරීමට බලය දෙනු ලැබ යම් තැනැත්තකු විසින් සිර භාරයට ගැනීමක් ක්‍රියාත්මක කිරීම පිණිස යම් ස්ථානයකට නීත්‍යානුකූලව ඇතුළු වීමෙන් පසු එහි රඳවා තැබුණු ලැබ සිටින තමාම නිදහස් වීම පිණිස හෝ වෙනත් තැනැත්තකු නිදහස් කර ගැනීම පිණිස හෝ ඒ ස්ථානයේ යම් බාහිර හෝ අභ්‍යන්තර හෝ දොරක් හෝ කවුළුවක් කඩා විවෘත කළ හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 27 වන වගන්තිය.)

(7.2.2) වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීම.

මහේස්ත්‍රාත්වරයෙකුගේ ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නෙමැතිව යම් සාම නිලධරයකු විසින්,

(අ) තමා ඉදිරිපිට සාමය කඩ කිරීමක යෙදෙන යම් තැනැත්තකු,

(ආ) යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාරධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු,

(ඇ) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව (හේතුවක් තිබේ නම් ඒ හේතුව ඔප්පු කිරීම සඳහා ඒ තැනැත්තා වෙත පැවරී ඇත) ගෙවල් බිඳින උපකරණයක් තම සන්තකයෙහි තබාගෙන සිටින යම් තැනැත්තකු,

(ඈ) වරද කරන්නකු ලෙස ප්‍රකාශයට පත් කොට ඇත්තා වූ යම් තැනැත්තකු සොරකම් කරන ලදැයි හෝ වංචනික ලෙස ලබා ගන්නා ලදැයි සාධාරණ ලෙස සැක කළ හැකි යම දෙයක්

තමා සන්තකයේ තබාගෙන සිට අසුවූ ද ඒ දෙය සම්බන්ධයෙන් වරදක් කළේ යැයි සාධාරණ ව සැක කරනු ලබන්නා වූ ද යම් තැනැත්තකු;

(උ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන්, නාවික හමුදාවෙන් හෝ ගුවන් හමුදාවෙන් පලා යන්නකු යයි සාධාරණව සැක කරනු ලබන යම් තැනැත්තකු;

(ඌ) සංඥෙය වරදක් කිරීමේ අදහසින් තමා සිටින බව සැඟවීමට පූර්වෝපාය යොදමින් සිටී යයි විශ්වාස කිරීමට හේතු ඇති කවර වූ ද අවස්ථා යටතේ සැඟවී සිටීමට පූර්වෝපාය යොදමින් සිටියා වූ යම් තැනැත්තකු;

(එ) ශ්‍රී ලංකාවේදී කරනු ලැබූ යම් වරදක් වශයෙන් ගෙන දඬුවම් කළ හැකි වූද, උදර්පනය හෝ පලායන තැනැත්තන් හෝ පිළිබඳ තත්කාලයෙහි වලංගුව පවත්නා යම් නීතියක් යටතේ නැතහොත් වෙනත් ආකාරයෙන් ශ්‍රී ලංකාවෙහිදී අල්ලා ගනු ලැබීමට හෝ අත්අඩංගුවෙහි රඳවා තැබීමට යටත් වුව ද වරදක් වන ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයකදී කිරීමට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සහේතුක පැමිණිල්ලක් කරනු ලැබ ඇත්තේ ද නැතහොත් යම් තැනැත්තකු යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ සැකයක් ඇති වී ඇත්තේ ද එවැනි යම් තැනත්තකු සිර භාරයට ගත හැකිය.

(2) වරෙන්තුවක් නොමැතිව යම් තැනැත්තකු සිර භාරයට ගැනීම සඳහා සාම නිලධාරියකුට බලය පවරන්නා වූ වෙනත් යම් ප්‍රතිපත්තියක ක්‍රියාකාරිත්වය කෙරෙහි බාධා කිරීමක් හෝ එය ලිහිල් කිරීමක් මේ වගන්තියෙහි කිසිවකින් සිදු වෙතැයි තීරණය නොකළ යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 32 වන වගන්තිය.)

<u>ඔමන්ත මුදලිගේ දෙන් ගාමිණී එරෙහිව පොලිස් පරීක්ෂක විශේෂ ඒකකය, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ තවත් අය. (ශ්‍රේෂ්ඨාධිකරණය නඩු අංකය SC/FR 81/2001)</u>

මෙම නඩුවේ දී අභියාචකයා රඳවා තබා ගැනීම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී. ශ්‍රී ලංකා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 වන වගන්තීන් වලට අනුකූලව ඉල්ලුම් පත්‍රය සකසා තිබේ. අභියාචනාධිකරණය පැහැදිළි කිරීමක් ඉල්ලා ඇත. ඒ වගඋත්තරකරුවන් විසින් 11,12(1), 12(2), 13(1), 13(2) සහ 14(1) (g) යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වගන්තීන් වලින් සහතික කරන ලද ඔහුගේ මූලික අයිතිවාසකම් උල්ලංඝණය කළ බවටය. අධිකරණය සෙයාගත් කරුණක් වන්නේ විවෘත පොලිස් වරෙන්තුවක් මගින් අත්අඩංගුවට ගෙන රඳවා ගත් බවටත් වන නමුත් එම අත්අඩංගුවට ගැනීම නීති විරෝධී යන්න වේ. අධිකරණය පහත ස්ථාවරය දැරීය. එනම් පළමු සහ දෙවන වගඋත්තරකරුවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය මගින් සහතික කර ඇති අභියාචක මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කළ බවය. රජය විසින් අභියාචකට වන්දි ලෙස රුපියල් 300,000/- ක් ගෙවීමට නියම කෙරිණි.

වරෙන්තුවක් නොමැතිව යම් තැනැත්තකු සිර භාරයට ගන්නා වූ සාම නිලධරයකු විසින් අනවශ්‍ය ප්‍රමාදයෙන් තොරව හා ඇප දීම සම්බන්ධයෙන් මෙහි ඇතුළත් විධි විධානවලට යටත්ව, සිර භායරට ගනු ලැබූ තැනැත්තා ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයකු වෙත ගෙන යාම හෝ ඉදිරිපත් කරවීම කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 36 වන වගන්තිය.)

පොලිස් ස්ථානවල නියුක්ත යම් පොලිස් නිලධාරියකු විසින් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලබන ලැබූ හෝ ඒ පොලිස් ස්ථාන භාර නිලධරයාගේ ඉදිරියට ගෙන එනු ලැබූ හෝ සියලුම තැනැත්තන් විෂයෙහිලා, එසේ සිර භාරයට ගැනීම හෝ තමන් ඉදිරියට පැමිණවීම සහ ඒ තැනැත්තාට ඇප දෙන ලද්දක් ද නැද්ද යන වග ඒ පොලිස් ස්ථාන භාර නිලධාරීන් විසින් ස්වකීය පොලිස් ස්ථාන පිහිටි ඒ ඒ දිස්ත්‍රික්කවල මහේස්ත්‍රාත් අධිකරණ වෙත වාර්තා කළ යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත (38) වන වගන්තිය.)

සාම නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ යම් තැනැත්තකු ඔහුගේ ම බැඳුම්කරය පිට හෝ ඇප පිට හෝ මහේස්ත්‍රාත් වරයකුගේ විශේෂ ලිඛිත ආඥාවක් යටතේ හෝ මිස නිදහස් නොකළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත (39) වන වගන්තිය.)

(7.2.3) වරෙන්තුවක් සහිතව සිර භාරයට ගැනීම.

සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ක්‍රියාවේ යොදවන තැනැත්තා විසින් ඒ වරෙන්තුවේ සාරය සිර භාරයට ගනු ලැබූ තැනැත්තාට දැනුම් දිය යුතු අතර, සිර භාරයට ගනු ලැබූ තැනැත්තා විසින් වරෙන්තුව පෙන්වන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත් එය නිකුත් කළ තැනැත්තා විසින් අත්සන් කරන ලද ඒ වරෙන්තුව හෝ එහි පිටපතක් ඒ සිර භාරයට ගනු ලැබූ තැනැත්තාට පෙන්විය යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 53 වන වගන්තිය.)

සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ක්‍රියාවේ යොදවන තැනැත්තකු විසින් (ඇප පිළිබඳ 51 වන වගන්තියේ විධි විධාන වලට යටත්ව) සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබීමට තමාට නීතියෙන් නියමිත අධිකරණය වෙත අවශ්‍ය ප්‍රමාදයෙන් තොරව ඔහු ඉදිරිපත් කළ යුතු අතර සිර භාරයට ගැනීම කරන වේලාව සහ ස්ථානය ඔහු විසින් වරෙන්තුවෙහි පිටසන් කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 54 වන වගන්තිය.)

සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයකදී ක්‍රියාත්මක කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 55 වන වගන්තිය.)

සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කරනු ලැබුවේ යම් අධිකරණයක් විසින්ද ඒ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාවන් පිටතදී ඒ වරෙන්තුව ක්‍රියාවේ යොදවනු ලැබූ විට, වරෙන්තුව නිකුත් කළ අධිකරණය සිර භාරයට ගැනීම කළ ස්ථානයේ සිට සැතපුම් විස්සක් ඇතුළත පිහිටියේ නම් හෝ සිර භාරයට ගැනීම කරනු ලැබුවේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත් අධිකරණයට වඩා ආසන්න නම් හෝ මිස, නැතහොත් 51 වන වගන්තිය යටතේ ඇප ගනු ලැබුවහොත් මිස සිර භාරයට ගනු ලැබූ තැනැත්තා අවසන් වරට සඳහන් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගෙන යනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 58 (1) වන වගන්තිය.)

ඒ සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඒ වරෙන්තුව නිකුත් කළ අධිකරණය විසින් අදහස් කරන ලද තැනැත්තා බව පෙනී ගියහොත් ඔහු ඒ වරෙන්තුව නිකුත් කළ අධිකරණය වෙත අත්අඩංගුවේ ගෙන යන ලෙස සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කරන ලද මහේස්ත්‍රාත් අධිකරණය විසින් විධාන කළ යුතුය.

එසේ වුවද, වරද ඇප දිය හැකි වරදක් නම් ද, සිර භාරයට ගනු ලැබූ තැනැත්තා ගෙන එනු ලැබ සිටින අධිකරණය සෑහීමට පත්වන සේ ඇප දීමට ඔහු සූදානම් වනු කැමති නම් හෝ එසේ වූ විධානයක් 51 වන වගන්තිය යටතේ වරෙන්තුවෙහි පිටපත් කරනු ලැබූ ඒ විධානයේ නියමිත ඇප පොරොන්දු දීමට ඒ තැනැත්තා සූදානම් සහ කැමති නම්ද, අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි ඒ ඇපය හෝ ඇප පොරොන්දුව භාරගෙන ඒ බැඳුම්කරය ඒ වරෙන්තුව නිකුත් කළ අධිකරණය වෙත යැවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 58 (2) වන වගන්තිය.)

යම් තැනැත්තකු සිර භාරයට ගනු ලැබීම සඳහා වරෙන්තුවක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකු යයි විශ්වාස කිරීමට පොලිස් නිලධාරියකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක මේ පර්ච්ඡේදයෙහි පටහැනිව කුමක් සඳහන් ඇත්ද යන්න ඒ වරෙන්තුව ඒ අවස්ථාවෙහි තම සන්තකයෙහි නොමැති

වුවද, ඒ වරෙන්තුව ක්‍රියාවෙහි යෙදවීමෙහිලා ඔහු විසින් ඒ තැනැත්තා සිර භාරයට ගනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 59 වන වගන්තිය.)

(7.2.4) සංඥෙය නොවන වැරදි වලදී සිර භාරයට ගැනීම.

සංඥෙය නොවන වැරදි වලදී සාම නිලධරයකුට වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත නොහැක. සාම නිලධාරියෙකු ඉදිරිපිට සිටින ඕනෑම පුද්ගලයෙකුට හඳුනාගත නොහැකි ක්‍රියාවක් කළ බවට චෝදනා කළ විට

එවැනි සාම නිලධාරියෙකුට ඔහුගේ නම සහ පදිංචිය හෝ දීම ලබා දෙන ලෙස ඉල්ලා සිටීම වරදකි

එවැනි නිලධාරියෙකු අසත්‍ය යැයි විශ්වාස කිරීමට හේතුවක් ඇති නමක් හෝ පදිංචියකින් ඔහු අත්අඩංගුවට ගත හැකිය

එවැනි සාම නිලධාරියෙකුගේ නම හෝ පදිංචිය නිශ්චය කර ගැනීම සඳහා

යම් තැනැත්තකු සංඥෙය නොවන වරදක් කළේ යයි සාම නිලධාරියකු ඉදිරියේදී ඔහුට චෝදනා කරනු ලැබූ අවස්ථාවක තමාගේ නම සහ පදිංචි ස්ථානය දන්වන ලෙස ඒ සාම නිලධාරියා විසින් ඉල්ලා සිටින අවස්ථාවක එය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ අසත්‍ය යයි විශ්වාස කිරීමට ඒ සාම නිලධාරියාට හේතු ඇති නමක් හෝ පදිංචියක් ඔහු ලබාදුන්න හොත් ඔහුගේ නම හෝ පදිංචි ස්ථානය නිසැකවම දැනගැනීම සඳහා ඔහු සිරභාරයට ගැනීම ඒ සාම නිලධාරියා විසින් කළ හැකිය.

තවද සිර භාරයට ගැනීමෙන් පසු පැය විසි හතරක් ඇතුළත දී ඒ තැනැත්තාගේ සැබෑ නම හා පදිංචි ස්ථානය නිසැකව දැනගනු ලැබුවේ නම් හා මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියෙහි පෙනී සිටීමට ඔහුට නියම කරනු ලැබුවේ නම් එසේ එකී අධිකරණය ඉදිරියට පැමිණෙන බවට බැඳුම්කරයක් ඒ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබූ විට, ඒ තැනැත්තා අප්‍රමාදව මුදාහැරිය යුතු අතර ඔහුගේ සැබෑ නම හා පදිංචි ස්ථානය එසේ නිසැකව දැනගත නොහැකි වුවහොත් ආසන්නතම මහේස්ත්‍රාත් අධිකරණය වෙත යාම සඳහා අවශ්‍ය කාලය අත්හැර ඒ සඳහා ඒ තැනැත්තා සිර භාරයට ගත් වේලාවේ සිට ගණන් බලනු ලබන පැය විසි හතරක් ඇතුළත දී ඒ තැනැත්තා ආසන්නතම මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගෙන යා යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 33 (1) වන වගන්තිය)

යම් පුද්ගලයකුට සංඥෙය නොවන වරදක් කළ බවට චෝදනා එල්ල වේ. එවැනි පුද්ගලයකු ශ්‍රී ලංකාව තුළ ස්ථිර පදිංචියක් නොමැති විට සහ ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාමට සූදානම් බවට විශ්වාස කිරීමට සාම නිලධාරියකුට හේතු ඇති විට එවැනි පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට සාම නිලධාරියකුට හැකියාව ඇති අතර ඔහුව ඒ සමගම ළඟම ඇති මහේස්ත්‍රාත්වරයා වෙත එම පුද්ගලයාව ඉදිරිපත් කළ යුතුය. එහිදී ඔහුට බැඳුම්කරයකට හෝ ශරීර ඇපයක් ඇතිව හෝ නැතිව ඇතුළත් වන අතර ඒ අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටින ලෙස ආඥා කරමින් වන අතරම ඔහුට විරුද්ධව නඩු විභාග කරන තෙක් රඳවා ගැනීමට ආඥා කිරීම මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය 33 (2) වන වගන්තිය)

(7.2.5) පුද්ගලික තැනැත්තන් සිදුකරන අත්අඩංගුවට ගැනීම්.

පෞද්ගලික තැනැත්තන් විසින් චූදිතයකු අත්අඩංගුවට ගැනීමේ කාර්ය පටිපාටිය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 35 වන වගන්තියේ දක්වා ඇත.

යම් පෞද්ගලික තැනැත්තකු විසින් තමා ඉදිරිපිට දී සංඥෙය වරදක් කරන හෝ වරදකරුවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ සිටින හෝ පැන දුවන්නා වූද සංඥෙය වරදක් කළ තැනැත්තකු සාධාරණව තමා සැක කරන්නා වූද යම් තැනැත්තකු සිර භාරයට ගත හැකිය. ඔහු විසින් එසේ සිර භාරයට ගනු ලැබූ තැනැත්තා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ආසන්නතම සාම නිලධරයා වෙත භාර දිය යුතුය. සාම නිලධරයකු නොමැති නම් ඒ තැනැත්තා ආසන්නතම පොලිස් ස්ථානයට

ගෙන යා යුතුය. එවැනි තැනැත්තකු 32 වන වගන්තියේ විධි විධාන යටතට පත්වන්නකු බව විශ්වාස කිරීමට හේතු තිබේ නම් සාම නිලධාරියකු විසින් ඔහු නැවත සිර භාරයට ගත යුතුය.

ඒ තැනැත්තා විසින් සංඥෙය නොවන වරදක් කර ඇතැයි විශ්වාස කිරීමට හේතු තිබේ නම් සහ තම නම, ගම සහ පදිංචි ස්ථානය දන්වන ලෙස පොලිස් නිලධාරියකු විසින් ඉල්ලා සිටි කල්හි එය දන්වා සිටීමට ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරයි නම් හෝ අසත්‍ය හා විශ්වාස කිරීමට ඒ නිලධරයාට හේතු ඇති නමුත් නැතහොත් පදිංචි ස්ථානයක් ඒ තැනැත්තා දන්වා සිටී නම් හෝ ඒ තැනැත්තා ශ්‍රී ලංකාව හැර යාමට ආසන්න බව විශ්වාස කිරීමට හේතු ඒ නිලධාරියාට තිබේ නම් හෝ, 33 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලැබිය යුතුය. ඒ තැනැත්තා යම් වරදක් සිදුකර ඇතැයි විශ්වාස කිරීමට හේතු නොමැති නම් ඔහු වහාම නිදහස් කළ යුතුය.

<u>(7.2.6) මහේස්ත්‍රාත්වරුන් විසින් සිර භාරයට ගැනීම.</u>

මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ඔහුගේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළදී යම් තැනැත්තකු විසින් වරදක් සිදුකරනු ලැබූ අවස්ථාවක ඒ මහේස්ත්‍රාත්වරයාම විසින් ඒ වරදකරු සිරභාරයට ගැනීම හෝ සිර භාරයට ගනු ලැබීමට යම් තැනැත්තකුට ආඥා කිරීම හෝ කළ හැකිය. එසේ සිර භාරයට ගනු ලැබූ විට ඇප සම්බන්ධයෙන් මෙහි ඇතුළත් විධි විධානවලට යටත්ව ඒ වරද කරන්නා අත්අඩංගුවෙහි තැබීමට නියම කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 40 වන වගන්තිය)

තම අධිකරණ බල සීමාව තුළදී යම් තැනැත්තකු යම් වේලාවකදී යම් අවස්ථාගත කරුනු යටතේ සිර භාරයට ගැනීමට වරෙන්තුවක් නිකුත් කිරීමට බලය ඇති මහේස්ත්‍රාත්වරයකු විසින් එවැනි කවර වූ වේලාවකදී එවැනි තැනැත්තකු සිර භාරයට ගැනීම හෝ තමා ඉදිරියේදී සිර භාරයට ගනු ලැබීමට විධාන කිරීම හෝ කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 41 වන වගන්තිය)

<u>(7.2.7) ළමා අතවර සම්බන්ධයෙන් පුද්ගලයන් සිරභාරයට ගැනීම.</u>

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 43 (අ) වගන්තිය මගින් ළමා අතවර වලට සම්බන්ධ පුද්ගලයන් සිර භාරයට ගැනීම පිළිබඳ විශේෂ විධි විධාන දක්වා ඇත.

(1) 36 සහ 37 වගන්තීන්වල ප්‍රතිපාදන ළමා අතවර පිළිබඳ සැකකරුවන් හෝ චූදිතයන් සම්බන්ධයෙන් අදාල වනනේ නැත.

(2) ළමා අපචාර සම්බන්ධයෙන් පොලිස් නිලධාරියකු විසින් වරෙන්තුවක් නොමැතිව යම් තැනැත්තකු අත්අඩංගුවට ගත් විට අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ අත්අඩංගුවට පත්වී පැය 24 ක් ඇතුළත එම සිද්ධිය පිළිබඳ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

(3) උප වගන්ති 2 යටතේ අත්අඩංගුවට පත් පුද්ගලයකු මහේස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කිරීමේදී එම සහතිකය ඉදිරිපත් කිරීමට පොලිස් අධිකාරී තනතුරට අදාල නොවන හෝ ඔහු නොමැති විට ඒ වෙනුවෙන් වැඩ බලන නිලධාරියකු විසින් කළ යුතු අතරම, විමර්ශනය කිරීමේ අරමුණින් එවැනි පුද්ගලයකු රඳවා ගැනීම අවශ්‍ය වන විට එවැනි පුද්ගලයකු දින 3 කට නොවැඩි කාලයක් පොලිස් භාරයේ රඳවා ගැනීමට නියෝග කළ හැක.

(4) විමර්ශනය අවසානයේදී හෝ 3 වන වගන්තිය යටතේ නියෝග කළ ආකාරයට සිදු වූ රැඳවුම් කාලය නිමා කළ විට හෝ කුමක් පළමුව සිද්ධ වුවද එවැනි පුද්ගලයකු මහේස්ත්‍රාත්වරයකු හමුවට ඉදිරිපත් කිරීම සහ මෙම පනතේ ප්‍රතිපාදන අදාල වීම මෙන්ම එවැනි පුද්ගලයකු සම්බන්ධයෙන් සිදුවිය යුතුව ඇත.

(7.3) සෝදිසි කිරීම.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 73 සිට 79 වන වගන්තීන් මගින් සිදුකරන සෝදිසි කිරීම් වලට අදලව අපරාධ නඩු විධාන සංග්‍රහය සාමාන්‍ය ප්‍රතිපාදන දක්වා තිබේ.

(7.3.1) සිර භාරයට පත් පුද්ගලයකු සෝදිසි කිරීම.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 29 වන වගන්තිය ළමා අපචාර වලට සිර භාරයට පත් පුද්ගලයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන දක්වා ඇත.

යම් තැනැත්තකු,

(අ) ඇප ගැනීමට විධි විධාන නොසැලස්වුනු වරෙන්තුවක් යටතේ සාම නිලධරයකු විසින් සිර භාරයට ගනු ලැබූ හෝ ඇප ගැනීමට විධි විධාන සැලැස්වුනු වරෙන්තුවක් යටතේ හෝ සිරභාරයට ගනු ලැබූ ඒ සිර භාරයට ගනු ලැබූ තැනැත්තාට ඇප සැපයිය නොහැකි වූ හෝ

(ආ) වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ හෝ වරෙන්තුවක් යටතේ පෞද්ගලික තැනැත්තකු විසින් සිර භාරයට ගනු ලැබූ නීත්‍යානුකූලව ඇප දිය නොහැකි වූ නැතහොත් ඇප සැපයිය නොහැකි වූ

කවර අවස්ථාවකදී වුවද, සිර භාරයට ගැනීම කරන සාම නිලධරයා විසින් හෝ පෞද්ගලික තැනැත්තකු විසින් සිර භාරයට ගැනීම කරන ලද අවස්ථාවක, ඔහු විසින් සිර භාරයට ගනු ලැබූ තැනැත්තා භාර දෙනු ලැබූ සාම නිලධරයා විසින් හෝ 30 වන වගන්තියට යටත්ව ඒ තැනැත්තා සෝදිසි කරනු ලැබූ ඔහු වෙත ඇති අවශ්‍ය ඇඳුම් නොවන සියලු ද්‍රව්‍ය ආරක්ෂා රැකවරණයේ තැබිය හැකිය. තවද ඒ ද්‍රව්‍ය අතුරින් අපරාධයේ උපකරණ හෝ ප්‍රතිඵල හෝ වෙනත් සාක්ෂි හෝ වන්නේ යැයි විශ්වාස කිරීමට හේතු ඇති කිසිවක් ඔහු නිදහස් හෝ නිදොස් වනතුරු රඳවා තබාගත හැකිය.

(7.3.2) ස්ත්‍රීන් සෝදිසි කළ යුතු ආකාරය.

ස්ත්‍රියක සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍ය වන කවර අවස්ථාවකදී වුව ද ඒ සෝදිසිය විනීතව ඒ කෙරෙහි ඉතාමත් සැලකිලිමත්ව වෙනත් ස්ත්‍රියක විසින් කළ යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 30 වන වගන්තිය)

(7.3.3) ස්ථාන සෝදිසි කිරීම.

සිර භාරයට ගත යුතු යම් තැනැත්තකු යම් ස්ථානයකට ඇතුළු වී ඇතැයි හෝ ඒ ස්ථාන තුළ සිටිතැයි විශ්වාස කිරීමට හේතු සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් යටතේ ක්‍රියා කරන හෝ සිර භාරයට ගැනීමේ බලය ඇති යම් තැනැත්තකුට ඇති ගෙයක් ස්ථානයේ පදිංචි හෝ ඒ ස්ථානය භාර තැනත්තා විසින්, ඉහත කී ලෙස ක්‍රියා කරන හෝ එසේ බලය ඇති තැනැත්තාගේ ඉල්ලීම පිට, ඔහුට එහි නිදහසේ ඇතුළු වීමට ඉඩදී එහි සෝදිසි කිරීමට සියලු සාධාරණ පහසුකම් සැලැස්විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 24 වන වගන්තිය)

යම් වරදක් සම්බන්ධයෙන් යම් දෙයක් සොයා ගැනීම පිණිස යම් ගෙයක් හෝ ස්ථානයක් නීත්‍යානුකූලව සෝදිසි කරනු ලබන හෝ සෝදිසි කරනු ලැබීමට ආසන්න කවර අවස්ථාවකදී වුවද ඒ සෝදිසිය නිම වන තුරු ඒ ගෙය හෝ ස්ථානයෙහි සිටින සියලු තැනත්තන් එහි රඳවා තැබීම නීත්‍යානුකූල විය යුතු අතර, සොයා ගනු ලබන දෙයෙහි ස්වභාවය අනුව එය ඇඟෙන සඟවා තබා ගත හැකි දෙයක් වී නම්, එය සොයා ගැනීම සඳහා ඒ තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු විසින් හෝ පරීක්ෂකවරයකු විසින් හෝ පරීක්ෂකවරයකුට වඩා පදවියෙන් පහ නොවූ පොලිස් නිලධාරියකු විසින් හෝ ඔවුන් අතුරෙන් කෙනෙකු ඉදිරිපිට හෝ 30 වන වගන්තියට යටත්ව සෝදිසි කළ හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 26 වන වගන්තිය)

(7.4) දේපළ සහ ලිපි ගොනු තහනමට ගැනීම.

යම් දේපළක් හෝ ලිපිගොනු තහනමට ගැනීම සෝදිසි වරෙන්තුවක ප්‍රතිඵලයක් ලෙස සිදුවන විට අදාල නිලධාරියා තහනම් කළ භාණ්ඩ පිළිබඳ ලැයිස්තුවක් සෑදිය යුතුව ඇත. එය අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 75 වන වගන්තියේ පහත ආකාරයට පැහැදිළි කර ඇත.

සෝදිසිය කරනු ලබන අතරතුර තහනමට ගනු ලැබූ සියලුම දේවල් හා ඒවා සොයා ගනු ලබන ස්ථාන පිළිවෙලින් සඳහන් වන ලැයිස්තුවක් සකස් කොට ඒ ලැයිස්තුව අත්සන් කිරීම සෝදිසි වරෙන්තුව ක්‍රියාවේ යොදවන තැනැත්තා විසින් කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 75 වන වගන්තිය)

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 62 වන වගන්තිය අනුව තහනමට ගත් හෝ පහත අමුණා ඇති දේපළ හෝ අයිතමයන් සුදුසු පුද්ගලයාට යොමු කිරීමට පියවර ගත යුතුය. 61 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සුදුස්සක් කළ හැකිව තිබෙන්නේ හෝ තිබුනේ යම් තැනැත්තකුගේ දේපළ සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ඒ තහනම ගත් දින සිට අවුරුද්දක් ඇතුළත ඒ දේපළ තහනම් කිරීමේ ආඥාව නිකුත් කළ අධිකරණය ඉදිරියෙහි සහ කැමැත්තෙන් පෙනී සිට හෝ ඒ අධිකරණය ඉදිරියට අල්ලාගෙන එනු ලැබ වරෙන්තුව ක්‍රියාත්මක කරනු ලැබීම මග හැරීමේ කාර්යය සඳහා තමා පැන ගොස් සැඟවී නොසිටි බව හෝ සැඟවෙමින් නොසිටි බවත් ප්‍රකාශනයෙහි සඳහන් කාලය ඇතුළත අධිකරණය ඉදිරියෙහි තමාට පෙනී සිටිය හැකි වන සේ ඒ ප්‍රකාශනය පිළිබඳ දැන්වීම තමාට නොලැබුනු බවත් ඒ අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කළහොත් ඒ දේපළ හෝ එය විකුණන ලද නම්, ඒ විකිනීමෙන් ලැබූ ශුද්ධ අය හා දේපළෙහි ඉතිරි කොටස ඒ තහනමට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් දරන ලද සියලු වියදම් පියවීමෙන් පසුව ද ඔහුට භාර දිය යුතුය.

(7.5) සිතාසි

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 139 වන වගන්තිය මෙය නිකුත් කිරීමේ ක්‍රියාදාමය පහත පරිදි දක්වා ඇත.

(1) 126 (1) වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ නඩු පවරා වූ ද ඇත්තා වූ ද අත්අඩංගුවෙහි නොමැති යම් තැනැත්තකුට විරුද්ධව කටයුතු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බව මහේස්ත්‍රාත්වරයාගේ මතය වන්නා අවස්ථාවක,

(අ) නඩුව පළමුවන උපලේඛනයේ හත්වන තීරය අනුව, පළමු කොට සිතාසිය නිකුත් කළ යුතු නඩුවක් නම් ඒ තැනැත්තා පැමිණ සිටීම සඳහා වූ සිතාසියක් ඔහු විසින් 63 වන වගන්තියෙහි විධි විධානවලට යටත්ව, නිකුත් කරනු ලැබිය යුතුය;

(ආ) නඩුව, එම තීරණය අනුව පළමු කොට වරෙන්තුවක් නිකුත් කළ යුතු නඩුවක් නම්, නියමිත වේලාවකදී ඒ තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙනෙනු ලැබීමට හෝ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට හෝ සැලැස්වීම සඳහා වරෙන්තුවක් ඔහු විසින් නිකුත් කරනු ලැබිය යුතුය;

(2) 136 (1) වන වගන්තියේ (ඈ) ඡේදය යටතේ ද නඩුවේ ඇති අවස්ථාවක චූදිතයා අධිකරණය ඉදිරියට ගෙන ආ තැනැත්තා ද නඩුවේ සිද්ධි සම්බන්ධයෙන් තොරතුරු දන්නා අධිකරණයට පැමිණ සිටින වෙනත් ඕනෑම තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයා විසින් දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට වහාම විභාග කරනු ලැබිය යුතුය;

එසේ වුවද, නඩුවේ සිද්ධි පිළිබඳව වාර්තාවක් මහේස්ත්‍රාත්වරයා ඉදිරියෙහි ඇත්නම් හෝ ලියවිල්ලකින් වූ පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ නම්, එවැනි විභාගයක් අවශ්‍ය නොවිය යුතුය.

(3) 136 (1) වන වගන්තියේ (ඉ) ඡේදය යටතේ හෝ (ඊ) ඡේදය යටතේ හෝ නඩු පවරා ඇති අවස්ථාවක, නඩුව සිතාසියක් හෝ වරෙන්තුවක් හෝ පළමු කොට නිකුත් කරනු ලැබිය යුතු වරදක් වන්නේ යයි පළමුවන උපලේඛනයේ හතරවන වගන්තිය මගින් විධි විධාන සලස්වා ඇති පරිදි වරෙන්තුවෙහි හෝ පැමිණිල්ලෙහි හො නම් සඳහන් තැනත්තාගේ පැමිණ සිටීම

සඳහා සිතාසියක් හෝ ඒ තැනැත්තා නියත වේලාවකදී අධිකරණය ඉදිරියට පමුණුවනු ලැබීමට හෝ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට සැලැස්වීම සඳහා වරෙන්තුවක් හෝ මහේස්ත්‍රාත්වරයා විසින් පළමු අවස්ථාවේදී නිකුත් කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 139 (3) වන වගන්තිය)

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 255 වන වගන්තියේ ප්‍රකාශ වන්නේ කාර්ය පටිපාටියට අවශ්‍ය වන අවස්ථාවක සාක්ෂිකරුවන් පැමිණ සිටීම සඳහා බල කිරීමට අධිකරණයට හැකියාවක් ඇති බවය. 255 (1) මහේස්ත්‍රාත් අධිකරණයක පැවැත්වෙන යම් පරීක්ෂණයක හෝ නඩු විභාගයක කාර්යය සඳහා, පැමිණ සිටින ලෙස යම් සාක්ෂිකරුවකුට බල කිරීමට හෝ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස බල කිරීමට හෝ අධිකරණ නියෝගයක් නිකුත් කරන මෙන් චෝදක විසින් හෝ චූදිතයා විසින් හෝ මහේස්ත්‍රාත්වරයකුගේ ඉල්ලීමක් කරනු ලැබුවහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු අනුව එවැනි අධිකරණ නියෝගයක් නිකුත් කිරීම අනවශ්‍ය යයි ඔහු සැලකුවහොත් මිස ඔහු විසින් අධිකරණ නියෝගයක් නිකුත් කළ යුතුය.

යම් සාක්ෂිකරුවකුගේ පැමිණීමට බල කෙරෙන ක්‍රියාදාමය ගැටළු සහගත හෝ ප්‍රමාද හෝ යුක්තියේ අවශ්‍යතාව සම්පූර්ණ කරන විටදී, මහේස්ත්‍රාත්වරයා සලකන අවස්ථාවකදී ඉල්ලුම්කරු විසින් ඔහුව සෑහීමකට පත්කළ යුතුය. එනම් එවැනි සාක්ෂිකරුවකුගේ සාක්ෂි භෞතික බව පිළිගැනීමට සාධාරණ පසුබිමක් ඇති බවටය. ඔහු සෑහීමකට පත් නොවන විටදී පහත කරුණ සිද්ධ වේ. එනම් සාක්ෂිකරුව නැවත ප්‍රයෝජනය සඳහා කැඳවීමට (එවැනි ප්‍රතික්ෂේප කිරීමකට අදාළව හේතූන් වාර්තා කිරීම) හෝ සාක්ෂිකරුව කැඳවීමට අවශ්‍ය වන වියදම ඔහු සිතන ආකාරයට යම් මුදලක් තැන්පත් කිරීම ද වේ. ( අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 255 (2) වන වගන්තිය)

<u>(7.6) පශ්චාත් මරණ පරීක්ෂණ.</u>

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 373 වන වගන්තියේ පශ්චාත් මරණ පරීක්ෂණ නියාමනය කර ඇත.

(1) මෘත ශරීරය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වන ලෙස හා මරණයට හේතුව සම්බන්ධයෙන් වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික්කයේ රජයේ වෛද්‍ය නිලධාරියාට හෝ වෙනත් යම් වෛද්‍ය වෘත්තිකයකුට හෝ නියම කිරීම අවස්ථානුකූල යයි මහේස්ත්‍රාත්වරයා විසින් නැතහොත් හෝ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් බලය පවරන ලද යම් මරණ පරීක්ෂකයකු විසින් සලකනු ලැබුවහොත්, ඒ මහේස්ත්‍රාත්වරයා විසින් හෝ මරණ පරීක්ෂකවරයා විසින් හෝ එසේ නියම කළ යුතුය.

(2) මෘත ශරීරය ඒ වන විට වළලනු ලැබ තිබේ නම් (1) වන උප වගන්තිය යටතේ වූ පශ්චාත් මරණ පරීක්ෂණය පිළිබඳ කාර්ය සඳහා ඒ මෘත ශරීරය නැවත ගොඩ ගැනීමට මහේස්ත්‍රාත්වරයා විසින් සලස්වනු ලැබිය හැකිය.

<u>(7.7) රඳවා තැබීම.</u>

පොලිස් බාරයේ රඳවා තබා සිටින සේවාදයකුගේ නීතිඥයා ඔහුව ශාරීරික වශයෙන් අයහපත් ලෙස සලකා ඇති බව විශ්වාස කරන විට නමුත් සේවාදයකයාට ඇති ප්‍රවේශය බලධාරීන් වළක්වන අවස්ථාවක් ගනිමු. එවිට නීතිඥවරයාට මහාධිකරණය වෙත කඩනමින් ඉල්ලීමක් ඉදිරිපත් කළ හැක. ඒ නියෝගයක් ඉල්ලමිනි. එනම් ඔහුට හැකි ඉක්මණින් සේවාදයකයා වෙත ප්‍රවේශය ලබාදෙන ලෙස ඉල්ලමිනි. මක්නිසාද ඔහුගේ ශාරීරික තත්ත්වය පරීක්ෂා කළ යුතු බැවිනි.

වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබූ තැනැත්තකු අවස්ථාගත සියලු කරුණු අනුව යුක්ති සහගත වන කාලයකට වඩා දීර්ඝ කාලයක් අත්අඩංගුවෙහි රඳවා තබා ගැනීම හෝ අන් ලෙසකින් රඳවාගෙන සිටීම කිසිම සාම නිලධරයකු විසින් නොකළ යුතු අතර, ඒ කාලය සිර භාරයට ගැනීම සිදුකළ ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත යාමට අවශ්‍ය කාලය අතරතුර

ගණන් බැලිය යුතු පැය විසි හතරක කාලය නොඉක්ම විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 37 වන වගන්තිය)

මේ පරිච්ඡේදය යටතේ වූ විමර්ශනයක් 37 වන වගන්තියේ නියම කරනු ලැබ ඇති පරිදි පැය විසි හතරක් වූ කාලය ඇතුළත නිම කරනු ලැබිය නොහැකි සහ වැඩිදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය බව විශ්වාස කිරීමට හේතු තිබෙන කවර හෝ විටක පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් හෝ පරීක්ෂකවරයා විසින්, ඒ කාරණයට අදාළ ඒ විමර්ශනය කරනු ලබන අතරතුරද විභාග කරනු ලැබූ එක් එක් සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශ කිසිවක් වේ නම්, ඒ ප්‍රකාශ පිළිබඳ සාරාංශයක් ද සමග ඒ සිද්ධිය පිළිබඳ වාර්තාවක්, ඒ කාරණය පිළිබඳව අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත වහාම යැවිය යුතු අතර එවේලේම සැකකරු ඒ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 115 (1) වන වගන්තිය)

වැඩිදුරටත් විමර්ශන පවත්වනු ලබන තුරු සැකකරු අත්අඩංගුවේ රඳවා තබා ගැනීම අවස්ථානුකූල බවට, මේ වගන්තිය යටතේ සැකකරුවකු ඉදිරිපත් කරනු ලැබුවේ යම් මහේස්ත්‍රාත්වරයකු වෙතද ඒ මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් වුවහොත්, ඔහු විසින් ස්වකීය හේතු ඉදිරිපත් කිරීමෙන් පසු, දවස් පහළොවක් වූ සම්පූර්ණ කාලයක් සඳහා, එහෙත් දින ගණන ඊට වැඩි නොවන පරිදි සැකකරු රඳවා තබා ගැනීමට යම් බන්ධනාගාරයක අධිකාරීවරයා වෙත යවනු ලබන බලපත්‍රයක් මගින් බලය දෙනු ලැබිය හැකිය. 264 වන වගන්තියේ විධි විධාන එවැනි සෑම බලපත්‍රයකටම අදාළ විය යුතුය. එකී දින පහළොවක් වූ කාලය අවසානයේදී නඩු පවරනු නොලැබුවහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් (3) වන උප වගන්තියේ විධි විධානවලට යටත්ව, සැකකරු නිදහස් කරනු ලැබිය හැකිය. නැතහොත් පෙනී සිටින ලෙස නියම කරනු ලැබුවහොත් සහ නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට බැඳුම්කරයකින් ලියා අත්සන් කරන ලෙස ඔහුට නියම කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 115 (2) වන වගන්තිය)

(අ) තමා විසින්ම අධිකරණයට භාර වූ හෝ,

(ආ) සිර භාරයට ගන්නා ලද යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයා විසින් ඇප පිට හෝ අන්‍යාකාරයකින් හෝ මුදාහරිනු නොලැබිය යුතුය.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධි විධාන) පනත බලාත්මක ව පවත්නා තාක් ඒ පනතේ විධි විධානවලට යටත්වූ දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන, 191 වන හා 296 වන වගන්ති යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සිදුකර ඇති බවට හෝ සිදු කිරීමෙහිලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදුකර ඇතැයි සැක කරනු ලබන බවට හෝ සිදුකිරීමෙහිලා සම්බන්ධ වී ඇතැයි සැකකරනු ලබන බවට වූ චෝදනාවක ප්‍රතිඵලයක් වශයෙන්,

එසේ වුවද නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් අන්‍යාකාරයකින් විධාන කරතහොත් මිස, ඒ තැන්ත්තා අධිකරණයට භාර වූයේ සිර භාරයට ගන්නා ලද දිනයෙහි සිට මාස 03 ක කාලයක් ඉකුත් වීමට පෙර මහේස්ත්‍රාත් අධිකරණයක හෝ මහාධිකරණයෙහි හෝ ඔහුට විරුද්ධව නඩු කටයුතු ඉදිරිපත් කර නොමැති නම් ඒ තැනැත්තා ඇප පිට මුදා හරිනු ලැබිය යුතුය.

එසේම තවදුරටත්, මේ උප වගන්තියේ වූ විධි විධානවල සඳහන් මාස තුනේ කාලය ඉකුත්වීමට පෙර හෝ පසුව හෝ මහාධිකරණය විසින් ඒ තැනැත්තා විශේෂ අවස්ථාගත කරුණු යටතේ ඇප මත මුදාහරිනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 115 (3) වන වගන්තිය)

115 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ආඥා කරන ලද රඳවා තබා ගැනීම එක් වතාවකට පහළොස් දිනක කාල සීමාවක් සඳහා විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 120 (2) වන වගන්තිය)

සැකකරුවකු බන්ධනාගාර අධිකාරීවරයකුගේ නීතියානුකූල අත්අඩංගුවේ සිටින කාලය තුළ, පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධාරියා විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට විමර්ශනය පැවැත්වීමේ තීරණය සඳහා යුක්ති සහගත වේලාවක් තුළ සැකකරු මුණ ගැසීමට ඒ පොලිස් නිලධාරියාට හෝ වෙනත් යම් පොලිස් නිලධාරියකුට හෝ අධිකරණයක් විසින් බලය දෙනු ලැබිය හැකිය. තවද පොලිස් ස්ථානයක් භාර නිලධාරියකු විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා පොලිස් ස්ථානයක් නොවන යම් ස්ථානායකින් වෙනත් ස්ථානයකට සැකකරු ගෙන යාම අවශ්‍ය යැයි ඒ අධිකරණය විසින් සලකනු ලැබුවහොත්, ඒ අධිකරණය විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ යම් නිලධාරීවරයකු සමග සැකකරු, එසේ යම් ස්ථානයකින් වෙනත් ස්ථානයකට ගෙන යාමට ඒ පොලිස් නිලධාරියාට හෝ නම් කරන ලද වෙනත් පොලිස් නිලධාරියකුට හෝ බලය දෙනු ලැබිය හැකිය.

එසේ වුවද මේ උප වග්නතියේ විධි විධාන යටතේ පොලිස් නිලධාරියකුට සැකකරුවකු මුණ ගැසිය හැකි කාලය තුළ හෝ පොලිස් නිලධාරියකු විසින් සැකකරුවකු යම් ස්ථානයකින් වෙනත් ස්ථානයකට ගෙන යනු ලබන කාලය තුළ, ඒ සැකකරු සාක්ෂි ආඥා පනතේ 27 වන වගන්තියේ (1) වන උප වගන්තිය අදාළ කිරීමේ කාර්යය සඳහා ඒ පොලිස් නිලධාරියාගේ අත්අඩංගුවේ සිටින චූදිත තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 115 (4) වන වගන්තිය)

37 වන වගන්තියේ විධි විධානවලට යටත්ව, විමර්ශනයක් පවත්වනු ලබන අතරතුර දී තැනැත්තකු රඳවා තබා ගැනීම සඳහා අවසර දීමට සෑම පරීක්ෂා කරන්නෙකුටම සහ පොලිස් ස්ථානයක් භාර නිලධාරියකුටම බලය තිබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 118 (2) වන වගන්තිය)

## 7.8 පොලීසිය සිදුකරන ප්‍රශ්න කිරීම්.

වරදක් සිදුකිරීම පිළිබඳ සෑම තොරතුරක්ම පොලිස් නිලධරයකු වෙත හෝ පරීක්ෂකයරයකු වෙත වාචිකව හෝ ලියවිල්ලක් හෝ දෙනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 109 (1) වන වගන්තිය)

එවැනි තොරතුරක් පොලිස් නිලධාරියකු වෙත හෝ පරීක්ෂකවරයකු වෙත වාචිකව දෙනු ලැබිණි නම්, එය දෙන ලද භාෂාවෙන් ඔහු විසින් එය ලියා ගතයුතු අතර තොරතුරු දැන්වූ තැනැත්තාට ඇසෙන සේ එය කියවිය යුතුය.

එසේ වුවද තොරතුරු දෙන ලෙස ලද භාෂාවෙන් එය වාර්තාගත කිරීමට පොලිස් නිලධාරියාට හෝ පරීක්ෂකවරයාට නොහැකි නම් ඒ පොලිස් නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් තොරතුරු ලිඛිතව දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකිය. ඒ තොරතුරු දැන්වූ තැනැත්තාට ඒ තොරතුරු ලිඛිතව දීමට නොහැකි නම්, ජාතික භාෂා අතුරින් එක් ජාතික භාෂාවකින් එය වාර්තාගත කිරීමට සිදු වූ හේතු වාර්තාගත කරනු ලැබීමෙන් පසුව, පොලිස් නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් ඒ තොරතුරු එක් ජාතික භාෂාවකින් වාර්තා ගත කොට තොරතුරු දැන්වූ තැනැත්තාට ඇසෙන සේ වාර්තාව කියවීම හෝ ඔහුට වැටහෙන භාෂාවෙන් එය භාෂණ පරිවර්තනය කිරීම හෝ කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 109 (2) වන වගන්තිය)

එවැනි සෑම තොරතුරක්ම, ලියවිල්ලකින් දෙනු ලැබුවද නැතහොත් ඉහත කී පරිදි ලියා ගනු ලැබුවේද, එය දැන්වූ තැනැත්තා විසින් අත්සන් කළ යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඒ පොලිස් නිලධාරියා විසින් හෝ පරීක්ෂකවරයා විසින් පහසු පරිදි, ඒ තොරතුර හෝ එහි පිටපතක් පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් පොලිස් ස්ථානයේ තබාගනු ලබන හෝ පරීක්ෂකවරයා විසින් තබා ගනු ලබන මෙහි මින්පසු "තොරතුරු සටහන් පොත" යනුවෙන් හඳුන්වනු ලබන, පොතක අප්‍රමාදව ඇතුළත් කරනු ලැබිය යුතුය. ඒ තොරතුරු සටහන් පොත අමාත්‍යවාරයා විසින් පොත් කාර්යය සඳහා සදනු ලබන නියෝග මගින් විධි විධාන සලස්වනු ලබනතුරු නියමිත දිනයට ඉහතින්ම වූ

දිනයෙහි භාවිත වූ ආකෘතිය හෝ ආකෘති, භාවිතය සඳහා දිගටම වලංගුව පැවතිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 109 (3) වන වගන්තිය)

තොරතුර ලැබුණු පොලිස් නිලධාරියා, පොලිස් ස්ථානය භාර නිලධාරියා නොවන්නේ නම් ඒ පොලිස් නිලධාරියා විසින් ඒ තොරතුර පිළිබඳ සිද්ධි පොලිස් ස්ථානය භාර නිලධාරියා වෙත වහාම වාර්තා කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 109 (4) වන වගන්තිය)

පොලිස් නිලධාරියකු ඉදිරිපිට යම් වරදක් කළ විට එම පොලිස් නිලධාරියා ප්‍රකාශයක් වාර්තා කළ යුතු අතර ඒ අදල ස්ථානයේ යම් පුද්ගලයකු හෝ වරද සිදුකිරීමේ ස්ථානය අදල විය යුතු අතරම යම් සැකකරුවකු සිටී නම් ඔහුගේ ද ප්‍රකාශයක් වාර්තා ගත කළ යුතුය. එම පොලිස් නිලධාරියා වරද සිදුකළ ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරියා නොවන විට එම පොලීසිය භාර පොලිස් ස්ථානාධිපතිවරයා වෙත අදල තොරතුරු වාර්තා කළ යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 109 (4) (අ) වන වගන්තිය)

ඉහත සඳහන් දේ පිළිබඳව තවදුරටත් පැහැදිළි කිරීමේදී අපරාධ නඩු විධින සංග්‍රහය පනත, 109 (5) හි මෙසේ තීරණය වී ඇත. සංඥෙය වරදක් සිදුකරන බව හෝ සාමය කඩ කිරීමක් සිදුකරන බව හෝ ලැබුණු තොරතුරු අනුව හෝ අන්‍යාකාරයකින් හෝ සැක කිරීමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකුට හෝ පරීක්ෂකවරයකුට හේතු තිබේ නම්, ඔහු විසින් ඒ වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ද පොලිස් ස්ථානයක් භාර යම් නිලධරයකු සම්බන්ධ වන විට ඔහුගේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙත ඒ පිළිබඳ වාර්තාවක් වහාම යැවිය යුතු අතර ඒ පිළිබඳ සිද්ධි සහ අවස්ථාගත කරුණු විමර්ශනය කිරීමට ද වරදකරු සොයා සිරභාරයට ගැනීම සඳහා අවශ්‍යය යම් පියවර ගැනීමට ද ඒ ස්ථානයට ඔහු පෞද්ගලිකව යා යුතුය. එසේ වුවද ඒ විමර්ශන කිරීම සඳහා වරදකරු සොයා සිරභාරයට ගැනීම පිණිස අවශ්‍ය යම් පියවර ගැනීම සඳහා ඒ ස්ථානයට යාම යම් පොලිස් ස්ථානක් භාර නිලධරයකු විසින් තමාගේ යටත් නිලධරයන් අතුරින් කෙනෙකුට පවරනු ලැබිය හැකිය. නැතහොත් විමර්ශනයක් ආරම්භ කිරීමට තරම් ප්‍රමාණවත් හේතු නොමැති බව ඔහුට පෙනී ගියහොත් ඒ කාරණය පිළිබඳව විමර්ශනය කිරීමට ඔහු බැඳී නොසිටිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 109 (5) වන වගන්තිය)

මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයක් කරන යම් පොලිස් නිලධරයකු විසින් හෝ පරීක්ෂකවරයකු විසින් ඒ පොලිස් නිලධරයාගේ පොලිස් ස්ථානයේ හෝ යාබද යම් පොලිස් ස්ථානයක හෝ බල සීමාව ඇතුළත නැතහොත් ඒ පරීක්ෂකවරයාගේ ප්‍රාදේශීය බල සීමාව ඇතුළත පදිංචිව සිටින්නා වූ ද එම කාරණය සම්බන්ධයෙන් අවස්ථාගත කරුනු දන්නා බව ලැබුණු තොරතුරු අනුව හෝ අන්‍යාකාරයකින් පෙනී යන්නා වූ ද යම් තැනැත්තකුට තමා ඉදිරියට පැමිණෙන ලෙස ලියවිල්ලක් වූ නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර එසේ නියම කරන ලද පරිදි ඒ තැනැත්තා පැමිණිය යුතුය.

පැමිණෙන ලෙස පරීක්ෂකවරයකු විසින් නියම කරනු ලැබූ විට, යම තැනැත්තකු එසේ පැමිණීම ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරිය හොත්, ඉහත කී නියමයන් මගින් නියම කරන ලද පරිදි ඒ තැනැත්තා පැමිණ සිටින බවට වගබලා ගැනීම පිණිස පරීක්ෂකවරයා විසින් තම අභිමතය පරිදි වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 109 (6) වන වගන්තිය)

මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයක් කරන යම් පොලිස් නිලධාරියකු විසින් හෝ පරීක්ෂකවරයකු විසින් එම කාරණය පිළිබඳ සිද්ධි සහ අවස්ථාගත කරුණු දනිතැයි සිතිය හැකි යම් තැනැත්තකු හෝ වාචිකව විභාග කරනු ලැබිය හැකි අතර එසේ විභාග කරනු ලැබූ තැනැත්තා විසින් කරන ලද ඕනෑම ප්‍රකාශයක් ලියාගත යුතුය. එහෙත් එවැනි යම් තැනැත්තකු ලවා යම් දිව්රුමක් හෝ ප්‍රතිඥාවක් කරවීම හෝ නොකළ යුතුය. 109 (2) වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට ඒ මුළු ප්‍රකාශයම සම්පූර්ණයෙන්ම වාර්තාගත කළ යුතුය. පොලිස් නිලධාරියා විසින් හෝ පරීක්ෂකවරයා

විසින් හෝ යම් දෙයක් පැහැදිලි කර ගැනීම සඳහා යම් ප්‍රශ්නයක් සහ උත්තරයක් වශයෙන් වාර්තාගත කළ යුතුය. ඒ වාර්තාව ඔහුට පෙන්වීම හෝ ඔහුට ඇසෙන ලෙස කියවීම හෝ කළ යුතුය. එය ලියනු ලැබ තිබෙන භාෂාව ඔහුට නොවැටහේ නම්, ඔහුට වැටහෙන භාෂාවකින් එය භාෂිත පරිවර්තනය කරනු ලැබිය යුතු අතර එම ප්‍රකාශය පැහැදිලි කිරීමට හෝ ඊට යමක් කිරීමට හෝ ඔහුට නිදහස තිබිය යුතුය.

එවිට ප්‍රකාශය කරන තැනැත්තා විසින් ඒ ප්‍රකාශය අවසාන වන තැනම අත්සන් කළ යුතුය. ඒ ප්‍රකාශය වාර්තාගත කරන පොලිස් නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් එසේ වාර්තාගත කරනු ලබන එක් එක් ප්‍රකාශයට ....... පහත සඳහන් සහතිකය ලිවිය යුතුය.

"ඉහත නම සඳහන් ..................... ගේ ප්‍රකාශය ................ වන මා විසින් අවංක ලෙසත් නිවැරදි ලෙසත් වාර්තාගත කරන ලද බවට මම මෙයින් ප්‍රකාශ කරමි."

ඒ ප්‍රකාශය තොරතුරු සටහන් පොතෙහි වාර්තාගත කරුනු නොලැබුවහොත් එහි සත්‍ය පිටපතක් ඒ පොලිස් නිලධාරියා විසින් හෝ පරීක්ෂා කරන්නකු විසින් හැකි පහසු ඉක්මණින් තොරතුරු සටහන් පොතෙහි ඇතුළත් කළ යුතුය. ඒ ප්‍රකාශයෙහි යම් වෙනසක් කරන විට එය කරන තැනැත්තා විසින් එහි තම කෙටි අත්සන යෙදිය යුතුය. තවද කරන ලද වෙනස් කිරීම හේතුවෙන් ඉවත් කිරීමට අවශ්‍ය වන ප්‍රකාශයෙහි යම් කොටසක් ඒ කොටස කියවීමට නොහැකි බවට පත් නොවන යම් ආකාරයකින් කපා හරිනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 110 (1) වන වගන්තිය)

තමා අපරාධ චෝදනාවකට හෝ දණ්ඩනයකට හෝ රාජ්‍යය සන්තක කිරීමකට භාජනය කිරීමේ නැඹුරුතාවක් ඇති ප්‍රශ්න හැර ඒ කාරණය ට අදාලව ඒ නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් තමාගෙන් අසනු ලබන සියලු ප්‍රශ්නවලට සත්‍ය පිළිතුරු දීමට ඒ තැනැත්තා යටත් විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 110 (2) වන වගන්තිය)

යම් විමර්ශනයක් කරනු ලබන අතරතුර යම් තැනැත්තකු විසින් යම් පොලිස් නිලධාරියකුට කරන ලද ප්‍රකාශයක් ඒ තැනැත්තාගේ සාක්ෂි අධිකරණයේදී අදාළ කිරීමේ කාර්යය සඳහා හැර, සාක්ෂි ආඥා පනතේ විධි විධානවලට අනුකූලව උපයෝගී කරගනු ලැබිය හැකිය.

එසේ වුවද යම් විමර්ශනයක් පවත්වනු ලබන අතරතුර දී චූදිත තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් ඔහු වෙනස් ප්‍රකාශයක් වෙනස් වේලාවකදී කළ බව ඔප්පු කිරීමට පමණක් පාවිච්චි කළ යුතුය.

මේ උප වගන්තියෙහි වූ කිසිවක්, සාක්ෂි ආඥා පනතේ 27 වන වගන්තියේ විධි විධාන යටතේ ගැනෙන යම් ප්‍රකාශයකට අදාළ වන්නේ යැයි හෝ යම් විමර්ශනයක් පවත්වනු ලබන අතරතුරදී යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් දණ්ඩ නීති සංග්‍රහයෙහි 180 වන වගන්තිය යටතේ වූ චෝදනාවක දී සාක්ෂි වශයෙන් උපයෝගී කරගනු ලැබීම ඒ කිසිවකින් වළක්වන්නේ යැයි හෝ සලකනු නොලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 110 (3) වන වගන්තිය)

යම් අපරාධ අධිකරණයක පරීක්ෂණයකට හෝ නඩු විභාගයකට නියමිතව තිබෙන යම් නඩුවකදී යම් වාර්තාගත කරන ලද ප්‍රකාශ ඒ නඩුවේ සාක්ෂි වශයෙන් නොව, ඒ පරීක්ෂණයේදී හෝ නඩු විභාගයේදී ආධාරයක් ලෙස උපයෝගී කරගනු ලැබිය හැකිය. 444 වන වගන්තියෙහි අන්‍යාකාරයකින් විධි විධාන සලස්වා ඇති පරිදි හැර, හුදෙක් ඒ ප්‍රකාශ පිළිබඳව අධිකරණය විසින් සඳහන් කරනු ලැබීම නිසාම ඒ ප්‍රකාශ ඉල්ලා සිටීමට හෝ ඒ ප්‍රකාශ බැලීමට හෝ චූදිතයාට හෝ ඔහුගේ අනුයෝජිතයන්ට හිමිකම් නොතිබිය යුතුය. එහෙත් ඒ ප්‍රකාශ වාර්තාගත කළ පොලිස් නිලධාරියා විසින් හෝ පරීක්ෂකවරයා විසින් හෝ සාක්ෂිකරු විසින් තම මතකය අලුත් කර ගැනීම පිණිස ඒ ප්‍රකාශ උපයෝගී කරගනු ලැබුවහොත් හෝ ඒ පොලිස් නිලධාරියාගේ හෝ පරීක්ෂකවරයාගේ හෝ සාක්ෂිකරුගේ සාක්ෂි බිඳ හෙලීමේ කාර්යය සඳහා අධිකරණය විසින් ඒ ප්‍රකාශ උපයෝගී කරගනු ලැබුවහොත් අවස්ථාවෝචිත පරිදි සාක්ෂි ආඥා පනතේ 161 වන වගන්තියේ 145 වන වගන්තියේ විධි විධාන අදාළ විය යුතුය.

එසේ වුවද යම් වරදක් සම්බන්ධයෙන් xv වන පරිච්ඡේදය යටතේ මූලික පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවක, ඒ දක්වා වාර්තාගත කර තිබෙන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ චූදිතයා විසින් ඉල්ලා සිටින ලද විට ඔවුන් විසින් කියවා බලනු ලැබීම සඳහා ඔහුට ලබාගත හැකිවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 110 (4) වන වගන්තිය)

යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති යම් තැනැත්තකුට විරුද්ධව ඇති ඒ චෝදනාව පිළිබඳව යම් ප්‍රකාශයක් කරන ලෙසට ඒ තැනැත්තා පෙළඹවීම පිණිස යම් පරීක්ෂකවරයකු විසින් හෝ පොලිස් නිලධාරියකු විසින් යම් පෙළඹවීමක් කිරීම, තර්ජනයක් කිරීම හෝ පොරොන්දුවක් දීම නැතහොත් පෙළඹවීමක් හෝ තර්ජනයක් කිරීමට හෝ පොරොන්දුවක් දීමට සැලැස්වීම හෝ නොකළ යුතුය. එහෙත් මේ පරිච්ඡේදය යටතේ යම් විමර්ශනයක් කරනු ලබන අතරතුරදී සිය කැමැත්තෙන්ම යම් ප්‍රකාශයක් කිරීමට කැමති වන යම් තැනැත්තකු යම් අවවාදයක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉන් වැළැක්වීම හෝ අධෛර්යට පත් කිරීම යම් පරීක්ෂකවරයකු විසින් හෝ පොලිස් නිලධාරියකු විසින් හෝ නොකළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 111 වන වගන්තිය)

සංඥෙය කාරණයක් පිළිබඳව විමර්ශනයක් පැවැත්වීම සඳහා යම් ලේඛනයක් හෝ දෙයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි විමර්ශනයක් කරන යම් පොලිස් ස්ථානයක් භාර නිලධාරියකුගේ පරීක්ෂකවරයාද සලකන හා 66 වන වගන්ති යටතේ සිතාසියක් හෝ ආඥාවක් නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබිය හැකි තැනැත්තකු ඒ සිතාසියේ හෝ ආඥාවෙන් විධාන කර ඇති පරිදි ඒ ලේඛනය හෝ දෙය ඉදිරිපත් නොකරනු ඇතැයි විශ්වාස කිරීමට හේතු තිබෙන කවර හෝ විටක නැතහොත් ඒ ලේඛනය හෝ දෙය යම් තැනැත්තකුගේ සන්තකයේ තිබේ යැයි නොදන්නා විටක ඒ නිලධාරියා විසින් හෝ පරීක්ෂකවරයා විසින් යම් ස්ථානයක් ඒ සඳහා සෝදිසි කිරීම හෝ සෝදිසි කිරීමට සැලැස්වීම හෝ කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 112 (1) වන වගන්තිය)

හැකි නම්, ඒ සෝදිසිය ඒ නිලධාරියා විසින්ම හෝ පරීක්ෂකවරයා විසින්ම කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 112 (2) වන වගන්තිය)

ඔහුට ඒ සෝදිසිය පෞද්ගලිකව කළ නොහැකි නම් සහ ඒ සෝදිසිය කිරීමට බලය ඇති වෙනත් තැනැත්තකු ඒ වේලාවේදී නොසිටී නම් ඒ සෝදිසිය කරන ලෙස ඔහු විසින් යම් ග්‍රාම සේවා නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි අතර සෝදිසිය කළ යුත්තේ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් පිළිබඳව ද ඒ ලේඛනය හෝ දෙය සහ සෝදිසි කරනු ලැබිය යුතු ස්ථානය දැක්වෙන ලියවිල්ලකින් වූ නියමයක් ඔහු විසින් ඒ ග්‍රාම සේවා නිලධාරියාට භාර දිය යුතුය. එවිට ඒ ග්‍රාම සේවා නිලධාරියා විසින් ඒ දෙය සඳහා ඒ ස්ථානය සෝදිසි කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 113 (3) වන වගන්තිය)

ග්‍රාම නිලධාරියා යනු ශ්‍රී ලාංකීය රාජ්‍යය සේවකයෙකි. ඔහුව පත් කරන්නේ මධ්‍යම ආණ්ඩුවයි. ඔහු ග්‍රාම නිලධාරී කොට්ඨාශයක පරිපාලන වගකීම් කරගෙන යා යුතුය. එම ග්‍රාම නිලධාරී කොට්ඨාශය ප්‍රාදේශීය ලේකම් යටතේ පවතින උප ඒකකයකි. මෙම ග්‍රාම නිලධාරීන් අදාළ ප්‍රදේශය තුළ සිදුවන අපරාධ කටයුතු පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු අතරම ප්‍රදේශවාසීන් ඉල්ලූ විට ඔවුන් වෙනුවෙන් චරිත සහතික නිකුත් කළ යුතුව ඇත. සාම නිලධරයකු ලෙස දිව්රුම් දී ඇත්නම් ඔවුන්ට පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ හැකියාව තිබේ.

යම් යටත් පොලිස් නිලධරයකු විසින් මේ පරිච්ඡේදය යටතේ යම් විමර්ශනයක් කරන ලද විට ඔහු විසින් ඒ විමර්ශනයේ ප්‍රතිඵලය පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වාර්තා කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 113 වන වගන්තිය)

චූදිතයා මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබීම යුක්ති සහගත වීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි හෝ සැකයක් පිළිබඳ සාධාරණ හේතු ඇති බව මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයෙන් පසු, පොලිස් ස්ථානය භාර නිලධාරියාට හෝ පරීක්ෂකවරයාට පෙනී ගියහොත්, ඒ

තැනැත්තා අත්අඩංගුවේ සිටී නම් ඒ වරද පිළිබඳව නඩු විභාග කිරීම සඳහා හෝ පරීක්ෂණයක් කිරීම සඳහා අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ පෙනීසිටින ලෙස නියම කරනු ලැබුවහොත් සහ නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට, ඒ නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් විධාන කරනු ලබන පරිදි ඇප ඇතිව හෝ නැතිව ඒ තැනැත්තා විසින් බැඳුම්කරයක් මගින් ඔහු මුදාහැරිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 114 වන වගන්තිය)

මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයක් කරනු ලැබූ විට තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී තිබෙන බව හෝ වැඩිදුර විමර්ශනය කිරීම අවශ්‍ය බව පොලිස් ස්ථානය භාර නිලධාරියාට හෝ පරීක්ෂකවරයාට පෙනී ගියහොත්, ඒ නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් ඒ කාරණය පිළිබඳව අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත සැකකරු අත්අඩංගුවේ හෝ ඉදිරිපත් කිරීම හෝ වරද ඇප දිය හැකි වරදක් නම් සහ ඇප දීමට සැකකරුට හැකි නම්, ඒ අධිකරණය ඉදිරියේ ඔහුගේ පෙනී සිටීම සඳහා ඔහුගෙන් ඇප ලබා ගැනීම හෝ කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 116 (1) වන වගන්තිය)

පොලිස් ස්ථානයක් භාර නිලධරයා විසින් හෝ පරීක්ෂකවරයා විසින් සැකකරු මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලද හෝ ඔහුගේ පෙනී සිටීම සඳහා ඇප ලබාගන්නා ලද විටක, ඒ අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය යම් ආයුධයක් හෝ වෙනත් භාණ්ඩයක් හෝ ලේඛනයක් හෝ ආදර්ශකයක් හෝ සාම්පලයක් ඒ නිලධාරියා විසින් හෝ පරීක්ෂකවරයා විසින් ඒ අධිකරණය වෙත යැවිය යුතුය. තවද බැඳුම්කරයේ සඳහන් කරනු ලබන මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ පෙනී සිට, සැකරුට විරුද්ධව ඇති චෝදනාව පිළිබඳ කාරණයෙහිලා සාක්ෂි දෙන බවට බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙසට (චෝදනාකරුවකු සිටී නම්) චෝදනාකරුට ද ඒ කාරණය පිළිබඳව අවස්ථාගත කරුණු දන්නා බවට ඒ නිලධාරියාට හෝ පරීක්ෂකවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අවශ්‍ය යැයි ඔහු සලකන තැනැත්තන් සංඛ්‍යාවකට ද ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් නියම කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 116 (2) වන වගන්තිය)

පොලිස් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහේස්ත්‍රාත්වරයා විසින් එවැනි යම් ආයුධයක් හෝ වෙනත් භාණ්ඩයක් හෝ ලේඛනයක් හෝ ආදර්ශකයක් හෝ සාම්පලයක් අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුවේ රස පරීක්ෂක, සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා වෙත විශ්ලේෂණය කොට අධිකරණයට වාර්තා කරනු ලැබීම සඳහා ඉදිරිපත් කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 116 (3) වන වගන්තිය)

1 වන උප වගන්තියේ (116 (1) ) හෝ 2 වන (116 (2) ) උප වගන්තියේ සඳහන් බැඳුම්කරය ලියා අත්සන් කරනු ලැබුවේ යම් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු ඉදිරිපිටදී ද ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් ඒ බැඳුම්කරය මහේස්ත්‍රාත් අධිකරණය වෙත යැවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 116 (4) වන වගන්තිය)

යම් චෝදනාකරුවකු හෝ සාක්ෂිකරුවකු ඒ බැඳුම්කරය ලියා අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත්, ඒ නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ බව වාර්තා කළ යුතු අතර එවිට සැකකරුට විරුද්ධව නගා ඇති චෝදනාව පිළිබඳ කාරණයෙහිලා සාක්ෂි දීම පිණිස ඒ අධිකරණය ඉදිරිපිට ඒ චෝදනාකරු හෝ සාක්ෂිකරු, පැමිණෙන බවට වගබලා ගැනීම සඳහා ඒ අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි වරෙන්තුවක් හෝ සිතාසියක් නිකුත් කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 116 (5) වන වගන්තිය)

යම් පරීක්ෂකවරයකු විසින් විමර්ශනය කරනු ලබන යම් වරදක් පිළිබඳ පරීක්ෂණයක් කිරීමට අධිකරණ බලය ඇති යම් මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ කාරණය ඒ පරීක්ෂකවරයා ඕනෑම

අවස්ථාවකදී ඉවත් කොට එය තමා විසින්ම නඩු විභාග කිරීම හෝ නඩු විභාගයක් පිණිස ඉදිරිපත් කිරීම හෝ කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 119 වන වගන්තිය)

මේ පරිච්ඡේදය යටතේ වූ සෑම විමර්ශනයක් ම අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව නිම කරනු ලැබිය යුතුය. ඒ විමර්ශනය දින පහළොවක් ඇතුළත නිම කරනු ලැබිය නොහැකි අවස්ථාවකදී පොලිස් ස්ථානය භාර නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් දවස් පහළොව අවසානයේදී සහ ඉන්පසු විමර්ශනය නිමවන තුරු සෑම දවස් පහළොවක කාලය අවසානයේදීම, සිද්ධි පිළිබඳව සහ විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් ඒ කාරණය පිළිබඳ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත යැවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 120 (1) වන වගන්තිය)

විමර්ශනය නිම කරනු ලැබූ වහාම පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් නියමිත ආකෘතියෙහි වූ වාර්තාවක් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. සැකකරු යම් වරදක් සිදුකර ඇති බවට හෝ යම් වරදක් සිදු කිරීමෙහිලා සැකකරු සම්බන්ධ වී ඇති බවට හෝ වාර්තාවෙහි කිසිම චෝදනාවක් නොවුවහොත් මහේස්ත්‍රාත්වරයා විසින් ඔහු නිදෙස් කරනු ලැබිය යුතුය. සැකකරු වරදක් සිදුකර ඇති බවට හෝ වරදක් සිදුකිරීමෙහිලා සැකකරු සම්බන්ධ වී ඇති බවට වූ වාර්තාවෙහි චෝදනාවක් වුවහොත්, මේ සංග්‍රහයේ විධි විධානවලට අනුකූලව ඔහුට විරුද්ධව නඩු පවරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 120 (3) වන වගන්තිය)

විමර්ශනයක් පවත්වාගෙන යාම සඳහා වෛද්‍යවරයකු විසින් යම් තැනැත්තකු පරීක්ෂා කරනු ලැබීම අවශ්‍ය යැයි පොලිස් ස්ථානයක් භාර යම් නිලධාරියකු සලකන අවස්ථාවක, ඔහු විසින් ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු ලවා ඒ තැනැත්තා පරීක්ෂා කරවීම ට සලස්වනු ලැබිය හැකිය. ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂණයේ ප්‍රතිඵල දක්වමින් පොලිස් නිලධාරියා වෙත වාර්තා කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 122 (1) වන වගන්තිය)

එසේ පරීක්ෂා කරනු ලැබීමට (1) වන උප වගන්තියේ සඳහන් තැනැත්තකු කැමති නොවන අවස්ථාවක ඒ තැනැත්තා පරීක්ෂා කර ඒ පිළිබඳව වාර්තා කිරීම සඳහා ආඥාවේ නම සඳහන් කරනු ලබන ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු වෙත බලය දෙන ආඥාවක් සඳහා විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරයකු ගේ අධිකරණ බල සීමාව ඇතුළතද ඒ මහේස්ත්‍රාත්වරයා වෙත ඒ පොලිස් නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකිය. එවැනි ආඥාවක් කරන ලද අවස්ථාවකදී, ඒ තැනැත්තා ඒ ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියා ඉදිරියේදී පරීක්ෂකවරයාට භාර විය යුතු අතර ඒ ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂණයේ ප්‍රතිඵල දක්වමින් මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 122 (2) වන වගන්තිය)

විමර්ශනයක කාර්යය සඳහා විමර්ශනයට ලක් කරනු ලැබී ඇති වරද ගැන සැක කරනු ලබන යම් තැනැත්තකුගේ, යම් ඇඟිල්ලක, අත්ලක හෝ යම් පාදයක සලකුණක් හෝ ශරීරයේ යම් කොටසක සලකුණක් හෝ ඒ තැනැත්තාගේ කෙළවල, මූත්‍රාවල, හිස කෙස්වල හෝ නියපොතුවල ආදර්ශකයක් හෝ නියපොතුවල සූරා ගන්නා ලද කොටසක් ගැනීම අවශ්‍ය යැයි පොලිස් ස්ථානයක් භා යම් නිලධරයකුගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව එසේ කිරීමට ඒ පොලිස් නිලධාරියා විසින් සලස්වනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 123 (1) වන වගන්තිය)

එවැනි සලකුණක්, ආදර්ශයක් හෝ සූරණු ලැබූ කොටසක් ගැනීම ගැන 123 (1) වන උප වගන්තියේ සඳහන් තැනැත්තා කැමති නොවන අවස්ථාවක ඒ පොලිස් නිලධාරියා විසින් එවැනි යම් සලකුණක්, ආදර්ශකයක් හෝ සූරා ගනු ලැබූ කොටසක් ගැනීම සඳහා පොලිස් නිලධාරියකුට බලය දෙන ආඥාවක් සඳහා විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල සීමාව ඇතුළත ද, ඒ මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 123 (2) වන වගන්තිය)

විමර්ශනයේ කාර්යය සඳහා අත් අකුරු කිසිවක් සංසන්දනය කර බැලීමට අවශ්‍ය වූ අවස්ථාවක යම් තැනැත්තකුගේ අත් අකුරුවල ආදර්ශකයක් සිදුකර කැමැත්ත ඇතිව ගැනීමට පොලිස් ස්ථානයක් භාර යම් නිලධරයකු විසින් සලස්වනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 123 (3) වන වගන්තිය)

තම අත් අකුරුවල ආදර්ශකයක් දීම ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරණ අවස්ථාවක ඔහුගේ අත් අකුරුවල ආදර්ශකයක් දිය යුතු බවට ඒ තැනැත්තාට නියම කරණ ආඥාවක් සඳහා විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත්වරයා ගේ පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා ඒ ආඥාවට ක්‍රියා කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 123 (4) වන වගන්තිය)

විමර්ශනයක් පවත්වාගෙන යෑමට සහය දෙන ලෙස ඉල්ලීමක් කරනු ලැබුවේ යම් මහේස්ත්‍රාත්වරයකු වෙතද ඒ සෑම මහේස්ත්‍රාත්වරයකු විසින්ම, විමර්ශනයක් පැවැත්වීමට සහය දිය යුතු අතර, විශේෂයෙන්ම වරදකරු කවරෙක්ද යන වග නිසැකවම දැනගැනීමේ කාර්යය සඳහා හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වීමට හෝ පැවැත්වීමට බලය දීම සහ ඒ කාර්යය සඳහා ඒ පෙරෙට්ටුවට සහභාගී වන ලෙස සැකකරුවකුට හෝ වෙනත් යම් තැනැත්තකුට නියම කිරීම සහ ඒ පෙරෙට්ටුවේ කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම හෝ කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 124 වන වගන්තිය)

මේ පනතෙහි හෝ වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සදහන්ව ඇතිද, යම් වරදක් සඳහා මේ පරිච්ඡේදය යටතේ ද යම් විමර්ශනයක් නොකර පොලිස් අධිකාරීවරයකුගේ පදවියට වඩා නොඅඩු පදවියක යම් පොලිස් නිලධාරියකු විසින් ඕනෑම අවස්ථාවකදී භාරගනු ලැබීම හා විමර්ශනය පවත්වාගෙන යෑම සහ මෙහෙයවීම ද ඒ කාර්යය සඳහා තමා විසින් තෝරාගනු ලැබූ යම් පොලිස් නිලධාරියකු විසින් දිවයිනේ යම් පළාතකින් තෝරාගනු ලැබූ විශේෂයෙන් තෝරාගත් පොලිස් නිලධරයන් කණ්ඩායමක් විසින් ඒ විමර්ශනය හෝ එහි යම් කොටසක් වශයෙන් පවත්වාගෙන යනු ලැබීමට සැලැස්වීම නීත්‍යනුකූල විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 125 වන වගන්තිය)

<u>(7.9) චූදිත සිදුකළ ප්‍රකාශ.</u>

චූදිත, දැනටමත් පොලීසියට ප්‍රකාශයක් සිදුකර ඇති විට එය වාර්තා නොකරන අතරම නීතිඥවරයාට එම වාර්තාගත ප්‍රකාශය තමාට බැලීමට ඉඩ දෙන ලෙස ඉල්ලිය හැක. එහි පිටපතක් ද ඉල්ලා සිටිය හැක.

සේවාදයකයා පොලීසියට තවමත් ප්‍රකාශයක් කර නැත්නම් ඔහු සේවාදයකයා දැනුවත් කළ යුතුය. ඔහු එහිදී පහත ආකාරයට තීරණය කළ යුතු වේ. එනම් ප්‍රකාශය සෑදීමට කවර ආකාරයේ උපදෙස් තම සේවාදයකයාට ලබාදිය යුතු ද යන්නය. සාමාන්‍යයෙන් ගත් කල සේවාදයකයා ප්‍රකාශයක් ලබාදීමට අනවශ්‍ය ලෙස කලබල නොවිය යුතු අතරම ඒ සඳහා වඩාත් පරිස්සමින් සලකා බැලිය යුතුව ඇත.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 126 වන වගන්තියට අනුව මහේස්ත්‍රාත්වරුන් සාම නිලධාරීන්ට ප්‍රකාශ ලබා දීමේදී පහත ආකාරයට තීරණය කළ යුතුය.

xxi වන පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇති යම් තැනැත්තකුට විරුද්ධව ඇති ඒ චෝදනාව පිළිබඳව යම් ප්‍රකාශයක් කරන ලෙසට ඒ තැනැත්තා පෙළඹවීම පිණිස යම් සාම නිලධාරියකු හෝ බලය ලත් තැනැත්තකු විසින් යම් පෙළඹවීමක් හෝ තර්ජනයක් කිරීම හෝ පොරොන්දුවක් දීමට සැලැස්වීම හෝ නොකළ යුතුය. එහෙත් එය කැමැත්තෙන්ම යම් ප්‍රකාශයක් කිරීමට කැමති වන යම් තැනැත්තකු යම් අවවාදයක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉන් වැළැක්වීම හෝ අධෛර්යට පත්කිරීම යම් සාම නිලධරයකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ නොකළ යුතුය.

විත්තියේ නීතිඥවරයා සේවාදායකයාට උපදෙස් ලබාදිය යුතුය. ඒ ප්‍රකාශය සේවාදායකයාගේ අභිලාෂයන්ට සහය වන ලෙස කුමන වාතාවරණයක් යටතේ සකස් කිරීම පිළිබඳවය. නිර්දෝෂී පුද්ගලයා තම නිර්දෝෂී භාවය පැහැදිළිවම කියා සිටින අතර එය සැක කටයුතු වන විට එසේ ඉල්ලීමට අපොහොසත් වේ. එසේ නොවුවහොත් එය පසු අවස්ථාවකදී අයහපත් තත්ත්වයක් ඇති කරනු ඇත. තම සේවාදයකයා නිර්දෝෂී බව නීතිඥයාට පැහැදිළි ලෙස පෙනෙන විට ඔහුගේ නිර්දොෂී භාවය පහසුවෙන් ස්ථාපිත කළ හැක. එවිට අන්‍යඅස්ථානික භාවය/නොහැකියාව පරීක්ෂා කිරීම කළ හැකි අතරම සේවාදයකයා හැකි ඉක්මණින් එය සිදුකළ යුතුය. එවිට සේවාදයකයාගේ කතාව විමර්ශනය කිරීමට පුළුවන් වන අතරම අදල කරුණ පහැදිළි කිරීමද සිදුකළ හැකි වන අතර සේවාදයකයාට නිදහස් විය හැකිය.

මෙම අත්පොතේ 5 වන පරිච්ඡේදයේ පහත කරුනු පෙන්නුම් කෙරිණි. සේවාදයකයා අන්‍යඅස්ථානික භාවය/නොහැකියාව පිළිබඳ විත්ති වාචකය මත රැඳී සිටීමට අදහස් කරන අවස්ථාවකදී ඔහු/ඇය ඒ පිළිබඳව දැනුම් දිය යුතුය. තවද එය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 126 (අ) ඡේදයට අනුව එය ඉල්ලා සිටිය යුතුව ඇත.

නීතිඥවරයා, සේවාදයකයාට නිරතුරුව පවසා සිටිය යුත්තේ සේවාදයකයාගේ උපදෙස් මත ප්‍රකාශය සෑදීමට නීතිඥවරයාට ඉඩ ලබාදෙන ලෙසය. එවිට ප්‍රකාශය පරිස්සමින් සකස් කෙරෙන අතරම සේවාදයකයාගේ නඩුව පැහැදිළිව දැක්විය හැකිය. තවද එය තාර්කික වන අතරම විස්තර ද අදල ලෙස දැක්වේ. එවිට නීතිඥවරයා පොලීසියට දන්වා සිටින්නේ තමන් ප්‍රකාශය සකස් කළ බවත් එය සේවාදයකයා අත්සන් කළ පසුව පොලීසියට භාර දෙන බවත්ය. ඔහු සේවාදයකයාට ද පහත ලෙස ප්‍රකාශ කළ යුතුය. ඒ පොලීසිය ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගැනිමට සැරසෙන බවත් එවිට ඔහු වෙනුවෙන් ප්‍රකාශය සෑදීම ඔහුගේ නීතිඥවරයා සිදුකරන අතර එය නිසි ක්‍රියාදමය ඇතිව ඉදිරිපත් කරන බවත්ය.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන ඡේදයේ නිශ්චිත ක්‍රියාදමයක් සහ බලතල දක්වා ඇති අතර එය මහේස්ත්‍රාත්වරුන්ට ප්‍රකාශ හෝ පාපොච්ඡාරණ වාර්තා කිරීම ගැන ඇති බලපෑම් වලට අදල වේ.

(i) යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් ආරම්භ කිරීමට හෝ යම් අවස්ථාවකදී තමා වෙත කරනු ලබන යම් ප්‍රකාශයක් යම් මහේස්ත්‍රාත්වරයකු විසින් වාර්තාගත කරනු ලැබිය හැකිය.

(ii) ඒ ප්‍රකාශය 277 වන වගන්තියෙහි විධි විධාන සලස්වා ඇති පරිදි වාර්තාගත කර, අත්සන් තබා, දිනය යොද, ඉක්බිතිව කාරණය පිළිබඳ පරීක්ෂණය හෝ නඩු විභාගය හෝ කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ද ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

මහේස්ත්‍රාත්වරයා වාර්තා කරන ප්‍රකාශය පාපොච්ඡාරණය වන විට 127 (3) වන වගන්තිය වැදගත්ය.

(iii) පාපොච්ඡාරණයක් වූ යම් ප්‍රකාශයක් කරන තැනැත්තාගෙන් ප්‍රශ්න කළ විට, එය ස්වේච්ඡාවෙන් කරන ලද බව විශ්වාස කිරීමට තමාට හේතු ඇතොත් මිස කිරීම මහේස්ත්‍රාත්වරයකු විසින් අපරාධ පාපොච්ඡාරණයක් වූ යම් ප්‍රකාශයක් වාර්ත ගත නොකළ යුතුය. තවද එවැනි යම් ප්‍රකාශයක් ඔහු විසින් වාර්තාගත කරනු ලබන විට, ඒ වාර්තාව යටින් පහත දැක්වෙන අන්දමේ සටහනක් ඔහු විසින් කළ යුතුය.

මෙම ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරනු ලබන බවට මම විශ්වාස කරමි. එය මා ඉදිරියෙහි මට ඇසෙන සේ සටහන් කරගනු ලැබූ සහ කළ තැනැත්තාට මා විසින් එය කියවා දෙන ලදුව එය නිවැරදි බව ඔහු විසින් පිළිගන්නා ලදි. තවද ඔහු විසින් කරන ලද සම්පූර්ණ ප්‍රකාශය එහි නිවැරදි ලෙස ඇතුළත් වී ඇත්තේය.

(අත්සන් කළේ) ඒ.බී.

...................................

මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා.

සමහර සිද්ධි පිළිබඳ පොලීසියට ප්‍රකාශයක් නොකර සිටීම සේවාදයකයාට හොඳය. ඒ සේවාදයකයාට විරුද්ධව අපරාධ චෝදනා කිරීමට පොලීසියට කිසිදු සාක්ෂියක් නොමැති අවස්ථාවලදී ඔවුන් තම නඩුව චූදිතගේ ප්‍රකාශ ඔස්සේ සකස් කිරීමට බලාපොරොත්තු වන වට්දීය.

(7.10) නිහඬව සිටීමට ඇති අයිතිවාසිකම.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිහඬව සිටීමට ඇති අයිතිවාසිකම සහතික කරන්නේ නැත. ඒ නමුත් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 110 (2) වන වගන්තිය චූදිතගේ නිහඬව සිටීමට ඇති අයිතිවාසිකම ආරක්ෂා කර දෙනු ලැබේ. මෙම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වන්නේ පොලීසියේ ප්‍රශ්න කරන්නා ට පිළිතුරු දීමට සැකකරු බැඳී සිටින නමුත් සැකකරු අපරාධ වරදකට හෙළිදරව් වන පිළිතුරු ලබාදීමට බැඳී නොමැති බවය. මෙය ව්‍යතිරේකයක් ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 5 වන ඡේදය දැක්විය හැක. එහි සඳහන් වන්නේ ත්‍රස්තවාදී ක්‍රියාවකට සම්බන්ධ යම් තොරතුරක් ලබාදීම අසමත් වීම දඬුවම් පැමිණවිය යුතු වරදක් කියාය. මේ අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත චූදිතට නිහඬව සිටීමේ අයිතිවාසිකම ආපසු කැඳවා ඇත.

සාක්ෂි ආඥා පනතේ 24 වන ඡේදයේ පහත ආකාරයට සඳහන් වේ. එනම් පෙළඹවීම, තර්ජනය හෝ පොරොන්දුවක් මත ලබාගනු ලබන පාපොච්චාරණ අදාළ කරගත නොහැකි බවය. චූදිත නිහඬව සිටීමට කැමති අවස්ථාවක නීතිඥවරු සැලකිලිමත් විය යුත්තේ ඒ පිළිබඳව මෝෂමක් මගින් අධිකරණයට දැන්වීමක් කරනු ලැබුවාද යන්න පිළිබඳවය. එහිදී චූදිත අධිකරණයට ප්‍රකාශයක් ලබා නොදෙයි. එයට විත්තිවාචක එනම් සාක්ෂි ප්‍රමාණවත් නොවීම හෝ අනෙකුත් විත්තියේ සාක්ෂිකරුවන්ගේ නියෝජනයක් නොදීම යන කරුණු මත රැඳී නොසිටින බව මගිනි. ශ්‍රී ලංකා නීතියට අනුව නීතිඥවරයා චූදිත සම්බන්ධයෙන් සහතික විය යුතු කරුණක් ඇත. ඒ චූදිත සාක්ෂිකරුවකු ලෙස සාක්ෂි දීමට අකමැති අවස්ථාවක චූදිතගේ ප්‍රකාශය එම චෝදනා සාමාන්‍ය බැහැර කිරීමකට හේතු වන බවය.

සේවාදයකයාට නිහඬව සිටීම සනාථ කිරීමෙහිලා නීතිඥවරයා සේවාදයකයා සූදනම් කළ යුතුව ඇත. චූදිත නිහඬව සිටීමට තීරණය කර ඇති අවස්ථාවක එම චූදිතව දිගටම ප්‍රශ්න කිරීමේදී නීතිඥවරයා විරෝධතා සකස් කිරීම සහ වර්තා කිරීම කළ යුතුය.

(7.11) පොලිසිය විසින් සේවාදයකයාට අයුතු ලෙස සැලකීම.

අත්අඩංගුවේ සිටින සේවාදයක සමග ඔහුගේ නීතිඥවරයා සම්මුඛ සාකච්ඡාවක් පවත්වන අවස්ථාවක් ගනිමු. නීතිඥවරයා, ඔහුට පාපොච්චාරණය ලබා ගැනීමට බල කිරීමෙහිලා ශාරීරිකව පහත් කොට සැලකීමට ලක් කර ඇති බවට කරුණු සොයාගෙන ඇත . එවිට ඔහු ඒ පිළිබඳව කඩිනමින් පොලිස් ස්ථාන භාර නිලධාරියාට පැමිණිලි කිරීම අනිවාර්ය වේ. එහිදී තම සේවාදයකයාට වෛද්‍ය පරික්ෂණ ලබාදෙන ලෙස ද ඉල්ලා සිටිය යුතුය. එසේ වෛද්‍ය පරීක්ෂණ ප්‍රතික්ෂේප කරන විට නීතිඥවරයා පොලිස් මූලස්ථානයට ඒ පිළිබඳව යොමුවිය යුතුය. මෙහිදී සේවාදයකයාව හැකි ඉක්මණින් වෛද්‍ය පරීක්ෂණයකට යොමු කිරීම අවශ්‍ය වන්නේ අදල අයුතු සැලකීම නිසා දැනටමත් වරද සිදුකළ බවට ඔප්පු කරන ප්‍රකාශයක් කර ඇති බැවිනි. එනම් මෙය සිදුව ඇත්තේ අයුතු සැලකීම නිසාය.[23]

[23] See Chapter 4 inso far instances where client has allegedly been tortured or/and subjects to human rights above.

(7.12) නඩු පැවරීමට අවශ්‍ය සාක්ෂි ලබා ගැනීම.

නීති වෘත්තිකයා පහත කරුණ ගැන චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගෙන් ඇසිය යුතුය. නඩු විභාගයේදී සාක්ෂි දීමට රජය ඉදිරිපත් කිරීමට අපේක්ෂිත සාක්ෂිකරුවන්ගේ නාමාවලිය පිළිබඳවය. රජයේ සාක්ෂිකරුවකු සාක්ෂි දීමට පෙර ඔහුව සම්මුඛ සාකච්ඡාවට භාජනය කිරීමට විත්තියේ නීතිඥවරයාට කළ නොහැකිය. ඒ පිළිබඳව සාක්ෂිකරු වන අය පිළිබඳව දැන ගැනීම වැදගත් වේ.

මෙම ක්‍රියාදාමය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 158 වන ඡේදයේ සොයාගැනීම යන්නට අදාල කරගෙන ඇත.

(1) චූදිතව නඩු විභාගයට මුහුණ දීමට සිටින විට ඔහු සාධාරණ කාලයක් තුළ ඉල්ලා සිටියහොත් එනම් නඩු විභාගයට පෙර මහේස්ත්‍රාත්වරයා නඩුවේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන් පොලීසියට ලබාදුන් ප්‍රකාශවල සහතික පිටපත් සහ චූදිත පොලීසියට කළ ප්‍රකාශ ඇතොත් ඒවාද අදල පොත් සටහන් තබා ගෙන සිටින පොලිසීය භාර ස්ථාන භාර නිලධාරියා විසින් නීතිය පිළිබඳ ඇමතිවරයා නිශ්චය කරන ගාස්තුවක් යටතේ ඔහුට ලබාදිය යුතුව ඇත.

(2) යම් පුද්ගලයකුට එරෙහිව පළමු උපලේඛනයේ අටවන තීරුවේ සඳහන් මහේස්ත්‍රාත්වරයාට නඩු පැවරිය නොහැකි වරදක් පිළිබඳ අධිචෝදනා ගොනු කර ඇති විට නීතිපතිවරයා විසින් යුක්තිය පිළිබඳව අධිචෝදනා නාමාවලියේ නොමැති පොලීසියට කරන ප්‍රකාශ පිළිබඳව චූදිතයා හෝ ඔහුගේ නීතිඥවරයාට ලබාදිය යුතුය. බලය ලත් අධිකාරීන්ට වගකීමක් ඇත. ඒ ඔවුන් සතුව පාලනයට ඇති නිසි තොරතුරු ලිපි සහ ලේඛන පිළිබඳ ප්‍රවේශය නීතිඥවරුන් සඳහා සහතික කිරීම වේ. ඒවා නීතිඥවරුන්ට ප්‍රමාණවත් කාලයක් තුළ ලබාදිය යුතුව ඇත. මක්නිසාද ඔවුන් විසින් එලදායී නීති සහය සේවාදායකයන්ට ලබාදිය යුතු බැවිනි. එවැනි ප්‍රවේශයක් හැකි ඉක්මණින් නිශ්චිත කාලය තුළ ලබාදිය යුතුය. (එක්සත් ජාතීන්ගේ මූලික මූල ධර්ම 21 වන වගන්තිය)

(8) නඩු විභාගයට පෙර කරුණු.

(8.1) ඇප.

ශ්‍රී ලංකාව තුළ ඇප සහ ඇප දීම (හෝ නොදීම) පිළිබඳ නීතිය ඇත්තේ 1997 අංක 30 දරන ඇප පනතේය.

උද්යෝගී නීතිඥවරයකු මනස තුළ තබාගත යුතු දෙයක් ඇත. එනම් ශ්‍රී ලංකාව තුළ ඇප ලබාගැනීමය. එය ඔහුගේ ප්‍රධාන සලකා බැලීමක් ද වේ. එය පනතේ මූලිකාංග වලද සඳහන් වේ. ශ්‍රී ලංකාව පිළිබඳ එම තත්ත්වය ඇප පනතේ 2 වන ඡේදයේ පැහැදිළි කර ඇත.

"මේ පනතේ මින් මතු විධි විධාන සලස්වා ඇති පරිදි වූ ව්‍යතිරේඛවලට යටත්ව, මේ පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ අනුගම්‍ය ප්‍රතිපත්තිය විය යුත්තේ ඇප දීම රීතිය වශයෙන් සැලකීම සහ ඇප දීම ප්‍රතික්ෂේප කිරීම ව්‍යතිරේඛයක් ලෙස සැලකීමයි."

මෙම ඡේදය, ශ්‍රී ලංකාවේ විත්තියේ නීතිඥවරුන්ට ස්ථිර පදනමක් නිර්මාණය කර දී ඇත. ඒ චූදිත නිදහස් කර ගැනීමෙහිලා කාර්යපටිපාටිය සකස් කිරීම මගින් හා හැකි ඉක්මණින් එය ඉටු කිරීමෙහිලාය. තවද ඉහත ඡේදය අනුව විත්තියේ නීතිඥවරුන් චූදිත හැකි ඉක්මණින් නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතුව ඇත. ඒ පොලීසියට අවිධිමත් ලෙස නීතිය කියාදීම, රක්ෂිත බන්ධනාගාරගතව සිටින විට නෛතික නියෝජනය ලබාදීම. විධිමත් ලෙස සිදුකරන ඇප ඉල්ලීම සහ පරීක්ෂණ හා නඩු විභාගයේ සියලුම අවස්ථාවලදී නීතිය ක්‍රියාත්මක කිරීම වේ.

ඇප ලබාදීම පිළිබඳව ප්‍රතිපාදන ඉතා පුළුල් ලෙස වර්ග 3කට දක්වා ඇත.

1. ඇප දිය හැකි (ඇප පනතේ 4 වන ඡේදය) සහ

2. ඇප නොදීම (ඇප පනතේ 5 වන ඡේදය) යන නඩුවලදීය.

නිශ්චිත පරිච්ඡේද පහත ආකාරයට තීරණය කර තිබේ.

"ඇප දිය හැකි වරදක් සිදුකිරීමෙහිලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදුකර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටන තැනැත්තකු මෙහි මින් මතු සලසා ඇති විධි විධාන වලට යටත්වූ ඇප මත මුදා හරිනු ලැබීමට හිමිකම් ඇත." (ඇප පනත 4 වන ඡේදය)

13 වන වගන්තියේ විධි විධානවලට යටත්ව, ඇප දිය නොහැකි වරදක් සිදුකිරීමෙහිලා සම්බන්ධ වී ඇති බවට හෝ සිදුකර ඇති බවට සැකකරනු ලබන හෝ චෝදනා ලැබ සිටින තැනැත්තකු අධිකරණයේ අභිමතය පරිදි මුදාහරිනු ලැබිය හැකිය. (ඇප පනත 5 වන ඡේදය)

අධිකරණය වැඩිදුර පරීක්ෂණය හෝ නඩු විභාගයට ඉඩ ඇති බවට ප්‍රමාණවත් පසුබිමක් ඇත් ද යන්න සලකා බලන විට යම් මුදලකට යටත්ව සහ ශරීර ඇපයක් ඇතිව හෝ නැතුව චූදිතව බැඳුම්කරයක් මත නිදහස් කළ යුතුව ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 403 (2) වන වගන්තිය)

ඇප පනතේ 6 (1) ඡේදය පොලීසිය සිදුකරන ඇප දිය හැකි වැරදි විමර්ශනය කරන විට පුද්ගලයන් නිදහස් කිරීම ගැන අවධානය යොමු කර ඇත.

පොලීසිය මගින් විමර්ශනය කරනු ලබන වරදක් ඇප දිය හැකි වරදක් වන අවස්ථාවකදී පොලිස් ස්ථානය භාර නිලධාරියා භාරයේ සිටින සැකකරු එම වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස එම ස්ථාන භාර නිලධාරියාට නියම කරනු නොලැබිය යුතු නමුත් එම සැකකරු අත්අඩංගුවට ගෙන පැය විසිහතරක් ගතවීමට පෙර එම නිලධාරියා විසින් ලිඛිත පොරොන්දුවක් මත එම සැකකරු මුදාහැර නියම කරනු ලබන දිනයකදී මහේස්ත්‍රාතවරයා වෙත ඉදිරිපත් වන ලෙස එම සැකකරුට නියම කරනු ලැබිය යුතුයි.

එසේ වුවද විමර්ශනයට පාත්‍රව ඇති සිදුකරනු ලදැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් විය හැකි මහජන ප්‍රතිචාරය මගින් සාමය කඩවීමක් ඇති වීමට ඉඩ ඇති බව ස්ථාන බාර නිලධාරියාගේ මතය වන අවස්ථාවක එම ස්ථාන භාර නිලධාරියා විසින් අත්අඩංගුවේ සිටින සැකකරු එම වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර මහේස්ත්‍රාත්වරයා විසින් උචිත යයි සලකනු ලබන පරිදි 7 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබිය යුතුය.

6 (2) ඡේදය යටතේ නිදහස් වන සැකකරුවකු සම්බන්ධයෙන් නීතිමය තත්ත්වය යටතේ තීරණය කරන අතර ඔහු නිදහස් වීමෙන් පසු අධිකරණයේ පෙනී නොසිටීම ගැනද සාකච්ඡා කරනු ලැබේ. එහි පහත ආකාරයට කියනු ලැබේ.

"(1) වන උප වගන්තිය යටතේ ලිඛිත පොරොන්දුවක් දී පොලිස් ස්ථානයක ස්ථාන භාර නිලධාරියකු විසින් නිදහස් කරනු ලැබ නියමිත දිනයේදී මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සැකකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී මාස හයකට නොවැඩි කාලයක් සඳහා වූ බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත්විය යුතු අතර මහේස්ත්‍රාත්වරයා විසින් තම අභිමතය පරිදි නිශ්චිතව දක්වනු හැකි කොන්දේසි වලට යටත්ව එම සැකකරු අවස්ථාවෝචිත පරිදි ඇප මත මුදාහැරීම සඳහා හෝ රිමාන්ඩ් භාරයට පත් කිරීම සඳහා හෝ ආඥා කරනු ලැබිය යුතුය.

(8.2) ඇප පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය.

සේවාදයකයා ඇප ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන අවස්ථාවක පහත ලේඛනය වැදගත්ය. එහි අදල ඇප පිළිබඳ තොරතුරු සහ ප්‍රශ්න ප්‍රයෝජනවත් වේ.

- සේවාදායකයාගේ මූල්‍යමය තත්ත්වය
- සේවාදායකයා ස්ථිර රැකියා පදනමක් මත රැකියාවක නිරතවේද යන්න
- ශරීර ඇප දෙන පුද්ගලයන්ගේ නම, ලිපිනය සහ දුරකථන අංක නොවරදවා ගන්න
- අනෙකුත් ආධාර පිළිබඳ මූලාශ්‍ර
- සේවාදායකයාගේ වාසස්ථානය පිළිබඳ ලිපිනය
- සේවාදායකයාගේ සිවිල් තත්ත්වය
- සේවාදායකයාට දරුවන් සහ/හෝ යැපෙන්නන් සිටිනවාද
- සේවාදායකයාට ගුවන් ගමන් සඳහා අනතුරක් පවතීද
- සේවාදායකයා ට ගුවන් ගමන් බලපත්‍රයක් තිබේද යන්න
- සේවාදායකයා පොලීසියට වාර්තා කිරීමට සූදානම් ද යන වග (දිනපතා, සතිපතා. සතියකට දෙවරක්, මාසිකව)
- ඇප ඉල්ලුම් පත්‍රයට චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විරුද්ධ වේද හෝ නැද්ද යන වග
- චෝදනාවල ස්වභාවය සහ බරපතල බව මෙන්ම චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ සිද්ධිය පිළිබඳ ඇති ශක්තිමත් බව.
- සේවාදායකයා අපරාධ පිළිබඳව හෝ මීට ඉහත වැරදි පිළිබඳ වාර්තාවක් හෝ නාමාවලියක් පවතීද යන්න; (එම සමාන වැරදි හෝ අනෙකුත් වැරදි පිලිබඳව)
- අනෙකුත් කරුනු සම්බන්ධයෙන් සේවාදායකයා අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු තිබේද යන්න (වෙනත් නඩු අංක ඇති)
- සේවාදායකයාට විරුද්ධව මෙම ස්වභාවයට සමාන බහා තැබූ චෝදනා තිබේද යන වග;
- සේවාදායකයාට වෛද්‍ය/මානසික/හෝ විද්‍යාත්මක හෝ වෙනත් අතවර පිළිබඳ තත්ත්වයන් තිබේද යන්න;
- සේවාදායකයාට අපරාධ වරෙන්තුවක් ඇතොත් සේවාදායකයා සිර දඬුවමින් තාවකාලිකව නිදහස් කිරීමට හෝ පරිවාස කාලයකට යටත් ද යන වග;
- ඇප පිළිබඳ නඩුව විභාග වන අවස්ථාවේ නඩු පවරන්නා හා විමර්ශන නිලධාරියාට හෝ/සහ අනෙකුත් සාක්ෂිකරුවන් කැඳෙව්වාද යන්න පිළිබඳව;
- සේවාදායකයා අදාල චෝදනාව සම්බන්ධව චෝදනා කරන වින්දිතයාට හෝ නඩු පවරන්නාගේ සාක්ෂිකරුවන්ට අනතුරක් හෝ තර්ජනයක් කරන්නේ ද යන ප්‍රශ්නය සලකා බැලීම

"ඇප දිය හැකි හෝ ඇප දිය නොහැකි වරදක් සිදු කිරීමෙහිලා සම්බන්ධ වී ඇති බවට හෝ එවැනි වරදක් සිදුකර ඇති බවට හෝ සැකකරනු ලබන හෝ චෝදනා ලැබ සිටින යම් තැනැත්තෙක් නිසි අධිකරණ බලය ඇති අධිකරණයේ පෙනී සිටි විට හෝ අධිකරණය වෙත ගෙන එනු ලැබූ විට හෝ ඒ අධිකරණයට යටත් වූ විට" එහි අභිමතය පරිදි එවැනි පුද්ගලයකු නිදහස් කළ හැක. (ඇප පනත 7 වන වගන්තිය)

- අවශ්‍ය වූ විට අධිකරණයේ පෙනී සිටීම සඳහා එම තැනැත්තා විසින් දෙනු ලැබූ පොරොන්දුවක් මත;
- එම තැනැත්තා විසින්ම දෙනු ලබන බැඳුම් ඔප්පුවක් මත;
- ඇපකරුවන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් සමග එම තැනැත්තා විසින් බැඳුම්කරයක් ලියා අත්සන් කිරීම මත;
- අධිකරණය විසින් සාධාරණ යැයි තීරණය කරනු ලබන මුදලක් එම තැනැත්තා විසින් තැන්පත් කිරීම මත හෝ;

- අධිකරණය විසින් ආඥා කරනු ලබන යම් විස්තරයකට අයත් සාධාරණ සහතික අත්සනක් එම තැනැත්තා විසින් ඉදිරිපත් කිරීම මත අධිකරණය විසින් එම තැනැත්තා මුදා හරිනු ලැබිය හැකිය.

දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් පහත ප්‍රතිපාදන ඇතුළත් ඇප දිය නොහැකි වැරදි සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයට අභිමතයක් නැත.

114 වන ඡේදය - රාජ්‍ය විරෝධී වැරදි - රජයට විරුද්ධ යුද්ධ කරන හෝ යුද්ධ කිරීමට තැත් කිරීම හෝ යුද්ධ කිරීමට අනුබල දීම.

191 ඡේදය - මරණීය වරදකට වරදකරුවා කිරීමේ අදහසින් බොරු සාක්ෂි දීම හෝ සෑදීම.

296 ඡේදය - මිනී මැරුම සිදුකරන තැනැත්තකුට මරණීය දඬුවමින් දඬුවම් කළ යුතුය.

ඉහත දණ්ඩන වරදවල් සඳහා මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඇප ලබා දෙන්නේ නම් ඒ සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය අවශ්‍ය වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් අනෙකුත් ඇප දිය නොහැකි වැරදි සම්බන්ධයෙන් මහේසත්‍රාත්වරයාට තම අභිමතය පරිදි පුද්ගලික ඇප මත නිදහස් කළ හැක. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 403 (3) වන ඡේදය)

බැඳුම්කරයක් මත චූදිතයකු නිදහස් කරන විට, තැන්පත් කළ යුතු මුදල් ප්‍රමාණය අධිකරණය විසින් ඇපකරු හෝ චූදිත සිදු කළ වරදේ ස්වභාවයට අනුව විය යුතු අතරම ඊට වඩා වැඩි නොවිය යුතුය. (ඇප පනත 11 (1) ඡේදය) තවද අධිකරණය චූදිත රක්ෂිත බන්ධනාගාර ගතව සිටියදී එම ප්‍රමාණය අඩු කිරීමට අභිමතයක් ඇත. (ඇප පනත, 11 (2) වන ඡේදය)

මෙම පරිච්ඡේදය යටතේ අත්සන් කරනු ලබන සෑම බැඳුම්කරයකටම මුදල්, නඩුවේ අවස්ථාගත කරුණු ගැන නිසි සැලකිල්ල ඇතිව නියම කරනු ලැබිය යුතු අතර එය අධික නොවිය යුතුය. තවද මේ සංග්‍රහයෙහි හෝ බාහිර යම් නීතියකට පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද අත්අඩංගුවේ සිටින යම් තැනැත්තකු ඇප පිට නිදහස් කරන ලෙස හෝ මහාධිකරණය විසින් හෝ මහේස්ත්‍රාත්වරයකු විසින් හෝ නියම කරන ලද ඇප මුදල අඩු හෝ වැඩි කරන ලෙස හෝ මහාධිකරණය විනිශ්චයකාරවරයකු විසින් හෝ මහේස්ත්‍රාත්වරයකු විසින් ඇප පිට මුදාහරින ලද යම් තැනැත්තකු අත්අඩංගුවේ රිමාන්ඩ් භාරයේ තබන ලෙස හෝ ඕනෑම අවස්ථාවකදී අභියාචනාධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 404 වන ඡේදය)

ඉල්ලුම්කරු සිරභාරයට ගනු ලැබුවහොත් ඔහු ඇප පිට මුදාහැරිය යුතු බවට වූ ආඥාවක් මහේස්ත්‍රාත්වරයකු විසින් කරනු ලබන කවර හෝ අවස්ථාවකදී (ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් බැහැරව යාම තහනම් කරන හෝ ඉල්ලුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රය අධිකරණයට භාර දිය යුතු බවට නියම කරන කොන්දේසි ද ඇතුළුව) අදාල නඩුවේ සිද්ධිමය කරුණු සැලකිල්ලට ගැනීමේදී සුදුසු යැයි අධිකරණය කල්පනා කරන යම් කොන්දේසීන් ද ආඥාවට ඇතුළත් කරනු ලැබිය යුතු අතර,

(අ) ආඥාව කරනු ලැබ ඇත්තේ යම් ඇප දිය නොහැකි වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් ද ඒ වරද හෝ වැරදි ; සහ

(ආ) සිර භාරයට ගනු ලබන අවස්ථාවේදී ඉල්ලුම්කරු විසින් ඇප ඉදිරිපත් කළ යුතු ආකාරය

ඒ ආඥාවෙහි දක්වනු ලැබිය යුතුය. (ඇප පනත 22 වන ඡේදය)

යම් තැනැත්තකු ඇප පිට හෝ ඔහුගේම බැඳුම්කරයක් මත මුදාහරිනු ලැබීමට පෙර, ප්‍රමාණවත් යයි, අවස්ථාවෝචිත පරිදි නිලධරයා හෝ අධිකරණය කල්පනා කරන යම් මුදලක් සඳහා බැඳුම්කරයක් ඒ තැනැත්තා විසින් අත්සන් කළ යුතුය. ඔහු ප්‍රමාණවත් ඇප කරුවන් එක් කෙනෙකු හෝ ඊට වැඩි ගණනකගේ ඇපය පිට මුදාහරිනු ලැබූ විට, බැඳුම්කරයේ සඳහන් වේලාවේදී සහ

ස්ථානයේදී පැමිණ සිටිය යුතු බවත් අන්‍යාකාරයෙන් විධාන කරනු ලබන තුරු ඔහු එසේ දිගටම පැමිණ සිටිය යුතු බවත් ඒ බැඳුම්කරයේ කොන්දේසි විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 405 වන ඡේදය)

බැඳුම්කරය ලියා ඇත්තේ අත්සන් කරනු ලැබූ වහාම එය අත්සන් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ පෙනී සිටීම සඳහා ද ඒ තැනැත්තා මුදාහරිනු ලැබිය යුතුය. තවද ඔහු බන්ධනාගාරයෙහි සිටින අවස්ථාවක ඇප පිට ඔහු නිදහස් කරන අධිකරණය විසින් බන්ධනාගාරය භාර නිලධාරියා වෙත මුදා හැරීමේ ආඥාවක් නිකුත් කළ යුතු අතර, ඒ ආඥාව ලැබුණු විට ඒ නිලධරයා විසින් ඔහු මුදාහරිනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 406 (1) වන වගන්තිය ඇතුලු ඇප පනතේ 8 වන වගන්තිය)

බැඳුම්කරය ලියා අත්සන් කරන ලද්දේ යම් කාරණයක් සඳහා ද ඒ කාරණය නොවන වෙනත් කාරණයක් සඳහා රඳවා තැබීමට යටත් යම් තැනැත්තකු මේ වගන්තියෙහි, 402 වන වගන්තියෙහි හෝ 403 වගන්තියෙහි සඳහන් කිසිවක් නිසා මුදා හැරීම අවශ්‍ය කරුණකැයි සලකනු නොලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 406 (2) වන වගන්තිය)

යම් තැනැත්තකු ඇප පිට මුදා හරිනු ලැබූ අවස්ථාවකදී, එම තැනැත්තා වෙත සියලු දැන්වීම් හෝ අධිකරණ විධාන භාරදිය හැකි ලිපිනයක් එම තැනැත්තා විසින් අධිකරණය හෝ ඇප භාර ගත් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉන්පසු එම තැනැත්තා සොයා ගත නොහැකි වුවහොත් හෝ වෙනයම් කුමන හෝ හේතුවක් මත ඔහු වෙත දැන්වීම් හෝ අධිකරණ විධාන භාර දීම ක්‍රියාත්මක කළ නොහැකි වුවහොත් එම ලිපිනය වෙත භාර කළ යම් දැන්වීමක් හෝ අධිකරණ විධානයක් එම තැනැත්තා වෙත නිසි පරිදි භාර දුන් ලෙස සලකනු ලැබිය යුතුය. (ඇප පනත 12 (1) වන වගන්තිය)

වැරදීමක් නිසා, වංචාවක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා ප්‍රමාණවත් නොවන ඇපකරුවන් පිළිගෙන ඇත්නම් හෝ පසුව ඔවුන් ප්‍රමාණවත් නොවන බවට පත්වුව හොත්, ඇප පිට මුදාහරින ලද තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස විධාන කරමින්, සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් අධිකරණය විසින් නිකුත් කළ හැකිය. එවිට ප්‍රමාණවත් ඇප කරුවන් සොයා ගන්නා ලෙස ඔහුට ආඥා කිරීම ද ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගැනීම ඔහු විසින් පැහැර හරිනු ලැබීමේදී ඔහු බන්ධනාගාරයට නියම කිරීමද අධිකරණය විසින් කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 407 වන වගන්තිය)

ඇප පිට මුදාහරිනු ලැබූ තැනැත්තාගේ පැමිණීම සහ පෙනී සිටීම සඳහා ඇප වූ ඇපකරුවන් සියලු දෙනාම හෝ ඔවුන්ගෙන් කිසිවකු හෝ විසින් බැඳුම්කර සම්පූර්ණයෙන්ම නිදහස් කරන ලෙස නැතහොත් එය තම තමන්ට අදාළ වන තාක් දුරට බැඳුම්කරයෙන් තම තමන් නිදහස් කරන ලෙස ඕනෑම අවස්ථාවකදී අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 408 (1) වන වගන්තිය)

එවැනි ඉල්ලීමක් කරනු ලැබීමේදී මුදාහරින ලද තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙනෙන ලෙස විධාන කරමින් සිර භාරයට ගැනීමේ වරෙන්තුවක් අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 408 (2) වන වගන්තිය)

ඒ තැනැත්තා වරෙන්තුව ප්‍රකාර හෝ සිය කැමැත්තෙන්ම භාර වීමෙන් හෝ පෙනී සිටි කල්හි ඒ බැඳුම්කරය සම්පූර්ණයෙන්ම හෝ එය ඉල්ලුම්කරුවන්ට අදළ වන තෙක් දුරට හෝ නිදහස් කරන ලෙසට අධිකරණය විසින් විධාන කළ යුතු අතර වෙනත් ප්‍රමාණවත් ඇපකරුවන් සෙයා ගන්නා ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතුය. තවද එසේ ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගැනීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු අත්අඩංගුවෙහි තබන ලෙස නියම කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 408 (3) වන වගන්තිය)

ඇපකරුවකු ඇප වුයේ යම් තැනැත්තකුගේ පැමිණීම සහ පෙනී සිටීම සඳහා ද ඒ තැනැත්තා පැන ගොස් සැඟවී සිටින අවස්ථාවක ඒ ඇපකරු විසින් ඕනෑම වෙලාවක ඒ තැනැත්තා සිර

භාරයට ගෙන අධිකරණය ඉදිරියට වහාම ගෙන යා හැකි අතර එවිට අධිකරණය විසින් ඒ ඇපකරුගේ බැඳුම්කරය නිදහස් කර වෙනත් ප්‍රමාණවත් ඇපකරුවකු සොයා ගන්නා ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතුය. එසේ ප්‍රමාණවත් ඇපකරුවන් සොයා ගැනීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු අත්අඩංගුවේ තබන ලෙස නියම කළ යුතුයි. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 408 (4) වන වගන්තිය)

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනත යටතේ හෝ මහජන ආරක්ෂක පනත යටතේ වූ නියෝග යටතේ හෝ වරදක් සිදුකර ඇති බවට හෝ වරදකට වරදකරු වී ඇති බවට හෝ වරදකට වරදකරු වී ඇති බවට චෝදනා ලැබ සිටින හෝ සැක කරනු ලබන තැනැත්තන් ඇප පිට නිදහස් කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශිත විධි විධාන සලසා ඇත්තේ යම් ලිඛිත නීතියක් යටතේ ද එම ලිඛිත නීතිය යටතේ හෝ වරදක් සිදුකර ඇති බවට චෝදනා ලැබ සිටින හෝ සැක කරනු ලබන තැනැත්තකුට මේ පනතේ සඳහන් කිසිවක් අදාළ නොවේ. (ඇප පනත 3 (1) වන වගන්තිය)

(8.3) පිළිගැනීම්.

(8.3.1) නිවැරදිකරු බව පිළිගැනීම සහ වැරදිකරු බව පිළිගැනීම.

සේවාදායකයා, ඔහු හෝ ඇය චූදිත වූ වරද කළ බව ප්‍රතික්ෂේප කරන විට නිවැරදිකරු බව පිළිගැනීමේ අවස්ථාව එයි. (මෙම අත් පොතේ 5 වන පරිච්ඡේදයේ විවිධ විත්තිවාචක යටතේ වරදකරු නොවන බව පිළිගැනීම ද ඇතුළත් ව ඇත.)

චූදිත ප්‍රථම නීති සාකච්ඡාවේ දී හෝ ඉන්පසුව රැස්වීම් වලදී වරද පිළිගන්නේ නම් හෝ වරද පිළිගැනීමට කැමති නම් ඒ පිළිබඳ ක්‍රියාදාමය විසින් එය කිරීම වැදගත් වේ.

තමා වරදකරු කරනු නොලැබිය යුතු බවට හේතු කිසිවක් තමාට තිබේදැයි අසනු ලැබූ විට තමා චෝදනා ලබා සිටින වරද සම්බන්ධයෙන් තමා වරදකරු බවට නිරවශේෂ පිළිගැනීමක් වන ප්‍රකාශයක් චූදිතයා කළහොත්, ඔහුගේ ප්‍රකාශයේදී ඔහු විසින් උපයෝගී කරගනු ලබන වචන වලින් ම හැකිතාක් ඒ ප්‍රකාශය වාර්තාගත කරනු ලැබිය යුතුය; තවද වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කොට නීතිය අනුව චූදිතයාට දණ්ඩනය නියම කොට ඒ දණ්ඩන නියමය වාර්තාගත කළ යුතුය;

(ලඝු ආකාරයෙන් නඩු විභාග කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය ඇති අවස්ථාවක නඩු විභාග කිරීමේදී)

එසේ වුවද චූදිතයා ට විරුද්ධව දණ්ඩන නියමය පැනවීමට පෙර ඕනෑම අවස්ථාවකදී මහේස්ත්‍රාත්වරයාගේ අවසරය ඇතිව චූදිතයා විසින් තම වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කර ගත හැකිය.

එවැනි අවස්ථාවකදී වරදකරු කිරීම සටහන් කරනු නොලැබුවාක් මෙන් නඩු විභාගය පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයා කටයුතු කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 183 (1) වන වගන්තිය)

මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් ජූරි සභාවක් නොමැතිව නඩු විභාග කිරීම, නඩු විභාගය ආරම්භ කිරීම, චූදිතයා තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් සහ ඔහුගේ උත්තරවාදයේ ප්‍රතිඵලය ඔහු නිවැරදිව අවබෝධ කරගෙන ඇති බව විනිශ්චයකාරවරයා සෑහීමකට පත්වන ආකාරයෙන් පෙනී යන්නේ නම් ඒ උත්තරවාදය අධි චෝදනා පත්‍රයෙහි වාර්තා ගත කළ යුතු අතර ඒ අනුව චූදිතයා වරදකරු කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 197 වන වගන්තිය)

ජූරි සභාවක් මගින් නඩු විභාග කිරීම, නඩු විභාගය ආරම්භ කිරීම, නඩු විභාගය ආරම්භ කිරීමට අධිකරණය සූදානම් විට, චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටිය යුතුය; නැතහොත් අධිකරණය ඉදිරියට ගෙන එනු ලැබිය යුතුය; තවද ඔහුට අධිචෝදනා පත්‍රය කියවා තොරුම් කර දිය යුතු අතර, චෝදනා නගා ඇති වරදට තමා වරදකරුද? වරදකරු නොවේද? යන වග ඔහුගෙන් විමසිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 204 වන වගන්තිය)

චූදිතයා තමා වරදකරු යැයි උත්තරවාද දෙන්නේ නම් සහ ඔහුගේ උත්තරවාදයේ ප්‍රතිඵලය ඔහු නිවැරදිව අවබෝධ කරගෙන ඇති බව විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන ආකාරයෙන් පෙනී යන්නේ නම් ඒ උත්තරවාදය අධිචෝදනා පත්‍රයෙහි වාර්තාගත කළ යුතු අතර, ඒ අනුව චූදිතයා වරදකරු කරනු ලැබිය හැකිය. එසේ වුවද වරදකරු බවට උත්තරවාද දෙන ලද අධිචෝදනාව මිනීමැරුමක් සම්බන්ධයෙන් වූ අධිචෝදනාවක් වන විට, ඒ උත්තරවාදය පිළිගැනීම විනිශ්චයකාරවරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු අතර, තමා වරදකරු නොවේ යැයි චූදිතයා විසින් උත්තරවාද දෙන ලද්දක් මෙන් ඒ නඩු විභාගය පවත්වා ගෙන යාමට සැලැස්විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 205 වන වගන්තිය)

චූදිතයා තමා වරදකරු නොවේ යැයි උත්තරවාද දෙන්නේ වුවද ඒ අධිචෝදනා පත්‍රය මත තමා වරදකරු කරනු ලැබිය හැකිව තිබූ අඩු වරදකට වරදකරු යැයි උත්තරවාද දීමට තමා කැමති බව ප්‍රකාශ කරන තෙක් හා චෝදනාව මෙහෙයවන නීතිඥවරයා ඒ උත්තරවාදය පිළිගැනීමට කැමැති වුවහොත් ඒ උත්තරවාදය වාර්තා ගත කිරීමෙන් යුක්තිය ඉෂ්ටවනු ඇතැයි විනිශ්චයකාරවරයා කල්පනා කරන්නේ නම් ඔහු විසින් ඒ උත්තරවාදය වාර්තාගත කරන ලෙස ආඥා කොට, ඒ සම්බන්ධයෙන් ඒ අනුව වූ නඩු තීන්දුවක් ප්‍රකාශ කරනු ලැබිය හැකිය. එවිට අධිචෝදනා පත්‍රයෙහි දැක්වෙන වරදින් චූදිතයා නිදහස් කරනු ලැබිය යුතු අතර ඒ නිදහස් කිරීම නිදෙස් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 207 වන වගන්තිය)

<u>කට්ටඩිගේ අමරසේන එරෙහිව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය (ශ්‍රේෂ්ඨාධිකරණ නඩුව අංක SC(SPU) LA No: 59/2014)</u>

මෙම විශේෂ අභියාචන ඉල්ලුම් පත්‍රයක් වන අතර එය පළාත් මහාධිකරණ (විශේෂ විධි විධාන) අංක 19, 1990 ආඥා පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 128 සහ 154 P 3(අ) වගන්ති යටතේ ගොනු කර ඇත. අභියාචක මිනීමැරුමකට වරදකරු කර තිබේ. ඒ අනුව තම බිරිඳ මරා දැමීමට මරණීය දණ්ඩනය නියමව ඇත. අභියාචක ගෙනා විත්තිවාචකය බලවත් වූ හදිසි කෝපය වන අතරම පිළිගැනීම බරපතල දඬුවම අඩු කරන ලෙසය. වරදකරු කිරීමට සහ දඬුවමට එරෙහිව ඔහු කළ අභියාචනය ප්‍රතික්ෂේප කෙරිණි. බලවත් වූත් හදිසි වූත් ප්‍රකෝප කිරීම යන ශ්‍රී ලංකා අපරාධ නීතියේ එන විත්තිවාචකය පදනම්ව කරනු ලැබූ වරද පිළිනොගැනීම සාකච්ඡාවට බඳුන් කළ අධිකරණය අභියාචනය බහා තබන ලදි.

<u>ආයාචනයන් පිළිබඳ ගනුදෙනුවක් මෙහෙයවීම.</u>

ආයාචනය පිළිබඳ ගනුදෙනුව පාර්ශව දෙකක එනම් චෝදනා මෙහෙයවන නීතිඥවරයා සහ චූදිත අතර අපරාධ නඩුවකදී ඇතිවන ගිවිසුමකි. එනම් චූදිත, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සමග එකඟතාවයකට එනු ලැබේ. ඒ චූදිත විශේෂ චෝදනාවකට පමණක් වරදකරු බව පිළිගැනීම ට එකඟ වෙමිනි. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 207 වන වගන්තිය)

මෙහි නිරතුරුවම හෙලිදරව් වන තත්ත්වයක් වන්නේ සේවාදයකයා ඔහු හෝ ඇය චෝදනා ලැබූ දෙයට පටහැනිව සහ ක්‍රියාදාමයේ මුල සිටම වරදකරු බව පිළිගැනීමයි. එය මෙසේ ද සිදුවිය හැකිය. එනම් සේවාදයකයා ඔහුගේ හෝ ඇයගේ නිර්දෝෂීභාවය කියා සිටින විට (වරද කර නැති බව) පෙන්නුම් කරන්නේ ඔහු හෝ ඇය නඩු විභාගයක් සඳහා ඉදිරියට යෑම අපේක්ෂා නොකරන බවය. ඔබ විත්තියේ නීතිඥවරයකු ලෙස ඔබේ සේවාදායකයාගේ අවසරය (උපදෙස් පරිදි) බව චෝදනාව මෙහෙයවන නීතිඥවරයා හා සම්බන්ධ වෙමින් පිළිගැනීම පිළිබඳ ගනුදෙනුවකට

සාකච්ඡා කිරීමය. (එය පහත ලෙස ද සිදුවිය හැක. ඒ චෝදනාව මෙහෙයවන නීතිඥවරයා ඔබ වෙත එනම් විත්තියේ නීතිඥවරයා ලෙස යොමුව ළඟා විය හැකි පිළිගැනීමේ ගනුදෙනුවකට සලකා බැලීම වේ.)

වෘත්තියේ යෙදීමේදී වැදගත් කරුණක් :- රජය පවරන නඩුව සුපරීක්ෂාකාරීව බැලීමට කාලය ගත යුතුව ඇත. තවද එහි සිදුවිය හැකි දුර්වලතාවයන්ට වඩා සාක්ෂිවල ශක්තිමත් භාවය පරීක්ෂා කළ යුතු වේ. චෝදනාව මෙහෙයවන නීතිඥවරයා නඩු විභාගය ආරම්භයේදී හෝ ඊට පෙර පිළිගැනීම පිළිබඳ යෝජනාවක් ගෙන එන විට ඒ පිළිබඳව සම්පූර්ණයෙන්ම අමතරව ප්‍රවේශම්කාරීව එය වෙත යොමු වීමට මතක තබාගත යුතුව ඇත. සාමාන්‍යයෙන් චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට ශක්තිමත් නඩුවක් ඇති විට නඩුව මෙහෙයවීම චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සම්පූර්ණයෙන්ම සිදුකරනු ලැබේ. මීට විරුද්ධව චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව දුර්වල වීම ඔවුන්ට පිළිගැනීම පිළිබඳ ගනුදෙනුව අවසන් කර පහසු දඬුවමකට සහ නඩුව විභාග කිරීම අවශ්‍ය වේ.

විත්තියේ නීතිඥවරයා, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සමග පහත කරුණු ගැන සාකච්ඡා කළ යුතුව ඇත. ඒ විත්තිය සහ රජය අතර ගැටළු සහගත ක්ෂේත්‍ර ගැන සලකා බැලිය යුතු අතරම, නඩුව විභාගයට ගත්විට කාලය ඉතිරි කරගත යුතුය. සේවාදායකයා චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගෙන් බලාපොරොත්තු වන දෙයක් ඇත. ඒ ඔහු අඩු චෝදනාවකට කරන පිළිගැනීම, පිළිගැනීමට සූදානම් ද යන වගය. ඒ සේවාදායකයාට ඇති චෝදනාවට විරුද්ධවය. තවද එය අධිකරණයේදී වඩා බරපතල අපරාධයක් සිදු කිරීම පිළිබඳව සම්පූර්ණ තර්ක කිරීමකට අමතරව සිදුවනු ඇත.

විත්තියේ නීතිඥවරයා, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සමග සාකච්ඡා කිරීමට කැමති දෙයක් ද ඇත. ඒ රජය පාලනය කරන සාක්ෂි වල මූලිකව සේවාදායකයාට උත්තර දිය හැකි කුඩා හමුවක් පවතී ද යන්නය. තවද එය චෝදනාව ඉල්ලා අස්කර නොගන්නා අවස්ථාවකදීය. මෙම තත්ත්වයකදී/නඩුවකදී විත්තියේ නීතිඥවරයා විත්තියේ නඩුව ඉදිරිපත් කරමින් චෝදනාව මෙහෙය වන නීතිඥවරයා හෝ චූදිත විසින් පිළිතුරු දිය යුතු නඩුවක් ඇත්දැයි ප්‍රශ්න කළ යුතුය.

පිළිගැනීම පිළිබඳ ගනුදෙනුවකදී පහත සඳහන් කරුණු සතර අත්‍යාවශ්‍යය.

1. විත්තියට අපරාධයක් කිරීම පිළිබඳව චෝදනාවක් ඇත.
2. එම චෝදනාව සමග ඉදිරියට යාමට විත්තිය අපේක්ෂා නොකරයි.
   (වරදකරු වුවත් හෝ නොවුවත්)
3. විත්තිය සැබෑ චෝදනාව වෙනුවට බරපතල කමින් අඩු චෝදනාවකට වරද පිළිගැනීමට අපේක්ෂාවෙන් සිටීමයි.
4. චෝදනාව මෙහෙයවන නීතිඥවරයා අඩු චෝදනාවකට වරද පිළිගැනීමක්, පිළිගැනීමට කැමැත්තෙන් සිටීම යන්නය.

පිළිගැනීම පිළිබඳ කියා සිටීමකදී පහත වාසිසහගත බව ඇත. ඒ දෙපාර්ශවයම දීර්ඝ අපරාධ නඩු විභාගයකට යාමෙන් වැළකේ.

තවද වඩා බරපතල චෝදනාවක් සම්බන්ධයෙන් වූ නඩු විභාගයකදී විත්තිකරුවන් වරදකරුවන් වීමේ අනතුර වළක්වයි.

(8.4) <u>මූලික පරීක්ෂණය.</u>

නඩුවක් සම්බන්ධයෙන් වූ පරීක්ෂණය, මහේස්ත්‍රාත් උසාවියක ලඝු ලෙස විභාග නොවන, මහාධිකරණය විසින් නඩුව විභාග කරන පරීක්ෂණයකි.

මෙයට අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 145 වන වගන්තියට අනුව චූදිත මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට හෝ එය ඉදිරියට පැමිණවීම සිදුවන අතරම මහේස්ත්‍රාත්වරයා;

(අ) වරද හෝ වැරදි එකකට වැඩි ගණනක් ඇති විට ඒ වැරදි අතුරින් යම් වරදක් හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උප ලේඛනයෙහි දක්වා ඇති වැරදි ලැයිස්තුවට අයත් වරදක් වන අවස්ථාවක;

හෝ

(ආ) අධිචෝදනා පත්‍රයක් සකස් කිරීම සඳහා මූලික පරීක්ෂණයක දී වාර්තාගත කරන ලද සාක්ෂි අවශ්‍ය වෙතැයි නීතිපතිවරයාගේ මතය වන විට වරද සිදුකරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතු යයි නීතිපතිවරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක,

මෙහි මින් මතු සඳහන් කර ඇති ආකාරයට මහේස්ත්‍රාත්වරයා විසින් මූලික පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතුය.

මූලික පරීක්ෂණයක් පවත්වන මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ පරීක්ෂණය ආරම්භයේදී, පරීක්ෂණය පවත්වනු ලබන්නේ යම් චෝදනාවක් හෝ චෝදනා සම්බන්ධයෙන් ද ඒ චෝදනාව හෝ චූදිතයාට කියවා දිය යුතු නමුත් එසේ කියවා දීමේදී එයට යම් උත්තරයක් දෙන ලෙස චූදිතයාට නියම කරනු නොලැබිය යුතුය. යම් උත්තරයක් දෙනු ලැබුවහොත් මහේස්ත්‍රාත්වරයා විසින් එය වාර්තාගත කරනු නොලැබිය යුතුය. එමෙන්ම එවැනි යම් උත්තරයක් චූදිතයාට විරුද්ධව සාක්ෂියේදී අවශ්‍ය නොවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 146 වන වගන්තිය)

විමර්ශනයේ සටහන්වලද විමර්ශනය පවත්වාගෙන යන අතරතුර වාර්තාගත කරන ලද සියලු ප්‍රකාශන වලද සහතික පිටපත් දෙකක් අදාළ තොරතුරු සටහන් පොත තබා ඇති පොලිස් ස්ථානය භාර නිලධාරියා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 147 වන වගන්තිය)

ඉක්බිතිව මහේස්ත්‍රාත්වරයා විසින්, චූදිතයා ඉදිරියේදී සහ මෙහි මින් මතු විධි විධාන සලස්වා ඇති පරිදි නඩුවේ සිද්ධි සහ අවස්ථාගත කරුනු දන්නා තැනැත්තකු විසින් දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට කරනු ලබන ප්‍රකාශ ලබාගෙන ඒවා ලියාගනු ලැබිය යුතුය. (මේවාට දිවුරුම් සාක්ෂි යැයි කියනු ලැබේ.) එසේ වුවද නීතිපතිවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කළහොත් මිස මහේස්ත්‍රාත්වරයා විසින් යම් විශේෂඥ සාක්ෂිකරුවකු කැඳවීම සහ ඔහුගේ සාක්ෂි වාර්තාගත කිරීම නොකළ යුතු නමුත් එවැනි සාක්ෂිකරුවකුගේ වාර්තාව පමණක් ඉදිරිපත් කරනු ලැබීමට සහ එය නඩු වාර්තාවෙහි ගොනු කරනු ලැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 148 (1) වන වගන්තිය)

චූදිතයාට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන එක් එක් සාක්ෂිකරුගේ (1) වන උප වගන්තියේ අතුරු උප වගන්තියේ විධි විධාන වලට යටත්ව චූදිතයාට ප්‍රශ්න ඇසිය හැකි අතර එහිලා සාක්ෂිකරුගෙන් ලැබෙන උත්තරය ඔහුගේ දිවුරුම් සාක්ෂියේ කොටසක් විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 148 (2) වන වගන්තිය)

නොපැමිණි චූදිතයකු වෙනුවෙන් නීතිඥයකුට පෙනී සිටිය හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 148 (4) වන වගන්තිය)

146 වන වගන්තිය යටතේ චූදිතයාට කියවා දෙනු ලැබූ චෝදනාවෙහි දක්වා ඇති සිද්ධි හා ඒවා සනාථ කරනු පිණිස වරද හෝ ක්‍රියාව සිදු කරනු ලැබූ සාක්ෂි අතර, ඇති යම් වෙනසක් ඒ වෙනස් වේලාව සම්බන්ධයෙන් වූ විට චෝදනාව ඉදිරිපත් කිරීම සඳහා නීතිය මගින් නියමිත කාලයක් ඇතුළත ඒ චෝදනාව ඇත්ත වශයෙන්ම ඉදිරිපත් කරනු ලැබූ බවද, ඒ වෙනස් ස්ථානය සම්බන්ධයෙන් වූ විට අධිකරණයේ අධිකරණ බලය එමගින් සනාථ කරනු ලබන බවද ඔප්පු කරණු

ලැබුවහොත් වැදගත් යයි සලකනු නොලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 149 (1) වන වගන්තිය)

චෝදනාවෙහි දක්වා ඇති සිද්ධි හා ඒවා සනාථ කරණු පිණිස ඉදිරිපත් කරණු ලැබූ සාක්ෂි හා උත්තර වෙනත් යම් ආකාරයකින් වූ යම් වෙනසක් වැදගත් නොවිය යුතුය.

එසේ වුවද චූදිතයාට චෝදනා නගා ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද පිළිබඳ නඩු විභාගයේදී චූදිතයාට චෝදනා නගා ඇති වරද නොවන වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් ඔහු වැරදිකරු කිරීම ද එකී වෙනත් යම් වරද මේ සංග්‍රහයේ විධි විධාන යටතේ වන එකී නඩු විභාගයේදී චූදතයා නීත්‍යානුකූලව වරදකරු කරනු ලැබිය හැකි වරදක් නම් මිස, කරනු නොලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 149 (2) වන වගන්තිය)

එවැනි යම් වෙනසක් පෙනී ගිය විට චෝදනාව සම්බන්ධයෙන් සුදුසු යයි තමා සලකන යම් සංශෝධනයක් මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි අතර, යම් සාක්ෂිකරුවකු නැවත කැඳවනු ලැබීමට සහ ඒ වෙනසට හෝ සංශෝධිත චෝදනාවට හෝ අදාළ කරුණු කිසිවක් පිළිබඳව වැඩිදුරටත් ඒ සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කරනු ලැබීමට ඔහු විසින් අවසර දිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 149 (4) වන වගන්තිය)

චෝදක පක්ෂය වෙනුවෙන් කැඳවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කරනු ලැබීමෙන් පසු 153 වන වගන්තියේ විධි වධාන වලට අනුකූලව නඩුව සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු යයි මහේස්ත්‍රාත්වරයා විසින් සලකනු නොලබන්නේ නම් මහේස්ත්‍රාත්වරයා විසින් චෝදනාව චූදිතයාට කියවා එහි ස්වභාවය සාමාන්‍ය භාෂාවෙන් ඔහුට තේරුම් කර දී, සාක්ෂිකරුවන් කැඳවීමට ද තමා වෙනුවෙන්ම සාක්ෂි දීමට ඔහු බලාපොරොත්තු වන්නේ නම් එසේ කිරීමට ද ඔහුට අයිතිවාසිකමක් ඇති බව මහේස්ත්‍රාත්වරයා විසින් ඔහුට දන්වනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 150 වන වගන්තිය)

ඉක්බිතිව පහත දැක්වෙන වචනවලින් හෝ ඒ හා සමාන බලපෑම් ඇති වචනවලින් මහේස්ත්‍රාත්වරයා චූදිතයා ඇමතිය යුතුය. :- "චෝදනාවට පිළිතුරු වශයෙන් කිසිවක් කීමට ඔබ කැමැත්තෙහිද? එසේ කිරීමට ඔබ බලාපොරොත්තු වන්නෙහි නම් මිස කිසිවක් කීමට ඔබ බැඳී නොසිටින නමුත් ඔබ කියන කුමක් වුවද සටහන් කරගනු ලැබ ඔබේ නම, විභාගයේදී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ." (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 151 (1) වන වගන්තිය)

චෝදනාවට පිළිතුරු වශයෙන් චූදිතයා, යම් ප්‍රකාශයක් කිරීමට පෙර ස්වකීය වරදකාරීත්වය පිළිබඳ යම් පිළිගැනීමක් හෝ අපරාධ විචාරණයක් හෝ කිරීමට ඔහු පෙළඹවීම පිණිස ඔහු වෙත පිරනමනු ලැබිය හැකි අනුග්‍රහයක් පිළිබඳව වූ යම් පොරොන්දුවක් බලාපොරොත්තු වීමට කිසිවක් නොමැති බවත් එහෙත් එම පොරොන්දුව හෝ තර්ජනය නොතකා ඔහු විසින් එවිට පවසනු ලබන කුමක් හෝ ඔහුගේ නඩු විභාගයේදී සාක්ෂි වශයෙන් දෙනු ලබන බවත් මහේස්ත්‍රාත්වරයා විසින් ඔහුට ප්‍රකාශ කොට පැහැදිළි ලෙස අවබෝධ කර දිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 151 (2) වන වගන්තිය)

චෝදනාවට පිළිතුරු වශයෙන් චූදිතයා විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් 277 වන වගන්තියෙන් විධි විධාන සලස්වා ඇති ආකාරයට වාර්තාගත කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 151 (3) වන වගන්තිය)

චූදිතයාගේ ප්‍රකාශයට අදාළව 151 වන වගන්තියෙහි වූ නියමය අනුව ක්‍රියා කිරීමෙන් ඉක්බිතිවම චූදිතයා විසින් ප්‍රකාශයක් කර ඇති වුවද, නොමැති වුවද, තමා වෙනුවෙන්ම සාක්ෂි දීමට ඔහු බලාපොරොත්තු වන්නේ ද යන වග සහ සාක්ෂිකරුවන් කැඳවීමට ඔහු බලාපොරොත්තු වන්නේ ද යන වග මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයාගෙන් විමසනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 152 (1) වන වගන්තිය)

කැඳවීමට තමාට සාක්ෂිකරුවන් ඇති නමුත් ඔවුන් අධිකරණයට පැමිණ නොමැති බව චූදිතයා විසින් ප්‍රකාශ කරනු ලැබුවහොත් සහ ඒ සාක්ෂිකරුවන් පැමිණ නොසිටීම හේතුව චූදිතයාගේ යම්

දෝෂයක් හෝ නොසැලකිල්ලක් හෝ නිසා නොවන බවටත් ඔවුන් පැමිණ සිටියේ නම් ඔවුන්ට චූදිතයා වෙනුවෙන් වැදගත් සාක්ෂි දීමට ඉඩ ඇති බවටත් මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, විභාගය අඩාලව කල් තැබීම ද ඒ සාක්ෂිකරුවන්ගේ පැමිණ සිටීම බල කිරීම පිණිස අධිකරණ නියෝග නිකුත් කිරීම හෝ වෙනත් පියවර ගැනීමද මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය 153 වන වගන්තිය)

චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි චූදිතයා නඩු විභාගයට භාජනය කිරීමට ප්‍රමාණවත් නොවේ යයි මහේස්ත්‍රාත්වරයා සලකතහොත් විභාගයට යටත්ව පවත්නා චෝදනාව සම්බන්ධයෙන් තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත චූදිතයා නිදහස් කරන ලෙස, මහේස්ත්‍රාත්වරයා විසින් නොපමාව ආඥා කරනු ලැබිය යුතුය. එහෙත් එවැනි නිදහස් කිරීමක්, එම සිද්ධි සම්බන්ධයෙන් වූ යම් තැනැත්තෙක් චෝදනාවට බාධාවක් නොවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 153 (1) වන වගන්තිය)

චූදිතයා පිළිබඳ නඩු විභාගය ඉහළ අධිකරණයට ඇසීමට සාක්ෂි ප්‍රමාණවත් වේ යයි මහේසත්‍රාත්වරයා සලකතොත් මහාධිකරණය ඉදිරියේ නඩු විභාගය සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයා ඉදිරිපත් කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 154 වන වගන්තිය)

චූදිතයාගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබන අවස්ථාවේදී ස්වකීය නඩු විභාගයේදී සාක්ෂි දීමට නියම කරනු ලැබීමට තමා බලාපොරොත්තු වන තැනැත්තන් කිසිවකු වෙතොත් සිද්ධි පිළිබඳව කරුණු දැක්වීම පිණිස කැඳවීමට තමා අදහස් කරන්නා වූ තැනැත්තන් හා හුදෙක් චරිතය පිළිබඳව කරුණු දැක්වීම පිණිස කැඳවීමට තමා අදහස් කරන්නා වූ තැනැත්තන් වෙන් වෙන් වශයෙන් දක්වමින් ඔවුන්ගේ නම් එතැනදීම හා එවෙලෙහිම වාචිකව ප්‍රකාශ කරන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයාට නියම කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 155 (1) වන වගන්තිය)

චූදිතයා විසින් (1) වන උප වගන්තිය යටතේ නම් කරනු ලැබූ සාක්ෂිකරුවන් අතුරින් තමා ඉදරියෙහි ඒ වන විටත් සාක්ෂි දී නොමැති සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් මහේස්ත්‍රාත්වරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර දැන්වීමෙහි සඳහන් වන දිනයෙහි නඩු විභාගය පවත්වන අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස නියම කරමින් ඒ එක් එක් සාක්ෂිකරු වෙත දැන්වීමක් නිකුත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් පිස්කල්ට විධාන කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 155 (2) වන වගන්තිය)

චූදිතයාගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබනු ලැබූ විට නඩු විභාගයට පෙර යුක්ති සහගත කාලයක් ඇතුළත චූදිතයා විසින්;

(අ) නඩු වාර්තාවේ හෝ එහි යම් කොටසක සහතික පිටපතක් ඉල්ලා සිටිනු ලැබුවහොත් ඒ නඩු වාර්තාව භාර නිලධාරියා විසින් සහ

(ආ) මහේස්ත්‍රාත්වරයා ඉදිරියෙහි සාක්ෂි දුන් සාක්ෂිකරුවන් විසින් පොලීසියට කරන ලද ප්‍රකාශවල සහ චූදිතයා විසින් පොලීසියට කරන ලද යම් ප්‍රකාශ වෙතොත් ඒ ප්‍රකාශවල සහතික පිටපතක් ඉල්ලා සිටිනු ලැබුවහොත් ඒ ප්‍රකාශවල සහතික පිටපතක් අදළ පොත් තබා ඇති පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින්, වචන එක් සියයකට ශත විසි පහ බැගින් වූ ප්‍රමාණයක් අනුව ඒ සඳහා චූදතියා විසින් ගෙවන ලද විට ඒ සහතික පිටපත් ඔහුට සපයනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 158 (1) වන වගන්තිය)

තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු කරුනු හේතු කොටගෙන එක් මාසයක කාලයකට වැඩි කාලයකට පරීක්ෂණයේ කාලය දීර්ඝ කිරීම අවශ්‍ය යයි මහේස්ත්‍රාත්වරයාට පෙනී ගියහොත් මිස, මේ පරිච්ඡේදය යටතේ පවත්වනු ලබන සෑම පරීක්ෂණයක්ම නඩු කටයුතු ආරම්භ වීමෙන් පසු එක් මාසයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 163 වන වගන්තිය)

(8.5) නඩු විභාගයට සූදානම් වීම.

චූදිතයා සමග ප්‍රථම උපදෙස් දීම සම්පූර්ණ කිරීමෙන් පසුව වැදගත් දෙයක් විස්තර කළ යුතුව ඇත. ඒ ඔහු/ඇයව හමුවීමට සූදානම් වීමෙහිලා අවශ්‍ය නෛතික කාර්ය පටිපාටිය විධිමත් කිරීම වේ. පහතින් දක්වා ඇත්තේ සලකා බැලිය යුතු කරුනු පිළිබඳ උපදෙස් මාලාවකි. එහිදී සාකච්ඡාව සුදුසු අවස්ථාවල පැහැදිළි කිරීම සේවාදයකයාට සිදුකළ යුතු අතරම සේවාදයකයා නඩු විභාගයට සූදානම් කිරීමේ ක්‍රියාදමය අතරතුර එය සිදුකළ යුතුව ඇත.

(8.5.1) සාමාන්‍යය නඩුවකට අදාල උසාවියට ඉදිරිපත් කළ යුතු උපදෙස් මාලාව.

- චෝදනාව සහිත ලේඛනය;
- විත්තිවාචක ඇත්නම් ඒ මොනවාද යන්න;
- සම විත්තිකරුවකු සිටීද යන්න;
- න්‍යාය සහ නඩුවේ තේමාව;
- පොලිස් වාර්තා;
- රජයේ සාක්ෂිකරු සහ ප්‍රදර්ශනය කර ඇති ලැයිස්තුව;
- දිවිරුම් ප්‍රකාශ ඇත්නම්;
- ඇප දිය හැකි හා ඇප දිය නොහැකි වැරදි;
- ජූරිය එරෙහි ව ජූරියක් නොමැති කරුණු;

(8.5.2) චෝදනා

- චෝදනාව හෝ අධි චෝදනාව; අදාල ව්‍යවස්ථා පනත් සහ ව්‍යවස්ථා; රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට අදාල මෝෂන්

(8.5.3) ආරම්භ නෛතික විමර්ශනය;

- අධිකරණමය කරුණු;
- අදාල වන හෝ නොවන ව්‍යවස්ථාපිත සීමාවන්;
- නඩු විභාගය කඩිනම් කරන කරුනු හෝ/සහ චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සමග පිළිගැනීම පිළිබඳ සාකච්ඡා;
- යම් විත්තිවාචක සඳහා විශේෂඥ/දැනුම් දීම/මෝෂන් අවශ්‍ය වේද යන්න;
- සේවාදයකයා තමන්ගේම විත්තිවාචකයට උදව් සහ සහය දෙනවාද යන්න;
- ප්‍රාථමික දඬුවම පිළිබඳ ඇගයීම;
- අදාල වගවීම උපරිම/අවම දඬුවම්;

(8.5.4) විත්තියේ සාක්ෂිකරුවන් පිළිබඳ ඇගයීම;

- සාක්ෂිකරුවන් ගේ ලැයිස්තුව;
- සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ඇතොත් ඒවා;
- කැඳවිය හැකි සෙසු අතිරේක සාක්ෂිකරුවන් සිටී නම්;
- විශේෂ සිතාසි ඇතොත් ඒවා අවශ්‍යය ද- උදහරණයකට වෛද්‍ය වාර්තා;
- සේවාදයකයා සාක්ෂි දීමට කැමතිද නැතහොත් නිහඬව සිටීමට කැමතිද යන වග;

(8.5.6) විශේෂඥයන්

- අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥයන් අවශ්‍යද?
- මනෝ විශේෂඥයින්;

- වෛද්‍යවරු/අධිකරණ වෛද්‍ය නිලධාරීන්;
- දේපළ හෝ හානිය පිළිබඳ විශේෂඥ තක්සේරුකරුවන්;
- අධිකරණ වෛද්‍ය විද්‍යාව, අපරාධය සිදුවූ ස්ථානය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති අය; ඇසින් දුටු සාක්ෂි පිළිබඳ ඒවා හඳුනාගත හැකි විශේෂඥයින් අවශ්‍ය ද යන්න;

(8.5.7) අදාල වෙතොත් පිළිගැනීම සහ දණ්ඩනයට සූදානම් වීම.

- සෑම විටම ගණනය කළ යුතු පිළිගැනීම පිළිබඳ ගිවිසුම්;
- දණ්ඩනය අඩු කිරීමේ තත්ත්වයන්;

චෝදනාව මෙහෙයවන නීති උපදේශකගේ සොයා ගැනීම් ලැබීමෙන් පසුව සියලු නිශ්චිත සාක්ෂි සමාලෝචනය කළ යුතුය. එම නිශ්චිත සාක්ෂිවලට ලේඛන, පොලිස් වාර්තා, ශ්‍රව්‍ය සහ වීඩියෝ වාර්තාගත කිරීම් අත්අඩංගුවට ගැනීමේ හෝ සෝදිසි කිරීමේ වරෙන්තු, ප්‍රස්ථාර, වාර්තා සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව සහ ප්‍රදර්ශනාත්මක සහ භෞතික සාක්ෂි යන්න ඇතුළත් වේ. රජය රැඳී සිටින තොරතුරු වල සාරාංශයක් ඇති අතර එය චූදිතට එරෙහි චෝදනා සාධාරණීකරණය කිරීමේදී අධිකරණයට මූලික හේතුවක් වනු ඇත.

සේවාදායකයා සාක්ෂි දීමේ වාසිදායක තත්ත්වයන් හා අවාසිදායක තත්ත්වයන් සලකා බැලිය යුතුය. මෙහිදී පැහැදිළි කළ යුතු වැදගත් දෙයක් ලෙස සේවාදායකයාට අපරාධය සිදුකළ බව පිළිගැනීමෙන් වැළකීම සහ නිහඬව සිටීමට ඇති අයිතිය පැහැදිළි කිරීම වැදගත් වේ.

(9) නඩු විභාගය

(9.1) මහේස්ත්‍රාත් අධිකරණවල කාර්ය භාරයන්.

මහේස්ත්‍රාත් අධිකරණයේදී චූදිත වැරදි නොකළ බව අයැද සිටින අවස්ථාවක් ගනිමු. එවිට චෝදනාව මෙහෙයවන නීතිඥවරයා පළමුව රජයේ නඩුව පිළිබඳ එහි ස්වභාවය ගැන සැලකිල්ලක් ඉදිරිපත් කළ යුතු අතරම ඔහු දරා සිටින භෞතික තොරතුරු ඉදිරිපත් කළ යුතුය. විත්තියෙන් පහත ඉල්ලීම කළ යුතුව ඇත. ඒ ඔහුගේ විත්තිවාචකය පිළිබඳ රාමුවක් ඉදිරිපත් කරන ලෙසය. එහිදී සාක්ෂි පිළිබඳ සාරාංශයක් ද ඇතුළත් විය යුතු අතර සෑම සාක්ෂිකරුවකුම එයට දායක විය යුතුය. ඔවුන් රජය දැනුවත් කළ යුතු අතර එයට චූදිත රැඳී සිටින විත්තිවාචක ඇතුලු සියලු භෞතික තොරතුරු ඇතුලත් කළ යුතුය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 136 වන වගන්තියේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරීමේ මූලික සැලැස්ම දක්වා ඇත.

(1) මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීම පහත දැක්වෙන ක්‍රම අතුරින් එකක් අනුව කරනු ලැබිය යුතුය :-

(අ) පරීක්ෂණය පැවැත්වීමට හෝ නඩු විභාග කිරීමට හෝ එම අධිකරණයට අධිකරණ බලය ඇති වරදක් සිදුකර ඇති බවට වාචික හෝ ලිඛිත පැමිණිල්ලක් එම අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වෙත කරනු ලැබූ විට; එසේ වුවද එවැනි පැමිණිල්ලක් ලිඛිතව කරනු ලැබේ නම් එය උත්තරවාදියකු විසින් පිළියෙල කරනු ලැබ අනු අත්සන් කරනු ලැබිය යුතුය.

(ආ) xi වන පරිච්ඡේදය යටතේ පත්කරනු ලැබූ පරීක්ෂකවරයකු විසින් හෝ සාම නිලධරයකු විසින් හෝ රජයේ සේවකයකු විසින් හෝ මහ නගර සභාවක සේවකයකු විසින් හෝ නගර සභාවක හෝ සුළු නගර සභාවක හෝ සේවකයකු විසින් ඉහත සඳහන් අන්දමේ වාර්තාවක් එම අධිකරණයේ මහේස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ විට,

(ඇ) ඉහත සඳහන් අන්දමේ දැනුමක් හෝ සැකයක් එම අධිකරණයේ මහේස්ත්‍රාත්වරයකුට ඇති වූ විට;

එසේ වුවද මේ ඡේදය යටතේ නඩු පවරනු ලැබූ විටක, නඩුව පවරනු ලැබුවේ යම් මහේස්ත්‍රාත්වරයකුගේ දැනුම හෝ සැකය මතද ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ නඩුව විභාග කරනු ලැබිය යුතු යැයි නැතහොත් නඩු විභාගය ඉහළ අධිකරණයට තැබිය යුතු යැයිද ඉල්ලා සිටීමට චූදිතයාට හෝ චූදිත තැනැත්තන්ගෙන් කිහිප දෙනෙකු ඇතොත් ඔවුන් අතුරින් කවර හෝ චූදිතයකුට හෝ හිමිකම් තිබිය යුතුය.

(ඈ) පරීක්ෂණයක් පැවැත්වීමට හෝ නඩු විභාග කිරීමට හෝ එම අධිකරණයට අධිකරණ බලය ඇති වරදක් සිදුකරන ලද බවට චෝදනා කරනු ලැබ අධිකරණ නියෝගයක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබ එම අධිකරණයේ මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට යම් තැනැත්තකු පමුණුවනු ලැබූ විට;

(ඉ) පරීක්ෂණයක් පැවැත්වීමට යම් අධිකරණයකට අධිකරණ බලය ඇති වරදක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස එම අධිකරණයේ මහේස්ත්‍රාත්වරයකුට නියම කෙරෙන නීතිපතිවරයාගේ අත්සන යටතේ වූ බලපත්‍රයක් මත;

(ඊ) 135 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ ලිඛිත වාර්තාව (ඉ) ඡේදය යටතේ වූ නීතිපතිවරයාගේ බලපත්‍රය සහ (ඊ) ඡේදය යටතේ වූ ලිඛිත පැමිණිල්ල ද තැපෑලෙන් හෝ පණිවුඩකරුවෙකු මගින් හෝ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම හෝ මහේස්ත්‍රාත් අධිකරණය වෙත අතින් භාර දීම හෝ කරනු ලැබිය යුතු අතර ඒවා නඩු කටයුතු වල කොටසක් බවට පත්විය යුතුය.

මෙහිලා විධි විධාන සලස්වා ඇති පරිදි හැර මහේස්ත්‍රාත්වරයකු විසින් යම් ලිඛිත පැමිණිල්ලක් භාර ගනු නොලැබිය යුතුය.

ඉන්පසුව මහේස්ත්‍රාත්වරයකු මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර ඒ අදාල නඩුව මහේස්ත්‍රාත් අධිකරණය හෝ මහාධිකරණය විසින් විභාග කරන්නේ ද යන්න තීරණය කිරීම ට වන අතර ඒ බව අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 145 වන වගන්තියේ සඳහන්ව ඇත.

(9.1.1) නඩුව මහාධිකරණයට යොමු කරනවාද නැතිනම් නිදහස් කරනවාද මහේස්ත්‍රාත්වරයා විසින් මූලික පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව තීරණය කරනු ලැබේ.

<u>145 වන වගන්තිය; මූලික පරීක්ෂණය</u>

චූදිතයා මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියෙහි පෙනී සිටි විට හෝ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියට පමුණුවනු ලැබූ විට

(අ) වරද හෝ වැරදි එකකට වැඩි ගණනක් ඇති විට ඒ වැරදි අතුරින් යම් වරදක් හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ ඉහත උප ලේඛනයෙහි දක්වා ඇති වැරදි ලැයිස්තුවට අයත් වරදක් වන අවස්ථාවක හෝ,

(ආ) අධිචෝදනා පත්‍රයක් සකස් කිරීම සඳහා මූලික පරීක්ෂණයකදී වාර්තාගත කරන ලද සාක්ෂි අවශ්‍ය වෙතැයි නීතිපතිවරයාගේ මතය වන විට වරද සිදුකරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතු යයි නීතිපතිවරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක,

මෙහි මින්මතු සඳහන් කර ඇති ආකාරයට මහේසත්‍රාත්වරයා විසින් මූලික පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතුය. (146 වන වගන්තිය)

චෝදනාව චූදිතයාට දැනුම් දිය යුතු බව.

මූලික පරීක්ෂණයක් පවත්වන මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ පරීක්ෂණය ආරම්භයේදී, පරීක්ෂණය පවත්වනු ලබන්නේ යම් චෝදනාවක් හෝ චෝදනා සම්බන්ධයෙන් ද ඒ චෝදනාව හෝ චෝදනා චූදිතයන්ට කියවා දිය යුතු නමුත්, එසේ කියවා දීමේදී එයට යම් උත්තරයක් දෙන ලෙස චූදිතයාට නියම කරනු නොලැබිය යුතුය. එවැනි යම් උත්තරයක් දෙනු ලැබුවහොත් මහේස්ත්‍රාත්වරයා එසේ

එය වාර්තාගත කරනු නොලැබිය යුතුය. එමෙන්ම එවැනි යම් උත්තරයක් චූදිතයාට විරුද්ධව සාක්ෂියේදී අවේශ්‍යය නොවිය යුතුය.

චෝදනාව මෙහෙයවන නීතිඥවරයා තම නඩුව සහ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුව විත්තියට ඔහුගේ හෝ ඇයගේ නඩුව ඉදිරිපත් කිරීමට අයිතිය ඇත.

152 වගන්තිය; විත්තිය සඳහා වූ සාක්ෂි

(1) චූදිතයාගේ ප්‍රකාශයට අදළව 151 වන වගන්තියෙහි වූ නියම අනුව ක්‍රියා කිරීමෙන් ඉක්බිතිව, චූදිතයා විසින් ප්‍රකාශයක් කර ඇති වුවද නොමැති වුවද, තමා වෙනුවෙන්ම සාක්ෂි දීමට ඔහු බලාපොරොත්තු වන්නේද යන වග සහ සාක්ෂිකරුවන් කැඳවීමට ඔහු බලාපොරොත්තු වන්නේ ද යන වග මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයාගෙන් විමසනු ලැබිය යුතුය.

(2) සාක්ෂිකරුවන් කැඳවීමට නොව සාක්ෂි දීමට තමා බලාපොරොත්තු වන බව ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් චූදිතයා ප්‍රකාශ කරතහොත්, චූදිතයාගේ සාක්ෂි නොපමාව ගැනීමට මහේස්ත්‍රාත්වරයා ක්‍රියාකළ යුතු අතර, චූදිතයාගේ සාක්ෂිය අවසානයේදී (චූදිතයා නියෝජනය කරනු ලැබේ නම්) චූදිතයා කැමති වුවහොත් ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ සැලසිය යුතුය.

(3) තමා වෙනුවෙන්ම සාක්ෂි දීමට සහ සාක්ෂිකරුවන් කැඳවීමට හෝ සාක්ෂිකරුවන් කැඳවීමට පමණක් හෝ තමා බලාපොරොත්තු වන බව ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් චූදිතයා ප්‍රකාශ කරන තෙක් තමා විසින්ම සාක්ෂි දීමට චූදිතයා අදහස් කරන්නේ නම් ඔහුගේ සාක්ෂි සහ නඩුවේ සිද්ධි හා අවස්ථාගත කරුණුවලට අදලව කිසිවක් හෝ චූදිතයාගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට තුඩු දෙන්නා වූ කිසිවක් හෝ දන්නවාද චූදිතයා විසින් කැඳවනු ලබන්නා වූද යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි නොපමාව හෝ චූදිතයා වෙනුවෙන් නීතිඥවරයකු විසින් දේශනයක් පවත්වනු ලැබීමට තිබේ නම් ඒ දේශනය අවසන් වීමෙන් පසු හෝ ගැනීමට මහේස්ත්‍රාත්වරයා විසින් ක්‍රියා කළ යුතුය.

(4) කැඳවීමට තමාට සාක්ෂිකරුවන් ඇති නමුත් අධිකරණයට පැමිණ නොමැති බව චූදිතයා විසින් ප්‍රකාශ කරනු ලැබුවහොත් සහ ඒ සාක්ෂිකරුවන් පැමිණ නොසිටීමට හේතුව චූදිතයාගේ යම් දෝෂයක් හෝ නොසැලකිල්ලක් හෝ නිසා නොවන බවටත් ඔවුන් පැමිණ සිටියේ නම් ඔවුන්ට චූදිතයා වෙනුවෙන් වැදගත් සාක්ෂි දීමට ඉඩ ඇති බවටත් මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, විභාගය අඩාලව කල් තැබීම ද ඒ සාක්ෂිකරුවන්ගේ පැමිණ සිටීම බල කිරීම පිණිස අධිකරණ නියෝග නිකුත් කිරීම හෝ වෙනත් පියවර ගැනීමද මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය යුතුය.

(5) චූදිතයා විසින් හෝ ඉහත කී පරිදි එවැනි යම් සාක්ෂිකරුවකු විසින් හෝ දෙනු ලැබූ සාක්ෂි ලිඛිතව සටහන් කරගනු ලැබිය යුතු අතර, 148 වන වගන්තියේ විධි විධාන, චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් අදළ වන්නාක් මෙන්ම විත්තියේ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් ද අදළ විය යුතුය. එහෙත් චූදිතයාගේ චරිතය පිළිබඳව පමණක් සාක්ෂිකරුවකු වූ යම් සාක්ෂිකරුවකුට නඩු විභාගයට පැමිණ සිටීම පිණිස බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු නොලැබිය යුතුය.

මහේස්ත්‍රාත්වරයා, ඊළඟට නඩුවෙන් නිදහස් කිරීම හෝ නඩුව මහාධිකරණයට යොමු කළ හැකි ද යන්න සලකා බැලිය යුතුව ඇත.

<u>153 වගන්තිය, නිදහස් කිරීම.</u>

චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි චූදිතයා නඩු විභාගයට භාජනය කිරීමට ප්‍රමාණවත් නොවේ යයි මහේස්ත්‍රාත්වරයා සලකතහොත් විභාගයට යටත්ව පවත්නා චෝදනාව සම්බන්ධයෙන් තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත චූදිතයා නිදහස් කරන ලෙස, මහේස්ත්‍රාත්වරයා විසින්

නොපමාව ආඥා කරනු ලැබිය යුතුය. එහෙත් එවැනි නිදහස් කිරීමක්, එම සිද්ධි සම්බන්ධයෙන් වූ යම් තැනැත්තකුගේ චෝදනාවකට බාධාවක් නොවිය යුතුය.

එසේ වුවද වහාම හෝ යුක්තිය ඉටු කිරීම පිණිස යෝග්‍ය යයි පෙනී යන පරීක්ෂණයේ යම් අඩාලව කල් තැබීමකින් පසුව හෝ චූදිතයා මහේස්ත්‍රාත්වරයා ඉදිරියට කැඳවනු ලැබිය හැකිව තිබූ හෝ අන්‍යාකාරයකින් පමුනුවනු ලැබිය හැකිව තිබූ වෙනත් යම් චෝදනාවක් විමර්ශනය කරගෙන යාමෙන් නැතහොත් ඉහත කී පරිදි එසේ නිදහස් කරන ලද චෝදනාව විභාග කරගෙන යනු ලබන අතරතුර චූදිතයා විසින් සිදුකරන ලදැයි පෙනී යන කාරණයක් පිළිබඳ වෙනත් යම් චෝදනාවක් විමර්ශනය කරගෙන යාමෙන් මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් මහේස්ත්‍රාත්වරයා වළක්වනු නොලැබිය යුතුය.

(2) (තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු අනුව) අපරාධ චෝදනාව පදනම් රහිත යයි මහේස්ත්‍රාත්වරයා සලකන්නේ නම් නඩුවේ කවර හෝ අවස්ථාවකදී චූදිතයා නිදහස් කිරීමෙන් මේ වගන්තියෙහි වූ කිසිවකින් මහේස්ත්‍රාත්වරයා වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතුය.

<u>154 වන වගන්තිය, නඩු විභාගයට තැබීම.</u>

(1) චූදිතව නඩු විභාගයට තැබීම ට ප්‍රමාණවත් සාක්ෂි ඇත්තේ යයි මහේස්ත්‍රාත්වරයා සලකන්නේ නම් නඩු විභාගය මහා අධිකරණයට තැබිය යුතුය.

(2) මහාධිකරණයේ නඩු විභාගයට පෙර චූදිතයා අඩු වරදකට වරද පිළිගැනීමට කැමති බව ප්‍රකාශ කරන විට එය මහා අධිකරණයේ අධිචෝදනා ලැබ සිටින විටදී මහේස්ත්‍රාත්වරයා එවැනි ප්‍රකාශයක් වාර්තා කළ යුතුය.

කෙසේ නමුත් එවැනි ප්‍රකාශයක් සිදුකර තිබුණද මහාධිකරණයේ නඩු විභාගයට සිටීමෙන් චූදිතයා නොවැළැක්විය යුතුය.

එවැනි ප්‍රකාශයක් කර ඇති විට එය චූදිතයාව නඩු විභාගයකදී වෙනස්කමකට භාජනය නොකළ යුතුව ඇත.

(3) මහා අධිකරණයේ අධිචෝදනා ඉදිරිපත් කර ඇති විට දී චූදිතයා අඩු වරදකට වරදකරු වීමට කැමති බව ප්‍රකාශ කර ඇති විටදී අධිකරණය ද එම පිළිගැනීමට කැමති වූ විට ඔහුට විනිසුරු දඬුවම් පැමිණවිය යුතු අතරම මහේස්ත්‍රාත් අධිකරණයේදී අඩු වරදකට වරදකරු වීමේ කැමැත්ත පිළිගනු ලැබේ.

(4) 2 වන උප වගන්තිය යටතේ චූදිතයා ප්‍රකාශයක් කර ඇති විටදී අධිකරණය හෝ නීතිපතිවරයා චූදිතයා විසින් මහාධිකරණයේ සිදුකළ අඩු වරද කිරීමකට මහාධිකරණයේ කළ ප්‍රකාශය මත අධිචෝදනාවකට වරද පිළිගනී.

(9.1.2) <u>ලඝු ආකාරයෙන් නඩු විභාග කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය ඇති අවස්ථාවක නඩු විභාග කිරීම.</u>

මහේස්ත්‍රාත් අධිකරණය ලඝු ආකාරයකින් නඩු විභාග කරන විට ඒ පිළිබඳ සාමාන්‍ය කාර්යපටිපාටිය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 182 සිට 192 වන වගන්තිය දක්වා සඳහන් කර ඇත.

<u>182 වන වගන්තිය, නඩුවේ විස්තර චූදිතයාට ප්‍රකාශ කළ යුතු බව.</u>

(1) චූදිතයා අධිකරණය ඉදිරියට පමුනුවනු ලබන හෝ ඔහු අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින හෝ අවස්ථාවක චූදිතයාට විරුද්ධව ක්‍රියා කරගෙන යාමට ප්‍රමාණවත් හේතු ඇත්තේ නම් මහේස්ත්‍රාත්වරයා එසේ චූදිතයාට විරුද්ධව චෝදනාවක් සකස් කළ යුතුය.

(2) මහේස්ත්‍රාත්වරයා විසින් ඒ චෝදනාව චූදිතයාට කියවා ඔහු වරදකරු කරනු නොලැබිය යුතු බවට හේතු කිසිවක් දැක්වීමට තිබේදැයි ඔහුගෙන් ඇසිය යුතුය.

183 වන වගන්තිය : චූදිතයා විසින් වරද පිළිගැනීම.

(1) තමා වරදකරු කරනු නොලැබිය යුතු බවට හේතු කිසිවක් දැක්වීමට තමාට තිබේදැයි අසනු ලැබූ විට තමා චෝදනා ලැබ සිටින වරද සම්බන්ධයෙන් තමා වරදකරු බවට නිරවශේෂ පිළිගැනීමක් වන ප්‍රකාශයක්, චූදිතයා කළහොත්, ඔහුගේ ප්‍රකාශයේදී ඔහු විසින් උපයෝගී කරගනු ලබන වචන වලින්ම හැකිතාක් ඒ ප්‍රකාශය වාර්තාගත කරනු ලැබිය යුතුය. තවද වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කොට නීතිය අනුව චූදිතයාට දණ්ඩනය නියම කොට ඒ දණ්ඩන නියමය වාර්තාගත කළ යුතුය.

එසේ වුවද චූදිතයාට විරුද්ධව දණ්ඩන නියමය පැනවීමට පෙර ඕනෑම අවස්ථාවකදී මහේස්ත්‍රාත්වරයාගේ අවසරය ඇතිව චූදිතයා විසින් තම වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කර ගත හැකිය. එවැනි අවස්ථාවකදී වරදකරු කිරීම සටහන් කරනු නොලැබූවාක් මෙන් නඩු විභාගය පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයා කටයුතු කළ යුතුය.

(2) චූදිතයා ප්‍රකාශයක් නොකළ හොත් හෝ නිරවශේෂ වරද පිළිගැනීමක් බවට පත් නොවන ප්‍රකාශයක් කළහොත් නඩු විභාගය සඳහා සූදානම් දැයි මහේස්ත්‍රාත්වරයා විසින් ඔහුගෙන් අසනු ලැබිය යුතු අතර,

(අ) තමා නඩු විභාගය සඳහා සූදානම් යයි චූදිතයා පිළිතුරු දුනහොත් මහේස්ත්‍රාත්වරයා විසින්, මෙහි මින් මතු විධි විධාන සලස්වා ඇති ආකාරයට නඩුව විභාග කරගෙන යා යුතුය, එහෙත්

(ආ) සාක්ෂිකරුවන් පැමිණ නොසිටීමේ හේතුව නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ තමා නඩු විභාගය සඳහා සූදානම් නැතැයි චූදිතයා පිළිතුරු දුනහොත් මහේස්ත්‍රාත්වරයා විසින්, 263 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධි විධානවලට යටත්ව ඒ අවස්ථාවේදී නියම කළ යුතු දිනයකට නඩු විභාගය කල් තැබීම හෝ මෙහි මින් මතු විධි විධාන සලස්වා ඇති ආකාරයට නඩුව නොපමාව විභාග කිරීම කරගෙන යාම හෝ කළ යුතුය.

එහෙත් මෙහි මින් මතු විධි විධාන සලස්වා ඇති ආකාරයට, චෝදක පක්ෂයේද විත්ති පක්ෂය වෙනුවෙන් පැමිණ සිටින යම් සාක්ෂිකරුවන්ගේ ද සාක්ෂි ගැනීමෙන් හා ඊට පසු 263 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධි විධාන වලට යටත්ව, මහේස්ත්‍රාත්වරයා විසින් ලිඛිතව වාර්තාගත කළ යුතු හේතු මත ඔහු විසින් නියම කරනු ලබන දිනයකට නඩු විභාගය අඩාලව කල් තැබීමෙන්, මෙහි ඇතුළත් කිසිවකින් මහේස්ත්‍රාත්වරයා වළක්වනු නොලැබිය යුතුය.

184 - නඩු විභාගයේදී කාර්ය පටිපාටිය.

(1) චූදිතයාට විරුද්ධව නඩු විභාග කිරීම මහේස්ත්‍රාත්වරයා විසින් කරගෙන යනු ලබන කල්හි පිළිවෙලින්, චෝදක පක්ෂය සඳහා හෝ විත්ති පක්ෂය සඳහා හෝ ඉදිරිපත් කරනු ලබන සියලු සාක්ෂි මහේස්ත්‍රාත්වරයා විසින් ගනු ලැබිය යුතුය.

(2) චෝදක පක්ෂය වෙනුවෙන් කැඳවන ලද සියලු සාක්ෂි කරුවන්ගේ ද මහේස්ත්‍රාත්වරයා විසින් කැඳවන ලද හෝ නැවත කැඳවන ලද සියලු සාක්ෂිකරුවන්ගේ ද හරස් ප්‍රශ්න ඇසීමට විත්තිකරුට ඉඩ දෙනු ලැබිය යුතුය.

(3) ස්වකීය නඩු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම ආරම්භ කිරීමට පැමිණිලිකරුට ද චූදිතයාට ද ඔවුන්ගේ උත්තරවාදීන්ට ද හිමිකම් ඇති නමුත් චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් දෙනු ලැබූ සාක්ෂිවලට පිළිතුරු වශයෙන් නිරීක්ෂණ කිසිවක් කිරීමට පැමිණිලිකරුට හෝ ඔහුගේ උත්තරවාදියාට හෝ හිමිකම් නොතිබිය යුතුය.

185 වන වගන්තිය - තීන්දු ප්‍රකාශය

(1) චෝදක පක්ෂයේ සහ විත්ති පක්ෂයේ සාක්ෂි මහේස්ත්‍රාත්වරයා විසින් සිය මෙහෙයවීමෙන් ඉදිරිපත් කිරීමට සලස්වනු ලබන වැඩිදුර සාක්ෂි කිසිවක් වෙතොත් ඒ සාක්ෂි ද ගැනීමෙන් පසු චූදිතයා වරදකරු නොවේ යයි මහේස්ත්‍රාත්වරයා තීරණය කරන තෙක් නිදෙස් කිරීමේ තීන්දු ප්‍රකාශයක් මහේස්ත්‍රාත්වරයා විසින් නොපමාව වාර්තාගත කරනු ලැබිය යුතුය. චූදිතයා වරදකරු යයි මහේස්ත්‍රාත්වරයා තීරණය කරතහොත් වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් ඔහු විසින් නොපමාවම වාර්තාගත කොට නීතිය අනුව චූදිතයාට දණ්ඩනය නියම කොට ඒ දණ්ඩන නියමය වාර්තාගත කරනු ලැබිය යුතුය.

186 වන වගන්තිය - ඕනෑම අවස්ථාවක චූදිතයා නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය ඇති බව.

මෙහි මින් පෙර ඇතුළත් කිසිවකින් නඩුවේ යම් කලින් අවස්ථාවකදී චූදිතයා නිදහස් කිරීමෙන් මහේස්ත්‍රාත්වරයා වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු නමුත් එසේ නිදහස් කිරීමට හේතු මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතුය. එසේ වුවද නඩුව සම්බන්ධයෙන් වැඩිදුර නඩු කටයුතු පවත්වාගෙන යාමෙන් චූදිතයා වරදකරු කිරීමේ ප්‍රතිඵලය ඇති නොවන බවට තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින් චූදිතයා නිදෙස් කරනු ලැබිය යුතුය.

187 වන වගන්තිය - නඩු කටයුතු පවත්වාගෙන යන අතරතුර වෙනත් වරදක් එළිදරව් වූ විට ගතයුතු ක්‍රියාමාර්ගය.

(1) නඩු විභාග කිරීමට මහේස්ත්‍රාත්වරයාගේ අධිකරණ බලය ඇතුළත වූ චෝදනාවේ සඳහන් වරද නොවන වෙනත් වරදක් චූදිතයා විසින් කර ඇති බව පිළිගනු ලැබූ හෝ ඔප්පු කරනු ලැබූ සිද්ධි අනුව පෙනී ගියහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ වරදට චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි නමුත්, එසේ වරදකරු කිරීමට පෙර ඔහු විසින් චෝදනාවක් සකස් කර ඒ චෝදනාව චූදිතයාට කියවා තේරුම් කර දිය යුතුය. තවද වෙනස් කරනු ලැබූ චෝදනාවලට xvi වන පරිච්ඡේදයේ විධි විධාන අතුරින් අදාළ වන්නේ යම් විධි විධාන ද ඒ විධි විධාන මේ වගන්තිය යටතේ සකස් කරනු ලැබූ චෝදනාවට අදාළ විය යුතුය.

(2) පිළිගනු ලැබූ හෝ ඔප්පු කරනු ලැබූ සිද්ධි අනුව

(අ) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති වැරදි ලැයිස්තුව ඇතුළත් වන වරදක් චූදිතයා විසින් වරදකරු කරනු නොලැබිය යුතුය. එහෙත් ඔහු විසින් xv පරිච්ඡේදය යටතේ අලුතින් නඩු කටයුතු ආරම්භ කළ යුතුය; නැතහොත්

(ආ) එම උපලේඛනයේ සඳහන් වැරදි ලැයිස්තුවට ඇතුළත් නොවන නමුත් මහේස්ත්‍රාත්වරයා විසින් ලඝු ආකාරයෙන් නඩු විභාග කළ නොහැකි වරදක් චූදිතයා විසින් කර ඇති බව පෙනී ගියහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයා වරදකරු කරනු නොලැබිය යුතුය. එහෙත් ඔහු විසින් නඩු කටයුතු නතර කර නඩුව නීතිපතිවරයා වෙත වාර්තා කොට ඊට පසු ඔහුගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

188 වන වගන්තිය - පැමිණිලිකරු පැමිණ නොමැති විට චූදිතයා නිදෙස් කළ හැකි බව.

(1) 136 (1) (අ) වගන්තිය යටතේ වූ පැමිණිල්ලක් මත සිතාසි නිකුත් කරනු ලැබූ චූදිතයාට පෙනී සිටින ලෙස නියම කර ඇති දිනයේදී හෝ වේලාවේදී නැතහොත් නඩු විභාගය යම් අවස්ථාවක ට අඩාලව කල් තබනු ලැබීමේදී ඒ අවස්ථාවේදී පැමිණිලිකරු පෙනී නොසිටියහොත් මෙහි මින් පෙර කුමක් සඳහන්ව ඇතද, යම් කිසි හේතුවක් නිසා යම් දිනයකට හෝ වේලාවකට නඩු විභාගය අඩාලව කල් තැබීම සුදුසු යයි මහේස්ත්‍රාත්වරයා කියන්නේ නම් මිස මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයා නිදෙස් කළ යුතු අතර, ඊට අතිරේකව මෙහි මින් මතු විධි විධාන සලස්වා ඇති පරිදි

පැමිණිලිකරු විසින් රජයේ ගාස්තු ගෙවනු ලැබීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කළ හැකිය.

එසේ වුවද පැමිණිලිකරු සාධාරණ කාලයක් ඇතුළත පෙනී සිට තමාගේ නොපැමිනීම, අසනීපයක්, හදිසි අනතුරක් හෝ තමාට මැඩ පැවැත්විය නොහැකි වෙනත් යම් හේතුවක් නිසා වූයේ යයි මහේස්ත්‍රාත්වරයා වසින් මේ උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක් අවලංගු කළ යුතුය.

(2) අවස්ථාවෝචිත පරිදි 136 (1) (ආ) හෝ (ඇ) වන වගන්තිය යටතේ වූ පැමිණිල්ලක් මත සිතාසි නිකුත් කරනු ලැබ, නඩු විභාගය සඳහා නියම කරන ලද දිනයේදී චෝදක පක්ෂය සූදනම්ව නොසිටිය හොත් යම් කිසි හේතුවක් නිසා වෙනත් දිනයකට හෝ වේලාවකට නඩු විභාගය අඩාලව කල් තැබීම සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම් මිස, අධිරණය විසින් චූදිතයා නිදහස් කළ හැකිය.

(3) (2) වන උප වගන්තියෙහි සඳහන් නිදහස් කිරීමේ ආඥාව කරනු ලැබුවේ එකම වරද සම්බන්ධයෙන් දෙවන වරට නම් ඒ නිදහස් කිරීමේ ආඥාව නිදෙස් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතුය.

189 - පැමිණිලිකරු විසින් චෝදනාව අස්කර ගැනීම.

මේ පරිච්ඡේදය යටතේ වූ යම් නඩුවක නඩු තීන්දුව දීමට පෙර යම් අවස්ථාවකදී, නඩුව අස්කර ගැනීමට තමාට අවසර දීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට පැමිණිලිකරුවකු විසින් මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් කරතහොත් නඩුව අස්කර ගැනීමට මහේසත්‍රාත්වරයා විසින් ඔහුට අවසර දීය හැකි අතර, ඉනික්බිතිව මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයා නිදෙස් කළ යුතුය. එහෙත් එසේ කිරීම සඳහා තමාට ඇති හේතු මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතුය.

එසේ වුවද 266 වගන්තියේ විධි විධාන යටතේ වැරදි සමථයට පත් කිරීමට ඉඩදීමට මහේස්ත්‍රාත්වරයකුට ඇති බලතල මෙහි ඇතුළත් කිසිවකින් පුළුල් වෙතැයි සලකනු නොලැබිය යුතුය.

190 - නීතිපතිවරයාගේ අනුමැතිය ඇතිව මහේස්ත්‍රාත්වරායා විසින් චූදිතයා නිදහස් කළ හැකි බව.

136 (1) වන වගනතියෙහි (ආ) වන (ඇ) වන සහ (ඈ) වන ඡේද යටතේ වූ පැමිණිල්ලක් මත හැර, මේ පරිච්ඡේදය යටතේ විභාග කරනු ලබන යම් නඩුවකදී මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තා ගත කළ යුතු හේතු මත, නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, නිදෙස් කිරීමේ හෝ වරදකරු කිරීමේ යම් නඩු තීන්දුවක් ප්‍රකාශ නොකොට ඕනැම අවස්ථාවකදී නඩු කටයුතු නතර කළ හැකි අතර, ඉනික්බිතිව මහේස්ත්‍රාත්වරයා විසින් චූදිතයා නිදහස් කළ හැකිය.

191 - මේ පරිච්ඡේදය යටතේ වූ අපරාධ චෝදනා කවරෙකු විසින් මෙහෙයවනු ලැබිය හැකිද යන වග.

(1) නීතිපතිවරයාට, නියෝජ්‍යය නීතිපතිවරයාට, රජයේ නීතිඥයකුට හෝ නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකුට හෝ (2) වන උප වගන්තියේ විධි විධානවලට යටත්ව මේ පරිච්ඡේදය යටතේ විභාග කරනු ලබන යම් නඩුවකදී පෙනී සිටි අපරාධ චෝදනාව මෙහෙයවීමට හිමිකම තිබිය යුතුය. එහෙත් නීතිපතිවරයා, නියෝජ්‍යය නීතිපතිවරයා, රජයේ නීතිඥවරයා හෝ පෙර කී පරිදි වූ යම් උත්තරවාදියකු නොමැති විට, පැමිණිලිකරු විසින් හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක යම් නිලධරයකු විසින් හෝ යම් මහ නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක යම් නිලධරයකු විසින්, එම පැමිණිලිකරු හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව හෝ මහ නගර සභාව හෝ නගර සභාව හෝ සුළු නගර සභාව සම්බන්ධතාවක් දක්වන යම් නඩුවක අපරාධ චෝදනාව මෙහෙයවීම පිණිස පෞද්ගලික හෝ උත්තරවාදියකු මගින් හෝ පෙනී සිටිය හැකිය.

එසේ වුවද නීතිපතිවරයා, නියෝජ්‍ය නීතිපතිවරයා, රජයේ නීතිඥවරයකු හෝ නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකු පැමිණ නොමැති විටක, මහේස්ත්‍රාත්වරයා විසින් පැමිණිලිකරු වෙනුවෙන් නීතිඥයකු පෙනී නොසිටින අවස්ථාවක චූදිතයා විසින් වරද සිදුකරනු ලදැයි කියනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද නැතහොත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙනුවෙන් පෙනී සිට අපරාධ චෝදනාව මොහයවීම පිණිස යම් නීතිඥයකුට අවසර දෙනු ලැබිය හැකිය.

(2) පැමිණිල්ල 136 වන වගන්තියේ 1 වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් නම්, රජයේ නිලධාරියකුගේ හෝ සේවා නියුක්තිකයකුගේ නිල කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් වූ හෝ ඉටු කිරීමට අදාල වූ කාරණයක් සම්බන්ධයෙන් ඒ නිලධාරියාට හෝ සේවා නියුක්තිකයාට විරුද්ධව ඒ පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවකදී හැර, නීතිපතිවරයාට, නියෝජ්‍ය නීතිපතිවරයා, රජයේ නීතිඥයකුට හෝ නීතිපතිවරයා විසින් විශේෂයෙන් හෝ සාමාන්‍යයෙන් බලය දෙනු ලැබූ උත්තරවාදියකුට හෝ පැමිණිලිකරුගේ කැමැත්ත නොමැතිව ඔහු වෙනුවෙන් පෙනී සිටීමේ අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

192 - චූදිතයා පැමිණ නොසිටිය දී නඩු විභාගය පවත්වාගෙන යා හැකි බව.

(1) (අ) චූදිතයා පැන ගොස් සැඟවී සිටින හෝ දිවයිනෙන් බැහැරව සිටින අවස්ථාවක හෝ

(ආ) අසනීපයක් නිසා අධිකරණයට පැමිණ සිටීමට හෝ අධිකරණයෙහි රැඳී සිටීමට චූදිතයාට නොහැකි වන්නා වූ සහ ඔහු නොමැතිව නඩු විභාගය ආරම්භ කිරීමට හෝ පවත්වාගෙන යාමට ඔහු කැමැත්ත දී හෝ එම නඩු විභාගය ඔහුට හානියක් නොවන අන්දමින් ආරම්භ කොට පවත්වාගෙන යාම හෝ දිගටම පවත්වාගෙන යාම කළහැකි වන්නා වූ ද අවස්ථාවක හෝ,

(ඇ) අධිකරණයෙහි ඔහුගේ හැසිරීම හේතු කොට ගෙන නඩු විභාගය ඉදිරියට පවත්වාගෙන යාමට චූදිතයා බාධා කරන හෝ අවහිර කරන අවස්ථාවක,

මහේස්ත්‍රාත්වරයා මේ සිද්ධි සම්බන්ධයෙන් සෑහීමට පත්වන්නේ නම් ඔහු විසින් චූදිතයා පැමිණ නොසිටියදී නඩු විභාගය ආරම්භ කොට පවත්වාගෙන යනු ලැබිය හැකිය.

(2) චූදිත තැනැත්තකු පිළිබඳව (1) වන වගන්තිය (අ) ඡේදය යටතේ නඩු විභාගය පවත්වාගෙන යනු ලබන අතරතුර හෝ නඩු විභාගය අවසන් වී සාධාරණ කාලයක් ඇතුළත චූදිත තැනැත්තා අධිකරණයෙහි පෙනී සිට සම්පූර්ණ නඩු විභාගයට හෝ ඉන් කොටසකට තමා පැමිණ නොසිටීම සද්භාවයෙන් සිදුවූවක් බවට අධිකරණය සෑහීමකට පත් කරතහොත්,

(අ) නඩු විභාගය අවසන් කර නොමැති විට, අධිකරණය ඉදිරියෙහි චූදිතයා පෙනී සිටි අවස්ථාව දක්වා ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද සාක්ෂි ඔහුට කියාදෙනු ලැබිය යුතු අතර, ඒ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ඔහුට ලබාදිය යුතුය.

තවද;

(ආ) නඩු විභාගය අවසන් කර ඇති විට, වරදකරු කිරීමක් හා දණ්ඩන නියමයක් කර ඇති යම් අධිකරණය විසින් ඒවා අවලංගු කොට චූදිතයා පිළිබඳ නඩු විභාගය අලුතෙන් පැවැත්විය යුතු යයි ආඥා කළ යුතුය.

(3) නඩු විභාගයේදී චූදිත තැනැත්තා පැමිණ නොසිටියදී ඥාතියකු විසින් ඒ චූදිත තැනැත්තාගේ විත්තිවාචකය ඉදිරිපත් කරන ලද නම්, (2) වන උප වගන්තියෙහි විධි විධාන අදාළ නොවිය යුතුය.

(9.2) මහේස්ත්‍රාත් අධිකරණ ගැලීම් සටහන; 15 වන පරිච්ඡේදය බලන්න.

පරිශිෂ්ටය

(9.3) <u>මහා අධිකරණය කාර්ය පටිපාටීන්.</u>

මහා අධිකරණයේ චූදිතයාට විරුද්ධව අධිචෝදනා ගොනු කර ඇති විට ඇයට/ඔහුට අධි චෝදනා භාර දිය යුතු අතර ඇයට හෝ ඔහුට චෝදනාවේ විස්තර ලබා දිය යුතුව ඇත. ඒ සමගම නඩු විභාගය පිළිබඳව ද දැනුවත් කළ යුතුය. එම වේලාවේදීම ඇයට/ඔහුට,

(අ) රජය නඩු විභාගයට කැඳවන සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් සහ සෑම සාක්ෂිකරුවකුම දෙන සාක්ෂිවල සාරංශයක් ලබාදිය යුතු අතරම රජය සලකනු ලබන සියලු තොරතුරු පිළිබඳව චූදිතයා දැනුවත් කළ යුතුව ඇත;

(ආ) චූදිතව ඔහුගේ විත්තිවාචකය පිළිබඳව කරුනු ඉදිරිපත් කරන ලෙස දැන්විය යුතු අතරම එය චෝදනාව සම්බන්ධයෙන් විය යුතු අතරම ඔහු විත්තිවාචකය සඳහා කැඳවන සියලු සාක්ෂිකරුවන් ගේ නාමාවාලියක් ද සෑම සාක්ෂිකරුවකුම දිමට නියමිත සාක්ෂි වල සාරාංශයක් ද කැඳවිය යුතුව ඇත. මෙමගින් ඔහු සිය විත්තිවාචකයේදී කැඳවන සියලු තොරතුරු පිළිබඳව රජයට ප්‍රමාණවත් පරිදි දැනුම් දිය යුතුව ඇත.

මහා අධිකරණයේ නඩු විභාගවලට අදල වන සාමාන්‍යය ප්‍රතිපාදන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 193 සිට 195 දක්වා වගන්තිවල සඳහන් කර ඇත.

**193 වන වගන්තිය - මහාධිකරණය ඉදිරිපිට වූ නඩු විභාග කවරකු විසින් මෙහෙයවනු ලැබිය යුතු ද යන බව.**

මහාධිකරණය ඉදිරිපිට වූ සෑම නඩු විභාගයකදී ම, නීතිපතිවරයා විසින් හෝ නියෝජ්‍යය නීතිපතිවරයා විසින් හෝ රජයේ නීතිඥවරයකු විසින් අපරාධ චෝදනාව මෙහෙයවීම පිණිස නීතිපතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් උත්තරවාදියකු විසින් හෝ අපරාධ චෝදනාව මෙහෙයවනු ලැබිය යුතුය.

**194 වන වගන්තිය :- නීතිපතිවරයා, චෝදනාව ඉවත් කර ගැනීම.**

194 (1) මේ සංග්‍රහය මහාධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන නඩු විභාගයකදී ජූරි සභාවේ තීරණය ඉදිරිපත් කිරීමට පෙර කවර හෝ අවස්ථාවක, සුදුසු යයි නීතිඥවරයා කල්පනා කරතහොත් ඔහු විසින් අධිචෝදනා පත්‍රය මත නැතහොත් එහිලා සඳහන් යම් චෝදනාවක් මත චූදිතයාට විරුද්ධව තවදුරටත් තමා විසින් අපරාධ චෝදනාව මෙහෙය වනු නොලබන බව අධිකරණයට දැනුම් දිය හැකි අතර එසේ දැනුම් දෙනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි ඒ අධිචෝදනා පත්‍රය මත හෝ චෝදනාව මත හෝ චූදිතයාට විරුද්ධව ඇති සියලු නඩු කටයුතු පවත්වා ඒ පිළිබඳවද එයින් ද චූදිතයා නිදහස් කරනු ලැබිය යුතුය.

(2) මේ වගන්තිය යටතේ කෙරෙන දැනුම් දීම වාචිකව හෝ නීතිපතිවරයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් හෝ කළ හැකිය.

(3) ජූරි සභාවේ තීරණය ඉදිරිපත් කිරීමට පෙර නඩු විභාගයේ කවර හෝ අවස්ථාවකදී චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් මූලාසනාරූඪ විනිශ්චයකාරවරයාගේ කැමැත්ත ඇතිව, අධිචෝදනා පත්‍රය හෝ එහිලා සඳහන් යම් චෝදනාවක් හෝ අස්කර ගත හැකි අතර එසේ අස්කර ගනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ඒ අධිචෝදනා පත්‍රය මත හෝ ඒ චෝදනාව මත හෝ චූදිතයාට විරුද්ධව ඇති සියලු නඩු කටයුතු නවත්වා ඒ පිලිබඳව ද එයින්ද චූදිතයා නිදහස් කරනු ලැබිය යුතුය.

**195 අධිචෝදනා පත්‍රය ලැබුනු විට විනිශ්චයකාරවරයාගේ කාර්යය.**

අධිචෝදනා පත්‍රය මහාධිකරණය වෙත ලැබුනු විට යම් මහාධිකරණ විනිසුරු විසින් විධාන කර ඇත්ද ඒ සැසි වාරය මූලාසනාරූඪ මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින්, නඩුව විභාග කිරීමට නියමිත අධිකරණ භූමියේදී සිදුකළ යුතුය,

(අ) චූදිතයා තමා ඉදිරිපිට පෙනී සිටීමට හෝ තමා ඉදිරිපිට පෙනී සිටිනු ලැබීමට හෝ සැලැස්විය යුතුය;

(ආ) ඒ අධිචෝදනා පත්‍රය මත නඩු විභාගයට භාජනය කරනු ලබන එක් එක් චූදිතයා වෙත අධිචෝදනා පත්‍රයේ පිටපතක් එහි ඇමිණුම් සමග භාර දීමට සැලැස්විය යුතුය;

(ඇ) නඩු විභාගය පවත්වන දිනය චූදිතයාට දැන්විය යුතුය;

(ඈ) 403 වන වගන්තියේ විධි විධානවලට යටත්ව චූදිතයාගේ නඩු විභාගය සඳහා ඔහු අධිකරණය ඉදිරිපිට පෙනී සිටින බවට බැඳුම්කරයක් අත්සන් කර දෙන ලෙස චූදිතයාට විධාන කළ යුතුය; නැතහොත් යම් බන්ධනාගාරයක අධිකාරීවරයා නමට වූ බලපත්‍රයකින් නඩු විභාගය පැවැත්වෙන තුරු චූදිතයා රඳවා තැබීමට බලය දිය යුතුය.

(ඉ) චූදිතයාගේ ඇඟිලි සටහන් ගැනීමට සලස්වා ඒ ඇඟිලි සටහන් පරීක්ෂා කරනු ලැබීම හා අපරාධ චෝදනාව මෙහෙයවන රජයේ නීතිඥවරයා වෙත ඒ ගැන වාර්තා කරනු ලැබීම සඳහා ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුයි;

(ඊ) නඩු විභාගය ජූරි සභාවක් මගින් පවත්වනු ලැබිය යුතු අවස්ථාවක ජූරි සභිකයන්ගේ ඒ ඒ මූල මණ්ඩල වලින් තමාගේ නඩු විභාගය සඳහා ජූරි සභාව පත්කළ යුත්තේ කිනම් මූල මණ්ඩලයෙන් දැයි තෝරා ගන්නා ලෙස චූදිතයාට විධාන කළ යුතු අතර, එසේ කරනු ලබන තෝරා ගැනීමෙන් ඔහු බැඳෙන බවත් ඒ තෝරා ගැනීම අනුව ඔහු නඩු විභාගයට භාජනය කරනු ලැබිය හැකි බවත් චූදිතයාට දැන්විය යුතුය;

(උ) තමාගේ විත්තිවාචකය සඳහා නීතිඥවරයකුගේ සේවය අවශ්‍යදැයි අධිකරණය විසින් අසනු ලැබීමේදී සේවය ලබාදෙන මෙන් චූදිතයා විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක නීතඥවරයකුගේ සේවය එසේ ලබාදිය යුතුය.

**9.3.1. මහාධිකරණය : ජූරිය නොමැතිව විනිසුරු විසින් නඩු විභාග කිරීම.**

මෙම ක්‍රියාදමය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 196 සිට 203 දක්වා වගන්තීන්වල සඳහන් කර ඇත.

**196 - චූදිතයා විනිශ්චයට ඉදිරිපත් කිරීම,**

නඩු විභාගය ආරම්භ කිරීමට අධිකරණය සූදානම්ව සිටින විට, චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටිය යුතුය. නැතහොත් අධිකරණය ඉදිරියට ගෙන එනු ලැබිය යුතුය. තවද ඔහුට අධිචෝදනා පත්‍රය කියවා තේරුම් කර දිය යුතු අතර, චෝදනා නගා ඇති වරදට තමා වරදකරුද, වරදකරු නොවේද යන වග ඔහුගෙන් විමසිය යුතුය.

**197 - වරද පිළිගැනීම සහ දඬුවම.**

වරදකරු බවට උත්තරවාද දී චූදිතයා තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් සහ ඔහුගේ උත්තරවාදයේ ප්‍රතිඵලය ඔහු නිවැරදිව අවබෝධ කර ගෙන ඇති බව විනිශ්චයකරවරයා සෑහීමකට පත්වන ආකාරයේ එකක් බව පෙනී යන්නේ නම් ඒ උත්තරවාදය අධිචෝදනා පත්‍රයෙහි වාර්තා කළ යුතු අතර ඒ අනුව චූදිතයා වරදකරු කරනු ලැබිය හැකිය.

**198 - පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ වරදකරු නොවන බව පිළිගැනීම. උත්තරවාද දීම ප්‍රතික්ෂේප කිරීමෙන් වරදකරු නොවේ යයි උත්තරවාද දීම.**

චූදිතයා උත්තරවාදය නොදෙන්නේ නම් හෝ වරදකරු නොවේ යයි ඔහු උත්තරවාද දෙන්නේ නම්, ඔහු නඩු විභාගයට භාජනය කරනු ලැබිය යුතුය.

**199 - නීතිඥවරයා විසින් ස්වකීය නඩුව ආරම්භ කර සාක්ෂිකරුවන් කැඳවිය යුතු බව.**

(1) චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් ස්වකීය නඩුව ආරම්භ කර සාක්ෂිකරුවන් කැඳවිය යුතු බව.

(2) ඉන් ඉක්බිතිව චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් විභාග කරනු ලැබිය යුතුය.

(3) මහේස්ත්‍රාත් අධිකරණයෙහි පරීක්ෂණයක් පවත්වනු ලැබුවේ නම්, ඒ පරීක්ෂණය පැවැත්වෙන අතර වාර්තාගත කරනු ලැබූ චූදිතයාගේ සියලු ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව අවසන් කිරීමට පෙර ඒ ප්‍රකාශ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කොට තිබිය යුතුය.

(4) චෝදක පක්ෂය විසින් කැඳවනු නොලැබූ යම් සාක්ෂිකරුවන් කැඳවීම යුක්ති ධර්මය උදෙසා අවශ්‍යය වුවත් යම් අධිකරණයක් විසින් ඒ සාක්ෂිකරුවන් කැඳවීම නීත්‍යානුකූල විය යුතුය. එහෙත් එම සාක්ෂිකරුවන් චෝදනාව මෙහෙය වන නීතිඥවරයා සහ චූදිතයා විසින් හරස් ප්‍රශ්න ඇසීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(5) චෝදක පක්ෂය වෙනුවෙන් කැඳවනු ලැබූ සියලු සාක්ෂිකරුවන්ගේ හරස් ප්‍රශ්න ඇසීමට චූදිතයාට අවසර දිය යුතුය.

**200 - විත්තිවාචකය ඉදිරිපත් කරන ලෙස නියම නොකර අධිකරණය විසින් නිදෙස් කළ හැකිය. නැතහොත් විත්තිවාචකය ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකිය.**

(1) චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව ඉදිරිපත් කිරීම අවසන් කරනු ලැබූ විට, චෝදක පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි විනිශ්චය කරනු ලැබිය යුතුය.

මුළුමනින්ම අවිශ්වාස කරන්නේ නම් හෝ අධිචෝදනා පත්‍රයෙහි චූදිතයාට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගා ඇත්තේ ද ඒ වරද හෝ ඒ අධිචෝදනා පත්‍රය මත චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි වෙනත් යම් වරදක් හෝ සිදුකර ඇති බව සනාථ කිරීමට ඒ සාක්ෂි අපොහොසත් වන බව විනිශ්චයකාරවරයාගේ මතය වන්නේ නම් වාර්තාගත කළ යුතුය. එසේ වුවද නඩු විභාගය පවත්වාගෙන යාමට හේතු ඇතැයි විනිශ්චයකාරවරයා සලකන්නේ නම් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කරන ලෙස විනිශ්චයකාරවරයා විසින් චූදිතයාට නියම කළ යුතුය.

(2) සාක්ෂි ඉදිරිපත් කිරීමට තමා අදහස් නොකරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා ප්‍රකාශ කරන්නේ නම් චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි සම්පිණ්ඩනය කිරීමේ කාර්යය සඳහා තමාගේ නඩුව සනාථ කරනු පිණිස චෝදනාව මෙහෙය වන නීතිඥවරයා විසින් දෙවන වරටත් අධිකරණය අමතනු ලැබිය යුතුය.

**201 - චූදිතයා විසින් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කළ හැකි බව.**

(1) සාක්ෂි ඉදිරිපත් කිරීමට තමා අදහස් කරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා ප්‍රකාශ කරන්නේ නම් චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ විසින් ස්වකීය විත්තිවාචකය ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර ඔහුගේ සාක්ෂිකරුවන් (ඇත්නම්) ඔවුන් විභාග කරනු ලැබිය හැකිය. ඉන්පසුව චූදිත තැනැත්තා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ විසින් ස්වකීය නඩුව සම්පිණ්ඩනය කොට දැක්විය හැකිය.

(2) දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශ මත සාක්ෂි දීමට විත්තිය විසින් කැඳවනු ලැබූ සියලු සාක්ෂිකරුවන්ගේ හරස් ප්‍රශ්න ඇසීමට චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට හිමිකම ඇත්තේය.

**202 - සාක්ෂි බිඳ හෙලීම පිණිස සාක්ෂිකරුවන් කැඳවීමට චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට හිමිකම් ඇත්තේ කිනම් විටක ද යන වග.**

චූදිතයා වෙනුවෙන් යම් සාක්ෂි ඉදිරිපත් කරනු ලබන්නේ නම්, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව සාක්ෂි බිඳ හෙලීම පිණිස සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකිය.

**203 - විනිශ්චයකාරවරයා විසින් නඩු තීන්දුව දිය හැකි බව.**

චෝදක පක්ෂය හා විත්ති පක්ෂය වෙනුවෙන් කරුණු දැක්වීම අවසන් කරනු ලැබූ විට, විනිශ්චයකාරවරයා විසින් වහාම හෝ නඩු විභාගය අවසන් කොට දින දහයක් ඇතුළත නිදෙස් කිරීමේ හෝ වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් ඒ සඳහා තම හේතු සඳහන් කරමින් වාර්තාගත කරනු ලැබිය යුතුය. තවද තීන්දු ප්‍රකාශය වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් නම් නීතිය අනුව චූදිතයා වෙතද දණ්ඩන නියමයක් කළ යුතුය.

(9.3.2) <u>මහාධිකරණය ජූරි සභාවක් ඉදිරියේ නඩු විභාග කිරීම.</u>

ජූරි සභාවක් මගින් නඩු විභාග කරන විට ඊට අදළ සාමාන්‍ය කාර්ය පටිපාටිය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 204 සිට 208 දක්වා වගන්තීන් වල සඳහන් කර තිබේ.

**204 - චූදිතයා විනිශ්චයට ඉදිරිපත් කිරීම.**

නඩු විභාගය ආරම්භ කිරීමට අධිකරණය සූදනම් විට, චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටිය යුතුය. නැතහොත් අධිකරණය ඉදිරියට ගෙනු එනු ලැබිය යුතුය. තවද ඔහුට අධිචෝදනා පත්‍රය කියවා තොරුම් කර දිය යුතු අතර, චෝදනා නගා ඇති වරදට තමා, වරදකරුද, වරදකරු නොවේද යන වග ඔහුගෙන් විමසිය යුතුය.

**205 - වරදකරු බවට වූ උත්තරවාදය වාර්තාගත කරනු ලැබිය හැකි බව සහ ඒ මත චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි බව. මෙයට 197 වන වගන්තිය අදළ වේ.**

චූදිතයා තමා වරදකරු යැයි උත්තරවාද දෙන්නේ නම් සහ ඔහුගේ උත්තරවාදයේ ප්‍රතිඵලය ඔහු නිවැරදිව අවබෝධ කරගෙන ඇති බව විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන ආකාරයෙන් පෙනී යන්නේ නම් ඒ උත්තරවාදය අධිචෝදනා පත්‍රයෙහි වාර්තා ගත කළ යුතු අතර ඒ අනුව විත්දිතයා වරදකරු කරනු ලැබිය හැකිය.

එසේ වුවද වරදකරු බවට උත්තරවාද දෙන ලද අධිචෝදනාව මිනීමැරුමක් සම්බන්ධයෙන් වූ අධිචෝදනාවක් වන විට, ඒ උත්තරවාදය පිළිගැනීම විනිශ්චයකාරවරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු අතර, තමා වරදකරු නොවේ යයි චූදිතයා විසින් උත්තරවාද දෙන ලද්දක් මෙන් ඒ නඩු විභාගය පවත්ගෙන යාමට සැලැස්විය යුතුය.

**206 - උත්තරවාද දීම ප්‍රතික්ෂේප කිරීම.**

චූදිතයා උත්තරවාදයක් නොදෙන්නේ නම් හෝ වරදකරු නොවේ යයි ඔහු උත්තරවාද දෙන්නේ නම් හෝ 205 වන වගන්තියේ අතුරු වගන්තියෙහි දක්වා ඇති අවස්ථානුගත කරුණු අනුව උත්තරවාදය පිළිගැනීම විනිශ්චයකාරවරයා ප්‍රතික්ෂේප කරන්නේ නම් මෙහි මින් මතු විධි විධාන සලස්වා ඇති පරිදි නඩු විභාග කිරීම සඳහා ජූරි සභිකයන් තෝරා ගනු ලැබිය යුතුය.

**207 - චූදිතයා තමා වරදකරු නොවේ යයි උත්තරවාද දෙන හෝ අඩු වරදකට වරදකරු යයි උත්තරවාද දීමට කැමති වන විට.**

චූදිතයා තමා වරදකරු නොවේ යයි උත්තරවාද දෙන්නේ වුවද ඒ අධිචෝදනා පත්‍රය මත තමා වරදකරු කරන ලැබිය හැකිව තිබූ අඩු වරදකට වරදකරු යයි උත්තරවාද දීමට තමා කැමති බව ප්‍රකාශ කරතහොත් හා චෝදනාව මෙහෙයවන නීතිඥවරයා ඒ උත්තරවාදය පිළිගැනීමට කැමති වුවහොත් ඒ උත්තරවාදය වාර්තාගත කිරීමෙන් යුක්තිය ඉෂ්ට වනු ඇතැයි විනිශ්චයකාරවරයා කල්පනා කරන්නේ නම් ඔහු විසින් ඒ උත්තරවාදය වාර්තා ගත කරන ලෙස ආඥා කොට ඒ සම්බන්ධයෙන් ඒ අනුව වූ නඩු තීන්දුවක් ප්‍රකාශ කරනු ලැබිය හැකිය. එවිට අධිචෝදනා පත්‍රයේ දැක්වෙන වරදින් චූදිතයා නිදහස් කරනු ලැබිය යුතු අතර ඒ නිදහස් කිරීම නිදෙස් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතුය.

**208 - විශේෂ ජූරි සභාවක් කැඳවනු ලැබිය හැකි බව.**

1. යම් නඩුවක් විභාග කිරීම පිණිස විශේෂ ජූරි සභාවක් කැඳවන ලෙස නියම කර ආඥාවක් ලබා ගැනීම සඳහා චෝදනාව මෙහෙය වන නීතිඥවරයා හෝ චූදිතයා හෝ විසින්, නඩු විභාගය පැවැත්වෙන සැසි වාරයේදී මහාධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකිය. තවද ඒ ඉල්ලීම, විභාග කරනු ලබන්නේ යම් විනිශ්චයකාරවරයකු ඉදිරියෙහිද ඒ විනිශ්චයකාරවරයා විසින්, ඒ ඉල්ලීම සාධාරණ හා යුක්තිසහගත යයි සලකනු ලැබුවහොත්, ඔහු විසින් ඒ අනුව ආඥාවක් කළ යුතුය.

(2) නීතිපතිවරයා, නියෝජ්‍ය නීතිපතිවරයා හෝ රජයේ නීතිඥවරයකු හෝ විසින් කරනු ලැබූ විට හැර, ඒ ඉල්ලීම දිවුරුම් පත්‍රයකින් කරනු ලැබිය යුතුය.

(9.3.3) <u>ජූරි සභාවක් තෝරා ගැනීම සහ අදාළ සාමාන්‍ය ක්‍රියාදාමය.</u>

මේ පිළිබඳ ප්‍රතිපාදන අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි, 209 සිට 216 වන වගන්තීන්වල සඳහන් කර ඇත.

**209 - වගන්තිය ජූරි සභාවක් තෝරා ගැනීම ජූරි සභාවේ සඛ්‍යාව හා තීරණය සඳහා ගනපූරණය**

209 (1) ජූරි සභාව සත් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(2) දෙනු ලබන තීරණය ඒකමතික තීරණයක් හෝ පස්දෙනෙකු හෝ ඊට වැඩි බහුතර සංඛ්‍යාවක් විසින් දෙනු ලබන තීරණයක් විය යුතුය.

**210 - <u>ජූරි සභාව තෝරා ගැනීම.</u>**

(1) අධිකරණය අන්‍යාකාරයකින් විධාන කරතහොත් මිස චූදිතයා විසින් තෝරා ගනු ලබන මූල මණ්ඩලයෙන් ජූරි සභාව සකස් කර ගත යුතුය.

(2) කුසපත් ඇදීමෙන් මූල මණ්ඩලයෙන් ජූරි සභාව තෝරා ගනු ලැබිය යුතුය.

(3) එක් එක් ජූරි සභිකයා තෝරා ගනු ලැබූ විට ඔහුගේ නම කියනු ලැබිය යුතු අතර ඔහු පෙනී සිටි කල්හි, ඒ ජූරි සභිකයා විසින් තමාගේ නඩු විභාගය කරනු ලැබීම ගැන තමා විරෝධය පාන්නේ දැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් චූදිතයාගෙන් ප්‍රශ්න කරනු ලැබිය යුතුය.

(4) චෝදනා ලැබ සිටින චූදිත තනැත්තා හෝ තැනැත්තන් සියලු දෙනාම හෝ ඔහු වෙනුවෙන් හේතු ඉදිරිපත් කරනු නොලබන විරෝධය පෑම් දෙකකට ඉඩ දෙනු ලැබිය යුතුය.

(5) කැඳවනු ලැබූ ඒ වේලෙහි ජූරි සභාවේ සේවය සඳහා පැමිණ සිටින සියලු ජූරි සභිකයන්ගේ නම් කියවා අවසාන වන තෙක් චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් විරෝධය පෑමට හේතු නොදක්වමින් කරනු ලබන යෝජනාව මත, නම් කියවන ලද කවර හෝ ජූරි සභිකයන් සංඛ්‍යාවකට, පසෙකින් සිටින ලෙස විනිශ්චයකාරවරයා විසින් ආඥා කරනු ලැබිය හැකිය.

(6) ඒ නම් කියවා අවසන් වන තුරුත් ජූරි සභාවක් සකස් නොවූයේ නම් පසෙකින් සිටින ලෙස එසේ ආඥා කරන ලද එක් එක් තැනැත්තාගේ නම් නැවත කියවිය යුතු අතර මෙහි 211 වන වගන්තිය යටතේ විරෝධය පෑමට හේතු (කිසිවක් ඇතොත් ඒ හේතු) දක්වන ලෙස චෝදනා මෙහෙයවන නීතිඥවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය යුතුයි.

(7) විරෝධය පෑමක් කරනු නොලැබූ ප්‍රමාණවත් ජූරි සභික සංඛ්‍යාවක් පැමිණ නොසිටියහොත්, අලුත් ජූරි සභික මූල මණ්ඩලයක් කැඳවීමට හැකිවන පරිදි නඩු විභාගය අඩාලව කල් තබනු ලැබිය යුතුය.

**211 - <u>විරෝධය පෑමට හේතු.</u>**

පහත දැක්වෙන හේතු අතුරින් යම් හේතුවක් මත ජූරි සභිකයකු පිළිබඳව දක්වනු ලබන යම් විරෝධය පෑමක් අධිකරණය සෑහීමට පත්වන පරිදි ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ විරෝධය පෑමට ඉඩ දෙනු ලැබිය යුතුයි.

(අ) ජූරි සභිකයා තුළ පවතින බවට පූර්ව නිගමනයක් ඇති හෝ ඔහු තුළ සැබවින්ම පවතින හෝ යම් පක්ෂපාතීත්වයක්;

(ආ) යම් නීතියක් මගින් හෝ තත්කාලයෙහි වලංගුව පවත්වන නීතියක බලය ඇති යම් රීතියක් මගින් හෝ නියමිත සුදුසුකමෙහි ඌනතාවක් වැනි යම් පෞද්ගලික හේතුවක්;

(ඇ) පොලීසිය සතු කාර්යය ඔහු විසින් ක්‍රියාවෙහි යෙදවීම හෝ පොලිස් කාර්යයන් ඔහුට භාරදෙනු ලැබීම;

(ඈ) විනිශ්චයකාරවරයාගේ මතය අනුව ඒ ජූරි සභිකයා ජූරි සභාවේ සේවය කිරීමට නුසුදුස්සකු බවට පත් කරන යම් වරදකට ඔහු වරදකරු කරනු ලැබ සිටීම;

(ඉ) ජූරි සභාව සකස් කර ගනු ලැබූ යම් මූලමණ්ඩලයකින් ද ඒ මූලමණ්ඩලයේ භාෂාව තේරුම් ගැනීමට ඔහුට නුපුළුවන්කම.

(ඊ) විනිශ්චයකාරවරයාගේ මතය අනුව ඔහු ජූරි සභිකයකු වශයෙන් නොනිසි බවට පත් කරවන වෙනත් යම් අවස්ථාගත කරුණක්.

212 - <u>විරෝධය පෑම පිළිබඳව තීරණය.</u>

212 (1) ජූරි සභිකයකු සම්බන්ධයෙන් දක්වනු ලබන සෑම විරෝධය පෑමක්ම පිළිබඳව විනිශ්චයකාරවරයා විසින් තීරණයක් කළ යුතුය. ඒ තීරණය සටහන් කරනු ලැබිය යුතු අතර එය අවසානාත්මක විය යුතුය.

(2) විරෝධය පෑමට ඉඩ දෙනු ලැබුවහොත් ඒ ජූරි සභිකයාගේ තැන මේ පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් තෝරාගනු ලබන වෙනත් යම් ජූරි සභිකකු විසින් පුරවනු ලැබිය යුතුය.

213 - <u>ජූරි සභාවේ නායකයා.</u>

213 (1) ජූරි සභිකයන් තෝරා ගනු ලැබූ කල්හි පහත දැක්වෙන පරිදිය

එනම් :- "ජූරි සභාවේ මහත්වරුනි, ඔබේ නායකයා තෝරා ගන්න" යනුවෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඔවුන් ඇමතිය යුතු අතර ඉන් ඉක්බිතිව ඔවුන් එසේ ක්‍රියා කළ යුතුය.

(2) නායකයකු පත් කර ගැනීමේදී යුක්ති සහගත යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන කාලයක් තුළ ජූරි සභාවෙන් වැඩි දෙනෙකු එකඟත්වයට නොපැමිණියහොත්, විනිශ්චයාකාරවරයා විසින් නායකයකු පත් කරනු ලැබිය යුතුය.

(3) නායකයා පත්කර ගනු ලැබූ කල්හි ජූරි සභිකයන් දිවුරුම් දීම හෝ ඔවුන් විසින් ප්‍රතිඥා දීම කරවීම හෝ කළ යුතුය.

**214 වන වගන්තිය :- නායකයාගේ වගකීම.**

ජූරි සභාවේ විවාද වලදී මූලාසනය දැරීම, ජූරි සභාවට හෝ ජූරි සභිකයන් අතුරින් යම් ජූරි සභිකයකුට හෝ අවශ්‍ය තීරණය ප්‍රකාශ කිරීම ජූරි සභාවේ නායකයා විසින් කළ යුතුය.

**215 - ජූරි සභිකයකු සහභාගී නොවන විට අදාළ ක්‍රියාදාමය.**

ජූරි සභාවක් මගින් නඩු විභාගයක් පවත්වාගෙන යනු ලබන අතරතුර තීරණය ඉදිරිපත් කිරීමට පෙර යම් අවස්ථාවක යම් ප්‍රමාණවත් හේතුවක් නිසා නඩු විභාගය පැවැත්වෙන කාලය මුළුල්ලේම පැමිණ සිටීමෙන් යම් ජූරි සභිකයකු වළක්වනු ලැබුවහොත් හෝ යම් ජූරි සභිකයකු නොපැමිණියහොත් සහ ඔහුට පැමිණ සිටීමට බල කිරීම කළ නොහැකි නම් හෝ සාක්ෂි දෙනු ලබන්නේ යම් භාෂාවකින් ද ඒ භාෂාව නැතහොත් ඒ සාක්ෂි භාෂණ පරිවර්තනය කරනු ලබන කල්හි එය භාෂණ පරිවර්තනය කරනු ලබන්නේ යම් භාෂාවකට ද ඒ භාෂාව හෝ අලුත් ජූරි

සභිකයකු එකතු කරන ලෙස නැතහොත් ජූරි සභාව විසුරුවා හැර අලුත් ජූරි සභාවක් තෝරා ගන්නා ලෙස විනිශ්චයකාරවරුන් විසින් ආඥා කරනු ලැබිය හැකිය.

**216 - ජූරි සභාව විසුරුවා හැරීම හෝ සිරකරුවකු අසනීප වීම.**

කූඩුවෙහි රැඳී සිටීමට සිරකරුට නුපුළුවන් වන කවර හෝ විටකදී ජූරි සභාව විසුරුවා හැරිය පසු යුක්තිය ඉෂ්ට කිරීමෙහිලා අවශ්‍ය යැයි විනිශ්චයකාරවරයාගේ මතය වන කවර හෝ විටකදී විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාව වසුරුවා හරිනු ලැබිය හැකිය.

**එඩ්මන්ගේ සම්පත් අමරසිරි එරෙහිව ස්ථානාධිපති වාරියපොල පොලිස් ස්ථානය සහ නීතිපති (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC(SPL)LA අංක 262/15)**

මෙම නඩුවේදී චෝදනාව මෙහෙය වන නීතිඥවරයාගේ වගකීම පිළිබඳව ගැටළුවක් ඇති කළේය. මෙය පළාත් මහාධිකරණ විශේෂ විධාන පනත අංක 19, 1990 යන්නෙහි 9(අ) වගන්තිය යටතේ විශේෂ අභියාචන ඉල්ලුම් පත්‍රයකි. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 128 වන වගන්තිය සමග කියවේ. චූදිතයා, දණ්ඩ නීති සංග්‍රහයෙහි 344 වන වගන්තිය අනුව වරද සම්බන්ධයෙන් වරදකරු විය. මාස 02 ක සැහැල්ලු දඬුවමක ට ලක්වුනි. එය වසර 5 කට අත්හිටවනු ලැබිණි. දඩය රුඃ 1000/- ක් විය. අධිරකරණය සලකා බැලූ ප්‍රධාන ප්‍රශ්නයක් විය. ඒ නඩු අවසානයේ නඩුවේදී අභියාචක සාධාරණ සැකයක් නිර්මාණය කර ඇතිද යන්නය. අධිකරණය තීරණය කළ දෙයක් විය. එනම් නඩුව මෙය වන විට විත්තියේ නඩුව අනිවාර්යෙන් සාර්ථක වන බවය.

**(9.3.4) චෝදක පක්ෂය හා විත්ති පක්ෂය වෙනුවෙන් නඩුවේ අවසානය තෙක් නඩු විභාගය :-**

මේ පිළිබඳ ප්‍රතිපාදනය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 217 සිට 228 දක්වා වගන්තීන් වල දක්වා ඇත.

**217 වන වගන්තිය :- රෙජිස්ට්‍රාර්වාරයා විසින් අධිචෝදනා පත්‍රය ජූරි සභාවට කියවිය යුතු බව.**

ජූරි සභාව දිවුරවනු ලැබූ විගසම චූදතයාට ඇසෙන පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් අධිචෝදනා පත්‍රය ජූරි සභාවට කියවිය යුතු අතර, සාක්ෂිවලට ඇහුම්කන් දීමත් අධිචෝදනා පත්‍රයෙහි චූදිතයාට විරුද්ධව කර ඇති චෝදනාවට හෝ චෝදනා එකකට වැඩි ගණනක් කර ඇති නම් ඒ චෝදනා අතුරින් කිසියම් චෝදනාවකට හෝ ඔහු වරදකරුද, වරදකරු නොවේදයන වග ඒ සාක්ෂි අනුව ස්වකීය තීන්දුවකින් තීරණය කිරීමත් ඔවුන්ගේ කාර්යය වන බව විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාවට දැනුම් දිය යුතුය. තවද නඩුව සම්බන්ධයෙන් අදාළ විය හැකි, නිර්දෝශීත්වයේ පූර්ව නිමිත්ත ඔප්පු කිරීමේ භාරය සහ එවැනි වෙනත් නීති මූලධර්ම පිළිබඳව ඔවුන්ට ලුහුඩින් කරුණු පැහැදිළි කර දීම ද ඔහු විසින් කළ හැකිය.

**218 වන වගන්තිය - චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව ආරම්භ කිරීම.**

ඉන්පසුව චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින්, චෝදනා කරනු ලැබ ඇති වරදෙහි ස්වභාවය ද චූදිතයාගේ වරදකාරීත්වය ඔප්පු කිරීම පිණිස ඉදරිපත් කිරීමට තමා බලාපොරොත්තු වන සාක්ෂි ද ලුහුඩින් ප්‍රකාශ කිරීමෙන් ස්වකීය නඩුව ආරම්භ කළ යුතු අතර ඉන් ඉක්බිතිව ඔහු විසින් යම් සාක්ෂිකරුවන් විභාග කරනු ලැබිය යුතුය. ඉන්ඉක්බිතිව චූදිතයා විසින් හෝ ඔහුගේ උත්තරවාදියා විසින් ඒ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න අසනු ලැබිය හැකිය.

**219 - සිරකරුවා විසින් කරන ලද ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය.**

මහේස්ත්‍රාත් අධිකරණයෙහි පරීක්ෂණයක් කරනු ලැබුවේ නම්, ඒ පරීක්ෂණය පැවැත්වෙද්දී වාර්තාගත කරන ලද චූදිතයාගේ සියලු ප්‍රකාශ චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව අවසන් කිරීමට පෙර සාක්ෂි වශයෙන් ඉදරිපත් කොට කියනු ලැබිය යුතුය.

**220 - චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් විභාග කරනු ලැබීමෙන් පසු අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.**

(1) චෝදක පක්ෂය වෙනුවෙන් නඩුවේ කරුණු ඉදිරිපත් කිරීම අවසන් වූ විට, චූදිතයා වරද සිදුකළ බවට සාක්ෂි නොමැති යයි විනිශ්චයකාරවරයා සලකන්නේ නම් "වරදකරු නොවේය" යන තීරණය දෙන ලෙසට ඔහු ජූරි සභාව මෙහෙයවිය යුතුය.

(2) චූදිතයා වරද සිදුකළ බවට සාක්ෂි ඇතැයි විනිශ්චයකාරවරයා සලකන්නේ නම්, විනිශ්චයකාරවරයා විසින්, චූදිතයා සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ දැයි ඔහුගෙන් හෝ ඔහුගේ උත්තරවාදියාගෙන් ඇසිය යුතුය.

(3) සාක්ෂි ඉදිරිපත් කිරීමට තමා අදහස් නොකරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ ප්‍රකාශ කරතහොත්, චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි සම්පිණ්ඩනය කොට දැක්වීමේ කාර්යය සඳහා ස්වකීය නඩුව සනාථ කරනු පිණිස චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් දෙවන වරටත් ජූරි සභාව අමතනු ලැබිය හැකිය.

**221 (1) විත්ති පක්ෂය.**

තමා පිටිවහල් කර ගැනීමට බලාපොරොත්තු වන සිද්ධි හෝ නීතිය හෝ සඳහන් කිරීමෙන් සහ චෝදක පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව අවශ්‍ය යැයි තමා කල්පනා කරන අදහස් පල කිරීමෙන් චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ විසින් එවිට ස්වකීය නඩුව ආරම්භ කරනු ලැබිය හැකිය. ඉන් ඉක්බිතිව ඔහු විසින් ස්වකීය සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකි අතර ඒ සාක්ෂිකරුවන් සාක්ෂි දෙනු ලැබීමෙන් පසු ස්වකීය නඩුවේ කරුණු ඔහු විසින් සම්පිණ්ඩනය කොට දැක්විය හැකිය.

(2) දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට සාක්ෂි දීමට විත්ති පක්ෂය විසින් කැඳවනු ලැබූ සියලු සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට චෝදනාව මෙහෙයවන නීතිඥයාට හිමිකම තිබිය යුතුය.

**222 - සාක්ෂිකරුවන් විභාග කිරීමට හා කැඳවීමට චූදිතයාට ඇති අයිතිවාසිකම.**

තමා විසින් කලින් නම් නොකරන ලද යම් සාක්ෂිකරුවකු අධිකරණයට පැමිණ සිටින්නේ නම් ඒ සාක්ෂිකරු විභාග කිරීමට චූදිතයාට ඉඩ දෙනු ලැබිය යුතුය.

**223 - සාක්ෂි බිඳ හෙළීම පිණිස වූ සාක්ෂිකරුවෝ.**

චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින්, විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව, කරුණු බිඳ හෙළීම පිණිස සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකිය.

**224 (1) - වරද කරන ලද ස්ථානය ජූරි සභාව විසින් බැලීම.**

චෝදනා නගා ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සිදුකරන ලදැයි කියනු ලබන ස්ථානය හෝ නඩු විභාගය සම්බන්ධයෙන් වැදගත් වන අන්කිසි කටයුත්තක් සිදුවී යයි කියනු ලබන වෙනත් යම් ස්ථානයක් හෝ ජූරි සභාව විසින් බැලිය යුතු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන කවර හෝ අවස්ථාවක විනිශ්චයකාරවරයා විසින් ඒ බවට ආඥාවක් කරනු ලැබිය යුතුය.

තවද අධිකරණයේ නිලධාරියකුගේ ආරක්ෂාව යටතේ ජූරි සභාව එක් කණ්ඩායමක් වශයෙන් ඒ ස්ථානය වෙත ගෙන එනු ලැබිය යුතු අතර විනිශ්චයකාරවරයා විසින් පත්කරන ලද තැනැත්තකු විසින් ඒ ස්ථානය ජූරි සභාවට පෙන්වනු ලැබිය යුතුය.

ඒ නිලධාරියා විසින්, විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව හැර, ජූරි සභාවේ යම් සාමාජිකයකු සමග කතා කිරීමට හෝ ජූරි සභාවේ යම් සාමාජිකයකු සමග අදහස් හුවමාරු කර ගැනීමට හෝ වෙනත් යම් තැනැත්තකුට ඉඩ නොදිය යුතුය. තවද අධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලැබුවහොත් මිස ස්ථානය බලා ගැනීම අවසන් කළ පසු ජූරි සභාව වහාම අධිකරණය වෙත ආපසු ගෙන ආ යුතුය.

**225 - ජූරි සභිකයකු පරීක්ෂා කිරීම.**

ජූරි සභිකයකු යම් අදාළ සිද්ධියක් පෞද්ගලිකව දන්නේ නම් ඒ බව අධිකරණය වෙත දැනුම් දීම ඔහුගේ කාර්යය වන අතර, එසේ කරනු ලැබූ විට, වෙනත් යම් සාක්ෂිකරුවකු දිවුරනු ලබන හා විභාග කරනු ලබන ආකාරයෙන්ම ඒ ජූරි සභිකයා දිවුරනු ලැබීම විභාග කරනු ලැබීම කළ හැකිය.

**226 - නඩුව කල් තැබූ විට ජූරිය පැමිණ සිටිය යුතු බව.**

නඩු විභාගයක් අඩාලව කල් තබනු ලැබුවහොත්, එසේ අඩාලව කල් තබා පවත්වනු ලබන සෑම රැස්වීම් වාරවලදී සහ නඩු විභාගය අවසන් වන තෙක් ඉන් අනතුරුව පැවැත්වෙන සෑම රැස්වීම් වාරයකදීම ජූරි සභාව පැමිණ සිටිය යුතුය.

**227 (1) - ජූරිය එක්ව තබා ගැනීම.**

යම් අවස්ථාවකදී විනිශ්චයකාරවරයාගේ සම්පිණ්ඩන දේශනය අවසන් වීමට කලින් නඩු විභාගයක් අඩාලව කල් තබා ඇති යම් කාලයක් තුළ ජූරි සභාව එක්රැස් කරවා තැබීම අවශ්‍ය නොවිය යුතුය. එහෙත් යම් නඩු විභාගයකදී යුක්තිය ඉෂ්ට කිරීමෙහිලා ප්‍රඥාගෝචර යයි තමාට පෙනී ගියහොත් නඩු විභාගයක් අඩාලව කල් තබා ඇති යම් කාලයක් තුළ ජූරි සභාව එක්රැස් කරවා තබන ලෙස විනිශ්චයකාරවරයා විසින් නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(2) යම් නඩු විභාගයක් පවත්වනු ලබන අතරතුර වෙන්ව යාමට ජූරි සභාවට ඉඩ දෙනු ලැබූ අවස්ථාවක, එසේ වෙන්ව ගොස් සිටින කාලය තුළ සහෝදර ජූරි සභිකයකු සමග හැර වෙනත් යම් තැනැත්තකු සමග නඩු විභාගයේ විෂයය පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමක් නොකරන බවට ජූරි සභිකයන් පළමු කොට දිවුරවීම හෝ ඔවුන්ගෙන් ප්‍රතිඥා ගැනීම කරනු ලැබිය හැකිය.

(3) එයින් යම් ජූරි සභිකයකු, සහෝදර ජූරි සභිකයකු නොවන වෙනත් යම් තැනැත්තකු සමග එවැනි යම් අදහස් හුවමාරු කර ගැනීමක් කළහොත් නැතහොත් සහෝදර ජූරි සභිකයකු නොවන යම් තැනැත්තකු එයින් යම් ජූරි සභිකයකු සමග එවැනි යම් අදහස් හුවමාරු කර ගැනීමක් කළහොත්, අවස්ථාවෝචිත පරිදි ඒ ජූරි සභිකයා නැතහොත් ඒ තැනැත්තා අධිකරණයට අපහාස කිරීමක් සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඔහුට දඬුවම් කරනු ලැබිය යුතුය.

**228 - විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාවට ආහාර පාන දීමට ඉඩ දිය හැකි බව.**

විනිශ්චයකාරවරයාගේ සම්පිණ්ඩන දේශනය පැවැත්වීමට පෙර හෝ පසුව ජූරි සභාව එක්රැස් කොට තැබිය හැකි යම් කාලයක් තුළ යම් අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් රජයේ වියදමින් ජූරි සභාව සඳහා සෑහෙන ආහාර පාන සැපයිය යුතු යැයි ආඥා කිරීම සුදුසු බව විනිශ්චයකාරවරයා කල්පනා කරතහොත් ඔහු විසින් එසේ ආඥා කරනු ලැබිය හැකිය.

**229 - ජූරි සභාවට දේශනය පැවැත්වීම.**

විත්ති පක්ෂය වෙනුවෙන් නඩුවේ කරුණු ඉදිරිපත් කිරීම ද චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ යම් පිළිතුරක් වේතොත් එයද අවසන් කරනු ලැබූ විට, සාක්ෂි සම්පිණ්ඩනය කොට දක්වමින් විනිශ්චයකාරවරයා විසින් ජූරි සභාව වෙත සිය දේශනය පැවැත්විය යුතුය.

**230 (අ) - විනිශ්චයකාරවරයාගේ කාර්යය.**

නඩු විභාගය පැවැත්වෙන අතරතුර උද්ගත වන සියලු නීති ප්‍රශ්න ද විශේෂයෙන්ම, ඔප්පු කිරීමට අදහස් කොට ඇති සිද්ධිවල උචිතභාවය සහ සාක්ෂිවල අවේශ්‍යතාව හෝ පාර්ශවකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අසනු ලබන ප්‍රශ්න වල යෝග්‍යතාව පිළිබඳ සියලු ප්‍රශ්න ද තීරණය කිරීම සහ පාර්ශවකරුවන් විසින් විරෝධය පළ කරනු ලැබුව ද නොලැබුව ද අවේශ්‍යය නොවන්නා වූ සාක්ෂි ඉදිරිපත් කිරීම ස්වකීය අභිමතය පරිදි වැළැක්වීම;

(ආ) නඩු විභාගයේදී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛනවල අර්ථය හා අර්ථ නිරූපනය තීරණය කිරීම;

(ඇ) විශේෂ කාරණා පිළිබඳව සාක්ෂි දිය හැකිවනු පිණිස ඔප්පු කිරීම අවශ්‍ය විය හැකි සිද්ධීන් පිළිබඳ සියලු කාරණා තීරණය කිරීම;

(ඈ) උද්ගත වූ යම් ප්‍රශ්නයක් තමා සඳහා වූවක් ද නැතහොත් ජූරි සභාව සඳහා වූවක් දැයි තීරණය කිරීම විනිශ්චයකාරවරයාගේ කාර්යය වේ.

**231 - සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් හෝ නීතිය හා සිද්ධිය මිශ්‍ර ප්‍රශ්නයක් හෝ පිළිබඳව විනිශ්චයකාරවරයා විසින් අදහස් ප්‍රකාශ කළ හැකි බව.**

ස්වකීය සම්පිණ්ඩන දේශනය කිරීමේදී, සුදුසු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරන්නේ නම්, නඩු කටයුත්තට අදාළ යම් සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හෝ නීතිය හා සිද්ධි මිශ්‍ර යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තම මතය ඔහු විසින් ජූරි සභාවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

<u>නිදර්ශන</u>

(අ) නඩුවේ සාක්ෂිකරුවකු නොවන තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක්, ඒ ප්‍රකාශය පිළිබඳ සාක්ෂි පිළිගනු ලබන බවට පත්කරන අවස්ථානුගත කරුණු. ඔප්පු වී ඇතැයි යන හේතුව මත ඔප්පු කිරීමට යෝජනා කර ඇත. මේ අවස්ථානුගත කරුණුවල පැවැත්ම ඔප්පු කරනු ලැබුවේද නැද්ද යන වග තීරණය කිරීම ජූරි සභාව විසින් නොව, විනිශ්චයකාරවරයා විසින් කළ යුතුය.

(ආ) මුල් පිටපත නැති වී යයි හෝ විනාශ කරන ලදැයි හෝ කියනු ලබන ලේඛනයක් පිළිබඳව ද්විතීයික සාක්ෂි දීමට යොජනා කර ඇත. මුල් පිටපත නැති වූ බව හෝ විනාශ වූ බව හෝ තීරණය කිරීම විනිශ්චයකාරවරයාගේ කාර්යය වේ.

**232 (අ) - ජූරි සභාවේ කාර්යය.**

සිද්ධි පිළිබඳව කවර මතය සත්‍ය දැයි තීරණය කිරීම සහ ඉන් අනතුරුව ඒ මතය යටතේ විනිශ්චයකාරවරයා ගේ මෙහෙයවීම අනුව ප්‍රකාශ කළ යුතු තීරණය ප්‍රකාශ කිරීම;

(ආ) (නීතියේ යෙදුම් නොවන) සියලු පාරිභාෂික යෙදුම්වල දක්නට ලැබුණද නොලැබුණ ද නිශ්චය කිරීම අවශ්‍ය විය හැකි, අසාමාන්‍ය අර්ථයකින් යෙදෙන වචන වලද අර්ථය නිශ්චය කිරීම;

(ඇ) නීතිය අනුව සිද්ධිය පිළිබඳ ප්‍රශ්න වශයෙන් සලකනු ලබන සියලු ප්‍රශ්න තීරණය කිරීම;

(ඈ) සාමාන්‍ය අනියත යෙදුම් නෛතික කාර්යය පටිපාටිය පිළිබඳව සඳහනක් කරතහොත් මිස, නැතහොත් එම යෙදුම්වල අර්ථය තීරණය නීතිය අනුව නිසැකවම දක්වා ඇත්නම් මිස, (ඒ අවස්ථා දෙකෙන් කවර හෝ අවස්ථාවකදී වුවද ඒ යෙදුම්වල අර්ථය තීරණය කිරීම විනිශ්චයකාරවරයා ගේ කාර්යය වේ) සාමාන්‍ය අනියත යෙදුම් විශේෂ අවස්ථාවලට අදාළ වන්නේ ද නොවන්නේ ද යන වග තීරණය කිරීම ජූරි සභාවේ කාර්යය වේ.

<u>නිදර්ශන</u>

(අ) "බී" ගේ මරණය සිදුකිරීම සම්බන්ධයෙන් "ඒ" ට විරුද්ධව නඩු විභාග කරනු ලැබේ. මිනීමැරුම සහ මිනීමැරුමක් නොවන්නා වූ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් අතර ඇති වෙනස ජූරි සභාවට පැහැදිළි කර දීම සහ මිනීමැරුම සම්බන්ධයෙන් හෝ මිනීමැරුමක් නොවන්නා වූ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් "ඒ" වරදකරු කරනු ලැබිය යුත්තේ නැතහොත් නිදෙස් කරනු

ලැබිය යුත්තේ සිද්ධි පිළිබඳ කවර අවස්ථාවන් යටතේ ද යන වග කියා දීම විනිශ්චයකාරවරයාගේ කාර්යය වේ.

සිද්ධි පිළිබඳව කවර අදහස සත්‍යදැයි තීරණය කර, විනිශ්චයකාරවරයාගේ මෙහෙයවීම හරි වුවද, වැරදි වුවද ජූරි සභාව ඒ මෙහෙයවීම හා එකඟ වුවද නොවූව ද ඒ මෙහෙය වීම අනුව තීරණයක් ප්‍රකාශ කිරීම ජූරි සභාවේ කාර්යය වේ.

(ආ) ප්‍රශ්නය නම්, එක්තරා කාරණයක් පිළිබඳව යම් තැනැත්තකු සාධාරණ විශ්වාසයක් දැරුවේද වැඩය සෑහෙන දක්ෂතාවයකින් හෝ නිසි උද්යෝගයෙන් කරන ලද්දක් ද යන්නය.

මේ එක් එක් කාරණය ජූරි සභාව විසින් තීරණය කළ යුතු ප්‍රශ්නයකි.

**233 (1) - ජූරි සභාව තීරණය සලකා බැලීම සඳහා ඉවත්ව යා හැකිය.**

සම්පිණ්ඩන දේශනයෙන් පසු ස්වකීය තීරණය සලකා බැලීම සඳහා ජූරි සභාව ඉවත්ව යා හැකිය.

(2) ජූරි සභාව ඉවත්ව යතහොත් නියමිත ආකෘතියෙහි පළමුකොට දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දිය යුතු අධිකරණයේ නිලධාරියකුගේ භාරයට ජූරි සභාව පත් කරනු ලැබිය යුතුය.

(3) විනිශ්චයකාරවරයාගේ අවසරය ඇතිව හැර, ඒ ජූරි සභාවේ සාමාජිකයකු නොවන කිසිම තැනැත්තකු ඒ ජූරි සභාවේ යම් සාමාජිකයකු සමග කතා කිරීම හෝ ඔහු සමග යම් අදහස් හුවමාරුවක් කරගැනීම හෝ නොකළ යුතුය.

**234 (1) - තීරණය දීමට ජූරි සභාව සූදානම්ව සිටින අවස්ථාව.**

ස්වකීය තීරණය දීමට ජූරි සභාව සූදානම් විට සහ සියලුම ජූරි සභිකයන් රැස්ව සිටින විට ජූරි සභිකයන් ඒකමතික දැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් ජූරි සභාවේ නායකයාගෙන් ඇසිය යුතුය.

(2) ජූරි සභාව ඒකමතික නොවන්නේ නම් තවදුරටත් සලකා බැලීම සඳහා ඉවත්ව යන ලෙස විනිශ්චයකාරවයා විසින් ජූරි සභාවට නියම කරනු ලැබිය හැකිය.

(3) සාධාරණ යැයි විනිශ්චයකාරවරයා සලකන කාලයක් එසේ තවදුරටත් සලකා බැලීමෙන් පසුව හෝ තමන් ඒකමතික බව ජූරි සභාවේ නායකයා පළමු අවස්ථාවේදීම කියන්නේ නම් හෝ ඔවුන්ට ඉවත්ව යාමට විනිශ්චයකාරවරයා විසින් නියම කරනු නොලබන්නේ නම් හෝ (සියලුම ජූරි සභිකයන් රැස්ව සිටියදී) රෙජිස්ට්‍රාර්වාරයා විසින් මෙසේ පැවසිය යුතුය. "ඔබ තීරණය කරන්නේ චූදිත තැනැත්තා වන (ඔහුගේ නම සඳහන් කරමින්) ඔහුට චෝදනා නගා ඇති (වරද සඳහන් කරමින්) වරද සම්බන්ධයෙන් ඔහු වරදකරුද? නොවේද? නැතහොත් වරදකරු නොවන බවද?

(4) එවිට ජූරි සභාවේ තීරණය කුමක්දැයි ජූරි සභාවේ නායකයා විසින් ප්‍රකාශ කරනු ලැබය යුතුයි.

**235 (1) - එක් එක් චෝදනාව සම්බන්ධයෙන් තීරණයක් දිය යුතු බව.**

විනිශ්චයකාරවරයා විසින් අන්‍යාකාරයකින් ආඥා කරනු ලැබුවහොත් මිස, යම් චෝදනා සම්බන්ධයෙන් චූදිතයාට විරුද්ධව නඩු විභාග කරනු ලැබීද ඒ සියලුම චෝදනා සම්බන්ධයෙන් ජූරි සභාව විසින් තීරණයක් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර ඔවුන්ගේ තීරණය කුමක්දැයි නිසැකව දැන ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රශ්න විනිශ්චයකාරවරයා විසින් ඔවුන්ගෙන් ඇසිය හැකිය.

(2) ජූරි සභාව විසින් ප්‍රකාශ කරන ලද තීරණය විනිශ්චයකාරවරයා විසින් අනුමත කරනු නොලබන්නේ නම් ඔවුන්ගේ තීරණය නැවත සලකා බලන ලෙස විනිශ්චයකාරවරයා විසින් ඔවුන්ට විධාන කරනු ලැබිය හැකි අතර, එසේ නැවත සලකා බැලීමෙන් පසු දෙනු ලබන තීරණය නියම තීරණය ලෙස සලකනු ලැබිය යුතුය.

**236 (1) - තීරණය සටහන් කිරීම හා අත්සන් කිරීම.**

රෙජිස්ට්‍රාර් විසින් තීරණය අධිචෝදනා පත්‍රයෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඉන් ඉක්බිතිව පහත දැක්වෙන වචන මාලාව හෝ ඒ හා සමාන අර්ථයකින් යුතු වචන මාලාවක් ජූරි සභාවට පැවසිය යුතුය.

“ජූරි සභාවේ මහත්වරුනි, ඔබේ නායකයා ඔබේ තීරණය අත්සන් කරන විට රැස්ව සිටින්න. ඔබේ (හෝ අවස්ථාවෝචිත පරිදි ඔබ ........ දෙදෙනාගේ) නිගමනය අ, ආ, නැමති සිරකරු වරදකරු වන බව (හෝ වරදකරු නොවන බව) ය.”

(2) එසේ සටහන් කරන ලද තීරණය ජූරි සභාවේ නායකයා විසින් අත්සන් කළ යුතු වන අතර, තීරණය එලෙස සටහන් කරනු ලැබ අත්සන් කරනු ලැබූ විට අවසානාත්මක විය යුතුය; එහෙත් ඊට කලින් එසේ නොවිය යුතුය.

(3) අත්වැරැද්දකින් හෝ වැරදීමකින් හෝ වැරදි තීරණයක් දෙනු ලැබූ විටක ඒ තීරණය අත්සන් කිරීමට පෙර හෝ අත්සන් කිරීමෙන් ඉක්බිතිව හෝ ජූරි සභාව විසින් එය සංශෝධනය කරනු ලැබිය හැකිය.

**237 - ජූරි සභාවට එකඟත්වයට පැමිණිය නොහැකි විට ජූරි සභාව විසුරුවා හැරීම.**

ජූරි සභාවට හෝ ඔවුන් අතුරින් නියමිත බහුතර සංඛ්‍යාවට එකඟත්වයට පැමිණිය නොහැකි වුවහොත් සාධාරණ යයි තමා කල්පනා කරන කාලයක් ඉකුත්වූ පසු විනිශ්චයකාරවරයා විසින් ඔවුන් විසුරුවා හරිනු ලැබිය යුතුය.

**238 - වරදකරු කරනු ලැබූ විට නඩු තීන්දුව නියම කිරීම.**

චූදිතයා වරදකරු කරනු ලැබුවහොත් විනිශ්චයකාරවරයා විසින් නොපමාවම හෝ සාධාරණ කාලයක් ඇතුළත හෝ නීතිය අනුව ඔහු සම්බන්ධයෙන් නඩු තීන්දුව දිය යුතුය;

එසේ වුවද ව්‍යවස්ථානුකූල යයි විනිශ්චයකාරවරයාට පෙනී යන්නේ නම්, නඩු තීන්දුව ප්‍රකාශ කරනු වෙනුවට, කැඳවනු ලැබුවහොත් හා කැඳවනු ලැබූ විට අධිකරණය ඉදිරියෙහි පෙනී සිට නඩු තීන්දුව භාර ගැනීම පිණිස හා ඒ අතරතුර සාමය ආරක්ෂා කරන ලෙස හා යහපත් හැසිරීමෙන් යුතු වීම පිණිස විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලබන යම් කාලයක් සඳහා ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම්කරයකට ඇතුළත් කර චූදිතයා මුදාහරින ලෙස විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලැබිය හැකිය.

**9.4. <u>මහා අධිකරණය ගැලීම් සටහන : 15 වන පරිච්ඡේදය බලන්න පරිශිෂ්ඨය.</u>**

**9.5. <u>අධිකරණ ශාලාව තුළ ආචාර ධර්ම සහ සිරිත් විරිත්.</u>**

අධිකරණ ශාලාව නිල කටයුතු සඳහාය. එයට සමහරක් විශේෂිත ආචාර ධර්ම ඇති අතර එය ඔබට නුපුරුදු විය හැක. මේ ඒ සම්බන්ධයෙන් වූ ප්‍රයෝජනවත් මිණුම් දඬු වේ.

- අධිකරණය සමග සත්‍යය විය යුතුය. මතක තබා ගත යුතු කරුණ නම් ඔබ අධිකරණයේ නිලධාරියකු බවයි.
- අධිකරණයේ පෙනී සිටින විට නිසි ලෙස සැරසී සිටිය යුතු අතරම අධිකරණ ශාලාවට ඇතුළු වන විට ලෝගුව පැළඳිය යුතුය. ඒ ඔබ පෙනී සිටින කණ්ඩායමට ගෞරව කිරීම පිණිසයි.
- අධිකරණ ශාලාවේ සියලු කාර්යය මණ්ඩලයට ගරුත්වයෙන් යුතුව සැලකිය යුතුය. මෙයට පරිවර්තකයන්, අධිකරණය විධිමත්ව පවත්වාගෙන යන අය, යතුරු ලියන්නන්, පොලිස් නිලධාරීන්, ලිපිකරුවන්, මහේස්ත්‍රාත්වරුන් සහ විනිසුරුවරුන් ය.
- විනිසුරුවරයාට මුහුණලා සිටින චූදිතගේ නීතිඥවරයා අදාල මේසයේ දකුණු අත පැත්තේ වාඩිවිය යුතු අතර චෝදනාව මෙහෙයවන නීතිඥවරයා මෙසේ වම් අත පැත්තේ වාඩි වී සිටිය යුතුය.

- විනිසුරුවරයා අධිකරණ ශාලාවට ඇතුලු වන විට සියලුම නීතිඥවරුන්ට සහ අධිකරණ ශාලාවේ සිටින සෙසු සියලු අය අනිවාර්යෙන් සිය අසුන්වලින් නැගී සිටිය යුතුය. එවිට නීතිඥවරයා විනිසුරුවරයාට හිස නමා ආචාර කළ යුතුව ඇත.
- ලිපිකරු/රෙජිස්ට්‍රාර්වරයා සියල්ලන්ට උපදෙස් දීමෙන් අනතුරුව පමණක් නැවත අසුන් වල වාඩිවිය යුතුය.
- ඔබ විනිසුරුවරයා ඇමතීමට සූදානම් වූ විට ඔබේ මේසය අසලින් නැගී සිටීම හෝ වේදිකාව මත (එවැන්නක් ඇතොත්) සිට ගත යුතුව ඇත.
- විනිසුරු ඔබ දෙස බලන තෙක් හෝ ඉදිරියට කටයුතු කරගෙන යාමට සූදානම් වන තෙක් ඔබ සිටිය යුතුය. ඔබට ඉදිරියට කටයුතු කරගෙන යාමට ඔලුව වැනීමෙන් සංඥා කිරීමෙන් හෝ එසේ පවසනු ඇත. ඔබට ඒ පිළිබඳ විශ්වාසයක් නැති විට ඔබ ඉදිරියට කටයුතු කරගෙන යන්නේ ද පිළිබඳව විනිසුරුවරයාගෙන් ඇසිය යුතුය.
- සාමාන්‍යයෙන් අධිකරණය අමතන පළමු නීතිඥවරයා අනෙකුත් නීතිඥවරුන් හඳුන්වා දිය යුතුය. උදාහරණයකට යමෙකුට මෙසේ පැවසිය හැක. “(නම) නඩු පවරන්නා වෙනුවෙන් පෙනී සිටි හා මගේ සහෝදරවරුන් (නම) හෝ මගේ මිතුරන් (නම්) සහ (නම) චූදිත වෙනුවෙන් පෙනී සිටී.
- අනෙක් සෑම නීතිඥවරයකුම අධිකරණය ඇමතීමට පෙර තම තමන්ව හඳුන්වා දිය යුතුව ඇත.
- විනිසුරු ඇමතීම ඔබේ අවස්ථාව නොවන විට අවසර ගැනීම කර සිදුවන දෙයට අවධානය යොමු කරන්න.
- ඔබේ ඉදිරිපත් කිරීම්වලදී හෝ ප්‍රකාශ අවසන් කිරීමේදී යොදා ගැනීම සඳහා අවශ්‍ය සටහන් තබාගන්න.
- විනිසුරුවරයාගේ අවධානය වෙනතක ගෙන යාමට උත්සාහ නොකරන්න. ඔබට තම සහායක නීතිඥවරයා සමග කතා කාරීමට අවශ්‍ය නම් සටහනක් ලියන්න.
- ඔබ විනිසුරු අමතන විට මෙන්ම විනිසුරු ඔබ අමතන විට සෑම විටකදීම අසුන් වලින් නැගී සිටින්න. වාඩිවී නොසිටින්න.
- ඔබේ සහායක නීතිඥවරයා ආමන්ත්‍රණය කරන විට හෝ උපුටා ගන්නා විට “මගේ සහයක” ලෙස හෝ “මගේ සහායක නීතිඥ ලෙස” ප්‍රකාශ කරන්න. විරුද්ධ පාර්ශවයෙන් නීතිඥවරයාට මගේ මිතුරා හෝ සේවාදායකගේ නම හෝ තත්ත්වය කියා නීතිඥ ලෙස ආමන්ත්‍රනය කරන්න.
- විනිසුරුවරයාව නිල ලෙස ආමන්ත්‍රණය කරන්න. පොදු නීතිය ක්‍රියාත්මක වන අධිකරණ බලය පවතින ප්‍රදේශවල මෙය ස්වාමීනි (පිරිම විනිසුරුවරයකු) හෝ මැතිනියනි (කාන්ති විනිසුරුවරියකට) ලෙස වේ. මීට විකල්පයක් ලෙස සෑම විනිසුරුවරයකුම ඇමතීමේදී විනිසුරු (වාසගම) හෝ සරලව විනිසුරුතුමා ලෙස ආමන්ත්‍රනය කළ හැක.
- ඔබ විනිසුරුවරයාට බාධා නොකළ යුතුය.
- ඔබ වැරදි තොරතුරක් හෝ නීතිය පිළිබඳ කරුණක් ඉදිරිපත් කරනවා යැයි සිතන්න. මෙය විනිසුරුවරයා හෝ චෝදනාව මෙහෙයවන නීතිඥවරුන් පෙන්වා දුන් විට නිහතමානී වන්න. පහත වචන වලින් එය පිළිගන්න. “මම උසාවියට සහ මගේ උගත් මිත්‍රයාට මම ණයගැති වෙමි”
- ඔබ අධිකරණය ආමන්ත්‍රනය කරන විට සහ යම් කරුණක් පෙන්වා දෙන විට එය පහත වචන මගින් පෙන්වා දෙන්න. “එය පහත ආකාරයට පෙන්වා දෙමි”
- විනිසුරුවරයා ඔබට යම් බාධාවක් කළහොත් තර්ක කිරීම හෝ ඉදිරිපත් කිරීම්වලදී වහාම නතර කරන්න, එයට උත්තර දීමට ඔවුන් අවසන් කරන තුරු සිටින්න;

- ඔබේ සේවාදායකයාට වැදගත් වන චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සම්බන්ධ විශේෂිත තොරතුරක් අධිකරණයට ලබාදීමට ඔබ සිතන විට එය පෙන්නුම් කරනු ලබන්නේ මෙය මගේ විශේෂිත උපදෙස් යනුවෙනි.
- විරුද්ධ පාර්ශවයේ නීතිඥවරයා විසින් විනිසුරුවරයා ආමන්ත්‍රනය කරන විට බාධා කිරීමක් හෝ විරෝධය පෑමක් සිදු නොකළ යුතුය.
- විරුද්ධ පාර්ශවයේ නීතිඥවරයා තර්ක කරන යම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේදී විනිසුරුවරයා එය විශේෂයෙන් අසන තෙක් ඔබ බලා සිටිය යුතුය.
- විනිසුරුවරයා ඔබෙන් ප්‍රශ්නයක් ඇසුවහොත්, එයට ප්‍රතිචාර දැක්වීමට පෙර ඔබේ කාලය ගත යුතුය. ඔබට ප්‍රශ්නය නිසි ලෙස ඇසුනේ නැත්නම් හෝ ව්‍යාකූල නම් විනිසුරුවරයාගෙන් එම ප්‍රශ්නය නැවත ඇසීමට හෝ ප්‍රකාශ කරන්නැයි ඇසිය යුතුව ඇත.
- යම් ප්‍රශ්නයකට පිළිතුරු ඔබ නොදන්නේ නම් එය පවසා සිටිය යුතුය.
- යම් ප්‍රශ්නයකට උත්තර දීමේදී එම ප්‍රශ්නයට පෙර සිටි අවස්ථාවෙන් පටන් ගත යුතුය.
- විවෘත අධිකරණයේදී ඔබේ ඉවසීම කිසිදු අවස්ථාවක නැති කර නොගත යුතුය.

9.6. <u>විවෘත ප්‍රකාශ.</u>

(9.6.1) <u>සාමාන්‍ය</u>

නඩු විභාගයට පෙර කරුණු සම්පූර්ණ වූ විට, චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට සහ විත්තියට විවෘත ප්‍රකාශයක් ලබාදීමේ අවස්ථාව ඇත. විවෘත ප්‍රකාශය දෙපාර්ශවයටම ඉඩ ලබා දෙන දෙයක් තිබේ. ඒ විනිසුරුවරයාට හෝ විනිසුරුවරයාට සහ ජූරියට නඩුවේ ස්වභාවය පිළිබඳවයි. එයට ඔවුන් ඔප්පු කිරීමට යන දෙය සහ ඔවුන් එය ඔප්පු කරන්නේ කෙසේ ද යන්න ඇතුළත් වේ. අපරාධ නඩු විධාන සංග්‍රහයේ පහත දේ ලබාදී ඇත. ඒ චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට සහ විත්තියට විවෘත ප්‍රකාශයක් කෙසේ ලබාදෙන්නේ ද යන්න පිළිබඳවය.

<u>(9.6.2) අදාළ ව්‍යවස්ථාව.</u>

මහේස්ත්‍රාත් අධිකරණය

චූදිතයා හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින අයට ඔවුන්ට අදල නඩුව විවෘතව මෙහෙයවීමට අයිතිය ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 184 (3) වන වගන්තිය)

**මහාධිකරණය, විනිසුරුවරයකු විසින් පමණක් නඩු විභාග කිරීම.**

චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව පිළිබඳ ඉදිරිපත් කිරීමට අවස්ථාව වූ විට එයින් පසුව චූදිතයා විසින් සාක්ෂි ඉදිරිපත් කළ යුතුව ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 201 වන වගන්තිය)

**මහාධිකරණය :- ජූරි සභාවක් විසින් නඩු විභාග කිරීම.**

චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව සිද්ධි සම්පූර්ණ කිරීමෙන් පසුව ආරම්භ කළ යුතුය. එහිදී තොරතුරු හෝ නීතිය ඔහු දරා සිටීම කැමැත්ත ප්‍රකාශ විය යුතුව තිබේ. චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට අවශ්‍ය සාක්ෂිවලට අනුව ඔහු සිතන විවේචන අනුව සහ සිද්ධ විය යුතුව ඇත. එවිට ඔහු තම සාක්ෂිකරුවන් කැඳවිය යුතුය. ඔවුන් සාක්ෂි දීමෙන් පසුව ඔහුගේ නඩුව සම්පූර්ණ වේ. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 22 (1) වන වගන්තිය)

<u>(9.6.3) එලදායී ලෙස විවෘත ප්‍රකාශයක් කිරීම.</u>

ඔබේ නඩුවේ උද්ධෘතයන් ස්ථාපිත කිරීමට ඔබේ විවෘත ප්‍රකාශය අවස්ථාවක් වේ. එයට විත්තු ගන්වන සහ සාක්ෂි දීමට සුදුසු ආකාරයට ඔබේ කතාව ඉදිරිපත් කිරීමෙහිලා ඔබේ සාක්ෂිකරුවන් සහ සාක්ෂි හඳුන්වා දිය යුතුය. විවෘත ප්‍රකාශයක අරමුණ පහත පරිදි වේ. ඔවුන් නඩුව සම්බන්ධව හෝ අවශ්‍ය දෙයක් අධිකරණයට සහ/හෝ ජූරි සභිකයන්ට පැවසිය යුතුව ඇත. තොරතුරු වලට අනුව විවෘත ප්‍රකාශයක් කිරීම වැදගත් වේ. තවද ඒවා සාක්ෂි මගින් ඔප්පු විය යුතු අතර විවෘත ප්‍රකාශය කිසි විටකත් තර්ක කිරීමට භාජනය නොවිය යුතුය.

අදාළ පාර්ශවයේ සාක්ෂි ඔප්පු කිරීම මත සිදුකරන විවෘත ප්‍රකාශයකින් නඩුව ආරම්භ වේ. ශ්‍රී ලංකාවේ පළමුව චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් ඔවුන්ගේ විවෘත ප්‍රකාශය කරනු ලැබේ. ඉන්පසුව විත්තියේ අවස්ථාව වේ. වඩාත්ම පොදුව සැලකූ කළ විත්තියේ නීතිඥවරයාගේ අරමුණ විවෘත ප්‍රකාශයක් කිරීමේදී එයට පහත කරුණු ඇතුළත් වේ.

- විත්තිය සිද්ධිය පිළිබඳව පැහැදිළි කිරීමක් සිදුකිරීම;
- චෝදනාව මෙහෙය වන නීතිඥවරයාගේ නඩුව පිළිබඳ දුර්වලතාවයන් හඳුනා ගැනීම;
- චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ ඔප්පු කිරීමේ භාරය ඉස්මතු කර දැක්වීම;
- සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සාරාංශ කර දැක්වීම සහ සමස්ත නඩුවට සම්බන්ධ සෑම කෙනෙකුගේම සම්බන්ධය පිළිබඳ භූමිකාව;
- ඉදිරිපත් කිරීම් ප්‍රදර්ශනය පිළිබඳ විස්තර කිරීම සහ සමස්ත නඩුවට සම්බන්ධ සෑම කෙනෙකුගේම සම්බන්ධය පිළිබඳ භූමිකාව පිළිබඳව;
- ජූරියේ වගකීම පැහැදිළි කිරීම සහ
- ජූරිය විසින් කැඳවන නීතිඥවරයා සලකනු ලබන මැදිහත්වීම් පිළිබඳ ප්‍රකාශය;

(9.6.4) <u>විධිමත් විවෘත ප්‍රකාශයක් ලබාගැනීම සම්බන්ධයෙන් වැඩිදුර ප්‍රායෝගික කරුණු</u>.

- නිශ්චිත නිල ආකාරයෙන් ආරම්භ කිරීම "අධිකරණය සෑහීමකට පත්වන්නේ නම්";
- වඩාත්ම හැකි ආකාරයට කෙටි විය යුතුය;
- විනිසුරුවරයා සහ/හෝ සෑම ජූරි සභිකයකු දෙසම බලන්න; ඔවුන්ව ඔබේ අවධානයට ගන්න. අධිකරණයේ ඉඩකඩට පමණක් කතා කිරීමෙන් වලකින්න;
- ජූරි සභිකයන්ට ඔවුන්ගේ මතකයේ රැඳෙන ආකාරයට යම් වැදගත් දෙයක් ජූරි සභාවේ සාමාජිකයන්ට පැවසීම, ආරම්භ කරන්න; වැදගත් තොරතුරු හෝ සාක්ෂිමය දේවල් ඉස්මතු කර දක්වන්න;
- ඔබේ නඩුව න්‍යායාත්මකව ස්ථාපිත කරන්න. ඔබේ විත්තිවාචකය පිළිබඳ ශක්තිමත් මධ්‍යගත තේමාවක් අධිකරණයට සහ/හෝ ජූරි සභිකයන්ට දැනගැනීමට ඉඩකඩ ලබා දෙන්න;
- ඔබට සහාය නීතිඥවරයකු හඳුන්වාදීමට අවශ්‍ය වූ විට නඩු විභාගය පවත්වාගෙන යාම විස්තර කිරීම අවශ්‍ය වේ. එය ඔබ කළ යුත්තේ ඔබේ විවෘත කිරීමෙන් පසු යහපත් වූ විටදී ය;
- කෙටි සහ සාමාන්‍ය යෙදුම් භාවිතයට ගෙන සරල භාෂාවෙන් කතා කළ යුතුය;
- ජූරි සභිකයන්ගේ මනසේ චිත්‍රයක් නිර්මාණය වන ආකාරයට ඔබ තෝරාගත් වචන භාවිතා කළ යුතුය;
- ඔබේ විරුද්ධවාදියා සමග ඝට්ඨනයක් ඇති කර නොගෙන ඔබේ ස්ථාවරය ඉදිරිපත් කළ යුතුය;
- ඔබේ සේවාදායකයා පිළිබඳව සංවේදනාත්මක විය යුතු අතර විනිසුරු සහ හෝ ජූරි සභිකයන් තුළ ඔබේ සේවාදායකයාගේ පුද්ගලික ජීවිතය පිළිබඳ අවධානය ලබාගත යුතුය.
- එය වෙනස් ආකාරයට නැවත නැවත මතක් කර දෙමින් යම් කාරණයක් බවට පත් කළ යුතුවීම සහ;

- එයට අවශ්‍ය ආධාර සහ තැන්පත් කිරීමේ කොටස් ප්‍රයෝජනයට ගත යුතුව ඇත.

(9.7) සෘජු පරීක්ෂණය (මූලික පරීක්ෂණය)

විත්තිය වෙනුවෙන් සාක්ෂි දීම උදෙසා විත්තියේ නීතිඥවරයා සාක්ෂිකරුවන් කැඳවිය යුතුය. මීට අමතරව ඔහු විත්තිකරු ද ඔහුගේ විත්තිවාචකය පිළිබඳව සාක්ෂි දීමට කැඳවිය යුතුව ඇත. මූලික පරීක්ෂණයේ අරමුණක් තිබේ. ඒ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි පැහැදිළි සහ නිසි ආකාරයෙන් ලබාගැනීමට අදාළ සහ සුදුසු සාක්ෂි ලබා ගැනීමටය. සාක්ෂි දීමේ රීතීන් පිළිබඳව බහුතර සාක්ෂිකරුවන්ට පැහැදිළිතාවයක් නැත. එම නිසා නීතිඥවරයා කළ යුතු අත්‍යාවශ්‍ය දෙයක් තිබේ. ඒ අදාළ සහ සුදුසු සාක්ෂි ගැනීමෙහිලා නිසි ප්‍රශ්න ඇසීම ගැනය.

(9.7.1) අදාළ ව්‍යවස්ථාව.

(9.7.1.1) මහේස්ත්‍රාත් අධිකරණය - මහේස්ත්‍රාත්වරයා විසින් විභාග කිරීම.

සෑම සාක්ෂිකරුවෙකුගෙන්ම ප්‍රශ්න ඇසීමට චූදිතයාට ඉඩදිය යුතුය. එවිට ඔහු කලින් නම් කළ සාක්ෂිකරුවන්ගෙන් පමණක් නොව කලින් නම් නොකළ සාක්ෂිකරුවන් ද ගැනේ. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 222 වන වගන්තිය)

චෝදනාව මෙහෙයවන නීතිඥවරයා, විනිසුරුවරයාගේ අවසරය ඇතිව අසත්‍ය බව ඔප්පු කිරීමට ද සාක්ෂිකරුවන් කැඳවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 223 වන වගන්තිය)

මහේස්ත්‍රාත්වරයා, චූදිත තමා වෙනුවෙන් සාක්ෂි දෙනවාද ඔහු සාක්ෂිකරුවන් කැඳවීමට අපේක්ෂා කරන්නේදැයි ඇසිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 152 (1) වන වගන්තිය)

චූදිත සාක්ෂි දීමට බලාපොරොත්තු වන නමුත් සාක්ෂිකරුවන් කැඳවන්නේ නැතිනම් මහේස්ත්‍රාත්වරයා, චූදිතගේ සාක්ෂි ගැනීමට ක්‍රියා කළ යුතුව ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 152 (2) වන වගන්තිය)

මහේස්ත්‍රාත්වරයා විසින් චූදිත නඩු විභාගයට තැබීමේදී නඩු විභාගයේදී චූදිත සාක්ෂි දීමට කැමති සාක්ෂිකරුවන්ගේ නම් වාචිකව පැවසිය යුතු අතර, එහිදී තොරතුරු ලබාදෙන සහ චරිතය පිළිබඳව සාක්ෂි දෙන්නන් වෙන් වෙන්ව ගත යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 155 (1) වන වගන්තිය)

ඉන්පසුව චූදිත සඳහන් කළ සාක්ෂිකරුවන්ගේ නම් ලැයිස්තුවක් සකස් කළ යුතුව ඇත. තවද පිස්කල්වරයාට සෑම සාක්ෂිකරුවන්ට නඩු විභාගය සඳහා අධිකරණයේ පෙනී සිටින ලෙස දැන්වීම් භාරදෙන ලෙස නියෝග කළ යුතුව ඇත. අදාළ දැන්වීමේදී එම නියමිත දිනය ද සඳහන් කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 155 (2) වන වගන්තිය)

චූදිත සහ සාක්ෂිකරුවන් ලබාදෙන සාක්ෂි ලිඛිතව සටහන් කළ යුතුව ඇත.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 152 (5) වන වගන්තිය)

චූදිතගේ සියලු ප්‍රකාශ වාර්තා කළ යුතුය. ඒ අදාළ පරීක්ෂණවේදියාය. චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩු අවසාන වීමට පෙර සාක්ෂි ලබාගෙන ඒවා කියවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 219 වන වගන්තිය)

(9.7.1.2) මහාධිකරණය - විනිසුරුවරයා විසින් නඩු විභාග කිරීම.

චූදිතයා තමා, විත්තිවාචකය සකස් කළ යුතු අතරම සාක්ෂිකරුවන් ඇතොත් ඔවුන් ගෙන් ප්‍රශ්න කළ යුතුය. තවද චූදිත තැනැත්තා හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින්නා ඔහුගේ නඩුව සම්පිණ්ඩනය කර දැක්විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 201 වන වගන්තිය)

(9.7.1.3) මහාධිකරණය - ජූරි සභාව විසින් නඩු විභාග කිරීම.

චූදිත හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින්නා නඩුව ආරම්භ කළ යුතු අතර ඔහු රැඳී සිටීමට කැමති තොරතුරු හෝ නීතිය ප්‍රකාශ කළ යුතුය.

ඔහු අවශ්‍ය යයි සිතන යම් විවේචනයක් ඇතොත් චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ සාක්ෂි අනුව සකස්විය යුතුව තිබේ. ඉන්පසුව ඔහුගේ සාක්ෂි කැඳවිය යුතුය. ඔවුන් සාක්ෂි දීමෙන් පසුව ඔහුගේ නඩුව සම්පිණ්ඩනය කළ යුතුව ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 221 (1) වන වගන්තිය)

විත්තියේ නීතිඥවරයා ඉතා පරිස්සමින් තම ප්‍රශ්නාවලිය අනුපිළිවෙලට සකස් කළ යුතුව තිබේ. මෙහි අරමුණක් ඇත. ඒ පැහැදිළිව සහ ක්‍රමානුකූල ආකාරයට සාක්ෂි ලබාගැනීම වේ. එම ප්‍රශ්න තාර්කික අනුපිළිවෙලකට විය යුතු අතර එම සාක්ෂි අවබෝධ කරගැනීමෙහිලා සුදුනම් විය යුතුව ඇත. ප්‍රශ්න ඇසීමේදී නීතිඥවරයා තාර්කික පිළිවෙලක් අනුගමනය නොකරන්නේ නම් සාක්ෂිකරු විමතියට පත්වන අතරම විනිසුරු හෝ ජූරිය සාක්ෂිකරුවන් ගෙන් සාක්ෂි ගැනීමේදී අදාළ ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමෙහිලා සහ තේරුම් ගැනීමේදී දුෂ්කරතාවයට පත් වේ.

සාක්ෂි ලබාගැනීමේ හොඳම විදිය වන්නේ සාක්ෂිකරුවන්ට ඔවුන්ගේම සිද්ධීන් පිළිබඳ විනිශ්චයක් ලබාදීමට ඉඩ හැරීම වේ. එම සිද්ධීන් සම්බන්ධ කිරීම අවසන් කළ විට අදාළ කරුණු විශ්ලේෂණය කිරීමෙහිලා ප්‍රශ්න යොමු කළ යුතුය. කෙසේ නමුත් ප්‍රශ්න ඇසිය යුත්තේ සාක්ෂිකරුවන්ට තමන්ගේ සිද්ධිය තමා දන්නා ආකාරයට පැවසීමට සහය පළ කිරීමටය. නමුත් සාක්ෂිකරුවන්ට නොපැවසිය යුත්තක් ඇත. ප්‍රශ්න නොකළ යුත්තක් ඇත. ඒ ප්‍රශ්නවලට උත්තර යෝජනා කිරීම වේ. ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න කෙටි විය යුතු අතරම පැහැදිළි සහ සරල ද විය යුතුය. ඒ සාක්ෂිකරුවන්ට ඒවා පහසුවෙන් තේරුම්ගත හැකි පරිදි වේ.

සුදුසු සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් සොයාගත යුතු දෙයක් ඇත. ඒ ඔවුන් සැබවින්ම ප්‍රශ්නගත සිද්ධීන් දන්නේ දැයි සොයා ගැනීමය. චූදිත හෝ ඔහුගේ ඇයගේ ඥාතීන් කියන දේ මතම රැඳී සිටීම භායානක වේ. මක්නිසාද යත් සාක්ෂිකරුවන් දන්නා බව සහ එවැනි පුද්ගලයන් සක්ෂිකරුවන් ලෙස සිතාසි මගින් කැඳවීම ඔවුන් ඔබට පැවසූ ආකාරය මතය. විත්තියේ සාක්ෂිකරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක්කළ යුතුය. ඒ ඔවුන් දන්නා කැපී පෙනෙන කරුණු සලකා බැලීමට වේ. විත්තියේ නඩුව වෙනුවෙන් එයට පක්ෂව ප්‍රකාශ දිය හැකි නම් ඔවුන්ව කැඳවීම ප්‍රමාණවත්ය.

ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක් ඇත. ඒ නීතිඥවරයා සාක්ෂිකරුව සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන අවස්ථාවේදී ඔහුට විත්තිය වෙනුවෙන් වටිනා සාක්ෂි ඇතැයි ද ඒවා අවශ්‍යය ද සලකන විට නමුත් සාක්ෂිකරු අධිකරණය ඉදිරියේ ප්‍රකාශයක් කිරීමට අකමැති හෝ මැලිකමක් දක්වන විටදීය. සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශය විත්තිය සම්බන්ධයෙන් තීරණාත්මක වීමේදී විත්තියට, සාක්ෂිකරුට සිතාසි නිකුත් කිරීමට සිදුවේ. සිතාසි යැවූ සාක්ෂිකරු මැලිකමක් දක්වන විටදී විත්තියේ නීතිඥවරයා පහත කරුණු සලකා බැලිය යුතුය. ඒ එසේ මැලිකමක් දක්වන සාක්ෂිකරුගෙන් අධිකරණයේදී ලබාගන්නේ කුමන සාක්ෂි ද යන වග සහ ඔහුගේ/ඇයගේ ප්‍රකාශය තම සේවාදයකයාට යම් යහපතක් කරන්නේ ද යන වගය.

(9.7.2) මූලික පරීක්ෂණයක් පැවැත්වීමේදී මතක තබාගත යුතු කරුණු.

- ලබාගන්නා තොරතුරු පිළිබඳ ස්ථිර බවක් ඔබට තිබිය යුතුය; ඔබ නඩු විභාගයේදී සාක්ෂිකරු නියෝජනය කරන බවත්, ඔබේ නඩුවේදී සෑහීමට හෝ විත්තියට නිශ්චිත තොරතුරු ඔප්පු කිරීමෙහිලා වැදගත් වන බවත් මතක තබාගත යුතුය. යම් විශේෂ සාක්ෂිකරුවකු නියෝජනය කිරීමට අවශ්‍ය තොරතුරු මොනවාද යන්න දැන ගැනීමට වූ කල ප්‍රශ්න කිරීමේදී හොඳ මාර්ගයක් වේ;
- සාක්ෂිකරුගෙන් තොරතුරු ලබාගැනීම සඳහා පහත වචන වලින් ආරම්භ වන ප්‍රශ්න ඇසිය යුතුය; තවද, කුමක්ද, කීයටද, කොහේද, ඇයි කොහොමද, විස්තර කරන්න, පැහැදිළි කරන්න ආදී වශයෙන් වේ;

- සාක්ෂිකරු සූදානම් කරන්න, ඔබේ සාක්ෂිය ගැන සූදානම් වන්න, අත්‍යාවශ්‍ය කරුණක් ඇත. ඒ ඔබ දෙපාර්ශවයම විසින් කිව යුත්තේ කුමක්දැයි දැන ගැනීමටය. කෙසේ නමුත් ඔබ විශේෂිත ප්‍රශ්න සඳහා පමණක් කැප නොවිය යුතුය. තවද සාක්ෂිකරුට පෙර දැක්වෙන වැළැක්වෙන උත්තර දීමට ඉඩ ලබා නොදිය යුතුව ඇත.
- ඔබ අසන ප්‍රශ්න ගැන සිතන්න. උත්තර දෙන, උත්සාහ කරන සහ ..... (හැකිතාක් දුරට) පිළිතුරුවලට පරිස්සමෙන් ඇහුම්කන් දෙන්න. ඒ ඔබ ...... සාක්ෂිකරුගෙන් ලබාගත් උත්තරවලට අදාළ ඔබේ පසුගිය ප්‍රශ්නවලටය.
- ඔබේ ප්‍රශ්න කෙටි විය යුතුය. ඔබ සහතික විය යුතුය. ඒ සාක්ෂිකරුට ඔහුගේ/ඇයගේ කතාන්දර තාර්කිකව පැහැදිළි ආකාරයට පවසනු ලැබීම ගැනය.
- ප්‍රධාන සිරස්තල සහිත ප්‍රශ්න ඇතුළත් කරන්න. ඒවා මගින් සාක්ෂිකරු සහ ජූරි සභාව යන දෙපාර්ශවයටම ප්‍රකාශ කළ යුතුව ඇත. එහිදී ඔබේ ප්‍රශ්න කුමන දිසානතියක් ගන්නේ දැයි විමසිය යුතුය.
- ඔබේ විරුද්ධවාදියාගෙන් ඔබේ ප්‍රශ්න ආකාරය සහ ඉතිරිය පිළිබඳ විරෝධතාවයන් හැසිරවීමට සූදානම් විය යුතුව ඇත.
- ඔබේ විරුද්ධවාදියාගේ හරස් ප්‍රශ්න ගැන අපේක්ෂා කරන්න; ඔබේ නඩුවට අයහපත් තොරතුරු ඇතොත් සහ ඒවා ඔබ කණස්සල්ලට පත් කරන්නේ නම් එය නිතරම ඔබ නිර්මාණය කිරීමට ප්‍රමාණවත් වන අතරම එය හරස් ප්‍රශ්න ඇසීමේදී සිද්ධ වේ. ඔබට මේ විදිහට අයහපත් තොරතුරු පාලනයට සහ අඩු කිරීමට මෙන්ම ලබාදීමට ද සිද්ද වේ.
- මතක තබාගත යුතුය; මූලික පරීක්ෂණයේදී සාක්ෂිකරු තරුවක් වේ. නමුත් විත්තියේ නීතිඥවරයා එසේ නොවේ. මූලික පරීක්ෂණයේදී ඔබ සාක්ෂි මෙහෙයවන අතර සාක්ෂිකරුට ඔහුගේ/ඇයගේ කතාන්දරය කියවීමට ඉඩදිය යුතුව ඇත.
- වඩාත් ප්‍රවේශම් විය යුත්තේ සාක්ෂිකරුට නිශ්චය කොට තබා ගැනීම ගැනය. ඒ පිළිබඳව සාක්ෂිකරුට ප්‍රශ්න ඇති විටදීය. එසේ නිශ්චය නැත්නම් පසුව අසන ප්‍රශ්න මගින් ඔහුව/ඇයව එම කරුණ නිශ්චය කර ගැනීමෙහිලා ඒ තත්ත්වයට පත්කර ගත යුතුව තිබේ.
- උත්තරය හඟවන ප්‍රශ්න ඇසිය යුතු නැත; සහ
- සාක්ෂිකරු විශ්මයට පත්වීම, අපහසුතාවයට පත්වීම හෝ මහන්සිවීම ගැන සහ එවැනි සංඥාවන් දෙස විමසිලිමත් වන්න. එසේ වෙතොත් සහය වෙන්න සහ මුල සිට පටන් ගන්න හෝ යම් කෙටි කාලයකට නඩු කාර්යපටිපාටිය කල් දමා ගන්න.

(9.8) සාක්ෂි දීමට චූදිතව කැඳවීම.

විත්තියේ නීතිඥවරයා පහත කරුණු තීරණය කිරීමට අවශ්‍ය වේ. ඒ චූදිත තැනැත්තා ඔහුගේ/ඇයගේ විත්තිවාචිකය පිළිබඳව ප්‍රකාශයක් ලබාදීම ගැනය. මෙය උපාය මාර්ගික නඩු පිළිබඳ තීරණයක් වන අතරම සාකච්ඡාවක් ආරම්භ විය යුතුව ඇත. ඒ නීතිඥවරයා සහ චූදිත තැනැත්තා අතරය. ඒ චූදිත තැනැත්තා සාක්ෂිදීම සුදුසු ද යන්න සම්බන්ධයෙනි.

මෙය සලකා බැලිය යුතු ප්‍රායෝගික විදියක් ඇත. ඒ චෝදනාව මෙහයවන නීතිඥවරයාගේ නඩුව අවසානයේදී චූදිතව සලකා බලන නඩුවක් පවත්වා ගෙන යාමට අවශ්‍ය සාක්ෂි තිබේද යන්නය. එසේ වෙතොත් එයින් පැහැදිළි වන්නේ චූදිතට උත්තර දීමට නඩුවක් ඇති බවය. එවැනි නඩුවකදී චූදිතට පහත ලෙස උපදෙස් දීම ආරක්ෂාකාරී වේ ඒ සාක්ෂි ලබා ගැනීමට චූදිතව කැඳවීම සඳහාය. මෙයට හේතුවක් ඇත. චූදිත සාක්ෂි නොදීමට තීරණය කළහොත් ඔහුට එරෙහිව ඇති චෝදනාව ට සම්බන්ධ බවට සාක්ෂියක් වන අතරම අධිකරණයේ ප්‍රතිචාරය වන්නේ ඔහුට/ඇයට යමක් සැඟවීමට ඇති බවත් එම ප්‍රතික්ෂේප කිරීමට පදනම් වූ ඉතා අයහපත් නිගමනයකට එළඹීම වේ.

විරුද්ධව චෝදනාව මෙහෙයවන නීතිඥයාගේ නඩුව දුර්වල නම් (මක් නිසාද සාක්ෂි මදකම, චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ පාර්ශවයෙන් දුප්පත් ප්‍රකාශ සාක්ෂිකරුවන් විසින් සිදු කිරීම, සහ/හෝ විත්තියේ නීතිඥවරයාගේ ඉතා හොඳින් හරස් ප්‍රශ්න ඇසීම) සහ චූදිතට එරෙහි බැලූ බැල්මට සාක්ෂි නොමැතිකමද යන හේතූන් මත පහත කරුණ වඩාත්ම උපදේශාත්මක වේ. චූදිතට සාක්ෂි නොදෙන්නැයි පැවසිය යුතුය. (එනම් නිහඬව සිටීමට චූදිතගේ අයිතිය ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කිරීම) විශේෂයෙන් චූදිත දුර්වල සාක්ෂිකරුවකු නම් මෙය අවසානයට පත්වන්නේ රජය පාර්ශවයෙන් නඩුව ශක්තිමත් කිරීමෙනි.

යම් කරුණක් පිළිබඳ ගණනය කරන අනතුරක් පවතින විටදී චූදිත සාක්ෂි දෙනවාද නැද්ද සම්බන්ධයෙන් තීරණය වේ. එය සැම නඩුවකදීම මෙම ගණනය කිරීම මත පදනම් වේ. නීතිඥයාට වගකීමක් තිබේ. චෝදනාව මෙහෙයවන පාර්ශවයෙන් සහ විත්තියේ නඩුව සම්බන්ධයෙන් ද ශක්තිමත් සහ දුර්වල කරුණු සලකා බැලීමය. තවද සේවාදයකයාට උපදෙස් දිය යුතුව ඇත. ඒ ඔහුට/ඇයට සාක්ෂි දීමට අවශ්‍යද නැද්ද යන්න සම්බන්ධයෙනි.

(9.9) හරස් ප්‍රශ්න ඇසීම.

(9.9.1) සාමාන්‍ය.

මූලික පරීක්ෂණය අතරේද විරුද්ධ පාර්ශවය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් ගෙන් ප්‍රශ්න කිරීමේ රටාව සහ ක්‍රියාදාමය මෙසේය.

හරස් ප්‍රශ්න ඇසීමේ ක්‍රියාදාමයේ අරමුණ පහත පරිදි වේ. එනම් නිරවද්‍යතාව, අවංකභාවය සහ සාක්ෂි වල විවිධත්වය ඉදිරිපත් කිරීම පරීක්ෂා කිරීමය. හරස් ප්‍රශ්න ඇසීමේ ඉලක්කයට පහත කරුණු ඇතුළත් වේ. එනම් සාක්ෂිකරුට එකතු කිරීම, වෙනස් කිරීම, සුදුසුකම් ඇති කිරීම, සංශෝධනය කිරීම හෝ ලබාදෙන සාක්ෂි වාචිකව සකස් කිරීම ද වේ. හරස් ප්‍රශ්න ඇසීම සාක්ෂිකරුගේ විශ්වාසය කඩ කිරීමට සහ ඔවුන්ගේ සාක්ෂි සහ හරස් ප්‍රශ්න ඇසීමේ පාර්ශවයට පක්ෂපාතී බවට සාක්ෂි ලිහිල් කිරීම ඇතුළත්ය.

හරස් ප්‍රශ්න දෙකක අරමුණු වැඩිහරියක් හෝ සියල්ල එකට එකතු කරන අතරම එය මූලිකව පහත කරුණු ද ඉෂ්ට කරනු ලැබේ. ඔබේ නඩුවට අදාලව පක්ෂපාතී සාක්ෂි ගතයුතු අතරම ඔබේ විරුද්ධ පාර්ශවයේ නඩුව පිළිබඳ දුර්වලතා හෙළිදරව් කෙරේ.

සාමාන්‍ය භාවිතය වන්නේ විත්තියේ නීතිඥවරුන් සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ප්‍රියමනාප සහ ආචාරශීලි වීමය. කෙසේ නමුත් සමහරවිට සතුරු සහයෝගය නොදෙන හෝ නොමනා සාක්ෂිකරුවකු සමග කටයුතු කිරීමේදී ස්ථිර විය යුතුය. අවේගශීලි විය යුතුයි.

(9.9.2) අදාළ ව්‍යවස්ථාව

මහේස්ත්‍රාත් අධිකරණය

මහේස්ත්‍රාත් අධිකරණයේදී චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සහ මහේස්ත්‍රාත් කැඳවන හෝ යලි කැඳවන සියලු සාක්ෂිකරුවන් හෝ හරස් ප්‍රශ්න ඇසීමට චූදිතට අවසරය ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 184 (2) වන වගන්තිය)

මහාධිකරණය

චෝදනාව මෙහෙයවන නීතිඥවරයා කැඳවන සියලු සාක්ෂිකරුවන් හෝ හරස් ප්‍රශ්න ඇසීමට චූදිතට අවසරය තිබේ. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 199 (5) වන වගන්තිය)

(9.9.3) හරස් ප්‍රශ්න ඇසීමේදී ප්‍රායෝගික කරුණු.

- විත්තියේ නීතිඥවරයා තමාගේම සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසිය යුතු නැත.
- සාක්ෂිකරුගේ අවංකභාවය ප්‍රශ්න කිරීමේදී විත්තියේ නීතිඥවරයා සාක්ෂිකරුගේ ප්‍රකාශයේ ප්‍රධාන වෙනස්කම් වලට අවධානය යොමු කළ යුතුය.
- හරස් ප්‍රශ්න ඇසීමේදී ප්‍රධාන ප්‍රශ්නවලට අවකාශය ලබාදිය යුතුය. තවද අධිකරණය මූලික පරීක්ෂණයට වඩා පුළුල්ව හරස් ප්‍රශ්න ඇසීම සාමාන්‍යයෙන් කළ යුතුය.
- සාක්ෂිකරුගේ යම් කරුණක් පිළිබඳව හරස් ප්‍රශ්න ඇසීමට අපොහොසත් වන විට ඒ කරුණට අදල සාක්ෂි පිළිගැනීමට අදහස් කරන විට සිදුවිය යුතුව ඇත.

(9.9.4) <u>ඉහත කරුණු වලට අමතරව, නීතිඥවරයා හරස් ප්‍රශ්න ඇසීමට සූදානම් වීම.</u>

- පුද්ගලිකව සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී අවශ්‍ය වන තොරතුරු ලබාගන්නේ කෙසේද යන්න පිළිබඳව අනිවාර්යයෙන් සලකා බැලිය යුතුය.
- ප්‍රධාන පරීක්ෂණයේදී චෝදනාව මෙහෙයවන නීතිඥවරයා කැඳවන සාක්ෂිකරුවන් බලාපොරොත්තු විය යුතු අතරම එසේ නැතිනම් ඔවුන් පැමිණිල්ලට විත්තියෙන් පිළිතුරු දිය යුතුය.
- සෑම බලාපොරොත්තු වන සාක්ෂිකරුවකුටම අවශ්‍යය හරස් ප්‍රශ්න ඇසීමේ සැලැස්මක් නිර්මාණය කළ යුතුව ඇත.
- සාක්ෂිකරුගේ ප්‍රකාශය පිළිබඳ නොගැලපෙන තැන් හෝ විය හැකි විවිධත්වයන් පිළිබඳව දැඩි අවධානයෙන් සිටිය යුතු අතරම ඒවා අධිකරණයට ඉසිමතු කර දැක්විය යුතුය.
- සාක්ෂිකරුවන් මුලින් දුන් ප්‍රකාශ සමාලෝචනය කළ යුතු අතරම බලාපොරොත්තු වන මීට පෙර කළ යම් ප්‍රකාශ ඇතොත් ඒවාද සමාලෝචනය කළ යුතුය.
- පොලීසියේ සාක්ෂිකරුවන් ගෙන් ප්‍රශ්න ඇසීමේදී අදළ ව්‍යවස්ථා සහ දේශීය පොලිස් රෙගුලාසි සුදුසු වන විට සමාලෝචනය කළ යුතුය.
- සාක්ෂිකරුවන්ගේ විශ්වසනීයත්වය ට අදල කරුණු සම්බන්ධයෙන් ද දැඩි අවධානයෙන් සිටිය යුතු අතරම පක්ෂපාතීත්වය සහ සාක්ෂි දීමේ අරමුණ ගැන ද එය එසේම සිදුවිය යුතු අතරම එම කරුණු හරස් ප්‍රශ්න ඇසීමේදී ඉස්මතු කළ යුතුය.

විත්තියේ නීතිඥවරු කිසි විටකත් නොඇසිය යුතු දෙයක් තිබේ. ඒ කව්ද, කුමක්ද, කොහේද, කීයටද, ඇයි, කොහොමද, විස්තර කරන්න සහ පැහැදිළි කරන්න යන ප්‍රශ්න කිසි විටකත් හරස් ප්‍රශ්න කිරීමේදී නොඇසිය යුතු බවය. හරස් ප්‍රශ්න ඇසීමේදී ඔබ විසින් විස්තර කළ නොහැකි වචන ඇත. හරස් ප්‍රශ්න ඇසීමේ අරමුණ පහත පරිදි වේ. එය චෝදනාව මෙහයවන නීතිඥවරයාගේ නඩුව ගැන ඉලක්කය විය යුතුය. එයට සාක්ෂිකරුට ඔවුන්ගේ පිළිතුරු විස්තර කිරීමට අවස්ථාවක් ලබා නොදී චූදිතගේ න්‍යාය සම්බන්ධයෙන් ඉදරියට කටයුතු කිරීම ද අදාළ වේ. ඔබට අවශ්‍යය වන්නේ සිද්ධීන් පිළිබඳ ඔබේ විස්තරයට සාක්ෂිකරු එකඟ කර ගැනීම වන අතරම ඔවුන්ට ඔවුන්ගේම තත්ත්වයක් සංවර්ධනය කිරීම නොවේ.

එම නිසා ඔබ සිදුකරන හරස් ප්‍රශ්න ඇසීමට උපරිම ලෙස බලපෑමක් වන මෙම මූලික පිළිවෙත් තුන මතක තබා ගත යුතුය.

<u>(අ) අපේක්ෂිත විස්තර ලබාගැනීමට අදළ ප්‍රශ්න පමණක් ඇසිය යුතුය.</u>

මෙම ප්‍රශ්න සරලව තොරතුරක් හඟවන අතරම ප්‍රශ්නය අවසානයේ අදහස හඟවන ප්‍රශ්නාර්ථය ඇත.

(ආ) සෑම ප්‍රශ්නයකින්ම එක් තොරතුරක් පමණක් ලබා ගැනීම ස්ථාපිත කළ යුතුය.

(ඇ) සෑම ප්‍රශ්නයක්ම නිශ්චිත ඉලක්කයක් සඳහා බව සහතික විය යුතුය.

අරමුණක් නොමැතිව ප්‍රශ්න කිරීම කාලය කා දැමීමක් වන අතරම සාක්ෂිකරුට තමන්ගේම විස්තරයක් ලබා දීමෙහිලා අවස්ථාව ලබාදීමකි.

(9.10) නැවත විභාග කිරීම.

සාක්ෂිකරුගේ හරස් ප්‍රශ්න අසා අවසන් වූ විට ඔහු කැඳවූ පාර්ශවය ඔහුට වැඩිදුරටත් ප්‍රශ්න ඉදිරිපත් කළ යුතුය. කෙසේ නමුත් ඇසිය යුතු ප්‍රශ්න වල ආකාරය පිළිබඳ ඉතා දැඩි සීමා කිරීම් තිබිය යුතුව ඇත. මෙහිදී විනිසුරුවරයා හෝ මහේස්ත්‍රාත්වරයා අනිවාර්යයෙන් සහතික විය යුතු දෙයක් තිබේ. ඒ ප්‍රශ්න කරන්නා ඔවුන් ගේ සීමාවන් ඉක්ම නොයා යුතු දෙයක් තිබේ. මෙහිදී හරස් ප්‍රශ්න ඇසීමේදී ඉස්මතු වූ කරුණු පිළිබඳ ප්‍රශ්න පමණක් යෙදිය යුතුය. එයට අපේක්ෂිත පිළිතුරු හඟවන ප්‍රශ්න ඇතුල් නොකළ යුතුව ඇත. විනිසුරුවරයා හෝ මහේස්ත්‍රාත්වරයා අවසර දී ඇති අවස්ථාවකදී පමණක් අළුත් කරුණු හඳුන්වා දිය යුතුව තිබේ.

(9.11) තර්ක කිරීම අවසන් කිරීම.

(9.11.1) සාමාන්‍ය- තර්ක අවසන් කිරීම යනු සෑම පාර්ශවයකම නීතිඥවරයා නිමා කරන ප්‍රකාශයක් වේ. එහිදී නැවත නැවත කියවීමක් ඇත. ඒ විනිසුරුවරයා ගේ ජූරිය වඩාත් වැදගත් තොරතුරු සහ අදළ තොරතුරු පිළිබඳ සාක්ෂි වේ.

සියලු සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නඩු විභාගය අවසානයේ තර්ක අවසන් කිරීම උද්ගත වේ. අපරාධ නඩුවකදී චෝදනාව මෙහෙයවන නීතිඥවරයා ඔහුගේ තර්ක අවසන් කිරීම විත්තියෙන් පසුව සිදුකරනු ලැබේ. චෝදනාව මෙහෙයවන නීතිඥවරයා අපරාධ නඩුවලදී ඔප්පු කිරීමේ භාරය උදෙසා අවසන් අසත්‍යය පිළිබඳ තර්කයට අවසර දිය යුතුව ඇත. මක් නිසාද එය අපරාධ නඩුවලදී ඔප්පු කිරීමේ භාරය වන බැවිනි. ජූරිය විසින් නඩුව විභාග කළහොත් විනිසුරුවරයා ජූරියට සාමාන්‍යයෙන් ලබාදිය යුත්තක් ඇත. ඒ අදළ පාර්ශවය අවසන් තර්ක කිරීම ශ්‍රවනය කර ජූරියට අවසන් උපදෙස් දීම විත්තියේ නීතඥවරයා තර්ක අවසන් කිරීමෙහිලා පහත කරුණු සම්බන්ධයෙන් එනම් චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ දුර්වලතා ඉස්මතු කිරීමට පමණක් නොව සාක්ෂි මගින් ලබාගත් යහපත් මැදිහත්වීම් විස්තර කිරීම ට කටයුතු කිරීම වේ..

තර්ක අවසන් කිරීමේදී සියලුම සාක්ෂි කොටස් එකට රැගෙන පැමිණිය යුතුය. තවද නඩුව ශක්තිමත් දැයි අප්‍රතිහත ධෛර්යයෙන් ඉදිරිපත් කළ යුතුව තිබේ. නඩුවේ න්‍යාය ස්ථාපිත කරන සියලුම දේවල් ඔප්පු කිරීමෙහිලා නඩුව සම්පූර්ණයෙන් ඉස්මතු කළ යුතුය. එම අවසන් කිරීම සරලව නිශ්චිත ආකාරයට සිදුවිය යුතුව තිබේ.

(9.11.2) ප්‍රයෝජනවත් ප්‍රායෝගික හෝඩුවාවන්.

- අනෙක් පාර්ශවය සාදනු ලබන තර්ක අපේක්ෂා කිරීම වැදගත් වේ; ඒවා සෑදීමට පෙර එම තර්ක අසත්‍යය බව ඔප්පු කිරීමට සූදානම් විය යුතුව ඇත.
- අනෙක් පාර්ශවයේ නීතිඥවරයාට ප්‍රහාර එල්ල කිරීමෙන් වැළකිය යුතුව තිබේ. ජූරිය මෙන්ම විනිසුරුවරයාද මෙවැනි තර්කයක් පිළිගැනීමෙන් වැළකිය යුතුය. කිසිම වාතාවරණයක් යටතේ පුද්ගලිකව සටන් කිරීම එනම් විරුද්ධ පාර්ශවය හෝ නීතිඥවරයා සමග නොකළ යුතුය; එය නුසුදුසු වනවා පමණක් නොව වෘත්තිය ද නොවේ;
- ස්ථිර ලෙස දැනගත යුතු දෙයක් ඇත. ඒ ඔප්පු කිරීමේ සාක්ෂි ඔබේ නඩුවේ ප්‍රධාන කරුණු විස්තර කිරීමෙහිලා භාවිතයට ගත යුතුය. (ඔප්පු කිරීමේ සාක්ෂි ප්‍රයෝජනයට ගැනීමේදී ඒවා විශාල වශයෙන් තර්ක අවසන් කිරීම පිළිබඳ ඵලදායිතාව වැඩි කරනු ලැබේ.) සහ
- නඩු විභාගය අතරවාරයේදී ඉදිරිපත් කරනු ලබන සියලු සාක්ෂි අනාවරණය නොකිරීම වැදගත් වේ. අවසන් කිරීම සිදුවන අවස්ථාවේදී සමස්ත නඩුවම ඉදිරිපත් කළ යුතුය. එවිට මෙය එපා වනවා පමණක් නොව විනිසුරුවරයාගේ සහ/හෝ ජූරියේ අවධානය

ලබාගැනීමට නොහැකි වීමද සිදුවේ. ඒ වෙනුවට ප්‍රකාශය සහ නඩු විභාගයේ ප්‍රධාන සාක්ෂි ඉස්මතු කර දැක්වීමට කටයුතු කළ යුතුය.

අවසන් කිරීමේදී නීතිඥවරයා ඔහුගේ/ඇයගේ ඉදිරිපත් කිරීම් මගින් චූදිතයා නිදෙස් කොට නිදහස් කිරීමට ජූරියෙන් හෝ විනිසුරුවරයාගෙන් ඇසිය යුතුව තිබේ.

(9.12) <u>පරීක්ෂණය; සාධාරණ සැකයෙන් ඔබ්බට වරදකරු කිරීම;</u>

ශ්‍රී ලංකාවේදී චෝදනා මෙහෙයවන නීතිඥවරයා සාධාරණ සැකයෙන් ඔබ්බට තම නඩුව ඔප්පු කළ යුතුය. පුද්ගලයකු වරදකරු බව සොයා ගැනීමෙහිලා චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සියලු සාධාරණ සැකයන් මුලිනුපුටා දැක්වීම අවශ්‍ය නොවන අතරම එය පුද්ගලයා යම් දෙයක් කිරීම හෝ නොකිරීම ද සම්පූර්ණයෙන්ම ස්ථිර ලෙස නඩුවට ඔප්පු කිරීම ද වේ. සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමේදී පහත කරුණු අත්‍යාවශ්‍ය වේ. එනම් විනිසුරුගේ ජූරිය සියලු සාක්ෂි සලකා බැලීමෙන් පසුව එක් නිගමනයකට එළඹේ. ඒ විත්තිකරු සැබවින්ම වරදකරුද යන්න පිළිබඳවය.

ශ්‍රී ලාංකීය සාක්ෂි ආඥා පනතට අනුව, යම් තොරතුරක් ඔප්පු කිරීමේදී, එය ඉදිරියේ ඇති කරුණු සලකා බැලූ විට, ඒවා ඉවත් කළ යුතු ද නැතිනම් පැවැත්ම ඇත්තේ අපේක්ෂිත නඩුවේදී වාතාවරනය අනුව හැකිද යන්න පිළිබඳව සලකා බැලිය යුතු අතරම එහි පැවැත්ම අනුව කටයුතු කළ යුතුව තිබේ. (සාක්ෂි ආඥා පනත 1 වන පරිච්ඡේදය)

පුද්ගලයකුගේ වරදකාරීත්වය පිළිබඳව සාධාරණ සැකයක් ඇති විට එය සලකා බැලීමෙන් සහ සන්සන්දනය කිරීමෙන් පසුවද තවද සියලු සාක්ෂි වල බර මත කිසිවකු ඉවත්ව යාම සිදු නොකළ යුතුය. ඒ චූදිතට එල්ල වන්නාවූ චෝදනාවේ සත්‍යය පිළිබඳව දඬුවම් දීමේදී අනුබල දීමක් වේ. තවද චූදිතට එරෙහි සියලු චෝදනාවල ඵලයන් ඔප්පු කළ යුතුය.

සාධාරණ සැකයෙන් ඔබ්බට යන්න පිළිබඳ තේරුම හොඳින් අවබෝධ කර ගැනීමෙහිලා අධිකරණය අදාළ කළ යුතු තවත් ස්ථාවරයන් දෙකක් ඇත. ඒ සාක්ෂි අධිභාරය හෝ/සහ පැහැදිළි සහ ඔප්පු කිරීමේ සාක්ෂිය;

- සාක්ෂි අධිභාරය :- මෙයින් තේරුම් යන්නේ සාක්ෂිවලින් 50% ක් සහ සාක්ෂිවල බර අනුව විනිසුරුවරයා හෝ ජූරිය සිතන විට යමක් සිදු නොවූවාට වඩා සිදුවන විට ඔවුන් එම තොරතුරු සත්‍යය බව සොයා ගැනීමට පුළුවන;
- පැහැදිළි සහ ඒත්තු ගැන්වීමේ සාක්ෂි; මෙය අධිභාරයට වඩා වැඩි දෙයකි. තවද යමෙකු විසින් යමක් සිදුවීම හෝ සිදුනොවීම පිළිබඳ 75% ක ප්‍රතිශතයක අවස්ථාව ඇත.
- සාධාරණ සැකයෙන් ඔබ්බට යන්න ඉහළ ප්‍රමිතියකි. එය ලෝකයේ වඩාත්ම සුලභ වඩාත්ම අපරාධ නීති ක්‍රියාදාමයන් වේ. අපරාධ නඩුවකදී අභිප්‍රායන් වඩාත් ඉහළ නිසා විත්තිකරු වරදක් කළ බවට ඔප්පු කිරීම ප්‍රමාණවත් නැත. එයට වඩා චෝදනාව මෙහෙයවන නීතිඥවරයා අනිවාර්යෙන් ඔප්පු කළ යුතු දෙයක් තිබේ. ඒ නඩුවේ සෑම කරුණක්ම (සහ චෝදනාව) සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීම වේ.

<u>චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව අවසානයේදී නිදහස් කිරීම පිළිබඳව අධිකරණයේ ඉල්ලීම.</u>

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 220 වන ඡේදය පහත ආකාරයට තීරණය කරනු ලැබේ.

චෝදක පක්ෂයේ සාක්ෂිකරුවන් විභාග කරනු ලැබීමෙන් පසු අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

220 (1) චෝදක පක්ෂය වෙනුවෙන් නඩුවේ කරුණු ඉදිරිපත් කිරීම අවසන් වූ විට, චූදිතයා, වරද සිදුකළ බවට සාක්ෂි නොමැතියි විනිසුරුවරයා සලකන්නේ නම් "වරදකරු නොවේය" යන තීරණයක් දෙන ලෙසට ඔහු ජූරි සභාව මෙහෙය විය යුතුය.

චූදිතයා වරද සිදුකළ බවට සාක්ෂි ඇතැයි විනිශ්චයකාරවරයා සලකන්නේ නම්, විනිශ්චයකාරවරයා විසින්, චූදිතයා සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ දැයි ඔහුගෙන් හෝ ඔහුගේ උත්තරවාදියාගෙන් ඇසිය යුතුය.

(3) සාක්ෂි ඉදිරිපත් කිරීමට තමා අදහස් නොකරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා හෝ ප්‍රකාශ කරතහොත්, චූදිතයාට විරුද්ධව ඇති සාක්ෂි සම්පිණ්ඩනය කොට දැක්වීමේ කාර්යය සඳහා ස්වකීය නඩුව සනාථ කරනු පිණිස චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් දෙවන වරටත් ජූරි සභාව අමතනු ලැබිය හැකිය.

නඩුව විභාග කරන විනිසුරුවරයාට තමාගේ කැමැත්ත පරිදි කටයුතු කිරීමට ප්‍රමුඛ අභිමතයක් ලබාදේ. ඒ ඉහත වගන්තිය මගිනි. ඒ අනුව ඔහුට වරදකරු නොකිරීමේ තීන්දුවකට එළඹෙන ලෙස ජූරියට නියෝග කළ හැක. තවද එය චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව ඉදිරිපත් කිරීමෙන් පසුව සිදුවිය යුතුය.

220 (1) වගන්තිය විත්තියට වැදගත් වේ. එය නීතිඥවරයා අධිකරණයට ඉල්ලීමක් කිරීමට අවස්ථාව උදකර දෙයි. (එනම් නීතිඥවරයාගේ අදහස චූදිත වරද කළ බවට කිසිදු සාක්ෂියක් නොමැති විට) සාක්ෂි නොමැති වීම නිසා එලදයී ලෙස නඩුව නිදහස් කිරීම සහ ජූරියට වරදකරු නොවන බවට වන ප්‍රකාශයක් ලබාදීමට නියෝග කරනු ලැබේ. 220 (2) සහ 220 (3) යන වගන්තීන් වල පළමුවෙන්ම ආරම්භ කළ ආකාරයට අදාළ ක්‍රියාදාමයට මෝෂමක් මගින් ඉදිරිපත් කළ හැක.

නීතිඥවරයාට 220 (1) වගන්තිය ඉතා ප්‍රයෝජනවත් උපකාරකයක් වේ. ඒ සේවාදයකයාට එරෙහි නඩුවෙන් නිදහස්වීම ඉතා කෙටි කාලයකින් සිදුවන නිසා පමණක් නොව (සාර්ථක වුවහොත්) ඊට සමානව චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව පිළිබඳව දුර්වලතා තර්ක කිරීම (විනිසුරුවරයා සාක්ෂි ඇතැයි සලකා බැලුවහොත් සහ චූදිත උත්තර දිය යුතු නඩුවක් ඇතොත්) අදළ ක්‍රියාදාමයේ මුල් අවස්ථාවල සිදකළ යුතු වේ. ඉන්පසුව එය විනිසුරුවරයාට සහ ජූරියට ඉස්මතු කර දැක්විය යුතුය. අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සඳහන් 220 (1) වන වගන්තිය, 153 (1) වන වගන්තියට සමාන වේ. මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනාව මෙහෙයවන නීතිඥවරයා නඩුව අසන විට 153 (1) වන වගන්තියේ සඳහන් සමාන ක්‍රියාදාමය සඳහා මෙහිදී ද ඉඩ සැලසේ. තවද 220 (1) වන වගන්තිය මහාධිකරණයේ ජූරි සභාවක් සම්බන්ධයෙන් ද අදළ වේ.

<u>ගුණවර්ධන එරෙහිව ශ්‍රී ලංකා ජනරජය මහාධිකරණය ගම්පහ - 28/78 ශ්‍රී ලංකා නීති වාර්තා 316.</u>

චූදිතට එරෙහිව නඩුවක් පවත්වාගෙන යාම ප්‍රමාණවත් සාක්ෂි නොමැති විට, ඔහු විසින් පැහැදිළි කිරීමක් ලබාදීම අවශ්‍ය නොවේ. ඔප්පු කිරීමේ එකම භාරය චෝදනාව මෙහෙයවන නීතිඥවරයා වෙත පවතින අතර ඔහු චූදිතගේ වරදකාරීත්වය ඔප්පු කළ යුතුය. මෙහිදී චූදිතට නිර්දෝශීභාවයේ පූර්ව නිගමනය මත රැඳී සිටීමට ආරක්ෂාකාරී විවෘත අවස්ථාවක් පවතී. ඒ චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ පූර්ව නිගමනය මත රැඳී සිටීමට නීතිඥවරයාගේ සාක්ෂිවල දුබලතාවය සහ චූදිතට චෝදනාව මෙහෙයවන නීතිඥවරයාට ඔප්පු කිරීමේදී සහය වීමෙහිලා වගකීමක් නැත යන කරුණු මත වේ.

නීති වෘත්තියේ යෙදෙන්නා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 186 වන වගන්තිය සැලකිල්ලට ගත යුතුය. එයින් මහේස්ත්‍රාත්වරයා තම චූදිතව තමාගේ කැමැත්ත පරිදි නඩු ක්‍රියාදාමයේදී ඕනෑම අවස්ථාවකදී නිදහස් කිරීමට බලය ඇත. එම වගන්තිය පහත පරිදි තීරණය කර තිබේ.

186 . මෙහි මින් පෙර ඇතුළත් කිසිවකින් නඩුවේ යම් කලින් අවස්ථාවක චූදිතයා නිදහස් කිරීමෙන් මහේස්ත්‍රාත්වරයා වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු නමුත් එසේ නිදහස් කිරීමට හේතු මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතුය;

එසේ වුවද නඩුව සම්බන්ධයෙන් වැඩිදුර නඩු කටයුතු පවත්වාගෙන යාමෙන් චූදිතයා වරදකරු කිරීමේ ප්‍රතිඵලය ඇති නොවන බවට තමා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් චූදිතයා නිදෙස් කරනු ලැබිය යුතුය.

10. සාක්ෂ්‍ය රීතිය

10.1. සාමාන්‍ය

විත්තියේ නීතිඥවරයා සාක්ෂ්‍ය රීතිය සමග සම්පූර්ණයෙන් සාකච්ඡා කර තිබිය යුතුය. වැඩි හරියක් අපරාධ නඩු වලදී තොරතුරු මත සහ එම තොරතුරු වලින් උකහා ගන්නා මැදිහත්වීම්වලදී ඇති වැදගත්කම නීතිමය කරුණු වලට වඩා වැඩිය. එමෙන්ම තොරතුරුවලට ප්‍රධාන වැදගත්කමක් තිබේ. සාක්ෂ්‍ය රීතියට ප්‍රාථමික වැදගත්කමක් ලෙස තොරතුරු පිළිගැනීමේදී එවැනි දේට අවධානය යොමු කිරීම කුමන පුද්ගලයන් ප්‍රකාශ දීමේදී දක්වන්නාවූ දක්ෂතාවය තොරතුරු ඔප්පු කිරීම, පාපොච්ඡාරණය අදාළවීම සහ යනාදිය වේ.

ශ්‍රී ලංකාව තුළ සාක්ෂි රීතිය විශේෂයෙන් අපරාධ කාර්යය පටිපාටියට අදාළ වේ. එය ශ්‍රී ලංකා සාක්ෂි ආඥා පනතේ දක්වා ඇත. ශ්‍රී ලංකාව තුළ සිටින නීති වෘත්තිකයන් ආඥා පනතේ 100 වන වගන්තිය  සැලකිල්ලට ගත යුතු අතර එහි පහත ආකාරයට සඳහන්ව තිබේ;

100. මේ ආඥා පනත මගින් හෝ මේ දිවයිනෙහි වලංගු අන් කිසි නීතියක් මගින් විධි විධාන නොයොදා ඇති සාක්ෂි පිළිබඳ ප්‍රශ්නයක් නීති කෘත්‍යයකදී මතුවන ඕනෑම විටෙක, එබඳු ප්‍රශ්නයක් තත් කාලයේ බල පවත්නා සාක්ෂි පිළිබඳ ඉංග්‍රීසි නීතිය අනුව නිශ්චය කළ යුතුය.

මෙම වගන්තියේ සාරාංශ කොට දක්වා ඇත්තේ සාක්ෂි පිළිබඳ ප්‍රධාන රීතීන් වන අතර අපරාධ නඩු වලදී නීතිඥවරයා තම සේවාදයකයන් වෙනුවෙන් පෙනී සිටීමේදී දක්වන්නා වූ සහයෝගයකි. මෙම රීතින් පළමුව විස්තර කරන දෙයක් ඇත. ඒ ඒවා අධිකරණවලදී යොදා ගන්නා ආකාරය පිළිබඳවය. එමගින් ඔවුන් පරීක්ෂා කරන්නේ විවිධ අපරාධ වලට චෝදනා ලැබ ඇති පුද්ගලයන්ට සහනයක් වන ආකාරයට ඒවා යොදා ගනු ලබන දෘෂ්ටි කෝණයෙන් වේ.

(10.2) අනුසන්දන සාක්ෂි.

යම් තොරතුරක් හෝ සහතිකයක් යම් අතිරේක තොරතුරක් මගින් අදාළ අයිතමයන් සත්‍යයතාව පිළිබඳ ස්ථිර කරන විට අනුසන්දන සාක්ෂි එහි විශ්වසනීයත්වයට සහය පළ කිරීම මෙන්ම විශාල කිරීම්ද සිදුකරනු ලබයි. යම් සාක්ෂිකරුගේ ප්‍රකාශයක් උදාහරණයකට ආසන්න සාක්ෂි වන විටදී පසුව සිදුකරන සාක්ෂි වෙතොත් (එනම් මරණ පරීක්ෂණ වාර්තාවක් හෝ වෙනත් සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ වැනි) එමගින් එය සත්‍යය බවට පත් කරයි.

අනුසන්දන සාක්ෂියක් යනු දැනටමත් සකස් කර ඇති නැතිනම් සහය පල කරන්නා වූ ආරම්භක සාක්ෂියක් මගින් සත්‍යය ප්‍රස්තුතයක් ස්ථිර කරන ප්‍රස්තුතයකට සහය පල කරන සාක්ෂියක් වේ. උදාහරණයකට, Z සාක්ෂිකරුවෙකි. ඇය W තමාගේ මෝටර් රථය කොල පාට මෝටර් රථයක් වෙත පදවනු දැක තිබෙන බවට සාක්ෂි දෙයි. මෙ අතරතුර Y නම් තවත් සාක්ෂිකරුවකු මෙසේ සාක්ෂි දෙයි. එනම් ඔහු W ගේ මෝටර් රථය එම දිනයේම පසු අවස්ථාවක දැක ඇති අතර එහි ගැටීම් වලක්වනය කොල පාටින් දිස්වූ බව නිරීක්ෂණය කර ඇත.

යම් යම් වර්ගවල සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ප්‍රමාණවත් නොවීම, තනිව පැවතීම නිසා එම තොරතුරු ඔප්පු කිරීමෙහිලා දිවුරුම් පිට සාක්ෂි දීම අවශ්‍යය වේ. එවැනි සාක්ෂිකරුවන්

උදාහරණයකට තරුණ ළමයින් සහ ලිංගික කටයුතු සබන්ධ නඩු වලදී එහි පැමිණිලිකරුවන් අදාළ වන අතරම අනිවාර්යයෙන් සාක්ෂි අනුසන්දනය සිදු කෙරේ.

යම් තොරතුරක් හෝ තොරතුරු අනුසන්දනය වන විට ඒවා සාක්ෂිමය වශයෙන් වඩාත් වැඩි ද්‍රව්‍යයමය දේවල් වේ. වැදගත් නොවන තොරතුරු අනුසන්දනය කිරීම රජයේ නඩුව ශක්තිමත් කිරීමට සාමාන්‍යයෙන් උදව් නොවේ.

රජයේ ආකල්පය අනුව අපරාධයකට හසු කර ගැනීමේදී අනුසන්සන්දන සාක්ෂි වැදගත් වේ. නමුත් මෙයින් තේරුම් යන්නේ වරද සිදුකිරීමේදී චූදිතව එම අපරාධයට හසු කිරීමේදී අදාල සාක්ෂි යන්නය. තවත් සාක්ෂිකරුවෙකු හෝ නැතිනම් චූදිතගේ සාක්ෂිවලින් සාක්ෂි අනුසන්දනය ඇති වේ. චූදිතගේ පාපොච්ඡාරණය අනුසන්දන සාක්ෂි ලෙස යොදාගත හැකිය. යම් නිශ්චිත වාතාවරණයක් යටතේ චූදිත සාක්ෂි දීමට අපොහොසත් වන විට වෙනත් සාක්ෂි මගින් සාක්ෂි අනුසන්දනය සිදු කෙරේ.

(10.3) ප්‍රවාදක සාක්ෂි.

ප්‍රවාදක සාක්ෂි යනු ප්‍රකාශයක් වන අතර සාක්ෂිකරු දැකපු; ඇසුව හෝ වෙනත් ආකාරයකට නිරීක්ෂණය කළ දෙයක් නොවන නමුත් විමර්ශනය යටතේ පවත්නා විට අනෙක් අය යම් කරුණක් සම්බන්ධයෙන් කියපු දෙයක් ඇසීමට හැකි වූ දෙයකි. සාමාන්‍යයෙන් මෙය ශ්‍රී ලංකාව තුළ පිළිගන්නේ නැත.

සාක්ෂි ආඥා පනතේ 60 වන වගන්තිය පැහැදිළිව ප්‍රකාශ කරන දෙයක් තිබේ. ඒ වාචික සාක්ෂිවල දිශානතියයි. සාක්ෂි ආඥා පනතේ ප්‍රවාදක සාක්ෂි අධිකරණ ක්‍රියාදමය තුළ අදාළ කර නොගන්නා බවට පෙන්නුම් කරන ප්‍රකාශන නැත. නමුත් ව්‍යතිරේක ලෙස ප්‍රවාදක සාක්ෂි ආඥා පනත යටතේ එන එක සිද්ධිකරණය ( 6 වන  වගන්තිය යටතේ පිළිගත්) සහ පොදු චේතනාව (10 වන වග්නතිය යටතේ පිළිගත් සහ 17 වන වගන්තියේ සිට 39 වන වගන්තිය දක්වා සඳහන් කර ඇති සමහරක් ව්‍යතිරේක අවස්ථාවන් වේ.

ප්‍රවාදක සාක්ෂි වලට ඉඩ ලබා නොදීමට හේතුවක් ඇත. සාමාන්‍ය තත්ත්වය වන්නේ තරඟකාරීත්වය හා තොරතුරු මත එය හොඳම සාක්ෂිය නොවීමය. (හොඳම සාක්ෂිය රීතිය යටතේ සැලකූ විට සත්‍යය පරීක්ෂකයාට සාක්ෂි දීමට අවස්ථාව නොදෙන අතර එම නිසා එවැනි සාක්ෂියක් පිළිබඳ විශ්වසනීයත්වය, හරස් ප්‍රශ්න ඇසීම හරහා පරීක්ෂා කළ යුතු නැත.) තවත් අනතුරක් ඇත. එනම් සත්‍යය සොයා නිරීක්ෂකයා කියන්නා වූ දෙවන වාර්තාව විකෘති සහ වැරදි විය හැක.

රාජාධිකරණ නඩුවක් වූ සුබ්‍රමනියම් එරෙහිව රජයේ නඩු පවරන්නා (1956) WLR 965 නඩුවේ තීන්දුවේදී පහත කරුණු හඳුන්වාදෙන ලදි. විනිසුරුවරයාට සාක්ෂි ප්‍රවාදකද නැද්ද යන්න පිළිබඳ යාන්ත්‍රනය ලබා දී ඇත. ඒ සාක්ෂියේ අරමුණ ප්‍රකාශයේ ඇතුළත් දෙය අනුව සත්‍යය ස්ථාපිත කිරීමේදී වේ. (ප්‍රවාදක සහ අදාළ නොවන විටදීය) තවද සාක්ෂි මගින් එය ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ. එය ප්‍රකාශයේ සත්‍යතාව මත නොවන නමුත් තොරතුරු මත සිදුවිය.

ලේඛනමය සාක්ෂි.

ලේඛන වල අන්තර්ගතය ප්‍රාථමික හෝ ද්වීතීයික සාක්ෂි මගින් ඔප්පු කරනු ලැබේ. (සාක්ෂි ආඥා පනත, 61 වන වගන්තිය) ප්‍රාථමික සාක්ෂි යන්නෙහි තේරුම අදාළ ලේඛනය අධිකරණයේ පරීක්ෂාවට භාජනය කිරීමය.

(සාක්ෂි ආඥා පනත 62 වන වගන්තිය) ද්වීතීයික තේරුම සාක්ෂි වල තේරුම සහ එයට අන්තර්ගත වන දේ.

- මින්පසු අන්තර්ගත කරන ප්‍රතිපාදන යටතේ සහතික පිටපත් ලබාදීම.
- යාන්ත්‍රික ක්‍රියාදමයක් මගින් සත්‍ය පිටපත්වල පිටපත් වශයෙන් අදාළ පිටපත්වල නිරවද්‍යතාවය සහ එම පිටපත් සමග සංසන්දනය කරනු ලබන පිටපත් වල සහතික කිරීම වේ.
- සත්‍ය පිටපත් සමග අදාළ පිටපත් සෑදීම හෝ සංසන්දනය කිරීම.
- ලේඛන වල පිටපත් එවා ක්‍රියාත්මක නොකරන අයට විරුද්ධව යෙදීම සහ
- ලේඛනයක අන්තර්ගතය පිළිබඳ වාචිකව හේතු දැක්වීම යම් පුද්ගලයකු සිදුකළ යුතු අතර ඔහු විසින්ම එය දැක තිබිය යුතුය.

සාමාන්‍යයෙන් ලේඛන ප්‍රාථමික සාක්ෂි මගින් ඔප්පු කළ යුතුය. (සාක්ෂි ආඥා පනත 64 වන වගන්තිය)

මෙම සාමාන්‍ය ඉල්ලුමට අදාළ ව්‍යතිරේක සාක්ෂි ආඥා පනතේ 65 වන වගන්තියේ සඳහන්ව ඇත;

65. පහත දැක්වෙන අවස්ථාවන්හි ලේඛනයක පැවැත්ම, තත්ත්වය හෝ අන්තර්ගත කරුණු පිළිබඳ ද්විතියික සාක්ෂි දිය හැකිය.

i. ලේඛනය යමකුට විරුද්ධව ඔප්පු කිරීමට බලාපොරොත්තු වනු ලැබුවේද එම තැනැත්තාගේ හෝ
ii. අධිකරණයේ කැඳවීම් නියෝගයක් බලපවත්වන ප්‍රදේශයේ සිටින හෝ එවැන්නකට යටත් නොවන යම් තැනැත්තකුගේ.
iii. මුල් පිටපත ඉදිරිපත් කරන ලෙස නීත්‍යානුකූලව බැඳී සිටින යම් තැනැත්තකුගේ ස්වාමිත්වය හෝ බලයේ මුල් පිටපත තිබේ යයි පෙන්වා දුන් කල හෝ පෙනෙන කල, සහ 66 වෙනි වගන්තියේ සඳහන් දැන්වීමෙන් පසුව එබඳු තැනැත්තකු එය ඉදිරිපත් නොකරන කල

(2) ලේඛනය යමකුට විරුද්ධව ඔප්පු කිරීමට බලාපොරොත්තු වනු ලැබේ.

එහි පැවැත්ම, තත්ත්වය හෝ අන්තර්ගත කරුණු එකී තැනැත්තා විසින් හෝ ඔහුගේ සම්බන්ධතාව නියෝජනය කරන තැනැත්තා විසින් ලියවිල්ලකින් ඒත්තු ගත් බැව් ඔප්පු වී ඇති කල;

(3) මුල් පිටපත විනාශ කරනු ලැබූ කල හෝ නැතිවී ඇති කල හෝ එකී අතිරේක කරුණු පිළිබඳ සාක්ෂි දීමට ඉදිරිපත් වන තැනැත්තාට වැරදීමෙන් හෝ නොසැලකිල්ලෙන් උද්ගත නොවන අන්කිසි හේතුවක් නිසා එය සෑහෙන කාලයකදී ඉදිරිපත් කිරීමට නුපුළුවන් කල;

(4) මුල් පිටපත පහසුවෙන් සෙලවිය නොහැකි අන්දමේ ස්වභාවයෙන් යුක්ත වන කල;

(5) මුල් පිටපත, 74 වන වගන්තියේ අර්ථය ඇතුළත ප්‍රසිද්ධ ලේඛනයක් වන කල;

(6) මුල් පිටපත, සහතික කළ පිටපතක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබීමට මේ ආඥා පනත මගින් හෝ මේ දිවයිනේ වලංගු අන්කිසි නීතියක් මගින් අවසර දෙනු ලැබෙන ලේඛනයක් වන කල;

(7) මුල් පිටපත්, අධිකරණයේදී පහසුවෙන් පරීක්ෂා කළ නොහැකි නොයෙක් විස්තරවලින් හෝ වෙනත් ලේඛනවලින් යුක්ත වන කල, සහ ඔප්පු කළ යුතු කරුණු සම්පූර්ණ ලිපි ලේඛන රාශියක්ම ප්‍රතිඵලය වන කල;

1,2, හා 4 වන වගන්තිවල දැක්වෙන ආකාරයට ලේඛනයේ අන්තර්ගත යම් ද්විතියික සාක්ෂි ඇතොත් ඒවා පිළිගනු ලැබේ. 2 වන උප වගන්තියට අනුව ලිඛිත දේශන පිළිගනී. 5 සහ 6 වැනි

උප වගන්තිවල දැක්වෙන ආකාරයට අදළ ලේඛනයේ සහතික පිටපතක් නමුත් ද්වීතියික සාක්ෂි නොමැතිව පිළිගනු ලැබේ. 7 වන උපවගන්තියට අනුව එහි අරමුණු උදෙසා ඕනෑම පුද්ගලයකු ලේඛන වල සාමාන්‍ය ප්‍රතිඵලය උදෙසා ඒවා ඔහුට පරීක්ෂා කළ හැකි වන අවස්ථාවක සහ එවැනි ලේඛන පරීක්ෂා කිරීමට ඔහුට හැකියාව ඇති විට ඒ පිළිබඳව සාක්ෂි දිය හැක.

66 වන වගන්තියේ අන්තර්ගත දැන්වීම පිළිබඳ රීතීන් 65 වන වගන්තියේ දක්වා ඇත.

යම් ලේඛනයක් යම් කෙනෙකු විසින් අත්සන් කරන ලදැයි හෝ සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ලියන ලදැයි කියනු ලැබේ නම්, ලේඛනයේ එකී තැනැත්තාගේ අත් අකුරින් ලියවී ඇතැයි කියනු ලබන ප්‍රමාණය හා අත්සන ඔහුගේ අත්අකුරින් ලියැවී ඇතැයි සත්‍ය භාවය ඔප්පු කළ යුතු වේ. (සාක්ෂි ආඥා පනත, 67 වන වගන්තිය)

යම් ලේඛනයක් සහතික කිරීම නීති මගින් අවශ්‍ය වුවහොත් අධිකරණයේ කැඳවීම් නියෝගයකට යටත් වන්නා වූද සාක්ෂි දීමට පුළුවන් වූද සහතික කරන සාක්ෂිකරුවෙක් ජීවත්ව සිටී නම් එය ලියා අත්සන් කරන ලද බව සත්‍යය බැව් ඔප්පු කිරීම ගැන යටත් පිරිසෙන් සහතික කරන එක් සාක්ෂිකරුවකු කැඳවනු ලබන තෙක් එම ලේඛනය සාක්ෂි වශයෙන් පාවිච්චි කළ යුතු නොවේ.

(සාක්ෂි ආඥා පනත 68 වන වගන්තිය)

එබඳු සහතික කරන සාක්ෂිකරුවකු සොයාගත නොහැකි නම් හෝ ලේඛනය මහා බ්‍රිතාන්‍යයේ සහ උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානියෙහි ද ලියා අත්සන් කරනු ලැබී යයි අදහස් වේ නම්, යටත් පිරිසෙන් සහතික කරන එක සාක්ෂිකරුවෙකුගේවත් සහතික කිරීම ඔහුගේ අත්අකුරින් ඇතැයි ද ලේඛනය ලියා අත්සන් කරන ලද තැනැත්තාගේ අත්සන ඔහුගේම අත් අකුරින් ඇතැයි ද යන වග සත්‍ය බැව් ඔප්පු කළ යුතුය. (සාක්ෂි ආඥා පනත 69 වන වගන්තිය)

සහතික කරන ලද ලේඛනයක් තමා ලියා අත්සන කළ බැව් පාර්ශවකරුවකු විසින් ඒත්තු ගැනීම, එය සහතික කළ යුතු යැයි නීති මගින් අවශ්‍යව ඇති නමුදු එය ලියා අත්සන් කරන ලද බව ඔහුට විරුද්ධව සෑහෙන සාධක විය යුතුය. (සාක්ෂි ආඥා පනත 70 වන වගන්තිය)

සහතික කරන සාක්ෂිකරු ලේඛනය ලියා අත්සන් කරන ලද බැව් හෝ පිළිගන්නේ නම් හෝ සිහිපත් නොකරන්නේ නම්, එය ලියා අත්සන් කරන ලද බව වෙනත් සාක්ෂි වලින් සත්‍යය බැව් ඔප්පු කළ හැකිය. (සාක්ෂි ආඥා පනත 71 වන වගන්තිය)

<u>(10.05) පරිවේෂණීය සාක්ෂි.</u>

පරිවේෂණීය සාක්ෂියක් යනු යම් තොරතුරක් අවසන් කිරීම සම්බන්ධයෙන් අනුමාන කරන සාක්ෂියක් මත සම්බන්ධ වුවකි. එය ජූරියට අපරාධ ස්ථානයේ ඇඟිලි සලකුණු ගැනීමකට සමාන වේ. මෙයට වෙනස්ව සෘජු සාක්ෂි, සෘජුවම සිදුකරන්නාවූ සත්‍යයට සහය වනු ලැබේ. ඒ සඳහා අතිරේක සාක්ෂි හෝ අනුමාන කිරීම් අවශ්‍ය නොවේ.

විශේෂිත ක්‍රියාවක් හෝ යම් කටයුතු සම්බන්ධයෙන් වූ සෘජු සාක්ෂි නොපවතින විට යමෙක් ස්ථිරව හෝ නිරන්තරයෙන් අනිවාර්ය ලෙස අනුමාන කළ යුතුය.

<u>ගුණවර්ධන එරෙහිව ශ්‍රී ලංකා ජනරජය (මහාධිකරණය ගම්පහ) 28/78 ශ්‍රී ලංකා නීති වාර්තා පිටුව 315</u> හා අදල කරුණ සම්බන්ධයෙන් පහත ආකාරයට තීරණය විය. යම් නඩුවක් පරිවේෂණීය සාක්ෂි මත රැඳී සිටින විට විනිසුරුවරයා සාමාන්‍ය නියෝගය දීමට අතිරේකව චෝදනාව මෙහෙයවන නීතිඥවරයා නඩුව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුතු අතරම අනිවාර්යයෙන් වැඩිදුරටත් නියෝගයක් දිය යුතුව ඇත. එහිදී ප්‍රකාශ වන්නේ ඔවුන් පරිවේෂණීය සාක්ෂි මත අනිවාර්ය ලෙස වරදකරු නොකළ යුතු බවය. නමුත් තොරතුරු ඔප්පු වූ බවට සෑහීමකට පත්වන අවස්ථාවක සහ එය චූදිතගේ වරදකාරීත්වය සමග ගැළපෙන විට චූදිතගේ

වරදකාරීත්වය සම්බන්ධයෙන් හැර විය හැකි සියලු විස්තරයක් හෝ දැක්විය යුතුය. එයට සෘජු නොවන තේරුම් ඇති අතරම යම් තොරතුරු ස්ථාපිත කිරීමෙහිලා සාක්ෂි අවශ්‍ය වේ.

සක්ෂිකරුවෙකුගෙන් ලබාගන්නා සෘජු සාක්ෂි හරස් ප්‍රශ්න ඇසීමට විවෘත වූ ද සිට එය නැවත පරීක්ෂණයට සහ නැවත එක් කිරීමෙහිලා දුර්වල වූ විට පරිවේෂණීය සාක්ෂි තරඟකාරී බවෙන් අඩු වීම සහ වඩාත් පහසුවෙන් රැඳී සිටිය හැක. චූදිතයකු වරදකරු කිරීම පරිවේෂණීය සාක්ෂි මත යැපෙන විටදී පහත දේ සිද්ධ වේ. ස්ථාපිත සියලු තොරතුරු වලින් අනුමාන කිරීම් කැඳවන විටදී, අනුමාන කිරීම් ඔප්පු කළ තොරතුරු මත සමන්විත වේ. එම තොරතුරු වලින් අනෙකුත් සාධාරණ අනුමාන කිරීම් බැහැර කරන නමුත් ඒවා අවධානයට ගැනීමෙන් ආරක්ෂා කරනු ලැබේ.

එය තවදුරටත් පහත ආකාරයට තීරණය වේ. (ගුණවර්ධන හි අන්තර්ගත කරුණු) පරිවේෂණීය සාක්ෂි අදාලවන නඩුවකදී සාක්ෂිවලදී ලබාදෙන්නා වූ තොරතුරු එක්රැස් කර ගත යුතුව ඇති අතර වැරදි බව ඔප්පු කිරීමට ප්‍රමාණවත් විය යුතුව ඇත. සෑම තොරතුරකම නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය වෙන් වෙන්ව ගතහොත් එය සැකයක් පිළිබඳ කරුණක් වේ.

අධිකරණය/ගුණවර්ධන හිදී අදාළ කරුණ සම්බන්ධයෙන් ගත්විට නැවත නැවත පසක් වන දෙයක් ඇත. ඒ පරිවේෂනීය සාක්ෂි මාලයක සෑම පුරුකක්ම පිළිබඳ සිද්ධියක් නොව එසේ වුවද එක පුරුකක් බිඳ වැටුණු විට සම්පූර්ණ මාලයම කඩා වැටේ. අධිකරණයේ මත වාදයට වඩා පරිවේෂනීය සාක්ෂි ලණුවක් වැනි දෙයක් වන අතර ගැට ගණනාවකින් යුක්තය. එම ලණුව එක තැනකින් ඇදීම බර දරා ගැනීමට ප්‍රමාණවත් නොවන අතර තැන් තුණක් ගැනීම සහ ඒවා එකට ගැනීම යම්තාක් දුරකට ප්‍රමාණවත් වේ.

(10.6) සාක්ෂිකරුගේ ප්‍රකාශය.

(10.6.1.) ළමුන්.

විවිධ අධිකරණ බලයන් වලදී විවිධ නඩු සහ පර්යේෂණවලදී ළමුන් සාක්ෂිකරුවන් ලෙස යොදා ගැනීම ස්ථාපිත කිරීම යහපත් වන විටදී එම ළමුන්ගේ මතකයන් වැඩිහිටියන්ට වඩා අඩුවෙන් මෝරා ඇත. ළමුන් වැඩිහිටියන්ට වඩා යෝජනාවලට විවෘත වේ. ඔවුන්ට වැඩිහිටියන්ට වඩා විශාල අසීරුතාවක් පවතී. ඒ ඔවුන් දන්නා දේ සංනිවේදනය කිරීම සම්බන්ධයෙනි.[24] බොහෝ අධිකරණ බලයක් තුළ ළමා සාක්ෂිකරුවන් හෝ ප්‍රකාශ ගැනීමේදී ඒවාට ඇහුම්කන් දීම සහ සලකා බැලීම සම්බන්ධයෙන් ආරක්ෂාකාරී රීතියක් සංවර්ධනයට සහ ඉල්ලුම් කිරීමට යොදගත හැක.

ශ්‍රී ලංකා සාක්ෂි ආඥා පනතේ 118 වන වගන්තියේ පහත ආකාරයට තීරණය කෙරේ. "සියලු තැනැත්තන්, ලාබාල වයස, අධික මහලු වයස, ශාරීරික හෝ මානසික ආබාධ හෝ එම වර්ගයේ අන්කිසි හේතුවක් නිසා තමන්ගෙන් අසනු ලබන ප්‍රශ්න අවබෝධ කර ගැනීමට එකී ප්‍රශ්නවලට කල්පනාවෙන් පිළිතුරු සැපයීමට ද නොහැකි යයි අධිකරණය කල්පනා කරතහොත් මිස හෝ එසේම සාක්ෂි දීමට සුදුස්සන් විය යුතුය."

සෑම නඩුවක්ම එහි කුසලතාවයන් මත සලකා බැලීම/අනිවාර්යය විය යුතුව තිබේ. යම් නඩුවක නිරතුරුවම ළමයකුගේ ප්‍රකාශය එකම ප්‍රකාශය වන අවස්ථා ඇත. එය ළමයා සාක්ෂිකරුවකු වීම යන සරල කරුණ මත නොසලකා හැරීමට පුළුවන්කමක් නැත. (හෝ අඩු සාක්ෂිමය බරක් ඇති) අධිකරණයේ සොයා ගැනීම නම් ළමා සාක්ෂිකරු, වැඩිහිටියකු මෙන්ම විශ්වසනීය සාක්ෂිකරුවකු බවය.

---

[24] ".Judicial Assessment of the credibility of child witnesses us National Library of Medicine , National Institute of Health , April 2005, http://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC 4640896

ළමයකුගේ ප්‍රකාශයට අවධානය යොමු කිරීමේදී වඩාත් සමබර වේ. එය අනෙකුත් සංවරණ හා තුලනයන්ට වඩා වැඩිය.

සහතික කිරීමද සාක්ෂිමය රීතීන්ට අදාළ වේ. තවද අනුකූලතා/ අනුකූල නොවන දේ, අවේනික සම්භාවිතාවන් විශ්වසනීයත්වය සහ පවතින සාක්ෂි පිළිබඳ ශක්තිමත් බවද මෙයට අදාළ වේ. පවතින සත්‍යයක් ඇත. සාමාන්‍ය සිද්ධි මාලාවකදී වයස අවුරුදු 06 ක කෙනෙකුට වැඩිහිටියකු හා සමානව තාර්කික ලෙස හැසිරෙතැයි අපේක්ෂා කිරීමට පුළුවන්කමක් නැත. කෙසේ නමුත් ළමයෙකුගේ තරුණ වයස එම ළමයාගේ විශ්වසනීයත්වය සහ ඇදහිය හැකි සාක්ෂිකරුවකු ලෙස කටයුතු කළ නොහැකි යයි තීරණය කිරීමට නොහැක.

තවද එක් වරක්වත් අදාළ වන සැම කරුණක්ම එහි දක්ෂතාවය සහ ළමයාගේ මානසික සංවර්ධනය, සහ මේරූ බව වඩාත් ප්‍රවේශමෙන් ගණනය කළ යුතුය. එය ඔහුගේ/ඇයගේ ප්‍රකාශය සම්බන්ධයෙන් එහි ප්‍රමාණයට අදාලව තීරණය කිරීමට පෙර සිද්ධ විය යුතුය. මේ ආකාරයෙන් ගත් කළ වඩාත් ප්‍රවේශම් කිරීම අදාළ කළ යුත්තක් ඇත. එනම් සාමාන්‍ය පරීක්ෂණය විවිධ තොරතුරු වලට එනම් බාහිර හැසිරීම, මානසික හැකියාව, සහතික කිරීම් සහ ළමා සාක්ෂිකරුවන් පිළිබඳ හැකියාව යන්න සම්බන්ධයෙන් ද අදාළ වේ.

අධිකරණයට ද වගකීමක් ඇත. ඒ ළමයාට දරාගත නොහැකි ඉක්මවා යන, හෝ ප්‍රකම්පනයට පත් කරන අසාධාරණ ප්‍රශ්න ඇසීම වැළැක්වීම හෝ ළමයාට නොවුමනා දේ සම්බන්ධයෙන් කඩිනම් කිරීමට උත්සාහ කිරීම වේ. ළමයාට ස්වාභාවික ලෙස හා ඉබේ සිදුවන ආකාරයට ප්‍රතිචාරයන් දැක්වීමට ඉඩ ලබාදිය යුතුය. විනිසුරුවරුන්ට ද වගකීමක් ඇත. ඒ ළමුන් ඇතුළු සියලුම සාක්ෂිකරුවන් හෝ ඔවුන්ට වැටහෙන පරිදි උසාවියේදී ප්‍රශ්න කිරීම වේ. මෙයට අර්ථාන්විත ලෙස තේරුම් යන පරිදි පිළිතුරු දීමට ඔවුන් සමබන්ධයෙන් කටයුතු කළ යුතුව තිබේ. කැනඩාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධයෙන් වඩාත් ප්‍රයෝජනවත් මිනුම් දණ්ඩක් ලබා දී ඇත. ඒ R.V.L.(D) හි දීය. එහි මෙම කරුණ නැවත නැවත කියවේ.

එනම් ළමුන් ඇතුළු දුර්වල සාක්ෂිකරුවන් සිටින නඩුවලදී නඩු විභාගය සිදුකරන විනිසුරුවරයා වගකීමෙන් සහතකි කළ යුතු දෙයක් තිබේ. එනම් ළමයා තමාගෙන් අසන ප්‍රශ්න පිළිබඳ අවබෝධයෙන් සිටීම සහ ළමයා දෙනු ලබන සාක්ෂි පැහැදිළි සහ ව්‍යාකූල නොවිය යුතුය යන්න සම්බන්ධයෙනි. මෙම ..... සම්පූර්ණ කිරීමේදී නඩු විභාග කරන විනිසුරුවරයා විසින් පහත ලෙස පැහැදිළි කළ යුතුව ඇත. ඒ නීතිඥවරයා අසන්නා වූ ප්‍රශ්න සම්බන්ධයෙනි. තවද පසුව සිදුවූ කරුණු පිළිබඳව ප්‍රශ්න ළමයාගෙන් ඇසිය යුතුය. ඒ ළමයාගේ ප්‍රතිචාරයන් පැහැදිළි කිරීම උදෙසාය. නඩු විභාගය සුදුසු ලෙස හැසිරවීමෙහිලා ඊට අදළ පිළිවෙල සහතික කිරීමට ළමයාගේ ආතතිය අඩු කොට විවේකීව සහ සන්සුන්ව ළමයාට කටුයතු කිරීමට සුදුසු වාතාවරණයක් සැකසිය යුතුව තිබේ.[25]

චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගේ නඩුව ළමා සාක්ෂිකරුවෙකුගේ සාක්ෂිය මත රඳා පවතින විටදී නීතිඥවරයා ප්‍රවේශමෙන් සාක්ෂිකරුව හරස් ප්‍රශ්න ඇසීමට කටුයතු කළ යුතුව ඇත. ඔහුගේ/ඇයගේ ප්‍රකාශය නුසුදුසු බවට (දෙපාර්ශවය) පත් කිරීමෙහිලාය. (මෙයට උදාහරණයක් ලෙස නඩුව මෙහෙයවන පාර්ශවයේ එකම සාක්ෂිකරු ළමයා වන විටදීය.)

කෙසේ නමුත් ඉහත පෙන්නුම් කළ ආකාරයට නිතිඥවරයාට අවසර නොලැබෙන කටයුත්තක් ද ඇත. එනම් රැකබලා ගත යුතු වයසේ සිටින සාක්ෂිකරුවෙකු හෝ විශේෂ ගුණයක් පිළිබඳව සහ අවේගශීලී ප්‍රශ්න ඇසීම සම්බන්ධයෙනි.

[25] R.V.L. (Do) (1993) 45.C.R. 419 at 471

(10.6.2) අපරාධ සහායකයන්.

අපරාධ සහායකයා යනු අපරාධයක් සිදුවන විට එයට සහභාගී වන මෙන් සහය වන නමුත් අපරාධකරුවන් නොවන අදාළ කරුණට පසුව අපරාධයට සහය වන පුද්ගලයකු වේ.

මේ තත්ත්වය ඉංග්‍රීසි පොදු නීතියේ පහත ආකාරයට සඳහන්ව ඇත. එනම් අපරාධ සහයකයා අපරාධය සිදුවීමේදී ක්‍රියාකාරී ලෙස සහභාගී වන නමුත් සත්‍යය ලෙස අපරාධ වරද සිදු කිරීමෙහිලා සහභාගී නොවන පුද්ගලයකු වේ. උදාහරණයකට බැංකු මංකොල්ලයක දී අදාළ පුද්ගලයාට පිස්තෝලය එල්ල කරන සහ මුදල් ඉල්ලා බල කරන ආයුධ සන්නද්ධ පුද්ගලයා මංකොල්ලයේ වරදකරු වේ. තවද අපරාධය සිදුකිරීමෙහිලා සෘජුවම සහභාගී වන අපරාධ සහායකයන්ය.

එදෙස බලා සිටින හෝ මෝටර් රථ රියදුරු යන අය අපරාධ සහායකයන්ය. බලා සිටින්නා හෝ මෝටර් රථය පැදවීම අවධානයට ලක් නොවන සහ නොපැමිණ සිටින විට එය වරදක් නොවේ.

අපරාධ සහායකයා, වරදට හවුල් වන්නා ගෙන් වෙනස් වේ. සත්‍යය ලෙස අපරාධය සිදුවන විට අපරාධ සහායකයා පෙනී සිටී. නමුත් ප්‍රධාන අපරාධකරු (මූලික) චෝදනා නොලබන විට හෝ වරදකරු නොවන විට දී ඔහුට හෝ ඇයට විරුද්ධව නඩු පැවරිය හැක.

අදාළ අපරාධය සිදුවන අවස්ථාවේදී වරදට හවුල් වන්නා සාමාන්‍යයෙන් පෙනී සිටින්නේ නැත. ඔහුට විෂය වන්නේ අඩු දණ්ඩනයකි. එනම් අපරාධ සහයකයාට හෝ ප්‍රධානියාට වඩා අඩුවෙනි.

ඔවුන් අධිකරණමය භාරය තුළ අධිකරණයට වඩා ප්‍රවේශමෙන් අපරාධ සහයකයෙකුගේ සාක්ෂි වලට අවතීර්ණ වේ. එයට හේතූන් පහත දක්වා ඇත.

- අපරාධ සහායකයා, වරදකරුවකු සහ/හෝ අපරාධ හැසිරීමක දී අපරාධයක ට හසුවෙන දඬුවම් කළ යුතු චරිතයක් හෙබි සත්‍යය සඳහා, ඉහළ සම්බන්ධයක් නැති පුද්ගලයෙකි.
- මෙහි ආවේනික අනතුරක් ඇත. ඒ අපරාධ සහායකයා අධිකරණයට බොරු කීමට කැමති විටදී වෙනත් අයකු චෝදනාවකට හසු කර ඔහු හෝ ඇය (අපරාධ සහායක) නඩු පැවරීමේ වගකීමෙන් මිදීම සහතික කර අඩු දණ්ඩනයක් හෝ අනුකම්පාව හෝ අනෙක් චූදිතයාට එරෙහිව සාක්ෂි දීමෙන්, බලාපොරොත්තු වේ.
- අපරාධ සහායකයකු කැමති වන තවත් දෙයක් ඇත. ඒ එක් පුද්ගලයකු වැරදියට අපරාධයකට හසු කරන අතර එය සිදු කරන්නේ වෙනත් පුද්ගලයකු ආරක්ෂා කර ඔහුගේ/ඇයගේ අපරාධය සිදුකිරීමේ සිය භූමිකාව ආරක්ෂා කිරීමට වේ.

සාක්ෂි ආඥා පනතේ 133 වන වගන්තිය පහත ආකාරයට තීරණය කර ඇත.

"අපරාධ සහායකයකු චෝදනා ලැබ සිටින තැනැත්තාට විරුද්ධව සාක්ෂි දීමට සුදුසු සාක්ෂිකරුවකු විය යුතු අතර, යමකු වරදක් කළ බැව් ඔප්පු වීම, අපරාධ සහායකයන් තහවුරු කළ සාක්ෂියෙන් පැන නැගී ඇති පමණින් නීති විරෝධී නොවේ"

සාක්ෂි ආඥා පනතේ 114 වන වගන්තිය පහත උදාහරණ දක්වා ඇත. ඒවාට අනුව අධිකරණය ස්ථිර තොරතුරු වල පැවැත්ම සම්බන්ධයෙන් ඒවා සත්‍යය බව පවසයි. (මෙම උදාහරණ සාමාන්‍යයෙන් වරදකරු බව ඔප්පු කිරීම විස්තර කර ඇත.)

114 වන වගන්තියට අනුව "විශේෂ අවස්ථාවේ කරුණු හා සම්බන්ධ ස්වාභාවික සිදුවීම් වල සාමාන්‍ය පිළිවෙලද, මිනිස් ගති පැවතුම් හා පුද්ගලික වැඩ කටයුතුද ගැන සැලකිල්ලක් දක්වමින් සිදුවීමට ඉඩ ඇතැයි අධිකරණය සිතන කරුණක පැවැත්ම අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකිය"

අනෙකුත් අධිකරණ බලයන්ට අනුව එක් චූදිතයකුගේ (අපරාධ සහායක) පාපොච්ඡාරණයක අන්තර්ගතය තවත් චූදිතයකුට විරුද්ධව සාක්ෂියක් ලෙස යොද ගත නොහැක. සාක්ෂි ආඥා පනතේ 30 වන වගන්තියේ මෙසේ සඳහන් කර ඇත."එකම වරදක් කිරීම ගැන එක්කෙනෙකුට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට විරුද්ධව සාමූහික නඩු පැවරීමේදී තමාට සහ එවැනි තැනැත්තන් අතුරින් අන් කිසිවකුටත් බලපාන අන්දමේ වරද කියා පෑමක් ඒ තැනැත්තාගෙන් කෙනෙකු විසින් කර තිබෙන බව සත්‍ය බැව් ඔප්පු වූ විට, ඒ අන්‍ය තැනැත්තාට විරුද්ධව ඒ වරද කියාපෑම අධිකරණය විසින් සලකා බැලිය යුතු නොවේ."

(10.6.3) විශේෂඥ සාක්ෂි.

සාක්ෂි නීතියට ඇතුළත් සාමාන්‍ය රීතියක් වන්නේ යම් මතයක් ලෙස ප්‍රකාශයක් බැහැර කිරීම වන අතර, එය ව්‍යතිරේඛ ගණනාවකට විෂය වේ. මෙසේ ඉවත් කිරීමේ මූලධර්මය ප්‍රකාශ කරන්නේ සාක්ෂිකරු තම මතය ඉදිරිපත් නොකළ යුතු අතරම ඒ පහත කරුණ සම්බන්ධ වී ඇත. එනම් අධිකරණය, එවැනි කරුණු වලට විශේෂිත හැකියාවක් හෝ දැනුමක් ඇති සහ ඒවා ගැන සලකා බලා කැඳවිය යුතුව තිබේ.

සාක්ෂි ආඥා පනතේ 45 වන වගන්තිය මෙසේ ද ප්‍රකාශ කරයි. විදේශීය නීතිය හෝ විද්‍යාව හෝ කලාව හෝ අත්අකුරුවල හෝ ඇඟිලි සටහන්වල හෝ අත්ල සටහන්වල හෝ පතුල් සටහන්වල අනන්‍යතාව හෝ අව්‍යාජත්වය සම්බන්ධයෙන් මතයක් ඇති කර ගැනීමට අධිකරණයට වුවමනා කල එකදු නීතිය, විද්‍යාව හෝ කලාව පිළිබඳව හෝ අත්අකුරුවල හෝ ඇඟිලි සටහන්වල හෝ අනන්‍යතාවය හෝ අව්‍යාජත්වය පිළිබඳ විශේෂ නිපුනතාවයක් ඇති තැනැත්තන් එකී කරුණු ගැන දරණ අනුකූල කරුණු වේ.

එබඳු තැනැත්තන් හට විශේෂඥයින් යැයි කියනු ලැබේ.

විශේෂඥ සාක්ෂිවල අදාලත්වය සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ 45 වන වගන්තිය පහත නිදර්ශනයන් ලබාදේ.

සාක්ෂි ආඥා පනතේ පහත සඳහන් නිදර්ශන දක්වා තිබේ. ඒ 45 වන වගන්තියේ විශේෂඥ සාක්ෂි වල නිරවද්‍යතාව සම්බන්ධයෙනි. නිදර්ශන (අ) ප්‍රශ්නය නම් "ඒ" ගේ මරණය වස දීමෙන් සිදුවූයේ ද යනුයි. "ඒ" ගේ මරණයට හේතු වූයේ යයි සිතන විට ද්‍රව්‍යය නිසා ඇති වන රෝග ලක්ෂණ සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ මත අනුකූල වේ.

නිදර්ශන (ආ) ප්‍රශ්නය නම එක්තරා ලේඛනයක් "ඒ" විසින් ලියන ලද්දක් ද යනුයි. "ඒ" විසින් ලියන ලද්දක් යයි ඔප්පු වූ හෝ බාරගත් වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබේ.

ලේඛන දෙකම එකම තැනැත්තකු විසින් ලියන ලදැයි නැතහොත්, දෙදෙනෙකු විසින් ලියන ලදැයි යන ප්‍රශ්නය පිළිබඳ විශේෂඥයින්ගේ අදහස් වේ.

සාක්ෂි දීමට කැඳවන පුද්ගලයා විශේෂඥ දක්ෂතාවයකින් හෙබිද යන්න පිළිබඳ අධිකරණය විසින් තීරණය කළයුතු යම් තොරතුරක් පිළිබඳ ප්‍රශ්නයකි. බලන්න; ඒ බව චාල්ස් පෙරේරා එ.මෝෆා (1961) 65 NLR 294 at P29 හි අගවිනිසුරු බස්නායක විනිසුරුවරයා විසින් දක්වා ඇත.) සාක්ෂිකරු කැඳවන පාර්ශවයේ වගකීම වන්නේ අධිකරණය සෑහීමකට පත්වන අයුරින් ඔවුන් කැඳවූ විශේෂඥ ප්‍රකාශ දීමෙහිලා අදළ සුදුසුකම් සහ අත්දැකීම් ඇත්ද යන්න පිළිබඳව වේ.

ආර්. ඒ. පින්හාමි (1955) 57 NLR 169 at 171 - බස්නායක අගවිනිසුරු) විත්තිය විසින් සහතික කළ යුතු දෙයක් ඇත. ඒ විශේෂඥ සාක්ෂිකරු අධිකරණයට පැමිණිය යුත්තේ ඔහුගේ හෝ ඇයගේ සුදුසුකම් සහ විශේෂඥතාව පිළිබඳ ඔප්පු කළ හැකි ලේඛනවලින් සන්නද්ධවය. (උදා: පුද්ගලික තොරතුරු ලේඛන, වගන්ති හා ප්‍රකාශන මගිනි.)

අනෙකුත් සාමාන්‍යයෙන් වැදගත් ලේඛන වලදී සාක්ෂිකරුට ඔහුගේ හෝ ඇයගේ මතකය සිහිපත් කරගත හැක. "විශේෂඥයකු විසින්, වගන්ති, නිබන්ධන බැලීමෙන් කරුණු සිහිපත් කළ හැක" (සාක්ෂි ආඥා පනත 159 වන වගන්තිය)

හරස් ප්‍රශ්න ඇසීමට යටත් සාක්ෂිකරුවෙකුට හැර වෙනත් සාක්ෂිකරුවෙකුට අධිකරණය තුළ රැඳී සිටීමට සාමාන්‍යයෙන් ඉඩ ලබා දේනනේ නැත. නමුත් අධිකරණයට පහත ආකාරයට කටුයතු කළ හැක. එනම් අනෙකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි නිරීක්ෂණය කිරීමට විශේෂඥ සාක්ෂිකරුවකුට අධිකරණයේ රැඳී සිටීමට අවසර දීමට අධිකරණයට හැකියාව තිබේ. (බලන්න; Colombo Electric Trainway Cov. Colombo Gas &Water Co. (1915) 18 NLR 385)

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතිය තුළ අපරාධ විත්තිය වෙනුවෙන් විශේෂඥ සාක්ෂිකරුවන් යොදා ගැනීම දුර්ලභ වේ. කෙසේ නමුත් අනිවාර්යයෙන් සඳහන් කළ යුතු කරුණක් ඇත. ඒ එවැනි විශේෂඥ සාක්ෂි හේතුවෙන් දෝෂමුක්ත කිරීම් ගණනාවක් උද්ගතව තිබේ. අතීතයේදී විද්‍යාත්මක නොවන සාක්ෂි සහ අත්තනෝමතික මත හේතුවෙන් අහිංසක පුද්ගලයන් සිරගත කොට තිබේ. විත්ති පාර්ශවයේ විශේෂඥ සාක්ෂියක් ඇති විට පක්ෂපාතීත්වය, අගතිය, අප්‍රසාදය, සහ වංක බව අවම කිරීමට හැකියාව ඇති අතර විද්‍යාත්මක සමබරතාවය පිළිබඳ තර්කානුකූල බවක් ද ඇත.[26]

<u>(10,6.4) සාක්ෂිවල විශ්වසනීයත්වය.</u>

චූදිතයකුගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටින විත්තියේ නීතිඥවරයකු සතු වගකීම් විසින් එකක් වන්නේ පහත කරුණු වේ. එනම් විශේෂයෙන් අදාළ කරන නඩු විභාගය වෙනුවෙන් ඉදිරිපත් වීමේදී සාක්ෂිකරුවන් සාක්ෂි දෙන විට, විශ්වසනීයත්වය ගැන මෙන්ම අනෙක් අතට චෝදනා සහ විත්තිය වෙනුවෙන් ඉදිරිපත් වන සාක්ෂි තර්ක කිරීම වේ.

යම් සාක්ෂිකරුවෙකුගේ විශ්වසනීයත්වය ඇගයීමට ලක්කිරීමේදී සහ ඔවුන්ගේ ප්‍රකාශවලට සාක්ෂිකරුගේ ප්‍රකාශ පිළිබඳ වෙනස් ආකාරයේ දෘෂ්ටිපතනයන් ගණනාවක් සාමාන්‍යයෙන් සලකා බලන අතරම එයට පහත සඳහන් කරුණු ද ඇතුළත්ය.

- අවංකභාවය; යම් සාක්ෂිකරුවකු සම්පූර්ණයෙන්ම සහ නිවැරදි ලෙස සාක්ෂි ලබාදෙන විට එය යහපත් විශ්වාසයකින් කරනු ලැබේද නැතිනම් ඊට පටහැනිව සාක්ෂිකරුවකු මුළුමණින්ම බොරු කීම හෝ අවම වශයෙන් යම් ස්ථිර තොරතුරක් හෙළිදරව් නොකරයි ද යන්න පිළිබඳවය.
- මතකය; සාක්ෂිකරුගේ මතකය කොතරම් නිවැරදිද? සහ සම්පූර්ණද?
- යෝජනා කිරීම; සෙසු අයගේ සාකච්ඡා සහ ප්‍රශ්න නිසා සාක්ෂිකරුගේ මතකය විකෘති වී ඇතිද?
- සංනිවේදන හැකියාව; සාක්ෂිකරු කෙතරම් හොඳින් ප්‍රශ්න අවබෝධ කරගෙන ඇතිද? සහ අදාළ කරුණු පිළිබඳව සාක්ෂිකරු කෙතරම් හොඳින් සංනිවේදනය සිදුකර ඇතිද?
- සාක්ෂිකරුගේ විශ්වසනීයත්වය ඇගයීමට ලක් කිරීමේදී විනිසුරුගේ පූර්ය රැඳී සිටින කරුණු ගණනාවක් ඇති අතරම එයට පහත සඳහන් කරුණු ඇතුළත් වේ;
- සාක්ෂිකරුගේ ප්‍රකාශය නඩුවේ අනෙක් අයගේ සාක්ෂි සමග ගැලපීම හෝ එසේ නොවීම;

[26] Goonerathne , I, 2011. Deliv erring a forensic Expert Testimony for to Detence, Relevance, Hesitations and Reservations amougst Professionally in Sri Lanka. Sri Lanka Journal of Forensic Medicine , Science & Law 1(2) pp 1-4 .DOI:http://doi.org/10.40 38/sljfmsl . vl2.2719.

- ප්‍රකාශය ලබාදීමේදී සාක්ෂිකරුගේ බාහිර හැසිරීම, එනම් එයට පහත කරුණු ඇතුළත් වේ. කතාව, නතර කිරීම්, ශාරීරික හැසිරීම, සහ සාක්ෂිකරු පෙන්නුම් කරන විශ්වසනීය බව වේ.
- සාක්ෂිකරු සම්පූර්ණ කතාව කියන්නේ හෝ සන්නිවේදනයේදී එකිනෙකට නොගැළපෙන දේ තිබේද යන්න.
- එම කතාවට සංවේදීතාවක් ඇත්ද? එම ප්‍රකාශය ලෝකයේ සිදුවන දේ පිළිබඳව සහ වෙනස් වෙනස් වාතාවරණයන් තුළ ජනතාවගේ හැසිරීම් ගත්විට ඒවා සමග අවබෝධයෙන් සිටීද යන්න පිළිබඳව;
- සාක්ෂිකරුගේ අවංක භාවය හෝ වංක භාවය සම්බන්ධයෙන් සාමාන්‍ය ප්‍රසිද්ධියක් තිබේද යන්න පිළිබඳවය.

(10.7) ඩී.එන්.ඒ., ඇඟිලි, අතුල්, පාද සහ අත්අකුරු පිළිබඳ නියැදි.

යම් පුද්ගලයකුගේ ඩී.එන්.ඒ. ලක්ෂණ තීරණය කිරීමේ ක්‍රියාදාමයට ඩී.එන්.ඒ. ඇඟිලි සලකුණු, ඩී.එන්.ඒ. පරීක්ෂණ හෝ ඩී.එන්.ඒ. සටහන් යැයි කියන ලබන දේ ඇතුළත් වන අතරම එයට ඇඟිලි සලකුණු මෙන්ම ආවේනික බවක් ඇත.

යම් පුද්ගලයකුට වඩා ඩී.එන්.ඒ. විශ්ලේෂකයින් යම් විශේෂයක් හඳුනා ගැනීමේදී එයට ඩී.එන්.ඒ. සංකේත යයි කියනු ලැබේ. අපරාධ විමර්ශනයේදී අධිකරණමය කරුණක් ලෙස ඩී.එන්.ඒ. සටහන් යොදා ගනී. ඒ සඳහා පහත උදාහරණය ගත හැක. එනම් අපරාධ ස්ථානයේදී යමෙකු හෝ කිහිප දෙනෙකුගේ ඩී.එන්.ඒ. සටහන් සංසන්දනය කිරීමෙන් ඔවුන්ගේ අපරාධයට සම්බන්ධතාවය සොයාගත හැකිය. ඩී.එන්.ඒ. හි වැදගත්කම වන්නේ සෑම පුද්ගලයකුටම ඩී.එන්.ඒ. පිළිබඳව අනන්‍යතාවක් තිබීමය. පහත සඳහන් දේ විශ්ලේෂණය කිරීමෙන් ඩී.එන්.ඒ. හඳුනාගත හැකිය. එනම්, සෙල, එයට පහත දේද ඇතුළත්ය. එනම් ලේ වල කුඩා කොටස් කෙල, ශුක්‍රානු, සම හෝ දහඩිය ද ඒ අතර වේ.

අපරාධ නඩු විධාන සංගහය පනතේ 123 වන වගන්තියේ ඩී.එන්.ඒ. සාක්ෂි පිළිබඳව කරුණු දක්වා ඇත. (සාක්ෂි ආඥා පනතේ 45 වන වගන්තිය ශ්‍රී ලංකාවේ අධිකරණ ඩී.එන්.ඒ. සාක්ෂිවල නෛතික පිළිගැනීම දක්වා තිබේ).

123. සැක කරන ලද තැනැත්තකුගේ ඇඟිලි සලකුණු, හිස කෙස්වල නෛතික පිළිගැනීම දක්වා තිබේ.

(1) විමර්ශනයක කාර්යය සඳහා විමර්ශනයට භාජනය කරනු ලැබ ඇති වරද ගැන සැක කරනු ලබන යම් තැනැත්තකුගේ, යම් ඇඟිල්ලක, අත්ලක හෝ පාදයක සලකුණක් හෝ ශරීරයේ යම් කොටසක සලකුණක් හෝ ඒ තැනැත්තාගේ කෙළවල මුත්‍රාවල, හිස කෙස් හෝ නියපොතුවල, ආදර්ශකයක් හෝ නියපොතුවල සූරා ගන්නා ලද කොටසක් ගැනීම අවශ්‍යය යැයි පොලිස් ස්ථානයක් භාර යම් නිලධරයකුගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව එසේ කිරීමට ඒ පොලිස් නිලධාරියා විසින් සලස්වනු ලැබිය හැකිය.

(2) එවැනි සළකුණක්, ආදර්ශයක්, හෝ සූරාගනු ලැබූ කොටසක් ගැනීම ගැන (1) වන උප වගන්තියේ සඳහන් තැනැත්තා කැමති නොවන අවස්ථාවක ඒ පොලිස් නිලධාරියා විසින් එවැනි යම් සලකුණක්, ආදර්ශයක් හෝ සූරාගනු ලබන කොටසක් ගැනීම සඳහා පොලිස් නිලධාරියකුට බලය දෙන ආඥාවක් සඳහා, විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත්වරයාගේ ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(3) විමර්ශනයේ කාර්යය සඳහා අත්අකුරු කිසිවක් සංසන්දනය කර බැලීමට අවශ්‍ය වූ අවස්ථාවක, යම් තැනැත්තකුගේ අත්අකුරුවල ආදර්ශකයක් ඔහුගේ කැමැත්ත ඇතිව ගැනීමට පොලිස් ස්ථානයක් භාර යම් නිලධරයකු විසින් සලස්වනු ලැබිය හැකිය.

(4) තම අත්අකුරුවල ආදර්ශකයක් දීම ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරන අවස්ථාවක ඔහුගේ අත්අකුරුවල ආදර්ශකයක් දිය යුතු බවට ඒ තැනැත්තාට නියම කරන ආඥාවක් සඳහා විමර්ශනය කරනු ලබන්නේ යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල සීමාව ඇතුළතද ඒ මහේස්ත්‍රාත්වරයාගේ පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කළ යුතුය.

නීතිඥයකු 123 (2) සහ 123 (4) යන වගන්තීන් යටතේ සඳහන් වන වැදගත් කරුණු දෙකක් පිළිබඳව සලකා බැලිය යුතුව ඇත.

(1) චූදිතයකු 123 (1) සහ 123 (3) යන වගන්තිවල සඳහන් යම් ආදර්ශකයක් ලබාදීම පොලීසිය ඉල්ලා සිටින විට ප්‍රතික්ෂේප කිරීම සහ;

(2) එසේ චූදිත යම් ආදර්ශකයක් ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, පොලිස් නිලධාරියා එවැනි ආදර්ශකයක් ලබාදෙන ලෙස කියා සිටින විටදී එවැනි ආදර්ශක ලබාගැනීමට නිසි අධිකරණ බලය අදාළ මහේස්ත්‍රාත්වරයා වෙත පළමුව ඉල්ලීමක් කළ යුතුය. ඒ එම ආදර්ශක ලබා ගැනීමට ආඥාවක් ඉල්ලා සිටීමෙනි.

මෙම වගන්තියේ බලපෑම වන්නේ අදාළ පොලිස් නිලධරයා අදාළ මහේස්ත්‍රාත්වරයකු හෝ ආඥාවක් සඳහා ඉල්ලීමක් කර ඇති විටදී පමණක් සිදුවන අතර එසේ නොමැතිව ආදර්ශ ලබා ගැනීම නීතිවිරෝධී සහ චූදිතගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් වේ.

මෙම පනතේ 5(1) වන වගන්තියේ පරිගණක සාක්ෂි යන්න සංකේතවත් කර ඇත.

<u>(10.8) හඳුනා ගැනීමේ පෙරට්ටු.</u>

ශ්‍රී ලංකාව තුළ මෙයට අවසරය ඇති අතර එය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කාර්ය පටිපාටිය අනුව 124 වන වගන්තියෙන් බලය දී තිබේ.

124 වන වගන්තිය; මහේස්ත්‍රාත්වරයා විමර්ශනයට සහය දිය යුතු බව.

124. විමර්ශනයක් පවත්වාගෙන යාමට සහය දෙන ලෙස ඉල්ලීමක් කරනු ලැබුවේ යම් මහේස්ත්‍රාත්වරයකු වෙතද, ඒ සැම මහේස්ත්‍රාත්වරයකු විසින්ම නිසි ආඥා කිරීමෙන් සහ අධිකරණ නියෝග නිකුත් කිරීමෙන්, විමර්ශනයක් පැවැත්වීමට සහය දිය යුතු අතර, විශේෂයෙන්ම වරදකරු කවරෙක් ද යන වග නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වීම හෝ පැවැත්වීමට බලය දීම සහ ඒ කාර්යය සඳහා ඒ තැනැත්තකුට නියම කිරීම සහ ඒ පෙරෙට්ටුවේ කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම හෝ කරනු ලැබිය යුතුය.

වෘත්තිකයන් සැලකිල්ලට ගත යුතු දෙයක් ඇත. එනම් මෙම වගන්තියේ වැදගත් බවයි. එනම් හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පිළිබඳ ඉල්ලීමක් මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලා සිටිය යුතුයි; එවැනි ඉල්ලීමක් කර නැති විට ඒ අනුව මහේස්ත්‍රාත්වරයා ලබාදෙන ආඥාව අනුව හඳුනා ගැනීමේ පෙරෙට්ටුවට අදාළ සාක්ෂි නඩු විභාගයේදී චෝදක පාර්ශවය විසින් කැඳවනු නොලැබේ.

(10.9) පරිඝණක සාක්ෂි.

1995 සාක්ෂි (විශේෂ විධි විධාන) පනතෙහි 12 වන වගන්තිය පරිගණකය යන්න පහත ලෙස අර්ථකතනය කර ඇත. "එනම් තොරතුරු/දත්ත ගබඩා කරන සහ සකස් කරන කාර්යය ඇතුළත් උපාංගයකි".

මෙම පනතේම 5 (1) වගන්තිය මගින් පරිගණක සාක්ෂි යන්න පිළිබඳව පහත ආකාරයට විශේෂයෙන් සඳහන් කර ඇත.

5(1) සිද්ධියක් පිළිබඳ සෘජු වාචික සාක්ෂි අවේශ්‍යය කළ හැකි යම් නඩු කටයුත්තකදී පරිගණකයක් මගින් උත්පාදනය කරන ලද්ද වූද, ඒ සිද්ධිය ඔප්පු කිරීමට තුඩු දෙන්නා වූ ද යම් ප්‍රකාශයක ඇතුළත් යම් තොරතුරක් එම ඡේදයේම ප්‍රකාශිත තත්ත්වයන්ට අනුව එනම්,

(අ) (2) වන උප වගන්තියට යටත්ව ඒ ප්‍රකාශය උත්තරවාදය කර ඇත්තා වූ ආකෘතියෙන් හෝ ප්‍රතිඋත්පාදනය කර ඇත්තා වූ ආකෘතියෙන් ඉන්ද්‍රියන් ගෙන් ග්‍රහණය කළ හැකි බව;

(ආ) ප්‍රකාශය උත්පාදනය කළ පරිගණකය සියලු වැදගත් අවස්ථාවලදී නිසි ලෙස ක්‍රියාත්මක වෙමින් තිබුණු බව හෝ එසේ නොතිබුනේ නම් එය නිසි ලෙස ක්‍රියා නොකළේ හෝ ක්‍රියා විරහිත වූයේ යම් කරුණක් සම්බන්ධයෙන් ද ඒ කරුණ එහි ස්වභාවය අනුව එකී ප්‍රකාශය උත්පාදනය කිරීම හෝ එහි ඇතුළත් තොරතුරු නිරවද්‍ය බව සහ ප්‍රකාශයේ ඇතුළත් තොරතුරු, පරිගණකයට එසේ සපයන ලද තොරතුරු ප්‍රත්‍යුත්පාදනය කරන බව හෝ ඉන් ව්‍යුත්පන්න වන බව පෙන්නුම් කරනු ලැබුවහොත්, ඒ තොරතතුරු ඒ සිද්ධිය පිළිබඳ සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතුය;

මෙම පනතේ 9 වන වගන්තිය පහත ලෙස දක්වා ඇත. පොදු වශයෙන් භාවිතා කරනු ලබන යන්ත්‍රයක්, උපක්‍රමයක් හෝ පරිගණකය මගින් හෝ එය භාවිතයෙන් හෝ උත්පාදනය කෙරෙන යම් රෙකෝඩරයක, ප්‍රත්‍යුත්පාදනයක හෝ ප්‍රකාශයක නිරවද්‍යතාව අධිකරණය විසින් පූර්ව නිගමනය කරනු ලැබිය හැකි අතර, යම් රෙකෝඩරයක්, ප්‍රත්‍යුත්පාදනයක හෝ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අදහස් කරන යම් පාර්ශවකරුවකු විසින් රෙකෝඩරයක්, ප්‍රත්‍යුත්පාදනයක හෝ ප්‍රකාශය ආවේශ්‍යය කිරීමට අදළ, මේ පනතේ ඉහත කී විධි විධානවල දැක්වෙන කොන්දේසි කිසිවක් සපුරාලනු ලැබ ඇති බව පෙන්වාදීම අවශ්‍ය නොවන්නේය. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 415 වන වගන්තියට දිව්රුම් ප්‍රකාශ දී තිබීම සහ/හෝ සහතික කර දී තිබිය යුතුව ඇත. එම වගන්තිය පහත ආකාරයට විශේෂයෙන් ඒ බව තීරණය කර ඇත.

10.10. දිව්රුම් ප්‍රකාශ.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 415 වන වගන්තිය මෙසේ තීරණය කර ඇත. දිව්රුම් ප්‍රකාශ අපරාධ කාර්ය පටිපාටියේ යොදා ගැනීමට නම් ඒවා නිවැරදිව දිව්රුම් දී සහ/හෝ ප්‍රතිඥා දී තිබීම අනිවාර්යෙන් සිදුව තිබිය යුතුය.

"යම් දිවුරුම් පත්‍රයක් අපරාධ අධිකරණයකදී යොදා ගැනීමට එය පහත ආකාරයට දිව්රුම් දී හෝ ප්‍රතිඥා දී තිබිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවෙහි යම් සාමදාන විනිශ්චයකාරවරයකු හෝ විනිශ්චයකාරවරයකු ඉදිරි පිට දී;

(ආ) වෙනත් යම් ස්ථානයක විනිශ්චයකාරවරයකු හෝ මහේස්ත්‍රාත්වරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ ඒ ස්ථානයේ දිවුරවීමට සුදුසුකම් ලත් හෝ බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තකු ඉදිරි පිටදී නැතහොත් අධිකරණය විසින් සෑහේ යැයි සලකනු ලබන වෙනත් යම් ආකාරයකින් ශ්‍රී ලංකාවෙන් පිටත දිවුරුම් ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු ඉදිරිපිට දී.

දිවුරා හෝ සහතික කර තිබේ නම් එය අපරාධ අධිකරණයකදී පාවිච්චි කළ හැකිය.

මෙහි තීරණාත්මක වැදගත්කමක් ඇත. චෝදනාව මෙහයවන නීතිඥවරයා තම නඩුව සඳහා වැදගත් වන දිවුරුම් ප්‍රකාශයක් තැනීමේදී නීතිඥවරයා එම දිවුරුම් ප්‍රකාශය දිවුරා හෝ සහතික කර ඇති ආකරය අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 415 වන වගන්තිය සමග ගැලපෙන විටදී පමණක් තීරණය කළ යුතුය.

(10.11) ඒත්තු ගැන්වීම්.

ඒත්තු ගැන්වීමක් යනු යම් ඉදිරිපත් කරන කරුණක් හෝ අනුකූල කරුණක් සම්බන්ධයෙන් යම් නියමයක් යෝජනා වන්නක් වූ ද මෙහි පහත සඳහන් පුද්ගලයන් අතුරෙන් යමකු විසින් හා මෙහි පහත සඳහන් අවස්ථාවන් හිදී කරනු ලබන්නා වූද කථික හෝ ලේඛනගත ප්‍රකාශයකි. (සාක්ෂි ආඥා පනත 17(1) වන වගන්තිය)

ඒත්තු ගැනීම් වූ කලී ඒත්තු ගන්නා ලද කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාධක නොවන නමුදු, මෙහි පහත ඇතුළත් විධි විධාන යටතේ නිශේධ වශයෙන් ක්‍රියාත්මක විය හැකිය. (සාක්ෂි ආඥා පනත 31 වන වගන්තිය)

අපරාධ නඩුවකදී විත්තිය විසින් යම් ඒත්තු ගැනීමක් කිරීමට පෙර එය සම්පූර්ණයෙන් සහ සවිස්තරාත්මකව සේවාදයකයා සමග සාකච්ඡා කළ යුතුය. ඕනෑම ඒත්තු ගැන්වීමක් ඇති අන්තර්ගතය ද නීතිඥවරයා සොයා ගත යුතුව තිබේ. එනම් තම සේවාදයකයාට එවැනි ඒත්තු ගැනීම් සිදුකිරීමේදී ඒ පිළිබඳව ඇති බලපෑම ද විස්තර කළ යුතුව ඇත.

සියලු ඒත්තු ගැනීම් ප්‍රවේශමෙන් සහ පැහැදිළි ලෙස කෙටුම්පත් කිරීම අවශ්‍ය වේ. සේවාදයකයාගෙන් තමා ඒත්තු ගැනීමක් කරන්නේ කුමක් සඳහා ද යන්න පිළිබඳව ලිඛිතව ස්ථිර කරන ලෙස පැවසිය යුතුය.

අධිකරණ කටයුත්තක පාර්ශවකරුවකු විසින් හෝ නඩුවේ පවත්නා කරුණුවල හැටියට ප්‍රකාශ නිකුත් කිරීමට පැහැදිළි ලෙසත් හැඟෙන ලෙසත් ඔහු විසින් බලය ලබාදී ඇතැයි අධිකරණය සලකා එවැනි පාර්ශවකරුවකුගේ නියෝජිතයකු විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශ ඒත්තු ගැනීම්ය. (සාක්ෂි ආඥා පනත 18 (1) වන වගන්තිය)

මළ තැනැත්තකු විසින් හෝ සොයා ගත නොහැකි තැනැත්තකු විසින් හෝ සාක්ෂිවලට අපොහොසත් තත්ත්වයකට පැමිණ සිටින්නකු විසින් හෝ නඩුවේ කරුණු යෙදී තිබෙන අන්දම අධිකරණයේ මතය අනුව සාධාරණ නොවන ප්‍රමාණයක් හෝ වියදමක් රහිතව අධිකරණයෙහි පෙනී සිටීමට ගෙන්වාගත නොහැකි තැනැත්තකු විසින් අනුකූල කරුණු පිළිබඳව කරනු ලබන ලිඛිත හෝ භාෂිත ප්‍රකාශයට පහත දැක්වෙන අවස්ථාවලදී අනුකූල කරුණු වේ.

(1) එම තැනැත්තන්ගේ මරණයට හේතුව විවාදයට භාජනය වන අවස්ථාවලදී තම මරණය සමබන්ධයෙන් හෝ තම මරණයෙන් කෙලවර වූ කටයුත්තේ දී තිබුණු කරුණු ඇතුළත් කිරීමක් සම්බන්ධයෙන් ඔහු විසින් ප්‍රකාශ කරනු ලබන විට;

එවැනි ප්‍රකාශ කරනු ලබද්දී ඒ ප්‍රකාශ කළ තැනත්තා මරණය බලාපොරොත්තුවෙන් සිටිය ද නොසිටිය ද ඔහුගේ මරණයට හේතුව විවාදයට භාජනය වන අධිකරණ කටයුත්තේ ස්වභාවය කුමක් වුවද එබඳු ප්‍රකාශ අනුකූල වේ. (සාක්ෂි ආඥා පනත 32 සහ 32 (1) වන වගන්තිය)

ප්‍රකාශය කරන්නාගේ මුදල් පිළිබඳ හෝ හිමිකරු වශයෙන් ඇති සම්බන්ධතාවලට විරෝධතාවයන් ප්‍රකාශනය මගින් සැලසෙන විට හෝ ප්‍රකාශය සත්‍ය නම්, එය කරන්න ඒ මගින් අපරාධ නඩුවකට හෝ අලාභ ඉල්ලා පවරනු ලබන නඩුවකට මුහුණ පෑමට කටයුතු සැලසෙන විට, හෝ කටයුතු සැලැස්විය හැකි වූ විට. (සාක්ෂි ආඥා පනත 32 (3) වන වගන්තිය)

යම් පවතින අයිතිවාසිකමක, චාරිත්‍රයක හෝ පොදු හෝ සාමාන්‍යය උනන්දුව දැක්වෙන කරුණක පැවැත්ම සම්බන්ධයෙන් එකී දෙය පැවතියේ නම් එහි පැවැත්ම ගැන දැන ගැනීමට ඉඩ තිබුණු යම් තැනැත්තකුගේ මතයක් ඒ බඳු අයිතිවාසිකම්, චාරිත්‍රය හෝ කරුණ පිළිබඳ කිසි මතභේදයක් පහළ වීමට පෙර ප්‍රකාශ කරනු ලැබූ විට. (සාක්ෂි ආඥා පනත 32 (4) වන වගන්තිය)

පුද්ගලයන් ගණනාවක් විසින් ප්‍රකාශ කරනු ලැබූ විවාදයට පවත්නා කරුණට අදාළ වන පරිදි ඔවුන් තුළ ඇති වූ හැඟීම් ඒ මගින් ප්‍රකාශ වූ විට; (සාක්ෂි ආඥා පනත 32 (8) වන වගන්තිය)

සාක්ෂි ආඥා පනතේ 33 වන වගන්තිය පහත ආකාරයට ප්‍රකාශ කරනු ලැබේ. එසේ වන්නේ අධිකරණ කටයුත්ත එකම පාර්ශවකරුවන් අතර හෝ ඔවුන්ගේ සම්බන්ධතාව නියෝජනය කරන්නන් අතර වූ විට; හරස් ප්‍රශ්න ඇසීමට බලය හා අවස්ථාව, පළමුවෙනි අධිකරණ කටුයත්තක් විරුද්ධ පාර්ශවයට තිබුණු විට; පළමුවෙනි අධිකරණ කටයුත්තේ මෙන්ම දෙවැනි අධිකරණ කටයුත්තේ ද ප්‍රශ්න වැඩි වශයෙන් එක සමාන වන විටය.

යම් වෘත්තියක් හෝ රැකියාවක් වෙනුවෙන් වාර්තාගත ප්‍රකාශයක් සකස් කරන විට අදාළ තොරතුරු සත්‍ය ආකාරයට සපයන පුද්ගලයාගේ වාචික සාක්ෂි සමග එය සහතික නොකළ යුතුය. (සාක්ෂි ආඥා පනත, 35 (අ) වගන්තිය.

(10.12) වරද පිළිගැනීමේ (පාපොච්ඡාරණය)

වරද පිළිගැනීමක් යනු චෝදනා වලට අදාළව සම්පූර්ණයෙන් වරද පිළිගැනීමක් වේ. මේ ආඥාව පරිදි කියාපෑම හුදු වරද කියා පෑමක් පමණක් නොවේ.

චූදිත වරදේ යම් විශේෂ අංගයක් පිළිගත යුතුව තිබේ. එවිට එම අංගය මෙහෙයවන නීතිඥවරයා විසින් ඔප්පු කිරීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් එය ඔප්පු නොකරන කරුණක් ද තිබේ. එනම් චූදිත වරදකරු බව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීම වේ. අනෙක් අතට යම් විශේෂ වරදකට යොමුව අංග වලට වරද කියාපාන විටදී එය චෝදනා කරන අපරාධය පිළිබඳ පාපොච්චාරණයක් බවට පත්වේ.

ශ්‍රී ලංකාවේ සාක්ෂි ආඥා පනතේ 17 (2) වන වගන්තිය පහත ලෙස වරද කියාපෑම අර්ථකථනය කර ඇත. වරද කියාපෑමක් යනු වරදක් කරන ලදැයි චෝදනා ලැබ සිටින පුද්ගලයකු විසින් තමා එම වරද කළ බැව් ප්‍රකාශ කරමින් හෝ එම නිගමනය සනාථ කරමින් යම් වේලාවකදී කරනු ලබන ඒත්තු ගැන්වීමකි.

සාක්ෂි ආඥා පනතේ 24 වන වග්නතියට අනුව චූදිත තැනැත්තකු කරනු ලබන වරද කියාපෑමක් අදාළ නොවන අතරම පහත කරුණට අනුව මිස චූදිතට එරෙහි අපරාධ ක්‍රියාදාමයේදීත් අදාළ නොවිය යුතුය.

"චෝදනා ලැබ සිටින තැනැත්තාට විරුද්ධව නගා ඇති චෝදනාව සම්බන්ධ වූ ද, බලය ලත් තැනැත්තකුගේ හෝ බලධාරී තැනැත්තකු ඉදිරිපිටදී සහ ඔහුගේ අනුදැනීම ඇතිව තවත් කෙනෙකුගෙන් හට ගන්නා වූද යම් පෙළඹවීමක්, තර්ජනයක්, හෝ පොරොන්දුවක් හේතු කොට ගෙන වරද කියාපෑමෙන් සිදුවී තිබේ යයි අධිකරණයට පෙනී යන්නේ නම් සහ එසේ වරද කියාපෑමෙන් තමාට විරුද්ධව කරනු ලබන නඩු විභාගය සම්බන්ධයෙන් ලෞකික ස්වභාවයකින් යුත් යම් පහසුකමක් ලබාගැනීමට හෝ යම් විපතකින් වැළකීමට තමාට හැකි බව විශ්වාස කිරීමට යුක්ති සහගත යැයි තමාට පෙනෙන හේතු චෝදනා ලැබූ තැනැත්තාට අත්කර දීමට අධිකරණයේ මතය පරිදි මෙකී පෙළඹවීම, තර්ජනය හෝ පොරොන්දුවීම සෑහේ නම් යම් අපරාධ නඩුවකදී චෝදනා ලැබ සිටින තැනැත්තකු විසින් කරනු ලබන වරද කියාපෑමක් අනුකූල නොවේ.

24 වන වගන්තියෙහි සඳහන් අන්දමේ වරද කියාපෑමක් හෝ එබඳු පෙළඹවීමක්, තර්ජනයක් හෝ පොරොන්දුවක් හේතු කොට ගෙන ඇති වූ හැඟීම් අධිකරණයේ මතය අනුව සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබීමෙන් පසුව, කරන ලද නම්, එය අනුකූල වෙයි. (සාක්ෂි ආඥා පනත 28 වන වගන්තිය)

වරද කියාපෑමක් අදාළ වන්නේ යම් සාක්ෂි ආඥා පනතේ 29 වන වගන්තිය ප්‍රකාරව එය අදාළ නොවන්නේ නොවේ.

එබඳු වරද කියාපෑමක් අන් ලෙසකින් අනුකූල වන්නේ නම්, එසේ ඔබේ පොරොන්දුවක් පිට හෝ එය ලබාගැනීම සඳහා විත්තිකරු යොදන ලද රැවටිල්ලක ප්‍රතිඵලයක් වශයෙන් පමණක් හෝ ඔහු වෙරි මතින් සිටියදී එය කරන ලද බැවින්, හෝ ප්‍රශ්නවල ආකාරය කුමක් වුවද තමා විසින් පිළිතුරු සැපයිය යුතු නොව, ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් එය කරන ලද බැවින්, හෝ එබඳු වරද කියාපෑමක් කිරීමට තමා බැඳී නැතැයි හා ඒ පිළිබඳ සාක්ෂි තමාට විරුද්ධව දෙනු ලැබිය හැකි යැයි තමාට අවවාද නොකරන ලද බැවින් පමණක් එය අනුකූල නොවන තත්ත්වයට නොපැමිණෙයි.

පොලිස් නිලධරයකු වෙත කරන ලද කිසි වරද කියාපෑමක් යම් අපරාධයක් කරන ලදැයි චෝදනා ලැබ සිටින තැනැත්තකුට විරුද්ධව සත්‍යය බැව් ඔප්පු නොකළ යුතුය. (සාක්ෂි ආඥා පනත 25 (1) වන වගන්තිය)

යම් තැනැත්තකු පොලිස් නිලධරයකුගේ ආරක්ෂාව යටතේ සිටින කාලය තුළ ඔහු විසින් කරනු ලබන කිසි වරද කියාපෑමක් හුදු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේදීම කරනු ලැබේ නම් මිස නොඑසේ වූ එවැනි තැනැත්තකුට විරුද්ධව ඔප්පු නොකළ යුතුය. (සාක්ෂි ආඥා පනත 26 (1) වන වගන්තිය)

ශ්‍රී ලංකාවේ වෘත්තිකයන් සාක්ෂි ආඥා පනතේ 30 වන වගන්තියේ අන්තර්ගතය සම්බන්ධයෙන් වඩා ප්‍රවේශම්කාරී වේ. එහිදී එක්කෙනෙකුට වඩා වැඩිය පුද්ගලයන්ට එරෙහිව නඩු විභාග කරන විට එක් පුද්ගලයකු වරද කියාපෑමක් සිදුකරන විට, එහිදී එම වරද කියාපෑමට අදාළ අන්තර්ගතය එවැනි අයෙකු චූදිතයකුට එරෙහිව සාක්ෂියක් ලෙස යොදගත නොහැක.

"එකම වරදක් කිරීම යන එක් කෙනෙකුට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට විරුද්ධව සාමූහික නඩු විසඳීමේදී තමාට සහ එවැනි තැනැත්තන් හෝ කෙනෙකු විසින් කර තිබෙන බව සත්‍ය බැව් ඔප්පු වූ විට ඒ අන්‍ය තැනැත්තකුට විරුද්ධව ඒ වරද කියාපෑම අධිකරණය විසින් සලකා බැලිය යුතු නොවේ."

<u>(10.13) ගිනි අවි.</u>

අපරාධය වූ ස්ථානයේ ගිනි අවි සම්බන්ධ සාක්ෂිවලදී කරනු ලබන පරීක්ෂණයක් එනම්, උණ්ඩ, කාට්රිජ, ප්‍රක්ෂිප්ත සහ අනෙකුත් පුපුරන ද්‍රව්‍ය ඇතුළුව ඒවායේ ප්‍රතිඵල සහ හැසිරීම පිළිබඳව වේ. ප්‍රක්ෂිප්ත විද්‍යාව පිළිබඳ අධිකරණ වෛද්‍ය විශේෂඥවරයකු විසින් නඩුවකට සම්බන්ධ පාර්ශව එනම් චෝදනා ලැබ සිටින සැකකරුවන් හෝ අනෙකුත් අයගේ අවි ආයුධ සමග උණ්ඩ, කැඩුන කොටස් සහ අනෙකුත් සාක්ෂි සංශෝධනය කරනු ලැබේ. ප්‍රක්ෂිප්ත සාක්ෂි එකතු කරන ක්‍රම පහත දේ වලින් අන්තර්ගතය;

- ඇඟිලි සලකුනු ලබා ගැනීම.
- අනුක්‍රමික අංක ලබා ගැනීම.
- චුම්බක කොටස් පරීක්ෂාව
- රසායනික ද්‍රව්‍යය නැවත ස්ථාපිත කිරීම.
- සොයාගනු ලැබූ උණ්ඩයක වර්ගය හෝ පුද්ගලික චර්යාවන් විභාග කිරීම.

- දත්තයන් සටහන් කිරීම.
- සමකාලීන උණ්ඩ පිළිබඳ විශ්ලේෂණය භාවිතයට ගැනීම පිළිබඳව දැන් ඇත්තේ අවමානයක් බව.

ගිනි අවි පිළිබඳ සාක්ෂි වෘත්තීමය ලෙස එක්රැස් කිරීමට අදළ තාක්ෂණය පිළිබඳ අවශ්‍යතාවක් ශ්‍රී ලංකාව තුළ ඇත. ඒ රටේ ගිනි අවි පිළිබඳ හිමිකාරීත්වය ගැන වූ ස්වභාවය පිළිබඳ න්‍යාය. 2017 වසරේදී සුළු අවි ආයුධ පිළිබඳ සංගණනයක් පැවැත්විණි. එය සිදුවූයේ ජිනීවා හි ජාත්‍යන්තර සහ සංවර්ධන අධ්‍යයන පිළිබඳ උපාධි ආයතනයේ ව්‍යාපෘතියක් පදනම් කරගෙනය. එහිදී පහත තක්සේරුව සිදුවුණි. එනම් ශ්‍රී ලාංකීය සිවිල් පුරවැසියන් සතුව ඇති ගිනි අවි 494000 න් 93% ක් ම නීති විරෝධී හිමිකාරීත්වය යටතේ පවතින බවයි.

එම ආයතනය තක්සේරු කළ තවත් දෙයක් විය. ඒ පොලීසිය සංචිත කර ඇති ගිනි අවි ප්‍රමාණය 134000 ක් සහ අනෙකුත් ආරක්ෂක අංශ සතුව ඇති තුවක්කු ප්‍රමාණය 509700 ක් වන බවය.

එනම් ගිනි අවි සොයා කරන මෙහෙයුම ඵලදයී වීමට සහ එක්සත් ජාතීන්ගේ මිණුම් දඬු සමග ගැලපීමට ශ්‍රී ලංකා ගිනි අවි ආඥා පනත 18 වන වගන්තියේ පහත ආකාරයට දක්වා ඇත. "ශ්‍රී ලංකාවේ තුවක්කු නිෂ්පාදනය කරන සෑම අයෙක්ම ලියාපදිංචි වී සිටිය යුතුය ... එහි ආයුධ නිශ්පාදකයාගේ නම, අදළ අංකය මෙන්ම බැරලයේ අනුක්‍රමාංකය කොටා තිබිය යුතුය"

ශ්‍රී ලංකාව ආයුධ නිෂ්පාදිත රටක් නොවන නිසා මෙම සටහන් කිරීමේ ක්‍රියාදමය පිළිබඳ අනන්‍යතාවය විදේශ නිෂ්පාදකයා මත පැවරේ. ගිනි අවි ආඥා පනතේ 28 වන වගන්තිය මෙසේ සඳහන් කර ඇත.

"බලපත්‍රය දෙනු ලබන අධිකාරිය එය දීමට පෙර ඉල්ලුම්කරු එවැනි ඕනෑම තුවක්කුවක් ඔහු ඉදිරියට ගෙන ආ යුතුය. එහිදී සටහන් කරන දෙය ස්ථිර ලෙස සිදුවිය යුතුව ඇත. එවැනි සටහනක් මකා දමන, විකෘති කරන, වෙනස් කරන, හෝ වංචනික ලෙස සකස් කරන පුද්ගලයකු වරදක් කරන ලෙස සැලකිය යුතුය.

මෙම අනන්‍යතාව ගිනි අවි සාක්ෂි එකතු කිරීම මෙහෙයවන එක් විදියක් වේ. කෙසේ නමුත් එවැනි නීති වල ක්‍රියාදමයේ ඵලදයීතාව එනම් නීති විරෝධී අවි ආයුධ වෙළඳාම සහ භාවිතය සම්බන්ධයෙන් දන්නේ නැත. දශක ගණනාවක සිට ලෝකය පුරා අධිකරණ ශාලා වල මෙම ගිනි අවි විවාද රහිත විද්‍යාවක් විය. කෙසේ නමුත් මෑත වසර වලදී විත්තියේ නීතිඥවරු ඉතා ඉහළ සාර්ථකත්වයකින් යුතුව ගිනි අවි පිළිබඳ සාක්ෂිවල යථාර්ථය ට අභියෝග කරනු ලැබේ. මෙහිදී එක්සත් ජනපදයේ නඩු කිහිපයක තොරතුරු දැක්වීම යෝග්‍යය වේ;

- Dauber V.Merell Dow Pharnacehiti case the jog Us 571 (1993) අධිකරණය විසින් පහත ලෙස තීරණය කෙරිණි. එනම් පෙඩරල් සාක්ෂි පිළිබඳ රෙගුලාසි විද්‍යාත්මක සාක්ෂි අදළ කිරීම පාලනය කරයි. ඔවුන් කියන්නේ විනිසුරුවරයා ගේට්ටු මුරකරුවකු ලෙස ක්‍රියා කළ යුතු බවය. එනම් සාක්ෂි පිළිගැනීමට පෙර පවතින නඩුවට අදළව සාක්ෂි විද්‍යාත්මක වටිනාකමින් යුක්ත ද අදළ බැවින් යුක්ත ද යන්න තීරණය කළ යුතුය.
- United States V. Green, 405 F. Supp. 2d 104, 107 (D.M.15 – 2005) හිදී අධිකරණය පහත ලෙස තීරණය කළේය. විශේෂඥයකු විසින් කළ යුත්තේ පහත කරුණු පමණි. ඒ උණ්ඩයේ ආරක්ෂක වැස්ම සමාන ද යන්න ය. එසේ නැතුව එම ආවරණ නිකුත් වූයේ යම් නිශ්චිත ආයුධයකින් ද යන්න පිළිබඳව නොවේ. එනම් ලොව වෙනත් සෑම ගිනි අවියකින් සිදු නොවූ බවය.
- United States V. Monderrio, 407 F. Supp. 2d 351, 374 (D.Miss. 2006) අධිකරණය පහත නිගමනයට එළිඹිණි. පරීක්ෂකවරයා ඔහුගේ ක්ෂේත්‍රය තුළ ස්ථාපිත ප්‍රමිතීන් අනුගමනය නොකළ යුතුය. ඔහු සාක්ෂි යළිත් විභාග කිරීමට පෙර තීන්දු නොකළ යුතු

අතරම එය ඔහුගේ සොයා ගැනීම් වලට අදාළ නිසි ලේඛන නැවත විභාගයට පෙර ද සිදුවිය යුතුය.

ගිනි අවි පිළිබඳ විශේෂඥයකු ඔබේ නඩුවේදී සාක්ෂි දීමට සිටින විට ඒ අවස්ථාවේදී කාලය හෝ ඊට අදාළ ගිනි අවය සහ උණ්ඩ පිළිබඳව ඒවාගේ ස්වරූපය ගැන ඉගෙන ගත යුතුය. අදාළ නීතීන් සහ එහි ස්වරූපය දැනගත යුතුය. විශේෂඥවරයාගේ සහතික, ක්‍රම, සහ නිගමන පිළිබඳ විමර්ශනය කළ යුතුව තිබේ. මෙහිදී කාලය ආයෝජනය කිරීමේදී පහත ප්‍රතිඵලය අත්වේ. එය ඔබට සාක්ෂි පළිබඳව වඩා පහසු කරවන අතරම ඔබේ සේවාදයකයා වඩා ඵලදයී ලෙස නියෝජනය කිරීමට උදව් කරනු ලැබේ.

(11) පශ්චාත් නඩු විභාගය.

(11.1) දණ්ඩනය.

(11.1.1) සාමාන්‍ය.

චූදිතයකු වරදකරුවකු වූ විට අධිකරණයේ සාමාන්‍ය කාර්ය වන්නේ චූදිතයාට දඬුවම් කිරීම වේ. සාමාන්‍යයෙන් පහත ආකරයට දණ්ඩන ක්‍රියාදමයන් අනුගමනය කරනු ලැබේ. එය සෘජුය. කාර්යපටිපාටිය සුදුසුකම මත අවසන් කරන අතරම හෝ අධිකරණයේ අභිමතය පරිදි එය පසු දිනයක ද සිදු කළ හැක. (සාමාන්‍යයෙන් එක් පාර්ශවයකට එම ක්‍රියාදමය පසු දිනයකට තබන්නැයි ඉල්ලීමක් කළ හැක.)

සිදුකළ අපරාධයට සාමාන්‍යයෙන් අධිකරණය දඬුවම් පැමිණවීමේදී අදාළ ව්‍යවස්ථාවේ පරාසය අනුව එය සිදුකළ යුතුව ඇත.

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ දඬුවම් පැමිණවීමේ පරාසය තුළ දඬුවම නියම කර තිබේ.

(11.1.2) ශ්‍රී ලංකාවේ දණ්ඩන රාමුව.

ලිඛිත නීතයේ නියමිත යම් දඬුවමක් හෝ වෙනත් දණ්ඩනයක් මහේස්ත්‍රාත් අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 13 වන වගන්තිය)

මහේස්ත්‍රාත් අධිකරණය අනුව දණ්ඩනයන් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 14 වන වගන්තියේ සඳහන් කර ඇත. මෙයට පහත දේ ඇතුළත්ය;

(අ) අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමක්;

(ආ) රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයක්;

(ඇ) (මෙයට 2005 අංක 21 පනතේ 2 වැන්න ආදේශ වේ;

(ඈ) ඉහත කී දණ්ඩන නියමවලින් කවර හෝ දණ්ඩන නියම දෙකක් ඒකාබද්ධ කරන නීත්‍යානුකූල දණ්ඩන නියමයක් (මෙය 2005 අංක 21 පනතේ 2 වන වගන්තියේ සංශෝධනය වී තිබේ.)

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 15 (1) වන වගන්තිය මෙසේ සඳහන් කරයි. එනම් දින හතකට අඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමක් නොකළ යුතු බව.

"මේ සංග්‍රහයෙහි, දණ්ඩන නීති සංග්‍රහයෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක ට පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් හෝ නොඑසේම හෝ යම්

අධිකරණයක් විසින් කිසිම තැනැත්තු දින හතකට අඩු කාලයක් බන්ධගාරගත කිරීමේ දණ්ඩන ඇගයීමක් නොකළ යුතුය"

මෙම සංග්‍රහය, බන්ධනාගාරගත කිරීම වෙනුවට අධිකරණයේ සීමාව රඳවා තැබීමේ දණ්ඩන නියමය පනවනු ලබයි.

"දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් හෝ එසේම වරදකරුව බන්ධනාගාරගත කිරීමට යම් ලිඛිත හෝ වෙනත් නීතියකින් යම් අධිකරණයකට බලය ලැබී ඇති අවස්ථාවක, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට; ඒ අධිකරණය විසින් ආඥාවක් කිරීමෙන්, ඒ ආඥාව කරන දිනයේ අපර භාග 8 නොඉක්මවන්නා වූ ඒ අධිකරණය විසින් ඒ ආඥාවෙහි නියම කරනු ලබන කාලයක් ඒ වරදකරු ඒ අධිකරණයේ සීමාව තුළ රඳවා තැබිය යුතු බවට ආඥාවක් කරනු ලැබිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 15 (2) වන වගන්තිය)

යම් චූදිතයකු දඩයක් ගෙවීම පැහැර හරින විට ඔහුව සිරගත කිරීමේ දඬුවමක් නියම කිරීමට අධිකරණ වලට බලය ඇත.

(3) දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නියම කිරීමට නීතියේ බලය දී ඇති කාලයක බන්ධනාගාරගත කිරීමක් යම් අධිකරණයක් විසින් ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකිය. එසේ වුවද එසේ නියම කරනු ලබන කාලය මේ සංග්‍රහය යටතේ ඒ අධිකරණයේ බලතල නොඉක්මවන කාලයක් විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහ පනත 15 (2) වන වගන්තිය)

එක් නඩු විභාගයකදී වැරදි කිහිපයක්ම වරදකරු වූ චූදිතට දඬුවම් පැමිණවීමේදී අපරාධ නඩු වධාන සංග්‍රහය පනතේ 16 (1) වන වගන්තියේ පහත ලෙස තීරණය කර ඇත.

යම් තැනැත්තකු එකම නඩු විභාගයකදී යම් අපරාධ වැරදි දෙකකට හෝ ඊට වැඩි ගණනකට වරදකරු කරනු ලැබූ විට, ඒ වැරදි සඳහා නියමිත වූද, නියම කිරීමට ඒ අධිකරණයට බලය ඇත්තාවූ ද වෙන් වෙන් දඬුවම් 301 වන වගන්තියේ විධි විධානවලට යටත්ව එම තැනැත්තාට අධිකරණය විසින් නියම කළ හැකිය. එම දඬුවම් බන්ධනාගාරගත කිරීම් වලින් ආරම්භ වන කල්හි ඒ බන්ධනාගාරගත කිරීම් හෝ ඉන් කිසිවක් එකවිට නොවිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබුවහොත් මිස, වැරදි කීපයම සහ මුළු දඬුවම්වල එකතුව, එසේ තනි වරදකට වරදකරු කරනු ලැබීමේදී නියම කිරීමට ඒ අධිකරණයට බලය ඇති දඬුවම ඉක්මවන අවස්ථාවක වුවද ඒ අධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයට එක් බන්ධනාගාරගත කිරීමක් අවසන් වන විට අනිත් බන්ධනාගාරගත කිරීම ආරම්භ විය යුතුය.

එසේ වුවද, නඩුව මෙහේස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කරනු ලැබේ නම්, මුළු දඬුවම, ඒ අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී නියම කිරීමට ඒ අධිකරණයට බලය ඇති දඬුවමේ ප්‍රමාණයෙහි දෙගුණයකට වැඩි නොවිය යුතුය.

<u>(11.1.3) දඬුවම් පැමිණවීම; ලිහිල් කිරීම සහ වැඩිකරන කරුණු.</u>

<u>(11.1.3.1) සාමාන්‍යය</u>

සාමාන්‍යයෙන් අධිකරණයක් දණ්ඩනයක් පැමිණවීමේදී එය ඉදිරියේදී චෝදක සහ විත්තිය යන දෙපාර්ශවයම ඒ පිළිබඳව අධිකරණයට කරුණු දැක්වීමට අවස්ථාවක් දිය යුතුය. සාමාන්‍යයෙන් චෝදක, දඬුවම වැඩි කිරීමට තර්ක කරන අතර විත්තිය එය අඩු කිරීමට තර්ක කරනු ඇත. අධිකරණය ඉදිරියේ විවිධ තොරතුරු ඇත. එයට පහත සඳහන් දේ ඇතුළත්ය;

- චූදිතගේ අපරාධ ඉතිහාසය (පෙර වැරදි);
- චෝදනාව සහ අපරාධයේ ස්වභාවය;

- යම් විශේෂිත ප්‍රදේශයකට හෝ ප්‍රජාවක අදාළ අපරාධය පිළිබඳ අදාළත්වය;
- වින්දිතගේ අභිලාෂයන්;
- වැරදිකරුගේ අභිලාෂයන්;
- ප්‍රජාවේ අභිලාෂයන්;
- චූදිතගේ පුද්ගලික තත්ත්වය (අධ්‍යාපන මට්ටම, ළමුන්, සිවිල් තත්ත්වය සහ රැකියාවේ තත්ත්වය;
- චූදිත සිය පශ්චත්තාපය ප්‍රකාශ කළාද?
- අපරාධය සිතා මතා කර තිබීම සහ එසේ වූ විට එහි මට්ටම;
- අපරාධයේ බරපතලකම;
- අපරාධය සිදුවූ වාතාවරණය (උදාහරණයකට චූදිතව ප්‍රකෝප කිරීම හෝ එසේ විශේෂිත චූදිතයකුගේ සහභාගිත්වයේ මට්ටම;
- මෙම සමාන වැරදි සඳහා නඩුවේ අධිකාරීත්වය අතර සබඳතාවය;
- පූර්ව දණ්ඩන වාර්තා මගින් සාක්ෂි ඉදිරිපත් කිරීම; (සුදුසු වන විට)

විනිසුරුවරයා දඬුවම තීරණය කිරීමේදී චෝදක සහ විත්තිය ලබාදුන් කරුණු සලකා බලනු ඇත. එය චූදිත ප්‍රකාශයක් කිරීමට කැමතිව සිටීම හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා ප්‍රකාශයක් කිරීමට කැමැත්තෙන් සිටින විට අදාළ වේ.

(මෙම පහත තත්ත්වය සාමාන්‍යයෙන් චූදිත වෙනුවෙන් නීතිඥ මඩුල්ල, එක පාර්ශවයකට ලෙස අධිකරණය ඇමතීම පිළිබඳව අදාළ වේ).

(11.1.3.3) උපදෙසක් දිය යුතුව ඇත. එනම් සුදුසු අවස්ථාවේදී දණ්ඩන පැවරීම පිළිබඳ නඩුවේදී තර්ක අවසන් කිරීමේදී පහත කරුණු සැලකිල්ලට ගත යුතුව ඇත.

- චූදිතගේ පුද්ගලික තොරතුරු ඉතිහාසය සවිස්තරාත්මකව ලබාගත යුතු අතර එයට පහත දේ ඇතුළත් වේ. ඒ අනෙක් දේවලට අතිරේකවය. එනම් ධනාත්මක පුද්ගලික සාර්ථකත්වය, ස්වේච්ඡා වැඩ/සහ/හෝ/ප්‍රජා සේවය (මෙම ක්‍රියාදාමය චූදිත මානුෂික කිරීමට අදාළය).
- සිරගත කිරීමට හැකි අයෙකුගේ විකල්පයන් එනම් ප්‍රජා සේවා, පරිවාස, නිවාස, සිර අඩස්සිය සහ/හෝ අර්ධ නිවාස වල තැබීම) මෙය රඳවා තබා නොගත යුතු දණ්ඩන නීතිවලට අදාළ වේ.
- නිශ්චිත ප්‍රජා සේවා;
- මනෝ විද්‍යාත්මක උපදේශනය;
- වරද සිදු කිරීම පිළිබඳව වින්දිතයාට වන්දි පිරිනැමීම පිළිබඳ පසුතැවිල්ල ගැන ප්‍රකාශය;
- චූදිතව පුනරුත්ථාපනය කිරීම පිළිබඳව වූ ඉඩ කඩ;
- නිශ්චිත රැකියා අවස්ථා/විස්තරාත්මක වැඩ පිළිබඳ ඉතිහාසය;
- චෝදකගේ සාක්ෂි මගින් දණ්ඩනය වැඩි කිරීමට එරෙහිව අනෙකුත් එම තත්ත්වය අඩුකරන තත්ත්වයන්;

විත්තියේ නීතිඥවරයාගේ භූමිකාවට පහත කරුණ අනිවාර්යෙන් අදාළ වේ. එනම් අධිකරණයට චූදිත පිළිබඳ සියලු ධනාත්මක තොරතුරු ලබාදීම් වශයෙන් දණ්ඩනය නියම කිරීමට සහය විය යුතුය.

නීතිඥවරයා, සැලකිල්ලට ගතයුතු දෙයක් තිබේ. එනම් ළමා හා තරුණ තැනැත්තන් පිළිබඳ නඩුවකදී, එම දඬුවමට එරෙහිව නඩු විභාග කිරීමේදී(විශේෂයෙන් දීර්ඝ කාලීන සිර දඬුවම් සාමාන්‍ය වැඩිහිටි වයසේ සිටන චූදිතයකුට) වඩා ප්‍රබල වන බවය. තවත් අත්‍යාවශ්‍යය කරුණක්

ඇත. ඒ නීතිඥවරයා ළමයකු හෝ තරුණ චූදිතයකු නියෝජනය කරන විට චෝදක පක්ෂය සමග සහ අධිකරණය සමග දණ්ඩන නියමය කිරීමේ ක්‍රියාදාමයේදී කටයුතු කළයුතු අතරම සෘජුව සිරගත කිරීමට වඩා අනෙකුත් විකල්ප දණ්ඩන නියමයන් සොයා ගත යුතුය.

76 වන වගන්තියේ සඳහන් අවස්ථාවේදී චූදිතයාට විරුද්ධව එක් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබූ ඒ වගන්තියේ විධි විධාන යටතේ ඔහුට විරුද්ධව චෝදනා නැගිය හැකිව තිබුණු වෙනත් වරදක් ඔහු විසින් කර තිබෙන බව සාක්ෂිවලින් පෙනී ගියහොත්, ඒ වරද සම්බන්ධයෙන් ඔහුට චෝදනා නගනු නොලැබුව ද, ඔහු විසින් කරන ලදැයි ඔප්පු කරනු ලැබූ ඒ වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබිය හැක. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 177 වන වගන්තිය)

වරදක් කිරීමට සම්බන්ධ සියලුම තැනැත්තන්ට විරුද්ධව එකට චෝදනා නැගිය හැකි බව. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 180 වන වගන්තිය)

නිදර්ශන

(අ) “ඒ” හා “බී” එකම මිනී මැරුම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටිති. මිනී මැරම සම්බන්ධයෙන් “ඒ” ට සහ “බී” ට විරුද්ධව අධිචෝදනා කර එකම නඩු විභාග කරනු ලැබිය හැකිය.

(11.1.4) සිර දඬුවම් කිරීමේ ප්‍රතිඵල.

(11.1.4.1) වරදකරු කරනු ලැබූ විට වන්දි ගෙවීම.

අපරාධ නඩු විධාන සංග්‍රහය 17 (4) යම් තැනැත්තකු යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ කවර අවස්ථාවක වුවද, නැතහොත් චෝදනාව ඔප්පු වී ඇතැයි අධිකරණය තීරණය කළද වරදකරු නොකොට අධිකරණය වරදකරු සම්බනධයෙන් ක්‍රියාකරන අවස්ථාවක, වන්දි වශයෙන් අධිකරණයට සුදුසු යයි පෙනෙන මුදලක් අධිකරණය විධාන කරනු ලබන කාලය ඇතුළත හෝ එසේ විධාන කරනු ලබන වාරික වලින් හෝ ඒ වරදින් පීඩාවට පත් යම් තැනැත්තකුට ගෙවන ලෙස වරදකරු කරනු ලැබූ හෝ චෝදනා ඔප්පු වී ඇතැයි අධිකරණය තීරණය කරනු ලැබූ හෝ තැනැත්තන්ට අධිකරණය විසින් ආඥා කළ හැකිය.

(5) 4 වන උප වගන්තියෙහි සඳහන් වරදකරුවන් වයස අවුරුදු දහසයට අඩු නම් ඔහුගේ දෙමාපියන් විසින් හෝ භාරකරු විසින් හෝ ගෙවීම සුදුසු යයි අධිකරණය සැලකුවහොත් එසේ ගෙවිය යුතු යයි අධිකරණය විසින් ආඥා කළ හැකිය.

(6) ගාස්තු වශයෙන් හෝ වන්දි වශයෙන් හෝ මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් මුදලක් අධිරණය විසින් නියම කරන දඩයක් ලෙස අයකර ගනු ලැබිය යුතුය.

(7) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වන්දි නියම කරනු ලබන විට, ඒ වන්දිය එක් එක් අපේක්ෂිත පාර්ශවයට රුපියල් පන්සියයක් නොඉක්මවිය යුතුය. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ (291) වන වගන්තියේ දඩ ගැසීමේ දණ්ඩන නියමයන්ට අදාළ විධි විධාන දක්වා ඇත.

(11.1.4.2) ප්‍රජා සේවා ආඥා

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 18 (1) වගන්තිය පහත විධි විධාන දක්වා තිබේ.

(18.1) රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන හෝ ව්‍යාපෘතියක නම් කරන ලද ස්ථානයක දී නියම කරන ලද සේවයක් ඉටුකරන ලෙස තැනැත්තකුට විධාන කරන ආඥාවක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදා ඇත්නම් චූදිත තැනත්තකු වරදකරු කොට බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයන් කිරීම වෙනුවට හෝ දඩයක් ගෙවීම පැහැර හැරීමේදී චූදිත

තැනත්තකුට බන්ධනාගරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට අධිකරණය විසින් මෙහි මින් මතු "ප්‍රජා සේවා ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන ආඥාවක් නියම කරනු ලැබිය යුතුය.

(2) ප්‍රජා සේවා ආඥාවක කාල සීමාව මහේස්ත්‍රාත්වරයකු විසින් ආඥාව කරනු ලැබූ විට එක් අවුරුද්දකට වැඩි නොවිය යුතු අතර, මහාධිකරණයක් විසින් කරනු ලැබූ විට අවුරුදු තුනකට වැඩි නොවිය යුතුය.

(3) ප්‍රජා සේවා ආඥාවක් කරනු ලැබුවේ යම් වරදකරුවකු කරනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා නම් කරන ලද වැඩ කළ යුතු ස්ථානයට පැමිණීම පැහැර හරී නම් හෝ පැමිණ ඇතිද නියම කරන ලද සේවය කිරීම පැහැර හරියි නම් හෝ පැමිණීම අමතක නම් හෝ කලට හෝ වේලාවට නොපැමිණියේ නම් හෝ ව්‍යාපෘතියේ කළමනාකාරිත්වය සෑහීමට පත්වන පරිදි වැඩ නොකරයි නම් හෝ අන් ලෙසකින් ප්‍රජා සේවා ආඥාව අනුව ක්‍රියාකිරීම පැහැර හරියි නම්, ඒ ආඥාව සටහන් කළ අධිකරණය විසින්, ඒ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කොට ඒ අධිකරණය සුදුසු යැයි කල්පනා කරන බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(11.1.4.3) බන්ධනාගාරගත කිරීම.

කිසිම තැනැත්තකු දින හතකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමට දඬුවමක් නොකළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 15 (1) වන වගන්තිය)

(11.1.4.4) බන්ධනාගාරගත කිරීමේ අත්හිටවූ දණ්ඩන නියමය.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 303 වන වගන්තිය පහත සඳහන් ආකාරයට කරුණු දක්වා තිබේ.

303 (1) වරදක් සඳහා වරදකරුවකුට අවරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කළ අධිකරණය විසින්, ආඥාවෙහි දින සිට අවුරුදු පහකට නොඅඩු වූ ද ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද (මෙහි මින් මතු,"ක්‍රියාත්මක වන කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාලයක් තුළදී ඒ වරදකරු විසින් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි (මෙහි මින් මතු "සඳහන් කළ වරද" යනුවෙන් සඳහන් කරනු ලබන වෙනත් වරදක් කරනු ලැබුවහොත් මිස, ඒ දණ්ඩන නියමය ක්‍රියාත්මක නොකළ යුතු යැයි ආඥාවක් කළ හැකිය.

(2) කලින් බන්ධනාගාරගත කරනු ලැබ නොමැති වරදකරුවකු එක් වරදක් සඳහා මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරන අධිකරණයක් විසින්;

(අ) සාහසික ක්‍රියාවක් කිරීම නොහොත් කරන බවට තර්ජනය කිරීම හෝ තුවක්කුවක්, පුපුරණ ද්‍රව්‍යයක් හෝ පීඩාකාරී ආයුධයක් පාවිච්චි කිරීම නොහොත් සන්තකයේ තබා ගැනීම ඒ වරදට සම්බන්ධ නම් මිස;

(ආ) ඒ වරද සම්බන්ධයෙන් පරිවාස ආඥාවක් හෝ කොන්දේසි පිට නිදහස් කිරීමේ ආඥාවක් හෝ මුලින් කර තිබුනේ නම් මිස හෝ;

(ඇ) ඒ වරද කළ වේලාවේදී ඒ වරදකරු අත්හිටවූ දණ්ඩන නියමයකට යටත්ව සිටියේ නම් මිස; හෝ

(ඈ) විවස්ථාගත කරුණු අනුව මේ උපවගන්තියේ ප්‍රකාර වරදකරු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම ලිඛිතව සඳහන් කළ යුතු හේතු නිසා සුදුසු නොවේ යයි අධිකරණයේ මතය වන්නේ නම් මිස;

(1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කළ යුතුය.

(11.1.4.5) විත්තිකරුවන් කොන්දේසි පිට නිදහස් කිරීමේ ආඥාව - අපරාධ නඩු විධාන සංග්‍රහය 306 වගන්තියේ පහත ආකරයට සඳහන්ව ඇත.

(1) යම් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් දඬුවම් පමුණුවනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව ඒ අධිකරණය ඉදිරියෙහි චෝදනා නගනු ලැබ, චෝදනාව ඔප්පු වී ඇතැයි අධිකරණය කල්පනා කරන නමුත් චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාගේ චරිතය, පූර්ව ක්‍රියා කලාපය, වයස, සෞඛ්‍යය හෝ මානසික තත්ත්වය හො වරදේ අල්ප ස්වභාවය නැතහොත් වරද කරනු ලැබූ අවස්ථාවෙහි පැවති වන්දිකාරක කරුනු සැලකිල්ලට ගත් විට, ඒ තැනැත්තා ට නාම මාත්‍ර දඬුවමක් නොවන වෙනත් යම් දඬුවමක් නියම කිරීම යෝග්‍ය නොවන බව හෝ මෙහි මින් මතු විධි විධාන සලස්වා ඇති පරිදි වරදකරු කොන්දේසි පිට නිදහස් කිරීම යෝග්‍ය වන බව හෝ අධිකරණයේ මතය වන අවස්ථාවක ඔහු වරදකරු කිරීමට ක්‍රියා නොකොට, අධිකරණය විසින් ,

(අ) සුදුසු යයි අධිකරණයට පෙනෙන යම් අවවාදයක් කිරීමෙන් පසු ඒ වරදකරු නිදහස් කරන ලෙස ආඥාවක් කරනු ලැබිය හැකිය; නැතහොත්

(ආ) යහපත් හැසිරීමෙන් යුක්ත වන බවට සහ අධිකරණයේ ආඥාවෙහි සඳහන් කරනු ලබන්නා වූද අවරුදු තුනක් නොඉක්මවන්නා වූ ද යම් කාලයක් ඇතුළත යම් අවස්ථාවකදී වරදකරු කිරීම සඳහා හා දණ්ඩන නියමයක් කිරීම සඳහා පෙනී සිටින ලෙස නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට වරදකරු ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට, වරදකරු කොන්දේසි පිට නිදහස් කරනු ලැබිය හැකිය.

(2) බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි යම් වරදක් සම්බන්ධයෙන් අධි චෝදනා පත්‍රයක් මත යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ, චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාගේ චරිතය පූර්ව ක්‍රියාකලාපය, වයස, සෞඛ්‍යය, හෝ මානසික තත්ත්වය හෝ වරදේ අල්ප ස්වභාවය නැතහොත් වරද කරනු ලැබූ අවස්ථාවෙහි පැවති වන්දිකාරක කරුනු සැලකිල්ලට ගත් විට, නාම මාත්‍ර දඬුවමක් නොවන වෙනත් යම් දඬුවමක් ඒ තැනැත්තාට නියම කිරීම යෝග්‍ය නොවන බව හෝ මෙහි මින්මතු විධි විධාන සලස්වා ඇති පරිදි වරදකරු කොන්දේසි පිට නිදහස් කිරීම යෝග්‍ය වන බව හෝ අධිකරණයේ මතය වන අවස්ථාවක, ඔහුව බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට, යහපත් හැසිරීමෙන් යුක්ත වන බවට සහ ආඥාවෙහි සඳහන් කරනු ලබන්නා වූ ද අවුරුදු තුනක් නොඉක්ම වන්නා වූ ද යම් කාලයක් ඇතුළත යම් අවස්ථාවකදී දණ්ඩන නියමයක් කිරීම සඳහා පෙනි සිටින ලෙස නියම කරනු ලැබූ විට එසේ පෙනී සිටින බවට වරදකරු ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට, වරදකරු කොන්දේසි පිට නිදහස් කරමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකිය.

(3)

(i) උපවගන්තියේ හෝ (2) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් කරනු ලබන යම් ආඥාවකට අතිරේකව අධිකරණය විසින්

(ii) රජයේ ගාස්තු වශයෙන් සුදුසු යයි අධිකරණය කල්පනා කරන පරිදි රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන මුදලක් ගෙවන ලෙස වරදකරුට ආඥාවක් කළ හැකිය.

(4) මේ වගන්තිය යටතේ වූ ආඥාවක් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් කරනු ලැබූ අවස්ථාවක සොරකම් කරන ලද දේපලක් ආපසු පවරා දීමේ හෝ ප්‍රතිස්ථාපනය කිරීමේ කාර්යය සඳහා සහ අයිතිකරු වෙත දේපල නැවත ලබාදීම හෝ භාර දීම සම්බන්ධයෙන් හා එසේ නැවත ලබාදුන් විට හෝ භාර දුන් විට නැතහොත් ඒ සම්බන්ධයෙන් මුදල් ගෙවීම සම්බන්ධයෙන් ආඥා කිරීමට අධිකරණයට හැකි කිරීමේ කාර්යය සඳහා ඒ වරදකරු කරවීමකදී ඇති වන බලපෑම ඒ ආඥාවෙහි තිබිය යුතුය.

මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ යුතු වරදකට වරදකරු වන වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම පුද්ගලයකුට අධිකරනය විසින් දඬුවම් කළ හැකි අතර, එයට දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තියට අනුව මරණීය දණ්ඩණයෙන් දඬුවම් කළ හැක. මෙය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 281 වන වගන්තියේ දක්වා ඇත.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 285 වන වගන්තියට අනුව එවැනි මරණ දඬුවමක් ලැබූ පුද්ගලයකු ජනාධිපතිවරයා තීරණය දිනයක සහ ස්ථානයකදී මිය යන තුරු බෙල්ලෙන් එල්ලා තැබිය හැක.

(11.1.4.7) කාන්තාවන්

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 282 වන වගන්තිය පහත ආකරයට සඳහන් කරයි;

282 (1) මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ ස්ත්‍රියක තමා ගර්භණියකැයි කියා සිටින අවස්ථාවක හෝ ස්ත්‍රියක එසේ වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය විසින් ඒ ස්ත්‍රිය ගර්භණියක ද නැද්ද යන ප්‍රශ්නය නිශ්චය කිරීම යෝග්‍යය යයි කල්පනා කරන අවස්ථාවක, ඒ ස්ත්‍රිය විෂයෙහි දණ්ඩ නියමය නියම කිරීමට පෙර;

(අ) ඒ ස්ත්‍රීන් වරදකරු කරන ලද්දේ මහාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගෙන් තිදෙනෙකු විසින් ජූරි සභාවක් නැතිව විශේෂ නඩු විභාගයකින් පසුව නම් ඒ විනිශ්චයකාරවරයා විසින්; හෝ

(ආ) ඒ ස්ත්‍රිය වරදකරු කරන ලද්දේ ජූරි සභාවක් මගින් පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසුව නම්, ඇය වරදකරු කිරීමේ තීරණය දුන් ජූරි සභාව විසින් (මෙහිදී ඒ ජූරි සභාවේ සභිකයන් නැවත දිවුර වීම අවශ්‍යය නොවේ.) ඒ ප්‍රශ්නය තීරණය කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය (ආ) ඡේදය යටතට පත්වන අවස්ථාවලදී ගර්භණියක ද නැද්ද යන ප්‍රශ්නය පිළිබඳව තීන්දුවක් දීමට පෙර ඒ පරීක්ෂණය පැවැත්වුනු කාලය මුළුල්ලේම යම් ප්‍රමාණවත් හේතුවක් නිසා පැමිණ සිටීමට යම් ජූරි සභිකයකුට නොහැකි වුවහොත් හෝ යම් ජූරි සභිකයකු නොපැමිණිය හොත් සහ ඔහුට පැමිණ සිටීමට බල කළ නොහැකි නම් හෝ සාක්ෂි දෙනු ලබන්නේ යම් භාෂාවකින් ද ඒ භාෂාව හෝ සාක්ෂි භාෂණ පරිවර්තනය කරනු ලබන විටක, එය එසේ භාෂණ පරිවර්තනය කරනු ලබන්නේ යම් භාෂාවකට ද ඒ භාෂාව හෝ තේරුම් ගැනීමට යම් ජූරි සභිකයකුට නොහැකි යයි පෙනී යතහොත් ජූරි සභාව විසුරුවා හැර අලුත් ජූරි සභාවක් තෝරා ගන්නා ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය.

(ආ) නිශ්චය කිරීමට ඇති ප්‍රශ්නය පිළිබඳව ඒකමතිකව හෝ දෙකට පහ යන ප්‍රමාණයට නොඅඩු වැඩි ඡන්දයෙන් හෝ එකඟතාවයට පැමිණීමට ජූරි සභාවට නොහැකි වේ නම් නැතහොත් ජූරි සභාව විසුරුව හැර අළුත් ජූරි සභාවක් පත් කිරීම යුක්තිය ඉටු කිරීම පිණිස අවශ්‍යය වන බවට අධිකරණයේ මතය වේ නම් අධිකරණය විසින් ජූරි සභාව විසුරුවා හැර අළුත් ජූරි සභාවක් තෝරා ගන්නා ලෙස ආඥා කළ හැකිය;

(ඇ) මේ උත්සාහය (අ) ඡේදය යටතේ හෝ (ආ) ඡේදය යටතේ අළුත් ජූරි සභාවක් තෝරා ගන්නා ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලබන අවස්ථාවකදී නඩු විභාගයක් සඳහා තෝරා ගනු ලබන ජූරි සභාවක් සංයුක්ත වන ආකාරයෙන්ම ඒ ජූරි සභාව ද සංයුක්ත විය යුතුය. ඒ සැම ජූරි සභාවක්ම සහ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ අළුතින් එකතු කරන ලද සෑම අළුත් ජූරි සභිකයකුටම, අධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයකින් දිවුරනු ලැබිය යුතුය.

(3) ස්ත්‍රිය විසින් හෝ චෝදක පක්ෂය විසින් හෝ අවස්ථාවෝචිත පරිදි විනිශ්චයකාරවරයාට නැතහොත් ජූරි සභාවට ඉදිරිපත් කරනු ලබන සාක්ෂි මත, ඒ ස්ත්‍රිය ගර්භණී ද නැද්ද යන ප්‍රශ්නය ඒ විනිශ්චයකාරවරයන් හෝ ජූරි සභාව හෝ සෑහීමට පත්වන අන්දමට නියත වශයෙන්ම ඔප්පු

කරනු ලැබුවහොත් මිස ඒ විනිශ්චයකාරවරයා හෝ ජූරි සභාව විසින් ඒ ස්ත්‍රිය ගර්භණී නොවන බව;

(4) ස්ත්‍රිය ගර්භණී බව තීරණය කරන ලද්දේ නම්, අධිකරණය විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 54 වන වගන්තියේ විධි විධාන සලස්වා ඇති පරිදි බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය, මරණීය දණ්ඩනය වෙනුවට ඒ ස්ත්‍රිය විෂයෙහි ප්‍රකාශ කළ යුතුය.

<u>(11.1.4.8) අදාළ ව්‍යවස්ථා.</u>

<u>(11.1.4.8.1) මහේස්ත්‍රාත් අධිකරණය මහේස්ත්‍රාත්වරයා විසින් නඩු විභාග කිරීම.</u>

185. චෝදක පක්ෂයේ සහ විත්ති පක්ෂයේ සාක්ෂි මහේස්ත්‍රාත්වරයා විසින් එය මෙහෙය වීමෙන් ඉදිරිපත් කිරීමට සලස්වනු ලබන වැඩිදුර සාක්ෂි කිසිවක් වෙතොත් ඒ සාක්ෂි ද ගැනීමෙන් පසු චූදිතයා වරදකරු නොවේ යයි මහේස්ත්‍රාත්වරයා තීරණය කරතහොත් නිදෙස් කිරීමේ තීන්දු ප්‍රකාශයක් මහේස්ත්‍රාත්වරයා විසින් නොපමාව වාර්තාගත කරනු ලැබිය යුතුය. චූදිතයා වරදකරු යයි මහේස්ත්‍රාත්වරයා තීරණය කරතහොත් වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් ඔහු විසින් නොපමාවම වාර්තාගත කොට නීතිය අනුව චූදිතයාට දණ්ඩනය නියම කොට ඒ දණ්ඩන නියමය වාර්තාගත කරනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 185 වන වගන්තිය)

මහේස්ත්‍රාත් අධිකරණය පහත දණ්ඩනයන් පැනවිය යුතුව ඇත.

14. පහත දැක්වෙන දණ්ඩන නියම අතුරින් යම් දණ්ඩන නියමයක් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නියම කළ හැකිය :-

(අ) අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමක්;

(ආ) රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයක්;

(ඇ) ඉහත කී දණ්ඩන නියම වලින් කවර හෝ දණ්ඩන නියම දෙකක් ඒකාබද්ධ කරන නීත්‍යානුකූල දණ්ඩන නියමයන්;

<u>(11.1.4.8.2) මහාධිකරණය ජූරි සභාවක් විසින් නඩු විභාග කිරීම.</u>

13. ලිඛිත නීතියේ නියමිත යම් දඬුවමක් හෝ වෙනත් දණ්ඩනයක් මහාධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත)

235 (1) විනිශ්චයකාරවරයා විසින් අන්‍යාකාරයකින් ආඥා කරනු ලැබුවහොත් මිස, යම් චෝදනා සම්බන්ධයෙන් චූදිතයාට විරුද්ධව නඩු විභාග කරනු ලැබීද, ඒ සියලුම චෝදනා සම්බන්ධයෙන් ජූරි සභාව විසින් තීරණයක් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර ඔවුන්ගේ තීරණය කුමක්දැයි නිසැකවම දැන ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රශ්න විනිශ්චයකාරවරයා විසින් ඔවුන්ගෙන් ඇසිය හැකිය.

(2) ජූරි සභාව විසින් ප්‍රකාශ කරන ලද තීරණය විනිශ්චයකාරවරයා විසින් අනුමත කරනු නොලබන්නේ නම් ඔවුන්ගේ තීරණය නැවත සලකා බලන ලෙස විනිශ්චයකාරවරයා විසින් ඔවුන්ට විධාන කරනු ලැබිය හැකි අතර, එසේ නැවත සලකා බැලීමෙන් පසු දෙනු ලබන තීරණය නියම තීරණය ලෙස සලකනු ලැබිය යුතුය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත)

චූදිතයා වරදකරු කරනු ලැබුවහොත් විනිශ්චයකාරවරයා විසින් නොපමාව හෝ සාධාරණ කාලයක් ඇතුළත හෝ නීතිය අනුව ඔහු සම්බන්ධයෙන් නඩු තීන්දුව දිය යුතුය;

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 238 වන වගන්තිය)

(11.1.4.8.3) මහාධිකරණය - විනිසුරු විසින් නඩු විභාග කිරීම.

203. චෝදක පක්ෂය හා විත්ති පක්ෂය වෙනුවෙන් කරුණු දැක්වීම අවසන් කරනු ලැබූ විට, විනිශ්චයකාරවරයා විසින් වහාම හෝ නඩු විභාගය අවසන් කොට දින දහයක් ඇතුළත, නිදෙස් කිරීමේ හෝ වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් ඒ සඳහා තම හේතු සඳහන් කරමින් වාර්තා ගත කරනු ලැබිය යුතුය; තවද තීන්දු ප්‍රකාශය වරදකරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් නම් නීතිය අනුව චූදිතයා වෙත දණ්ඩන නියමයක් කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 203 වන වගන්තිය)

(11.2) අභියාචනා.

(11.2.1) සාමාන්‍ය.

අපරාධ නඩුවකදී යම් අධිකරණයක් විසින් දෙන ලැබූ තීන්දුවකට හෝ අවසන් නියෝගයකට එරෙහිව ඒ පිළිබඳව අතෘප්තිමත් වන ඕනෑම පුද්ගලයකුට නීතිය හෝ තොරතුරක් පිළිබඳ වරදක දී අභියාචනාධිකරණයට අභියාචනා කළ හැක.

(11.2.2) මහේස්ත්‍රාත් අධිකරණයේ සිට අභියාචනා අධිකරණයට.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 320 (1) වන වගන්තියේ මහේස්ත්‍රාත් අධිකරණයේ ආඥාවකට විරුද්ධව අභියාචන කිරීම පිළිබඳ කාර්යපටිපාටිය සහ රෙගුලාසි දක්වා ඇත;

ඕනෑම මහේස්ත්‍රාත් අධිකරණයක් ප්‍රකාශ කරන්නා වූ ඕනෑම තීන්දුවකට හෝ අවසන් ආඥාවකට විරුද්ධව එවන් අගතියට පත් පාර්ශවයකට එවැනි තීන්දුවකින් එනම් නීතිය හෝ තොරතුරක් සම්බන්ධ වැරදීමක් පිළිබඳව අභියාචන අධිකරණයට අභියාචනය කළ හැක :-

(අ) ඒ නඩු තීන්දුව දෙනු ලැබූ හෝ ආඥාව කරනු ලැබූ දිනයේ සිට දවස් දෑ හතරක් ඇතුළත, අභියාචනාධිකරණය ඇමතූ අභියාචන පෙත්සමක් එකී මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන්, නැතහොත්

(ආ) අභියාචනය කිරීමට තමා බලාපොරොත්තු වන බව හා අභියාචනයට හේතු ඉහත කී කාලය ඇතුළත ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට හෝ අතෘප්තියට පත් තැනැත්තා තත් කාලයේ රඳවා තබනු ලැබ ඇති බන්ධනාගාරයේ ජේලර්වරයාට හෝ ප්‍රකාශ කර රුපියල් පහක වටිනාකම ඇති මුද්දරයක් ඒ සමග සැපයීමෙන් එවිට අභියාචන පෙත්සමක් පිළයෙල කොට, එකී නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ අධිකරණය වෙත එය ඉදිරිපත් කිරීම, අවස්ථාවෝචිත පරිදි, එකී රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ බන්ධනාගාරයේ ජේලර්වරයාගේ හෝ කාර්යය විය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 320 (1) (අ) වන වගන්තිය)

321 (1) අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ගණන් බැලීමේදී, අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට ආඥාවකට විරුද්ධව ද ඒ නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ දිනය ගණන් ගත යුතු නමුත් සියලුම ඉරු දින සහ රජයේ නිවාඩු දින ගණන් ගනු නොලැබිය යුතුය.

(2) අභියාචන පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය ඉකුත්වන දිනය අධිකරණයේ කාර්යාලය වසා ඇති දිනයක් වුවහොත්, ඉන්පසු ඒ කාර්යාලය විවෘත කෙරෙන ඊළඟ ප්‍රථම

දිනයෙහි එය ඉදිරිපත් කරනු ලැබේ නම් එය නිසි කල්හි ඉදිරිපත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

322 (1) සෑම අවස්ථාවකම පෙත්සමකම අභියාචනයට පදනම් වූ කරුණු ලහුඩින් ප්‍රකාශ විය යුතු අතර අභියාචක විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ එය අත්සන් කර තිබිය යුතුය.

(2) අභියාචනය කරනුයේ නීතිය පිළිබඳ කාරණයක් සම්බන්යෙන් වන අවස්ථාවක විවාදයකට භාජනය කළ යුතු එම නීතිය පිළිබඳ කාරණය සම්බන්ධයෙන් වූ ප්‍රකාශයක් පෙත්සමෙහි ඇතුළත් විය යුතු අතර එම නීතිය පිළිබඳ කාරණය අභියාචනාධිකරණය විසින් විනිශ්චය කරනු ලැබීමට සුදුසු ප්‍රශ්නයක් බවට නීතිඥවරයකුගේ සහතිකයක් ද එහි ඇතුළත් විය යුතුය.

(3) ඒ සෑම පෙත්සමකම රුපියල් පහක මුද්දරයක් අලවා තිබිය යුතුය.

(4) අභියාචනයේ තීරණය පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ අභියාචකගේ වාසියට දෙනු ලැබුවහොත්, මුද්දර ගාස්තුවක් ගෙවා ඇති විට එය ඔහුට ආපසු දිය යුතුය.

<u>ඇප දුන් විට අභියාචක මුදාහරිනු ලැබිය යුතු බව.</u>

323 (1) අභියාචනයක් ඉදිරිපත් කර ඇති විට, අභියාචක අත්අඩංගුවේ සිටින්නේ නම්, අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ යම් අධිකරණයකින් ද ඒ අධිකරණය විසින් විධානය කරනු ලබන මුදලකට එසේ විධාන කරනු ලබන පරිදි ඇපකරුවකු හෝ ඇපකරුවන් ඇතිව හෝ නැතිව අභියාචනාධිකරණයේ නඩු තීන්දුව පිළිපදින බවට හා තීන්දු කරනු ලබන නඩු ගාස්තු ගෙවන බවට වූ කොන්දේසි වලට යටත් බැඳුම් ඔප්පුවකට ඒ අභියාචක මුදා හරින ලෙස ආඥා කළ යුතුය.

එසේ වුවද අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින්ද ඒ අධිකරණය සුදුසු යයි කල්පනා කරන්නේ නම්, බැඳුම් ඔප්පුවකට ඇතුළත් වනු වෙනුවට ප්‍රමාණවත් යයි ඒ අධිකරණය සලකන මුදලක් ඒ අධිකරණයේ තැන්පත් කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අභියාචක විසින් වෙනත් යම් ඇපයක් තබනු ලැබිය හැකිය.

(2) අභියාචක එවැනි යම් බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට හෝ ඉහත කී පරිදි වෙනත් යම් ඇපයක් මත හෝ ඔහු අත්අඩංගුවෙන් මුදාහරිනු ලැබිය යුතුය.

(3) අභියාචක සිටින්නේ බන්ධනාගාරයේ නම් ඒ බන්ධනාගාරයේ අධිකාරීවරයා හෝ ජේලර්වරයාගේ ඉදිරියෙහි ඒ බැඳුම් ඔප්පුවට ඇතුළත් විය හැකි අතර, එසේ ඇතුළත් වූ විට, එය එම අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් අධිකරණයකින්ද ඒ අධිකරණය ඉදිරියේදී ඇතුළත් වන ලද්දක් සේ සියලු ආකාරයෙන්ම වලංගු විය යුතුය. තවද අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ සම්බන්ධයෙන් තැබිය යුතු ඇපයේ ප්‍රමාණය සහ ස්වභාවය බන්ධනාගාරගත කිරීමේ බලපත්‍රයෙහි, අධිකරණය විසින් මේ කාර්යය සඳහා පිටපත් කළ යුතුය.

(4) බරපතල වැඩ ඇතිව යම් කාලයකට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් නියම කරනු ලැබූ තැනැත්තකු අභියාචනයක් ඉදිරිපත් කොට ඇත්තාවූ ද එහෙත් නියමිත බැඳුම් ඔප්පුව තැබීමට හෝ වෙනත් ඇපයක් දීමට හෝ ඔහුට නොහැකි වන්නාවූ ද අවස්ථාවක අභියාචනාධිකරණයේ නඩු තීන්දුව බන්ධනාගාරයේ අධිකාරීවරයාට දැනුම් දෙන තුරු ඒ තැනැත්තා බරපතල වැඩ නැතිව අත්අඩංගුවෙහි රඳවා තබාගනු ලැබිය යුතුය.

(5) ඒ අභියාචක එසේ අත්අඩංගුවෙහි සිටි කාලය හෝ එසේ යම් කොටසකින් හෝ ඔහුගේ දණ්ඩන නියමයේ දැක්වෙන කාලයෙන් කොටසක් ලෙස ගණන් ගනු ලැබිය යුතු යයි අභියාචනාධිකරණය විසින් ආඥා කළ හැකිය.

(6) අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර ඇති විට එම අභියාචන පෙත්සම සමග නඩු කටයුතු වාර්තාව මහේස්ත්‍රාත්වරයා විසින් අභියාචනාධිකරණයට යැවිය යුතු අතර, ඒ බව අභියාචනයට විෂය වූ නඩු තීන්දුවක් හෝ ආඥාව හෝ ප්‍රකාශයට පත් කරන ලද්දේ හෝ දෙන ලද්දේ පැමිණිලිකරු වූ නැතහොත් චූදිතයා වූ යම් පාර්ශවකරුවකුගේ වාසියට ද නැතහොත් අභියාචනය ඉදිරිපත් කොට ඇත්තේ යම් පාර්ශවකරුවකුගේ අවාසියට ද ඒ පාර්ශවකරු වෙත අප්‍රමාදව දැනුම් දිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 323 වන වගන්තිය 1 සිට 6 දක්වා)

1. නඩු කටයුතු වාර්තාව සහ අභියාචන පෙත්සම අභියාචනාධිකරණය වෙත යවනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් අභියාචනයට අංක යොදා එය අභියාචන ලැයිස්තුවෙහි ඇතුළත් කරනු ලැබිය යුතු අතර ඒ ලැයිස්තුව අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි එල්ලා තැබිය යුතුය.

2. අභියාචනයේ පාර්ශවකරුවන් වැඩි දුර දැනුම් දීමක් නොමැත. අභියාචනය අංක පිළිවෙල අනුව විභාගයට ගනු ලැබිය යුතුය. එසේ වුවද අභියාචනය පවත්වා ගෙන යාම හෝ අභියාචනයේ ගාස්තු හෝ සම්බන්ධයෙන් නැතහොත් අන්‍යාකාරයකින් සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියමය මත අධිකරණය විසින් සිය මෙහෙය වීමෙන් හෝ පාර්ශවකරුවකුගේ ඉල්ලීමක් පිට හෝ අභියාචන විභාගය ඉක්මන් කිරීම නැතහොත් කල් තැබීම කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 324 (1) සහ (2) වන වගන්තිය)

අභියාචනය විභාගය සඳහා ගනු ලැබූ විට, අභියාචක පැමිණ සිටී නම් අභියාචනය සනාථ කිරීම සඳහා ඔහු ඉදිරිපත් කරන කරුණුවලට පළමුව සවන් දිය යුතු අතර වගඋත්තරකරු පැමිණ සිටී නම්, අභියාචනයට විරුද්ධව ඔහු ඉදිරිපත් කරන කරුණුවලට ඉන් අනතුරුව සවන් දිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 325 (1) වන වගන්තිය)

අභියාචනය විභාග කිරීමේදී මැදිහත් වීමට ප්‍රමාණවත් හේතු නොමැති බව අධිකරණය සලකන්නේ නම් අභියාචනය නිෂ්ප්‍රභා කළ හැකිය; නැතහොත්

(අ) නිදෙස් කිරීමේ ආඥාවට විරුද්ධ වූ අභියාචනයක දී ඒ ආඥාව ප්‍රතිවර්තනය කොට අවස්ථාවෝචිත පරිදි, වැඩිදුර විභාග පවත්වන ලෙස හෝ චූදිතයා නැවත නඩුව විභාගයට භාජනය කරන ලෙස හෝ ඔහුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තබන ලෙස හෝ විධාන කිරීම නැතහොත් ඔහු වරදකරු බව තීරණය කොට ඔහු විෂයෙහි නීතිය අනුව දණ්ඩන නියමයක් කිරීම;

(ආ) වරදකරු කිරීමකට විරුද්ධ වූ අභියාචනයකදී;

(i) තීන්දු ප්‍රකාශය හා දණ්ඩන නියමය ප්‍රතිවර්තනය කොට චූදිතයා නිදෙස් කිරීම හෝ නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඔහුට විරුද්ධව නැවත නඩු විභාග කරනු ලැබිය යුතු යැයි නැතහොත් ඔහුගේ නඩු විභාගය ඉහළ අධිකරණයට තැබිය යුතු යයි ආඥා කිරීම; හෝ

(ii) දණ්ඩන නියමය එසේම තිබියදී තීන්දුව වෙනස් කිරීම හෝ තීන්දුව වෙනස් කරන්නේ නැතිව දණ්ඩන නියමයේ ප්‍රමාණය වැඩි හෝ අඩු හෝ කිරීම හෝ ස්වභාවය වෙනස් කිරීම;

(ඇ) වෙනත් යම් ආඥාවකට විරුද්ධව වූ අභියාචනයකදී ඒ ආඥාව වෙනස් කිරීම, හෝ ප්‍රතිවර්තනය කළ හැකිය.

එසේ වුවද, අභියාචනයක් මත කරනු ලබන දණ්ඩන නියමය මුල් අධිකරණය විසින් නියම කළ හැකිව තබු දණ්ඩන නියමය නොඉක්මවිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 328 වන වගන්තිය)

මේ පරිච්ඡේදය යටතේ අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේදී වැඩිදුර සාක්ෂි අවශ්‍ය යයි අභියාචනාධිකරණය කල්පනා කරන්නේ නම් ඒ වැඩිදුර සාක්ෂි අභියාචනාධිකරණය විසින්ම සටහන් කරන්නේ නම් නැතහොත් ඒ සාක්ෂි සටහන් කරන ලෙස යම් මහේස්ත්‍රාත්වරයකුට විධාන කළ හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 329 (1) වන වගන්තිය)

ඒ සාක්ෂි සටහන් කර ගැනීම, XV වන පරිච්ඡේදය යටතේ වූ පරීක්ෂණයක් ලෙස සලකනු ලැබිය යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 329 (4) වන වගන්තිය)

අභියාචන විභාගය අවසන් වූ විට, අභියාචනාධිකරණය විසින් ඒ අවස්ථාවේදීම හෝ තත්කාර්යය සඳහා ඒ අවස්ථාවේදී නියම කළ යුතු යම් පසු දිනයක හෝ තම තීරණයට හේතු දක්වමින්, නඩු තීන්දුව විවෘත අධිකරණයේදී ප්‍රකාශ කළ යුතුය. (අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 330 (1) වන වගන්තිය)

එසේ නියම කරන ලද දිනයේදී නඩු තින්දුව දීමට අධිකරණය සූදානම් නැත්නම්, ඒ කාර්යය සඳහා තවත් පසු දිනයක් නියම කොට ප්‍රකාශයට පත් කළ හැකිය.

(අපරාධ නඩු විධාන සංග්‍රහය පනත 330 (1) වන වගන්තිය)

ඕනෑම පාර්ශවයකින් මහේස්ත්‍රාත් අධිකරණයේ යම් වරදකින්, දණ්ඩනයකින් හෝ ආඥාවකින් පීඩාවට පත්වන විටදී අභියාචනය කිරීමේ ප්‍රතිපාදන වලට යටත්වන අතරම අභියාචන කිරීමේ අයිතියක් ඇත. (අධිකරණ සංවිධාන පනත, 31 වන වගන්තිය )

<u>(11.2.3) මහාධිකරණයේ සිට අභියාචනාධිකරණය දක්වා.</u>

මහාධිකරණය විසින් යම් වරදකට පුද්ගලයකු වරදකරු කළ විට අභියාචන අධිකරණයට අභියාචන කළ යුතුව ඇත. (අධිකරණ සංවිධාන පනත, 14 වන වගන්තිය)

(11.2.3.1) ජූරි සභාවක් ඇතිව නඩු විභාගය කරන ලද නඩුවක් සම්බන්ධයෙන් වන විට

- (i) තමා වරදකරු කිරීමට විරුද්ධව නීතිය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් ඇතුළත් යම් හේතුවක් මත හෝ,
- (ii) තමා වරදකරු කිරීමට විරුද්ධව සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නැතහොත් නීතිය හා සිද්ධිය මිශ්‍ර ප්‍රශ්නයක් ඇතුළුව යම් හේතුවක් මත හෝ
- (iii) තමා වරදකරු කිරීමේදී කරන ලද දණ්ඩන නියමය නීතියේ නියමිත දණ්ඩන නියමය නොවේ නම්, ඒ දණ්ඩන නියමයට විරුද්ධව අභියාචන අධිකරණයේ අවසරය ඇතිව, අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකිය,

(අධිකරණ සංවිධාන පනත, 14 (අ) වන වගන්තිය)

(11.2.3.1) (ආ) ජූරි සභාවක් නැතිව නඩු විභාග කරනු ලැබූ නඩුවක් සම්බන්ධයෙන් වන විට,

- (i) චූදිතයා වරද පිළිගෙන ඇති අවස්ථාවක; හෝ
- (ii) දණ්ඩන නියමය කවර වූ හෝ ආකාරයට එක් මාසයක කාලයක් සඳහා බන්ධනාගරගත කිරීම හෝ රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයක් හෝ වන අවස්ථාවක;

හැර යම්කිසි වරදකරු කිරීමකට නැතහොත් දණ්ඩන නියමයකට විරුද්ධ වූ අයිතිවාසිකමක් වශයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකිය.

එසේ වුවද එකී සෑම අවස්ථාවකදීම නීතිය පිළිබඳවූ ප්‍රශ්නයක් මත හෝ චූදිතයා වරද පිළිගෙන ඇති විටෙක, දණ්ඩන නියමය පමණක් පිළිබඳ වූ ප්‍රශ්නයක් මත හෝ අභියාචනය කළ හැකිය. (අධිකරණ සංවිධාන පනත, 14 (ආ) වන වගන්තිය)

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 331 වන වගන්තිය, අභියාචන පෙත්සම ඉදිරිපත් කිරීම හෝ අභියාචනය කිරීමට අවසර ඉලල්මට අදාළ කාර්යපටිපාටිය සඳහන් කරයි.

<u>මහාධිකරණය හෝ අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන සහ අභියාචනය කිරීමට අවසර ලබා ගැනීමේ ඉල්ලීම.</u>

321 (1) මේ පරිච්ඡේදය යටතේ වූ අභියාචනයක්, ඒ අභියාචනය කරනු ලබන්නේ යම් වරදකරු කිරීමකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධව ද ඒ වරද කිරීම, දණ්ඩන නියමය හෝ ආඥාව මහාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ දින සිට දවස් දහ හතරක් ඇතුළත, මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචන පෙත්සමක් හෝ අභියාචනය කිරීමට අවසර ලබාගැනීමේ ඉල්ලීමක් හෝ භාර දීමක් කළ හැකිය;

එසේ වුවද, බන්ධනාගාරයේ සිටින තැනැත්තකු විසින් අභියාචනය කිරීමට තමා බලාපොරොත්තු වන බවද ඒ අභියාචනයට හේතු ද ඔහු තත් කාලයේ රඳවා තබා ඇති බන්ධනාගාරයේ ජේලර්වරයාට ඉහත සඳහන් කාලය තුළදී ප්‍රකාශ කිරීමෙන් අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවිට අභියාචන පෙත්සමක් පිළියෙල කොට ඒ අභියාචනයට විෂය වී ඇති වරදකරු කිරීම, දණ්ඩන නියමය හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ මහාධිකරණය වෙත ඒ අභියාචන පෙත්සම ඉදිරිපත් කිරීම ඒ ජේලර්වරයාගේ කාර්යය විය යුතුය.

(2) අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ කවර කාලයක් ඇතුළත ද ඒ කාලය ගණන් බැලීමේදී, ඒ අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ අවසාන ආඥාවකට විරුද්ධව ද එම නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ දිනය ගණන් ගත යුතු නමුත් සියලුම ඉරු දින සහ රජයේ නිවාඩු දින ගණන් නොගත යුතුය.

(3) අභියාචන පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය අධිකරණයේ කාර්යාලය වසා ඇති දිනයක ඉකුත් වුවහොත් ඉන්පසු ඒ කාර්යාලය විවෘත කෙරෙන ඊළඟ ප්‍රථම දිනයෙහි එය ඉදිරිපත් කරනු ලැබී නම් එය නිසි කල්හි ඉදිරිපත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) අභියාචන පෙත්සම මනා හා යෝග්‍ය කඩදාසියක පැහැදිළිව ලියා අභියාචක විසින් හෝ අභියාචකගේ නීතිඥවරයා විසින් හෝ අත්සන් කර දිනය යොදා තිබිය යුතුය. තවද අභියාචන පෙත්සමෙහි පහත දැක්වෙන තොරතුරු ඇතුළත් විය යුතුය -:

(අ) අභියාචනය කරනු ලබන්නේ යම් වරදරකරු කිරීමකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධවද ඒ වරදකරු කිරීම, දණ්ඩන නියමය හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ මහාධිකරණයේ සැසි වාරය;

(ආ) නඩුවේ අංකය;

(ඇ) අභියාචකගේ සහ වගඋත්තරකරුගේ නම සහ ලිපිනය;

(ඈ) අභියාචනාධිකරණය වෙත කෙරෙන ඇමතුම;

(ඉ) අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව ද අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු තීන්දුව හෝ ආඥාව හෝ ප්‍රකාශයට පත් කළ දිනය සහ එම ප්‍රකාශයේ ස්වභාවය;

(ඊ) අභියාචනයට පදනම් වූ හේතු දැක්වෙන සරල හා සංක්ෂිප්ත ප්‍රකාශයක්;

(උ) ඉල්ලා සිටින සහතිකය

(5) අභියාචක විසින් අභියාචනයට රුපියල් පහක් වටිනා මුද්දර ඇලවිය යුතුය. එහෙත් අභියාචනය නීතිඥවරයා විසින් ඉදිරිපත් කරනු ලැබූ විට හෝ මරණීය දණ්ඩනය නියම කෙරෙන දණ්ඩන නියමයකට විරුද්ධව වන විට හෝ මුද්දර ගාස්තුවක් අවශ්‍ය නොවේ.

නඩු විභාගය ජූරි සභාවක් ඉදිරියේ පැවැත්වුනු නඩුවලට විරුද්ධව වූ අභියාචන තීරණය කිරීම.

334 (1) ජූරි සභාවක තීන්දුවක් මත වූ වරදකරු කිරීමකට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් අභියාචනයකදී ජූරි සභාවේ තීන්දුව අසාධාරණ වීමේ හේතුව මත හෝ සාක්ෂි ගැන සලකා බලන කල තහවුරු කළ යුතු බව හෝ අභියාචක වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියෙහි ද ඒ අධිකරණයේ නඩු තීන්දුව නීතිය පිළිබඳ යම් ප්‍රකාශනයක් සම්බන්ධයෙන් වූ කල වැරදි තීරණයක හේතුව මත ඉවතලිය යුතු යැයි නැතහොත් කවර හෝ හේතුවක් නිසා යුක්තිය ඉටු නොවීමක් සිදුවී ඇති බව අභියාචනාධිකරණය විසින් සලකනු ලබන්නේ නම් අභියාචනාධිකරණය විසින් අභියාචනයට ඉඩ දිය යුතු අතර වෙනත් කවර වුවද අවස්ථාවකදී අභියාචනය නිශ්ප්‍රභා කළ යුතුය;

එසේ වුවද අභියාචනයේදී මතු කර ඇති ප්‍රශ්නය අභියාචකගේ වාසියට තීරණය විය හැකි බව අධිකරණයේ මතය වුවද සැලකිය යුතු තරමින් යුක්තිය ඉටු නොවීමක් ඇත්ත වශයෙන් සිදුවී නැතැයි අධිකරණය සලකන්නේ නම් අධිකරණය විසින් අභියාචනය නිශ්ප්‍රභා කළ හැකිය.

(2) වරදකරු කිරීමකට විරුද්ධව වූ අභියාචනයකට අභියාචනාධිකරණය විසින් ඉඩ දෙනු ලබන්නේ නම් එකී වරදකරු කිරීම, මේ සංග්‍රහයේ ඇති විශේෂ විධිවිධානවලට යටත් වූ අභියාචනාධිකරණය විසින් නිශ්ප්‍රභා කොට ඔහු නිදෙස් කිරීමේ නඩු තීන්දුවක් දෙන ලෙස විධාන කළ යුතුය;

එසේ වුවද අභියාචනයට ඉඩ දීමට හේතු වූ අක්‍රමිකතාව නිසා නොවේ නම් චූදිතයා යුක්ති සහගත ලෙස වරදකරු කළ හැකි වීමට ප්‍රමාණවත් වූ සාක්ෂි ජූරි සභාව ඉදිරියෙහි තිබුන බව අභියාචනාධිකරණයේ මතය වේ නම් අලුත් නඩු විභාගයක් පවත්වන ලෙස අභියාචනාධිකරණය විසින් ආඥා කළ හැකිය.

**11.2.6. ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කිරීම.** මහාධිකරණයෙන්, දිසා අධිකරණවලින්, පවුල් අධිකරණවලින් හෝ මහේස්ත්‍රාත් අධිකරණවලින් ඉදිරිපත් කෙරෙන යම් අභියාචනයක් පිළිබඳ අභියාචනාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් යම් නීතියක, විධි විධාන වලට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකමක් තිබිය යුතුය. (අධිකරණ සංවිධාන පනත 37 වන වගන්තිය) බටගල මැණිකේ එරෙහිව නීතිපති (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක (SC (SPL) LA 57/215) මෙය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 127 වගන්තියට අනුව සිදුකළ විශේෂ අභියාචන ඉල්ලුම් පත්‍රයකි. අභියාචක මිනී මැරීමට වරදකරු විය. මරණ දඬුවම හිමි විය. මෙම වරදට සහ දඬුවමට එරෙහි අභියාචනය ඉවත දැම්ණි. එයට සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය ආදේශ කෙරිණි. තවද අවුරුද 15 ක සිර දඬුවම් හිමි විය. අධිකරණය පහත ලෙස තීරණය කළේය. අභියාචන තීරණය ලබාගන්නා කාලය තුල අභියාචකට ඇප හිමි විය. තවද අභියාචක සිරගතව සිටියදී ඔහුගේ හෝ ඇයගේ දඬුවමට එම සිරගත කිරීමට අදළ අත්අඩංගුවේ සිටි කාලය ගණන් ගන්නේ නැත.

නීතිපති එරෙහිව සිංගප්පුලි දසනායක හෙවත් ගාමිනීගේ කොල්ලා සහ තවත් අය. (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංකː SC(SPL)LA 125/2014 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 128 වන වගන්තියට අනුව මෙය විශේෂ අභියාචන පෙත්සමකි. එය ශ්‍රේෂ්ඨාධිකරණයේ 1990 රීතීන්ට අනුව අදළ වන්නේ නැත. මෙම 3 වන රීතිය පහත අවශ්‍යතාව සිදුකරයි.

එයට ශ්‍රේෂ්ඨාධිකරණය අභියාචනයට විශේෂ අවසරයක් දෙන්නේ දැයි තීරණය කිරීමට අවශ්‍ය තොරතුරු සහ කරුණු ඇතුළත් වේ. නමුත් පෙත්සම්කරු මෙම රීතියට අනුව කටයුතු කිරීමට අපොහොසත් වන විට නමුත් වගඋත්තරකරුට වෙනස්කමක් නොවන පරිදි මෙම රීතියට අනුව කටයුතු කිරීමේදී අධිකරණය පහත කරුණු විභාග කළ යුතුය.

එනම් එවැනි අදාළ නොකිරීමකට අදාළ වාතාවරණය සහ සාධාරණ දැක්මක් ලබා ගැනීමටය. ඒ පෙත්සම නිශ්ප්‍රභ වීම වැළැක්වීමේ ආඥාවක් සම්බන්ධයෙනි.

**11.3. අධිකරණ සමාලෝචනය**. නෛතික ක්‍රියාදාමයකි. එනම් නීතිය පිළිබඳ අධිකරණයට රාජ්‍ය ආයතනයක් සැදූ රීතියක් හෝ තීරණයක් සමාලෝචනය කළ හැක. රාජ්‍ය වගකීම සම්බන්ධයෙන් තැකීමක් ඇති කරුණක් නම් අධිකරණ සමාලෝචනය අත්‍යවශ්‍ය බවය. එමගින් රාජ්‍ය බලය හොඳින් ස්ථාපිත සංකල්පයන් හා මූලධර්මයන්ට අනුව භාවිතයේ යෙදීමට සහතිකයක් ලබාදේ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තියෙන් අවස්ථා ගණනාවකදී අධිකරණ සමාලෝචනය අදාළ කිරීම පහත කාරණා ද ඇතුළුව දක්වා ඇත.

(අ) මානව හිමිකම් තත්ත්වයන්;

(ආ) අධිකරණ පරිපාලනය පිළිබඳ සාමාන්‍ය මූලධර්ම සහ/හෝ

(ඇ) පොදු භාවිතය පිළිබඳ සංකල්ප පරිදිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ සඳහන් කර ඇති මානව හිමිකම් තත්ත්වයන්ට විරුද්ධ වූ "පරිපාලන හෝ විධායක ක්‍රියාවන්" සමතුලනය කිරීම දක්වා ඇති අයිතිවාසිකම් උල්ලංඝණය වූ විට පුරවැසියන්ට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සම් ඉදිරිපත් කිරීමට අවසරය සැලසේ.

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ ප්‍රතිපාදන මගින් මහජන භාරය යන මතවාදයට ශක්තිය සහ නෛතික වටිනාකම ලබා දෙයි. නීතිය මත පාලනය යන අනෙකුත් ව්‍යවස්ථාපිත මූල ධර්මයන් ඉස්මතු කර දක්වන කරුණක් තිබේ. ඒ විධායක සහ පරිපාලන ක්‍රියාවකට පොදු වාසියක සහ පොදු අරමුණක් ඇති බවය. මහජන නිලධාරීන්ට තම බලතල අදාළ අරමුණ කෙරෙහි යෙදීමට ඔවුන්ට සිය බලතල ක්‍රියාත්මක කිරීමේදී ඉහළ ප්‍රමිතියක් ඇත. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 වන වගන්තියට එරෙහිව සිදුවන බලය අයුතු ලෙස භාවිතාවේදී එය අදාළ විශ්වාසය (භාරය) කඩ කිරීමක් වේ.

අධිකරණය සැලකිය යුතු කාලයක සිට සමාලෝචනය පිළිබඳ ප්‍රමිතීන් සංවර්ධනය කර ඇති අතරම එය අධිකරණ පරිපාලනය යන සාමාන්‍ය මූලධර්ම යටතේ සිදුවිය. මෙයට පහත පසුබිමද අදාළ වේ. එනම් අධිකරණ බලය ප්‍රමාණවත් නොවීම, ස්වභාවික යුක්ති මූලධර්ම උල්ලංඝණය කිරීම, අභිමත බලය පිළිබඳ අයුතු භාවිතය සහ වර්තාගත කරන නීතියේ වැරදි වේ. ව්‍යවස්ථාපිත හෝ පරිපාලන ක්‍රියාවන්ට අදාළව අධිකරණමය සමාලෝචනයේදී දේශපාලන ප්‍රතිඵල තිබේ. රජයේ ආයතනයකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ට හෝ අමාත්‍යවරයකුට එරෙහිව වූ තීරණයකදී අදාළ කරුණ ඉතා පහත් ආකාරයට වර්තමාන ආණ්ඩුවෙන් ප්‍රදර්ශනය කෙරේ.

<u>(12) අනෙකුත් අදාළ දේශීය නීතිය.</u>

<u>(12.1) මරණ දඬුවම.</u>

මරණ දඬුවම ආණ්ඩුවේ වාරණ භාවිතාවක් වන අතර අපරාධයකට දඬුවමක් ලෙස රජය විසින් පුද්ගලයකු මරා දමනු ලැබේ. මෙවැනි ආකාරයට යමෙකු මරා දැමීමට ලබාදෙන දණ්ඩනය පැනවීම මරණය සිදුකිරීම ක්‍රියාත්මක කිරීම වේ. මරණයට පත් කිරීමෙන් දඬුවම් කරන අපරාධ, මරණීය දණ්ඩනය හිමි අපරාධ ලෙස හෝ මරණීය දණ්ඩනය හිමි වැරදි ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ තවම මරණ දඬුවම නීතියේ ඇති අතර එය භාවිතය තහනම් කර ඇත. 1976 දී අවසන්

වරට ශ්‍රී ලංකාව තුළ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක විය. 1976 සිට මේ දක්වාම එල්ලා මැරීම නතර කර ඇත. මරණ දඬුවම හිමි වූ සිරකරුවෝ ජීවිතාන්තය දක්වා දඬුවම් විඳිමින් සිටිති.

(12.1.1) ශ්‍රී ලංකාවේ මරණ දඬුවමින් දඬුවම් කරන අපරාධ සහ වැරදිකරුවන්.

වෘත්තිකයන් අනිවාර්යෙන්, අවසන් වශයෙන් සටහන් කළ යුත්තක් ඇත. ඒ අපරාධ නඩු විධාන කාර්ය පටිපාටිය අනුව එන රීතීන්ට වරදකරුවකු මරණ දඬුවම පැමිණවීමට ප්‍රථමයෙන් අධිකරණය වරදකරුට, ඔහුට මරණ දඬුවම නොපැමිණවීමට ඇති හේතූන් දක්වන්න යයි අධිකරණය විසින් අවකාශය ලබාදිය යුතුය. මරණ දඬුවම සුදුසු ද යන්න සම්බන්ධයෙන් නඩුවේ වාර්තාව මෙන්ම ඇගයීමක් විනිසුරුවරයා විසින් ජනාධිපතිට අනිවාර්යෙන් යොමු කළ යුතුව ඇත.

මීට අතිරේකව ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව ජනාධිපති සිය වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට ද, ඔහු අධිකරණ අමාත්‍යාංශයට ද යවා උපදේශනය සඳහා යොමු කළ යුතු අතර ඔහු අවශ්‍යය නිර්දේශය ලබා ගැනීමට ජනාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.[27]

පහත අපරාධ මරණ දඬුවමින් දඬුවම් කෙරේ.

- මිනී මැරීම "මිනී මැරීම සිදුකරන කවරකුට වුවද මරණ දඬුවමින් දඬුවම් කළ යුතුය.[28]
- මරණීය ප්‍රතිඵලය වූ අනෙකුත් වැරදි :- නිර්දෝෂී පුද්ගලයකු වැරදිකරු වුවහොත් එහි ප්‍රතිඵලය ලෙස මරණ දඬුවම ලැබුවහොත් බොරු සාක්ෂි දුන් පුද්ගලයාට මරණ දඬුවමින් දඬුවම් කළ යුතුය.[29]
- යම් පුද්ගලයකු සිය දිවි නසා ගතහොත් එයට අනුබල දුන් පුද්ගලයාට ද මරණ දඬුවමින් දඬුවම් කළ යුතුය. [30]
- සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් තුවක්කුවක් ආධාර කොට ගෙන සිදුවුවහොත් එයට මරණ දඬුවමින් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමින් දඬුවම් කළ යුතුය.[31]
- මරණයක් සිදුනොවන ස්ත්‍රී දූෂණයක දී [32]
- මරණයක් සිදුනොවන මංකොල්ලකෑම්; තුවක්කුවක් යොදාගෙන මංකොල්ලයක් සිදුකළ විට මරණ දඬුවමින් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමකින් දඬුවම් කළ යුතුය.[33]
- මරණය ප්‍රතිඵලයක් නොවන අපහරණය; අපයෝජනය හෝ පැහැරගෙන යෑම තුවක්කුවක් යොදාගෙන සිදුකරන විට මරණ දඬුවමින් හෝ ජීවිතාන්තය දක්වා සිර

[27] Sri Lanka code of Criminal Procedure of 1979 arts 280,286 amended by Act no 7 of 2006

[28] Sri Lanka penal code of 1885,arts, 294-296 amended by Act No.16 of 2006

[29] Sri Lanka penal code of 1885,arts, 294-296 amended by Act No.16 of 2006
[30] Sri Lanka penal code of 1885,arts, 294-296 amended by Act No.16 of 2006
[31] Sri Lanka Firearms Ordinance , art 44(A) & Schedule amended by Act No 22 of 1996

[32] Sri Lanka penal code of 1885, arts, 294-296 amended by Act No.16 of 2006

[33] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996

දඬුවමින් දඬුවම් කළ යුතුය. මෙය පැහැරගෙන යෑම, අපහරණය සහ මනුෂ්‍යය කූට්ඨනය සම්බන්ධයෙන් ද අදාළ වේ.[34]

- මරණය සිදුනොවන මත්ද්‍රව්‍යය ජාවාරම :- විෂ ද්‍රව්‍යය අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනතේ 54 - (අ - ආ) වශයෙන් යටතේ යම් අයකු හෙරොයින්, කොකේන්, මොෆීන් හෝ අබිං නිශ්පාදනය කරන විට මරණ දඬුවමට හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කෙරේ. 3 වන පරිච්ඡේදයේ දෙවන සහ තුන්වන කොටස් වලත් අදාළ ද්‍රව්‍යයේ ග්‍රෑම් 500 කට හෝ වැඩියෙන් ජාවාරම් කිරීම, ආනයනය හෝ අපනයනය කිරීම මරණ දඬුවමින් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමින් දඬුවම් කළ යුතුය.[35]
- එම ආඥා පනත යටතේ සිදුකරන ඕනෑම මත්ද්‍රව්‍යය පිළිබඳ වරදක් තුවක්කුවක් භාවිතා කරමින් සිදුකරන විටදී මරණ දඬුවමින් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමින් දඬුවම් කළ යුතුය.[36]
- <u>මත්ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම</u> : විෂ ද්‍රව්‍යය අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනතේ 3 වන පරිච්ඡේදයේ ii සහ iiii කොටස් වලින් යමෙකු ග්‍රෑම් 500 ට වඩා වැඩියෙන් අදාළ ද්‍රව්‍ය ළඟ තබා ගැනීම මරණ දඬුවමින් හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කළ යුතු වැරදි වේ.[37]
- ඕනෑම මත්ද්‍රව්‍යය වරදක් තුවක්කුවක් පාවිච්චි කර සිදු කිරීමට මෙම පනත යටතේ මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කළ හැක.[38]
- රාජ්‍ය ද්‍රෝහීත්වය; ජනරජයට විරුද්ධව යුද්ධ කරන, හෝ එවැනි යුද්ධයක් කිරීමට උත්සාහ කරන, එවැනි යුද්ධයකට අනුබල දෙන ඕනෑම අයකුට මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කළ යුතුව ඇත.[39]
- රජයට විරුද්ධව තුවක්කුවක් භාවිතා කරමින් සිදුකරන වැරදි වලට මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කළ යුතුව ඇත.[40]
- මරණය ප්‍රතිඵලයක් නොවන හමුදා වැරදි; හමුදා අංශයන්ට සම්බන්ධ වැරදි (සිවිල් පුරවැසියන් හෝ) තුවක්කුවක් යොදා ගනිමින් සිදුවන විට මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කළ යුතුව ඇත.[41]
- මෙය සිවිල් පුරවැසියන් සම්බන්ධයෙන් අදාළ වේ, ජනරජයේ යුද්ධ හමුදා, නාවික හෝ ගුවන් යන බලකායන් වල යම් නිලධාරියකු, සොල්දාදුවකු, නාවික භටයකු හෝ ගුවන් භටයකු සිදුකරන කැරැල්ලකට අනුබල දෙන විට, මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමකින් දඬුවම් කළ යුතුය.[42]
- යුද්ධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ හමුදා විනය හා වගකීම කඩකරන වැරදි සිදුකරන හමුදා නිලධාරීන්ට, මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ යුතුය. එවැනි වැරදි වලට බියගුලුකම, යුද්ධමය ආඥාවන්ට සම්බන්ධ නොවීම, හමුදා වත්කම් විනාශ කිරීම

[34] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996
[35] Sri Lanka Poisons, Opine and Dangerous Drags (……….) Act . secs.5, 14, No 13 of 1984

[36] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996
[37] Sri Lanka Poisons, Opine and Dangerous Drags (……….) Act . secs.5, 14, No 13 of 1984

[38] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996
[39] Sri Lanka penal code of 1885,arts, 294-296 amended by Act No.16 of 2006
[40] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996

[41] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996
[42] Sri Lanka penal code of 1885, arts, 294-296 amended by Act No.16 of 2006

ක්‍රියාන්විත සාර්ථක කිරීම් අධෛර්ය කරන ක්‍රියාවන්, වැරදි සංඥා කිරීම්, රාජ්‍යය ද්‍රෝහීත්වය, සමාව දීම්, සතුරන්ට පක්ෂ වීම, ඔත්තු බැලීම, සතුරාට සහය වීම, සැකකරුවකු ලෙස අත්අඩංගුවට පත්වූ සතුරකුට ස්වේච්ඡාවෙන් සේවය කිරීම හෝ ආධාර දීම ඇතුළත් වේ.[43]

- රාජ්‍ය ද්‍රෝහීත්වයට (හෝ මිනී මැරීමට) ශ්‍රී ලංකාවේ හමුදා නීතියට විශය වන පුද්ගලයන් මරණීය දණ්ඩනයෙන් හෝ දඬුවම් ලබනු ඇත.[44]
- නාවික හමුදා නිලධාරීන්ට පහත කරුණු සම්බන්ධයෙන් මරණීය දණ්ඩනය හිමිවේ. එනම් සතුරා, මුහුදු කොල්ලකරුවන් හෝ කැරලිකරුවන් සම්බන්ධයෙන් අසමත් වීම් පිළිබඳ දඬුවම, එනම් මරණීය දණ්ඩනයට හෝ වෙනත් දඬුවම් වලට පාත්‍ර වීම; ඔවුන් මේ ආකාරයේ දඬුවමකට පාත්‍ර වීමෙහිලා බලපාන කරුණක් වන්නේ නාවුක කණ්ඩායම් හෝ ආරක්ෂාව සඳහා වන්දි ඉල්ලා සිටින විට ඒවා ආරක්ෂා කිරීමට අසමත් වන විටදීය.[45]
- ඔත්තු සපයන්නන් (නාවික හමුදාවේ සාමාජිකයන් හෝ එසේ නොවන විටදී) මරණීය දඬුවමින් හෝ ඊට අඩු දඬුවමකින් දඬුවම් හිමි වේ.[46]
- නාවික හමුදා නිලධාරීන් හමුදා විනය හා වගකීම පහත වැරදි සම්බන්ධයෙන් කඩ කරන විටදී මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ යුතුව ඇත. එනම් (ද්‍රෝහීත්වය හෝ බියගුලු කම නිසා) යමෙකුගේ තනතුර පැහැර හැරීම, කැරලි ගැසීම සිදුකිරීම එය වැළැක්වීමට අපොහොසත් වීම. එනම් (ද්‍රෝහීත්වය හෝ බියගුලු කම නිසා) සතුරාට පලා යෑමට සැලැස්වීම හෝ ගැටුමට පාත්‍ර නොවන දේපළවලට ගිණි තැබීම ද වේ. එවැනි සිද්ධීන් වලදී රාජ්‍යය ද්‍රෝහී ක්‍රියාව මරණ දණ්ඩනයෙන් දඬුවම් ලැබිය යුතුය.[47]
- රාජ්‍ය ද්‍රෝහීත්වය පිළිබඳ වැරදි (සහ මිනී මැරීම්) මරණයෙන් දඬුවම් කළ යුතුය.[48]
- තුවක්කුවක් යොදා සිදුකරන කප්පම් ගැනීම මරණයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමින් දඬුවම් කළ යුතුය.[49]
- තුවක්කුවක් යොදා සිදුකරන තුවාල කිරීම ද මරණයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමින් දඬුවම් කළ යුතුය.[50]
- තුවක්කුවක් යොදාගෙන, රාජ්‍යය සේවකයකුට පහර දීම හෝ අපරාධ බලය යෙදවීම හෝ ලිංගික ස්වභාවයෙන් හෝ සොරකමක් සිදු කිරීම වූ කලී මරණයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමින් දඬුවම් කළ යුතුය.[51]

---

[43] Sri Lanka Air Force Act of 1949, arts. 95, 97, 98,131(1-2), Amended by Act No 9 08 1993: Sri Lanka Army Act of 1949, arts, 95, 97, 98,131(1-2) amended by Act No 1008 1993

[44] Sri Lanka Air Force Act of 1949, arts. 95, 97, 98,131(1-2), Amended by Act No 9 08 1993: Sri Lanka Army Act of 1949, arts, 95, 97, 98,131(1-2) amended by Act No 1008 1993

[45] Sri Lanka Navy Act of 1950, arts. 54, 55, 92 amended by Act No. 53 of 1993
[46] Sri Lanka Navy Act of 1950, arts. 54, 55, 92 amended by Act No. 53 of 1993
[47] Sri Lanka Navy Act of 1950, arts. 54, 55, 92 amended by Act No. 53 of 1993
[48] Sri Lanka Air Force Act of 1949, arts. 95, 97, 98,131(1-2), Amended by Act No 9 08 1993: Sri Lanka Army Act of 1949, arts, 95, 97, 98,131(1-2) amended by Act No 1008 1993

[49] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996
[50] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996
[51] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996

- තුවක්කුවක් යොදගෙන, මිනී මැරීමක් සිදු කිරීමට උත්සාහ කිරීම හෝ සාවද්‍ය මනුෂ්‍යය ඝාතනයක් වන ක්‍රියාවක් කිරීමට උත්සාහ දැරීම යන්න ද මරණයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමින් දඬුවම් කළ යුතු අතරම;[52]
- තුවක්කුවක් යොද සිදුකරන්නා වූ මනුෂ්‍යය කුට්ටනය පිළිබඳව වැරදිද මරණයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමකින් හෝ දඬුවම් කළ යුතුය.[53]

(12.1.2.) මරණ දඬුවම් පැමිණවිය නොහැකි වරදකරුවන් වර්ග කිරීම.

(12.1.2.1) අපරාධය සිදුකරන අවස්ථාවේ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන්.

දණ්ඩ නීති සංග්‍රහයේ මෙසේ දක්වා ඇත. "අධිකරණයේ මතය අනුව වයස අවුරුද 18 ට අඩු ඕනම පුද්ගලයකුට එරෙහිව මරණ දඬුවම නියම කිරීම හෝ සටහන් කිරීම නොකළ යුතුය. නමුත් ඒ දඬුවම වෙනුවට අධිකරණයට එම පුද්ගලයකුට සිර දඬුවම් නියම කළ හැක.[54] ශ්‍රී ලංකාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පාර්ශවයක් වේ. ඒ සම්මුතීන් දෙකම මරණ දඬුවම් තහනම් කර ඇත.

(12.1.2.2) ගර්භනී කාන්තාවන්.

දණ්ඩ නීති සංග්‍රහයේ පහත ආකාරයට සඳහන්ව තිබේ. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 282 වගන්තියට අනුව යම් කාන්තාවක් දඬුවම් පැමිණවීමේදී ගර්භනී වී සිටීම මත ඇයට එරෙහිව මරණ දඬුවම පැමිණවීම හෝ සටහන් කිරීම නොකළ යුතු අතර ඒ දඬුවම වෙනුවට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් හෝ වෙනත් කාලයකට දඬුවම් නියම කළ හැක.[55]

මීට ඉහත මෙම අත්පොත මගින් පෙන්නුම් කළ ආකාරයට ශ්‍රී ලංකාව එවැනි මරණ දඬුවම් තහනම් කළ ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පාර්ශවයක් වේ.

(12.1.2.3) බුද්ධි හීනතාවය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යම්තාක් දුරකට බුද්ධි හීනතාව ඇති පුද්ගලයන් ආරක්ෂා කරයි. ඔවුන්ට සාධාරණ නඩු විභාගයකින් ආරක්ෂාව ලැබීමට ආධාර හිමිවන්නේ අඩු වශයෙනි.

"චූදිත උන්මන්තක නොවුවත් නඩුවට අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ මහා අධිකරණයේ කාර්ය පටිපාටිය අවබෝධ කර ගැනීමට නොහැකි කල, පරීක්ෂණය හා නඩු විභාගය සමග ඉදිරියට යාම සඳහා එවැනි පරීක්ෂණයක් කැප කිරීමක් හෝ එවැනි නඩු විභාගයක් දඬුවමකින් කෙලවර වන විට එවැනි වාතාවරණයකදී කාර්ය පටිපාටිය අභියාචනාධිකරණයට යොමු කළ යුතු අතරම එවිට අභියාචන අධිකරණය සෑහීමට පත්වූ විට එවැනි විරෝධයක් නිකුත් කරනු ඇත."[56]

(12.1.2.4) මානසිකව රෝගී වූ අය.

---

[52] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996
[53] Sri Lanka Firearms Ordinance, art 44(A) & Schedule amended by Act No 22 of 1996, Sri Lanka penal code of 1885, arts, 350-360 amended by Act No.16 of 2006
[54] Sri Lanka penal code of 1885, arts, 294-296 amended by Act No.16 of 2006
[55] Sri Lanka penal code of 1885, arts, 294-296 amended by Act No.16 of 2006

[56] Sri Lanka Code of Criminal Procedure of 1979, art. 262 amended by Act No. 7 of 2006

දණ්ඩ නීති සංග්‍රහයේ මෙසේ තීරණය කර තිබේ. "යම් පුද්ගලයකු යම් වරදක් සිදුකරන අවස්ථාවේදී මානසිකව රෝගී වී සිටින විට අදළ ක්‍රියාවේ ස්වභාවය පිළිබඳ දැනුවත් කමක් නැති විට හෝ ඔහු සිදුකරන්නේ නීතිය සම්බන්ධ වරදක් වූ විට අදළ ක්‍රියාවන් කිසිවක් වරදක් නොවේ."[57]

(12.2) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත.

(12.2.1) සාමාන්‍ය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, සෝදිසි කිරීමට, අත්අඩංගුවට ගැනීමට සහ සැකකරුවන් රඳවා ගැනීමට පොලීසියට පුළුල් බලතල ලබා දෙයි. මෙම පනතේ යටි අරමුණ විරුද්ධ මතධාරීන් මර්දනය කිරීම වේ.

(12.2.2) පනතේ එන කේන්ද්‍රීය මානව අයිතිවාසිකම් පිළිබඳ කරුණු සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, චූදිත ඕනෑම අවස්ථාවකදී කළ ප්‍රකාශයක් සාක්ෂියක් ලෙස පිළිගැනීමට අධිකරණයට අවකාශය ලබාදෙයි. තවද වධ හිංසාව පැමිණවීමෙන් ලබාගත් පාපොච්චාරණ සඳහා මෙහිදී ව්‍යතිරේඛයක් ලබාදීම ද සිදු නොවේ.[58] මෙම පනත යටතේ අත්අඩංගුවට ගත් සහතික කළ ආකාරයට පුද්ගලයන් 70 ත් 130 ත් අතර පිරිසක් රඳවා තිබෙන බව වාර්තා වී ඇත.[59] මානව හිමිකම් සංවිධාන සමග කළ සම්මුඛ සාකච්ඡා වලදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ එන වැරදිවලට චෝදනා ලැබූ අයද ඇතුළුව රට පුරා වධ හිංසාව ව්‍යාප්තව තිබේ. 2009 දී යුද්ධය අවසන් වීමෙන් පසුව සිට මෙම පනත යටතේ අත්අඩංගුවට පත් සැකකරුවන් පහත කරුණු සනාථ කර ඇත. එනම් වධ හිංසාව සහ පහත්කොට සැලකීම, බලහත්කාරයෙන් පාපොච්ඡාරණ ගැනීම නීතිඥවරුන්ගේ පවුලේ ඥතීන්ට ප්‍රවේශය ලබා ගැනීම යන මූලික අයිතීන් ප්‍රතික්ෂේප කිරීම වේ.[60]

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගැනීමට අභියෝග කිරීමේ හැකියාව විශේෂයෙන් සීමිතව ඇත. මෙයට[61] අනුව රැඳවියන්ට එරෙහිව චෝදනා ගොනු කරන්නේ නැතිව මාස 18 ක් තබා ගත හැකි නමුත් ප්‍රායෝගික භාවිතාවේදී මෙම පනත යටතේ රඳවා සිටින පුද්ගලයන්ට ඇප ලබාදීමට විනිසුරුවන්ට, නීතිපති දෙපාර්තමේන්තුවෙන් අවසර ලබාගත යුතු අතර නමුත් සාමාන්‍යය වන්නේ එම දෙපාර්තමේන්තුව එසේ ලබා නොදීමය.[62]

---

[57] Sri Lanka Code of Criminal Procedure of 1979, art. 262 amended by Act No. 7 of 2006

[58] Country Reports on Human Rights Practices for 2017 United States Department of State , Bureau of Democracy , Human Rights and Labor , http://www.state-gov/documents/organization/277537.pdf.

[59] Country Reports on Human Rights Practices for 2017 United States Department of State , Bureau of Democracy , Human Rights and Labor , http://www.state-gov/documents/organization/277537.pdf

[60] Country Reports on Human Rights Practices for 2017 United States Department of State , Bureau of Democracy , Human Rights and Labor , http://www.state-gov/documents/organization/277537.pdf

[61] Country Reports on Human Rights Practices for 2017 United States Department of State , Bureau of Democracy , Human Rights and Labor , http://www.state-gov/documents/organization/277537.pdf

[62] Country Reports on Human Rights Practices for 2017 United States Department of State , Bureau of Democracy , Human Rights and Labor , http://www.state-gov/documents/organization/277537.pdf

අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීමේ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු විසින් 2017 ත්‍රස්තවාදය මැඩලීම සිදුකරන අතරම මෙසේ වාර්තා කරන ලදි. රක්ෂිත බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගෙන් 81 දෙනෙක් පෙලිස් විමර්ශනයන් සම්පූර්ණ වන තුරු සිටින අතරම, නීතිපති, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා කළ තවත් 70 දෙනෙකු රඳවාගෙන සිටින අතර ඔවුන්ට අවුරුදු 5 කට වැඩි කාලයක් නඩු විභාගයක් නොමැතිව රඳවාගෙන සිටී. තවද 12 දෙනෙක්, වසර 10 කට වඩා වැඩි කාලයක් නඩු විභාගයක් නොමැතිව රඳවාගෙන සිටිනු ලැබේ.[63]

ශ්‍රී ලංකාවේ නීතිය අනුව සාමාන්‍ය අවශ්‍යතාව වන්නේ බලධාරීන් පුද්ගලයකු අත්අඩංගුවට ගත් විට ඔහුට/ඇයට අත්අඩංගුවට ගනු ලැබූ හේතුව දන්වා සිටිය යුතුය. තවද එම පුද්ගලයා (සුළු අපරාධ සම්බන්ධයෙන් පැය 24 ක් ඇතුළතද, සහ බරපතල අපරාධ සම්බන්ධයෙන් වන විට පැය 48 ක් ඇතුළත ද) මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණිවිය යුතුව ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අරමුණුවලට අනුව එම කාලය පැය 72 කි. නමුත් සමහරක් අවස්ථාවලදී විශේෂයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ එන නඩු වලදී සමහරක් රැඳවියන් ඊට වැඩි කාලයක් ගෙන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ අවස්ථා වාර්තාගත වී ඇත.[64]

<u>(12.3) අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලය පනත (2016 අංක 14)</u>

අතුරුදන් වූ පුද්ගලයන්ගේ කාර්යාලය වූ කලී ජාතික යාන්ත්‍රනයකි. එය රටේ අතුරුදහන් කිරීම් මුලිනුපුටා දැමීමට සහය විය යුතු අතරම පවුල්වල දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. එම කාර්යාලයට බලය ලබාදී ඇත්තේ මේ රටේ ඇතිවූ කැරලි සම්බන්ධයෙන් සහ 26 අවුරුදු යුද්ධයේදී සිදුවූ පුද්ගලයන් දස දහස් ගණනක් බලය යොදා සිදුකළ අතුරුදහන් කිරීම් පිළිබඳව විමර්ශනය කිරීමට සහ ආවරණය කර ගැනීමට ය. එය ස්වාධීන ආයතනයකි. එය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට වාර්තා කරයි.

<u>(12.3.1) අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කාර්යාලයේ වරණය.</u>

එයට අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳව පරීක්ෂා කිරීමට, අනාවරණය කිරීමට වරමක් දී ඇත. තවද එය කුමන පුද්ගලයන් අතුරුදහන් වී සිටීද සහ ඔවුන්ගේ ඉරණම අභිලාෂයන් පිළිබඳ වාතාවරණය පැහැදිළි කර ගත යුතුය. අතුරුදහන් වූ පුද්ගලයන්ට අදාළ සිද්ධි පිළිබඳ කටයුතු කිරීමෙහිලා නිර්දේශ සකස් කිරීම ඔවුන්ගේ අයිතිවාසිකම් සහ අභිලාෂයන් ආරක්ෂා කිරීම අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ සහය ලබා ගැනීමට අවශ්‍යය ක්ෂේත්‍ර හඳුනා ගැනීම අප විසින් සිදුකර ඇති අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ දත්ත එකතු කිරීම කළ යුතුව ඇත. තවද වෙනත් ආයතන සහ සංවිධාන, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ පරීක්ෂණ කොමිෂන් සභා මීට පෙර සිදුකළ දත්ත එක්රැස් කිරීමද මෙයටම ඇතුළත් කළ යුතුව ඇත.

<u>(12.3.2) අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලයේ බලතල</u>.

එයට විමර්ශනය කිරීමේ බලතල ඇත. එනම් අතුරුදහන් වූ පුද්ගලයකුගේ ඥාතියකුගෙන් හෝ වෙනත් ඕනෑම පුද්ගලයකුගෙන් හෝ සංවිධානයකින් තොරතුරු ලබාගැනීමට හැකියාව තිබේ. එයට පරීක්ෂණයක් සහ/හෝ විමර්ශනයක් ආරම්භ කළ හැක. එය කළ හැක්කේ එයට ලැබුණු පැමිණිල්ලක් හෝ මීට පෙර පරීක්ෂණ කොමිෂන් සභාවට ලැබුණු තොරතුරු මත සිදු වූ අතුරුදහන් කිරීම පිළිබඳ ස්ථානය හෝ ගමන් බිමන් සහ/හෝ වාතාවරණය පිළිබඳවය.

---

[63] Country Reports on Human Rights Practices for 2017 United States Department of State , Bureau of Democracy , Human Rights and Labor , http://www.state-gov/documents/organization/277537.pdf
[64] Country Reports on Human Rights Practices for 2017 United States Department of State , Bureau of Democracy , Human Rights and Labor , http://www.state-gov/documents/organization/277537.pdf

මෙම අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබද කාර්යාලය අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ සිද්ධීන් විමර්ශනයට ගත යුතු සියලු අවශ්‍යය පියවර ගත යුතුව ඇත. එහිදී තොරතුරු ලබාගැනීමට සහ ප්‍රකාශ (ලිඛිත හෝ වාචික) ලෙස ද තොරතුරු ලබාගත යුතුව තිබේ. සාක්ෂිකරුවන් පරීක්ෂා කළ යුතුය. ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයන් කැඳවිය හැකිය. සිවිල් හෝ අපරාධ අධිකරණ බලය තුළ පිළිනොගන්නා ප්‍රකාශයක් හෝ කරුණක් පිළිගත හැක. වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ පුද්ගලික ආරක්ෂාව සහතික කරමින් විශ්වසනීය තොරතුරු පිළිගැනීමට ක්‍රියාදමයක් ස්ථාපිත කර ඇත. සැක කටයුතු සමූහ මිනී වලවල් වලින් මිනී ගොඩ ගැනීමට/කැනීම් කිරීමට නියෝග ලබා ගැනීමට නිසි මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉල්ලීම් කිරීම ද සිදුවිය යුතුය. එහි නිසි නිලධරයකුට වරෙන්තුවක් නොමැතිව ඇතුලු වීමට සහ ඕනෑම රැඳවුම් ස්ථානයකට ගොස් විමර්ශන කිරීමට බලය දිය යුතුය. එයට පුද්ගලයකු සැක කටයුතු ලෙස රඳවා තිබෙන හෝ මීට ඉහත දී රඳවා සිටි බවට සැක කරන පොලීසිය සහ බන්ධනාගාරය ද ඇතුළත් වේ. සාක්ෂි ලබා ගැනීමෙහිලා සැකකටයුතු ස්ථාන පරීක්ෂාවට සෝදිසි වරෙන්තුවක් ලබා ගැනීමේදී ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැක.

අතුරුදහන් වූවන්ගේ කාර්යාලයට, දණ්ඩ නීති සංග්‍රහය හෝ වෙනත් නීතියක් යටතේ වරදක් සිදුව ඇති බව පෙනෙන්නට තිබුණහොත්, එයට වාර්තාවක් සම්පූර්ණ කර අදාළ නීති ක්‍රියාත්මක කරන්නාට හෝ නඩු පවරන්නාවූ අධිකරණයට යොමු කළ යුතු වේ.

(12.3.3) අතුරුදහන් වූවන් ගේ කාර්යාලයේ කර්තව්‍යය සහ වගකීම්.

මෙම කාර්යාලයට යම් නිගමනයකට එලඹීමට එනම් පැමිණිලි කර ඇති අදාළ පුද්ගලයා අතුරුදහන්ව ඇති බවට ප්‍රමාණවත් තොරතුරු ඇති විට එහි අභ්‍යන්තර වාර්තාවක් එම අතුරුදහන් වූවන්ගේ ඥාතියකුට නිකුත් කළ යුතුය. එමගින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට නොපැමිණීමේ සහතිකයක් හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට බලය පැවරේ.

මෙම කාර්යාලය පහත දේ සඳහා අදාළ අවශ්‍යතාව සහ ක්‍රියාකාරීත්වය ලබාදිය යුතුව ඇත. පරිපාලන සහ සුභසාධක සේවය ද සැපයිය යුතුය. සුභසාධනයේදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන් මගින් සමාජීය සහයෝගය ලබාදීම, අදාළ අධිකාරීන්ට අතුරුදහන් වූ පුද්ගලයන්ට සහ/හෝ ඥාතීන්ට වන්දි ලබාදීම, වින්දිත සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රියාදාමයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, මහජනතාව දැනුවත් කිරීම පිළිබඳ සේවාවක් ක්‍රියාත්මක කිරීම, නිර්මාණය කිරීම සිදුවිය යුතු අතරම එයට අදාළ හේතු සිද්ධීන් සහ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ බලපෑම සහ ඔවුන්ගේ ආර්ථික, මනෝ සාමාජික, නෛතික සහ පරිපාලන උදව් සඳහා පහසුකරණය කළ යුතුව ඇත.

(12.3.4) අනාවරණය කරන ගණන, ඒකකය සහ වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවනගේ ආරක්ෂාව.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කාර්යාලයේ අනාවරණය කර ගැනීමේ ඒකකයක් තිබිය යුතුය. එහි වගකීම විය යුත්තේ අතුරුදහන් වූ පුද්ගලයන් අනාවරණය කර ගැනීම සහ සොයා ගැනීමයි. එයට දක්ෂ, පළපුරුදු සහ සුදුසුකම් සහිත විමර්ශකයන් එනම් අදාළ තාක්ෂණික සහ අධිකරණ වෛද්‍ය විශේෂඥයන් ඇතුලු තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුව ඇත. තවද එයට වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයක් ද තිබිය යුතුව ඇත. එමගින් වින්දිතයන්, සාක්ෂිකරුවන් සහ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් අවශ්‍යතා සහ අදාළ තැකීමක් ඇති කරුණු ආරක්ෂා කළ යුතුව තිබේ.

(12.4) මරණ ලියාපදිංචි පිළිබඳ (තාවකාලික විධි විධාන සංශෝධන පනත) (2016 අංක 16)

2016 ජුනි මස මරණ ලියාපදිංචි කිරීමේ පනතට (තාවකාලික විධි විධාන) සංශෝධන පනත් සම්මත කර ඇත. එමගින් ආණ්ඩුවට නොපැමිණීම පිළිබඳ සහතික නිකුත් කිරීමට බලය පවරා

තිබේ. එම සහතිකය වසර 2 කට හෝ අතුරුදහන් වූ පුද්ගලයාගේ තොරතුරු ලැබෙන තෙක් වලංගු වේ. වසර දෙකකට පසුවත් කිසිදු තොරතුරක් ලැබී නොමැති නම් ඥාතීන් ඉහත සහතිකයේ කාලය දිගු කිරීම, මරණ සහතිකයකට ඉල්ලුම් කිරීම හෝ එම නොපැමිණීමේ සහතිකය අවලංගු කිරීම සිදුකළ යුතුය.

2016 දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන පහත කරුණට එකඟ විය. ඒ සිවිල් යුද්ධය අතරතුර අතුරුදහන් වූ පුද්ගලයන් 65000 ක පිරිසකගේ ඥාතීන්ට නොපැමිණීමේ සහතික නිකුත් කරන බවය. එහිදී ඔවුන්ට දේපළ සහ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ වත්කම් ඔවුන්ගේ භාරකාරීත්වය සහ ආණ්ඩුවේ සුභසාධන ව්‍යාපෘති වලට ඉල්ලුම් කිරීම තාවකාලිකව කලමනාකරණය කර ගැනීමට අවකාශය ලබාදේ.

(12.5) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත (2016 අංක 12)

2016 දී තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කරගනු ලැබිනි. රජය සහ රජයේ ආයතන ජනතාවගේ බදු මුදලින් නඩත්තු වේ. එම නිසා ජනතාවට අයිතියක් ඇත. ඒ මහජන මුදලින් පාලනය වන රාජ්‍ය ආයතන සිදුකරන දේවල් දැන ගැනීමට, තොරතුරු සඳහා අයිතිවාසිකමක් තිබේ.

මෙම තොරතුරු දැනගැනීමේ අයිතිය අතුරුදහන් වූවන්ගේ ඉරණම සොයා ගැනීමට පහසුකරණය සිදුකරයි. කෙසේ නමුත් යුද්ධයට සම්බන්ධ තොරතුරු, ජාතික ආරක්ෂාව මත පදනම්ව ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත.

(12.6) බලය යොදා සිදුකරන අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත. (2018 අංක 05)

බලය යොදා සිදුකරන අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, බලය යොදා සිදුකරන අතුරුදහන් කළ වින්දිතයන්ට යුක්තියට ඇති අයිතිය සහ වන්දි පිරිනැමීම සහතික කර ඇත. එම පනත පහත අවශ්‍යයතාව සපයනු ලැබේ. ඒ සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුටම බලය යොදා සිදුකරන අතුරුදහන් කිරීම් වලට වින්දිතයකු නොවී බියට පත් නොවී නිදහසේ ජීවත් වීමටය. එයට පැහැර ගැනීම් ද ඇතුළත් වේ. මෙම පනතට ප්‍රත්‍යක්ෂණය කිරීම පිළිබඳ මෙහෙයුම් නැත. මෙය බලය යොදා සිදුකරන අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳව, එම චෝදනා සම්බන්ධයෙන් අදාළ වන්නේ 2018 න් ඉදිරියට සිදුවූ දේ සඳහාය.

(13) අනෙකුත් අපරාධ යුක්තියට සම්බන්ධ පුද්ගලයන්.

(13.1) සාමාන්‍ය.

විත්තියේ නීතිඥවරුන් දැඩි ලෙස සේවාදයකයකුව පුද්ගලික වශයෙන් ආරක්ෂා කළ යුතුය. මෙම වගකීම පිළිබඳ වැදගත් අංගයක් වන්නේ ඔවුන් සෙසු අපරාධ යුක්ති ක්‍රියාදාමයට සම්බන්ධ පුද්ගලයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම වේ. මෙයට ශක්තිමත් අධිකරණ යුක්ති ක්‍රියාදාමයක් ගොඩ නැගීමට එනම් විනිවිද භාවයෙන් යුක්ත, ස්ථිර නෛතිකත්වය, නිර්මුක්තිය සහ අධිකරණ ස්වාධීනත්වය යන නීතිය මත පාලනය ගොඩ නැගීමට අවශ්‍යය දේ යන්න එකතු කළ යුතුව ඇත.

ශ්‍රී ලංකාව තුළ විත්තියේ නීතිඥවරයකු අනෙකුත් අපරාධ යුක්තියට සම්බන්ධ පුද්ගලයන් සමග නිරතුරුව කටයුතු කළ යුතු අතර එය අනෙකුත් අධිකරණ ක්‍රියාදාමයන්ට සම්බන්ධ පහත කාරණා ඇතුළත්ව සිදුවිය යුතුව තිබේ.

(13.2) විනිසුරුවරුන්.

විනිසුරුවරයකුගේ ප්‍රධාන භූමිකාව සහ වගකීම පහත පරිදිය. ඒ ජාත්‍යන්තර නීතිය ඇතුළුව ජාතික නීතිය නගා සිටුවීමටය. එනම් ජාත්‍යන්තර නීතිය දේශීය ව්‍යවස්ථාවට අනුගත කළ යුතුය. යුක්ති පිළිබඳ පරිපාලනයේදී විනිසුරුවරු ස්වාධීන සහ අපක්ෂපාතී විය යුතුව ඇත.

වරදකාරීත්වය හෝ නිර්දෝෂීභාවය තීරණය කිරීමේදී (පුද්ගලික සහ රජය අතර ඉල්ලා සිටීම් අනුව) සෑම පාර්ශවයකටම තොරතුරු සහ විශිෂ්ටත්වයක් පමණක් නොව අදාළ සහ සුදුසු නීතිය පිළිබඳව යොමු විය යුතු බව අනිවාර්යය වේ.

බොහෝමයක් පොදු නීති, අධිකරණ බලය තුළ විනිසුරුවරු ඉහළ අධිකරණවල (අභියාචන ඇතුලුව) සිවිල් හා අපරාධ නඩු මෙහෙයවයි. මෙයින් තේරුම් යන්නේ විනිසුරුවරු, මහ අධිකරණ, අභියාචන අධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ සහ ව්‍යවස්ථා අධිකරණ වල නඩු කටයුතු වලට සැමවිටම මූලාසනය දරන බවය.

විනිසුරුවරුන් ට වගකීමක් ඇත. ඒ විත්තිකරුවන්, සාක්ෂිකරුවන් සහ වින්දිතයන්ට සාධාරණව සැලකීම සහ අපරාධ වරදක් සිදුකළ චූදිතයකුට සාධාරණ නඩු විභාගයක් සහතික කිරීමය. සාධාරණ නඩු විභාගයක් සඳහා පහත කරුණු අදාළ වේ.

ඒ සෑම වෙලාවකම චූදිතගේ අයිතිවාසිකම් වලට ගරු කිරීම සහ නිසි ලෙස ලබාගත් සාක්ෂි පමණක් අධිකරණයේදී අදාළ කර ගැනීමය. තවද සාධාරණ නඩු විභාගයක් සහතික කිරීමේදී විනිසුරුවරුන්ට දැඩි භූමිකාවක් තිබේ. ඒ සියලු ප්‍රකාශ සහ සාක්ෂි නිදහස්ව ලැබූ බව පමණක් සහතික කිරීම නොව එවා බලය පාවිච්චි කර ලබා නොගත් බව සහතික කිරීමය.

විනිසුරුවරුන් සැම විටම පහත කරුණු සම්බන්ධව සුපරික්ෂාකාරී විය යුතුය. විත්තිකරුවන් සහ සාක්ෂිකරුවන් වධ හිංසාවට හෝ අනෙකුත් පහත්කොට සැලකීමට විෂය වනවාද යන්න පිළිබඳවය. පහත උදාහරණය ගනිමු. රැඳවියෙක් ඔහු හෝ ඇය පහත් කොට සැලකීමට භාජනය වූ බව චෝදනා කරන්නේ ය. මෙය ඔහුව හෝ ඇයව විනිසුරුවරයා වෙත ඉදිරිපත් කළ විට සිදුවේ. එවිට විනිසරුවරයා චෝදනා වාර්තා කළ යුතු අතරම නඩුව මෙහෙයවන නිලධාරියා ලෙස එම චෝදනා සම්පූර්ණයෙන් විමර්ශනය කිරීම සහතික කිරීමෙහිලා අවශ්‍යය පියවර ගත යුතුය. විචක්ෂණ විනිසුරුවරයකු මෙය පැමිණිල්ලක් හෝ චෝදනාවක් නොමැති විටදීත් ශාරීරිකව හෝ මානසිකව පහත් කොට සලකා ඇති බව පෙන්නුම් කරන ලක්ෂණ ඇති විට එය සිදු කළ යුතුව තිබේ.

ලොව රටවල් ගත් විට නෛතික ක්‍රියාදාමයන් වෙනස් වේ. නමුත් වධ හිංසාව තහනම් කිරීම විශ්වීය වන අතරම විනිසුරුවරයාට ප්‍රාථමික භූමිකාවක් ලෙස නීතියට අනුකූලව කටයුතු කිරීම සහ වධ හිංසාව වැළැක්වීම ද මෙයට අදාළය. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය අනුව අගවිනිසුරුවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් පත්කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත ව්‍යවස්ථාපිත අධිකාරියකි. එහි ඉලක්කය වන්නේ ස්වාධීන කොමිෂන් සභා නඩත්තු කර පවත්වාගෙන යාම සහ අදාළ කටයුතු  අධීක්ෂණය කිරීමය. ජනාධිපතිවරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත මහාධිකරණ විනිසුරුවරයා පත් කරනු ලැබේ. සාම්ප්‍රදායිකව විනිසුරුවරු වන්නේ නීතිඥවරුන් ය. මේ අතරතුර ශ්‍රේෂ්ඨාධිරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරු විශ්‍රාම යාමෙන් පසු නීතිඥවරුන් ලෙස කටයුතු කරන්නේ නැත.[65][66]

---

[65] Judicial Services Commission Secretariat Sri Lanka, http://www.jsc.gov.lk/web/index.php?option=com contend & view = front-page & Itemid= 1&lang=en

[66] Supreme Court of Sri Lanka , http://www.supremcourt.lk/.

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු උසාවියට එන්නේ රතු පාට නිල ගවුමක් ඇඳගෙනය. විශේෂ චාරිත්‍රානුකූල උත්සව අවස්ථාවල (ශ්‍රේෂ්ඨාධිකරණයේ චාරිත්‍රානුකූල අසුන් ගන්නා විට) ඔහු රතු පැහැති නිල ගවුමකින් සැරසී සිටින අතරම නීතිඥ පටියක් සහ ලිහිල් කබායක් සහ දිගු හිස් වැසුමකින් සැරසී සිටිති. අභියාචනාධිකරණ විනිසුරුවරු උසාවියට සහභාගී වීමේදී තද දම් පාට නිල කබායකින් සැරසී සිටිති. විශේෂ උත්සව අවස්ථාවල (අභියාචනාධිකරණ චාරිත්‍රානුකූල අසුන් ගැනීම්වලදී) ඔවුන් තද දම් පාට ගවුමකින් සහ ලිහිල් කබායක් සහ දිගු හිස් වැස්මකින් සැරසී සිටිනු ලැබේ.

(13.3.) මහේස්ත්‍රාත්වරුන්.

ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත්වරයකු අධිකරණ නිලධාරියකු වේ. ඔවුන් අධිකරණ පනතේ අධිකරණ බලය යටතේ මහේස්ත්‍රාත් අධිකරණය මෙහෙයවීමට පත් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත්වරුන් නිල වශයෙන් හැඳින්වෙන්නේ පොලිස් මහේස්ත්‍රාත්වරුන් ලෙස සහ මහේස්ත්‍රාත් උසාවි හඳුන්වනු ලබන්නේ පොලිස් මහේස්ත්‍රාත් උසාවි ලෙසය.

මහේස්ත්‍රාත්වරුන්ට දණ්ඩ නීති සංග්‍රහය යටතේ පවරන අපරාධ නඩු විභාග කිරීමට අධිකරණ බලය ඇත. මීට අමතරව ඔවුන්ගේ වගකීම් ලෙස සෝදිසි වරෙන්තු අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු සහ ඇප ඉල්ලුම්පත් පිළිබඳ නඩු විභාග කිරීම ඇතුළත් වේ. බොහෝමයක් නඩු වලදී මහේස්ත්‍රාත්වරු ප්‍රාථමික උසාවි මෙහෙයවයි. මහේස්ත්‍රාත්වරුන් සතර ආකාරයකට වර්ග කරනු ලැබේ.

- ප්‍රධාන මහේස්ත්‍රාත් (කොළඹ අගනුවර ප්‍රදේශවල පමණක්)
- මහේස්ත්‍රාත්
- අතිරේඛ මහේස්ත්‍රාත් (ඒ එක් ස්ථානයක එක් මහේස්ත්‍රාත්වරයකුට වඩා වැඩි ගණනක් සිටින විට)
- නිල නොලත් මහේස්ත්‍රාත්වරුන්

පහළ අධිකරණ වලට දිසා අධිකරණ සහ ප්‍රාථමික අධිකරණ වලට මහේස්ත්‍රාත්වරුන් පත් කිරීමේ වගකීම අධිකරණ සේවා කොමිෂමට ඇත.[67]

(13.4) සාම විනිසුරුවරු සහ නිල නොලත් මහේස්ත්‍රාත්වරුන්.

ශ්‍රී ලංකාවේ සාම විනිසුරු සහ නිල නොලත් මහේස්ත්‍රාත්වරයා (වැඩ බලන මහේස්ත්‍රාත් ලෙස සැලකෙන) අධිකරණමය පත් කිරීමක් වන අතර අධිකරණ අමාත්‍යවරයා අධිරකරණ පනත යටතේ ඔවුන් අධිකරණ බලයට පත් කරනු ලැබේ.

නිල නොලත් මහේස්ත්‍රාත් ජ්‍යේෂ්ඨ නීතිඥවරයෙකි. (වසර 15 ක හෝ ඊට වැඩි පළපුරුද්දක් සමගය) ඔහු සාම විනිසුරුවරයෙක් වන අතර මහේස්ත්‍රාත්වරයකු සතු බලතල සහ අධිකාරිය ඇති නමුත් සිවිල් හෝ අපරාධ නඩු ඇසීමට තීන්දු සහ තීරණ ගැනීමට බලයක් නැත.

නිල නොලත් මහේස්ත්‍රාත්වරු ලෙස පත් කළ පුද්ගලයන්ට සාම විනිසුරුවරුන්ගේ සහ/හෝ නිල නොලත් මහේස්ත්‍රාත්වරුන්ගේ පශ්චාත් නාමික යුක්තිය භාවිතා කළ හැකිය.

[67] Judicial Services Commission Secretariat Sri Lanka,
http://www.jsc.gov.lk/web/index.php?option=com contend & view = front-page & Itemid= 1&lang=en

(13.5) නඩු පවරන්නන්

සාමාන්‍ය කටයුතුවලදී නඩු පවරන්නන් අපරාධ ක්‍රියාදමය තුළ සක්‍රීය භූමිකාවක නිරතවන අතරම ඊට පහත සඳහන් දේ ද ඇතුළත්ය. නඩු පැවරීම ස්ථාපිත කිරීම, මෙම විමර්ශන වල නීත්‍යානුකූලතාවය අධීක්ෂණය කිරීම, අධිකරණ තීන්දු ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම, මහජන අභිලාෂය පිළිබඳ නීතිඥවරුන් ලෙස අනෙකුත් ක්‍රියාවන් භාවිතයට ගැනීම වේ.

ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ මහජනතාවගේ නඩු පවරන්නා රජයේ නීතිඥවරයා මෙන්ම අපරාධ අධිකරණ ක්‍රියාදමය තුළ රජය නියෝජනය කරනු ලැබේ. ඔවුන්ව තෝරා පත් කරන්නේ නැත. ඔවුන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් වන අතර මහජනතාවගේ සේවකයන් වේ.[68]

රජයේ නීතිඥවරයකු වීමට සුදුසුකම් හිමි නීතිඥවරයකු විය යුතුය. එහි සාමාජිකයකු වන ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරුන්ට මහජන නඩු පැවරීම පිළිබඳ සැලකිය යුතු වසර ගණනක පළපුරුද්ද තිබීම අවශ්‍ය වේ. නීතිපති සහ ඔහුගේ/ඇයගේ නියෝජ්‍යය සොලිසිටර් ජනරාල් හිටපු රජයේ නීතිඥවරුන්ය. 1972 ට පෙර මෙම නිලය හැඳින්වූයේ රාජ නීතිඥ ලෙස වන අතරම එය සිලෝන්/ශ්‍රී ලංකාව ජනරජයක් වීමෙන් පසුව මෙය වෙනස් විය.

රජයේ නීතිඥවරයාගේ භූමිකාව පහත භූමිකා සමග සමානකම් ඇත. ස්කොට්ලන්තයේ පිස්කල් එනම් නඩු පවරන්නා, එංගලන්තයේ සහ වේල්ස් හි රාජ නඩු පවරන්නා කැනඩාවේ රාජ නීතිඥවරයන් සහ එක්සත් ජනපදයේ දිස්ත්‍රික් නීතිඥවරුන් අතර වේ.

(13.6) පොලීසිය

(13.6.1) සාමාන්‍යය

ශ්‍රී ලංකා පොලීසිය සාමාන්‍ය පුරවැසියන්ගේ ජාතික පොලිස් බලකාය වේ. එහි වෘත්තීමය ප්‍රධානියා එනම් පොලිස්පතිවරයාය. ඔහු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය ට මෙන්ම ශ්‍රී ලංකාවේ ජාතික පොලිස් කොමිෂමට වගකිව යුතුය.

පොලිස් සේවාව පහත ආකාරයට සංවිධානගත වේ. එය පස් වැදෑරුම් වේ. එය ශ්‍රේණීන් ලෙස හැඳින්වේ. (i,ii,iii,iv,v) එහිදී රටේ උතුර, බස්නාහිර, නැගෙනහිර සහ දකුණ ආවරණය වේ.

පොලිස් සේවාවට විශේෂඥ ඒකක ගණනාවක් ඇතුළත් වේ. එම ඒකක විමර්ශන, ආරක්ෂාකාරී, ත්‍රස්තවාදය මර්දනය සහ යුධ හමුදවට සමාන කටයුතු යනාදියයි. සංවිධානගත අපරාධ ක්‍රියා විමර්ශනය කිරීම සහ පරීක්ෂණ කටයුතු අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින්ද සිදුකරනු ලැබේ. ඒ නියෝජ්‍යය පොලිස්පතිවරයාගේ ආඥාව පරිදිය.

2002 අප්‍රේල් 29 වන දින පොලිස් මානව හිමිකම් ඒකකය පිහිටවනු ලැබිනි. එයට මූලික අරමුණක් ඇත. එනම් පොලිස් නිලධාරීන් ඔවුන්ගේ ක්ෂේත්‍ර වගකීම් වලදී සිදුකරන මානව හිමිකම් උල්ලංඝණයන් වැළැක්වීම සහ මහජනතාවගේ වරප්‍රසාදයක් වූ මානව හිමිකම් අරක්ෂා කිරීම වේ.

පොලීසිය සිදුකරන මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම්.

පොලිස් අතවරයන්ට ගොදුරු වන වින්දිතයන්ට ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ යාන්ත්‍රනයන් ගණනාවක්ම තිබේ. එහි පළමු පියවර ලෙස වින්දිතයන්ට පළමු තොරතුරු වාර්තාවක් පොලීසියට ගොනු කළ හැක. අවාසනාවකට මේවා සියල්ල අසාර්ථකය. මක්නිසාද එක්කෝ පොලීසිය

[68] Attorney Generals Department Sri Lanka , http://www.attorneygeneral.gov.lk/.

පැමිණිල්ල වාර්තා කිරීමට අපොහොසත් වේ. නැත්නම් පළමු තොරතුරු වාර්තාවක් ගොනු නොකරන්නැයි වින්දිතයන්ට බලපෑම් කිරීමට උත්සාහ කරයි. දෙවනුව වින්දිතයන්ට පොලිසිය සිදුකරන අපචාර පිළිබඳව එයට එරෙහිව පහළ අධිකරණවලට පැමිණිලි කළ හැක. කෙසේ නමුත් අධිකරණ ශාස්තුව අධිකරණයට පැමිණීමට සහ නීතිඥ ශාස්තුව ගැන සැලකූ විට නිසි ලෙස අධිකරණයේ නඩු විභාග කිරීමට සාමාන්‍යයෙන් වසර ගණනාවක් ගත වේ. තෙවනුව ශ්‍රී ලංකාවේ නීතිය අනුව කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණයට සෘජුව අභියාචනය කිරීමට ඉඩකඩ සලසා තිබේ. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙනි. මෙම ඉල්ලීම් චෝදනා ලැබ ඇති උල්ලංඝණය සිදුවී දින 30 ක් ඇතුළත කළ යුතුව තිබේ.

(13.7) අධිකරණ වෛද්‍ය නිලධාරින්.

(13.7.1) සාමාන්‍ය තත්ත්වය.

අධිකරණ වෛද්‍ය නිලධාරියකු යනු පූර්ණ කාලීන අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකි.

අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රය යනු නීතිය සහ නෛතික ක්‍රියාදමය වෛද්‍ය ක්ෂේත්‍රය අතර සම්බන්ධයක් ඇති කරන්නකි. අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා රජයේ සේවකයෙකි. ඔහු අධිකරණ අමාත්‍යාංශය යටතේ සේවය කරන අතර එයට වග කියයි. අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ වගකීමට පහත සඳහන් දේ ඇතුළත්ය. නමුත් පහත සඳහන් වගකීම් වලට පමණක් සීමා වී නැත. එනම් මළ සිරුරු කපා පරීක්ෂා කිරීම, පශ්චාත් මරණ පරීක්ෂණ විමර්ශනය, සහ මළ මිනී ගොඩ ගැනීම, සැක කටයුතු ලෙස ශාරීරික තුවාල තත්ත්වයකට පත්ව ඇති රෝගීන් පරීක්ෂා කිරීම සහ අධිකරණයට සාක්ෂි ගොනු කිරීම වේ.

වධ හිංසාව පිළිබඳ චෝදනාවලදී අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ භූමිකාව තීරණාත්මක වේ. පොලීසිය භාරයේදී තමන්ව වධ හිංසාවට ලක් කළ බව චෝදනා කරන චූදිතයකුට පළමුව පරීක්ෂා කරනු ලබන්නේ අධිකරණ වෛද්‍ය නිලධාරියකු විසිනි. එවිට අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා ඒ පිළිබඳව වාචිකව සහ ශාරීරික පරීක්ෂණයක් සිදුකරනු ලැබේ. එහිදී තුවාල වල ඉතිහාසය වින්දිතායාට අනුව තීරණය කරනු ලබන අතර ඔවුන්ගේ අදහස් වාර්තා කරයි. තුවාල, චූදිත පුද්ගලයා කියා සිටින සිද්ධීන් සමග ගැලපේද යන්න තහවුරු කරයි. ඉන් අනතුරුව මෙම සොයා ගැනීම් වෛද්‍ය නීති පරීක්ෂා කිරීමේ පෝරමයක් තුළ වාර්තා කරනු ලැබේ. අධිකරණ වෛද්‍ය නිලධාරියා මෙහිදි තම මතය ද සඳහන් කරයි.

ඒ තුවාල සිදු වූ ආකාරය සහ චූදිත පුද්ගලයා සඳහන් කළ සිද්ධීන් අනුවය. ඉන්පසුව කාර්ය අධිකරණයට පැවරේ. අධිකරණය මෙම සාක්ෂි, අපරාධකරු සමග සම්බන්ධ කරයි. සාමන්‍යයෙන් අපරාධකරුවන් වන්නේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ය.

නඩුව මහේස්ත්‍රාත් අධිකරණයට යොමු වුවහොත් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය සවිස්තරාමක කළ අධිකරණ වෛද්‍ය වාර්තාවක් අධිකරණ වෛද්‍ය නිලධාරි ඉදිරිපත් කරනු ලැබේ. නඩුව මහාධිකරණයට යොමු කළහොත් නඩු පවරන්නා වෙනුවෙන් සාක්ෂිකරුවකු ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා සාක්ෂි දිය යුතුයි.

සාර්ථක ලෙස වධ හිංසා නඩු පැවරීමේදී අධිකරණ වෛද්‍ය වාර්තා තීරණාත්මක වේ. අවාසනාවකට ශ්‍රී ලංකාවේ සිටින්නේ අධිකරණ වෛද්‍ය නිලධාරීන් 42 ක් පමණි. නමුත් ජනගහනය මිලියන 20 කි. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල අධිකරණ වෛද්‍ය නිලධාරීවරයකුට ප්‍රවේශය ලබා ගැනීම දුෂ්කර වේ. එහි ප්‍රතිඵලය වධ හිංසාවට පාත්‍ර වන වින්දිතයන්ට කණිෂ්ඨ වෛද්‍යවරුන්ගේ අඩු පුහුණුවක් ඇති වෛද්‍යවරුන් විසින් පරීක්ෂා කිරීමය.

(13.7.2) අධිකරණ වෛද්‍ය නිලධාරියකුගේ නීත්‍යානුකූලභාවය.

චූදිත වෙනුවෙන් අපරාධ විත්තිය පිළිබඳ නීතිඥවරයකු පෙනී සිටිමින් කටයුතු කරන විට ඔහුට සේවාදයකයා වෙනුවෙන් යුතුකමක් ඇත. ඒ අධිකරණ වෛද්‍ය නිලධාරියකු සම්පූර්ණ කළ අධිකරණ පෝරමය පරීක්ෂණ පෝරමය සහ අධිකරණ වෛද්‍ය වාර්තාව යන්නෙහි නීත්‍යානුකූල භාවය පරීක්ෂා කිරීම වේ. බොහෝදුරට අධිකරණ වෛද්‍ය නිලධාරීවරයකු ප්‍රශ්න කිරීම හෝ නඩු පැවරීම සම්බන්ධයෙන් මුක්තියක් ලබා නැත. එක් නඩුවකදී අධිකරණය විසින් අධිකරණ වෛද්‍ය නිලධාරියකු වෘත්තීය අපචාරය සම්බන්ධයෙන් වැරදිකරු කර ඇත. ඒ පොලිස් වධ හිංසාවට පාත්‍ර වූ වින්දිතයකු නිසි ලෙස පරීක්ෂා නොකිරීමෙන් පසුව වින්දිතයා පොලිස් අත්අඩංගුවේ දී මිය යාමක් පිළිබඳවය. මෙහිදී අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ බලපත්‍රය වසර 03 කට තහනම් කෙරිණි.

(13.8) හදිසි මරණ පරීක්ෂක

අධිකරණ අමාත්‍යවරයා විසින් හදිසි මරණ පිළිබඳ පරීක්ෂණ කිරීමට බලය දී ඇති පුද්ගලයාය. එනම් හදිසි මරණ, පරීක්ෂක විසින් කරනු ලැබේ. ඔවුන් වෛද්‍ය හෝ නීති පිළිබඳව පත් කරන්නන් නොවේ. ඔවුන් ඉතා දැඩිව මරණ විමර්ශන වලදී පොලීසිය සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන් මත යැපෙති.

සැක කටයුතු හෝ යම් අවිනිශ්චිත වාතාවරණයක් යටතේ යම් පුද්ගලයකු මිය ගියහොත් පොලීසියට වාර්තා කරන අතරම වෛද්‍ය නෛතික ක්‍රියාදාමය සක්‍රීය වේ. එවිට පොලීසිය හදිසි මරණ පරීක්ෂකට දැනුම් දෙයි. එවිට හදිසි මරණ පරීක්ෂක මරණය සිදුවූ හේතුව සොයා පරීක්ෂණය පටන් ගනු ලැබේ.

මරණ පරීකෂක, මරණය පිළිබඳ හේතුව සොයා බැලීමට අපොහොසත් වුවහොත් ඔහු අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාට එය යොමු කරනු ඇත. ඒ පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීම සඳහාය. එවිට අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා මරණය සිදු වූ වාතාවරණය සෙවීමට දෙවන පරීක්ෂණය පවත්වයි.

(13.9) විශෝධන සේවා සහ බන්ධනාගාර නිලධාරීන්.

ශ්‍රී ලංකාවේ විශෝධන සැපයීම් සහ/හෝ බන්ධනාගාර නිලධාරීන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලැබේ. එම දෙපාර්තමේන්තුව ට පහත අරමුණ ඇත. ඒ ශ්‍රී ලංකාවේ අධිකරණය නියම කරන අපරාධ වැරදිවලට සිරභාරයට ගැනීම සහ සිර භාරයට නොගෙන දඬුවම් කිරීම සහ නියෝග (නිවාසවල රඳවා ගැනීම, අධීක්ෂණය, ප්‍රජා වැඩ සහ කොන්දේසිවලට යටත් කොට මුදා හැරීම) සහතික කිරීම සහ අධිකරණය තවදුරටත් ඒවා ආරක්ෂිත රැකවරණය සහිත මානුෂීය සහ ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම වේ.

මෙම දෙපාර්තමේන්තුවට පහත අරමුණ ද ඇත. ඒ ආරක්ෂිත සහ සාධාරණ සමාජයක් පවත්වාගෙන යාමට ඉලක්කගත සහ සුදුසු වැඩසටහන් මගින් වැරදිකරුවන් පුනරුත්ථාපනය සහ නැවත සමාජගත කිරීම උදෙසා කටයුතු කිරීමය. තවද මෙහිදී නැවත වැරදි කිරීම අඩු කිරීමට ද ඒ සඳහා ඉලක්කගත සහ සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥා පනත ට අදාළ මූලධර්ම මගින් මෙම දෙපාර්තමේන්තුව සහ එහි පරිපාලනය ක්‍රියාවට නැංවේ.

රට තුළ සිරකරුවන් ප්‍රවාහනය කිරීම උදෙසා ශ්‍රී ලංකා පොලීසියේ සහය ඇතිව කටයුතු කිරීමට ද මෙම දෙපාර්තමේන්තුවට වගකීමක් ඇත.

(13.10) අධිකරණ භාෂා පරිවර්තකයන්.

යම් අධිකරණයක, නිල භාෂාව නඩුවට සහභාගී වන පුද්ගලයා නොදන්නා විට ඔහුට හෝ ඇයට භාෂා පරිවර්තනය අධිකරණ ක්‍රියාදාමය තුළ ලබාදීමට එහිදී කටයුතු කරන පුද්ගලයා අධිකරණ භාෂා පරිවර්තක ලෙස හැඳින්වේ. එම අධිකරණ භාෂා පරිවර්තකයන් සාක්ෂිකරුවන් හෝ/සහ විත්තිකරුවන් සමග කටයුතු කරයි.

ඒ සාක්ෂි හා ප්‍රකාශ විත්තියට තේරුම් යන භාෂාවෙන් සැපයීම උදෙසා වටිනා සැබෑ පරිවර්තකයන් ලබාදීම උදෙසාය.

එම අධිකරණ භාෂා පරිවර්තකගේ රැකියාව පහත පරිදිය. එනම් ඔවුන් කියවන සෑම දෙයක්ම වාචිකව පරිවර්තනය කළ යුතු අතරම එවැනි භාෂා පරිවර්තකයන් නීතිඥවරයාට සේවාදායකයාට උපදෙස් දීමේදී සහය විය යුතුය.

(13.11) ජූරි සභිකයන්.

ජූරිය දිවුරුම් දුන් පුද්ගල මණ්ඩලයකින් සමන්විත වේ. ඔවුන් එසේ දිවුරුම් දෙන්නේ අපක්ෂපාතී තීන්දුවක් වෙනුවෙනි. (එනම් ප්‍රශ්නයක් පිළිබඳව තොරතුරක් සොයා දීමටය) නූතන ජූරි සභිකයන් අධිකරණය තුළදී අපරාධයක් සම්බන්ධයෙන් වරද නිශ්චය කිරීමට හෝ එයට අඩු වශයෙන් කටයුතු කිරීමේ නැම්යාවක් ඇත.

ඇන්ග්ලෝෆෙන් අධිකරණ බලය තුළ තීන්දුව වැරදිකරු හෝ නිවැරදිකරු වේ. (ඔප්පු නොවූ විට තීන්දුව නිදොස් කොට නිදහස් කිරීම වන අතර එය රජය විසින් වරදකරු කිරීමට අපොහොසත් වන විට එය නිර්දෝෂීභාවය ඔප්පු කිරීමෙහිලා පදනම් වන අතරම මෙය ස්කොට්ලන්තයේ පවා ක්‍රියාත්මක වේ.)

ශ්‍රී ලංකාවේ ජූරි සභාවක් මගින් මහා අධිකරණය නඩුවක් පැවරීම මහාධිකරණයේ ජූරියක් මගින් සිදුකරන අධි චෝදනාවක් මත පැවරිය යුතුව ඇත.

136 (1) (එ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ යම් නීතියක විධි විධානවලට යටත්ව අග්‍ර විනිශ්චයකාරවරයා සහ ඔහු විසින් නම් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයන් තිදෙනෙකු විසින් ජූරි සභා සඳහා මූල මණ්ඩල පිළියෙල කළ යුතු ආකාරයත් ජූරි සභිකයන් කැඳවීමේ, තේරීමේ සහ ඔවුන් පිළිබඳව විරෝධය පෑමේ පිළිවෙල අධිකරණයේ ජීවය හා කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා ද කලින් කළ රීතිය සැදිය හැක්කේය.

(13.12) නීති ආධාර කොමිෂම.

ශ්‍රී ලංකාවේ නීති ආධාර කොමිෂම 1978 දී පිහිටවනු ලැබීය. වර්තමානයේ එයට ලංකාව පුරා පැතිර ගිය මධ්‍යස්ථාන 76 ක් ඇත. එහි භූමිකාව මෙසේය. එනම් නීති උපදෙස් ලබාදීම, අඩු ආදායම්ලාභී කණ්ඩායම් සඳහා නොමිලේ නෛතික නියෝජනය (නීතිඥවරු) ලබාදීම සහ සමස්ත සමාජයටම නෛතික ක්‍රියාදාමයක් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් නිර්මාණය කිරීම වේ. එයින් ආධාර ලබාගැනීමට සේවාදායකයන් තම මාසික දීමනාව රුː 15,000/- හෝ ඊට අඩු බව පෙන්වා දිය යුතුය.

නඩු මගට බැසීමේ සේවාවන් සඳහා ඔවුන් සිය සේවා සපයන්නේ පහත ආකාරයටය. එනම් ඉඩම්, දික්කාසාද, මුදල් ආපසු අයකර ගැනීම, හදිසි අනතුරු වන්දි, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අඹු සැමි ළමුන් සඳහා නඩත්තු, කම්කරු, සමථ මණ්ඩල කරුණු ගෙවල් කුලී මණ්ඩල කරුණු, ඇප, අභියාචන සහ මූලික අයිතීන් කඩකිරීම් පිළිබඳ නඩු වේ. එය අපරාධ නඩු පිළිගන්නේ නැත්තේ නොවේ. එහි ප්‍රතිඵලය දුප්පත් චූදිතයන්ට ඔවුන් විසින්ම නෛතික ක්‍රියාදාමය හැසිරීමට බල කිරීම වේ.

(13.13) ශ්‍රී ලංකාවේ අධිකරණ සේවා කොමිෂම.

අධිකරණ සේවා කොමිෂම විසින් පහළ අධිකරණ සඳහා විනිසුරුවරු පත් කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම හා විනය පාලනය පිළිබඳ ක්‍රියාදාමය ස්ථාපිත කර ඇත. එය පහත ආකාරයට සැකසී ඇත.

අගවිනිසුරු එහි සභාපතිවරයා වන අතර ජනාධිපති පත් කරන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු දෙදෙනෙකු ගෙනි. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණයට පිවිසීමට අයදුම්කරුවන් නීති වෘත්තියේ අවම වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්ද ඇති ලිඛිත විභාගයකින් සමත් වීම සහ සම්මුඛ පරීක්ෂණයක දී සාර්ථක වීම අවශ්‍යය වේ. ඔවුන්ව පත් කිරීමෙන් අනතුරුව විනිසුරු ආයතනය තුළ අනිවාර්ය පුහුණුවක් ලැබිය යුතුව ඇත.

(13.14) ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත කරුණු බලාත්මක කිරීමෙහිලා පිහිටවනු ලැබ ඇත. ඒ එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් ලෙස මානව හිමිකම් ආරක්ෂා කිරීම, ජාත්‍යන්තර තලයේ විවිධ ජාතීන්ගේ ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවට පනවා ඇති යුතුකම් සහ වගකීම් ඉටු කිරීම, 1996 දී පැනවූ පැරිස් මූල ධර්ම වලට අදාළ තත්ත්වයන් පවත්වාගෙන යාම ඒ අතර වේ. මෙය ස්වාධීන කොමිෂන් සභාවකි. එය 1996 අංක 21 දරන පනතින් පිහිටවනු ලැබුවේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමටය.

එහි මෙහෙවර පහත ආකාර වේ. එනම් ශ්‍රී ලංකාව තුළ යහපත් මානව හිමිකම් පිළිබඳ සංස්කෘතියක් ඇති කිරීමය. මේ සඳහා නීති, ප්‍රතිපත්ති සහ ප්‍රායෝගිකව සියල්ල මානව හිමිකම් ආරක්ෂාව හා ප්‍රවර්ධනය සිදුකළ යුතු අතර එය විශ්වීය ලෙස පිළිගත් මානව හිමිකම් භාවිතාවන්ට සහ මූලධර්මයන්ට අනුකූල විය යුතුව තිබේ. එහිදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එහි පුරවැසියන්ට, ලබාදී ඇති සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වලට විශේෂයෙන් අවධානය යොමු කළ යුතුය.[69]

[69] Human Rights Commission of Sri Lanka , http://hrcsl.lk/english/about-us/establishment/.

# මහේස්ත්‍රාත් අධිකරණය

<u>පරිශිෂ්ටය - 1</u>

චූදිතට චෝදනා නගා ඇත

1.පළමු කොටසෙහි 8 වන වෙලුමේ වරදකට ( අපරාධ සංග්‍රහය 10 (ආ) )

2. අවුරුදු දෙකකට නොඅඩු හෝ රු 1500 කට නොවැඩි දඩයකයට දණ්ඩ නීති සංග්‍රහය යටතේ එන වැරදි (අපරාධ සංග්‍රහය 11 (ආ) (2) )

විනිසුරුවරයෙකුට පමණක් නඩු විභාග කිරීම

නඩු විභාගයට පෙර කරුණු

<u>ඇප නොදී සිටීම</u>

- රක්ෂිත බන්ධනාගාර ගත කිරීම නඩුව ඇසේ

<u>විමර්ශන අවස්තාව</u>

- චෝදනාව
- පොලිස් විමර්ශන
- පුද්ගලයෙකු හෝ ස්ථාන සෝදිසි කිරීම
- රඳවා තැබීම
- චූදිත ගේ ප්‍රකාශ
- නඩු පවරන්නගේ සාක්ෂි ලබා ගැනීම

<u>ඇප</u>

<u>ඇප පනත 7</u>

- අධිකරණය ඉදිරියේ පෙනී සිටීම
- තමාව හඳුනා ගැනීම
- බැඳුම් කරයකට ඇතුල් වීම
- යම් සාධාරන මුදලක් තැම්පත් කිරීම හෝ සාධාරන සහතික ඇපයක්

<u>නඩු විභාගය</u>

1) චෝදනාව මෙහෙයවන නීතිඥ වරයාගේ නඩුව

- විවෘත ප්‍රකාශන
- මූලික සාක්ෂි
- විත්තියේ හරස් ප්‍රශ්න ඇසීම

2) විත්තියේ නඩුව

- විත්තියේ ප්‍රකාශ අපරාධ සංග්‍රහය 184 (3)
- මූලික සාක්ෂි අපරාධ සංග්‍රහය 152 (1)
- චූදිත සාක්ෂි දීම අපරාධ සංග්‍රහය 152 (2)

<u>අවසන් කිරීමේ ප්‍රකාශය</u>

1) චෝදනාව මෙහෙයවන නීතිඥ වරයාගේ ප්‍රකාශය

2) විත්තියේ ප්‍රකාශය

තීන්දුව (අපරාධ සංග්‍රහය 185)

<u>වරදකරු නොකිරීම</u>

<u>වැරදිකරු වීම</u>

- දඬුවම (අපරාධ සංග්‍රහය 14)

අභියාචනය අපරාධ සංග්‍රහය 320

# මහාධිකරණය

පරිශිෂ්ටය 2

චූදිතට චෝදනාවක් කර ඇත

**විනිසුරු වරයෙකු විසින් නඩු විභාග කිරීම**

- මහාධිකරණයේ සියලු නඩු විනිසුරු වරයෙකු ඉදිරියේ සිදු කල යුතුය (අධිකරන සංවිධාන පනත11(1) ).

**ජූරිය විසින් නඩු විභාග කිරීම**

- ජූරිය විසින් නඩු විභාගය සිදු කිරීමට චූදිත තෝර ගත යුතුය.එ වරද අධිකරණ සංවිධන පනතේ දෙවන වෙදය යටතට නොපැමිණෙන විට නඩු විභාගයට පෙර (අපරාධ සංග්‍රහයදී 161 ) අධිකරණ සංවිදාන පනත දී 11(2)).

නඩු විභාගයට පෙර කරුණු

**ඇප නොදී සිටීම**

- රක්ෂිත බන්ධනාගාර ගත කිරීම නඩුව ඇසේ

**ඇප**

ඇප පනත 7

- අධිකරණය ඉදිරියේ පෙනී සිටීම
- තමාව හඳුනා ගැනීම
- බැඳුම් කරයකට ඇතුල් වීම
- යම් සාධාරන මුදලක් තැම්පත් කිරීම හෝ සාධාරන සහතික ඇපයක්

**විමර්ශන අවස්තා**

- චෝදනාව
- පොලිස් විමර්ශන
- පුද්ගලයින් හා ස්තාන සෝදිසි කිරීම
- රඳවා තැබීම
- චූදිතගේ ප්‍රකාශ
- නඩු පවරන්නාගෙ සාක්ෂි ගැනීම

නඩු විභාගය

**1) චෝදනාව මෙහෙයවන නීතිඥ වරයාගේ නඩුව**

- විවෘත ප්‍රකාශය
- මූලික සාක්ෂි
- විත්තියේ හරස් ප්‍රශ්න

**2) විත්තියේ නඩුව**

**විවෘත ප්‍රකාශය**

- එක් විනිසුරුවරයෙක් (අපරාධ සංග්‍රහය 201)
- ජූරි සභාවක් (අපරාධ සංග්‍රහය 221 [1] )

**මූලික සාක්ෂි**

- එක් විනිසුරුවරයෙක් පමනක් (අපරාධ සංග්‍රහය 201)
- ජූරි සභාවක් ඇතිව (අපරාධ සංග්‍රහය 221 [1] )

**චූදිතගෙන් ප්‍රශ්න ඇසීම (අපරාධ සංග්‍රහය 152 [2] )**

- එක් විනිසුරුවරයෙක් පමනක් (අපරාධ සංග්‍රහය 199 [5] )
- ජූරි සභාවක් සහිතව (අපරාධ සංග්‍රහය 218)

**චෝදනාව මෙහෙයවන නීතිඥ වරයා විසින් හරස් ප්‍රශ්න ඇසීම**

- එක් විනිසුරුවරයෙක් පමණක් (අපරාධ සංග්‍රහය 201 [1] )
- ජූරි සභාවක් සහිතව (අපරාධ සංග්‍රහය 221 [2] )

ප්‍රකාශ ලබා ගැනීම අවසන් කිරීම

1) චෝදනාව මෙහෙයවන නීතිඥ වරයාගේ ප්‍රකාශය

2) විත්තියේ ප්‍රකාශය

**තීන්දුව**

- විනිසුරු වරයෙකු පමනී අපරාද සංග්‍රහය 203
- ජූරිය අපරාධ සංග්‍රහය 234

**වරදකරු කර ඇත**

- දණ්ඩනය විනිසුරුවරයෙකු පමණක් සිටී අපරාධ සංග්‍රහය 203
- ජූරිය අපරාධ සංග්‍රහය 238

**අභියාචනය**

- විනිසුරුවරයෙකු පමනී අපරාධ සංග්‍රහය 235
- ජූරිය අපරාධ සංග්‍රහය 234

**වරදකරු නොකිරීම**

- චූදිතව නිදහස් කිරීම